# විදුරුපොල පියතිස්ස මාහිමි

සංස්කාරක

රාජකීය පණ්ඩිත ගෞරව ශාස්ත්‍රවේදී මහෝපාධ්‍යාය

**තෙරිපැහැ සෝමානන්ද මහා නායක ස්ථවිර**

සහාය සංස්කාරක

**ශාස්ත්‍රපති නුවරඑළියේ චන්ද්‍රජෝති අනු නායක ස්ථවිර**

Printed for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55, Sec 1, Hang Chow South Road, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website:http://www.budaedu.org

Mobile Web: m.budaedu.org

**This book is strictly for free distribution, it is not to be sold.**

**නොමිලයේ  බෙදාදීම පිණිසයි.**

Printed in Taiwan

රාජකීය පණ්ඩිත ගෞරව ශාස්ත්‍රවේදී

මහෝපාධ්‍යාය

## අතිපූජ්‍ය තෙරිපැහැ සෝමානන්ද මහා නායක

මාහිමිපාණන් වහන්සේගේ ඉල්ලීම පරිදි

ශ්‍රී ලංකා තායිවාන් ධර්මචක්‍ර ළමා පදනමේ

හා

කැලණිය ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි

බණ්ඩාරවෙල ශ්‍රී සුධර්මෝදය මහ පිරිවෙන් විහාරාධිපති

## ආචාර්ය පල්ලේවෙල සාරද හිමිපාණන් වහන්සේගේ

සම්බන්ධීකරණයෙන්

තායිවානයේ ප්‍රධාන සංඝනායක

ජාත්‍යන්තර ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ

ජනාධිපති උපදේශක

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේ

විසින් මුද්‍රණය කරන ලදි

2008 දෙසැම්බර් 09

# උඩරට අමරපුර මහා නිකාය

ආරම්භය :- ක්‍රි: ව: 1806

## විනය වාදිනී කාරක සංඝ සභාව

(1) රාජකීය පණ්ඩිත තෙරිපැහැ සෝමානන්ද මහා නාහිමි
සුධර්මාරාමය සරස්වතී වත්ත තලවතුගොඩ

(2) මහෝපාධ්‍යාය තවලම්පොළ සද්ධාතිස්ස අධිකරණ නා හිමි
බෝධිතිලක පුන්සඳ විහාරය ඇල්ලේඅරාව බලංගොඩ

(3) ශාස්ත්‍රවේදී රත්කරව්වේ ජිනානන්ද නා හිමි
රත්නායක මුදලින්දාරාමය රත්කරව්ව හපුතලේ

(4) වැල්ලවායේ විමලවංශ නාහිමි
මල්වත්තාවෙල පුරාණ විහාරය වැල්ලවාය

(5) ශාස්ත්‍රපති නුවරඑළියේ චන්ද්‍රජෝති අනු නාහිමි
ශ්‍රී පියතිස්ස විද්‍යායතන පිරිවෙණ ගවරම්මාන කැප්පෙට්ටිපොළ

(6) ශාස්ත්‍රවේදී ගෝදුන්නේ ගුණරතන හිමි
ශ්‍රී විජයනන්ද ශ්‍රී මහා විහාරය පුස්සැල්ලාකන්ද පතනවත්ත හාලිඇල

(7) ශාස්ත්‍රවේදී රත්මලවින්නේ ප්‍රඥානන්ද නා හිමි
ජිනජෝතිකාරාමය මාමල්ගහ ඉඹුල්පේ බලංගොඩ

(8) ශාස්ත්‍රපති අඹලියද්දේ පඤ්ඤානන්ද හිමි
ශ්‍රී උත්තරාරාමය ඇඹුලන්පහ රුපහ

(9) ශාස්ත්‍රවිශාරද නිකපොත චන්ද්‍රජෝති නා හිමි
ශ්‍රී ඤාණානන්ද බෞද්ධ මධ්‍යස්ථානය මාදිවෙල කෝට්ටේ

(10) අත්තිඩියේ පුඤ්ඤරතන අධිකරණ නා හිමි
ශ්‍රී පියරතනාරාමය ජිනරතන මාවත අත්තිඩිය පාර රත්මලාන

(11) නාවෙල කුසලඤාණ හිමි
ශ්‍රී පුරාණ විහාරය ඕ 4 ඇල කොමරියාව ගිරාඳුරුකෝට්ටේ

(12) ප්‍රවීණාචාර්ය බුදුරාවේ සීලවංශ හිමි
ශ්‍රී සරණපාල මූලික පිරිවෙණ මීගහකිවුල බදුල්ල

(13) ශාස්ත්‍රපති යාලගමුවේ ධම්මිස්සර නා හිමි
දිඹුලන මහා විහාරය විහාරගොඩ අඹගහවත්ත

(14) ශාස්ත්‍රවේදී නෙල්ලිගස්හින්නේ පියනන්ද හිමි

ශ්‍රී සුමංගලාරාමය විමලධම්ම මාවත පොල්වත්ත බදුල්ල

(15) ශාස්ත්‍රවේදී හාල්අටුතැන්නේ චන්ද්‍රවිමල හිමි

ශ්‍රී සුමංගලාරාමය විදුරුපොල කැප්පෙට්ටිපොළ

(16) ආචාර්ය පල්ලේවෙල සාරද හිමි

ශ්‍රී සුධර්මෝදය මහා පිරිවෙණ දකුණු කැබිල්ලේවෙල බණ්ඩාරවෙල

(17) ආචාර්ය කිවුලේගෙදර නාරද හිමි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ගංගොඩවිල නුගේගොඩ

(18) රාජකීය පණ්ඩිත රූපහ සිරිනන්ද හිමි

ශ්‍රී විවේකාරාමය රාගල හාල්ග්‍රන්ඔය

(19) රාජකීය පණ්ඩිත රූපහ සුමංගල හිමි

ශ්‍රී ජිනානන්ද මහා විහාරය රූපහ හාල්ග්‍රන්ඔය



**රාජකීය පණ්ඩිත විදුරුපොළ පියතිස්ස**

මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

1880 ජූනි 16. 1954 දෙසැ: 10.

## උපහාරය

අනුරපුර යුගයේ පටන්
මහනුවර යුගය තෙක්
ඒ වියත් මාහිමි පරපුර
සපුරා පිළිබිඹු කළ
විදුරුපොළ මාහිමියන් වහන්සේගේ
සඳ සම්භාවනීය ස්වර්ණමය නාමයට

## අති පූජ්‍ය පණ්ඩිත
## කන්දේගෙදර සුමනවංස මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන්

සපුරා වර්ෂ හතළිස් තුනකට ද අධික කාලයක් උඩරට අමරපුර නිකායයේ මහානායක ධුරය දැරූ භදන්ත පණ්ඩිත **විදුරුපොළ පියතිස්ස** මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ව්‍යක්ත දේශකයකු හා කීර්තිමත් මහා පඬිවරයකු හැටියට ලංකාවේ පමණක් නොව **ඉන්දියාව – සියමය – බුරුමය** වැනි රටවල පවා ප්‍රසිද්ධියක් ඉසිලූ සුපේශල ශික්ෂාකාමීත්වයෙන් පිරී සිටි උත්තම සංඝ පිතෘවරයෙකි. සිංහල–පාළි–සංස්කෘත–ඉංග්‍රීසි යන භාෂා කීපයකින් ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ සත්විස්සක් ම නිර්මාණය කළ උන්වහන්සේ විශාරද බුද්ධිමතෙකි. ප්‍රතිභාපූර්ණ මහා කවිවරයෙකි. ශ්‍රේෂ්ඨතම මහා සාහිත්‍ය ධරයෙකි. පාළි භාෂාවේ නටබුන් ව ගිය සාහිත්‍යාංග කීපයක් ම අප මා හිමියන් නිසා නව ජීවනයක් ලද්දේ ය.

උඩරට අමරපුර නිකායයේ ස්වර්ණමය යුගය උන්වහන්සේගේ පාලන සමය යැ යි කිව හැකි ය. උන්වහන්සේගේ ජීවිත කථාව පොතක් වශයෙන් අනාගත පරම්පරාව උදෙසා සකස් නොවීමේ පාඩුව මෙරට කෘතවේදී පාඨක ලෝකයාට තදින් ම දැනුණක් විය. 1986 අප්‍රේල් 25 වැනි දින රැස් වූ අප **කාරක සංඝසභාව** මේ පාඩුව මගහැරවීමට සඳහා චරිතාපදානයක් සම්පාදනය කිරීමට වැඩ පිළිවෙළ යොදා ගන්නා ලදී. ලංකාවේ කීර්තිමත් පඬිවරයෙකු, ව්‍යක්ත ලේඛකයෙකු හා ප්‍රසිද්ධ ග්‍රන්ථ කර්තෘවරයෙකු ද වූ රාජකීය පණ්ඩිත **තෙරිපැහැ සෝමානන්ද** අනුනායක ස්ථවිරයන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් සංස්කාරක මණ්ඩලයක් ද ඒ සඳහා පත්කර ගන්නට යෙදිණ. නිකායේ සහකාරලේඛක, ශාස්ත්‍රවේදී **බඹරපනේ සීලවංස**, ශාස්ත්‍රපති **නුවරඑළියේ චන්දජෝති** යන දෙනම එම මණ්ඩලයෙහි සහාය සංස්කාරකවරු වූහ. අප මහානායක මාහිමියන් වහන්සේ කෙරෙහි අතිමාත්‍ර ගෞරව සම්ප්‍රයුක්ත භක්තියක් ඇති සංස්කාරක අනුනායක ස්ථවිරයන් වහන්සේ ඊළඟ රැස්වීමට එම චරිතාපදානය පිළිබඳ සැලැස්මක් ද ඉදිරිපත් කළහ. එතැන් පටන් උන්වහන්සේලා දිවා රෑ වෙහෙස නොබලා මෙම කාර්යය සපුරා ගැනීම සඳහා මහත් පරිශ්‍රමයකින් ක්‍රියා කළහ. සාරගර්භ මෙම ග්‍රන්ථය එම පරිශ්‍රමයේ මහඟු ප්‍රතිඵලය යි.

මෙබන්දක දී විඳින්නට සිදුවන හැම අපහසුවක් ම විඳ දරා ගනිමින් ද, ස්ථිර අධිෂ්ඨානයෙන් හා නො පසුබට වීර්යයෙන් ද, යුක්ත ව මෙම කාර්යය සාර්ථක ව නිම කළ සංස්කාරක මණ්ඩලයටත්, මෙයට නොයෙක් අන්දමින් ආධාරෝපකාර කළ ගිහි-පැවිදි පින්වතුන් හැම දෙනාටත්, අපගේ ප්‍රසාදය හා කෘතඥතාව මෙයින් පිරිනැමේ.

මෛවගට,
ශාස්ත්‍රෝන්නතිකාමී,

**කන්දෙගෙදර සුමනවංස,**
උඩරට අමරපුර නිකායේ මහා නායක ස්ථවිර

ශ්‍රී සුධර්මෝදය පිරිවෙණ,
දකුණු කැබිල්ලේවෙල,
බණ්ඩාරවෙල.

**පිටකවරය :**
**බී. එච්. ඇම්. රත්නසිරි**

# හැඳින්වීම

මෙයට වසර දෙකහමාරකට පමණ පෙර අප නිකායේ **විනයවාදිනී** කාරක සංඝසභාවේ තීරණයක් අනුව මෙම ග්‍රන්ථය සකස් කරන ලදී. දසක හය හතක් පමණ කාලයක් මේ රටේ සාසනාම්බරය හා ධර්මශාස්ත්‍රාම්-බරය බබුළුවමින් වැඩ සිටි ජාතියේ ඉතිහාසයට ස්වකීය ස්වර්ණමය නාමය එකතු කළ අප උපාධ්‍යායවර සාර්වභෞම පණ්ඩිත විදුරුපොළ **පියතිස්සාභි-ධාන** මාහිමියන් වහන්සේගේ ජීවන පුවත අපවත් වී සූතිස් අවුරුද්දකට පසු ව වුව මේ ආකාරයෙන් එළි දක්වන්නට ලැබීම ප්‍රීතියට කරුණකි. මෙම ප්‍රීතිය මේ රටේ ධර්මශාස්ත්‍රරසික වියත් හුදී ජනතාවට ම පොදු වන්නක් බවට සැකයක් නැත.

අතිපූජ්‍ය මහනාහිමියන්ගේ ජීවන තොරතුරු එකම තැනකට එකතු කොට නො තිබිණ. අඩුම ගණනේ දිනපොතක් වත් පාවිච්චි නොකළ උන්වහන්සේගේ ජීවන චරිතය ලිවීමට බට විට දැනුණේ එය සෑහෙන දුෂ්කර කාර්යයක් බවයි. ඒ දුෂ්කරතාව වඩාත් ගැඹුරු කෙළේ අවුරුදු සියයකටත් ඇතක පටන් ලිඛිත තොරතුරුවලින් තොර වූ පුවත් රැසක් සංකලනය කරන්නට සිදුවීම නිසා ය.

මේ සඳහා අවශ්‍ය තොරතුරු සොයා ගන්නට නොයෙකුත් විධිවිධාන සලස්වන ලදී. නිකායික කාරක හිමිවරුන්ගෙන් පළමු කොට ඉල්ලීමක් කරන ලදී. විදුරුපොළ විහාර පරම්පරාවේ හිමිවරුන්ගෙන් ඒ අනුව ලද සහයෝගය අගය කළ යුතු වේ. ලංකාවේ සුප්‍රසිද්ධ පුවත්පත් මඟින් ද ඉල්ලීමක් කළත් එයට ප්‍රතිචාරයක් ලැබුණේ එක ගිහි මහතකුගෙන් පමණි. තත්ත්වය මෙබඳු වූවත් පුළුවන් තරමින් තොරතුරු සපයාගෙන දියුණු චරිතකථා සම්ප්‍රදායයට හැකිතාක් ආසන්න වන ලෙසින් මේ ග්‍රන්ථය පිළියෙළ කෙළෙමි. මෙයට අනවශ්‍ය දෑ ඇතුළත් වී නැතැයි සිතෙතත් ඇතුළත් විය යුතු අවශ්‍ය පුවත් තවත් තිබිය නොහැකි නො වේ. සපයාගත් හැම පුවතක් ම ප්‍රයෝජනයට ගන්නට ද මහන්සි ගතිමි.

වත්මන් සාම්ප්‍රදායික චරිතකථා දෙස බලන කළ මෙහි වෙනසක් දක්නට ලැබෙතොත් එය පුදුමයක් නො වේ. මෙම ජීවන චරිතය නිර්මාණය කොට ඇත්තේ දේශීය හා විදේශීය මහවියතුන් ද, බුද්ධිමතුන් හා උසස්

ප්‍රභූන් ද, සමකාලීන ජනමාධ්‍යකරුවන් ද, විදුරුපොළ මාහිමියන් ගැන පළකළ අදහස්වලට මුල් තැන දීමෙනි. උන්වහන්සේ ගේ විවිධ සේවාවන් ගැන නොයෙක් වර ඔවුන් පළ කල විවිධ අදහස් මෙහි පෙළගස්වා ඇති අතර ගත්කතුවරයා එක දිගට කරුණු විස්තර කරගෙනයාමේ පිළිවෙත ද බෙහෙවින් අඩු කිරීමට මහන්සි ගන්නා ලදී. විදුරුපොළ මාහිමියන් වහන්සේ තමන් වහන්සේ ගැන නොයෙක් වර ලියූ කියූ දෑ ද බෙහෙවින් ආශ්‍රය කොට ගතිමි.

මෙහිලා වඩාත් ම ආයාසකර කාර්යයක් වූයේ නිකාය ඉතිහාසය කියැවෙන පළමුවැනි පරිච්ඡේදය ගොනු කිරීම ය. එය වඩාත් විධිමත් ලෙස පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය තරම් ප්‍රමාණ කළ හැකි තොරතුරු සපයා ගැනීමට දැරූ පරිශ්‍රමය බලාපොරොත්තු තරම් සාර්ථක නොවිණ. ඒ නිසා එහි අඩුපාඩුකම් තිබිය හැකි ය.

## උපකාර

කාරක සභාවේ තීරණය අනුව මේ කෘතිය සැකසීම සඳහා තේරුණ සහායකයන් වූ සහකාර ලේඛක, ශාස්ත්‍රවේදී ගරු බඹරපනේ සීලවංස ස්ථවිරපාදයන් වහන්සේ හා ශාස්ත්‍රපති නුවරඑළියේ චන්ද්‍රජෝති ස්ථවිරයන් වහන්සේත් දුන් සහයෝගය ඉතා වැදගති. උපදේශදානයෙන් අනුග්‍රහ දැක්වූ රාජකීය පණ්ඩිත කන්දේගෙදර සුමනවංස මහානායක හිමිපාණන් වහන්සේට අප ගෞරවාශීර්වාදය හිමි වේ. අවශ්‍ය ලිපි ලේඛන සැහෙන ප්‍රමාණයක් සපයා දුන් විදුරුපොළ බුද්ධදත්ත නාහිමි, ශාස්ත්‍රවේදී බඹරපනේ සීලවංස හිමි, අපවත් වී වදළ පණ්ඩිතාචාර්ය විදුරුපොළ ධම්මානන්ද අනුනායක හිමි, පරිවෙණාධිපති ශාස්ත්‍රවේදී දික්කාපිටියේ නන්ද හිමි යන ස්වාමීන් වහන්සේලා නොමසුරුව එම කාර්යය ඉටු කළහ.

ඉතා වැදගත් ග්‍රන්ථ කීපයක් සපයා දුන් රාජකීය පණ්ඩිත අහුන්ගල්ලේ විමලනන්දිතිස්ස මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා අමුපිටියේ ධම්මරංසි නායක ස්වාමීන් වහන්සේත් ගෞරවයෙන් සිහිපත් කරමි. මෙම කාර්යයෙහි දී මුල පටන් ම සාකච්ඡා කිරීමෙන් හා උපදෙස් දීමෙන් සහයෝගය දැක් වූ රාජකීය පණ්ඩිත දවුල්දෙණ ඤාණිස්සර නායක හිමි පාණන්හට හා මෙහි එන පාළි නිබන්ධය රචනා කළ රාජකීය පණ්ඩිත කැකුණවෙල පියරතන හිමිපාණන්හට ද අපගේ ගෞරවය හිමි වේ.

## ස්තුතිය

මේ පිළිබඳව දැඩි උනන්දුවක් දැක් වූ සමරවීර වීරවන්නි අධ්‍යාපන උප ඇමති හා අධ්‍යාපන සේවා ඇමතිතුමාත්, ගාමිණී දිසානායක ඉඩම් ඉඩම් සංවර්ධන හා මහවැලි ඇමතිතුමාත්, ක්‍රියාකාරී අධ්‍යක්ෂක ඩී. එම්. පී. ඒකනායක මහත්මාත් අපේ විශේෂ ස්තුතියට පාත්‍ර වෙති.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සේවාමණ්ඩලයේ සභාපති **එම්. බී. සී. සිල්වා** මහතා ද මෙහි අප සිහිපත් කරන්නේ කෘතඥතා පෙරදැරිවයි.

ඌව පළාතේ මහ ඇමති **පර්සි සමරවීර**, දේශීය වෛද්‍ය ඇමති හා සංස්කෘතික ඇමති වී. ජ. මු. **ලොකුබණ්ඩාර** යන දෙපොළ දක්වූ උනන්දුව අප ධෛර්යයට හේතු විය.

අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ස. ජ. **සුමනසේකර බණ්ඩා** මහත්මා මුල පටන් ම මේ ග්‍රන්ථය ගැන ලොකු සැලකිල්ලක් දක්වී ය. ඒ මහත්මාගේ යෝජනා අනුව මෙහි සකස් කළ තැන් ද කීපයකි. එතුමාටත් මුද්‍රණයට පොත සකස් කර ගැනීමේදීත්, ශුද්ධිපත්‍ර කියවීමේදීත්, සහයෝගය දක්වූ සුධර්මා දහම් පාසැලේ ප්‍රධානාචාර්ය **එම්. පී. ශ්‍රියාන්ති** (බී.ඒ. ශ්‍රීලංකා) මහත්මියටත්, මුද්‍රණය සඳහා පිටපත පිරිසුදු ව ලියා දුන් කොළඹ **යශෝධරා බාලිකා** විද්‍යාලයයේ **බී. ඒ. ෂමිලා ඉමාලි** මෙණෙවියටත් අපගේ ස්තුතිය හිමි වේ.

මෙම ග්‍රන්ථය ප්‍රකාශනයට පත් කිරීම අප නිකාය තුළින් කිරීමට මුල දී බලාපොරොත්තු ඇතිකර ගත් නමුත් ප්‍රමාණවත් බරපැන් ප්‍රදානයක් නොලත් නිසා බැහැරින් ආධාරෝපකාර පතන්නට සිදු විය. එසේ ආධාර කළ ගිහි–පැවිදි පින්වතුන් හැමදෙනාට ම පින්දෙමු.

අවශ්‍ය ඉංග්‍රීසි ලිපි කීපයක් පරිවර්තනය කර දුන් **ආ. කු. නිශ්ශංක** මහත්මා කෘතවේදී වැ සිහි කරමි. මෙහි නම් සඳහන් වූ ද, නොවූ ද, මෙම කාර්යය ද සපුරා ගැනීම සඳහා ආධාරෝපකාර කළ ගිහි පැවිදි හැම කෙනෙකුට ම අපේ ස්තුතිය හිමි වේ. මුද්‍රණකාර්යය ඉතා හොඳින් ඉටු කර දුන් **අසෝක** බටදූවආරච්චි මහතාත්, ඒ මහතාගේ කාර්යය මණ්ඩලයත් අපේ පැසසුමට ලක් වේ.

අපගේ උපාධ්‍යායොත්තම භදන්ත පණ්ඩිත **විදුරුපොළ පියතිස්ස** මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ජීවිතපවත මේ ආකාරයෙන් ඉදිරිපත් කරන්නට ලැබීම මහත් පිනක් සේම උන්වහන්සේටත්, නිකායටත්, අප ඇති ණයබරින් මිදීමක් සේ ද සලකමි.

**තෙරිපැහැ සෝමානන්ද අනුනායක ස්ථවිර**
(සංස්කාරක)

2532
1988
සුධර්මාරාමය,
සරස්වතීවත්ත,
තලවතුගොඩ

# පටුන


පණ්ඩිත කන්දේගෙදර සුමනවංස මහානායක හිමිපාණන්ගේ ප්‍රකාශනය .. .. ii
හැඳින්වීම .. .. .. ix
පටුන .. .. .. xiii
i ගුණ සමර (විමලරත්න කුමාරගම) .. xv
ii ගුණ සින්ධු බින්දු (රාජකීය පණ්ඩිත කැකුණවෙළ පියරතන ස්ථවිර) .. .. xvii
iii ශ්‍රී ප්‍රියතිෂ්‍ය මහානායකස්වාමීන්ද්‍රගුණානුස්මෘතිඃ (රාජකීය පණ්ඩිත දවුල්දෙණ ඤාණිස්සර නායක ස්ථවිර) .. .. .. xix
ජීවිත සමරු සටහන .. .. xxiii

1 පරිච්ඡේදය
උඩරට අමරපුර නිකාය, සම්භවය හා ව්‍යාප්තිය 1 — 24
i කොටස .. .. .. 1 — 07
ii කොටස .. .. .. 7 — 24

2 පරිච්ඡේදය
උත්තම කුලකුමරකුගේ උපත .. .. 25 — 33

3 පරිච්ඡේදය
පැවිද්ද හා ප්‍රාථමික ශාසනික අධ්‍යයනය .. 34 — 40

4 පරිච්ඡේදය
පාරිවේණික අධ්‍යයනය හා උපසම්පදව .. 41 — 45

5 පරිච්ඡේදය
ලක්දිව පළමුවැනි පඬිරුවන .. .. 46 — 52

6 පරිච්ඡේදය
ආචාර්ය පරම්පරාව හා ධර්මශාස්ත්‍ර පරම්පරාව .. 53 — 59

7 පරිච්ඡේදය
මහානායක පදවිය හා ශාසනික සේවය .. 60 — 67

8 පරිච්ඡේදය
මහාකාව්‍ය — චම්පූකාව්‍ය හා කෝෂකෘති .. 68 — 92

9 පරිච්ඡේදය
ධර්ම ශාස්ත්‍රීය විවිධ කෘති .. .. 93 — 122
i කොටස .. .. .. 93 — 107
ii කොටස .. .. .. 108 — 122

10 පරිච්ඡේදය
ජාත්‍යන්තර කීර්තිය .. .. 123 — 161
i කොටස .. .. .. 123 — 138
ii කොටස .. .. .. 138 — 161

11 පරිච්ඡේදය
i ශ්‍රේෂ්ඨතම සංඝපිතෘත්වය .. .. 162 — 165
ii විශේෂ ගති ලක්ෂණ .. .. 165 — 172

12 පරිච්ඡේදය
සමකාලීන වියතුන් .. .. 173 — 180

13 පරිච්ඡේදය 181 — 186
i සිසු පිරිස .. .. .. 181 — 183
ii නිධන ප්‍රාප්තිය .. .. 183 — 186

14 පරිච්ඡේදය
විශේෂ ලිපි .. .. .. 187 — 204
උපග්‍රන්ථය .. .. .. 205
පොත්වැල .. .. .. 216
ලිපිවැල .. .. .. 217
පදවැල .. .. . 219


**සංවේගය**

මෙම ග්‍රන්ථය සම්පාදනය පිළිබඳ ආරම්භක අවස්ථාවේ දඩි උනන්දුවකින් ක්‍රියා කළ විදුරුපොල සුමංගලාරාමාධිපති ව වැඩ විසූ පණ්ඩිතාචාර්ය විදුරුපොළ ධම්මානන්ද අනුනායක හිමියන්ගේ නිධන ප්‍රාප්තිය පිළිබඳ සංවේගය පළ කරමු.

## ගුණ සමර

මට භය හතර වත් නො දනෙන ළපැටි කල
ඇසුයෙමි ගමෙක රසවත් නම ''විදුරුපොළ''
අද මේ තරම් ඇයි අහසේ අඳුරු වෙළ
අපතර නැති නිසයි නා හිමි විදුරුපොළ

ඉපිද 'කැප්පෙටිපොලට' නුදුරුව 'විදුරුපොළ' නම් ගමෙහි ඌවේ
ළපැටි වියෙදි ම සසුන් ගත වී උපන් දස්කම් ගෙනැර පෑවේ
බසට, සමයට, දැයට පණ දී කරපු නො මැරෙණ පරිදි සේවේ
විදුරුපොළ පියතිස්ස නායක සමිඳු නම මට නිතර සීවේ

මහා උගතුන් මැද ද උගතෙකි උගත්කම ගැන උගත් වියතයි
ලියූ පොත් පත්වලින් පැයේ අතේ දිග නොව අතේ වියතයි
අපේ රට අද කඳුළු බී ගෙන හඬ හඬා යනු අමුතු අතකයි
කුඩා කල දී පටන් මට ඔබ වහන්සේගේ නම ද මතකයි

සඳැස්, වියරණ, ලකර, එළු, සකු, මගද ඈ බස් සතර නිපුණව
සිටිය බව පළ කළේ ඉන්නා අවදියේ ම ය ළපැටි හෙරණව
අඳුරු සෙවණැලි වැටෙන හැටි දැක අපේ හෙළ උරුමයට උරණව
සමිඳ ඔබ ඉදිරියට ආවෙහි එළිය දී මුළු රටට සරණව

එද අඳුරු ව තිබූ පෙදෙසක් සඳ අඳුරින් මුදා ගත්තෙකි
සද සඟ පරපුර ම උඩරට උදා හිරු මෙන් හදා ගත්තෙකි
නිදා ගෙන සිටි සමාජය මත උදා පියවර තබා ඇත්තෙකි
උදා කරයෙකි — සිසිරකරයෙකි දෙපා හරසර ලබා ඇත්තෙකි

පිදුරුතලා ගල පෙදෙසින් හමන ගලා
සුමුදු පවන හැම මල් රොන් එකට වෙලා
සමිඳු නමට පුද පූජා කරනු බලා
සිටිය හැකි ද? හිමි පිය මත ම හිස නොලා

**විමලරත්න කුමාරගම**

# ගුණසින්ධුබින්දු

01. ලඞ්කායං ජිනසාසනම්බුජවනෙ – රාජීව ජීවො’නිසං
පීනෙන්තො ජන චඤ්චරීක නිචයං – යො භික්ඛු හංසාවුතො
**සාමින්දෙ වජීරොපලෙ** සමුදිතො – ධඤ්ඤාධිවාසො **මහා** -
**නෙතා’සී පියතිස්සනාම** විස්සුතො විඤ්ඤූනමග්ගෙසරො

02. **කිත්තීයස්ස** තතාන ඛීරධවලා’සෙසණ්ණවාතො පරං
දෙවාඛීරසමුද්ද මන්විනගතා ඤාතුං න තං සක්ඛිසුං
කීළන්තං හරි මුජ්ජහාය සතතං ගොපීහි වුන්දවනෙ
ලක්ඛී යත්‍ර වසං ගතා වසි සද අඤ්ඤත්‍ර හිත්වා රතිං

03. **පණ්ඩිච්චං** යස්ස දිස්වා සුනිසිතමසමං කින්නු වාචාපතී සො
යාචිත්වා දෙවතානං ගරුපදවිමිතො ලජ්ජිතො සම්පලායී
**වාචීසත්තං** විචිත්තං බුධයතිපතිනො යස්ස වාණීපි දිස්වා
හිත්වා බ්‍රහ්මාන මාරා පියමුඛ කමලෙ පෙමසා සංරමිත්ථ

04. ඛන්ති මෙත්තා දයාද්‍යාකරමුදුහදයො සීල **පඤ්ඤාණසාරො**
සාසනෙතා සාසනත්ථං නිජයති නිකරෙ මග්ගයං මග්ගමග්ගං
ථෙරින්දෙ පණ්ඩිතො සො “**විදුරුපොල**” මහා නෙතුපාදෙ තදනී
පුඤ්ඤඛෙත්තං මතන්තං භවි සිවසුඛදං සොගතානං ජනානං

05. ලඞ්කාදීපෙ–කඤ්චනදීපෙ–භුවිසිරියා විලසන්තො
බුධජනමොලී–මණිගුණසාලී–යතිජනහිතමෙසන්තො
සිසිර පදෙසෙ–නුවරෙළි දෙසෙ–භමරවනෙ සිරිසාරෙ
**වජීරොපල පියතිස්ස මහායති–පති** වසි මහාවිහාරෙ

06. **සොණ්ණමුද්දිකා** සමෙතමාදිමංහි පණ්ඩිතො-
පාධි මග්ගබුද්ධිකොසලෙන සංලභිත්ථ යො
පාලිසීහලාදිනෙක භාසයාතිසුන්දරං
**සද්දසින්ධු** ආදිගන්ථ ජාතමෙසගන්ථයී

07. සිඤ්ජිත මණි කිඞ්කිණි සමනාද
මඤ්ජුල පදසඤ්චය පරිපුණ්ණං
පඞ්කජමි’ව ගුණරඤ්ජිතමෙසො
ගන්ථයි **කමලඤ්ජලි** වර ගන්ථං

08. **නෙක්ඛම්මෙ සගුණං දිස්වා – නෙක්ඛම්මෙ නිරතො සදා**
**නෙක්ඛම්මමචම්පූ කබ්බංච – අකාසබ්බප්පසංසියං**

09. ගන්ථෙ ජගන්ථ විවිධෙ ච භවං යතින්දෙ
වාචිස්සරො'භවි තථා පිටකත්තයෙ ච
වෙසන්තරෙන **සිරි රාහුල සඞ්ඝරාජා**
දෙලායතෙ මම මනං කිමුපාගතොති

10 හො ! නෙතුපාද ! ! තිදසිස්සරියං උළාරං
වින්දං වසිත්ථ සුචිරං අධුනාත්‍ර දීපෙ
තුම්හාදිසා නහි භවන්ති සුධී යතින්ද
කස්මා පමජ්ජසි'හ ජායිතුමෙසකාලො.

ඉත්ථං සමුදීරයති.
අතුරලියේ කටුපොතවිල සිරි පත්ථාරාම පුරාණ විහාරාධිපති,
ගන්ථවිසාරදෙ, සත්ථවේදී, රාජකීය පණ්ඩිතො,
**කැකුණවෙල පියරතනත්ථෙරො.**

## ශ්‍රී ප්‍රියතිෂ්‍ය මහානායකස්වාමීන්ද්‍රගුණානුස්මෘතිඃ

1. ශ්‍රීමල්ලඞ්කොර්ද්ධවරාෂ්ට්‍රෙ'මරපුරවිදිතෙ භික්ෂුවංශෙ'ග්‍රනෙතා
ලක්ෂ්ම්‍යා ශුභ්‍රාංශුවද් යඃ සුචිරමුදලසච්ඡාසනාබ්ජෙ'ර්කබන්ධොඃ
ස්වාමීන්ද්‍රස්‍ය ප්‍රතීතෙ **විදුරුපල** ඉති ග්‍රාමවර්‍යෙ **ප්‍රියාදි**
**තිෂ්‍යාඛ්‍යාතස්‍ය** තස්‍ය ස්මරති ගුණලවං භක්තිපූර්වං ජනො'යම්.

2. සො'යං ස්වාමී විනෙතා පරමධෘතිධරඃ පෙශලො භික්ෂුකාර්‍යෙ
පාරම්පර්‍යං චරිත්‍රං විනයනයමනුල්ලඞ්ඝ්‍ය බුද්ධානුශිෂ්ටම්
සාමග්‍රීඤ්චාපි වෘද්ධිං ස්වයතිපරිෂදං ප්‍රාපයන් දීපයංශ්ච
යාවජ්ජීවං ව්‍යතානීද් දිශි දිශි විශදං කීර්තිවල්ලීමතල්ලීම්.

3. ශ්‍රද්ධාභක්ත්‍යාර්චිතානාං මුදිතජනගණෛඃ ප්‍රත්‍යයානාං චතුර්ණාං
ත්‍යාගී නෛකාර්ථිවර්ගෙ සුරතරුසදෘශො'යං රතො භික්ෂුශීලෙ
නෛෂ්ක්‍රම්‍යානම්‍රචෙතා භුවිඛ්‍යාවිමහිතප්‍රඥයා දීපිතාශඃ
සොත්සාහී යාවදර්ථ්‍යොන්නති සූකෘතිවිධෞ ක්ෂාන්තිශීලාත්‍යදෙෂෙ.

4. සද්වාග්භිඃ පූරිතාස්‍යඃ ස්ථිරතරහෘදයඃ සර්වසම්‍යක් ක්‍රියාසු
මෛත්‍රීගීතාම්බුසෙකාන්නිඛිලජනගණං ස්නාපයඤ් ශාන්තිකාමී
ලාභාලාභාවමානස්තුතිහිතකරණෙ චාපි මධ්‍යස්ථචිත්තඃ
සන්තුෂ්ට්‍යා ව්‍යාපෘතො'භූජ්ජගදුපකෘතයෙ බොධිචර්‍යානුගාමී.

5. නෙතායං මානිතඃ **ශ්‍රී** ප්‍රවරපදපුරොගාමිනා පූජ්‍ය වජ්‍ර
**ඥානාලඞ්කාරනාම්නා** ප්‍රවරයතිගණෛර් භක්තිභාරාත් ප්‍රමොදත්
භික්ෂ්වාකල්පප්‍රශාන්තො විබුධපරිෂදං භද්‍රපීඨං දධානඃ
ශ්‍රීලඞ්කාභූමහිෂ්‍යාමුකුටමණිරිව භ්‍රාජතෙස්ම ප්‍රභාවාත්.

6. මතිස්ත්‍රිරත්නෙ'වනතිස්තපොගුණෙ
රතිඃ පරාර්ථෙ විරතිස්තථාමිෂෙ
ස්මෘතිඃ ශිවෙ චාදිගුණා මනස්විනො
බහුවුරස්‍යාව්‍යයසම්පදඃ සදා.

7. අනෙකභාෂාමෘතපානබන්ධුරෙ
සුභාෂිතාභ්‍යාසවිකම්පිතාධරෙ
ප්‍රියංවදස්‍යාස්‍ය මුඛාම්බුජාකරෙ
සදභ්‍යරඞ්ක්ෂීත් මුදිතා සරස්වතී.

8. අනන්තසෙවී සුගතානුශාසනාත්
සමුත්සුකඃ ශාසනරක්ෂණෙ සදා
ශ්‍රීයාශ්‍රිතඃ සද්ගුණ කෞස්තුභොජ්ජ්වලඃ
සධර්මචක්‍රඃ පුරුෂොත්තමොන්වයම්.

9. දන්තං විශුද්ධචරිතං කෘතපුණ්‍යධන්‍යං
ප්‍රව්‍රාජ්‍ය බාලකජනං විනයානුරූපම්
පුත්‍රං යථා ජනයිතෛෂ දයාර්ද්‍රචෙතාඃ
සංවර්ධ්‍ය ශාසනචිරස්ථිතයෙ යුයොජ.

10. නිෂ්ණාතො විනයෙ සඞ්ඝානුඥයායං මහාශයඃ
අධිශීලාර්ත්ථිභික්ෂූණාමුපාධ්‍යායො'භවච්චිරම්.

11. උවාස යස්මින් සුචිරං ජග්ද්ධිතං
විධීයමානො'යමුදාරමානසඃ
සුමංගලාඛ්‍යඃ ස විහාරතල්ලජ
සදා බභාසෙ තපසො'ස්‍ය තෙජසා

12. අසෞ පලාලස්ථලපර්වතාන්තිකෙ
පුරෙ ප්‍රතීතෙ නගරංගණාහ්වයෙ
මහාවිහාරෙ'පි වස ඤ්ශශාඞ්කවච් –
චිරං ව්‍යභූෂීජ්ජිනශාසනාම්බරම්.

13. විපශ්චිතාං භක්තිමතාඤ්ච යාචනා –
දසෞ කදාචිත් සමුපෙත්‍ය භාරතම්
ප්‍රමොදයන් විශ්වජනං සභාසදං
දිදෙශ සද්ධර්මකථාං පරිස්ඵුටාම්.

14. ගුරාඃ සුරාණාමපි දූර්වචං තදා
නිමශ්‍ය තත් සාර්ථසුභාෂිතං මුදා
විධීයමානාඃ ස්තුතිවාක්‍යමුච්චකෛර්
නිපෙතුරස්‍යාඞ්ඝ්‍රිසරොරුහෙ ජනාඃ

15. ජිඝ්‍රඤ් ජිඝ්‍රන් ප්‍රකාමං විසෘමරමනිශං ශීලගන්ධං චතුර්භ්‍යො
දිග්භ්‍යඃ සම්ප්‍රාප්‍ය ලෞල්‍යාජ්ජනමධුපගණො නෙතෘපද්මං නිෂෙව්‍ය
පීත්වා පීත්වා ප්‍රදත්තං මධු මධුරරසං නෛකධර්මොපදෙශං
භ්‍රාමං භ්‍රාමං ජගත්‍යාං විමලගුණගණං ගායතිස්මාස්‍ය නිත්‍යම්.

16. ශිෂ්‍යාණාමස්‍ය කෙචිත් සුනිශිතමතයො නෛකවිද්‍යාකලාසු
සංස්ථාප්‍යොත්කෘෂ්ටවිද්‍යායතනසමුදයං ශාස්ත්‍රදානාච්ච කෙචිත්
ශ්‍රී සද්ධර්මප්‍රචාරාත් සකලජනහිත ග්‍රන්ථබන්ධාච්ච කෙචි –
ච්ඡශ්වල්ලොකාර්ථසිද්ධිං විදධති සුතරාං ප්‍රෙක්ෂමාණාශ්ච මොක්ෂම්.

17. දෛවීපාලිස්වභාෂාස්වපි පරසමයෙ වෙදවෙදාඞ්ගවිද්‍යා –
තර්කන්‍යායෙෂු විද්වාන් නිශිතමතිරපි ධ්වස්තමානාධ්වජො'සෞ
ප්‍රත්‍යක්ෂො ගාං ප්‍රපන්නො'මරගුරුමහිමා භ්‍රාජමානඃ සදර්ථෛර්
නව්‍යෛඃ කාව්‍යෛඃ ප්‍රබන්ධෛරකුරුත සුතරාං තුඞ්ගසාහිත්‍යසෙවාම්.

18. උන්මූලීකෘත්‍ය හත්වා භවභයකරණං ක්ලෙශජාලං නිකෘෂ්ටං
ප්‍රාප්‍යාර්හත්ත්වං මුනීන්ද්‍රොදිතවිදිතධුතාඞ්ගෙෂු යො'ග්‍රෙසරො'භූත්
තස්‍ය ක්ෂීණශ්‍රවර්ෂෙශ්වරිතමපි **මහාකාශ්‍යපස්‍යාශ්‍රයාණඃ**
සොත්කර්ෂං සර්ගබන්ධං ශ්‍රවණසුඛකරං පාලිකාව්‍යං චකාර.

19. සිද්ධාර්ථො බොධිසත්වඃ කපිලපුරවරෙ තෙජසා පාරමීණාං
සම්බොධිං ප්‍රාප්තුමිච්ඡන් ගෘහසුඛමජහත් සංසෘතෞ වීක්ෂ්‍ය දුඃඛම්
නෛෂ්ක්‍රම්‍යං වර්ණයංස්තත් සයතිරපිමහා **පූර්වනෛෂ්ක්‍රම්‍යචම්පූ**
කාව්‍යං රම්‍යං න්‍යබාන්ත්සීත් ප්‍රවරබුධගණෛර් වර්ණිතං මාගධීයම්.

20. විද්වත්තමඃ කුසුමදෙවකවිප්‍රණීත –
**දෘෂ්ටාන්ත පූර්වශතකස්‍ය** පුරාතනස්‍ය
ජාත්‍යා ස සප්තදශමෙ වයසි ස්ථිතො'පි
**ව්‍යාඛ්‍යාං** ව්‍යධත්ත සරලාං ජගදර්ථසිද්ධ්‍යෛ.

21. ජාත්‍යාෂ්ටාදශභායනෙ යතිපතිඃ සම්බුද්ධභක්ත්‍යාප්ලුතස් –
තස්‍යානන්තගුණෛකගුණෛකදෙශමතුලං පද්‍යෛන සංවර්ණයන්
පූර්ණං ධර්මසුධාරසෙන **සුගතාලංකාර**නාම්නා ශ්‍රුතං
කාව්‍යං කර්ණරසායනං විහිතවාන් තෙනෙ යශො භූතලෙ.

22. අසෞ සමායාං පරිපූර්ණවිංශතා –
වථොපසම්පත්තිනිබද්ධමානසඃ
සමර්වය**ච්ඡාසනවංශ**නාමිකං
විරච්‍ය කාව්‍යං නිජසඞ්ඝසංසදෙ.

23. ජගත්ප්‍රතීතෛර් ජනසම්මතොප -
දෙශෛඃ සුසංයුක්තමසෞ කවීශඃ
**දෘෂ්ටාන්තරත්නාවලි**පාලිකාව්‍ය
මරීරචච්චාරුසදර්ථපූර්ණම්.

24. සුඛාවබොධාය හි පාලිපාරි -
භාෂාපදානාං යතිනා ප්‍රණීතම්
සවිස්තරං **ව්‍යාකරණාදිශබ්ද** -
**සින්ධූං** ප්‍රමර්ථනන්ති බුධාඃ සදෛව.

25. පාශ්චාත්‍යදෙශීයජනස්‍ය පාලි -
භාෂාං යථාර්ථං පඨිතුං සුඛෙන
ඉංග්ලිෂිපාලීත්‍යාපි ශබ්දකොෂං
ප්‍රණීත්වානෙෂ යතිර්මනීෂී.

26. සනරාමරජනනන්දනමුනිවන්දනකෘතයෙ
ප්‍රතිභාකරමතිභාසුරකවිරුත්තමරසිකඃ
ශ්‍රුතිමඤ්ජුලපදසඤ්චයසදලඞ්කෘතිලසිතාං
කමලාඤ්ජලිවිදිතාං කෘතිමකරොදපි ස යතිඃ

27. විචාරබුද්ධිඃ සදසත්ස්වයං යතිඃ
ශුශොධ "නෙත්ත්‍යට්ඨකථාං" යථාතථම්
තථෛව සංයුත්තනිකායජාතකා -
භිධාන පාල්‍යර්ත්ථකථෛ ච තත්ත්වතඃ.

28. ජාත්‍යා ත්‍රිංශත්සමායාමවසිතනිපයො ධර්මශාස්ත්‍රාන්තගඃ ශ්‍රී
ලංකාප්‍රාචීනභාෂොපකෘතිසදසි යශ්චාවසානාං පරීක්ෂාම්
උත්තීර්ණො'සෞ විශිෂ්ටං ප්‍රමුඛතමතයා පණ්ඩිතොපාධිමග්‍රං
සම්ප්‍රාප්‍ය ස්වර්ණමුද්‍රාසහිතමිහ මහා පණ්ඩිතශ්චාදිමො'භූත්.

29. අස්‍ය ස්මර්තුං මහද්භිඃ කෘතගුණමතුලං කාරිතෙ ශ්‍රී ප්‍රියාදි -
තිෂ්‍යාඛ්‍යාතෙ ච ශාස්ත්‍රායතනජලනිධෞ ප්‍රාජ්‍යශිෂ්‍යා නිමග්නාඃ
භාෂාවිද්‍යාකලාදිප්‍රචුරමණිගණානුද්ධෘතා යාවදර්ථං
ප්‍රඥසම්පත්සමෘද්ධා ජගති ජනහිතං කුර්වතෙ නෛකදික්ෂූ

30. ඉත්ථං යඃ කාව්‍යබන්ධාමෘතරසනිචයඃ සත්ක්‍රියාතීක්ෂ්ණබුද්ධි -
ජ්‍යොත්ස්නාභිර් භික්ෂුතාරානිකරපරිවෘතො දුඃඛතාපං ප්‍රශාම්‍ය
චක්‍රෙ ලොකාර්ථසිද්ධිං කවිජනකුමුදනන්දකාර ප්‍රියාදි -
තිෂ්‍යොපාද්ධ්‍යායචන්ද්‍රො භවභයවිගතං නිර්වෘතිං ස ප්‍රයානාත්.

(i) තෙරිපැහැ සෝමානන්ද ස්ථවිරෙණ විපශ්චිතා
අඞ්ගීකෘත්‍ය මහානෙතෘගුණස්මෘත්‍යෛ කෘතාර්ථනාම්

(ii) ඌර්ධ්වරාෂ්ට්‍රෙ'මරපූර සාමග්‍රීසඞ්ඝසංසදි
අනුනෙතෘධුරීණෙන ගුණිනාං ගුණවෙදිනා

(iii) දවුල්දෙණග්‍රාමජෙන ඥානෙශ්වරෙණ භික්ෂුණා
ප්‍රියතිෂ්‍යමහානෙතුරචිතෙයං ගුණස්මෘතිඃ.

# ජීවිත සමරු සටහන

**උපත :**

ක්‍රි.ව. 1880 ජුනි 16
මව : ඒකනායක මුදියන්සේලාගේ මුතුමැණිකේ
පියා : වීරවන්නි මුදියන්සේලාගේ අප්පුහාමි වෙදමහතා

**පැවිද්ද :**

1890 මැයි 26
ආචාර්ය : පනාකන්නියේ අමිතසාර මහාස්ථවිර
උපාධ්‍යාය : විදුරුපොළ රතනජෝති මහානායක ස්ථවිර

**පාරිවෙණික අධ්‍යයනය :**

ඇරඹීම : 1895 පෙබරවාරි 22

**ප්‍රථම ග්‍රන්ථකරණය :**

1897 පෙබරවාරි 27, වයස අවුරුදු 17 දී
ග්‍රන්ථය : දෘෂ්ටාන්තශතක සන්නය

**උපසම්පදාව :**

1899 අගෝස්තු 18 විදුරුපොළ දී

**ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයෙන් සමත්වීම :**

1903 දී තෑගි සහිතව

**උපාධ්‍යායයන් වහන්සේගේ අභාවය :**

1905 අප්‍රේල් 25

**ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් සමත්වීම :**

1905 තෑගි පහක් සහිත ව

**ප්‍රාචීන අවසාන පණ්ඩිත විභාගයෙන් සමත්වීම :**

1910 තෑගි සහිත ව

**මහානායක පදප්‍රාප්තිය :**

1911 පෙබරවාරි 26, තුප්පිටියේ තපොධනරාමයේ දී

**පණ්ඩිත උපාධිය ලැබීම :**
ස්වර්ණමුද්‍රිකාව සහිත ව, 1911 නෙවැම්බර 04

**"විනයවාදිනී" කාරක සභාව ඇරඹීම :**
1913 පෙබරවාරි

**භාරතීය මහා පණ්ඩිත සම්මේලන නියෝජනය :**
1919 නොවැම්බර 06 — 09

**හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථමාලාවේ ප්‍රථම සංස්කරණය :**
1921 නෙත්තිප්පකරණට්ඨකථා. සංස්කරණය කළ ග්‍රන්ථ 13 කි.

**'පඤ්චවිංශතිපූර්ති' මහොත්සවය :**
1936 පෙබරවාරි 26, බඹරකැලේ ශ්‍රී මහා විහාරයේ දී

**විද්‍යාලංකාර ධර්ම සංගායනාවේ මුලසුන දැරීම :**
1953, විද්‍යාලංකාර පිරුවන්හි දී

**බුරුම ඡට්ඨසංගායනාවේ උත්තරීතර සභාවේ සභාපති පදවිය :**
1954 මැයි

**නිධන ප්‍රාප්තිය :**
1954 දෙසැම්බර් 10

# විදුරුපොල පියතිස්ස මාහිමි

## 1 පරිච්ඡේදය

## උඩරට අමරපුර නිකාය

### සම්භවය හා ව්‍යාප්තිය

### I

ධර්මාශෝක අධිරාජයාගේ ධර්මවිජය ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක් ලෙසින් ලංකාදිවට බුද්ධසමය සම්ප්‍රාප්ත වීමෙන් මිහිඳු මහරහතන් වහන්සේ මෙරට ඇරඹූ සිංහල භික්ෂුවංශය ප්‍රචලිත වූයේ මහාවිහාරීය භික්ෂුවංශය ලෙසිනි. ශ්‍රී ලංකාවේ ප්‍රතිෂ්ඨාපිත වූ එම භික්ෂුවංශය මෙරට සමාජ ජීවිතයට ප්‍රාණ වායුවක් විය. ආගමික, සාමාජික හා දේශපාලනික, ශුභසාධන ක්‍රියාමාර්ග යෙහි ලා උත්සුක වූ සඟපරපුර ආර්ජීක වූත්, අවිහිංසාවාදී වූත්, නමෝකරණ යක් ඇතිකරවාලීමට සම්මා ආජීවය සඳනාම් කොටගත් එම දේශනා මාර්ගය එහල් කොට දූන්හ. සමාජ පසුතලය තුළ බුදුසමයේ ආලෝකය ලබා දීමට උත්සාහ ගත් සංඝ සංස්ථාව වෙතින් උත්තුංග ගුණධර්ම රැසක් පහළ විය. ලෝක ධර්මතාවට අනුව ශ්‍රී ලංකාවේ සංඝ සමූහයා අතර ද කලින් කල පරිහානිකර ලක්ෂණ විද්‍යමාන විය. ආභ්‍යන්තරික හා බාහිර හේතු සාධක මුල් කොටගෙන ඊතු වූ ශාසනික අවනතිය දුරලීම සඳහා විටින් විට පහළ වූ ශාසනමාමක බුද්ධපුත්‍රයන් වහන්සේලා උත්සුක වූහ.

පෘතුගීසීන්ගේ ආගමනයෙන් පසු මෙරට බුදුසසුනට බලවත් ප්‍රහාර රැසක් ම එල්ල විය. ඔවුන්ගේ ආගමික ප්‍රතිපත්තියේ අශුභවාදී ප්‍රතිඵල රාශියක් දිස්විය. බෞද්ධයන්ගේ හා හින්දූන් ගේ වන්දනා ස්ථාන විනාශ කොට ඒවා කොල්ලකා ඒවායේ ආදායම් මාර්ග ඒවාට අහිමි කිරීම පෘතුගීසි ආගමික ප්‍රතිපත්තියේ එක් පැත්තක් පමණි.[1]

මහනුවර අවධිය වනවිට දේශපාලන තන්ත්‍රය තුළ උග්‍ර අර්බුද පැන නැගිණ. විදේශීය ආධිපත්‍යයට මුහුදුබඩ ප්‍රදේශ අවනත විණ. සිංහල රාජ්‍යයට අයත් ව තිබුණු සිංහාසනය නායක්කර් වංශිකයන් සතුවිය. මහාවිහාරීය සංඝ පරම්පරාව නෂ්ටප්‍රායව අපුබුද්ධ පිරිසකට පෞරාණික පාරිශුද්ධස්ථාන මෙන්ම සමාජයේ මාර්ග දේශකත්වය ද හිමි විය.[2]

මෙබඳු සමයක දී ය වැලිවිට සර්වඥපුත්‍රයන් වහන්සේ පහළ වූයේ. කීර්ති ශ්‍රී රාජසිංහ (ක්‍රි.ව. 1746 — 1779) රජදවස මෙරට යළිත් උපසම්පද විනය කර්මය සිදුකරවීමට වැලිවිට හිමිපාණන් වහන්සේට හැකි විය. බෞද්ධ බලය මර්දනය කළ ද ලන්දේසීහු උඩරට මිෂනාරීන්ගේ බලය බිඳිනු වස් සියාම දේශයෙන් උපාලි මහා ස්ථවිර ප්‍රමුඛ භික්ෂූන්වහන්සේලා එක් විසිනමක් වැඩමවා උපසම්පද විනය කර්මය කරවීමට සහයෝගය දුන්හ. මෙහිදී පළමුව උපසම්පදව ලැබූ වැලිවිට තෙරණුවෝ මෙරට ශාසන ප්‍රදීපය දැල්වූහ. මෙතුමන් සංඝරාජ පදවිය ලැබීමෙන් ශාසනික මෙහෙවරෙහි අතිශයින් ම ප්‍රශංසනීය ඓතිහාසික පිටුවක් පෙරළිණ.

ලක්දිව බෞද්ධ අයිතිවාසිකම් ආරක්ෂා කර දීමටත්, සුපරිශුද්ධ මහණ උපසම්පදව ඇතිකරවීමටත්, වැලිතර ඤාණවිමල තිස්සාභිධාන ස්වාමීන්ද්‍රයන් වහන්සේ බුරුම රටට වැඩ අමරපුරයේ දී ඤාණාභිවංස මහාධම්ම රාජාධි රාජගුරු සංඝරාජ මාහිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් මහා විහාර පරම්පරානුගත සුපරිශුද්ධොපසම්පදව ලබා ලක්දිවට වැඩම කළහ. මෙතුමෝ පූර්වෝක්ත සංඝරාජයන් වෙත නැවති ධර්ම විනයාදිය හදරා පරමාර්ථධර්ම දේශනායෙන් ප්‍රසාදයට පත් මහරජු විසින් පුදන ලද ත්‍රිපිටක පෙළපොත්, අටුවාටීකාදිය රැගෙන ශ්‍රී ලංකාවට වැඩම කළසේක.[3] බුරුම දේශයේ ශ්‍රද්ධාබුද්ධිසම්පන්න මහරජවරුන්ගේ රක්ෂාවරණ ගෝපනය ලබමින් පැවති සිංහල භික්ෂුවංශය නැවත මෙරට ප්‍රතිෂ්ඨාපිත කරවීමෙන් පසු අමරපුර නාමයෙන් හඳුන්වනු ලැබී ය.

"1802 දී අඹගහපිටියේ ඤාණවිමල තිස්ස හිමි අමරපුර නිකාය පිහිට වූහ" යනුවෙන් මහාවංශය[4] ඇතුළු බොහෝ මූලාශ්‍රවල එතත් ඇතැමුන් එය අවුරුද්දකින් කෙටි කොට ක්‍රි.ව. 1803 ට හෙළාගනිති.[5]

1. පරංගි කෝට්ටෙ, පි: 190
2. ශ්‍රී ලංකා අමරපුර වංශය, පි: 8
3. ශ්‍රී අ ව , පි: 09
4. මහාවංශය, පි: 732
5. අභිනව සංග්‍රහය, පි: 14

වැලිතර අඹගහපිටියේ ඤාණවිමලතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේ අමරපුර නිකාය පිහිටුවීමෙන් පසු සියම් නිකායේ පහතරට සංඝනායක පදවිය දැරූ කපුගම ධම්මඛන්ධ ස්වාමීන්ද්‍රයන් වහන්සේ අමරපුර නිකායෙන් ලෝක සාසන දෙකට සිදු කරන සේවය බෙහෙවින් අගය කළහ. ඤාණවිමලතිස්ස හිමිපාණන් වහන්සේගේ අනුමැතිය ලත් කපුගම ධම්මඛන්ධ හිමිපාණෝ, ධම්මරක්ඛිත, ධම්මදින්න, ගුණරතන, සුමන යන භික්ෂූන් හතර නමක් ද සංඝතිස්ස, ජනානන්ද යන සාමණේර දෙනමක් ද, කැපකරුවන් කිපදෙනෙකුන් ද කැටුව බුරුම රට අමරපුරයට වැඩම කළහ. මහාමංගල සීමාවේ දී ඤාණාභිවංස ධම්මසේනාපති සංඝරාජයන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් පුන ශික්ෂාව ලබා ක්‍රි.ව. 1809 දී ලක්දිවට වැඩ මහණ උපසම්පදා පුන ශික්ෂා කර්ම කිරීමෙන් අමරපුර නිකාය සංවර්ධනය කළ සේක.[6] කපුගම ධම්මඛන්ධ හිමිපාණන් වහන්සේට බුරුමරට සංඝරාජ මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන සංඝසභාව විසින් පිරිනමන ලද සද්ධම්ම වංසපාල මහා ධම්ම රාජාධිරාජගුරු යන ගෞරව නාම සම්මුතිය ගැන සලකා මේ සංඝ පරම්පරාව අමරපුර සද්ධම්මවංස නිකාය නම් විය.[7]

අමරපුර නිකාය මගින් ප්‍රතිෂ්ඨාපිත සාසන ප්‍රදීපස්තම්භය පුනරාලෝක වත් කිරීමට බෝධිසත්වගුණෝපේත බෝගහපිටියේ ධම්මජෝත්‍යභිධාන මා හිමිපාණෝ උපස්තම්භක වූහ. කොස්ගොඩ ගල්වෙහෙර බෝගහපිටිය නම් ග්‍රාමයෙහි ඉදිරිමුනි හෙන්ද්‍රික් ද සෝසා මහතා සහ ඒම මහත්මාවගේ කණිෂ්ඨ පුත්‍ර වැ ක්‍රි.ව. 1783 දී මෙලොව එළිය දුටු පින්වත් කුමරුවාය පසු කල මේ නමින් පතළ වූයේ.[8] මේ කුල කුමරුවන් පැවිදි බවට පත් වූයේ දසවසර ගතවන විටයි. වැලිවිට අසරණ සරණ සරණංකර සඟරාජ මා හිමියන්ගේ ප්‍රශිෂ්‍යවරයෙකු වූ කොස්ගොඩ වැලිතොට්දේ ශ්‍රී සුධර්මාරාමාධිපති ව වැඩ විසූ ඉන්ද්‍රවිමලතිස්ස මහා ස්ථවිරපාදයන් වහන්සේ සහ ලක්දිව ප්‍රථම වරට අමරපුර නිකාය පිහිටුවා වදාළ වැලිතර ඤාණවිමලතිස්ස මහා ස්වාමීන් වහන්සේත් සමඟ බුරුම රටට වැඩම කොට පෙරළා පැමිණි බෝගහවත්තේ ජයතුපිනතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේ යන සංඝනෝත්තම වරයන් වහන්සේලාගේ ශිෂ්‍යවරයකු ලෙසින්[9] ඉහත සඳහන් උත්තම කුල කුමරුවා බෝගහපිටියේ ධම්මජෝති නමින් පැවිදි භූමියට පත්විය.

බෝගහපිටියේ ශ්‍රී ධම්මජෝති හෙරණපාණන් බුරුම රටට වැඩම කෙළේ සාමණේර අවධියෙහි දී ය. මෙය සිදුවූයේ (බු.ව. 2349) ක්‍රි.ව. 1806 දී ය. මෙතුමන් සාමණේර අවධියේ දී ම සිංහල, පාළි, සංස්කෘත භාෂා ශාස්ත්‍රයන් ඉගෙනීම කෙළේ එවකට පහතරට සිටි පාණ්ඩිත්‍යයෙන්

---

6. ශ්‍රී අ ව. පි: 10
7. බුද්ධ ශාසන කොමිෂන් වාර්තාව. පි: 44
8. වැලිතොට. පි: 70
9. ශ්‍රී විමලබුද්ධි ප්‍රශස්ති. පි: 146

ප්‍රසිද්ධ වූ වීරඹලේ ගුරුතුමන්ගෙනි.[10] බෝගහපිටියේ හෙරණපාණන් වහන්සේ මුම්මදේශය බලා සමුද්‍රතරණය කිරීමේ දී සීලානන්ද, ධම්මරක්ඛිත, විමලසාර, ගුණරතන, අත්ථදස්සී යන හෙරණවරු ද ගමන් කළහ. එසේ ම ජයතුජිනතිස්ස හිමිපාණෝ ද ඒ සමඟ වැඩම කළහ.

> ''එක දිනක් ආගන්තුකාවාසයෙහි කල් ගෙවූ ධම්මජෝති හිමියන් ප්‍රධාන පිරිස උපසම්පද වීමට කැමති බවට මහරජතුමන්ට දන්වූ පසු එයට අවශ්‍ය සියලු පරිෂ්කාර රාජ මන්දිරයෙන් ලැබෙන්නට සලස්වා සංඝරාජ හිමිතුමන් වහන්සේට දන්වා යැවූ කල්හි උන්වහන්සේ ප්‍රමුඛ පන්තිස් නමක් පමණ භික්ෂු සංඝයා වහන්සේ සුධර්ම ශාලාව සමීපයෙහි වූ රත්න චෛත්‍යයෙන් සමලංකෘත ස්වර්ණගුහා නම් ත්‍රිවිධ සම්පත්ති යෙන් යුත් බද්ධසීමාවට රැස්ව ධම්මජෝති හිමියන් සහිත උපසම්පද පේක්ෂකයන් ගිහිවෙස් ගන්වා, පැවිදි කරවා, පළමු කොට සංඝරාජ මා හිමිතුමන් වහන්සේ උපාධ්‍යාය කොට සාසනානුස්සාන විහාරවාසී තෙරුන් වහන්සේ ද, රතනභූමි රම්ම විහාරවාසී තෙරුන් වහන්සේ ද, රවිවංසකිත්ති සුරාමච්ච විහාරවාසී තෙරුන්වහන්සේ ද, යන තෙරුන් වහන්සේලා කම්මවාචා භාණකාචාරියව බු.ව. 2351 පොසොන් අව තෙළෙස්වක් ලත් කිවිදින බෝගහපිටියේ ධම්මජෝති හිමියන් උපසම්පද කළහ.''[11]

මේ උන්වහන්සේගේ උපසම්පදව ගැන එන සටහනයි. එහි සඟරජ හිමි තුමන් වෙත පස්වර්ෂයක් ම වැස විනය පිටකය හදාරා උභතොවිභංග වාචනා ධරව නිස්සයමුත්තක වූහ. උපසම්පදවෙන් නිස්සයමුත්තක සම්මතය ලබන තුරු ධම්මජෝති හිමියෝ උභතෝවිභඞ්ගය සහ අටුවා ටීකා සහිත විනය පිටකය ද අර්ථ වශයෙන් ඉගෙන ගැඹුරු තැන් ද විචාරා අභිධර්මාර්ථ සඞ්ග්‍රහව හා විභාවිනී ටීකාව ද පට්ඨාන ප්‍රකරණය ද, අටුවාව ද, අර්ථවශයෙන් ප්‍රගුණ කළහ.[12] උන්වහන්සේ ලක්දිව බලා පිටත්වීමෙහි දී අතිශයින් ම ගෞරවාචාර දක්වූ රජතුමා අට්ඨකථා, ටීකා, ප්‍රකරණ සහිත පොත් රාශියක් ද, ''වේද විනිශ්චය'' නම් කෘතිය ද පරිත්‍යාග කොට ලක්දිව බුදු සසුන බබළ වන්නට සමත් වේවා'යි ආශීර්වාද ද කෙළේ ය. මෙම කරුණු විස්තර වශයෙන් සඳහන් සන්නස් පත්‍රය බුද්ධවර්ෂ 2354 ඉල් මස අව විසේනිය ලත් බුද දිනයෙහි ප්‍රදානය කරන ලදි.[13]

---

10. වැලි, පි: 71
11. වැලි, පි: 71
    බු. ව. 2350 දී ධම්මජෝති හෙරණපාණන් උපසම්පද වූ බව ''සම්පාතික යෙහි බෞද්ධාචාර්යයෝ'' නමැති කෘතියෙහි දක්වේ. පි: 46
12. වැලි, පි: 72
13. වැලි, පි: 73

සියරටට වැඩි ධම්මජෝති හිමිපාණෝ බෝගහපිටියේ කන්දේ විහාරයෙහි විසූහ. සංවරශීලීත්වයෙන් ද, ප්‍රභාවිත බුද්ධියෙන් ද, යුක්ත වූ ධම්මජෝති හිමිපාණෝ සාසනික සේවය කඳු රටට යොමු කළහ. උන්වහන්සේ එම ප්‍රදේශවලට වැඩම කෙළේ වැලිතර ගුණරතන, වස්කඩුවේ ශ්‍රී රාහුල ආදී ධර්මානුධර්මප්‍රතිපන්න වූ විනය විශාරදත්වයට පත් විනීත යතිවරයන් වහන්සේලා කැටුවයි. මේ ඒ ගැන සඳහන් වන අයුරු යි :

> "මේ ගමන හුදු ශාසනාලය පෙරදැරිව නිශ්ශරණාධ්‍යාශයෙන් ම ආරම්භ කිරීමේ උදාර පරමාර්ථය නිසාදෝ තමන් බලාපොරොත්තු වූවාටත් වඩා හොඳින් ඉක්මනටත් පැතිරී ගියේ ය. එද ගමන් බිමන් යෑම අතිශය දුෂ්කර කාර්යයක් ව පැවති නිසා හැම කටයුත්තක් ම මහත් ආයාශයෙන් ම කළ යුතු විය. ගිරි දුර්ග වන දුර්ගවලට මුහුණ දෙමින් ජීවිතයත්, මරණයත් අතර කෙරෙන මහත් සටනක් සේ මේ කටයුතුවල ව්‍යාවෘත වීමට සිදුවිය. එහෙත්, මේ වීරෝදාර මාහිමිවරුන් ශාසනෝද්දීප්තිය උදා කිරීමේ පරම පවිත්‍ර චේතනාවෙන් ම කර ගෙන ගිය මේ උසස් සේවාව කෙරෙහි ගිහි පැවිදි හැමගේත් සිත් යොමු වන්නට විය. **මහවලතැන්න, එක්නැළිගොඩ, ඉද්දමල්ගොඩ, රඹුක්පොත, මොලමුරේ, එල්ලාවල, ඇලපාත, වාරිගම් නිලමේ** ආදී ප්‍රභූවරු මිහිඳු මහරහතන් වහන්සේගේ කාලයෙන් පසු මේ රටට පහළ වූ ශ්‍රේෂ්ඨතම ධර්මදූතයන් වහන්සේලා මුන්වහන්සේලා යයි පවසමින් දායකවරුන් වශයෙන්, මේ ව්‍යාපාරය විටා එක්රොක් වන්නට වූහ."[14]

ශ්‍රී ලංකාවේ උඩරට ප්‍රදේශයේ අමරපුර වංශය පැතිර යෑමේ දී මල්වතු අස්ගිරි උභය විහාරයෙහි භේදය ද ඉවහල් වන්නට ඇත. අස්ගිරි විහාරයේ "**යටන්වල**" නම් මහා නායක හිමියන් අසීමාවේ දී පවා උපසම්පද කළාට වරදක් නැතැ'යි පළ කළ ප්‍රකාශයට විරුද්ධ ව මල්වතු විහාරයේ මහ නා හිමියන් ඇතුළු තත් විහාරීය භික්ෂූන් බලවත් විරෝධයක් දක්වා ඇත.[15] ක්‍රි.ව. 1826 — 1836 අතර අස්ගිරි විහාර පාර්ශ්වයේ **මහා නායක** පදවිය දැරුවේ අතිගරු යටන්වල සිරි සුනන්ද මහානායක මා හිමිපාණන් වහන්සේ ය.[16]

**රඹුපොළ, හුණුවල** ගම්හි සංජාත වූ කුලකුමාරුවෝ දෙදෙනෙක් මුන්වහන්සේගේ ආචාර්යත්වයෙන් පැවිදි වූහ. රඹුපොළ **සුජාත**, හුණුවල **නන්ද** යන තෙරවරුන් නමින් ප්‍රචලිත වූවෝ එකී දෙදෙනා වහන්සේ ය.

---

**14.** ශ්‍රී වි ප්‍ර. පි: 148

**15.** සරණංකර සංඝරාජ සමය, පි: 272

**16.** බුකොවා, පි: 32
(1824—07—27 සිට 1835—01—17 දක්වා අතිගරු යටන්වල මාහිමිපාණන් වහන්සේ මහා නායක පදවිය දැරූ බව 'ශ්‍රී ලංකාවේ නිකායන් පිළිබඳ තොරතුරු' නමැති කෘතියෙහි දක්වේ. පි: 04)

"එවකට මහනුවර ශ්‍රී භයගිරි මහා විහාරාධිපති ව වැඩ විසූ අතිගරු මහා නායක මා හිමියන් වහන්සේ සමයෙහි මහනුවර ශ්‍රී පුෂ්පාරාම විහාරයෙහි ඇති වූ සීමා සඞ්කරය හේතු කොට ගෙන සංවේගයට පැමිණීමත් එවකට විසූ සියම් නිකායේ අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති නිසාත් ඒ භික්ෂූන් ගැන ඇති වූ කලකිරීම නිසා අතිගරු රඹුපොල මා හිමියන් වහන්සේ සියම් නිකායෙන් ලැබූ උපසම්පදාව ප්‍රතික්ෂේප කරන්නට විය."[17]

බෞද්ධ බලයෙහි තව දුරටත් දැක්වෙන විස්තරයක් මෙසේ ය :

"අති පූජනීය බෝගහපිටියේ ශ්‍රී ධම්මජෝති මා හිමිපාණන් වහන්සේ උපාධ්‍යාය කොට ගෙන රඹුපොල ශ්‍රී සුජාත මා හිමිපාණන් වහන්සේ ප්‍රමුඛ තමන් වහන්සේගේ හිත මිතුරු සියම් නිකායික භික්ෂූන් වහන්සේලා අටළොස් නමකුත් ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 2379 (1836) වැන්නෙන් ඇසළ මස අව දෙළොස්වක් ලත් බුදදින නම්බපාන තොට උදකුක්ඛෙප සීමාවෙහි දී අමරපුර නිකායෙහි උපසම්පදාව ලැබූහ. ඒ භික්ෂූන් වහන්සේලා අතුරින් හැම අතින් ම උසස් භික්ෂූන් වහන්සේ රඹුපොල මා හිමිපාණන් වහන්සේ ය."[18]

මේ අවස්ථාවේ දී උපසම්පදාව ලත් පිරිස්වල ප්‍රමුඛවූවෝ **තෝලංගමුවේ, කොරනගොඩ, ඉද්දමල්ගොඩ, රඹුපොල** යන ගම්වල නමින් ප්‍රකට වූ පැවිදිවරුන් වහන්සේ ය.[19] අස්ගිරියේ යටන්වල මහ නා හිමිපාණන් වහන්සේගේ රාහුල නමැති ශිෂ්‍යයන් වහන්සේ ද මෙහි දී උපසම්පදාව ලත් බව දැක්වේ.[20] මෙසේ ශ්‍යාමවංශික භික්ෂූන් වහන්සේලා සහාය කොටගෙන බෝගහපිටියේ ධම්මජෝත්‍යාභිධාන මහා නායක තෙරණුවෝ උඩරට අමරපුර නිකාය පිහිටවූහ.[21] උඩරට අමරපුර නිකාය ආරම්භ කිරීමටත්, පෝෂණය කිරීමටත්, උඩරට ප්‍රදේශයේ සියම් නිකායික භික්ෂූන් වහන්සේලා රාශියක් උපස්තම්භක වූහ. එවක ලියන ලද ලිපියක මෙසේ සඳහන් වේ :

"මේ ලෝකානුකම්පා වාසගම ලියා ප්‍රසිද්ධ කළේ ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදහස් තුන්සිය සැත්තෑ නවයට පැමිණි වෘෂභ රවි විසිවෙනි දිනට සියම් සමාගමේ මෙතුවක් කල් සිට දෙවනුව අමරපුර සමාගමේ උපසම්පද උනු තුන්සිය හැත්තෑවක් පමණ, අපි සංඝයා විසිනි."[22]

---

17. බෞද්ධ බලය, (නව වන සාංවත්සරික වෙසක් කලාපය) පි: 126
18. බෞ: බ; (න: සා: වෙ: ක.) පි: 120
19. බුද්ධ ශාසන කොමිෂන් වාර්තාව, පි: 36
20. ඉතිහාස කථා, පි: 205
    වැලි, පි: 80
21. ශාසනවංශ ප්‍රදීපය, පි: 233
22. වැලි, පි: 81. ශ්‍රී වි ප්‍ර, පි: 148

අතිගරු ශ්‍රී ධම්මජෝති මා හිමිපාණන් වහන්සේ සබරගමු ප්‍රදේශයේ අමරපුර නිකාය ප්‍රචලිත කිරීමේ දී වරකාදණ්ඩේ අත්ථදස්සි හිමිපාණන් ප්‍රමුඛ භික්ෂු පිරිසක් උපසම්පදාව ලබා ඌව දිසාවට ගියහ.[23] වෙවැල්හින්නේ රතනපාල, අරියවංස, රේවත යන තෙරණුපාණන් වහන්සේලා පිරිසක් කැටුව හතර කෝරලයේ මාඹය උදකුක්ඛෙප සීමාවේ දී[24] බෝගහපිටියේ මහා නායක මා හිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් උපසම්පදාව ලබා ඇත.

"ධම්මජෝති නා හිමිතුමන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේ ඌව පළාතට වැඩමවා මිරහවත්ත සපුගහතැන්න, බළංගොඩ. සාංඝිකාරාමය, පස්සර ලෝකිත විහාරය, කටුගහ ලෙව්වෙ විහාරය, රඹුක්පොත විහාරය, සපූගොඩ විහාරය ආදී බොහෝ තැන්වල සීමා බන්ධනය කර බොහෝ කුල පුත්‍රයින් පැවිදි උපසම්පද කිරීමෙන් හා ධර්ම විනය ශබ්ද ශාස්ත්‍ර පුහුණු කරවීමෙන් ද, උඩරට අමරපුර නිකාය වර්ධනය කරනු සඳහා අධිකතර උත්සාහයක් දැරූහ."[25]

## II

**නිකාය ආරම්භ කළ තැන් සිට වර්තමානය දක්වා**
**මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා:**

### බෝගහපිටියේ සිරි ධම්මජෝත්‍යා'භිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

බෝගහපිටියේ හිමිපාණන් පරාර්ථචර්යාවෙන් උපශෝභිත වූ, ශික්ෂා කාමී සර්වඥ පුත්‍රයන් වහන්සේ නමකි. කඳුරට ශාසනෝද්දීප්තිය ඇති කළ මෙතුමෝ ධර්මානුධර්මප්‍රතිපන්න වූ භික්ෂු පිරිසක් ඇති කළහ. සීමා බන්ධන හා උපසම්පද විනය කර්ම ඇති කරමින් සබරගමු පළාතටත්, ඌව පළාතටත් සුවිශේෂ සේවාවක් කළ මෙතුමෝ සාසනය වෙනුවෙන් ජීවිතය පරදුවට තබා ක්‍රියා කළහ. ඌව ප්‍රදේශයේ දී ආගමික කටයුතුවල නිරත වී සිටි අතර රෝගාතුර වූ මුන් වහන්සේ තුළ ජන්මභූමියට යෑමේ දැඩි රුචියක් ඇතිවිණ. උඩරට ප්‍රදේශයේ භික්ෂූන් වහන්සේලාගේ බලවත් ශෝකය මැද බෝගහපිටියේ සිරි විජයාරාමයට වැඩි සේක.

ජීවිතයේ සන්ධ්‍යා භාගයේ දී ද අසාමාන්‍ය චිත්ත ධෛර්‍යයකින් හෙබි බුද්ධ පුත්‍රයෙකුගේ කාර්යභාරය ඉටුකළ යතිවරයාණෝ සීමාබන්ධන කාර්යයක් සඳහා රත්ගම මල්වැස්සගොඩ විහාරස්ථානයට වැඩමවා දින කිහිපයක් එහි නතර වූහ. රෝගයකින් අසාධ්‍ය වී බෝගහපිටියේ විහාරස්ථානයට වැඩම කරවන්නට වූහ. අකුරළ ගම වෙල්යාය පසු කරන්නට පෙර

23. වැලි, පි. 80
24. අභිනව සාසනවංසො, පි; 8—9
25. වැලි, පි; 81

අපවත් වූහ. අසූ පස්වසක් ආයු වැළඳූ මෙතුමන්ගේ ආදහන පූජෝත්සවය කොස්ගොඩ ජම්බුගස්හන්දිය සොහොන් බිමෙහි දී සිදු විය. මුන් වහන්සේගේ භෂ්මාවශේෂ තැන්පත් කොට ශ්‍රී විජය බෝධිරාජාරාමස්ථ භූමිභාගයේ සොහොන් ගැබක් ඉදි කෙරුණේ ය.[26] උඩරට අමරපුර මහා නිකායේ මහා නායක ධුරය දැරූ ආදිම පුරුෂෝත්තමයා මුන් වහන්සේ ය.

## රහුපොළ සිරි සුජාතාභිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

අති පූජනීය බෝගහපිටියේ සිරි ධම්මජෝතාභිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් පසු උඩරට අමරපුර මහා නිකායේ මහා නායක ධුරයට පත්වූවෝ අති පූජ්‍ය මහා විනායාචාර්ය **රහුපොළ සිරි සුජාතා'භිධාන** මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.

> "ශ්‍රී ලංකාවේ ඌව දිසාව බඳ බදුලු දිස්ත්‍රික්කයේ උඩුකිඳ කෝට්ඨාශයේ ගම්පහ කෝරලේ 'රහුපොළ' නම් ග්‍රාමය මේ යතිවරයන් වහන්සේගේ ජම්ම ග්‍රාමය වේ. මුන් වහන්සේගේ මව සහ පියා ද උසස් රදළ වංශිකයන් වූ බැවින් මේ කීර්තිමත් මහා යතිවරයන් වහන්සේ ද ශ්‍රෙෂ්ඨ රදළ වංශිකයෙක් ම වූයේ ය."[27]

එත්මන් ඌවෙ පරණගම රහුපොළ ගම්මානය නිජබිම් කොටගෙන භූපින්විත් කුල කුමරෙකු ලෙයින් උපත ලබා අස්ගිරි පාර්ශ්වයේ අති පූජනීය යටන්වල සිරි සුනන්දාභිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අන්තේවාසිකව පැවිදි වූ රහුපොළ සිරි සුජාත හෙරණපාණන්[28] මැනවින් සිප්සතර හදාළහ. යටන්වල මහා නායක මා හිමිපාණන් වහන්සේ වෙතින් ම පාළි, සංස්කෘත හා සිංහල භාෂාව ද, ඡන්දෝලංකාරාදිය ද, ජ්‍යොතිර් ගණිතය ද බොහෝ දුරට ඉගෙන ගත්හ.[29]

> "....උන්වහන්සේ සාමණේර බණ දහම් හා වැඩි දුරටත් ශබ්ද ශාස්ත්‍රෝද්ග්‍රහණය කළේ ස්වකීය ආචාර්යයන් වහන්සේගෙන් බවත් අධිශීල සංඛ්‍යාත උපසම්පත්තිය ලබා වදාළේ මහනුවර ශ්‍රී භයගිරි විහාරස්ථ උපොෂථාගාරයේ දී බවත් උන් වහන්සේගේ උපසම්පදාවේ දී උපාධ්‍යායයන් වහන්සේ වූයේත් ස්වකීය ආචාර්යයන් වහන්සේ වූ යටන්වල ශ්‍රී ඥානන්ද මහා නායක මා හිමියන් වහන්සේ බවත්.... උපසම්පදාවට පෙරත් උපසම්පදාවෙන් පසුත් උන් වහන්සේට සම්මත වූ

---

26. වැලි. පි; 83
27. බෞ ඛ. පි; 126
28. අ සා, මි: 12
29. බෞ ඛ, පි; 126

නාමය රහුපොල සුජාත කියා යි, උඩ අමරපුර මහා නිකායේ ආදි කර්තෘවරයන් වහන්සේ කෙනෙකු නාමින් හැඳින වදළේත් සුජාත යන නමින් වේ.''[30]

උඩරට අමරපුර මහා නිකාය ශෝභාමත් කළ අති පූජ්‍ය සිරි සුජාත මා හිමිපාණෝ සසුන් කෙතට වැඩ වඩමින් පොදු මහ ජනතාවගේත්, බෞද්ධ ජනතාවගේත් අතිශය ප්‍රසාදය දිනා ගත්හ. ගිරිදුර්ග හා වනදුර්ග තරණය කරමින් ශාසන සේවය සිදු කළහ. උන් වහන්සේගේ ප්‍රථම ශාසනික කාර්යය වූයේ බදුලු පුරාසන්න ඇකිරිය පළාත් ''කැකුලේඹය'' නම් නදියෙහි පළමු වන උපසම්පද මංගලොත්සවය කිරීම ය. දෙවන උපසම්පද පුණ්‍ය කර්මය පවත්වනු ලැබුවේ බදුලුපුර බදුලු ගඟේ මුතුරාවැල්ලේ උදකුක්ඛෙප සීමාවේ දී ය. ශ්‍රී බු.ව. 2388 දී (ක්‍රි.ව. 1845) මෙය සිදු වී ඇත.[31] බෝගහපිටියේ මා හිමිතුමන් වහන්සේ වැඩ සිටිය දී ම මේ සඳහා අනුමැතිය ලබා දුන් බව සිතිය හැක.

අතිගරු මාහිමිපාණෝ ඌව සබරගමු පළාත්වල සීමාබන්ධන රැසක් කළහ. අඹුපිටියේ වනවාසාරාමයේ සීමාබන්ධන විනය කර්මය සිදු කළ මෙතුමෝ දුම්බර සාරසිය පත්තුව හේවාහැට මීගමුව ආදී ඒ ඒ පළාත්වල ඒ ඒ කාලයන්හි පැමිණ සීමාබන්ධන උපසම්පද විනය කර්ම සිදු කළහ.[32] මෙතුමන්ගේ කාලයේ දී උඩරට ප්‍රදේශවල අතිශයින්ම අමරපුර නිකාය ව්‍යාප්ත විණ. එසේ ම ශෝභාමත් විණ.

> ''රහුපොළ ශ්‍රී සුජාතා'භිධාන මහා නායක මා හිමිපාණන් වහන්සේගේ කාලයේ දී මහනුවර ප්‍රදේශයේ උඩරට අමරපුර නිකායේ ආදි කර්තෘවරයන් වහන්සේ හැටියට සැලකෙන අංගොඩ ශ්‍රී සංඝානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ 1860 දී උඩරට අමරපුර නිකායට ඇතුළත් වූහ.''[33]

අති සම්භාවනීය රහුපොළ මා හිමිපාණෝ විවිධ ප්‍රදේශවල වැඩ සිටිමින් ශාසනය ජෝතිමත් කළහ. උඩරට අමරපුර නිකාය දියුණු කරමින් මෙතුමෝ කොට්ටඹුල්වල ගල් විහාරයේ වැඩ සිටි බව පෙනේ.[34] උන් වහන්සේ කෙටි කලක් රහුපොළ සිරි සුජාතාරාමයේ ද වැඩ සිටියහ. බදුල්ලේ අංදෙණියේ ගංගාරාමයේත්, හිඳගොඩ මහා තපෝධනාරාමයේත් උන්වහන්සේ බහුල වශයෙන් වැඩ සිටිමින් සාසනික අභිවෘද්ධියට හා නිකායික ව්‍යාප්තියට ඉමහත් සේවාවක් කළහ. රහුපොළ සිරි සුජාත

---

30. බෞ බ, පි; 127
31. බෞ බ, පි; 130
32. බෞ බ, පි; 131
33. ශ්‍රී සංඝානන්ද ගුණානුස්මරණ වාර්ෂික මංගල කලාපය.
34. සබරගමුවේ පැරණි ලියවිලි, පි; 109

ඒ හිමියන් බෝගහපිටියේ මා හිමියන් වැඩ සිටිය දී ම නිකායික කාර්යභාරය ඉටු කිරීමට සුදුසු වූහ. සිංහල විශ්ව කෝෂයේ එන මේ සඳහන එයට සාධක වේ :

"බෝගහපිටියේ තෙරණුවෝ ඌව පළාතේ අමරපුර නිකාය පාලනය කරනු සඳහා සුජාත තෙරුන්ට භාර කළහ."[35]

මෙයින් පැහැදිලි වන්නේ මහා නායක ධුරයේ කටයුතු බෝගහපිටියේ මාහිමි තුමන් සිටිය දී ම රඹුපොළ තෙරණුවන් සිදු කළ බවයි. බදුල්ලේ හිඳගොඩ මහා තපෝධනාරාමයේ දී මෙම පදවියට පත් වූ උන් වහන්සේ අපවත් වී වදළේ ද එහි දී ය.

මහා නායක ධුරයට පත් ව (බු.ව. 2420 දක්වා) ක්‍රි.ව. 1877 දක්වා මහා නායක ධුරය දරමින් සසුන් අඹර බැබළවූහ.[36]

## හුණුවල සිරි සාගතා'භිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

අති පූජ්‍ය මහා විනයාචාර්‍ය රඹුපොළ සිරි සුජාතා'භිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් පසු උඩරට අමරපුර මහා නිකායෙහි මහා නායක ධුරය දැරුවෝ මහෝපාධ්‍යාය හුණුවල සිරි සාගතා'භිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.[37] මුන් වහන්සේගේ නිජබිම වූයේ රත්නපුර ප්‍රදේශයේ හුණුවල ගම්මානය යි. අස්ගිරි විහාර පාර්ශ්වයෙන් ඉවත් වී උඩරට අමරපුර මහා නිකාය ආරම්භ කිරීමට පුරෝගාමී වූ එක් යතිවරයන් වහන්සේ කෙනෙකු වූ, සපුගොල්ලේ තපොධනාරාම මූල මහා විහාරයේ ආදි කතෘවරයාණන් වහන්සේ වූද හුණුවල ශ්‍රී නන්දාභිධාන මහා ස්ථවිරයන් වහන්සේගේ ද්විතීය ශිෂ්‍ය රත්නය ලෙසිනි සිරි සාගත හෙරණ පාණන් පැවිදි බවට පත් වූයේ. බෝගහපිටියේ සිරි ධම්මජොතා'භිධාන මහා නායක මා හිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් උපසම්පදාවට පත් මෙතුමෝ සිරි සුජාතා'භිධාන මහා නායක හිමිපාණන් වහන්සේගෙන් විනය කර්මාදිය පිළිබඳ අවබෝධය ලබා ගත්හ. ප්‍රාචීන භාෂාවන් පිළිබඳ පාහුල අවබෝධයක් ලබා සිටි ඒ හිමිපාණෝ උඩරට ප්‍රදේශයේ අමරපුර නිකායික භික්ෂූන් වහන්සේගේ සුප්‍රතිපන්න ගුණ දිවිපෙවෙත දිදුලවීමට මහත් මෙහෙයක් ඉටු කළහ. පා ගමනින් විනදුර්ගයන් තරණය කොට සසුන් කිසෙහි නිරත වූ මෙතුමන් පැවිදි, උපසම්පද විනය කර්ම රැසක් සිදු කොට ඇත.

---

35. සිංහල විශ්වකෝෂය, පළමු වැනි කාණ්ඩය, පි; 642
36. එම, පි; 236
37. වර්තමාන සිංහල කවීන්ද්‍රයෝ, කා 2, පි; 03
පඤ්චවිංශති පූර්ති මහොත්සව සභා, පි; 09

පුරාකෘත පුණ්‍ය මහිමයෙන් හා සංවරශීලිත්වයෙන් ද අතිශය සම්මාන නියත්වයට පත් වූ **සිරිසාගත** නා හිමි සඳාණෝ අති පූජනීයත්වයට පත් වූහ. සිරි සුජාතා'භිධාන නා හිමිපාණන් වහන්සේගේ නිකායික හා සාසනික කාර්‍යයන්හි ලා සම්පස්ථ ව ක්‍රියා කළෝ මෙතුමෝ ය. සපුගොල්ලේ විහාරස්ථානයේ මෙන්ම කලක් විදුරුපොළ ශ්‍රී සුමංගලාරාමයේ ද පැවති සිටි උන්වහන්සේ **තුප්පිටියේ තපෝධනාරාමයේත්** හිඳගොඩ **තපෝධනා රාමයේත්**, වැඩ වාසය කොට ඇත. මුන් වහන්සේගේ මහා නායක පදවි **ප්‍රාප්තිය සිදු වී ඇත්තේ තුප්පිටියේ තපෝධනාරාමයේ දී** ය.[38] 'ථෙර' සම්මුතිලාභි උතුමෙකු වූ සිරි සාගත මා හිමිපාණෝ අවසානභාගයේ දී **දැඩි ගිලන් බවට පත්වූහ.** උන් වහන්සේගෙන පසු මහා නායක ධුරයට පත් වූයේ විදුරුපොළ රතනජෝති හිමියෝ ය. ඒ බව ශ්‍රී රතනජෝති ස්ථවිර චරිතයෙහි මෙසේ දක්වෙයි .

> "ශ්‍රී සාගත මහා ස්ථවිරයන් වහන්සේ ද, වයෝවෘද්ධ ව දැඩි ගිලන් අවස්ථාවෙහි විදුරුපොළ ශ්‍රී රතනජෝති ස්ථවිරයන් වහන්සේ මහා නායක ධුරයට පත්කොට ස්වර්ග පරායණ වූ සේක."[39]

මෙයින් පැහැදිලි වන්නේ නිකායාභිවෘද්ධිය සැලකූ සිරි සාගත මා හිමිපාණන් වහන්සේ විසින් ම අනුප්‍රාප්තික උතුමෙකු භාරධුර කාර්‍යය සඳහා පත් කළ බවයි. මෙම පත් කිරීම සිදු වූයේ **තුප්පිටියේ තපොධනාරාම** විහාරයේ දී ය.[40]

## විදුරුපොළ සිරි රතනජොත්‍ය'භිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

තුප්පිටියේ තපෝධනාරාමාධිපති හුණුවල **නන්ද'භිධාන** මහ ස්ථවිරයන් වහන්සේගේ ශිෂ්‍ය කඹුරුගමුවේ සුමන ස්ථවිරයන් වහන්සේගේ ශිෂ්‍ය-වරයන් වහන්සේ ලෙසිනි, විදුරුපොළ **රතනජෝති හෙරණපාණන් වහන්සේ** පැවිදි වූයේ. විදුරුපොළ වීරවන්නි මුදලි පෙළපතේ **සියාතුරාල** හා එම **කුමාරිහාමි** මහෝපාසිකාවගේ පුතණුවන් වූ **වීරවන්නි** කුල කුමරුවන් ඉහත සඳහන් නාමිනි ප්‍රචලිත වූහ. මෙම කුමරු ජන්ම ලාභය ලැබුවේ 1836 දී ය.[41] වීරවන්නි දම්පතිහු සිය විදුරුපොළ වෙහෙර වත්ත' නාමැති භූමිභාගය සසුනට පුද ශ්‍රී සුමංගලාරාමය ගොඩ නගා කඹුරුගමුවේ මාහිමිපාණන් ඇතුළු සඟරුවනට පුද කළහ. විදුරුපොළ විහාරයේ දී පැවිදි වූ සිරි **රතනජෝති** හෙරණපාණන් වහන්සේ

---

38. ඉති, පි: 206
39. ශ්‍රී රතනජෝති මහා නායක ස්ථවිර චරිතය, පි: III
40. ඉති, පි: 206
41. වර්තමාන සිංහල කවීන්ද්‍රයෝ, කා; 02, පි: 02

මූලික අධ්‍යාපනය ලද්දේ **කොස්ගොඩ** ගණේගොඩැල්ලේ විජය සිරිවර්ධනාරාමාධිපති ව වැඩ විසූ පණ්ඩිතාචාර්ය ජිනවංස **පඤ්ඤාසාර** ස්වාමීන්ද්‍රයන් වහන්සේ යටතේ ය. මූන් වහන්සේ පාලි භාෂාව ආදි භාෂා ශාස්ත්‍රයන් මැනවින් ප්‍රගුණ කළ ප්‍රසිද්ධ ධර්ම දේශකයාණන් වහන්සේ නමක් ලෙසින් ප්‍රසිද්ධියට පත්වූහ.[42]

කපල්ලේවෙල **ශ්‍රී නාරද** මහා ස්ථවිරයන් වහන්සේ උපාධ්‍යාය කොට ගෙන ඌණුවිල **සාගත**, මඩිඅරාවේ **සුනන්ද**, කයිලගොඩ **සුමනතිස්ස** යන ස්ථවිරයන් වහන්සේලා කර්මාචාර්යත්වයෙන් විදුරුපොළ **රතනජෝති** හෙරණපාණෝ උපසම්පද වූහ.[43]

ධීරවීර ගුණයන්ගෙන් ද, සුපේසල ශික්ෂාකාමී විනීත ගුණයන්ගෙන් ද උඩ පහත දෙරටටම කීර්තිමත් වූ විදුරුපොළ **ශ්‍රී රතනජෝත්‍යා'භිධාන** මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ **රහුපොළ** මාහිමිපාණන් වහන්සේගෙන් විනය පිටකය හදරා ගම්භීර විනයධර උතුමෙකුව විසූහ.[44]

> "....මේ පින්වතුන් වහන්සේ දේහශ්‍රීයෙන් කුඩා සිරුරක් ඇතත් දුටුවන් වසඟ කරන විස්මය ජනක තේජාප්‍රතාපයක් හා ගැඹුරු මිහිරි කට හඬක් ඇති විචිත්‍ර ධර්ම කථික වූ විනයධරයාණ කෙනෙකි. සඞ්ඝාධිකරණ විනිශ්චයෙහි මහා බුද්ධිමත් විනිශ්චයකාරතුමෙකි.
>
> මෙතුමෝ අටළොස් අවුරුද්දක් මුළුල්ලේ උඩරට අමරපුර නිකායෙහි මහා සංඝනායක පදවිය උසුලමින් බුද්ධශාසනයාගේ ගෞරවය රැකගත්හ. දියුණුව සිදු කළහ. සෙසු සඟනට ආදර්ශයක්ම දැක්වූහ."[45]

පැවිදි උපසම්පද විනය කර්මයන්හි උපාධ්‍යාය ධුරය දැරූ සිරි රතන **ජෝත්‍යා'භිධාන** ස්වාමීන්ද්‍රයන් වහන්සේ **රහුපොළ** මහා නායක මාහිමිපාණන් වහන්සේගෙන් පෙරෙ සම්මුතිය ලත් උතුමෙකි.[46] ශ්‍රී සුධර්ම පාර්ශ්වයේ දමනන ධම්මානන්ද මා හිමිපාණන් වහන්සේට පෙරෙ සම්මුතිය දෙවා වදාළේ ද සිරි රතනජෝති මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේය.[47]

විශාල ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරක් ශාසනානුලෝමික ලෙය සාසනයට දායාද කොට දුන් මා හිමිපාණෝ ප්‍රථම වරට **නුවරඑළියේ** ප්‍රථම විහාරස්ථානය වූ **ශ්‍රී මහා විහාරය** ඇතුළු විහාරාරාම රැසක් බිහිකර වූහ. මේ මා හිමිපාණන් **නුවරඑළිය** ප්‍රදේශයේ ඉදිද බෞද්ධ පාඨශාලා ආරම්භ කෙළේ මිෂනාරි ක්‍රියාදාමය මුදුනට නැග පැවති වකවානුවේ දී ය.[48]

---

42. ශ්‍රී විප්‍ර. පි; 126
43. ශ්‍රී රතනව, පි; ii
44. ඉති; පි; 206
45. වසිංකා, කා; 02 පි; 02
46. වසිංක, කා; 02, පි; 03
47 බු. කො. වා, පි: 31
48. සරසවි සඳරැස, (ශ්‍රී බු: වර්ෂ 2445 මැයි මස 24 වන සිකුරාදා) පි; 03

අති පූජනීය රතනජෝති මා හිමිපාණෝ සමකාලීන කවීන් අතර වෙසෙසින් ප්‍රචලිත වූහ. උන්වහන්සේගේ කවිත්වය හා එම ශාස්ත්‍රයට සිදු වූ සේවාව වත්මන් කවියෙක් මෙසේ හඳුන්වයි :

''එතුමෝ ත්‍රිවිධ සම්පත්තියෙන් ආඪ්‍ය වූ කිවිඳෙක් ම වූහ. කලින් කල තැනූණු විචිත්‍ර කවි සිලෝ සමූහය ඒ ඒ දවස්හි පණ්ඩිත ජන සම්මතයට පාත්‍ර වී යයි ඉදු සිතින් පැවසිය හැකි නමුදු ඉන් වැඩිහරියක් සොයාගත නොහැකි වූයේ මෙයට සැත්තෑ වර්ෂයකට පූර්වයෙහි බඳිනු ලැබූ අභාවයට ගිය හෙයිනි. විශේෂයෙන් උඩරට ප්‍රදේශයෙහි වර්තමාන කවියන්ගේ ගුරුත්වයට අත්‍යන්තෝපකාර වූයේ මූන්වහන්සේගේ වැදගත් කෘතීන් බව අපක්ෂපාතී ව කිව යුත්තකි.''[49]

මූන් වහන්සේ විසින් රචිත පද්‍ය රාශියකි.[50] 'හුණුවල ශ්‍රී නන්ද' නමැති පද්‍ය නිර්මාණය ද මෙතුමන්ගේ කෘතියකි.[51] මේ එයින් උපුටාගත් එක පද්‍යයකි :

කාර   කොඳ මුතුහාර සරයුරු නිම්ල යස දස දෙසෙහි   දූපනළ
දී ර   තෙද බල විකුම් පළකළ සුරම්ගරද සිරින්   මංගල
සාර   ගුණමිණි හැර සුපැළැඳි කුළුණු අඳ යින් මචක   සරිගල
වී ර   උරසිරිවාස කර නිති වැජඹි යති නඳබිදම්   හුනුවල''[52]

සිරි රතනජෝති මහා නායක මා හිමිපාණන් 1905 අප්‍රේල් 25 දින අපවත් වී වදාළෙන් උඩරට අමරපුර මහා නිකායේ මහා නායක පදවිය හිස් විය. ඒ වන විට සිරි පියතිස්ස යතිවරයාණන් වහන්සේට වයස විසිහතර වසරක් විය. ඥාන වෘද්ධත්වයෙන් ද, තපෝවෘද්ධත්වයෙන් ද, තිස් වසරක් වූ කලය, උන් වහන්සේ සිව්නිකායික මහානායක ධුරයට පත් වූයේ. 1911 පෙබරවාරි 26 දින දී විනයවාදිනී කාරක මහා සංඝසභාවෙන් මෙම නිලය පුදන තෙක් උඩරට අමරපුර මහා නිකායේ මහා නායක පදවිය හිස්ව පැවතිණ.

''හුණුවල සාගත මහා ස්ථවිරයන් වහන්සේ ද, උන් වහන්සේගේ ඇවෑමෙන් විදුරුපොළ රතනජෝති මහා ස්ථවිරයන් වහන්සේ ද, පිළිවෙළින් මහානායක පදවිය දැරූහ. උන් වහන්සේගේ ඇවෑමෙන් මහා නායක ධුරය පුරප්පාඩු වී තිබුණු සාධූරුද්දෙහි බලංගොඩ දමහන ධම්මානන්ද නායක ස්ථවිරයන් වහන්සේත්, මොරහැල රත්නපාල මහා

49. වසිංක, කා; 02, පි; 04
50. ඌව ඉතිහාසය, පිටු: 42 - 43
51. මෙතෙක් අමුද්‍රිත මෙහි පුස්කොළ පිටපත විදුරුපොළ ශ්‍රී රතනජෝති පුස්තකාලයෙහි තැන්පත් වැ ඇත.
52. හුණුවල ශ්‍රී නන්ද, කව; 02

ස්ථවිරයන් වහන්සේත්, මහා නායක කෙනෙකුන්ගෙන් ඉටුවිය යුතු සියලු සංඝකර්ම විනය කර්මයෙහි ප්‍රධාන ව සංඝ පාලනය කළහ.''* මෙයින් පැහැදිලි වන්නේ වසර හයක් මුළුල්ලෙහි ධර්මවිනයධර සුපේසල ශික්ෂාකාමී යතිවරයන් වහන්සේලා සාමූහික ව නිකායික පාලන කටයුතු කළ බවයි.

''අප හිමිපාණෝ කවිශූරයින් කිහිපදෙනෙකුට ගුරු වූහ. උවදෙස් සඟරාව සහ අනිත්‍යාදි දර්ශනය යන කවි ගත් කළ වැලිකුඹුරේ පඤ්ඤානන්ද හිමියෝ පැවිදි සිසුවන් අතර අගතැන් ලත්හ.''[53]

විදුරුපොළ **රතනජෝති** මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ 1905 අප්‍රේල් 25 දින නිශාභාගයෙහි ස්වර්ගපරායණ වූ සේක.[54] මූන් වහන්සේ ක්‍රි.ව. 1888 — 1905[55] දක්වා උඩරට අමරපුර මහා නිකායෙහි **මහා නායක** පදවිය ඉසිලූහ.

## රාජකීය භදන්ත පණ්ඩිත විදුරුපොළ සිරි පියතිස්සා'භිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

පණ්ඩිත ජන සම්භාවනීය විද්වත් ජනශේඛරායමාන දේශදේශාන්තර ව්‍යාප්ත කීර්තියකින් හෙබි විදුරුපොළ සිරි **පියතිස්සා'භිධාන** මහානායක **ස්වාමීන්ද්‍රයන්** වහන්සේ සිරි රතනජොත්‍ය'භිධාන මහා නායක මා හිමිපාණන් වහන්සේගෙන් පසු උඩරට අමරපුර නිකායෙහි මහා නායක පදවියට පත් වූහ. මෙතුමන්ගේ ගිහිකල නාමය වූයේ ශ්‍රී වර්ධන යනුයි. **ශ්‍රී වර්ධන** කුල කුමරු වන්ගේ ඇදුරුපාණන් වහන්සේ විදුරුපොළ ශ්‍රී සුමංගලාරාමාධිශ්වර පනාකන්නියේ සිරි **අමිතසාරාභිධාන** ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.[56] උපාධ්‍යායන් වහන්සේ වූයේ විදුරුපොළ ශ්‍රී **රතනජොත්‍ය'භිධාන** මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.[57]

1903 — 1910 අතර වර්ෂයන්හි **ප්‍රාචීන භාෂොපකාර සමිතිය** මඟින් පැවැත් වූ ප්‍රාචීන විභාගයන්ට පෙනී සිටි මූන්වහන්සේ හැම විභාගයෙහි දී ම ත්‍යාග සහිත ව උසස් ලෙස සාමාර්ථ්‍යය ලබා **උභයශේඛර ස්වර්ණ මුද්‍රිකාවට** සුදුස්සකු වීමෙන් ලාංකික පඩි පරපුරෙහි ආරම්භකයා සේම එම පඩිවරයන්ගේ මුත්තාවලියෙහි අගතරල මිණ බවට පත් වූහ. 1919 දඹදිව **පූනා** නගරයේ පැවති **සමස්ත ඉන්දියා ප්‍රාචීන**

---

* බුද්ධ ශාසන කොමිෂන් වාර්තාව, XVIII වැනි සැසි වාර්තාව—1956, පි; 37

53. ව සිං ක, ක.; 02, පි; 04
54. ශ්‍රී රතන ච, පි; IV
55. ශ්‍රී නි කා තො, පි; 17
56. අ සාං පි; 17
57. වී සා අං, පි; 05

**පණ්ඩිත සම්මේලනයේ** දී 'බෞද්ධ න්‍යාය ශාස්ත්‍රය' පිළිබඳ මාගධි භාෂාත්මක ශාස්ත්‍රීය නිබන්ධනයක් ඔප්පු කිරීමෙන් සමස්ත ලංකාද්වීපයට ම ගෞරවයක් අත්කර දුන්හ.+

ශාස්ත්‍රීය වශයෙන් අද්විතීය වූ ප්‍රශස්ත සේවාවක් කළ* මෙතුමෝ 'වංශ කථා හා කාව්‍ය සාහිත්‍යය ද, ශබ්දකෝෂ මාධ්‍යය ද පරිපෝෂණය කළහ. පළමුවරට **ඉංග්‍රීසි – පාළි ශබ්දකෝෂයක්** ද නිර්මාණය කළහ. මේ එහි අගය පවසන විචාරක අදහසකි :

> "පෙර අපර දෙදිග පඬිවරුන් පාලි, ඉංග්‍රීසි අකාරාදි එකක් දෙසාක් පළ කළ නමුත්, ඉංග්‍රීසි—පාලි අකාරාදියක් නිපයා තැබීමෙහි ඔවුහු පවා අසමත් වූහ. ඒ අඩුව පූරවමින් නා හිමියන් ලිවූ ඉංග්‍රීසි—පාලි අකාරාදිය නූතන යුගයේ පෙරදිග පහළ වූ මහා පාලි පඬිවරයා විදුරුපොළ නා හිමියන් බව ලොවට පෙන්වා දෙයි."[58]

**භක්තිපඤ්චාශිකාවෙන්*** හා **කමලඤ්ජලී** භක්ති කාව්‍යයෙන් ද ප්‍රතිභාපූර්ණ කවිත්වය ප්‍රකට කළ අතර මා හිමිපාණෝ ත්‍රිපිටක ග්‍රන්ථ සංශෝධනය මගින් තම ධර්ම ශාස්ත්‍රීය සේවාව දීප්තිමත් කළහ.

රාජකීය භදන්ත පණ්ඩිත සිරි **පියතිස්ස** මාහිමිපාණන් වහන්සේ මහා නායක ධුරයට **විනයවාදිනී** කාරක සංඝ සභාව මගින් තෝරා පත්කර ගනු ලැබුවේ 1911 දී ය. ශ්‍රී රතනජෝත්‍ය'භිධාන මහා නායක හිමිපාණන් වහන්සේගෙන් පසුව හය වසරක් යනතෙක් පදවි ප්‍රදනයක් සිදු නොවී ඇත්තේ ඒ වන විට සිරි පියතිස්ස හිමිපාණන් වහන්සේ උපසම්පදාවෙන් ථේරවස්සික නොවූ නිසා විය හැකියි. තුප්පිටියේ **තපෝධනාරාම** සීමාවේ **දී** මහා සංඝයා වහන්සේ විසින් සිරි පියතිස්ස මා හිමිපාණන් වහන්සේ මහා නායක ධුරයට පත් කළහ.[59] ඒ 1911 පෙබරවාරි මස 26 වැනි දින සිදු වූවකි.

සාසනික හා ශාස්ත්‍රීය සේවාවන් රැසක් සිදු කළ රාජකීය භදන්ත පණ්ඩිත විදුරුපොළ සිරි **පියතිස්සා'භිධාන** මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් කෙරුණ ධර්මශාස්ත්‍රීය හා සාසනික සේවාව ඉදිරි පරිච්ඡෙද 7 – 9 තුළ විස්තර වේ.

රාජකීය භදන්ත පණ්ඩිත සිරි පියතිස්සා'භිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ 1911 පෙබරවාරි 26 දින සිට 1954 දෙසැම්බර 10 දින තෙක් තෙසාළිස් වසක් **උඩරට අමරපුර මහා නිකායේ** මහා නායක පදවිය ඉසිලූහ.

---

\+ සම්පූර්ණ විස්තර සඳහා මෙහි 10 වන පරිච්ඡේදය කියවන්න.

* උන්වහන්සේ පැරණි ග්‍රන්ථවලට ව්‍යාඛ්‍යාන සැපයීමෙන් ද, මහා කාව්‍ය, ඛණ්ඩ කාව්‍ය, චම්පු කාව්‍ය ආදී වශයෙන් නව කාව්‍ය කෘති නිෂ්පාදනයෙන්ද, භාෂා සාහිත්‍යයට විශිෂ්ට සේවාවක් කළහ. මෙහි පරිච්ඡේද 8, 9 තුළ එම විස්තර දක්වේ.

58. වීසා අං, පි. 25

* මෙම සංස්කෘත කාව්‍යය තවමත් මුද්‍රණය නොවූවකි. මෙහි ix වැනි පරිච්ඡේදය හා උපග්‍රන්ථය කියවන්න.

59 පඤ්ච, පි; 10

## නුවරඑළියේ ශ්‍රී විමලබුද්ධි මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

රාජකීය භදන්ත පණ්ඩිත විදුරුපොළ සිරි **පියතිස්සාභිධාන** මහා නායක **ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් පසු ව උඩරට අමරපුර නිකායේ** මහා නායක ධුරයට පත්වූවෝ නුවරඑළියේ ශ්‍රී විමලබුද්ධ්‍යභිධාන ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. **මුණසිංහ කේ. බණ්ඩාර** මහතාගේ සහ **කේ. ජී. ලූසිහාමිනේ** මැතිනියගේ පුත් රුවනක් ලෙසින් ඌව පළාතේ කන්දපල්ල කෝරළයේ කළුපහන නම් ගමෙහි උපත ලත් **ලෝරන්ස් අප්පුහාමි** කුල කුමරුවාණන් ය, ඉහත නාමයෙන් පැවිදිබව ලබා ප්‍රචලිත වූයේ. 1892 මැයි 26 දින උපත ලත් මෙම කුල කුමරුවන් සිරි **පියතිස්ස** මා හිමිපාණන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය රත්නය ලෙසින් නුවරඑළියේ ශ්‍රී **මහා විහාරයේ** දී පැවිදි බව ලැබූහ. **විමලබුද්ධි** හෙරණපාණෝ සිය ඇදුරුපාණන් වහන්සේගෙන් ධර්මවිනය හා ශබ්දශාස්ත්‍රයන් පිළිබඳ මනා අවබෝධයක් ලබා රත්මලානේ **පරමධම්මචේතිය** පිරිවෙනින් ද, ශාස්ත්‍රඥනය ලැබූහ. 1912 ජූනි මස 03 **දින** විදුරුපොළ **ශ්‍රී සුමංගලාරාම විසුද්ධබද්ධසීමාමාලකයේ** දී උපසම්පදාව ලැබූ අතර උපාධ්‍යායයන් වහන්සේ වූයේ සිය ආචාර්යයන් වහන්සේ ම ය. 1938 දී ථෙරසම්මුතිය ද, 1951 නාමසම්මුතිය ද, 1951 අනුනායක ධුරය ද, ලැබූ ශ්‍රී විමලබුද්ධි මා හිමිපාණෝ බෞද්ධ ආයතන රැසක් ගොඩනැගීමෙහි ලා ප්‍රතිෂ්ඨාධාර වූහ. විදුරුපොළ **ශ්‍රී රතනජෝති පුස්තකාලයක්**, **ශ්‍රී පියතිස්ස විද්‍යායතනයත්**, ධර්ම ශාස්ත්‍රීය සේවාවේ ප්‍රතිඵල දෙකකි. 1956 **භාරත** ධර්මදූත සේවයෙහි නිරත වූ මුන්වහන්සේ උඩරට ප්‍රදේශයේ සීමාබන්ධන විනය කර්ම රැසක් සිදු කරමින් සාසනාලෝකය ඇති කළහ.* නුවරඑළියේ **ශ්‍රී විමලබුද්ධි** හිමිපාණන් වහන්සේගේ සභාපතිත්වයෙන් යුක්ත විධායක සභාව පියතිස්ස මහ නා හිමිපාණන් වහන්සේගේ නිකායික පාලන කටයුතු වල දී අතිශයින් උපස්තම්භක වී ඇත.[60]

**සිරි පියතිස්සා'භිධාන** මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ධර්ම ශාස්ත්‍රීය සේවය සඳහා විවේක සුවය ලබාදීම මෙතුමන්ගේ ජීවිතයෙහි ප්‍රධානතම අරමුණ විය. **''හෙරණ සිඛ හා හෙරණ සිඛ විනය'** නම් ප්‍රාථමික

---

**60.** විසා අං: පි. 16

* **යටිරාවන ශ්‍රී නාරද හිමිපාණන් වහන්සේට අනුරාධපුර ශ්‍රී මහා බෝධි ආරක්ෂක රන්වැට බැඳවීමේදී උපදෙස් දුන් මහ නාහිමිපාණෝ මහියංගන ස්තූපරාජයන් වටා අයෝමය පහන්වැට කරවීමට එච්. එම්. මුතුමැණිකේ උපාසිකාවට අනුශාසනා කළහ.**

විනය ග්‍රන්ථය මනා ශුද්ධියකින් සකස් කොට එළි දක්වූහ.+ එයින් සසුන් මඟට එළියක් ලබා දුන්හ. සම්බුද්ධ ශාසනයේ චිරජීවිතයට මහඟු මෙහෙයක් ඉටු කළ මා හිමිපාණෝ වියත් ශික්ෂාකාමී භික්ෂු ශිෂ්‍ය පිරිසක් ද සසුනට දායාද කොට දුන්හ.

විදුරුපොළ ශ්‍රී සුමංගලාරාමයේ දී උඩරට අමරපුර මහා නිකායේ විනය වාදිනී කාරක සංඝ සභාවේ සම්මතයෙන් මහා නායක ධුරයට පත් වූ උන් වහන්සේ 1955.04.25 සිට 1979.09.23 දින තෙක් එම ධුරය ඉසිලූහ.

## රාජකීය පණ්ඩිත රුපහ සිරි සද්ධානන්දාභිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

සාසනවංසාලංකාර විනය විසාරද සිරි සුමන, නුවරඑළියේ විමලබුද්ධි මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් පසු ව මහා නායක පදවියට පත්වූයේ සිරි සද්ධම්මකිත්ති විනයාචාර්‍ය රාජකීය පණ්ඩිත රුපහ ශ්‍රී සද්ධානන්ද'භිධාන ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.

ලොකුබණ්ඩාර රත්නායක යන නමින්, වලපනේ රුපහ ගම්මානයේ උපත ලත් මෙම කුමරුවන්ගේ පියාණන් වූයේ යාලගමුවේ ගෙදර රත්නායක මුදියන්සේලාගේ පුංචිබණ්ඩාර රත්නායක නිළමෙතුමන් ය. රාසිංගොල්ලේ නවරත්න වීරසිංහ මුදියන්සේලාගේ උක්කුමැණිකේ උපාසිකාව මාතාව වූවා ය. රුපහ රජයේ විද්‍යාලයේ මූලික අධ්‍යාපනය ලත් මේ කුලකුමරුවාණන් තුළ දීප්තිමත් වූ අනාගතයකට තුඩුදෙන ගුණබර පින්බර ලකුණු පහළ වී තිබුණි. පැවිදි වීමේ අභිරුචියකින් කල් යැවූ රත්නායක කුල කුමරුවා රුපහ ශ්‍රී ජනානන්ද මහා විහාරස්ථානයේ දී ''සිරි සද්ධම්මවංසපාල සුමංගල, ඉලුක්වෙල සිරි සෝභිත හිමිපාණන් වහන්සේගේ ආචාර්‍යත්වයෙන් පැවිදි වී රුපහ සද්ධානන්ද නමින් ප්‍රකට විය. ඌවේ ගම්පහ විහාරගොඩ විහාරපාර්ශ්වයට අයත් වූ මෙතුමා මූලික බණ දහම් සිය ඇදුරුවරයන් වහන්සේලාගෙන් ඉගෙන ගනු ලැබීය.

පින්වත්තේ සද්ධර්මාකර පිරිවෙනින් මූලික අධ්‍යාපනය ලත් සද්ධානන්ද හෙරණපාණෝ 1925 දී උසස් අධ්‍යාපනය ලැබීමට විද්‍යෝදය පිරුවනට ඇතුළත් වී ධර්ම විනය හා භාෂාශාස්ත්‍රයන්හි ප්‍රවීණත්වය ලැබූහ. 1929 අවසාන වර්ෂයේ ප්‍රමුඛයා වී ස්‍යාමරාජ ත්‍යාගය ඇතුළු තෑගි රැසක් දිනා ගත්හ. 1926 දී ප්‍රාචීන අවසාන විභාගයෙන් සමත් වී රාජකීය පණ්ඩිත උපාධිය ද ලබා ගත්හ. 1930 දී රුපහ විද්‍යාවිලාස පිරිවෙන අරඹා මහඟු

+ මෙම ග්‍රන්ථය සිංහල සාහිත්‍යික කෘතීන් අතර මුල් ම යුගයට අයත් කෘතීන්ගෙන් එකකි. මෙය මුල්ම වරට සංස්කරණය කොට මුද්‍රණයෙන් පළ කෙළේ විමලබුද්ධි මාහිමිපාණන් යැයි සිතිය හැකිය. හෙරණ සිඛ පිටු දෙකක් හා එම විණිස පිටු තිස්හතරක් දැයි ඩිමයි පිටු 36ක් සපුරා සිටින්නකි.
ආර්. ඩබ්. සී. සලමන් අප්පුහාමි විසින් කොළඹ ''සත්සිළුමිණ'' යන්ත්‍රාලයෙහි මුද්‍රාපිත යි. මුද්‍රණය ක්‍රි. ව. 1911.

මෙහෙයක් සිදු කළ මුන් වහන්සේ උඩරට අමරපුර මහා නිකායේ විධායක කාරක සංඝසභාවේ ප්‍රධාන ලේඛක ධූරයට 1932 දී පත්වූහ. 1951 විනය වාදිනී කාරක සංඝ සභාවේ කාරක සාමාජික ධූරයට ද, 1973 දී නිකායේ අනුනායක ධූරයට ද, පත් වූහ. මුන් වහන්සේගේ මෙහෙයවීමෙන් හා ප්‍රධානත්වයෙන් ඇරඹුණු ශාස්ත්‍රීය කෘති අතර විද්‍යාවිලාස පාරිවේණික සංග්‍රහය වන 'ශ්‍රී වාගර්ථෝදය' සඟරාවත්, වලපනේ ශාස්ත්‍රීය සංගමයේ 'පහන' සඟරාවත්, බොහෝ කලක් පවත්වා ගෙන ගිය ශාස්ත්‍රීය කෘති වශයෙන් අගය කළ යුතු ඒවා ය. පුරාතන සම්භාව්‍ය සාහිත්‍ය කෘතියක් වන 'වාසවදත්තාව'ට නායක ස්වාමීන්ද්‍රයන් සපයා ඇති ව්‍යාඛ්‍යානය උන් වහන්සේගේ පාණ්ඩිත්‍යයට නිදසුන් කළ හැකි මහත්වපූර්ණ සාරගර්භ කෘතියකි.

විශාල ගිහි පැවිදි ශිෂ්‍ය පිරිසක් ඇති කළ නා හිමිපාණෝ නිකායික සාසනික කටයුතු නොපිරිහෙලා ඉටු කරමින් නිකායාභිවෘද්ධියට මහ මෙහෙයක් කළහ. 1980.01.26 දින සිට 1983.06.01 තෙක් මුන් වහන්සේ උඩරට අමරපුර මහා නිකායේ මහා නායක ධූරය හෙබවූහ.

## රාජකීය පණ්ඩිත කන්දේගෙදර ශ්‍රී සුමනවංසා'භිධාන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

රාජකීය පණ්ඩිත රූපහ ශ්‍රී සද්ධානන්ද'භිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් පසුව උඩරට අමරපුර මහා නිකායේ මහා නායක ධූරයට පත්වූවෝ කන්දේගෙදර ශ්‍රී සුමනවංසා'භිධාන ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. වියළුව කන්දේගෙදර යාපා මුදියන්සේලාගේ වන්නකුරාල හා රත්නායක මුදියන්සේලාගේ හීන්මැණිකේ යන දම්පතීන්ගේ පුතණු කෙනෙකුන් ලෙස 1916 අප්‍රේල් මස දෙවැනි දින 'අප්පුහාමි' නමැති පින්වත් කුල කුමරුවා උපත ලැබී ය. කුඩා දිවිපෙවෙතේ දී ම ගුණ'සින් හා නැණ'සින් යුක්ත වූ මේ කුමරා සැදැහැ බරවැ පැවිදි වීමට අභිරුචියක් දක්වී ය. කන්දේගෙදර සුමනවංස නමින් පැවිද්ද ලැබූ මේ සාමණේරවරයාගේ ආචාර්‍යවරුන් වූයේ විදුරුපොළ ශ්‍රී රතනජෝති මහා නායක මා හිමිපාණන් වහන්සේගේ අනුශිෂ්‍ය වූ කිරිඔරුවේ ශ්‍රී ප්‍රඥාසාර හිමිපාණන් වහන්සේ හා තොරතොට සිටි සුමනසාර හිමිපාණන් වහන්සේ ය. මෙම සාසනික පැවිද්ද සිදු වූයේ 1931 ජූනි 05 ද බණ්ඩාරවෙල කිනිගම න්‍යග්‍රෝධාරාමයේ දී ය. විදුරුපොළ සිරි පියතිස්ස මහා නායක මාහිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් හා පාරණගම සිරිනන්දාරාම, අලවතුගොඩ සිරිදේවරක්ඛිත, වලව්වත්තේ සිරි විමලධම්ම යන හිමිපාණන් වහන්සේලාගේ කර්මාචාර්‍යත්වයෙන් 1936 ජූලි මස 27 දින දී සුමනවංස හෙරණපාණෝ විදුරුපොළ ශ්‍රී සුමංගලාරාම මහා විහාරස්ථානයේ දී අධිශීල ශික්ෂා සංඛ්‍යාත උපසම්පදාව ලැබූහ.

ස්වකීය ආචාර්‍යයන් වහන්සේලාගෙන් මූලික අධ්‍යාපනය ලත් සුමනවංස හෙරණපාණෝ පින්වත්තේ සද්ධර්මාකර පිරිවෙනින් ද, කොළඹ විද්‍යෝදය පිරිවෙනින් ද, ගම්පහ විද්‍යාරවින්ද පිරිවෙනින් ද, උසස් අධ්‍යාපනය

ලැබූහ. 1949 **පණ්ඩිත උපාධිය** ලැබූ හිමිපාණෝ මහාචාර්ය රේරුකානේ **ශ්‍රී චන්දවිමල** ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් අභිධර්මය හදළහ. ගම්පහ **ලෝරන්ස් විද්‍යාලයෙන්** ඉංග්‍රීසි භාෂා කුසලතාව ලබා ගත් මෙතුමෝ **ගැස්පර්** නමැති ආචාර්යවරයාගෙන් **ද්‍රවිඩ භාෂාව** පිළිබඳ උසස් දැනුමක් ඇති කර ගත්හ. 1953 — 1957 දක්වා ඇටම්පිටියේ **විද්‍යාභූෂණ** පිරිවෙනෙහි ආධිපත්‍යය ලබා ආගමික හා අධ්‍යාපනික මෙහෙයක් සිදුකොට 1957 සැප්තැම්බර් 05 දින දකුණු කැබිල්ලේවෙල **ශ්‍රී සුධර්මෝදය** පිරිවෙන අරඹා ශාසනික අධ්‍යාපනික සේවාව තව තවත් ප්‍රචලිත කළහ. සිරි **පියතිස්ස** මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට **හේවාවිතාරණ ග්‍රන්ථ ශුද්ධියේ** දී මෙතුමෝ සහාය දීමෙන් අනුග්‍රහ දැක්වූහ.

උඩරට අමරපුර නිකායික **විනයවාදිනී** කාරක සංඝ සභාවේ සාමාජිකත්වයට 1954 ජූලි 05 දින පත් වූ මුන් වහන්සේ 1973 ජූලි 07 දින නිකායික **අනුනායක** ධුරයට පත්වූහ. 1973 සැප්තැම්බර් මස 27 දින **නාම සම්මුතියෙන් හා උපාධ්‍යාය** ධුරයෙන් ද, **ථෙර සම්මුතියෙන්** ද, පිදුම් ලදහ. 1983 ජූලි මස 14 දින උඩරට අමරපුර නිකායේ **මහානායක** පදවියට පත් සද්ධර්ම කීර්ති ශ්‍රී රාජකීය පණ්ඩිත **කන්දේගෙදර සිරි සුමනවංශ** මා හිමිපාණෝ සමස්ත ලංකා එක්සත් අමරපුර සංඝ සභාවේ උප සභාපති ධූරය ද හොබවති.

ධර්මානුධර්ම ප්‍රතිපදාවෙන් ප්‍රභාවිත වූ නිකායික පාලන කටයුතු මෙහෙය වන මාහිමිපාණෝ අමරපුර නිකායික සමගිය සඳහා විශාල මෙහෙයක් කරති.

අපවත් වී වදාළ අති පූජනීය මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා **උඩරට අමරපුර නිකායේ** සංවර්ධනයටත්, ලංකා සම්බුද්ධ සාසනයේ උද්දීප්තියටත් කළ සේවය වැනි සේවාවක් වර්තමාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ද, කරගෙන යති. උඩරට අමරපුර මහා නිකාය පිහිටු වූ අවධියේ දී ප්‍රචලිත වූයේ **ඌව අමරපුර නිකාය** නාමයෙනි.

> "මේ නිකායට උඩ පහත දෙරට වැසි බොහෝ මහා ස්ථවිරයන් වහන්සේලා විසින් 'ඌවේ අමරපුර නිකාය' යනු ව්‍යවහාර කර තිබේ. මීට හේතුව මේ නිකායේ මහා නායක ස්ථවිරයන් වහන්සේලා තුන් නමක් ම ඌව දියාවේ වැඩ විසූ බව මුත්, අන් කිසි හේතුවක් නොපෙනේ. මේ ගැන වැඩි සොයා බැලීමක් නොකළ කාලයෙහි මා විසින් පවා එසේ ලියා කියා ඇති බව පිළිගනිමි. නමුත් නිකාය ප්‍රතිෂ්ඨාපනය සම්බන්ධ වැඩිදුර කරුණු සෙවීමේ දී පුරාණ ලිපි ආදිය කියවන්නට ලැබීමෙන් 'ඌවේ අමරපුර නිකාය' යන ව්‍යවහාරය සම්පූර්ණයෙන්ම වැරදි බවත් 'උඩරට අමරපුර නිකාය යනු නිවැරදි ව්‍යවහාරය විය යුතු බවත් පෙනී ගියේ ය. පළමු කොටම නිකාය පිහිටුවීම සබරගමු දිශාවෙහි වූ බැවිනුත්, ඉන්පසු ඌව දිශාව, මධ්‍යම

දිශාව, සතර කෝරළය, සත් කෝරළය යන පළාත්වල පිළිවෙලින් ව්‍යාප්ත වූ බැවිනුත්, ඌව පමණක් වෙන් කොටගෙන නිකාය නාමය ව්‍යවහාර කරවන්නට නම් ඉහත කී සෑම පළාතක් ම හැර දමා ඌවේ පමණක් වෙනම අමරපුර නිකායක් පිහිටි බවට කරුණු තිබිය යුතුයි.''[61]

යනුවෙන් සිරි පියතිස්ස නා හිමියන් පවසා ඇත. **උඩරට අමරපුර මහා නිකායේ** සම්භවය හා ව්‍යාප්තිය පිළිබඳ ව ඇතැම් කරුණු මෙමගින් හෙළි වන අතර පසු කාලයේ නිකාය නාමය 'උඩරට අමරපුර නිකාය' නමින් වෙනස් කළ ආකාරය ද පැහැදිලි වේ.

''උඩරට පළාත්වල අමරපුර නිකාය පැතිරයත්ම 'උඩරට අමරපුර නිකාය' යි ව්‍යවහාරයට පැමිණි යේ ය.''[62]
යනුවෙන් **සිංහල විශ්වකෝෂයේ** ද සඳහන් වේ.

වර්තමාන **උඩරට අමරපුර මහා නිකාය** ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 15 ක් තුළ පැතිරී ඇත. **භාරත දේශයේ** ද නිකායික භික්ෂූන් වහන්සේලා වැඩ වෙසෙති. ඒ වෙනුවෙන් නායක පදවියක් පත් කොට ඇත. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල මෙම නිකායික භික්ෂූන් වහන්සේලා ව්‍යාප්ත වීමත් සමඟ ම ශාසනික ජෝතිමත්භාවයත්, ශාස්ත්‍රීය ප්‍රබෝධයත්, පාවුල විය. මේ සඳහා ඉවහල් වූ සංඝ පීතෘවරයන් වහන්සේලා විශාල පිරිසකි. මුල් අවධියේ දී සපුගොල්ලේ **තපෝධනාරාමයෙහි** වැඩ සිටි කපල්ලේවෙල **ශ්‍රී නාරද** ස්වාමීන්ද්‍රයන් වහන්සේ ශාසනයේ නවෝදය සඳහා ඉමහත් කාර්යභාරයක් ඉටු කළහ. මුන් වහන්සේ කවිත්වය පිළිබඳ ප්‍රමාණවත් කීර්තියක් ඉසිලූහ.[63] කපල්ලේවෙල හිමියන්ගේත් විදුරුපොළ මා හිමියන්ගේත් ශිෂ්‍යයෙකු වූ මුන් වහන්සේ යම් යම් අවස්ථාවල දී කියන ලද කවි බොහෝ යි.[64]

**උඩරට අමරපුර මහා නිකාය** ව්‍යාප්ත වීමේ දී මධ්‍යම පළාතේ මහා සංඝරත්නය විසින් ද සාසනික චිරස්ථායිභාවය මුල් කොටගත් අතයුදර සේවාවක් සිදුකොට ඇත.

උතුරු මැද පළාතේ නිකාය ව්‍යාප්ත කිරීම සඳහා දැඩි ආයාසයෙන් සාසනික ශාස්ත්‍රීය සේවාවන්හි නිරත වූ භික්ෂූන් වහන්සේලා කීප නමකි. නැගෙනහිර පළාතේ දුක්ගැහැට නොතකා ධර්මචර්‍යාවෙහි නිරතවෙමින් ශ්‍රද්ධාබුද්ධිකාමීන්ගේ අපේක්ෂාවන් ඉටුකළ උතුමන් ද කීප නමකි.

උඩරට අමරපුර මහා නිකායික සංඝ සංස්ථාව සුසංවිධිත කිරීමෙහි ලා ක්‍රමවත් ව්‍යවස්ථා පද්ධතියක් ද විද්‍යමාන ය. පාලන පහසුව සඳහා විමධ්‍ය

61. පං.ව, පි: 09
62. සිං වි කො, කා: I, පි; 642
63. ඌ ඉ, පි; 31
64. ඌ ඉ, පි; 54

ගත නීති පද්ධතීන් ද, ක්‍රියාත්මක කෙරේ. ශ්‍රී ලංකාවේ බොහෝ පළාත්වල ඒ ඒ ප්‍රදේශවාසී සංඝ රත්නයේ පහසුව සඳහා සීමාසම්මුති විනය කර්ම සිදුකොට ඇත. අමරපුර භික්ෂු වංශය ශාඛා ප්‍රශාඛාවලට බෙදී යාමේ දී අවම ශාඛාවන් ගණනක් විහිදී ගියේ උඩරට අමරපුර මහා නිකායෙනි. ඌව අමරපුර නිකාය, උඩුකිඳ අමරපුර නිකාය,[65] උඩරට අමරපුර සාම ශ්‍රී සංඝ සභාව[66], උඩරට අමරපුර නිකායෙන් වෙන් වී ගිය ශාඛාවන් ය. භික්ෂූන් වහන්සේලාගේ ව්‍යාප්තියත් සමඟ විනයකර්මාදිය කිරීමේ දී සංඝයාගේ පහසුව තකා මෙම නිකායික ශාඛා තුන බිහි වී ඇත. රාජකීය පණ්ඩිත කන්දේගෙදර **ශ්‍රී සුමනවංසා'භිධාන** වර්තමාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ උඩරට අමරපුර නිකායෙන් වෙන් වී ගිය සෙසු නිකායික මහා සංඝයා වහන්සේ සමගි සම්මුතියෙහි පිහිටුවා 1985 අප්‍රේල් 25 දින විදුරුපොළ ශ්‍රී සුමංගලාරාම මහා විහාරස්ථානයේ දී සමගි පොහොයක් කොට ධර්මාමිෂ සම්භෝගයේ දී නොවෙනස් ව එක ම පිරිසක් ලෙස කටයුතු කිරීමේ සමගි සම්මුතියට එළඹුනහ.

උඩරට අමරපුර නිකායික භික්ෂූන් වහන්සේගෙන් ජාතික වූත්, ආගමික වූත්, ඉමහත් සේවාවක් සිදු වේ. 1986 වර්ෂය වන විට සැකසූ නිකායික වාර්තාව අනුව භික්ෂූන් වහන්සේලා දහස ඉක්මවා මෙම මහා නිකාය නියෝජනය කරති. ශ්‍රී ලංකාව තුළ ආරාම 355 ක් මෙම නිකාය සතු වේ.[67] ඒවා පොදු මහජනතාවගේ ආගමික කාර්යයන් සපුරාලීමට මහෝපකාරී වේ. **දහම් පාසැල් අධ්‍යාපනය** මගින් මෙරට බොදු සිසු පරපුරේ ආධ්‍යාත්මික ගුණ වගාව සඳහා මහා සංඝයා වහන්සේලා නිරත ව සිටිති. නිකායික භික්ෂූන් වහන්සේලා 103 ක් දහම් පාසැල් මගින් මෙම සේවය ප්‍රචලිත කරති.

රජයේ ගුරු සේවාව මගින් ද, නිකායික භික්ෂූන් වහන්සේලා ශාස්ත්‍රදානයෙහි නියැලී සිටිති. ධර්ම ශාස්ත්‍රීය සේවය ප්‍රචලිත කිරීම සඳහා පිරිවෙන් රාශියක් උපස්ථම්භක වී ඇත.

රුපහ **විද්‍යාවිලාස** පිරිවෙන, බටගල්ලේ **සිරි ධම්මරතන** පිරිවෙන, මැදගොඩ **ශ්‍රී සිද්ධත්ථෝදය** පිරිවෙන, අමුපිටියේ **සිරි ධම්මාරාම** පිරිවෙන, කබිල්ලේවෙල සිරි **සුධර්මෝදය** පිරිවෙන, විදුරුපොළ **ශ්‍රී පියතිස්ස විද්‍යායතනය**, රුවන් එළියේ **ශ්‍රී රත්නාලෝක** පිරිවෙන, මල්පාන ශ්‍රී **සුධර්මෝදය** පිරිවෙන, හිඟුරක්දමන ශ්‍රී **කාශ්‍යප** පිරිවෙන, පොළොන්නරුව **විජයබා** පිරිවෙන. විහාරගොඩ **ශ්‍රී ධර්මානන්ද** පිරිවෙන, කරගහවෙල, ත්‍රිපිටකෝදය පිරිවෙන, හේනේගම **සංඝානන්ද** පිරිවෙන, ඇටම්පිටියේ **විද්‍යාභූෂණ** පිරිවෙන, සන්තලේ ශ්‍රී **අග්‍රබෝධි** පිරිවෙන, උහන සිරි ධම්මරතන

65. සිං වි කො, ක: I, පි: 642
66. සිං වි කො, ක: I, පි: 643
67. ශ්‍රී නි පි, පි; 16

පිරිවෙන, මීගහකිවුලේ ශ්‍රී සරණපාල පිරිවෙන, ආදී පිරිවෙන් මගින් ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේලා ධර්මානුධර්ම ප්‍රතිපන්න වියතුන් බවට පත් කිරීම සඳහා මහඟු මෙහෙයක් ඉටු කරනු ලැබේ. මහයාය ශ්‍රී විද්‍යායතන පිරිවෙනින් ද සිදුකොට ඇත්තේ සදනුස්මරණීය සේවාවකි.

ප්‍රගල්භ බුද්ධිකෞශල්‍යයෙන් හෙබි ඇතැම් යතිවරු භාෂා ශාස්ත්‍රීය මහඟු සේවාවක් ද කරති. අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ උපාධිලාභී හිමිවරු උසස් අධ්‍යාපන සේවාවෙහි නියැලී ක්‍රියා කරති. මෙම නිකායට අයත් භික්ෂූන් වහන්සේලා ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, සෝවියට් දේශය වැනි රටවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙහි නියැලී සිටිති. සිංගප්පූරුව, ඉන්දියාව, ජපානය, කැනඩාව වැනි රටවල ද නිකායික භික්ෂූන් වහන්සේලා ධර්ම ප්‍රචාරක කටයුතුවල නිරත වැ වෙසෙති. බෞද්ධ ආකල්ප වර්ධනය කිරීම සඳහාත්, තථාගත ශාසනයෙහි පැවැත්ම සඳහාත්, උඩරට අමරපුර නිකායික භික්ෂූන් වහන්සේගේ අප්‍රතිහත ධෛර්යය ඉවහල් වී ඇත.

උඩරට අමරපුර නිකාය තුළ වඩාත් විධිමත් පාලනයක් ඇති කිරීම සඳහා කමිටුවක් පත්කොට ප්‍රාදේශීය සංඝසභා පිහිටුවීම සඳහා ව්‍යවස්ථා මාලාවක් ද සම්පාදනය කොට ඇත.

ඒ ඒ ප්‍රදේශවල නිකායික සංඝයා වහන්සේලාගේ සමගිය හා විධිමත් පාලනය ඒ තුළින් වඩාත් ක්‍රමවත්වැ හැඩගැසෙනු ඇත. 1972 දී සම්මත වුණු නිකායික ව්‍යවස්ථා මාලාව සංශෝධනය කිරීම සඳහා විනයවාදිනී කාරක සභාව විසින් පත් කරන ලද කමිටුව වඩාත් විධිමත් වූත්, සාර්ථක වූත් නීති මාලාවක් සඳහා ක්‍රියා කරගෙන යයි.

## ආශ්‍රිත පොත පත


1. අභිනව සාසනවංසෝ (විදුරුපොළ පියතිස්ස) බු. ව. 2443
2. අභිස්තව සංග්‍රහය
3. ඉතිහාස කථා. 2 කාණ්ඩය. 1 කලාපය ක්‍රි. ව. 1926
4. ඌව ඉතිහාසය (නාවුල්ලේ ධම්මානන්ද)
   කොළඹ හුණුපිටියේ ජිනාලංකාර යන්ත්‍රාලය 1945
5. පංච විංශති පූර්ති මහෝත්සව සභා 1936
6. පරංගි කෝට්ටෙ (ටිකිරි අභයසිංහ)
   ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් ග්‍රන්ථ ප්‍රකාශකයෝ
7. බුද්ධශාසන කොමිෂන් වාර්තාව (XVIII) වැනි සැසි වාර්තාව)
   1959 නොවැම්බර්
8. බෞද්ධ බලය, නව වන සාංවත්සරික වෙසක් කලාපය
   (කේ. ඩී. සුමනසේකර) බු. ව. 2482
9. මහාවංශය (ගුණපාල වීරසේකර)
10. වර්තමාන සිංහල කවීන්ද්‍රයෝ II
11. වැලිතොට 1971
12. විදුරුපොළ ශ්‍රී පියතිස්ස සාහිත්‍ය අංකය
13. ශ්‍රී රතනජෝති මහානායක ස්ථවිර චරිතය 1936
14. ශ්‍රී ලංකා අමරපුරවංශය (මුල්ලපිටියේ කේ. එච්. ද සිල්වා)
    රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, බු. ව. 2513 නිකිනි
15. ශ්‍රී ලංකාවේ නිකායන් පිළිබඳ තොරතුරු
16, ශ්‍රී සංඝානන්ද ගුණානුස්මරණ වාර්ෂික මංගල කලාපය
    (හපුගොඩ සුමනතිස්ස) 1957
17. ශ්‍රී විමලබුද්ධි ප්‍රශස්ති
18. සපරගමුවෙ පැරණි ලියවිලි (කිරිඇල්ලේ ඤාණවිමල) 1946
19. සරණංකර සංඝරාජ සමය (කොටගම වාචිස්සර) 1960
20. සරසවි සඳරැස, බු. ව. 2445 මැයි 24
21. සිංහල විශ්ව කෝෂය, පළමුවැනි කාණ්ඩය 1963
22, හුණුවල ශ්‍රී නන්ද කවි, අමුද්‍රිතයි.
    (පුස්කොළ පොත, විදුරුපොළ ශ්‍රී රතනජෝති පුස්තකාලය)

## කෙටි යෙදුම්

| | | | |
|---|---|---|---|
| 1. | අ සා | — | අභිනව සාසනවංසො |
| 2. | ඉ ති | — | ඉතිහාස කථා |
| 3. | ඌ ඉ | — | ඌව ඉතිහාසය |
| 4. | පඤ්ච | — | පංච විංශති පූර්ති මහෝත්සව සභා |
| 5. | බු කො වා | — | බුද්ධශාසන කොමිෂන් වාර්තාව |
| 6. | බෞ බ | — | බෞද්ධ බලය |
| 7. | මහා | — | මහා වංශය |
| 8. | ව සිං ක | — | වර්තමාන සිංහල කවීන්ද්‍රයෝ II |
| 9. | වැලි | — | වැලිතොට |
| 10. | වි සා අං | — | විදුරුපොල ශ්‍රී පියතිස්ස සාහිත්‍ය අංකය |
| 11. | ශ්‍රී අ ව | — | ශ්‍රී ලංකා අමරපුර වංශය |
| 12. | ශ්‍රී නි කා තො | — | ශ්‍රී ලංකාවේ නිකායන් පිළිබඳ තොරතුර |
| 13. | ශ්‍රී රතන ච | — | ශ්‍රී රතනජෝති චරිතය |
| 14. | ශ්‍රී වි ප්‍ර | — | ශ්‍රී විමලබුද්ධි ප්‍රශස්ති |
| 15. | සිං වි කෝ | — | සිංහල විශ්වකෝෂය |

## 2 පරිච්ඡේදය

# උත්තම කුලකුමරකුගේ උපත

ඌව ප්‍රදේශය ඉතිහාසයෙන් එහා අවධියෙහි පවා සම්භාවනීය නමක් මේ රටට දයාද කොට දී ඇත. පුරාතන රාම රාවණ අවධියට නෑකම කියන **සීතා කොටුව, රාවණ ඇල්ල, දිවුරුම්වෙල, සීතාඑළිය, ස්ත්‍රීපුරය** ආදී නම්වලින් මෙන්ම මේ ප්‍රදේශයේ ප්‍රචලිත වැ ඇති විවිධ වෘත්තාන්තවලින් හා ජනප්‍රවාදයන්ගෙන් ද ඒ ගැන විශ්වාසයක් ඇති කරගත නොහැක්කේ නො වේ. **මහියංගනය හා බදුලු මුතියංගනය** යන ඌවේ ශ්‍රේෂ්ඨතම් ආගමික පූජාස්ථාන සම්බුද්ධපාදස්පර්ශයෙන් පාරිශුද්ධියට පත්වීම නිසා බුදුරජාණන් වහන්සේගේ ජීවමාන කාලයෙහි ම මෙම පෙදෙස බෞද්ධ ඉතිහාසයට හා සංස්කෘතියට එක්විණ.

මේ රටේ ඉතිහාසය ආරම්භ වූ කාලයේ පටන් ම ඌව ප්‍රදේශය ඓතිහාසික සම්බන්ධතාවලින් අඛණ්ඩ බවට වාර්තා පිහිටුවා ඇත. නියත වශයෙන් මූලික රාජධානි නොපිහිටියත්, ප්‍රාදේශීය පාලකයන්ගේ පාලන අධිකාරි පෙදෙසක් ලෙස ඌවට ඉතිහාසයේ ප්‍රධාන ස්ථානයක් හිමි ව ඇත. මීටත් වඩා බෞද්ධ සංස්කෘතික වටිනාකමින් මෙම පෙදෙසට හිමි වැ ඇත්තේ උතුම් ස්ථානයකි. රටත්, ජාතියත්, ආගමත්, බේරා ගැනීම සඳහා උදාර වීරවරයන් කළ කීර්තිමත් සටන්වල දී ඌව ප්‍රදේශයේ වීරවරයන් පෙරමුණ ගත්තේ ජාතිය හා දේශය පිළිබඳ වාත්සල්‍යයෙන් උදම් වූ අභීත විරෝදාර නායකයන් හැටියටයි. එබඳු ජාතික සටන්වලින් මෙන්ම ඓතිහාසික සිද්ධි, සංස්කෘතික නටබුන් හා දේශයේ සඳ සම්භාවනීය වාර්තා කියැවෙන පුරාතන අභිලේඛන ආදියෙන් ද ජාතිය පණ ගැන්වූ එම ප්‍රදේශයට හිමි ව ඇත්තේ ප්‍රසාදය හා සංවේගය වැටෙමින් නැගෙමින්, නැගෙමින් වැටෙමින් කියැවෙන අසම්භින්න ස්වර්ණමය වෘත්තාන්තයකි.

**පෘතුගීසීන්, ඕලන්දයන් හා ඉංග්‍රීසීන්** යන විජාතික විදේශීය ප්‍රහාරකයන් සිංහල රාජ්‍යයට එරෙහි වැ අවි අමෝරාගත් හැම අවස්ථාවක ම සිංහල කඩුවට පසුතරය දුන්නේ ඌව ප්‍රදේශයයි. එම සටන්වල අවසාන සටන වූ ජාතික මහා සංග්‍රාමය 1817 ඇරඹී 1818 නිමාවට පත්වූයේ ජාතියේ ඛේදවාචකය හඬ ගා කියාපාමිනි. මේ සටනේ දී **ඌවේ, වලපනේ හා වෙල්ලස්සේ වීර පුත්‍රයන් ජීවිත පරිත්‍යාගයෙන් ජාතියට ඇප කැප වූයේ**

ජාතිය හා රට ජීවිතයට ද වඩා උතුම් කොට සලකමිනි. සටන අනුක්‍රමයෙන් තියුණු විය. ඉංග්‍රීසීන්ට ලංකාව පිළිබඳ ආශාව අතහැරීමට තරම් තත්ත්වය දරුණු විය. මේ තත්ත්වය ගැන එද ලංකාණ්ඩුකාර **සර් රොබට් බ්‍රවුන්රිග්** මෙසේ කියයි :

"අතීතයෙහි අප සටන් කෙළේ පෙරදිග බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙහි කීර්තිය සඳහා ය. අද අපි නම්බුව රැක ගැනීම සඳහා සටන් කරමු. ඌවේ හා වෙල්ලස්සේ මිනිසුන්ට විරුද්ධ ව කරන මේ සටනේ දී අප යොදවන තරම් විශාල යුද හමුදාවක් අපි මීට පෙර කිසි කලෙක නොයෙද වීමු. අප මේ සටනින් දිනන බව පෙන්වන ලකුණු නැත."

(ඩේවි දුටු ලංකාව, පිට. xi)

මෙයින් පෙනී යන්නේ ඒ වනවිට ඉංග්‍රීසීන් පරාජයේ අන්තයට පත් වැ සිටි බවයි. එහෙත්, තත්ත්වය ඔවුන්ගේ වාසියට ම පෙරළුණේ ය. කැරලි නායකයන් එකිනෙකා අල්ලාගත හැකි විය. ප්‍රදේශයෙන් ප්‍රදේශය යටත් විය. 1818 ඔක්තෝබරය වන විට වීර කැප්පෙටිපොළ මහනිළමේ අත් අඩංගුවට ගත හැකි විය. ඒ ඉංග්‍රීසීන් ලද විපයග්‍රහනයේ උසස් ම ප්‍රතිඵලයයි.

මේ සටනේ දී ඉංග්‍රීසීන් කළ අමානුෂික කෲර ක්‍රියා නිසා මුළුමනින් ම ඌව ප්‍රදේශය විනාශයට පත් විය. ප්‍රදේශවාසී ජනතාව පමණක් නොව ඔවුන්ගේ කෙත්වතු, ගොවිතැන්බත්, ගව මහිෂාදි සියලු වස්තූන් ම මේ මහා විනාශයෙන් නෂ්ටප්‍රාය විය. **ජෝන් ඩේවි** තම ග්‍රන්ථයේ මෙසෙ සඳහන් කරයි.

"පැතුරුණු කැරැල්ලේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ පෙදෙස දුර්භික්ෂයෙන් පෙළේ යයි ද, වැසියන්ගෙන් බොහෝ දෙනෙකුට ආහාර සොයා පහත පෙදෙස්වලට පැමිණීමට සිදු වී යයි ද ඉතිරි ව සිටින්නෝ වනයේ පැලෑටි හා තාලවර්ගයේ විවිධ ගස්වල බඩයෙන් තනන සව වර්ගයක් අනුභව කොට යැපෙති යි ද පැවසී ය. ඔහු කථා කරමින් සිටින විට ඔහුගේ වචන ස්ථිර කිරීමට මෙන් අසරණ දීන ස්ත්‍රියක් එහි පැමිණියා ය. ඇය සාගතයේ මූර්තියකි. ඔසවා ගත් දෑතින් හා බැගෑපත් මුහුණින් යුතු වූ ඇය පුරා දින තුනක් කුසට අහර බිඳකුදු නොලැබුණු යි කියා ආහාර ස්වල්පයක් ඉල්ලා සිටියා ය."

(ඩේවි දුටු ලංකාව, පි: 210)

තවද මෙසේ ඔහු වැඩිදුරටත් එම තත්ත්වය විස්තර කරයි.

"මුළු මඟ දිගට ම මිනිසුන් වසන එකම ගෙයක් හෝ අලුත් වගාව පිළිබඳ යම්කිසි ලකුණක් හෝ එකම ස්වදේශිකයකු හෝ අපට මුණ නොගැසුණි. තැන් තැන්වල දිරාපත් වෙමින් පැවැති ගෙවල් ද නොසලකා හරිනා ලද කුඹුරු ද තවමත් මාරක කණිය එල්ලෙමින් තිබුණු ගසක් යට, පාර අයිනේ දක්නා ලද මිනී හිස්කබල ද අප දුටු දෑ පිළිබඳ ඉතිහාසය කාටත් තේරෙන භාෂාවෙන් කියා පෑයේ ය."

(ඩේවි දුටු ලංකාව, පි: 211)

සමකාලීනයන් විසින් සපයන ලද මෙබඳු වාර්තා රාශියක් ම කියා පාන්නේ ඌව ප්‍රදේශය එද පත්වැ තිබුණු විනාශයේ යථා ස්වරූපය යි. විල්සන්, මැක්ඩොනල්ඩ් ආදීන්ගේ භීෂණ ප්‍රහාරවලින් උඩුකිඳ යටකිඳ ආදී පෙදෙස්වලට වූ හානිය ද විශාල විය. මෙම පෙදෙස් වැසි වීරවරයෝ ජාතිය වෙනුවෙන් තම යුතුකම් ඉටු කොට ජාතියේ පූජාසනය මත ජීවිතය පූජා කළහ. මේ අතිභීෂණ සටනින් යන්තමින් හෝ දිවි බේරා ගත්තෝ යළිත් දෙපයින් නැගී සිටීමට දිරි ගත්තෝ ය. ඌව උඩුකිඳ වීරවන්නි මුදියන්සේලාගේ අප්පු වෙදමහතා ජනිත වූයේ ඊට සරමක් ඇත අවධියේ එබඳු කුල පරපුරක පෙනෙනතෙක්මානේ ඉතිහාස කථාවේ ආදිතමයා ලෙසට ය. ඔහුගේ දෙවැනි තෙවැනි පරම්පරාවල දූදරුවෝ බොහෝ දෙනෙක් ඕලන්ද කාලයේ පටන් ඉංග්‍රීසීන්ගේ ඉහත සඳහන් අමානුෂික ඝටන දක්වා සටන්වලට මුහුණ දුන්නෝ ය. ජීවිතවල පමණක් නොව ප්‍රවේණිගත උරුමකම් රැසක ද අහිමිකාරයෝ වූහ.

වීරවන්නි මුදියන්සේලාගේ පෙළපතේ ජනිත වූ හැම කෙනකු ම ගමට රටට පිරිමහින කවර හෝ ක්‍රමයකින් වැඩදායී ශාස්ත්‍රීය වෘත්තියක ම නිරත වූවන් වීම විශේෂත්වයකි. ජ්‍යොතිෂ, නක්ෂත්‍ර, අධ්‍යාපන, ශිල්පකලා යන මෙබඳු විෂයකින් ප්‍රසිද්ධියට පත්වීම එම පෙළපතට ප්‍රවේණිගත උරුමයක් මෙනි. එද පටන් අද දක්වා එම තත්ත්වය වෙනස් නොවිණ. දේශ දේශාන්තර කීර්තිධර භදන්ත පණ්ඩිත විදුරුපොළ පියතිස්ස මා හිමියන් වහන්සේ එම පෙළපතින් ජනිත සදනුස්මරණීය රුවන් පහන්ටැඹයි. උන් වහන්සේ ගමත් රටත් සම්බුද්ධ ශාසනයත් එක ලෙස ම ආලෝක කිරීමට සමත් වූහ.

සිරි පියතිස්ස මහ නා හිමිපාණන් වහන්සේ උපත ලත් පවුලේ පැරැන්නන් විසින් තබන ලද වාර්තා අනුව දිවිගාල්පිටියේ වීරවන්නි පෙළපත බෙහෙවින් ම ශාස්ත්‍රීය කටයුතුවල ප්‍රවීණත්වයක් දක් වූ අයගෙන් යුක්ත වූ බව පෙනේ. ශාස්ත්‍රීය සහ වෛද්‍ය වෘත්තීන්හි ද, නක්ෂත්‍ර විෂයෙහි ද, නියැලුණු අයගෙන් වරින්වර මෙම පෙළපත ප්‍රභාවිත විණ. දැනට සො ගෙන ඇති සාක්ෂ්‍ය අනුව අවුරුදු දෙසීයක පමණ ඉතිහාසයක් ඔස්සේ ඈතට මෙම පරපුර විහිද ව ඇතැයි හැඟේ. මේ පරපුරේ පාරම්පරික ලිඛිත සාධක අනුව ආදිතමයා හැටියට හඳුනාගත හැක්කේ දිවිගාල්පිටියේ වීරවන්නි මුදියන්සේලාගේ අප්පු වෙදමහත්මා ය. මෙතුමන්ගේ ජීවන වකවානුව රාජාධිරාජසිංහ රජුගේ හෝ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාල පරිච්ඡේදය විය හැකි ය. සමකාලීන යුගයේ දී එතුමන් ඇදුරුවරයකු ලෙසින් ක්‍රියා කොට ඇත. ජීවිතයේ අගභාගයේ පැවිදි ජීවිතයක් ගත කළ බව ද විශ්වාස කරනු ලැබේ. අප්පු වෙද මහත්මාගේ පුත්‍රයා මැණික්රාල වෙද ගුරුන්නාන්සේ ය. දිවිගාල්පිටියේ මහවෙද ගුරුන්නාන්සේ නමින් ද මෙතුමන් හඳුන්වනු ලැබී ය. වෛද්‍ය ශාස්ත්‍රයෙහි ද, නක්ෂත්‍රයෙහි ද ප්‍රවීණයකු වූ මෙතුමන් ගුප්ත ශාස්ත්‍ර විශාරදයෙකු ලෙසින් ප්‍රසිද්ධියක් උසුලා ඇත. එතුමන් විසින් ලියා ඇති පුස්කොළ පොත්වලින් මෙයට සාධක හමුවේ.

විදුරුපොළ සිරි **රතනජෝති** මා හිමිපාණන් වහන්සේ ගිහිසාලයේ දී සිප් සතර හදළේ මෙතුමන්ගෙනි. **'යෝගරත්නාකරය'**, **'වරයෝගසාරය'** ආදී වෙද පොත් ගණනාවක් එතුමා තමන්ගේ අතින් ම පිටපත් කර ඇත. මෙතුමා 1863 ජනවාරි මස 12 දින ජන්මාන්තර ගත වූයේ ය.

**දිවිගාල්පිටියේ** මහ වෙද ගුරුන්නාන්සේගේ **පුත්‍රයා** වූයේ **දිවිගාල් පිටියේ අප්පුහාමි වෙදමහත්මා** ය. මෙතුමන්ගේ උපත සිදුව ඇත්තේ ක්‍රි.ව. 1830 දී ය. අක්ෂර ශිල්පය සිය පියාණන්ගෙන් ම හදළ මෙතුමන් වෛද්‍ය ශාස්ත්‍ර විශාරදයෙකු වූවා සේ ම වියතෙක් ද විය. 'කැයුම්විදි' යයි ප්‍රකට කවිමන්ත්‍ර සහිත ශාස්ත්‍රය ද මැනවින් ප්‍රගුණ කළ කෙනෙකි. ඌව මධ්‍යම සබරගමු ආදී ප්‍රදේශවල ප්‍රචලිත වෛද්‍යවරයෙකු ලෙසින් ක්‍රියාකළ බවට මොහු පිළිබඳ ව ලිඛිත සාධක හමු වී ඇත. කාව්‍යකරණයට ඇල්මක් දක් වූ මෙතුමන් විසින් 1875 සැප්තැම්බර් මාසයේ දී **'සේරුවිල සන්දේශය'** නමින් සන්දේශ කාව්‍යයක් ද රචනා කොට, මුද්‍රණය කර තිබේ.

> '' ය ස සි න් ලොව පසිඳුවන මහවැලි ගඟම
> නිතියෙන් දිය බෙදී අතු දෙක වෙන වෙනම
> එ ග හි න් එකක් මුහුදට බැස ගිය නැනම
> ඇයුවෙන් නම කිමද කිවු කොට්ටියා රම
>
> ඹේ සේරුවිල සඳෙසෙහි එන්නකි.

> ''නෙක ශාස්ත්‍රාන්තර ප්‍රවීණ දිවිගාල්පිටියේ මහ වෙද තිලමේගේ දෙටුපුත් වූ මෙතුමා ද වෛද්‍ය නක්ෂත්‍රාදියෙහි මෙන් ම ආගමධර්මයෙහි ද හසල බුද්ධිමතෙක් විය....'' (ඌව ඉතිහාසය, පි: 32)

ඒ ආදී වශයෙන් ගත්කතුවරුන් එතුමා අගයා ඇත. අවුරුදු 65 ක් ආයු වළඳු මෙතුමා 1901 මැයි 12 වැනි දින පරලොව් සැපත් විය. මෙතුමාගේ කනිටු පුත්‍රයා **පියතිස්ස** මා හිමියෝ ය. දිවිගාල් පිටියේ **අප්පුහාමි වෙද මහත්මාගේ** දෙටු පුතණුවන් වූයේ **ඩී. එල්. අප්පුහාමි** හෙවත්, දිවිගාල්පිටියේ **ලොකු අප්පුහාමි** වෙද මහත්මා යි. මෙතුමන් සිය **පියාණන්ගේ** වෙදකම හදරා මීගමුවේ **මනුවෙල් ද සිල්වා** වෛද්‍යාචාර්ය වරයාගේ යටතේ වැඩිදුරටත් **ඉගෙනුම** ලැබී ය. 1929 කොළඹ පවත්වනු **ලැබූ වෛද්‍ය සම්මේලනයේ දී සම්මානයක්** ද ලබා ගත්තේ යි. ලංකාවේ **ප්‍රකට** වෛද්‍යවරයෙකු ලෙසින් සේවාව සැලසූ මෙතුමන් නක්ෂත්‍ර විෂයෙහිලා ද **ප්‍රකට විය.** සමකාලීන යුගයේ දී මෙතුමන් කරා අක්ෂර ශිල්පය හැදෑරීමට ද කුඩා දරුවන් පැමිණි බව සඳහන් වී ඇත. මෙතුමන් ප්‍රදේශය තුළ අති ශයින් ජනප්‍රිය වී ඇත්තේ ඉතා දක්ෂ වෛද්‍යවරයෙකු හා ගුරුවරයෙකු ද ලෙසිනි.

සිරි **පියතිස්ස** මහා නායක මා හිමිපාණන් වහන්සේගේ ශ්‍රෙෂ්ඨ ඥාති **වරයෙකි**, විජයසිංහ කෝරනර් මහත්මා. මෙතුමන් දිවිගාල්පිටියේ **අප්පුහාමි වෙදමහත්මාගේ** දෙවන **පුතණුවන්** ය. ක්‍රි.ව. 1876 ක් වූ මාර්තු මස 9 වන

ගුරු දින මෙතුමන්ගේ උපත සිදුවිය. පස් අවුරුදු වයසේ දී පියාණන්ම අකුරු කියවනු ලදුව කුඩා කල සිට ම සිප්සතර හැදෑරීම සඳහා විදුරුපොළ **සිරි රතනජෝති** මා හිමිපාණන් වහන්සේගේ උපකාරය ලැබී ය. සිංහල, පාළි, සංස්කෘත. යන භාෂාත්‍රය පිළිබඳ ගැඹුරු දැනුමක් මා හිමිපාණන් වහන්සේගෙන් ලද **විජයසිංහ** කෝර්නර්තුමන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ව ද ප්‍රමාණවත් අධ්‍යයනයක් ලැබී ය. මෙතුමන් තමා ගැන ලියා ඇති වාර්තා වලින් ද තොරතුරු අනාවරණය වෙයි. වෛද්‍ය ශාස්ත්‍රය සහ නක්ෂත්‍රය සම්බන්ධ වූ **'යෝගශතකය'**, **'සරස්වතී නිඝණ්ඩුව'**, **'වරහමිහිර'** වැනි පොත් කට පාඩම් කරගත් බව ද කියනු ලැබේ. කලාත්මක සැරසිලි කිරීමට විශේෂ දක්ෂතාවක් තිබුණු මෙතුමන්ට කලාත්මක ව යම්යම් උපකරණ නිපදවීමට හැකියාවක් තිබුණු බව ද පැරණි අය කියති. දහර කාලයේ සිට ම කාව්‍ය ප්‍රබන්ධයට යොමුවීම මෙතුමන් සතු නිර්මාණ කුසලතා වර්ධනයට හේතුවක් විය. කවිකරණයට තිබුණු හැකියාව නොයෙකුත් පැරණි පොත්පත් කියවීමෙන් වඩ වඩා දියුණු විය. කුඩා කල ම කවි කිරීමට සමත් වූ විජයසිංහ මහත්මා **'තුන් යහළු පුවත'** නමැති කාව්‍ය කෘතිය නිර්මාණය කළේ වයස අවුරුදු දහයයේ දී ය. මේ ඉන් උපුටාගත් පද්‍යයකි .

" මේබඳු සිතින් එහි පුර දෙර දකුණු දෙසේ
පසුකර මින් යනවර ඔහු සිනී මෙසේ
යුනු කුළුණෙන් ඔමිතුරු නා රජෙක් යසේ
මෙපුර දෙරින් සිට තුඹසෙක නිතර වැසේ "

(තුන් යහළු පුවත, 66 වන කවිය)

දහයය වියෙහි සිටියකුගේ කවිත්වය තුළ පවතින කුසලතාව මෙමගින් මැනවින් දිස්වේ. මෙම කාව්‍ය කෘතිය අගය කළ සිරි පියතිස්ස මා හිමිපාණන් එතුමන් කරා එවූ ලිපියක මෙසේ සඳහන් කොට ඇත :

" සුවිදිත ජිනධම්මො නේක සත්ථෙසු දක්ඛො
කවිජන පියභූතො පත්ථටානේක කිත්ති
සච්චිබුද්ධවර චබලිව. අප්පුගාමීති සඞ්ඛෙයා
ජයතු සුචිර කාලං දේවරාජේන ගුත්තො

සද්ධාදි සග්ගුණයුතො සපරත්ථකාමො
සන්තො විපස්සිහි පසත්ථතමො සුධිමා
සංසෙවිතො සතත සජ්ජනසංචයේන
සම්භාතු සො හත රිපු මඝවෙන ගුත්තො."

**යූ. ඒ. ඤාණතිලක** මා හිමිපාණන් එවූ ලිපියක් පහත සඳහන් ලෙසින් සඳහන් කොට ඇත.

"29.7.94, වැලිතොට මහතා විසින් කවිබසට නගා මුද්‍රණය කොට අප වෙත සතුටු පඬුරු කොට එවූ 'තුන් යහළු පුවත' නමැති පොත් පිංච ලැබී සතුටින් භාර ගතිමි. ඉතා ළදරු අවස්ථාවෙහි පිහිටි මහතා විසින් මෙතරම් කවි පොතක් සද ලක්දිව පඬිවරුන්ට යැවීම අතිශයින් ම ළදරු ගාසඤ්ඤාද්ග්‍රහණයෙහි ධෛර්‍ය උපදවන කරුණකි.

මේ වගට, අදෘෂ්ට මිත්‍ර,

පූ. ඒ. ඤාණතිලක නායක ස්ථවිර"

මේ හැර විවිධ පඬිවරුන් විසින් මෙම කෘතිය අගයා ඇත. තුන් යහළු පුවත් ගත් කතුවරයාගේ තවත් කෘතියකි **'උයන් වතු විස්තරය'** මෙම කෘතියේදී **හග්ගල මල්උයන** පිළිබඳ ඉතිහාසය ද සැකෙවින් දක්වා ඇත.

" පුරා දළමල් පලුපලනු දිලී
සරානෙක තුරුලිය පෙළ ලතලී
නැරා නඳුනුයනෙහි සිරි කියලී
පේරාදෙණියයි උයනෙක් බැබලී "

සිරිමත් මල්පල සැදි තුරු ලියෙනා
විදුරත් උයනට අපහස කරනා
මනනෙත් දහ කරවන දුටු නෙදනා
හෙනරත් ගොඩ උයන ද විය දියුනා "

(උයන්වතු විස්තරය, 75, 77 කවි)

මෙම කාව්‍යයෙන් ද කවි දස්කම් මොනාවට පළවෙයි. 1896 අගෝස්තු 12 දින **මඩුගල්ලේ සිද්ධත්ථ** හිමිපාණන් විසින් මෙම කෘතිය ගැන මෙසේ පවසා ඇත :

"....ලාබාල කෙනෙකුගේ කෘතියක් නුමුත් ගුත්තිල, කව්සේකර ආදි වූ පූර්ව කාව්‍ය කර්තෘ මතාවලම්බනයෙන් තත් සදුපදේශයන් සිත්හි දරා ශබ්දලංකාරාදියෙන් අනූනව කළ ඇතැම් කවිද මෙහි විද්‍යමානයි."

**මේ කෘතිය ලැබී අමන්දනන්දයට පත් විදුරුපොළ සිරි පියතිස්ස ස්වාමීන් වහන්සේ** මෙසේ පාළි පද්‍ය ප්‍රබන්ධයක් කොට යවා ඇත :

" නමෝ භගවතෝ විජිත කුසුමායුධ සංගාමස්ස.

පුරස්සරං කත්වා ථුතිං සසාජ්පං
ඤාපේමි මය්හං භවතෝ භවන්තං
පසන්න චිත්තෝ කරුණාය සාධු
අඩ්ගී කරෝතං විජයා දි සීඝෝ.

යංබෝ භවං මමං කුටියිදයං කත්වාන පේසයි
උය්‍යානවත්ථුවිත්ථාරනාම ධෙය්‍ය සමායුතං
ලද්ධා තං කුටිය චිත්තොහං ආදිතො අවලොකයං
පත්වාසි පමුදං එතං පේසෙමි කුටියි සාසනං

සම්පිණ්ණාඞ්ගධරෝ මහායිතිධරෝ පඤ්ඤාණකිත්තිධරෝ
සද්ධා සීලධරෝ තථා සුතධරෝ වත්ථුත්තයෙ සාදරෝ
භාතා මේ විජයාදිසීහ විධුරෝ සුසිලිට්ඨවාවාධරෝ
නිච්චං සෝච යුගන්ධරෝ මහිධරෝ සංවත්තතංධීධරෝ.

මෙවනත් පඬිවරුන් විසින් මෙම කාව්‍යයට ප්‍රශංසාමුඛයෙන් තවද එවනු ලැබූ ලිපි රාශියක් ම කතුවරයා වෙත තිබිණ. ඩී. ඩබ්ලිව්. විජය සිංහ රාළහාමි පිළිබඳ ව **වර්තමාන සිංහල කවීන්ද්‍රයෝ** (2) නමැති කෘතිය මෙසේ සඳහන් කරයි :


> "විදුරුපොළ පියතිස්ස මහා ස්වාමීන්ද්‍රයන් ගේ මද්දුම සොහොයුර වූ මෙතුමා ස්වකීය පරම්පරාගත වෛද්‍ය නක්ෂත්‍රාදි ශාස්ත්‍ර හසළ නුවණැත්තෙකි. තුන්යහළු පුවත, උයන්වතු විස්තරය, උපදේශ ශතකය, සාරෞෂධ විනිශ්චය යන වෙනත් ප්‍රබන්ධ ද මොවුන්ගේ කෘතීහු ය."
> (පි. 05)

මෙම වියතාණන්ගේ ලේඛන කුශලතාව හා කවිත්වය තත් කාලීන **'ජාතිය,' 'සරසවි සඳරුස** වැනි පුවත් පත් ද උසස් ලෙසින් අගයා ඇත.

ඌව **උඩුකිඳ, කැප්පෙටිපොළ, විදුරුපොළ,** ගම්මානයේ දිවිගාල්පිටිය ප්‍රසිද්ධ වූයේ, දිවිගාල්පිටියේ **වෙද පරපුර** නිසයි. සියවස් කීපයක් ඈතට දිව යන ශාස්ත්‍රීය උරුමයක් මෙම පරපුරේ ඉතිහාසයෙන් දක්නට ලැබෙයි. පසුකල සිරිලක විදුරුපොළ සිරි **පියතිස්ස** නමින් පතළ වූ යතිවරයාණන් උපත ලැබුවේ මෙම වෙද පරපුරේ ය. දිවිගාල්පිටියේ **අප්පුහාමි මහ වෙද මහත්මා** පියාණන් ලෙසින් ද, **මුතුමැණිකේ** උපාසිකාව මෑණියන් ලෙසින්ද උපත ලත් කනිටු පුතණුවන් **ශ්‍රී වර්ධන** නමින් හැඳින්විණ. ඉහත සඳහන් යතිවරයන් මෙනමින් ගිහි ජීවිතයේ හැඳින්වූවා සේ ම නාමයට උචිත ලෙසින් පවුලේ සිරිය සැපත වඩන කුලකුමරෙක් ම විය. ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදහස් සාංසිය සූවිසි වැන්නෙහි පොසොන් මස පුර අටවක ලත්, ශක වර්ෂ එක්දහස් අටසිය දෙවැන්නෙහි මිථුන රවි පස්හාය වූ සූර්යෝදය කාලයෙහි විදුරුපොළ **දිවිගාල්පිටියේ** දී මෙම කුල කුමරු උපත ලැබී ය.

## වීරවන්නි මුදියන්සේලාගේ ශ්‍රී වර්ධන කුලකුමරාගේ ජන්ම පත්‍රයේ දළ සටහන

ක්‍රිස්තු වර්ෂ 1880 ජුනි මස 16 වෙනි බදාද ඉරිද උදේ හෙවත් උදේ 6.00 ට පමණ ජන්ම ලාභය ලැබුවේ ය.




ත්‍රිවාර ලිත

| | | |
|---|---|---|
| කු.පු. 13.15 | — | බුධ-ශනි-උද |
| බ්‍ර. උ. 13.58 | — | ගුරු-වක්‍ර |
| ශු. හ. 12.36 | — | ශුක්‍ර-අස්තයි |

ශ්‍රී ශුද්ධ ශක රාජවර්ෂ ප්‍රමාණයෙන් 1802 ක් වූ, සූර්ය මාස ක්‍රමයෙන් මිථුන වේ. හතර භාගයක් වූ සඳ, චන්ද්‍රමාස ක්‍රමයෙන් පොසොන් මස පුර අටවක තිථිය ලත් බුධ දින ඉරිමා උදේ උපන් ශ්‍රීමත් කුමරුගේ උත්‍රපල් නැකත් වනු, 4 වෙනි පාද වණු, විංශෝත්තරී දශා ක්‍රමයට රවි මහා දශාවෙන් වර්ෂ 01 මාස 03 දින 28 ක් ඉදිරියට තැබුණේ ය.

> "දෛවඥයෝ මා සරස්වතී යෝගයෙන් උපන්නෙකැයි කියති. මගේ ගුණවත් මෑණියන් පසු කාලයක කළා වූ ප්‍රකාශයක අන්දමට මම එතුමිය විසින් තුන් අවුරුද්දක් මුළුල්ලෙහි සිවුවරම් දෙවියන් යැදීමෙන් ලත් පුත්‍රවරයෙකි. මට ඇයගේ ප්‍රකාශය සැබෑවට ප්‍රත්‍යක්ෂ කර වූ කරුණු බොහෝ ය."

යනුවෙන් 1936 පෙබරවාරි මස 26 වන දින නුවරඑළියේ බඩාරකැලේ, ශ්‍රී මහා විහාරස්ථානයෙහි පවත්වන ලද 'පංචවිංශතිපූර්ති' මහෝත්සව සභාව අමතා සිරි පියතිස්ස මාහිමිපාණන් වහන්සේ විසින් ම පැවසූ බව විදුරුපොළ ශ්‍රී පියතිස්ස සාහිත්‍ය අංකය නමැති කාණ්ඩයෙහි සඳහන් වේ. මේ අනුව ළමා කාලයද වාසනාවන්ත වූ බව පැහැදිලි යි. දෙමව්පියන්ගේ අත්‍යන්ත ප්‍රේමාදරය දිනාගත් ශ්‍රී වර්ධන කුලකුමරුවන් අක්ෂර ශික්ෂාවට භාජනය වූයේ පස්වසර සපිරුණු විට ය. 1885 වැන්නෙහි සරස්වතී යෝග දිනයක

උදෑසන **ගණපති පූජාව** හා සරස්වතී පූජාව පවත්වා කාළාලයක අනුළ කැකුළු සහල් මත්තෙහි **'ස්වස්ති සිද්ධම්'** යන්න ලියවී ය. සිය පියාණන් විසින් අකුරු ලියවීම හා කියවීම ද සිදු කරනු ලැබී ය. අතිදක්ෂයෙකු වූ කුල කුමරුවන් විසින් නොබෝ දිනකින් ම **'සකස්කඩය'** අවසන් කරනු ලැබී ය. ළමා දිවිපෙවෙතේ දී ම විදුරුපොළ සිරි **රතනජෝති** මහා නායක මාහිමි පාණන් වහන්සේගෙන් සිංහල, පාළි හා සංස්කෘත භාෂා ගැනත්, ආගමික වත්පිළිවෙත් ගැනත් ශික්ෂණයක් ලැබී ය. අප්පුහාමි වෙද මැතිඳුගෙන් මෙන් ම ඉහත සඳහන් නා හිමිපාණන්ගෙන් ළමා දිවි පෙවෙතට අදාළ මූලික අධ්‍යාපනය ලැබූ මෙම කුල කුමරුන් තුළ අසාමාන්‍ය බුද්ධි බල මහිමයක් දෘශ්‍යමාන විය. ස්මරණ ශක්තිය ද විස්මය ජනක විය.

> "කුඩා කළ සිය පියාණන් කියා දුන් ධූපයක් පිළිබඳ ශ්ලෝකයක් වයස 73 දී පමණ සිහියට නගන තුරු කිසිදක සිහියට නොනැගූ බවත්, මතක් කිරීමට වුවමනා නොවූ බවත්, ශ්ලෝකය ප්‍රකාශ කරමින් වදළහ......"
>
> විදුරුපොළ ශ්‍රී පියතිස්ස සාහිත්‍ය අංකය — පි: 62

යන්නෙන් එය වඩාත් පැහැදිලි වේ. ළමා දිවිපෙවෙතේ දී ම සිහිමන්ත සතිමන්ත භාවය **ශ්‍රී වර්ධන** ළදරු දිවිපෙවෙත තුළින් දක්නට ලැබුණේ මවිත කරවන ආකාරයෙනි. වරක් කී යම් දෙයක් කිසි විටෙක අමතක නො වන දුලබ ගුණය මෙම කුල කුමරුවන් තුළ පැවති බව **දිවිගාල්පිටිය පරපුර** පිළිබඳ ලියා ඇති, මේ කුමරු උපන් නිවසෙහි තැන්පත් කොට ඇති පැරණි වාර්තා පොතක සඳහන් ව ඇත.

ගුණවත් මවුපියන්ගේ ඇසුර මෙන් ම ආරාමයෙහි ඇසුර නිසා ගුණ නුවණින් මුහුකුරා ගිය ස්වරූපය ශ්‍රී වර්ධන ළමා චරිතයෙන් ප්‍රභාවිතවිය. මවුපිය වැඩිහිටියන්ට ගරු සැලකිලි දැක්වීම, අවිහිංසාව, කරුණාව, දයාව ආදී අනේකවිධ ගුණදම්වල මහිමය ශ්‍රී වර්ධන ළමා චරිතයෙන් දීප්තිමත් විය. මල් පහනින් බුදුන් පුද තුන් සූත්‍රය ස්වීය ස්මරණයෙන් ම කියවා මවුපියන් පුදන උදර ගුණය අද වසරකටත් පෙර ළමා සිරිතකින් අසන්නට ලැබෙන්නේ නම් එය ශ්‍රී වර්ධන කුල කුමරුන්ගේ ළමා චරිතයෙනැ යි සිතිය හැකි ය.

# 3 පරිච්ඡේදය

## පැවිද්ද හා ප්‍රාථමික සාසනික අධ්‍යයනය

ශාසනික ප්‍රතිපදවෙන් ජීවනචර්යාව උපශෝභිත කළ විදුරුපොළ ශ්‍රී **සුමංගලාරාමාධිපතිත්වය** දැරූ කඹුරුගමුවේ **සුමන** ස්වාමීන්ද්‍රයන් වහන්සේ සාසන පැවැත්මට සිදු කළ මෙහෙයන් අතර අතිඋදාර මෙහෙයකි විදුරුපොළ **රතනජෝති** සාමණේරයන් වහන්සේ නමින් කුල කුමරකු පැවිදි කිරීම. උන්වහන්සේ සංඝපිතෘවරයෙකු ලෙසින් සාසනයටත්, අමරපුර නිකායටත් සාර්ථක මෙහෙයක් ඉටු කළහ. **සිරි රතනජෝති** මා හිමිපාණන් වහන්සේ නුවරඑළියේ **ශ්‍රී මහා විහාරයේත්**, උඩුවහවර ශ්‍රී **විජයාරාමයේත්**, ආගමික කටයුතුවල නිරත වූ සමයෙහි දී විදුරුපොළ ශ්‍රී සුමංගලාරාමාධිපතින් වහන්සේ ලෙස ක්‍රියා කළේ රතනජෝති මහ නා හිමිපාණන් වහන්සේගේ ශිෂ්‍ය සිරිපවර ජිනෝරස පනාකන්නියේ **සිරි අමිතසාර** නා හිමිපාණන් වහන්සේ ය. මුන් වහන්සේලාගේ ශිෂ්‍යවරයෙකු ලෙසිනි **පියතිස්ස** හෙරණ පාණන් පැවිද්ද ලැබුවේ.

විදුරුපොළ **දිවිගාල්පිටිය** ගෙදර විසූ වීරවන්නි මුදියන්සේලාගේ **අප්පුහාමි** වෙද්දුරුතුමන්ගේ හා එම **මැණිකේ**ගේත් කනිටු පුතණුවන් ලෙසින් 1880 ජුනි මස 16 දින මෙලොව එළිය දුටු **ශ්‍රී වර්ධන** කුලකුමරුවන් තුළ ළාබාල වියේ දී ම පින් බලයක් මෙන් ම ගුණ බලයක් දක්නට ලැබුණි. **වීරවන්නි පරපුරේ** ප්‍රවේණිගත කුසලතා රසකින් බුද්ධි ප්‍රභාවය විකසිත වූ ලක්ෂණ දක්නට ලැබුණ බැවිනි, ඉහත සඳහන් යතිවරුන් මෙම කුලකුමරු පැවිදි කිරීමට කැමැත්ත දක්වූයේ. ගිහි දිවියෙහි දී ම පැවිදි ඇදුරුවරුන් ගෙන් අක්ෂර ශික්ෂණය පිළිබඳ අවබෝධයක් ලැබී ය. දස වසර ලබන විට හොඳින් ලිවීමටත්, කියවීමටත් හැකි වූයෙන් ඇදුරු හිමිවරුන් විසින් හෙරණසිඛ හා පිරිත් ආදිය මැනවින් උගන්වනු ලැබූ බව **'පඤ්චවිංශති පූර්ති'** නමැති කෘතියේ සඳහන් වේ. **රතනජෝති** මා හිමිපාණන් වහන්සේ උපාධ්‍යාය කොට **අමිතසාර** හිමිපාණන්ගේ ආචාර්යත්වයෙන් පැවිදි බව ලැබූ පසු ශ්‍රී වර්ධන කුමරුන් හැඳින්වූයේ **විදුරුපොළ පියතිස්ස** යන නමිනි. මෙම කුල කුමරු පැවිදි වූයේ ක්‍රි.ව. 1890 මැයි 26 දින පෙරවරු දස පැය වේලාවෙහි දී ය. මෙසේ පැවිදිබව ලැබූ හෙරණපාණන්ට විද්‍යාරම්භක සුභ මොහොතේ දී 'පාළි වරනැගිල්ල' කියවූයේ උපාධ්‍යායන් වහන්සේ විසින් ය. අධ්‍යාපන කාර්ය විෂයෙහි කුඩා හෙරණපාණන් තුළින් කුශාග්‍ර

බුද්ධිප්‍රභාව දිනෙන් දින පෙර පස සඳක් සේ වැඩෙන්නට විය. වසරක් ඇතුළත පාළි, සංස්කෘත, වරනැගිලි දෙකත්, රූපමාලාවත්, රසවාහිනී කථා වස්තු සතළිසකුත් කියවා නිම කිරීමට සමත් වූ බව පියතිස්ස මහා නායක හිමිපාණන් වහන්සේ ම සඳහන් කොට ඇත. පාළි නිඝණ්ඩුව හා බාලාවතාරය පාඩම් කරන්නට පටන් ගත් පියතිස්ස හෙරණපාණන් එක් දිනක් සිය උපාධ්‍යායයන් වහන්සේ වෙත ගොස් දිනකට තමන්ට ගාථා හැටක් පාඩම් වන බව පැවසූ විට දවසකට ගාථා අටක් හෝ දහයක් පාඩම් කළ යුතු යැයි වදාළ බවත් 'ශ්‍රී පියතිස්ස සාහිත්‍ය අංකය' නැමැති කෘතියෙහි සඳහන් වේ. වසරක් තුළ දී 'නිඝණ්ඩු' වේ ගාථා 800 ක් හා බාලාවතාරයත් පාඩම් කොට නිමවාගෙන සිංහල, පාළි, භාෂා දෙකට අයත් ව්‍යාකරණ ඡන්දස් අලංකාර සහ පාළි පොත් කීපයක් ද ඉගෙනුම ලැබී ය.

සිරි රතනජෝති මහා නා සමිඳුන්ගෙන් මූලික ශාසනික ශික්ෂණය හා භාෂාශාස්ත්‍රයන් පිළිබඳ ව ප්‍රාථමික දැනුමක් ලබාගත් පියතිස්ස හෙරණ පාණන් වහන්සේ තමන් තුළ පිහිටි නිසර්ග සිද්ධ බුද්ධිකෞශල්‍යය සිය ගුරු දෙගුරුන් විස්මිත වන අයුරින් විදහා පෑහ. තත්කාලීන වියතුන් අතර සුවිශේෂ කීර්තියට පත් ව සිටි නා සමිඳුන් සිය පැවිදි සිසුවරයාගේ අසීමිත කුසලතා පිළිබඳ ව මවිතයට පත්වැ සිටි බව පැවැසෙයි. එම වයසේ සිටි අන් කිසිදු හෙරණපාණ කෙනෙකු නො ලබන විෂයාවබෝධයකින් මේ ළදරු සාමණේර නම කීර්තිමත් විය. පාළි, සිංහල භාෂා සාහිත්‍යය පිළිබඳ විශේෂ දැනුමක් ද සංස්කෘත භාෂාව හා සාහිත්‍ය මෙන් ම ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සාමාන්‍ය දැනුමක් ද පසළොස් වසර වන විට ලබා තිබිණි.

පූර්ව පාරිවේණික සමයෙහි දී ම සිංහල හා පාළි ප්‍රබන්ධකරණය පිළිබඳ ලද හැකියාව ද විස්මය දනවන සුලු විය. විචිත්‍ර කාව්‍ය නිර්මාණය උන් වහන්සේට හුරු පුරුදු වූයේ හෙරණ වියේ දී ම ය. මේ දුලබ වූ ද, විරල වූ ද, සිදුවීමකි. දේශනයෙහි ලා පැවැති සහජ ශක්තිය ද අසාමාන්‍ය වූ ශක්තියක් සේ සිය ඇදුරුවරයා අගය කෙළේ ය. නෛසර්ගික වූ ප්‍රතිභාඥානය විවිධ කාව්‍ය රචනයෙහි ලා උන්වහන්සේ පොළඹවාලී ය. පියතිස්ස හෙරණ පාණන් හට තමනට වයසින් වැඩිහිටි ගිහි පැවිදි වියතුන්ගේ ධර්ම ශාස්ත්‍රීය ගැටලු නිරාකරණය කර දීමටත්, කාව්‍ය හා ධර්මශාස්ත්‍රීය රචනාවල සඳෙස් තැන් නිදෙස් කර දීමටත්, තරම් වන අවබෝධයක් හා බුද්ධිමාහාත්මයක් තිබිණ.

ඒ වන විටත් ලංකාවේ උඩ, පහත දෙරට ම කීර්තිමත් වැ සිට රතනජෝති මහ නා හිමි වියත් සුපේශල ශික්ෂාකාමී සංඝපිතෘවරයෙකු ලෙස ගිහි පැවිදි උගතුන්ගේත්, පොදු ජනතාවගේත්, පිළිගැනීම විය. උන්වහන්සේගේ අනුශිෂ්‍යයකු හැටියට හැඩ ගැසුණු පියතිස්ස ළදරු සාමණේරයන් වහන්සේ තම උපාධ්‍යායන් වහන්සේ සපුරා ආදර්ශයට ගත්හ. නිසර්ග සිද්ධ තම හැකියාවන් දිනෙන් දින දියුණු තියුණු කර ගැනීමට ඒ මහා නා හිමියන්ගේ නිරන්තර ආශ්‍රයත්, සදුපදේශදානය හා මග පෙන්වීමත් බෙහෙවින් ම පිටු වහල් විය.

**රතනජෝති** මහානායක හිමියන් එද ලංකාවේ සිටි සුප්‍රසිද්ධ කවියෙකි. විශේෂයෙන් පාළි, සිංහල, ගද්‍ය පද්‍ය රචනාවෙහි ලා උන් වහන්සේට පුළුල් හැකියාවක් තිබිණ. එම හැකියාව ළදරු සාමණේර අවධියේ ම **පියතිස්ස** පුංචි හාමුදුරුවන්හට ලැබී ඇත්තේ පාරම්පරික දායාදයක් ලෙසිනි. වයස එකොළහ දොළහ වන විට ම පියතිස්ස ළදරු සාමණේරයන් වහන්සේ පාළි,සිංහල,ගද්‍ය පද්‍ය රචනා විෂයයෙහි දක්වා ඇත්තේ ප්‍රවීණ බුහුටි බවකි. ආචාර්ය උපාධ්‍යායයන් වහන්සේලා තව තවත් එම හැකියාවන් පෝෂණය කෙළේ තම ශිෂ්‍යවරයාගේ අනාගතය පිළිබඳ අසීමිත අපේක්ෂාවන් ගොඩක් ගොඩ කරගෙන යි.

**පියතිස්ස** සාමණේරයන් වහන්සේට යම්තම් දෙළොස් විය උද වූවා පමණි. හරබර පාළි ගාථා, සිංහල කවි තැනීම උන්වහන්සේට විනෝදාංශයක් මෙන් විය. පියතිස්ස කුඩා ස්වාමීන් වහන්සේට විනෝදාංශයක් වැනි නිර්මාණ රසවතුනට රසගුළාවක් වූයේ නිතැතින් ම ය. පියතිස්ස කුඩා හිමියන්ගේ රචනා චාතුර්යය හා නිර්මාණ කෞශල්‍යය ප්‍රබුද්ධ රසිකයන්ගේ සිත් ඇද බැඳ ගැනීමෙහි සමත් විය.

ලංකාවේ නොයෙක් පෙදෙස්වල දේසනා පවත්වමින් ජාතික මෙහෙවරක යෙදුණු **ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා** ක්‍රි.ව. 1892 වැලිමඩ ප්‍රදේශයට ද සැපත් විය. එතුමා පිළිගැනීම සඳහා පිළියෙළ කැරුණු පාළි සිංහල පද්‍ය ප්‍රබන්ධය රචනා කළේ එවකට දෙළොස් වියේ සිටි **පියතිස්ස** සාමණේරයන් වහන්සේ ය. මේ එම ප්‍රබන්ධය යි :

1. ''ධීමාසංසුද්ධකිත්තීසපරහිතරතො. මොක්ඛමාකඞ්ඛමානො
සම්බුද්ධස්සාසනස්මිංසතතමභිරතො පුඤ්ඤපිණ්ඩූපමො සො
නානාසත්ථප්පවෙදීවිපුලගුණයුතො වණ්ණනීයොබුධෙහී
සම්භාතු **'ධම්මපාල'** චිහයවිබුධවරො නාකරාජෙනගුත්තො.

(ශ්‍රග්ධරා)

2. සබ්බඤ්ඤුනො පවරසාසනමම්බරස්මිං
සූරොදිතො සුජනචිත්තරවින්ද බොධො
ධම්මාදිනාම විසුතො ගුණරංසියුත්තො
යො සො විභාතු සතතං අනජඤ්ඤයුත්තො.

(වසන්තතිලකා)

3. විදිත සුගතධම්මො බාහුසච්චන්විතො යො
පවුර විරියයුත්තො සාසනජ්ජොතනස්මිං
අවිජහිත පසාදෙ තීසු වත්ථූසු නිච්චං
ස ජයතු චිර කාලං **'ධම්මපාලා'** භිධානො''

(මාලිනී)

1. සිරි කත විසුර මුවසර සරසවි සුරඳු
සිරි සර නෙකිතුගොස පළ දස දිගෙකඳු
සිරි ගණ සසුන වඩනට ලපෙමැති නොමඳු
සිරි විඳ සැරද ගරුතර '**දම්පල්**' මැතිඳු

2. සතර උගත් නුවණැති සම සුර ඇදුර
සතර දනැත් කුඹුපලනට කෙසර යුර
සතර සසුනඹරමත පත් රෙහෙණි සුර
සතර සුර රකින් '**දම්පල්**' මැති පවර

3. ලෙස සිත සුරක සිකපද පසසිල් අවන
ද ස නට පැමිණි සැම දන මන නද කරණ
ද ස බල සසුන වැඩුමෙහි සැදූහැති නොමින
ද ස දස වසෙක දින '**දම්පල්**' මැති කළණ

4. ලොවැදුරුව න් මුනි බුදුවුනු මරුන් මැඩ
සැදි සොබම න් දඹදිවැ ජයමහබො මැඩ
මිසදිටුව න් ගෙන් මුදවා රැගෙණ ඉඩ
සුගත සසු න් වඩවා කරණට ලොවැඩ

5. නෙ දෙසතු ර පුවත් මේ පළකොට ගොසින
කරණ වැ ර මහත් සැදැහැති ලෙස පමන
ගුණැතිව ර සමත් '**දම්පල්**'මැති සොබන
වෙමිනස ර සැපත් දින දින දින යෙහෙන

එම වයසේ දී **පියතිස්ස** ළදරු හෙරණපාණන් වහන්සේ විසින් රචනා කරන ලද මෙබඳු පාළි සිංහල පැදිවැල් සිය ගණනාවක් දක්නට ලැබේ. ඉහත සඳහන් ප්‍රබන්ධය ඒවායින් එකක් පමණි. එයින් වුව ද උන්වහන්සේ තුළ තිබුණු කවිශක්තිය කෙබඳු ද යනු වටහා ගැනීම අපහසු නො වේ. පද්‍ය රචනයට පමණක් නොව ගද්‍ය රචනාව පිළිබඳ ව ද උන්වහන්සේට විශේෂ හැකියාවක් ඒ ළමා කාලයේ දී ම පිහිටා තිබුණේ ය. සමකාලීන අවස්ථෝචිත සිද්ධි පවා ගද්‍ය සම්ප්‍රදයෙන් ඉදිරිපත් කිරීමට උන්වහන්සේ සමත් වී ඇත. කොළඹ නගරයේ විසූ **ඇස්. පී. විලියම්ස්** නමැති ඉංග්‍රීසි, දෙමළ ආදී භාෂාවන් පිළිබඳ ව උගතෙක් වරක් විදුරුපොළ සුමංගලාරාම විහාරස්ථානය කරා පැමිණියේ ය. ඔහු අන්‍යාගමිකයෙකි. බුද්ධාගම ගැන කරුණු වටහාගෙන තම ඇදහිල්ල අත හැරපියා බුදුසමය වැළඳගෙන **රතනජෝති** මහානායක හාමුදුරුවන්ගෙන් ද බුදුසමය ගැන අවබෝධයක් ලබාගෙන උන්වහන්සේ ඇතුළු විහාරස්ථ භික්ෂූන් වහන්සේලා ආශ්‍රය කරමින්, බෞද්ධ වත් පිළිවෙත් පුරමින් කාලයක් විදුරුපොළ විහාරස්ථානය ඇසුරු කරමින් කල්ගත කෙළේ ය. **විලියම්ස්ගේ** ජීවිත කථාව ඇතුළු එම පුවත් සමුදය පාළි ගද්‍යයට නගා කෙටි ජීවන චරිත සටහනක් පිළියෙළ කර දෙන ලෙස

**පියතිස්ස** කුඩා සාමණේරයන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ ය. උන් වහන්සේ ඔහුගේ එම ඉල්ලීම ඉෂ්ට කරමින් ව්‍යක්ත පාළි ගද්‍ය රචනාවක් පිළියෙළ කර දුන්හ. ඉතා ළාබාල වියේ සිටි පියතිස්ස සාමණේරයන් වහන්සේගේ පාළි රචනා පිළිබඳ ශක්තිය කෙරෙහි පුදුමයටත් පැහැදීමටත් පත් විලියම්ස් උපාසක තැන මහත් සතුටට පැමිණියේ ය. එම පාළි රචනාව සෙසු අයගේ ප්‍රයෝජනය සඳහා ප්‍රසිද්ධියට ද පත් කළේ ය. එබඳු කාලීන සිද්ධි ගෙන පාළි ගද්‍යයෙන් එම ළපටි සාමණේරයන් වහන්සේ කළ තව ද නිර්මාණ රාශියක් දක්නට ඇත.

මුන්වහන්සේට වයස අවුරුදු දෙළහ වන විට තවද දක්ෂකම් රැසක් පහළ වී තිබුණි. තැනට සුදුසු නුවණින් කටයුතු කිරීම ගුරුහිමිවරුන්ගේ බලවත් සතුටට හේතුවිණ. 1892 දී නුවරඑළියේ ශ්‍රී මහා විහාරයෙහි වැඩ නිමවා පෙරවස් එළඹි දින විශාල සෙනගක් විහාරස්ථානයට පැමිණ සිටියහ. **පියතිස්ස** සාමණේර හිමියන්ගේ ප්‍රසන්න ජනක වත් පිළිවෙත් හා ආචාර විචාර සම්පත්තිය දුටු බැතිමත්හු ද ප්‍රසාදය පළ කළෝ ය. එම වසරෙහි පවාරණ දිනයේ දී හෙරණපාණන්ගේ මංගල ධර්මදේශනය විදුරුපොළ ධර්මශාලාවේ දී සිදු විය. ධර්මශාලාවත්, විහාරභූමියත්, පිරෙන තරමට අති විශාල සෙනඟක් ධර්ම ශ්‍රවනයට පැමිණි බවත්, දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවෙන් රාත්‍රි 2 වනතුරු ධර්මදේශනා කළ බවත්, 'පඤ්චවිංශති පූර්ති' නමැති සිය කථාවෙහි උන්වහන්සේ සඳහන් කරති. ධර්මශ්‍රවනය කළ බැතිමතුන්ගේ ප්‍රසාදයත්, භක්තියත්, ස්නේහයත්, වැඩි දියුණු විය. හෙරණපාණන්ගේ කථිකත්වය, දේශනා විලාසය හා ධර්ම කරුණු අවබෝධ කරවන ආකාරය පිළිබඳ කවුරුත් පුදුමයට පත්වූහ. ධර්මශ්‍රවනය සඳහා උපාධ්‍යායයන්වහන්සේ ද ධර්ම ශාලාවට ම පැමිණියහ. හෙරණපාණන්ගේ කුසලතාවන් ගිහි පැවිදි හැම දෙනා ම බෙහෙවින් අගය කළ බව එමගින් වැටහේ. දෙළොස්වන වියේ දී එම මංගල ධර්ම දේශනය, සිදු කිරීමෙන් අනතුරුව නුවරඑළිය ප්‍රදේශයේ දයකවරුන්ගෙන් ධර්මදේශනාවකට ඇරයුම් ලැබුණි. **ශ්‍රී මහා විහාර** ධර්ම ශාලාවෙහි දී ඒ ඇරයුම ඉටු කෙළේ හෙරණපාණන්ගේ දෙවන ධර්ම දේශනාව හැටියටයි. මෙහි දී ද විචිත්‍ර දේශනා විලාසය ඔපටත් ව ප්‍රකට වූයෙන් අමන්දානන්දයට පත් වූ දයක පින්වතුන්ගේ ඉමහත් ගෞරවාදරයට මුන්වහන්සේ පාත්‍ර වූහ. ධර්ම දේශනාවෙන් දස වසරක් ගිය පසුව ස්වකීය උපාධ්‍යායයන් වහන්සේ ඒ පිළිබඳ පසසනු ලැබූ බව සිරි **පියතිස්ස** මහනාහිමිපාණන් වහන්සේ ම සඳහන් කොට ඇත.

1893 දී **සිරි රතනජෝති** මා හිමිපාණන් වහන්සේ පෙරවස් එළඹුණේ බඹරකැලේ **ශ්‍රී මහා විහාරයේ** ය. ඒ කාලයේ දී දේව බලයකින් ශාස්ත්‍ර කියන සිංහල පඬිවරයෙක් ආරාමයට පැමිණියේ ය. ඔහු **පියතිස්ස** හෙරණ පාණන්ගේ යටිපතුල්වල රේඛා බලා :

"මේ පුංචි හාමුදුරුවො සංඝරාජකමට සුදුසු කෙනෙකැයි" පැවසුවේ ය.

අනාගත භික්ෂූන් වහන්සේ පාලනය කිරීමේ පෞරුෂ බලය කුඩා හෙරණපාණන් තුළින් විද්‍යාමාන විය.

> "ළදරු යම් මහණෙක් බුද්ධ ශාසනයෙහි යෙදේ ද, හෙතෙම වලා පටලින් මිදුනු පුන්සඳක් මෙන් ලොව ඒකාන්තයෙන් ම නුවණ නමැති එළියෙන් බබළුවන්නේ ය."

යන බුදුවදන පියතිස්ස හෙරණපාණන්ගේ සිරිතෙන් දිස්විය. පසු කල ලියන ලද **'කමලඤ්ජලී'** භක්තිකාව්‍යයෙන් ප්‍රකට කළ බුද්ධ භක්තිය එද ළදරු හෙරණපාණන්ගේ අංකුර අවස්ථාව හටගැන්මක් බඳු විය. මෙම හෙරණපාණන් තුළ පැවති ප්‍රතිපත්ති ගරුක බව හා බුද්ධි කුසලතාව නිසා ජනතාව තුළ බලවත් ප්‍රසාදයක් හා ගෞරවයක් ඒ ළාබාල අවධියේ ම පැවති බව **දිවිගල්පිටියේ කෝ‍ර්නර්තුමන්** ලියන ලද අත් පිටපතක සඳහන් ව ඇත.

ළමා කාලයේත්, පූර්ව පාරිවේණික අවධියේ දීත්, පියතිස්ස සාමණේරයන් වහන්සේ ලිඛිත දිනචරියාවකට අනුගතවම සිය වත පිළිවෙත හා උද්ග්‍රහණ ධාරණ ආදී අධ්‍යයන කටයුතුත් පවත්වාගෙන යාම විශේෂ ලක්ෂණයක් විය. මේ ආකාරයෙන් පියතිස්ස හෙරණපාණන් වහන්සේ ගුණයෙන්, නුවණින් හා කථිකත්වයෙන් ද ප්‍රගල්භ බුද්ධි කුශලතාවෙන් ද ඒ ළාබාල අවධියේ ම පිරී සිටියෙන් අනන්‍යසාධාරණ අනාගතයක පෙර ලකුණු ප්‍රකට කරමින් හිරබටු තරුවක් සේ බබළමින් දිස්වන්නට වූහ.

විදුරුපොළ පියතිස්ස ළදරු සාමණේරයන් වහන්සේ තුළ තිබුණු තව ද විශේෂ හැකියාවක් නම් පැහැදිලිව ඉතා ලස්සනට පුස්කොළ අකුරු ලිවීම යි. කවදත් උන්වහන්සේ නිවැරදි පැහැදිලි ලස්සන අකුරුවලට ගරු කළහ. එය උන්වහන්සේගේ ජීවිතයෙහි අවසාන කාලයේ පවා ඒකාකාරව දක්ක හැකි ව තිබුණු විශේෂත්වයකි. **කැටගොඩ ගුරුන්නාන්සේ** නමැති බලි ඇදුරෙකුගේ ආරාධනාවක් පරිදි අටතිස් මඟල නමින් රචනා කරන ලද කුඩා කාව්‍යය උන්වහන්සේ සියතින් පුස්කොළවල ලියා පොතක් හැටියට පිළියෙළ කොට විසිතුරු කඩවැස්මකින් නිමහම් කර අනාගතය සඳහා තැන්පත් කොට තබා තිබේ. එම කාව්‍යය ඉතා දිගටි පැදි ගණනාවක් ඇතුළු විවිධ වෘත්තවලින් රචනා කරන ලද සරල නිබන්ධනයකි. ඒ කාව්‍යයෙන් උපුටා ගන්නා ලද ආරම්භය ඇතුළු පද්‍ය කීපයක් මෙසේ ය :

ස්වස්තිසිද්ධං

නමව් මුනි සරණ

1. සිරි ගුණ සරණ ස     ර
වැද දම් සරණ සිහි ක     ර
සඟ රුවන නම ක     ර
කියමි අටතිස් මඟල කවි ක     ර

2. ස ත් න ට  අපෙ මුනි වදහළ  මංගල
අ ත් පි ට  සිරි සැප දෙන සුබ  මංගල
නි ත් වි ට  මෙ ඔබට ආසිරි  මංගල
සෙත්කොට  පවසමි අටතිස්  මංගල

3. ඇසුවොත්  මුනි බණ කන් සිතු  ලොල්ලේ
පිරුවොත්.  පිළිවෙත සැපත විපු  ල්ලේ
ඇසුවොත්  මෙම අටතිස් මංග  ල්ලේ
සුබ සෙත්  බෝවා කලක් මුළු  ල්ලේ

4. කසළේ  තිබුනත් මහගි රුවන්  මය
සිහලේ  කවිකොට කිවත් දහම්  මය
නිමලේ  මුනිගුණ ඇසුවොත් සැප  මය
විපුලේ  ඔබහට මින් සුබ සෙත්  මය

5. න මා  සවන් සිතු යොමු කර මි  න්නේ
පෙමා  සිතින් ඇසුවොත් නොලසි  න්නේ
ද මා  මෙයින් පිරිපත දුර ල  න්නේ
නි මා  නො වන් සුබසෙත් සිරි දෙ  න්නෝ

6. සිතුලෙස්  වැජඹෙන වෙහෙර විදුරුපො  ල
පි ය තිස්  හිමිසඳ කිවිමන් බිඳ හ  ල
සමතැස්  මුනිරජ සතහට වද හ  ල
අ ට තිස්  මෙමඟුල් පද බැඳ සෙත් ක  ල

7. විමල්  දඹදිව කලෙක බරණැස් නුවර ඇ සැමතැන පසි  ද්දේ
විපුල්  දනරුස් වෙමින් රාමායනය ඇ කියමින් ඇවි  ද්දේ
එකල්  තැනකදි එකෙක් සෙට අප මඟුල් ඇත කී දනුව සු  ද්දේ
මඟුල්  කිම්දැයි එද ඇතිවිය මගුල් කොලහල වාද බ  ද්දේ

6. මි නි ස්  ලොව සැම තැන ම පැතිරී සදෙව් ලොව දෙවියන් තු  ලේ
වෙ න ස්  බව ඇති අසන්තල හැර පසළොසක් මහ බඹ ත  ලේ
ද හ ස්  සුවහස් වාද කරමින් නො ලැබ තිරසර කිසි ප  ලේ
දොළොස්  අවුරුදු කලක් පැවතුනි මෙලෙස මෙමගුල් කොලහ  ලේ"

මෙම කාව්‍යය උන්වහන්සේ නිමකොට ඇත්තේ 'අටතිස් මහල නිමි, විදුරුපොල පියතිස්ස ස්වාමිදරුවන් විසින් රචනා කරන ලදී.' යන වැකියෙනි. ඉතා කුඩා කල පටන් ම පුස්කොළ අකුරු ලිවීමෙහි ඕනෑකමක් දක් වූ පියතිස්ස හෙරණපාණන් තමා කළ බොහෝ කෙටි රචනා පුස්කොළවල ද ලියා තැන්පත් කොට තැබූහ. ලංකාවේ විවිධ පළාත්වල උගතුන්ගෙන් ස්තුති ප්‍රශංසා වශයෙන් තමාට ලැබුණු කවි, ගාථා, ශ්ලෝක රාශියක්ද එසේ ලියා තබා ඇත.

# 4 පරිච්ඡේදය

## පාරිවේණික අධ්‍යයනය හා උපසම්පදාව

විදුරුපොළ **පියතිස්ස** සාමණේරයන් වහන්සේ සිංහල පාළි භාෂා ඥානයට අවශ්‍ය සව්‍යාකරණ නිඝණ්ඩු ද, සාහිත්‍ය ඥානයට අදාළ පොතපත ද කාව්‍යකරණයට ඉවහල් වන ඡන්දස් අලංකාර පොත් ද සිය උපාධ්‍යායයන් වහන්සේ වෙතින් මැනවින් හදරා බුහුටි බුද්ධිමතකු හැටියටත්, අසාධාරණ ස්මරණ ශක්තියක් ඇත්තකු හැටියටත් ඒ වන විට ද ලබා තිබුණේ අසාමාන්‍ය කීර්තියකි. ප්‍රතිභාපූර්ණ කවියකු හැටියට ද උන්වහන්සේගේ කීර්තිය දිනෙන් දින පැතිරෙන්නට විය. පියතිස්ස හෙරණපාණන්ගේ දේශනා විලාසය හා කථිකත්වය ද අන්‍යයන් විස්මිත කරනසුලු විය. මේ සියල්ලත් සමඟ උන් වහන්සේ තුළ තිබුණු ගුරු භක්තිය ද අසීමිත එකක් වූයේ ය. මෙම හැම කරුණක ම ප්‍රතිඵලය වූයේ ගුරුචිත්තාරාධනය පෙර පස සඳක් සේ දිනෙන් දින අභිවර්ධනයට අවතීර්ණ වීමයි. ශිෂ්‍යයාගේ අනාගතය ගැන ගුරුවරුන්ගේ අපේක්ෂා නොසිතිය හැකි තරමින් පුළුල් විය. ඒ වන විටත් ඉංග්‍රීසි භාෂාව ගැන සාමාන්‍ය දැනුමක් ලබාගෙන සිටි සිය ශිෂ්‍යවරයාට පුළුල් ඉංග්‍රීසි භාෂා ඥානයක් ලබාදීම ගැනත්, විශේෂයෙන් සංස්කෘත භාෂාව ඇතුළු පෙරදිග භාෂා පිළිබඳ වඩා විස්තෘත දැනුමක් ලබාදීම ගැනත්, ගුරුවරු කල්පනා කරන්නට වූහ. ඊළඟ පියවර වූයේ ඊට උචිත ශාස්ත්‍ර ශාලාවක්, ගුරුභූමියක් සොයා ගැනීම යි.


ඒ සඳහා වර්තමාන ධර්මශාස්ත්‍රෝන්නතියේ මූලස්ථානය වූ රත්මලානේ **පරමධම්මචේතිය** පිරුවන ඉතා සුදුසු ම ස්ථානය ලෙස තීරණය කර ගැනීමට උන්වහන්සේලාට වැඩි කාලයක් ගත නොවී ය. හික්කඩුවේ ශ්‍රී සුමංගල නා හිමිපාණන් වහන්සේට **විද්‍යොදය** පිරුවන ඇරඹීමටත්, රත්මලානේ ශ්‍රී ධර්මාලෝක නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට **විද්‍යාලංකාර** පිරුවන ඇරඹීමටත් අවශ්‍ය දැන උගත්කම් ලබා දුන් පරමධම්මචේතිය පිරුවන විදුරුපොළ පියතිස්ස සාමණේරයන් වහන්සේටත් තම උසස් අධ්‍යාපනය ලබා ගත හැකි ගුරුභූමිය විය. භාෂාශාස්ත්‍ර විෂයෙහි ප්‍රවීණත්වයෙන් මෙන් ම කරුණා දයා දක්ෂිණ්‍යාදී ගුණ සමුදයකින් ද විභූෂිත ව සිටි **වලානේ ශ්‍රී ධර්මානන්ද** නා හිමියෝ එකල එහි ආධිපත්‍යය දැරූහ.

වර්ෂ 1895 පෙබරවාරි 22 දිනට යෙදුණු සුබ මොහොතින් විදුරුපොළ **රතනජෝති** මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ පියතිස්ස සාමණේරයන් වහන්සේ කැඳවාගෙන අවුත් පූර්වෝක්ත ධම්මානන් ද මහා ස්ථවිරපාදයන් වහන්සේට බාර කළහ. උන්වහන්සේ තම ශිෂ්‍යයා බාර කරමින් කීයේ පාළි, සිංහල දැනුම පරීක්ෂා කොට සතුටක් කළ යුතු බවත්, සංස්කෘත ටිකකුත් ඉගැන්විය යුතු බවත් ය. **පියතිස්ස** සාමණේරයන් වහන්සේට මෙම නව ශාස්ත්‍රභූමිය ධර්මශාස්ත්‍රඥනය ලබා ගැනීමට මෙන්ම ලබා ගත් දැනුම දියුණු තියුණු කර ගැනීමටත් හැම අතින්ම සුදුසු සශ්‍රීක ස්ථානයක් විය. නිසර්ගසිද්ධ බුද්ධිකෞශල්‍යයකින් හෙබි පියතිස්ස ශිෂ්‍යවරයා කෙරෙහි ගුරුවරයකුට කරන්ට තිබුණු කාර්යභාරය ඉතා සීමා සහිත විය. ශිෂ්‍යයාට ඉගැන්වීමට වඩා ඉගෙනීම සඳහා මඟ පෙන්වීම පමණකින් ගුරුවරයාගේ කාර්යය සම්පූර්ණ විය. ගුරුවරුන් නියම කරන ප්‍රමාණය මෙන් දෙතුන් ගුණයක් එක දිනකට ඉගෙනීම් කටයුතු කිරීමෙන් නියමිත විෂය දැනුම මේ ශිෂ්‍යයා ලබා ගත්තේ ගුරු ශිෂ්‍ය කවුරුනුත් විස්මයට පත් කරවමිනි. ගුරුවරුන්ගේ පමණක් නොව සහෝදර ශිෂ්‍ය පිරිසගේ ද දැඩි අවධානය මේ ශිෂ්‍යයා කෙරෙහි රැඳී බැඳී ආයේ ඉතාමත් සුළු කාල සීමාවක් තුළ යි. ශිෂ්‍යයන් අතර **පියතිස්ස** ශිෂ්‍යයා ඔවුන්ගේ ගැටලු හා සංසයස්ථාන විසඳන ආචාර්යවරයකුගේ ස්වරූපය ගත්තේ ය. මේ නිසා ශිෂ්‍ය පිරිස අතර තිබුණු සහෝදර සම්බන්ධය ගෞරව සම්ප්‍රයුක්ත ප්‍රවණතාව කට නැමී ගියේ ය. ගුරු ශිෂ්‍ය දෙපිරිස අතර පමණක් නොව එම ස්ථානයට සැපත් වන බාහිර විද්වතුන් අතරත් එහි දායකකාරකාදීන් අතරත් **පියතිස්ස** නාමය ජනාදරයට පත් වූයේ අතිශයින් ම සුළු කාලයක් ඇවෑමෙනි. ලංකාවේ චිර ප්‍රසිද්ධියට පත් විශාරද වියතුන් කීප නමක් එකල පරමධම්ම චේතිය පිරුවන්හි ධර්මශාස්ත්‍රය හැදෑරූහ. ස්වයංසිද්ධ බුද්ධිපාටවයත්, නිරන්තර අභ්‍යාසයත්, ඒ දෙකට ම නො අඩුව තිබුණු උනන්දුවත් නිසා පියතිස්ස කුඩා ස්වාමීන් වහන්සේගේ අධ්‍යයන කටයුතු නොසිතූ තරම් ඉක්මනින් සඵල විය. ආචාර්යවරයාගේ මඟ පෙන්වීම අර්ථවත් වූයේ ය. එහි යථා තත්ත්වය උන්වහන්සේගේම වචනවලින් පැවසෙන්නේ මෙසේ යි:

> "පරිවෙණාධිපති ගුරු දේවයන්වහන්සේ මගේ දැනීමේ තතු සොයා බලා සතුටුව අති සංක්ෂිප්ත වූ අධ්‍යාපන ක්‍රමයකින් අවුරුදු දෙකක් තුළ එළු, පාළි, සංස්කෘත භාෂාත්‍රයය හා ව්‍යාකරණ, ඡන්දස්, අලංකාරයන්හි උසස් නුවණක් මට දෙවා වදළේ ය. මම ශ්‍රීමත් කුසුමදේව පණ්ඩිතයන් රචනා කළ 'දෘෂ්ටාන්තශතක' නම් සංස්කෘත පද්‍යයට සන්නයක් ලියා පරිවෙණාධිපති ගුරු දේවයන් වහන්සේට පිළි ගැන්වීමි. උන්වහන්සේ එය බලා ඉතා සතුටු වූ සේක."
>
> පඤ්චවිංශතිපූර්ති.... පිටුව: 04

**සිංහල පාළි ගද්‍ය පද්‍ය රචනා සැපයීමෙන් සිය කවිශක්තිය පළ කළ පියතිස්ස හිමියෝ සංස්කෘත භාෂාවෙන් ද එබඳු ම රචනා සාර්ථක වැ නිර් මාණය කිරීමට අවශ්‍ය ඡන්දස් අලංකාරාදිය සහිත සංස්කෘත භාෂාඥනය ද**

# ත්‍රිපිටක ධර්ම සංගායනාව



1953 දී විද්‍යාලංකාර පිරිවෙන [වත්මන් විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය] මගින් කළ ත්‍රිපිටක ධර්ම සංගායනාවේ අභිධර්ම සංගායනා වාරයේ මූලසූන දැරීමට අගමැති ඩඩ්ලි සේනානායක මැතිතුමා විදුරුපොල ශ්‍රී පියතිස්ස මහ නාහිමිපාණන් වහන්සේට දූහැත් වට්ටියක් පිළිගන්වා ආරාධනා කරයි.

ලබා ගත්හ. එම භාෂාවෙන් ද සමත්කම් පෙන්වීමට පියතිස්ස සාමණේර යන් වහන්සේට වැඩි කලක් ගත නොවී ය. තම කුශලතාව පෙන්වීමට මෙන් පියතිස්ස හෙරණපාණන් කෙළේ හා පුරා කියා සංස්කෘත ශතක කාව්‍යයකට සන්නයක් ලිවීම ය. ඒ නම් ශ්‍රීමත් කුසුමදේව මහා කවියා විසින් රචනා කරන ලද දෘෂ්ටාන්තශතකයට ලියන ලද සන්නය යි. ඒ වන විට උන්වහන්සේගේ වයස අවුරුදු සතළොසකි. එය පිළිගන්වන ලද්දේ ද සිය ධර්මාචාර්යයන් වහන්සේට ම ය. එහි සංඥපනයෙහි උන්වහන්සේ මෙසේ කියති :

> "මෙයට පෙර සිංහල සන්නයක් නොතිබූන බැවින් මවිසින් රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙණෙහි ශාස්ත්‍රාධ්‍යයන කරණ සතළොස් (17) හැවිරිදි සාමණේර කාලයෙහි යථෝක්ත ටීකාවත් ඇසුරුකොට සිංහලාර්ථ ව්‍යාඛ්‍යානයක් ලියා සිය රටට පැමිණෙන කාලයෙහි (1897.02.27) ස්වකීය ආචාර්‍ය්‍ය උභය පක්ෂය සහ පාරිවේණික ශිෂ්‍ය සමූහය ද දායක පිරිස ද මධ්‍යයෙහි දී කියවා මගේ ධර්ම ශාස්ත්‍රාචාර්‍ය්‍ය වූ පරමධර්මචෛත්‍ය පරිවෙණාධිපති පූජ්‍යපාද වලානේ ධර්මානන්දස්ථවිර මා හිමියන් වහන්සේට ගුරු පඬුරු වසයෙන් පුදන ලදි. උන්වහන්සේ විසින් සමාදර කරුණා පුරස්සරවැ පිළිගෙණ වදරා...."
>
> සංඥපනය, පිටුව: 01

ඒ වයසේ දී පියතිස්ස හෙරණපාණන්ගේ සංස්කෘත භාෂාඥනය වටහා ගැනීමට එම සන්නය ප්‍රමාණවත් වේ. එම දැවුරුද්ද තුළ ලබාගත් සංස්කෘත භාෂාවබෝධය උසස් ලෙස කාව්‍ය නිර්මාණයට ද ප්‍රමාණවත් විය. දෘෂ්ටාන්ත ශතක සන්නයේ ප්‍රස්තාවනාව උන්වහන්සේ සපයන්නේ සංස්කෘත පද්‍යාවලියකිනි. ඒ මෙසේ යි :

ප්‍රස්තාවනා

1. ශ්‍රීයමඛිලවිදූර්භවාර්ණවෛක —
   තරණිනිභස්සුගතස්සුරෙන්ද්‍රවන්ද්‍යඃ ;
   ප්‍රථිතගුණගණස්සදසදද්‍යා —
   දමෘතනිධිර්භවතාං විභූතසත්‍යඃ.

2. ශ්‍රීමච්ඡාසනදෛත්‍යවිද්විෂපථෙ භක්තාග්‍රතාරාවෘතෙ
   කාරුණ්‍යප්‍රකටීකෘතෙන්දුරමලක්ෂිරාභකීර්තිප්‍රභඃ ;
   රත්නද්‍යොතියතීශ්වරඃ ස්ථිරධෘතිර්ධර්මාර්ථවිත් සත්කෘතිර්
   ජීයාද්වර්ෂශතං සුවිශ්‍රුතමතිර්වංශොත්තරං මද්ගුරුඃ.

3. අමිතවිඥවිවර්ණිතසද්‍යශො
   සමුදයො 'මිතසාරගුණාකරඃ;
   අමිතසාර සමාඛ්‍යමහායතිර්
   ජයති මද්ගුරුරග්‍රදයානිධිඃ.

4. භාස්වද්වංශාමෘතනිධිවිධොර්විශ්වලොකාධිපස්‍ය
සර්වඥස්‍යා'ඛිලගුණනිධෙඃ ශාසනෙ ශක්තචිත්තඃ,
විද්වද්වෘන්දෛර්විමලමතිභිර්වර්ණනීයස්වරූපො
ධර්මානන්දභ්වයයතිපතිර්භාතු භාස්වද්සුගාත්‍රඃ.

5. ශ්‍රීමත්කුසුමදෙවෙන විදුෂා විදුෂාං ප්‍රියම් ;
දෘෂ්ටාන්තශතකං නාම යත් ප්‍රණීතං සතාං මුදෙ.

6. තස්‍යෙ'යං යතිපුත්‍රෙණ ස්වයා සිංහලභාෂයා ;
ක්‍රියතෙ ප්‍රියතිෂ්‍යෙණ ව්‍යාඛ්‍යා තත්වාර්ථබොධිනී.

7. යද්‍යත්‍ර දෘෂ්‍යතෙ දෙෂො මත්ප්‍රමාදභ්‍රමොද්භවඃ ;
ස නිරාක්‍රියතාං ධීරෛර්ලොකාර්ථහිතසංසිහිඃ.

ළාබාල වියේ සිටි පියතිස්ය සාමණේරයන් වහන්සේගේ මේ නිර්මාණය බසින් හරවත් වන අතර කවිශක්තියෙන් පෝෂිත ද වේ. මෙතැන් පටන් එම යතිවරයන් වහන්සේ පාළි සිංහල පද්‍ය රචනාවට දක් වූ රුචිකත්වය සංස්කෘත ශ්ලෝක රචනයට ද දක්වන්නට වූහ. පියතිස්ස හෙරණපාණන් වහන්සේට රත්මලානේ පරමධම්මචේතිය පිරුවන්හි කළ ඉගෙනීම වැඩි කාලයක් කළ නොහැකි විය. එයට එකම බාධකය වූයේ සෞඛ්‍ය සම්පත්ති යෙන් පිරිහීමයි. ශාරීරික දුබලතාව දිනෙන් දින වැඩි දියුණු වීම නිසා පිරුවන්හි ඉගෙනීම නවතා ආපසු විහාරස්ථානය කරා යාමට අධිෂ්ඨාන කොට ගෙන ඒ බව සිය ආචාර්ය උපාධ්‍යායයන් වහන්සේලාට දන්වන ලදී.

කරුණු ඇති සැටියෙන් වටහා ගත් විදුරුපොළ රතනජෝති මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ 1897 මාර්තු 03 වැනි දින රත්මලානේ පිරුවන කරා වැඩම කොට ධර්මාචාර්යයන් වහන්සේට ගුරු පඩුරු ආදිය පිරිනමා සිය ශිෂ්‍යවරයා කැඳවාගෙන යාමට අවසරය ඉල්ලූහ. පියතිස්ස ශිෂ්‍යවරයා තමාට ධර්මශාස්ත්‍රදානය කළ ආචාර්යවර වලානේ ධම්මානන්ද නා හිමියන්ගේ ද දැඩි ප්‍රසාදයට හා සෙනෙහසට ලක්ව සිටි ගුරුයිත අකුරටම දිනාගත්තෙක් විය. එබඳු ශිෂ්‍යයකු පිරුවනින් පිටවනවා දකින්නට උන් වහන්සේ කෙසේ වත් කැමැත්ත දක්වූයේ නො වේ. එහෙත්, එම ඉල්ලීමට ඉඩ නො දී සිටිය නොහැකි විය. දෙනෙත පුරා පිරුණු කඳුළු ධාරාවලින් යුක්තව උන්වහන්සේ ශිෂ්‍යයාගේ අනාගතය සඳහා ආශිර්වාද පෙරටුව වරප්‍රසාදදානයෙන් ආපසු කැඳවාගෙන යාමේ ඉල්ලීමට කැමැත්ත දුන්හ.

විදුරුපොළ සිය අරම කරා වැඩම කළ පියතිස්ස යතිවරයන් වහන්සේ තරමක විවේකයක් ගනිමින් කයට මෙන්ම බුද්ධියටත් ප්‍රමාණවත් ඉස්පාසු වක් ලබා දුන්හ. රෝගී තත්ත්වය මැඩ පවත්වා ගැනීමට අවශ්‍ය සියලු වෛද්‍ය පිළියම් විධි සිය පියාණන් විසින්ම සපුරා ඉටු කරන ලදී. සුළු කලකින් ප්‍රකෘති තත්ත්වයට පත් හෙරණපාණන් වහන්සේ සිය උපාධ්‍යාය

යන් වහන්සේ ඇසුරු කරමින් පෙළ අටුවා පොත් ගැඹුරු ලෙසින් හැදෑරීමට ආරම්භ කළහ.

පියතිස්ස යතිවරයන් වහන්සේට වයස අවුරුදු දහඅට පිරෙත්ම තවද පාළි කාව්‍යයක් නිර්මාණය කළ හැකි විය. එය නම් සුගත බුදුගුණය වර්ණනා කැරෙන සුගතාලංකාරය යි. එහි කර්තෘ සන්දර්ශනයෙහි මෙසේ එයි :

" තෙනට්ඨාරසවස්සෙන – පියතිස්සෙන ධීමතා,
රචිතෝයම්පි සුගතා – ලංකාරො සිවමේසිනා "

විදුරුපොළ පියතිස්ස හෙරණපාණන් ගේ ධර්මශාස්ත්‍රධාරිත්වය සමඟ වයසත් කාලයත් ඉදිරියට ගියේ ය. උන්වහන්සේ වයසින් අවුරුදු විස්සට සමාසන්න වැ සිටියහ. ඒ උපසම්පදාවට යෝග්‍ය අවධිය වූයෙන් වර්ෂ 1899 අගෝස්තු මස 18 වැනි දින ගබ්භවීස උපසම්පදාවෙන් උන්වහන්සේ උපසම්පද අධිශීලය ලබා ගත්හ. එදින විදුරුපොළ සුමංගලාරාම විහාරස්ථ සුවිසුද්ධ බද්ධ සීමාවට රැස් වූ අතිරේක විංශත්වර්ගික මහා සංඝයා මධ්‍යයෙහි උපසම්පද අධිශීලය ලැබුයේ විදුරුපොළ රතනජෝති මහා නායක හිමිපාණන් උපාධ්‍යාය කොටගෙන ය. කර්මවාගාචාර්යයන් වූවෝ:

ගරු, රඹුපොල ධම්මරතන මහාස්ථවිර
ගරු, රංජල්ලාවේ ගුණරතන මහාස්ථවිර
ගරු, රාස්සගල සීලානන්ද මහාස්ථවිර
යන ස්වාමිපාදයාණන් වහන්සේලා ය.

තමන් ලබන උපසම්පද අධිශීලය නිමිත්තෙන් සිය උපාධ්‍යායයන් වහන්සේගේ ද සදුපදේශ මත පාළි කාව්‍යයක් රචනා කරන ලදී. අභිනව සාසනවංස නම් වූ එය මහා සංඝසභාව වෙත ඉදිරිපත් කරන ලදුව අතිශයින් ප්‍රීතිප්‍රමෝදයට පත් මහා සංඝසභාව සිරිපවර වජිරඤාණාලංකාර යන ගෞරව නාමසම්මුතිය දෙවා වදරමින් පිළිගන්නා ලදී. එය බු.ව. 2443 දී මුද්‍රණයෙන් ප්‍රසිද්ධ විය. සිය රුචිකත්වය අනුව සිංහල පාළි සංස්කෘත කාව්‍ය රචනාවල නිතර යෙදුණු පියතිස්ස හිමිපාණෝ දිගටම පාළි ගාථා රචනයෙහි ලා විශේෂ ලැදියාවක් දක්වන්නට වූහ. උපසම්පද ශීලයෙන් පසු පියතිස්ස හිමියන් තම උපාධ්‍යායයන් වහන්සේ වෙත ම වෙසෙමින් විනය පිටකය පිළිබඳ ව විශේෂ ශික්ෂණයක යෙදුනහ.

## 5 පරිච්ඡේදය

# ලක්දිව පළමුවැනි පඬිරුවන

කෝට්ටේ යුගයෙන් පසු සීතාවක යුගයේ උදවත් සමඟ ලංකාද්වීපය පුරා ඇතිවූයේ රට හා ජාතිය ඇතුළු ධර්මශාස්ත්‍ර මහා පරිහානියකි. ඊළඟට ඇරඹුණු මහනුවර යුගයේ මධ්‍යම සමයේ පහළ වූ වැලිවිට සරණංකර සඟරජ මා හිමියන්වහන්සේ එම ඛේදනීය තත්ත්වය පිටු දැකීමට පහළ වූ පූර්ණ චන්ද්‍රයෙකු බඳු වූහ. ආගම ධර්මය යථා ස්ථානයට ගැනීමට සපුරා කැප වූ උන්වහන්සේ භාෂා සාහිත්‍යය පිළිබඳ ව ද අධිෂ්ඨාන පූර්වක ස්වර්ණමය මෙහෙයක් ඉටු කළහ. දහ නව වැනි සියවසේ අවසාන කාර්තුවේ ආගමික අධ්‍යාපන ආයතන හැටියට පිරුවන් පහළවීමට ප්‍රාථමික හේතුව වූයේ උන්වහන්සේගේ ඒ මහනීය සේවයයි. පිරුවන් තුළින් ප්‍රාචීන භාෂාවන් හා තදයත්ත ශාස්ත්‍රාන්තරයන්ගේ දියුණුවට මග පැදිණ. එහෙත් දශක තුන හතරක්ම යන තුරු පිරුවන් තුළින් ලබන දැනුම පොදු විභාගයක් හෝ විභාගයන් මගින් ප්‍රමාණ කැරෙන පරීක්ෂණ පරිපාටියක් නො තිබිණ. මේ අඩුව එකල සිටි වියතුන්ට පමණක් නො ව ආණ්ඩුකාරයා ඇතුළු මහා බලවතුන්ට ද තේරී ගියේ ය. මෙරට භාෂාශාස්ත්‍ර සඳහා කීර්තිමත් සේවාවක් කොට තිබෙන ප්‍රාචීන භාෂොපකාර සමාගම ඇති කෙළේ එම අඩුව පිටුදැකීමට ය. ඒ සඳහා අනුබලය ලැබුණේ එද ආණ්ඩුකාරධුරය දැරූ සර් හෙන්රි ආතර් බ්ලේක් මහතාගෙනි. එකල අධ්‍යාපන අධ්‍යක්ෂ ධුරයෙහි සිටි ඇස්. ඇම්. බරොස් මහතා ආරම්භක සභාපතිවරයා වූ අතර ආරම්භක ලේකම් ඩබ්ලියු. ඇෆ්. ගුණවර්ධන වාසල මුදලිතුමා ය. ක්‍රි.ව. 1902 දී ඇරඹී එම සමාගම මගින් ප්‍රාචීන විභාග පරිපාටිය ඇති කරන ලදී. එම විභාග පරිපාටියේ මූලාරම්භ විභාගය නොහොත් ප්‍රාරම්භ විභාගය හා පුරා කියා පැවැත්වූයේ ක්‍රි.ව. 1903 වැනි වර්ෂයේ දී ය.

මේ අවධිය වන විට විදුරුපොළ පියතිස්ස හිමියන් තෙවිසි විය නො ගෙවූ තරුණ භික්ෂුවරයෙකි. උන්වහන්සේ රත්මලානේ පරමධම්මචේතිය පිරුවන මගින් විභාගයට ඉදිරිපත් කිරීමේ බලවත් ඕනෑකම ඇතිවූයේ පරිවෙණාධිපති නායක ස්වාමීන් වහන්සේට ය. මෙම කාරණය විභාගයට තුන් මසක් වැනි සුළු කාලයක් තිබිය දී පියතිස්ස හිමියන්හට දන්වන ලදී.

උපාධ්‍යායයන්වහන්සේ ඒ ගැන එක එල්ලේ සතුටක් පළ නො කළ නිසා උන්වහන්සේ එයට එකඟ කරවා ගන්නට බලවත් පරිශ්‍රමයක් දරන්ට සිදු විය. උපාධ්‍යායයන්වහන්සේගේ කැමැත්ත අවසාන මොහොතේ ලබා ගත හැකි වූයෙන් ඒ බව පරිවෙණාධිපති **ධම්මානන්ද** නායක ස්වාමීන් වහන්සේට දන්වන ලදී. එතෙක් තමා ලබාගෙන තිබුණු දැනුම උරගා බලන්නට මෙන් අවස්ථාවක් විදුරුපොළ **පියතිස්ස** යතිවරයන් වහන්සේට මේ නිසා උදා වූයේ ය. ප්‍රාචීන විභාගපරිපාටියේ ප්‍රාථමික විභාගය වන **ප්‍රාරම්භ පරීක්ෂණයට** සිංහල, පාළි යන භාෂා දෙකෙන් පෙනී සිටි උන් වහන්සේ අනෙක් සියලුම අයැදුම්කරුවන් අභිබවා ගෞරව පන්තියෙන් පළමුවැනියා හැටියට සාමර්ථ්‍යය ලදහ. පාළි භාෂාවට අයත් ත්‍යාගය ද, ලබා ගත්හ. මෙම ජයග්‍රහණය නිසා පියතිස්ස යතිවරයන් වහන්සේට තමාට ධර්මශාස්ත්‍රදානය කළ **ධම්මානන්ද** නායක ස්වාමීන් වහන්සේගේ ප්‍රසාදය වඩ වඩා දියුණු තියුණු කරගත හැකි විය. මේ තුළින් සිය පරිවෙණස්ථානයට විශාල කීර්තියක් ද අත්විණැ'යි උන්වහන්සේගේ ප්‍රීතිප්‍රමෝද්‍යය නිම්හිම් නැති තරම් විය. 1903.04.27 වැනි දින දතමින් **ධම්මානන්ද** හිමියන් තම ශිෂ්‍යවරයාට ලියූ ලිපියකින් පෙනෙන්නේ **විද්‍යොදය විද්‍යාලංකාර** ඇතුළු ලංකාවේ නොයෙක් පිරුවන්වලින් අපේක්ෂකයන් පෙනී සිටින මෙම විභාගයේ දී ඒ හැම අපේක්ෂකයකුම අභිබවා **පියතිස්ස** යතිවරයන් වහන්සේ පළමුවැනියා හැටියට සමත් වන බවට පූර්ව නිශ්වයක පිහිටා සිටිබව යි. එපමණක් නොව ඒ ගැන **හික්කඩුවේ සුමංගල** නා හිමියන්ට ද එබඳු ම කැමැත්තක් හා නිශ්චයක් තිබුණු බව ඒ ලිපියෙන් වඩාත් තහවුරු වෙයි. උන්වහන්සේලා විශ්වාසය තැබූ ආකාරයට ම ප්‍රතිඵල ලබා ගැනීමට **පියතිස්ස** හිමිපාණන් වහන්සේ සමත් වූහ. මෙයින් පෙනෙන තවද ඉතා වැදගත් කරුණක් නම්, එද සිටි එම මහොත්තමයන් වහන්සේලා නිකාය භෙදයක්, පළාත් භෙදයක් පමණක් නොව එද ගැඹුරින් නැගී සිටි ආයතන භෙදයක් පවා නොතකා සුදුස්සා සුදුසු තැනට ගැනීමටත්, සුදුසු තැන දීමටත් මහත් ඕනෑකමකින් ක්‍රියා කොට ඇති බව යි.

**පියතිස්ස** යතිවරයන් වහන්සේ ලද මේ විශිෂ්ට ජයග්‍රහණයෙන් වඩාත් ප්‍රීතියට පත්වූවෝ උන්වහන්සේගේ ශ්‍රෙෂ්ඨ ඥාතිවර උපාධ්‍යායයන් වහන්සේ වන විදුරුපොළ **රතනජෝති** මහා නායක හිමිපාණන් හා ආචාර්ය වර පනාකන්නියේ **අමිතසාර** ස්වාමීන්වහන්සේ ය. උන්වහන්සේන්ලා සිය ශිෂ්‍යවරයා කෙරෙහි යම් බලාපොරොත්තුවක් මුල දී තැබූහු නම්, ඒ බලාපොරොත්තුව ඊටත් වඩා හත් අට ගුණයකින් වැඩි දියුණු වන ලෙසින් ඵල දරනු බල බලා ලද්දේ අසීමිත ප්‍රීතිප්‍රමෝදයකි. ඊළඟට **පියතිස්ස** යතිවරයන් වහන්සේ ප්‍රාචීන විභාග පරිපාටියේ දෙවැනි පරීක්ෂණය වන **මධ්‍යම විභාගය** සඳහා සූදනම් වූහ. මේ අතර තමා ජීවිතයට හුරු පුරුදු කරගෙන ආ ලිපි ලේඛන කටයුතු, ධර්මදේශනා ආදී ශාසනික කටයුතු පමණක් නොව ශාස්ත්‍රීය සේවාවන් ද නො අඩුව සම්පූර්ණ කරලූහ. විභාගය සඳහා හැකි සෑම අවස්ථාවක ම සිය ධර්මාචාර්යවරයාණන්ගේ සදුපදේශයන්

ලබා ගැනීමට අමතක නො කළහ. 1905 ප්‍රාචීන මධ්‍යම විභාගයට භාෂාත්‍රයෙන් ම පෙනී සිට ප්‍රථම පන්තියේ ප්‍රමුඛස්ථානය හිමිකර ගනිමින් තවද විශිෂ්ට ජයක් අත්පත් කර ගත්හ. එහි දී උන්වහන්සේ සිංහල ත්‍යාගය, පාළි ත්‍යාගය, සංස්කෘත ත්‍යාගය, භාෂාත්‍රය ත්‍යාගය, අධ්‍යාපන අධ්‍යක්ෂ ත්‍යාගය යන තෑගි පහක් ම හිමි කරගත්තේ විශේෂ වාර්තාවක් පිහිටුවමිනි. රට තුළ විශාල ප්‍රසිද්ධියක් ඇති කළ මේ ජයග්‍රහණය නිසා බොහෝ ගිහි පැවිදි ප්‍රභූන්ගේ ස්තුති ප්‍රශංසා උන්වහන්සේ කරා ගලා එන්නට විය.

විසිතුරු පාළි ගද්‍ය පද්‍ය රචනා ගැන පියතිස්ස යතිවරයන් වහන්සේට යම්කිසි ශක්තියක් මේ වන විට තිබිණි ද ඊට නො දෙවැනි ශක්තියක් සංස්කෘත ගද්‍ය පද්‍ය කාව්‍ය නිර්මාණයෙහි ලා ද උන්වහන්සේ ලබාගෙන තිබුණු බව එකල කළ රචනාවලින් හැඟේ.

ස්වස්ති

'' ජයති විහිත හිතඝුකෘතිඃ ස්ථිරගුණ වසතිස්සතාං ගතිඃ ස්මෘතිමාන්,
නිජකුලපතිරූපනෘපතිර් ''ආෂ්මොර්'' නාමා මහාශයස්සුචිරම්.

(ගීතිඃ)

චිරං ජීව්‍යාද්දෛවාධිගතවරශාස්ත්‍රාර්ථනිකරස්
සුධීවෘන්දෛර්නිත්‍ය පුණුත සිතකීර්තිස්සුමතිමාන්,
ගුණෛර්ලඞ්කාභූමාවුපනෘපපදඤ්චාධිගතවාන්
ස වෛ ''ආෂ්මොර්'' නාමා නිජභුජකෘතාරාතිමථනඃ.

(ශිඛරිණී)

ශ්‍රූයතා'මභ්‍යර්පිතා'භීෂ්ටාර්ථසංසිද්ධිසාධනසුධීමතා ශ්‍රීමතිතො'ප නෘපතිවයෙෂිණෙ'ය'මස්මන්නිවෙද්‍යමානා සාදර සම්භාවනාශීර්වචන පුරස්කෘතා නිවෙදනා. සන්ති හි සභායා'මත්‍ර සන්නිවිෂ්ටාඃ සකල ලඞ්කාභූමණ්ඩලමණ්ඩනායිතාඃ ශශ්ච'දවිඛණ්ඩිතා'ශෙෂ සදචාර විශෙෂමණ්ඩිතපණ්ඩිතජනමණ්ඩලී සම්භාවිතාඃ ස්වාර්ථපරාර්ථ ස-ම්පාදනෛ'කසද්වුතස්ථිත සුජනගණප්‍රගීයමාණ දශදිගන්තරපරි පූරිතයශඃපටලධික්කෘතශරදින්දුකිරණනිකරපයොනිධි නීහාර භාරහරහූධරෛරාවතාඃ ප්‍රාචීනප්‍රතීචීනසමස්තභාෂාශාස්ත්‍ර තත්වාභිඥනකුශලකුශාග්‍රීයමතයො භූයාං ස්‍යවවිද්වාංසොලාඞ්කි කා ගෘහස්ථප්‍රව්‍රජිතොභයපාක්ෂිකාස්සජ්ජනාඃ සෙ'යම්දනීං විද්‍යුෂ්මතී සභා සර්වථෛ'ව විභූජනසනාථාභවති භවදභියානාද් විභාවරී'ව පරිපූර්ණශශිකලා සහෘදයහෘදයානන්දජනනී. ශ්‍රුතිශ්චෙ'යං විභූ විද්‍යුෂ්මතො'ව සභාපරිපූර්ණා ශොභත ඉති.

අත්‍රො'ච්‍යතෙ චිරන්තනෛඃ.

" මණිනා වලයං වලයෙන මණිඃ – මණිනා වලයෙන විභාති කරඃ,
කවිනා ච විභූර් විභුනා ච කවිඃ – කවිනා විභුනා ච විභාති සභා.
ශරද ච ශශිඃ ශශිනා ච ශරත් – ශරද ශශිනා ච විභාති නභඃ
කවිනා ච විභූර් විභුනා ච කවිඃ – කවිනා විභුනා ච විභාති සභා"
ඉත්‍යෙවමාදි.

පරන්තු මයමප්‍යෙ'වං විධ සරාජවිද්වත් සමාජමධ්‍යෙ
රාජස්තුතිරචනා'මීදෘශීංකර්තුංවක්තුංවාස්ම සංලබ්ධාවශරායත්තදහො.
ත්‍රිශරණශරණෛදභවස්‍ය ජිනශාසනාරක්ෂකසුරෙන්ද්‍රා'නුරක්ෂණ
සම්පන්නස්‍යාචිරස්වර්ගතරත්නද්‍යොති මහායතීශකරුණාකටාක්ෂ
පතනපුරස්කෘතස්‍ය විද්‍යොදයපරමධර්මචෛත්‍යප්‍රවිදිත විද්‍යා
මන්දිරද්වයාධිපති ගුරුවරණාරාධනප්‍රභාවානුගතස්‍ය ප්‍රාචීන
භාෂොපකාර සමිත්‍යනුග්‍රහාලලබධ සරස්වති ප්‍රශාදස්‍යා'තිශයා
ලඞ්කරිෂ්ණුතෙ'ත්‍යලම්'හබහුනා.

උපරාජස්තුති'මිමාංකෘතවාන් සුජනප්‍රියඃ
''ප්‍රියතිෂ්‍ය''යතිර්වජ්‍රපාලග්‍රාමො'ද්භවඃ කවිඃ.''

මේ එක නිදසුනක් පමණි. මෙය නිර්මාණය කළ දිනය වශයෙන් සටහන් කොට ඇත්තේ 1905.10.11 දතම ය. සමකාලීන වැ රුසැයුණු මෙබඳු තවද කෙටි රචනා රාශියක් දක්ක හැකි ය. ඒවා ගද්‍යාත්මක ව ද පද්‍යාත්මක ව ද උභය මිශ්‍රිත ව ද රචනා කොට තිබේ.

අනතුරුව පෙනී සිටිය යුතු ප්‍රාචීන අවසාන විභාගය සඳහා ද අවශ්‍ය දැනුම ලබා ගැනීමට ගතයුතු පියවරවල් ගැනීමත්, ඒ සඳහා දැඩි අධිෂ්ඨානය කින් ක්‍රියා කිරීමත් පියතිස්ස හිමියන්ගේ එකම අරමුණ විය. විශේෂයෙන් විභාගය සඳහා දැනුම ලබා ගන්නා අවධියේ දී උන්වහන්සේ වැඩිවශයෙන් කොළඹ ම කල් ගෙවූහ. රත්මලානේ පරමධම්මචේතිය පිරුවන ද, කොල්ලුපිටියේ ශ්‍රී වර්ධනාරාමය, කොළඹ හුණුපිටියේ ගංගාරාමය යන මෙකී විහාරස්ථාන විදුරුපොළ පියතිස්ස යතිවරයන් වහන්සේගේ තාවකාලික වාසස්ථාන විය. මේ ස්ථානවල අධිපති හා නේවාසික ගරු මහා සංඝයා වහන්සේලා හැම නෙනෙකුන් ම උන්වහන්සේගේ දයාබර හිතවතුන් ලෙස ආදර සංග්‍රහ කළ බව පියතිස්ස හිමියන් සඳහන් කොට ඇත්තේ සාතිශය කෘතඥතාවකිනි. 1907 ජූලි අගෝස්තු සැප්තැම්බර් කාලය පියතිස්ස හිමි පාණන් වහන්සේට බලවත් රෝගාබාධයකින් දුක් විඳින්න සිදුවිය. ඒ කාලය තුළ එක්තැන් වැ වැඩ සිටි උන්වහන්සේ තම මිත්‍රාදීන්ට මෙන් ම ආචාර්යවරුන්හට ද ලියුම් වශයෙන් ලියන ලද කවි, ගාථා, ශ්ලෝක පන්ති රාශියක් ම දක්ක හැකි ය. තරමක දීර්ඝ කාලයක් එම රෝගයෙන් පීඩා වින්ද අයුරු උන් වහන්සේ දක්වා ඇත්තේ සංවේගය දනවන අයුරිනි. හිතවත් හිමිනමකට 1907.09.20 දින ලියූ කවි පෙළක එක කවියක් මෙසේය:

"ඉතින් හුහක් ලෙඩ සුව වූ නමුත් මට
දතින් පහත අවසඟ බව ඇත දූනට
පයින් වැඩි දුරක් යා නොහැකිය සොඳට
ලෙඩින් දුබල විය කියනෙමි තව කුමට"

අසනීපයට කලක් ගත වුවත් නිෂ්ටාවට ම ගුණ නොවූ බව මෙයින් පෙනේ. තම නිර්මාණ ශක්තිය වඩ වඩාත් සියුම් කර ගැනීමට මෙන් ම පුළුල් කර ගැනීමටත් එම රෝගී අවධිය යොද ගැනීමට පියතිස්ස හිමියෝ විචාර ගරුක වූහ. මේ සියල්ලක් මැදම උන්වහන්සේ ප්‍රාචීන අවසාන විභාගය සඳහා ද සූදනම් වූහ. ඒ අනුව 1909 අවසාන පණ්ඩිත විභාගයට පෙනී සිට එහි දී ද පළමුවැනි තැන හිමිකර ගත්හ. 1910 එම විභාගයට අවසන් වරට පෙනී සිට එකලාව ම ගෞරව පන්තියේ ප්‍රමුඛ ස්ථානය හිමි කර ගනිමින් උභයශේඛර ස්වර්ණ මුද්‍රිකාව ද, දිනා ගත්හ. බටුවන්තුඩාවේ ත්‍යාගය ද, උන්වහන්සේට ම හිමි විය. 1903 දී සිය ධර්මාචාර්යයන් වහන්සේ ප්‍රකාශ කළ "තමුසෙ ඔය විභාගයට ගියොත් සෑම වාරයෙහි ම ප්‍රථමාංකය ලැබෙන බව මගේ විශ්වාසය" යි අනාගත වාක්‍යය හරියට ම හරි ගියේ ය. මෙබඳු විභාග ගැන තබා පිරුවන් විභාග ගැනවත් වැඩි පළපුරුද්දක් නො තිබුණ උන්වහන්සේට මීට කලින් කවරදකවත් නොපැවති මෙබඳු විභාගයක් ගැන කවර ආදර්ශයක් ද ? ඒ නිසා උන්වහන්සේ තමන්වහන්සේ ගැනම කියන්නේ "මට මගේම ආදර්ශය විනා වෙනත් කිසිම ආදර්ශයක් මේ විභාග හතරේ දී ම නො ලැබුණු බව" යි. උන් වහන්සේ ලද මේ ජයග්‍රහණය ගැන රට පුරා මහත් ප්‍රසිද්ධියක් ඇති විය. නොයෙකුත් ගිහි පැවිදි පින්වතුන්ගේ ආසිරි පැතුම් පියතිස්ස හිමියන් වහන්සේ වෙත වැඩි වැඩියෙන් ගලා එන්නට පටන් ගත්තේ ය. මේ විභාගයේ තතු විවරණය කරමින් ද, විදුරුපොළ පියතිස්ස හිමියන්ගේ බුද්ධිශක්තිය අගයමින් ද, උන්වහන්සේ ප්‍රාචීන මධ්‍යම විභාගය සමත් වූ විට ම 1905 අගෝස්තු 20 දතමින් හික්කඩුවේ සුමංගල නායක ස්වාමීන්ද්‍රයන් යවා තිබුණු ලියමන පියතිස්ස හිමියන්ට සිහියට ආයේ ය. එයින් හැඟවුණු අනාගත වාක්‍යය ද අර්ථවත් විය. විදුරුපොළ පියතිස්ස හිමියන් ප්‍රාචීන පණ්ඩිත විභාගයේ පාළි කොටසට පෙනී සිටි අවස්ථාවේ එම ප්‍රශ්න පත්‍රය සද තිබුණේ විද්‍යාලංකාර පරිවෙණාධිපති රත්මලානේ ධර්මාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි. තම ප්‍රශ්න පත්‍රයට විදුරුපොළ පියතිස්ස යතිවරයන් වහන්සේ උත්තර සපයා තිබූ ව්‍යක්තවිලාසය දුටු ධර්මාරාම නා හිමියෝ අතිශයින් ම පැහැදීමට පත් වූහ. සියයට සියයක් ම ලකුණු ද දුන්හ. එයිනුදු සෑහීමකට පත් නො වූ උන්වහන්සේ උත්තර ලියා තිබුණු කොළයේ අග මෙබඳු වැකියක් ද ලියා තැබූ බව කියනු ලැබේ.

"මේ ශිෂ්‍යයාට තවත් වැඩියෙන් ලකුණු දීමට පුළුවන්කමක් නැතිකම කණගාටුවට කාරණයකි."

කාවදත් විභාගවල දී අකුරට ම ලකුණු දෙන ධර්මාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වැනි නේනෙකුගෙන් මෙබඳු ප්‍රශංසාවක් හා අගැයීමක් හිමි කර ගන්න හැකිවීම කවර තරම් භාග්‍යයක් ද ? එය අගය කළ නොහැකි තරම් බුද්ධිමය සහතිකයකි. උන්වහන්සේ ලද පාණ්ඩිත්‍යයට කැරුණු අතිරේක සම්භාවනාවක් බඳු ය. එම වකවානුවේ පටන් රන් පදක්කම් ලැබූ පඬිවරයා යැයි උන්වහන්සේ ගැන විශේෂ විශේෂණයකින් බොහෝ දෙනා හඳුන්වන්නට වූහ.

**ප්‍රාචීන භාෂොපකාර සමිතියේ** තෑගි හා සන්නස්පත්‍ර දීම ගැන ප්‍රථම මංගල සභාව පැවැත්වූයේ **කොළඹ කුරුඳුවත්තේ** තර්ස්ටන් මාවතේ පිහිටි **ආණ්ඩුවේ ගුරු විද්‍යාලය** ශාලාවේ දී ය. ප්‍රථම පඬිවරයා හැටියට විදුරුපොළ පියතිස්ස හිමිපාණන් වහන්සේ 1911 නොවැම්බර් 4 වැනි දින පැවැත් වූ එම රාජකීය මහොත්සවයේ දී තම සන්නස් පත්‍රය හා රන් පදක්කම ලබා ගත්හ. එද **ප්‍රාචීන භාෂොපකාර සමිතියේ** සභාපති වූ ද, අධ්‍යාපන අධ්‍යක්ෂ වූ ද, **ජේ. හාවර්ඩ්** මහතා **විදුරුපොළ පියතිස්ස හිමියන්** ගැන වාර්තාව ඉදිරි පත් කොට තිබුණේ මෙපරිද්දෙනි :

> "In 1910 the first candidate passed qualifying for the Diploma. This was the Rev. Widurupola Piyatissa, Who gained honours carrying the Obeyesekere Gold Medal. His Diploma will Confer on him the title of Pandit, which will be equal in value to graduation in a University."

ලංකාණ්ඩුකාරතුමාගේ අත්සනත්, ලංකා රාජමුද්‍රාවත් පිහිටුවන ලද පණ්ඩිත උපාධිය පිළිබඳ එම සන්නස් පත්‍රය ද උභයශේඛර රන් පදක්කම ද, බටුවන්තුඩාවේ තෑග්ග ද එද උන්වහන්සේ ලැබුවේ ප්‍රාචීන භාෂොපකාර සමිතියේ අනුග්‍රාහක ශ්‍රීමත් ලංකාණ්ඩුකාර උතුමාණන්ගේ අතිනි.

මෙම රාජකීය සභාව නැරඹීමට ගිය සුප්‍රසිද්ධ පුවත්පත් කතුවර **පියසේන නිශ්ශංක** මහතා තම ඇසින් දුටු විස්තරය මෙසේ ලියා ඇත.

> "සභාව පවත්වන ලද්දේ එවකට කොළඹ කුරුඳුවත්තේ තර්ස්ටන් මාවතෙහි පිහිටි **ආණ්ඩුවේ ගුරුවරුන් පුහුණු** කළ පාසැල් ගොඩ නැගිල්ලෙහි ය. මුලසුන ඉසිලුවේ එකල ආණ්ඩුවේ මහලේකම් පදවිය එසේ නැත්නම් **සර් හැන්රි මැක්ලම්** වෙනුවට ආණ්ඩුකාර පදවියේ වැඩ බැලූ **සර් හ්‍යු ක්ලිෆර්ඩ්** ය.
>
> වේදිකාවේ එතරම් පිරිසක් සිටියේ නැත. එහෙත් එහි පනවන ලද ආසනවල රත්මලානේ ශ්‍රී ධර්මාරාම මා හිමි සහ මහගොඩ ශ්‍රී ඤාණෙශ්වර මා හිමි බබල බබලා වැඩ සිටියා මට මතක ය. **සයිමන් ද සිල්වා** වාසල මුදලිතුමා සහ **ඩබ්ලියු. ඇජ්. ගුණවර්ධන** වාසල මුදලිතුමා භාෂා පරිවර්තනයට සිටියහ. වේදිකාවේ අසුන් අරා සිටියේ මෙවැනි

කීප දෙනෙකු වුව ද සභා ශාලාව නම් කාෂාය වස්ත්‍රයෙන් බබලමින් තිබිණ. ඒ තරමටම වාගේ ගෘහස්ථයෝත් සිටියාහ.

මූලාසනාරූඪ මහතාට පිළිගැන්වීමට පිළියෙල කර තිබුණ ශුභාශීර්වාද පත්‍රය කියවූයේ එකල ප්‍රාචීන විභාගයෙන් උත්තීර්ණව සිටි ඇම්. ඇස්. පී. සමරසිංහ වෙද (පසුව වෙද මුදලි) මහතා ය. මෙහි වැඩි කථා තිබුණේ නැත. එහෙත් මෙහි මුලින් කියැවුණ මා හිමි දෙපොළගේ කථාවලට සවන් දෙන්නට සභාවට සිදුවිය. කථා දෙකම දීර්ඝ වුවත් අසා සිටියවුන්ට තවත් මදියයි සිතෙන තරමට ඒ කථා සාරගර්භ විය. චතුර විය. මධුර විය.

ඊළඟට පැවැත්වූ මූලාසනයේ කථාවෙන් පළමු කොටම කෙරුණේ රටේ ප්‍රාචීන භාෂා ශාස්ත්‍රෝන්නතියට අපමණ සේවයක් කළ ප්‍රාචීන භාෂොපකාර සමිතියේ ආදි කර්තෘවරයෙකු වූ මාස කීපයකට පෙර අපවත් වී වදළ හික්කඩුවේ ශ්‍රී සුමංගල මා හිමියන් වහන්සේ පිළිබඳ මුව නොසෑහෙන ගුණ කථනයක් කර උන් වහන්සේගේ අභාවය ගැන ශෝකප්‍රකාශ කිරීම ය.

ඊළඟට කෙරුණේ ප්‍රාචීන භාෂොපකාර සමාගමේ විභාගවලින් විශිෂ්ඨ ලෙස සාමාර්ථය ලබා ආදිම කොට උභයශේඛර ස්වර්ණ මුද්‍රිකාවත් ඇතිව පණ්ඩිතෝපාධිය ලැබීම ගැන විදුරුපොළ පියතිස්ස හිමිට ප්‍රශංසා පිරිනැමීම ය.''

පියතිස්ස සාහිත්‍ය අංකය, පිට. 30

උත්සවසභාවට සහභාගී වී පළමු කොට රත්මලානේ පරමධම්මචේතිය පිරුවන්හි එවකට ප්‍රධානාචාර්ය ධුරය දැරූ අරුග්ගොඩ ශ්‍රී සිලානන්ද මහා ස්ථවිරපාදයන් වහන්සේගේ හා ශිෂ්‍ය සහෝදර පිරිසගේ ඇරයුම පරිදි තම ප්‍රථම ගුරු භූමිය කරා වැඩම කළ උන්වහන්සේ ඉමහත් හරසරින් හා ගෞරවාදර සහිතව ගුරු ශිෂ්‍ය දෙපිරිස විසින් පිළිගන්නා ලදී. විදුරු පොළ ශ්‍රී සුමංගලාරාම විහාරස්ථානය කරා ඊට පසු වැඩම වූ රාජකීය පණ්ඩිත විදුරුපොළ පියතිස්සාභිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ එහි දී ද සාදර ගෞරවයෙන් පිළිගන්නට යෙදිණ.

ක්‍රි.ව.1911 අප්‍රේල් 30 වැනි දින විදුරුපොළ සුමංගලාරාම විහාරස්ථානයේ දී පවත්වනලද ගිහි පැවිදි මහා උත්සවසභාවක දී උඩරට අමරපුර නිකායේ මහානායක පදවිය පිළිබඳ සන්නස් පත්‍රය පණ්ඩිත විදුරුපොළ පියතිස්ස හිමිපාණන් වහන්සේට පිරිනමන ලදී. ඒ අනුව මුලින් සඳහන් පණ්ඩිත උපාධිය පිළිබඳ සන්නස් පත්‍රය උන්වහන්සේ ලබාගෙන ඇත්තේ මහා නායකවරයකු හැටියටයි. පණ්ඩිත උපාධි සන්නස ලබන විට මහ නායක පදවියක් තිබුණු වෙනත් සංඝනායකවරයකු ගැන නො දනිමු.

## 6 පරිච්ඡේදය

# ආචාර්ය පරම්පරාව හා ධර්මශාස්ත්‍ර පරම්පරාව

භාෂා සාහිත්‍යය පිළිබඳව මෙන් ම ආගම ධර්මය පිළිබඳවත් සොළොස් වැනි සියවසින් ඇරඹුණු මහා පරිහානිය ලංකාවේ වෙනත් පළාත්වලට මෙන් ම ඌව ප්‍රදේශයට ද තදින් දැනිණ. බොහෝ විහාරස්ථාන පන්සල් උගත් සුසිල්වත් භික්ෂූන්ගෙන් පිරිහී ගියේ සිය ගණනිනි. දේපොළ ඉඩකඩම් පොතපත රැකගත් පිරිස භික්ෂු වේශයෙන් සිටි පිරිසක් වූහ. ඒ ඒ ස්ථානගත වස්තුව රැක ගැනීමෙන් ඔවුන්ගෙන් වූව ද කෙරුණේ මෙහෙයක් බව කියයුතු ය. වැලිවිට **සරණංකර** සඟරජ හිමියන්ගෙන් කැරුණු සාසන මෙහෙවරෙහි ප්‍රතිඵල ඌව ප්‍රදේශයට ද ඇති කළ බලපෑම නිසා යළිත් බොහෝ පන්සල් පුනරුත්ථාපනය විය. සිල්වත් භික්ෂූන් වහන්සේගෙන් එම ආරාම කඩින් කඩ ආලෝකවත් වන්නට පටන් ගත්තේ ය. ඌවේ තරමකට පැරැණි ආරාමයක් වූ තුප්පිටියේ **තපෝධනාරාමය** එබඳු එක විහාරස්ථානයකි. එවක එහි අධිපති වැ වැඩ සිටි **හුණුවල නන්ද** හිමියෝ සීල සංගමයෙන් මෙන් ම ප්‍රතිපත්තිකාමීත්වයෙන් ද කාගේත් සිත් දිනාගත් මහාස්ථවිර කෙනෙක් වූහ. උන්වහන්සේ නිජබිම වූ සබරගමුවෙන් ඌව ප්‍රදේශය කරා වැඩම කළ හිමිනමකි. මාතර **කඹුරුගමුවෙන්** ඌව ප්‍රදේශය කරා ගිය සැදැහැබර පින්වතෙක් හුනුවල නන්ද හිමියන්ගේ ගුණ ගරුකත්වය හා ශික්ෂාකාමිත්වය ගැන අසා පැහැද උන් වහන්සේ වෙත පැවිදි වැ කඹුරුගමුවේ සුමන නමින් ප්‍රසිද්ධියට පත් විය. උන්වහන්සේ ගිහි කල සිට ම පුස්කොළ පොත් ලිවීමේ අති ශූරයකු බව අසන්නට ලැබේ. තම ගුරුවරයා අනුගමනය කළ එම නවක භික්ෂුව ද ප්‍රතිපත්ති ගරුක විය. ශික්ෂා ගරුක විය. සුළු කලෙකින් ගිහි පැවිදි හැම දෙනාගේ ම සිත්ගත් ශික්ෂාකාමී වියත් ධර්මධර භික්ෂුවක් විය.

විදුරුපොළ **පියතිස්ස** හිමිපාණන්ගේ මුත්තණු කෙනෙකු වූ **අප්පුහාමි** වෙද මහතාට මේ හිමියන්ගේ ශික්ෂාකාමිත්වය ගැන අසන්නට ලැබුණේ උන්වහන්සේ කෙරෙහි මහත් ප්‍රසාදයක් මෙන් ම භක්තිමත් භාවයක් ද ඇති කරගත හැකි විය. තම ප්‍රසාදයට ලක් වූ එම ස්වාමීන් වහන්සේට පාරම්පරික වැ තමාට හිමි වැ තිබුණු වෙහෙර වත්ත නම් ඉඩමෙහි පන්සලක් ඉදිකොට දීමේ සාසනික චේතනාවක් පහළ වූයෙන් දැනට **සුමංගලාරාමය** නමින් ප්‍රසිද්ධ එම විහාරස්ථානය අසල්වැසියන්ගේ ද ආධාරෝපකාරයෙන්

ගොඩනංවන ලදී. කඹුරුගමුවේ සුමන ස්වාමීන් වහන්සේට ආරාධනා කොට පළමුවරට උන්වහන්සේ එහි වස් වසවා ගත්තේ ය. නව විහාරස්ථානය උන්වහන්සේට පූජා කළ වෙද මහතා පුත්‍රයා සුමන ස්වාමීන් වහන්සේට පූජා කොට මහණ කරවන ලදී. සුමන ස්වාමීන් වහන්සේ මේ නවක සාමණේරවරයාට විදුරුපොළ ධම්මක්ඛන්ධ යැයි නම තබන්නට යෙදුණ. පසු කලෙක එම නම ඉවත්කොට විදුරුපොළ රතනජෝති යන නම තබා ඒ නමින් හඳුන්වන්නට පටන් ගත්තේ ය. රතනජෝති සාමණේර නම කුඩා කල පටන් ම කීමෙහි බිණීමෙහි අපූර්ව දස්කම් දක්වන්නට වූහ. සසුන් වත්පිළිවෙත් මගෙහි ද මහත් ලැදියාවකින් ක්‍රියා කළෝ ය. මේ සියල්ල තුළින් තම ගුරුවරයාගේ සිත තදින් ඇදගත් නව සාමණේරවරයාගේ අධ්‍යාපනය පිළිබඳ ව ගුරුවරයන් වහන්සේ ක්‍රියා කොට වදළේ ශිෂ්‍යවරයා තුළ උසස් අනාගතයක පෙර ලකුණු ඒ වනවිටත් පහළ වැ තිබුණු හෙයිනි.

පහතරට කොස්ගොඩ ගණේගොඩැල්ලේ විජය සිරි වර්ධනාරාමාධිපති වැ වැඩ විසූ පණ්ඩිතාචාර්ය ජිනවංස පඤ්ඤාසාර මහා ස්ථවිරපාදයන් වහන්සේ දන උගත්කම්වලින් හා ශික්ෂාකාමීත්වයෙන් උඩ පහත දෙරට ම ප්‍රසිද්ධියට පත් සංඝස්ථවිර නමක් වූහ. භාෂාශාස්ත්‍ර අධ්‍යයනය සඳහා තම ශිෂ්‍යවරයා උන්වහන්සේට බාර කිරීමට කඹුරුගමුවේ සුමන හිමියෝ තීරණය කර ගත්හ. ඒ අනුව ගණේගොඩැල්ලේ විහාරස්ථානය කරා කැඳවාගෙන ගිය ශිෂ්‍යවරයා එහි අධිපති ජිනවංස පඤ්ඤාසාර මහා ස්ථවිරයන් වහන්සේට බාර දී ආගම ධර්මය හා භාෂාශාස්ත්‍ර විෂයයෙහි ශික්ෂණයක් ලබාදෙන ලෙස අයැද සිටියහ. එතැන් පටන් දක්ෂ ලෙස ඉගෙනීමේ කටයුතුවල මේ ශිෂ්‍යයා නිරත විය. වැඩි කලක් නො යා දී ම සිංහල පාළි භාෂා ගැනත් තරමක දැනුමක් ලබා ගත්තේ ය. කුඩා කල පටන් ම පිහිටා තිබුණු කීමෙහි බිණීමෙහි දක්ෂතාව නිසා ඉමිහිරි හඬින් විචිත්‍ර ධර්මදේශනා පැවැත්වීම පිළිබඳ ප්‍රකට කීර්තියක් ද මේ ශිෂ්‍යවරයාට ලබාගත හැකි විය. එම සාමණේර නමට විසි වයස් පිරිණ. අවශ්‍ය පමණට භාෂා ශාස්ත්‍ර දැනීමෙන් ද ධර්මවිනය පිළිබඳ අවබෝධයෙන් ද යුක්ත විය. සුමන මහා ස්ථවිරයන් වහන්සේ තම ශිෂ්‍යයා කොස්ගොඩ ගණේගොඩැල්ලේ සිට සිය ආරාමය කරා කැඳවා ගෙන ආහ. කල වයසින් මෙන් ම ධර්මවිනය දැනුමෙන් ද දියුණුවක් ලබා සිටි මෙම ශිෂ්‍යවරයා සපුගොල්ලේ තපෝධනාරාමාධිපති වැ සිටි කපල්ලේවෙල නාරද මහා ස්ථවිරයන් වහන්සේ උපාධ්‍යාය කොට උපසම්පද කර වූහ. රහුපොළ ශ්‍රී සුජාත මහානායක යතිවරයන් වහන්සේ රෝගග්‍රස්ත වැ සිටීම නිසා උන්වහන්සේගේ ම උපදෙස් පරිදි එම විනයකර්මය ඒ ආකාරයෙන් සිද්ධ කරන්නට සිදු විය.

ශිෂ්‍යවරයාගේ ඉගෙනීම ගැන සෑහීමකට නො පත් ආචාර්යවරයා තවද වැඩිදුර ඉගෙනීමට කැඳවාගෙන ගියේ මාතර ප්‍රදේශයේ සුප්‍රකට උගතකු ව සිටි මඩිහේ සිරිසුමිත්ත ධම්මක්ඛන්ධ මහ තෙරුන් වෙතට යි. සිංහල, පාළි, භාෂා ගැන ද ව්‍යාකරණ ඡන්දෝලංකාරාදි විෂයයන් ගැන ද පුළුල් වශයෙන් හැදෑරූ රතනජෝති ස්වාමීන් වහන්සේ සිය අරම කරා අවුත්

රඹුපොළ සුජාත මහා නා හිමියන් වෙතින් විනය පිටකය ද පෘථුල ලෙස ප්‍රගුණ කළෝ ය. ක්‍රි.ව. 1888 දී මහා නායක පදවියට ද පත්වූහ. රතනජෝති මහ නා හිමියන් විසින් ඇති කරන ලද සිසු පිරිස සතර නමකි. උන් වහන්සේලා නම් :

මොරහැල රතනපාල
පනාකන්නියේ අමිතසාර
හොරතොට සුමනසාර
පරණගම නන්දරාම


යන හිමිවරුන් ය. පනාකන්නියේ අමිතසාර හිමි විදුරුපොළ පියතිස්ස හිමියන්ගේ ගුරුවරයන් වහන්සේ ය. ක්‍රි. ව. 1860 නොවැම්බර් 25 වැනි දින උපත ලද මෙතුමා 1872 දී පැවිද්ද ලද්දේ රතනජෝති නා හිමියන්ගේ දෙවැනි ශිෂ්‍යයා හැටියට යි. 1880 ජූනි 18 ද තුප්පිටියේ තපෝධනාරාමයේ දී උපසම්පද අධිශීලය ලැබී ය.

අමිතසාර හිමිපාණන්ගේ අතිඋත්තම ශාසනික කර්තව්‍යය වූයේ ක්‍රි. ව. 1890 මැයි 26 වැනි දින තම ශිෂ්‍යයා හැටියට විදුරුපොළ පියතිස්ස හිමියන් සසුන් ගත කිරීම යි. එතැන් පටන් උන්වහන්සේ තම ආචාර්‍ය්‍ය වරයන් වහන්සේ ද කැටුව සිය ශිෂ්‍යයාගේ දියුණුවට කළහැකි හැම කටයුත්තක් ම කලට වේලාවට සිද්ධ කළහ. 1905 සිය ගුරු දේවයන් වහන්සේගේ අපවත් වීමෙන් විදුරුපොළ සුමංගලාරාමයේ අධිපති ධූරයට පත් මේ හිමිපාණන්ට 1913 දී නිකායික කාරක පදවියක් ද, " සිරි පවර ජිනෝරස " යන නාම සම්මුතිය ද ලැබුණෙ ය. 1935 නොවැම්බර් 9 වැනි දින විදුරුපොළ විහාර පරම්පරාවේ නායක පදවියට ද උන්වහන්සේ පත් වූහ.

තම ශිෂ්‍යවරයා වූ විදුරුපොළ පියතිස්ස මහ නා හිමියන් අපවත් වී හරියට ම අවුරුද්දක් පිරුණු ද එනම් 1955 දෙසැම්බර් 10 දින " සිරි පවර ජිනෝරස " අමිතසාර නා හිමියෝ අපවත් වූහ.

අමිතසාර නා හිමි තම සඟ පරපුරට පමණක් නොව මුළු මහත් රටට ම ස්වර්ණමය ප්‍රදීපයක් බඳු ස්වීය ශිෂ්‍යවර විදුරුපොළ පියතිස්ස යතිවරයන්ගේ දියුණුව දක දක අසීමිත වින්දනයක් ලැබුවේ ය. ජීවිතයේ අවසාන ම භාගයේ එයට හානියක් වූයේ නම්, ඒ තම ශිෂ්‍යයා තමාටත් කලින් ම අපවත් වීම නිසා යි.

## ආචාර්ය පරම්පරාව


හුණුවල නන්ද හිමි
කඹුරුගමුවේ සුමන හිමි
විදුරුපොළ රතනජෝති මහ නා හිමි
මොරහැල රතනපාල හිමි
පනාකන්නියේ අමිතසාර හිමි
හොරතොට සුමනසාර හිමි
පරණගම නන්දාරාම හිමි
විදුරුපොළ පියතිස්ස මහ නා හිමි

## ධර්මශාස්ත්‍ර පරම්පරාව

වර්තමාන ධර්මශාස්ත්‍රෝන්නතියේ අසහාය වීරවරයා වැලිවිට **පිණ්ඩපාතික සරණංකර** සඟරජ මා හිමියන්වහන්සේ බව සක් සුදක් සේ පැහැදිලි, අවිවාදයෙන් හැමදෙනා ම පිළිගත් සත්‍යයකි. ක්‍රි.ව. 1698 මැද භාගයේ උපත ලද මුන්වහන්සේ පිරිහුණු සසුන යළි බැබළ වූ මිණි පහනයි. ගිහි කල **කුලතුංග** නමින් හැඳින්වූ මේ කුලකුමරා සොළොස් හැවිරිදි කල සූරියගොඩ විහාරයේ දී **සූරියගොඩ** සාමණේරයන් ළඟ පැවිදි විය. **ලෙව්කේ රාලහාමිගෙන්** පාළි භාෂාව ගැන මඳ දැනුමක් ලබාගත් මෙතුමා ඉගෙනීම කෙළේ අතිශය දුෂ්කරතා මැද ස්වෝත්සාහයෙන් ම ය.

ශාසනික උපසම්පදාව පිහිටුවාලීමෙන් සඟ පරපුරක් බිහි කළා සේ ම පොත් පත් රාශියක් ලිවීමෙන් ධර්මශාස්ත්‍ර දියුණුවක් ද ඇති කරන ලදී. **සාරාර්ථ සංග්‍රහය, භෛසජ්ජමඤ්ජුසා සන්නය, මුනිගුණාලංකාරය, අභිසම්බෝධි අලංකාරය, සතර බණවර සන්නය, මහා බෝධිවංස සන්නය, රූපමාලාව** ආදි පොත් රැසක් සිය අතින් ම පුස්කොළවල ලියා තබා කළ ඒ උදාර ධර්මසාහිත්‍ය සේවාව අග්‍රගණ්‍ය ය. උන්වහන්සේගේ ධර්මාචාර්ය වරුන් හැටියට අත්ථදස්සී හා වටබුලුවේ නම් තෙරවරුන් දෙනමක් ගැන ද සඳහන් වෙයි. රාජ ප්‍රසාදයට පත් **සරණංකර** හිමියන්හට පසු කාලයෙහි **කීර්ති ශ්‍රී රාජසිංහ** රජු සංඝරාජ පදවිය ද පිරිනමන ලදී. අසූ අවුරුදු අඩ මසක් ආයු ශ්‍රී වින්දනය කළ සඟරජ හිමියෝ 1778 ඇසළ මස පසළොස්වක පොහෝ දින අපවත් වූහ.

වැලිවිට **සරණංකර** සඟරජ හිමියන් ඇති කළ ශිෂ්‍ය පිරිස විශාලය. අත්තරගම රාජගුරු **බණ්ඩාර** පඬිතුමා ඔවුන් අතර ඉතා ප්‍රසිද්ධ වියතෙකි. මුල දී පැවිද්ද ලබා සිටි මෙතුමා රජුගේ ම ඉල්ලීම පරිදි පසු ව ගිහි වූ බව් පැවසේ. එහෙත්, හේ ගිහි පැවිදි විශාල පිරිසකට ධර්මශාස්ත්‍රදානය නොකඩවා කරගෙන ගියේ ය. රජතුමා විසින් මෙතුමාට රාජගුරු පදවිය පිරිනමන ලදී. සුප්‍රකට ගත්කරුවෙකු වූ මෙතුමා විසින් ලියා ඇති වැදගත් පොත් කීපයක් ම වෙයි. **කාරකපුෂ්පමඤ්ජරිය, සුධීර මුඛමණ්ඩනය, ශබ්දමාලාව, වෘත්තාවතාරය** යන මේවා ඒ අතර ප්‍රධාන වෙයි. ඇතැමුන් විසින් **බුද්ධගජ්ජය** ද මෙතුමාගේ කෘතියක් සේ සැලකේ. එහෙත්, කෙනෙකු එය **සරස්වතී** නමැති අයකුගේ කෘතියක් හැටියට ගන්නා බව පෙනේ. පහතරට ප්‍රදේශයෙහි ධර්මශාස්ත්‍ර දියුණුවට හේතු වූ උගතුන් ඇති කර ලීමෙන් මෙතුමා කළ සේවය අමරණීය වේ.

අත්තරගම රාජගුරු **බණ්ඩාර** මැතිතුමා වෙතින් ශබ්දශාස්ත්‍රය හදළ එක් වියතෙකි, කරතොට **ධර්මාරාම** හිමි. ඒ හිමියන්ගේ පැවිදි ආචාර්ය වරයා වූයේ මහ කඳුරුපොකුණේ **ස්වර්ණජෝති** නම් හිමිනමකි. මහනුවර මල්වතු විහාරය කරා ගිය මෙතුමා එහි දී ඉගෙනීම ලබා එහි ම නැවතී ගිහි

පැවිදි ශිෂ්‍යයනට ඉගැන්වීම කෙළේ ය. ශ්‍රීපාදස්ථානයේ නායක පදවිය හිමිකරගත් මෙතුමාට විශාල සතුරු පිරිසක් ඇති වූයෙන් ඔවුන්ගේ කේලාම් බස් නිසා උදහස් වූ රජතුමා **කටුගස්තොට** පැත්තේ ගෙයක සිර කරන ලදී. සිය ගුරු අත්තරගම රාජගුරු **බණ්ඩාරයන්**ගේ උවදෙස් පරිදි බාරස කාව්‍යය ලියා රජුට ඔප්පු කෙළේ එසේ සිරගෙයි සිටිමිනි. උන්වහන්සේ ලවා ම එහි අරුත් කියවා තේරුම් ගත් රජ සිරෙන් නිදහස් කොට පහතරට නායක පදවියත්, පල්ලේබැද්ද ගම්වරයත්, පුද කෙළේ ය. රජතුමා ම කරතොට හිමියන් ගැන කී කවකි මේ :

“ කරතොට    දහම්රම් නායක යතිඳු හ    ට<br>
නර දෙ ට    මෙමා බුහුමන් කරපු හැටිය    ට<br>
වරි ගෙ ට    ගෝල නමකට ඔහුගෙ යමෙකු    ට<br>
ව ර ද ට    යමක් නොකරනු මින් ඉදිරිය    ට ”

මුන්වහන්සේ අනූ දෙවසක් ධර්මශාස්ත්‍රීය සේවාවන් කොට ක්‍රි.ව. 1827 ජූලි 14 වැනි දින **වේරගම්පිට** විහාරස්ථානයේ දී අපවත් වූහ. කරතොට **ධර්මාරාම** හිමියන් උගැන්වූ ගිහි පැවිදි ශිෂ්‍යවරයන් අතර **ගාල්ලේ** හිමි ප්‍රධාන ශිෂ්‍යතම යි. ක්‍රි.ව. 1826 **ශ්‍රීපාද නායක පදවියට** පත් මෙතුමා වැදගත් උගත් සිසු පිරිසක් ද ඇති කොට 1836 අපවත් විය.

**ගාල්ලේ** හිමියන්ගේ ශිෂ්‍යයන් අතර කීර්තිමත් ශිෂ්‍යයෙකි, ඉඳුරුවේ **සුමංගල මේධංකර** හිමි. හේ වියත් බහුශ්‍රැතයෙකි. **පැල්මඩුල්ලේ** විද්‍යාස්ථානයක් අරඹා එහි ඉගැන්වීම කළ මෙතුමන් ශ්‍රීපාදස්ථානයේ නායක පදවියට ද පත් වූ බව දක්ක හැකි ය. ලියූ ග්‍රන්ථාදියක් ගැන ප්‍රකට නැත. ඉඳුරුවේ සුමංගල මේධංකර නා හිමියන්ගෙන් ධර්මශාස්ත්‍රය හදාළ ශිෂ්‍යයන් අතර බෙහෙවින් කීර්තිමත් වූවෝ වලානේ **සිද්ධාර්ථ** හිමියෝ ය.* උන්වහන්සේ ද පැල්මඩුල්ලේ විද්‍යායතනයෙන් ඉගෙනීම නිම කොට වලානට අවුත් නැවත රත්මලානට පැමිණ 1839 දී එහි **පරමධම්මචේතිය** පිරුවන ආරම්භ කරන ලදී. පිරුවන නමින් මෙවක ආරම්භ වූ පළමුවැනි විද්‍යායතනය මෙය යි. උඩුගම්පොළ **රතනපාල** හිමි, බටුවන්තුඩාවේ **දේවරක්ෂිත** පඬිතුමා ආදී සම්භාවනීය උගතුන් පිරිසක් වලානේ සිද්ධාර්ථ හිමියන්ගේ ශිෂ්‍යයන් වශයෙන් දක්නට ලැබේ. මාලිගාකන්දේ **විද්‍යෝදය පිරුවන** ඇරඹූ හික්කඩුවේ **සුමංගල** නා හිමි හා පැලියගොඩ **විද්‍යාලංකාර පිරුවන** ඇරඹූ රත්මලානේ **ධම්මාලෝක** නා හිමියෝත් රත්මලානේ **පරමධම්මචේතිය** පිරුවනින් බිහිකළ ශ්‍රේෂ්ඨ ශිෂ්‍යයෝ වෙති. පසු කල පරමධම්මචේතිය පිරුවන්හි ආධිපත්‍යයට පත් වූ වලානේ **ධම්මානන්ද** නා හිමි හික්කඩුවේ ශ්‍රී **සුමංගල** නා හිමියන්ගෙන් භාෂා ශාස්ත්‍ර උගත්තෙකි. විද්‍රුරුපොළ යතිවරයන් වහන්සේගේ ධර්මාචාර්යවරයා වලානේ ධම්මානන්ද නා හිමියෝ ය. තමාට ඉගැන් වූ ගුරුවරයකු හැටියට ධම්මානන්ද නා හිමියන්ගේ ශ්‍රී නාමය පවා ඉමහත් භක්තියෙන් හා ගෞරවයෙන් සිහි

---

* **ඉඳුරුවේ සුමංගල, වලානේ සිද්ධාර්ථ දෙනම සමානාචාර්ය සේකද සමහරු ගනිති.**

කළ විදුරුපොළ මහ නා හිමියෝ තම පණ්ඩිත පදප්‍රාප්තියට හා මහානායක පදප්‍රාප්තියට පස්විසි වසරක් පිරුණු තැන පැවැත් වූ මහොත්සවයේ දී කළ කථාව ආරම්භ කළේ උන් වහන්සේගේ ද 'ශ්‍රී චරණ යුග්මයන් හිස මත තබා නමදිමි'' යි කෘතඥතා පූර්වක අභිවන්දනයෙනි. විදුරුපොළ පියතිස්ස හිමියන් බුද්ධිපාටවයෙන් පිරිපුන් කෙනෙකු වීම නිසා ගුරුවරයකුට කළ යුතුව තිබුණේ යම්තමින් මග පෙන්වීම පමණි. විනයපිටකය ඇතුළු පාළි භාෂාව ගැනත්, කාව්‍යාලංකාර හා ඡන්දස් ඇතුළු සිංහල භාෂාව ගැනත්, පළල් දැනුමක් උන්වහන්සේ ලබා සිටියේ ස්වීය ප්‍රාචාර්ය විදුරුපොළ **රතනජෝති** මහ නා හිමියන් ගෙනි. මේ හේතු නිසා විදුරුපොළ පියතිස්ස හිමියන්හට රත්මලානේ **පරමධම්මචේතිය** පිරුවනින් ලැබූ උසස් අධ්‍යාපනය නිමකොට ප්‍රාචීන විභාග සියල්ල ද සුළු කලෙකින් සමත් වී ලංකාවේ ප්‍රථම පඬිවරයා වීමේ භාග්‍යය ලැබිණ.

## ධර්මශාස්ත්‍ර පරම්පරාව

වැලිවිට සරණංකර සඞ්ඝරාජ හිමි

↓

අත්තරගම රාජගුරු බණ්ඩාර

↓

කරතොට ධම්මාරාම නාහිමි

↓

ගාල්ලේ මේධංකර නාහිමි

↓

ඉඳුරුවේ සුමංගල නාහිමි

↓

වලානේ ශ්‍රී සිද්ධාර්ථ මහා ස්ථවිර

↓

| ↓ | ↓ | ↓ | ↓ | ↓ |
|---|---|---|---|---|
| බටුවන්තුඩාවේ දේවරක්ඛිත | හික්කඩුවේ සුමංගල | රත්මලානේ ධම්මාලෝක | උඩුගම්පොළ | බද්දේගම සරණංකර |

හික්කඩුවේ සුමංගල

↓

වලානේ ධම්මානන්ද

↓

විදුරුපොළ පියතිස්ස (මහානායක)

# 7 පරිච්ඡේදය

## මහානායක පදවිය හා සාසනික සේවය

භික්ෂුත්වයට පත්වන හැම කෙනෙකුට ම සාසනික සේවය නිරායාස යෙන් ම උරුම වන්නකි. සුපේසල ශික්ෂාකාමී යතිවරයෙකු වීමෙන් කුශාග්‍රබුද්ධිමත් මහා පඬිවරයකු වීමෙන්, පුළුල් සංඝ සංස්ථාවක මහා නායකවරයෙකු වීමෙන්, එම උරුමය දෙගුණ තෙගුණ වීමෙන් වඩ වඩා වැඩි දියුණු වෙයි. විදුරුපොළ මාහිමියන් මේ සියල්ලෙන් ම පිරී සිටි උත්තමගණයේ සංඝපිතෘවරයෙකි. උන්වහන්සේගේ ජීවිත කාලය තුළ කර ඇති සාසනික සේවාව එක භික්ෂුවරයකුට එතම ජීවන කාලයක් තුළ කළ නොහැකි තරම් වූ එකකි. හැම අතින් ම පුළුල් වූ එය හැම අතින් ම ඵලදායී වූවකි.

උඩරට අමරපුර නිකායේ සිවුවැනි මහා නායක ධුරය දැරූ විදුරුපොළ රතනජෝති හිමිපාණන් අපවත් වූයේ 1905 අප්‍රේල් මස 25 වැනි දින යි. මෙම දිනවල පියතිස්ස යතිවරයන් වහන්සේ කල් ගෙවූයේ ප්‍රාචීන මධ්‍යම විභාගයට පෙනී සිටිමිනි. 1905 අප්‍රේල් 29 දින සවස් ජාමේ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආදාහන පූජාව කෙරිණ. විභාගයට පිළිතුරු ලියා හමාර කොට පියතිස්ස හිමියන් ශාලාවෙන් පිටවූයේත් ඒ වෙලාවට ම ය. එදින ම රාත්‍රි දුම්රියෙන් පිටත් වූ උන්වහන්සේ පසු ද විදුරුපොළට පැමිණ පළමුකොට ආදාහන භූමිය කරා වැඩම කොට භෂ්මාවශේෂය තෙවරක් පැදකුණු කර වැඳ තම උපාධ්‍යායයන් වහන්සේ ක්ෂමා කරවා ගත්හ.

රතනජෝති මහ නා හිමියන්ගේ අභාවයේ පටන් පුරා අවුරුදු හයක් යන තුරා මහා නායකවරයකු නොමැතිකමින් උඩරට අමරපුර නිකාය අස්වාමික තත්ත්වයට පත්විණ. මේ කාලය තුළ නිකායික උපසම්පද විනයකර්මාදි කටයුතු මහා ස්ථවිර දෙනමකගේ ප්‍රධානත්වයෙන් සිද්ධ කරන ලදී.* පියතිස්ස හිමියන් වහන්සේ තම ඉදිරි අවසාන පණ්ඩිත විභාගයේ කටයුතු සඳහා මුල්තැන දෙමින් ක්‍රියා කළ අතර හැකි සෑම අවස්ථාවක ම නිකායික කටයුතුවලට ද සහභාගි වූහ. මහානායක පදවියේ පුරප්පාඩුකම උඩරට අමරපුර නිකායේ අභ්‍යන්තර තත්ත්වය යම් යම් හේතුමත සෙලවුම් කන තත්ත්වයන් ඇති කළත් ඒවායින් සමගි සාමදනයට

---

* දෙල්ගහගෙදර ධම්මානන්ද මහා ස්ථවිරයන් වහන්සේ එක නමකි.

ලොකු හානියක් සිදු නොවී ය. මෙවන් අවධියක එවන් දෑ ස්වාභාවික ලෙස කවුරුත් කල්පනා කරන්නට වූහ. **පියතිස්ස** හිමිපාණෝ තම ඉගෙනීමේ කටයුතු දිගට ම නොකඩවා පවත්වාගෙන ගියහ. සංඝස්ථවිර යන් වහන්සේලා බොහෝ දෙනාගෙන් මහානායක පදවිය බාර ගැනීම සඳහා උන්වහන්සේට යම් යම් බලකිරීම් ආ නමුත් නියම කල වයස පිරෙන තුරු තමා එයට සුදුසු නො වන බව උන්වහන්සේගේ තීරණය විය. උප සම්පදාවෙන් ථෙරවස්සික නො වීම මහානායක පදවියට සුදුසු නො වීමට මූලික හේතුව බව උන්වහන්සේගේ අදහස විය. කාලය අනුක්‍රමයෙන් ගෙවීයත් ම 1911 උදාවූයේ දොම්නසට හා සොම්නසට හේතුවන ප්‍රබල සිද්ධි කීපයක්ම පසුබිම් කරගෙන යි. තමාගේ ධර්මාචාර්යොත්තමයන් වහන්සේ වූ **වලානේ ධම්මානන්ද** ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අභාවය **පියතිස්ස** හිමියන්ට විඳදරා ගැනීමට අපහසු තරම් සංවේගදායක සිද්ධියක් විය. උන්වහන්සේ අපවත් වූයේ ද පුරා පස්විසි වර්ෂයක් තමන් විසින් උසුලන ලද පරමධම්මචේතිය පිරුවන්හි පරිවෙණාධිපති පදවිය සිය පිරිස ඉදිරියේ ම පියතිස්ස හිමිපාණන්හට පත්කොට වදරමිනි. මෙය උඩ පහත දෙරට ම බොහෝ ස්වාමීන් වහන්සේලාගේ කුතුහලයට හේතු වූවක් බව පෙනේ. කවර මතභෙද පළ වුවත් පියතිස්ස හිමිපාණන් තුළ ස්ව නිකායට තිබුණු ඇල්ම එන්න එන්න ම වැඩි වූවා විනා, එහි අඩුවක් නම් දැකක් හැකි නොවී ය. ඇති මතභෙදවලට ප්‍රතීකාරය හැටියට පහතරට නායක ස්වාමීන්වහන්සේලා කල්පනා කෙළේ තමන්ගේ සංඝ සභාවකින් උඩරට අමරපුර මහානායක පදවිය පුරවාලීමට ය. මේ අදහසේ එල්බගත් ප්‍රධාන නායක හිමියන් වූයේ වස්කඩුවේ ශ්‍රී සුභූති හිමිපාණන් ය. එම අදහස පියතිස්ස හිමියන්හට දන්වන ලදුව උන්වහන්සේ ඍජුව ම ප්‍රකාශ කෙළේ එබන්දක් තමාට අවශ්‍ය නැති බවයි.

ක්‍රි.ව. 1911 වසර විදුරුපොළ පියතිස්ස යතිවරයන් වහන්සේට සොම් නසට හේතුව වූයේ හය වසරක් ම හිස් ව තිබුණු තම නිකායේ මහානායක පදවිය තමන් වහන්සේට පත්කරලීම යි. එම වර්ෂයේ පෙබරවාරි 26 වැනි දින **තුප්පිටියේ** තපොධනාරාමස්ථ සීමා මන්දිරයට රැස් වූ උඩරට අමරපුර නිකායේ මහා ස්ථවිර ප්‍රමුඛ මහා සංඝයා වහන්සේ විසින් එතෙක් පුරප්පාඩුව තිබුණු මහානායක පදවියට රාජකීය පණ්ඩිත **විදුරුපොළ පියතිස්ස** හිමියන් වහන්සේ පත්කර වදරන ලදී. ඒ වන විට උන්වහන්සේගේ වයස අවුරුදු එක් තිසකි. මහා නායක ධුරය පත්කිරීම පිළිබඳ සම්මුතිය මහා ස්ථවිරයන් වහන්සේ පස් නමකගේ අත්සන සහිත ලිපියකින් පහතරට අමරපුර නිකායික මහා සංඝයා වහන්සේ වෙත ද දන්වා හරින ලදී. උන්වහන්සේලා සියලු දෙනා වහන්සේ ම එම පත්කිරීම ඉමහත් සතුටින් පිළිගත්හ.

මහානායක පදවිය පිළිබඳ අක්තපත්‍රය පිරිනැමීම මහා උත්සවයකින් කළ යුතු යැයි තීරණය වූයෙන් එම උත්සවය 1911 අප්‍රේල් 30 වැනි දිනට යොදාගෙන විහාරාධිපති පනාකන්නියේ **අමිතසාර** මහා ස්ථවිරපාදයන්

වහන්සේගේ හා **කේ. බී. කදුරුගමුවේ** උඩුකිඳ රටේ මහතාගේ ද අත්සනින් ආරාධනා පත්‍රයක් නිකුත් කරන ලදී. උඩ පහත දෙරට ම සුප්‍රසිද්ධ ගිහි පැවිදි ප්‍රභූ පිරිස මේ උත්සවය සඳහා පැමිණීමෙන් හෝ ආශීර්වාද කිරීමෙන් සහයෝගය දක්වා ඇත. ඒ අතර පහතරට අමරපුර නිකාය වෙනුවෙන් **වස්කඩුවේ ශ්‍රී සුභූති නායක මහා ස්ථවිර, පාණදූරේ ගුණරතන මහා ස්ථවිර, අම්බලන්ගොඩ දේවානන්ද** මහා ස්ථවිර, **පාණදූරේ ඤාණවිමලතිස්ස** මහා ස්ථවිර, **පින්වත්තේ සීලානන්ද** නායක මහා ස්ථවිර යන පස්නමගේ අත්සනින් මුද්‍රිත සන්දේශයක් ද නිකුත් කොට ආශීර්වාද කොට ඇත. **පණ්ඩිත** විදුරුපොළ **පියතිස්ස** හිමියන් මහානායක පදවියට අතිශයින් ම සුදුස්සා හැටියම පිළිගනිමින් ආශීර්වාද උපහාර දැක්වූවන් අතර අමරපුර නිකායේ ප්‍රධාන කැපකරු දායක **එක්නැළිගොඩ මහදිසාවේ** මැතිතුමා ප්‍රධාන වෙයි. ලංකාවාසී වියත් ප්‍රභූන් මේ පදවිය පිරිනැමීමට ඉතාම සුදුස්සා විදුරුපොළ මා හිමියන් බව කොතරම් ඕනෑකමින් හා ආශාවෙන් අනුමත කළා ද යනු එදා පිරිනැමූ ස්තුතිපත්‍ර රාශියෙන් මෙන් ම වෙනත් ප්‍රකාශනයන් ගෙන් ද, අදත් සුරක්ෂිත වැ ඇති ලියුම් රාශියෙන් ද ස්ථිර වෙයි.

නිකායික දියුණුව සාසනික දියුණුව සේ සැලකූ උන්වහන්සේ එහි අභිවෘද්ධියට අදාළ හැම පියවරක් ම ගත්හ. නිකායික පරිපාලන කටයුතුවල පහසුව තකා **"විනයවාදිනී"** නමින් අද ද හැඳින්වෙන කාරක සංඝසභාව ආරම්භ කෙළේ 1913 දී ය. කාරක සාමාජිකයන් වහන්සේලා 13 නමකට සීමා වූ එය පසුව 21 නම දක්වා දියුණු කරන ලදී. මෙම කාරක මණ්ඩලයේ සමානච්ඡන්දයෙන් නාම සම්මුති, ථෙර සම්මුති හා ප්‍රාදේශීය සංඝනායක පදවි ආදිය ද ප්‍රදානය කරන ලද්දේ ය. කලක් ගිය තැන **විනයවාදිනී කාරක සංඝසභාවේ** කාර්ය පහසුව සලකා 1931 දී **විධායක** සංඝසභාවක් පත් කරන්නට යෙදිණ. ධර්මවිනයධර වියත් තෙරවරු 11 නමක් එයට අයත් වූහ.

මේ ආකාරයෙන් පාලන කටයුතුවල ක්‍රමවත් බවකුත් නිකායික ප්‍රගතිය කුත් පැහැදිලි ව පෙනෙන්නට තිබිය දීත් ඇතැම් මහතෙරවරු නිකාය තුළ ද පිටත ද යම් යම් මත භෙද ඇති නො කොළෝ නො වෙති. ඒවා බොහෝ විට ප්‍රතිපත්තිමය වූ ද, උපසම්පද විනයකර්මාදිය සඳහා තෝරාගත යුතු ස්ථාන පිළිබඳ වූ ද අවුල්වලට ම සීමා විය. එබඳු අවස්ථාවල ස්ථානෝචිත පරිදි විදුරුපොළ මා හිමියන් ගත් පියවරවල් බොහෝ සෙයින් සාර්ථක විය. උන්වහන්සේගේ එබඳු විසඳුම් කෙරෙහි නොනැමුණු තෙරවරුනට ලිඛිත වැ හෝ පිළිතුරු දීමට මහානායක හිමිපාණෝ නොපසුබැහ. උන්වහන්සේ සිය නිල නාමයෙන් මැ ප්‍රසිද්ධියට පත්කළ එබඳු එක පිළිතුරු ප්‍රකාශනයක්* **"ප්‍රකාශ පත්‍රය"** නමින් කුඩා පොතක් වශයෙන් බෙදා හැර ඇත.

---

* **ප්‍රකාශ පත්‍රය;** **විනයවදිනී කාරක මහා සංඝසභාවේ සභාපති විදුරුපොළ පියතිස්සාභිධාන ප්‍රධාන සංඝනායක ස්ථවිර.**

**මුද්‍රණය:** **ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලය, කොළඹ. ක්‍රි.ව. 1914.**

විනය ප්‍රතිපත්ති සාසනික පැවැත්මට අතිශයින් ම අවශ්‍ය බව අකුරට ම පිළිගත් මහානායක හිමිපාණෝ උපසම්පද — පරිවාස — මානත්ත — අබ්භාණ ආදී සාම්ප්‍රදායික විනය කර්ම ඉතා සැලකිල්ලෙන් හා වගකීමෙන් ද, ගෞරව සම්ප්‍රයුක්ත ලෙස ආදර්ශමත් ආකාරයෙන් ද, ඉටු කළහ. උන් වහන්සේ විනිශ්චය කොට සමථයට පත් කළ ඇතැම් නඩු උසාවිවලට ගත් අවස්ථාවල එම තීන්දුව ම දීමෙන් විනිශ්චයකාරවරුන් සෑහීමකට පත් වී ඇත. විනිශ්චයකාරවරුන් මෙන් ම නීතිඥයන් ද විදුරුපොළ මහානායක හිමියන්ගේ විනිශ්චයන් ගැන පැහැදී උසාවිය තුළ ම උන් වහන්සේට ප්‍රශංසා කළ අවස්ථා ද කීපයක් ම වෙයි.

ප්‍රාදේශීය භික්ෂූන් වහන්සේගේ පහසුව තකා ඒ ඒ ප්‍රදේශවල විනය කර්ම කිරීම පිණිස 1936 වන විට විහාරස්ථාන 13 ක සීමා සම්මුති 13 ක් ඇති කරන ලදී. විදුරුපොළ මා හිමියන්ගේ ප්‍රධානත්වයෙන් සම්මත කරගත් එම සීමා අයත් විහාරස්ථාන මෙසේ ය :

> ''ඌව දිශාවේ මාරදෙළ විහාරස්ථානය, බෙරලියපොළ සුදර්ශනාරාමය, වංගියකුඹුරේ සුභද්‍රාරාමය, මයිලගස්තැන්නේ සුධර්මාරාමය, හපුතලේ අශෝකාරාමය, මධ්‍යම දිශාවේ නුවරඑළියේ බඹරකැලේ විහාරය, රූපහ කැටවලහින්නේ ජනානන්ද විහාරය, දුම්බර අලවතුගිරි විහාරය, අතරගල්ලේ අග්‍රබෝධිස්වර්ණබිම්බාරාමය, හාරසියපත්තුවේ මාලගම්මන ශ්‍රී වර්ධනාරාමය, යටිරාවන සුදර්ශන බිම්බාරාමය, මාතලේ නාවරගොඩ ජිනරාජ මහාවිහාරය, සබරගමු දිශාවේ මොරහැල සුවිසුද්ධාරාමය යන විහාරස්ථාන 13 ක සීමාසම්මුති විනයකර්ම කරන ලදී.''

''තවද බෝලියැද්දේ ශ්‍රී විජයාරාමය, පුස්සැල්ලාකන්දේ ශ්‍රී මහා විහාරය, බඹරපනේ ශ්‍රී ධර්මවිජයාරාමය, වේරගොඩ විහාරස්ථානය'' යන ආරාමයන්හි විදුරුපොළ මා හිමියන්ගේ ප්‍රධානත්වයෙන් සීමා බන්ධන විනය කර්ම කිරීමට යෙදිණ.

මීට පසුව ද තවත් විහාරස්ථාන ගණනක ම සීමා සම්මත කරන ලදී.

1931 දී විහාර දේවාලය ගම් පනත යටතේ භික්ෂූන් ලියා පදිංචි කරවීම පිළිබඳ වැ ආරම්භයේ දී රු. 50 ක දඩයක් නියම වැ තිබුණු නිසා මහානායක හිමියෝ තම නිකායික භික්ෂූන් එයින් බේරා ගැනීම් වස් භික්ෂු රෙජිස්ටරයට එකඟ වූහ. එහෙත් එය මත හෙදයට තුඩු දුන්නක් විය.

භික්ෂූන් ලියා පදිංචි කිරීම පිළිබඳ ව උන්වහන්සේ කරුණු පැහැදිලි කරමින් නිවේදන පත්‍ර කීපයක් ම මුද්‍රණය කොට බෙද හරින්නට සලස්වන ලදී.* මෙහි දෙවැනි නිවේදන පත්‍රිකාව නිකුත් වූයේ 1932 ජනවාරි 27

* භික්ෂූන් ලියාපදිංචි කිරීම; උඩරට අමරපුර නිකායේ මහානායක ධූරන්ධර රාජකීය පණ්ඩිත විදුරුපොළ පියතිස්සාභිධාන මහා ස්ථවිරයෝ.
මුද්‍රණය: නුවරඑළියේ ඇඩ්වින් ඇල්බට් සහ සමාගම. 1932 ජනවාරි 27

දින යි. 1930 ගණන්වල ඇතිවුණු ආණ්ඩු ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණයේ දී එහි ප්‍රතිඵල වශයෙන් **ඩොනමෝර් කොමිෂන් සභාව** මගින් ලංකාවට ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ලබා දීමට තීරණය විය. එහි ලා ඡන්ද පාවිච්චිය පිළිබඳ ව **උඩරට අමරපුර නිකායික** සියලු භික්ෂූන් වහන්සේ වෙත මුද්‍රිත නිවේදන පත්‍රිකාවක් මගින් කරුණු පැහැදිලි කරන්නට යෙදිණ.*

**ඇටෝර්නි ජනරාල්**තුමාගේ නියමයක් පරිදි 1934 ජූනි 22 දින **රාජ්‍ය මන්ත්‍රණ සභාවේ** පැවැත්වුණු උඩරට නීති ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සාකච්ඡාවට සහභාගි වූ විදුරුපොළ මා හිමියෝ ඉතා සාරගර්භ එළදයී කරුණු රාශියක් ඉදිරිපත් කිරීමෙහි සමත් වූහ. එයින් උන්වහන්සේ නීති වේදීන්ගේ ද පැසසුමට ලක්වූහ.

මේ සියවසේ පර්යාප්ති සාසනයට පණ්ඩිත විදුරුපොළ **පියතිස්ස** මා මියන්ගෙන් වූ සේවය සද සම්භාවනීය ය. 1913 මාර්තු 16 දින ලංකාවේ ප්‍රධාන උගත් ගිහි පැවිදි පිරිස එකතු කොට **හේවාවිතාරණ ත්‍රිපිටක මුද්‍රණ සභාව** ආරම්භ කරන ලදී. **සයිමන්** ඇලෙක්සැන්ඩර් **හේවාවිතාරණ** මැති තුමන්ගේ ධනව්‍යයෙන් ත්‍රිපිටක පොත් ක්‍රමවත් ශුද්ධියකින් ශුද්ධ කොට, ලක්ෂණ මුද්‍රණයකින් පිටකිරීම එහි අරමුණ වූ අතර එම සංස්කාරක මණ්ඩලයේ ප්‍රධාන පෙළේ සංස්කාරකවරයෙකු හැටියට උන්වහන්සේ කළ සේවය අමරණීය වේ. **සංයුත්ත අටුවාව, නෙත්තිප්පකරණ** අටුවාව වැනි අපපාඨවලින් ගහන වැ අසම්පූර්ණ වැ තිබුණු ඒ පොත් උන්වහන්සේ ගේ සාරගර්භ ශුද්ධියෙන් ශුද්ධියට පත් වැ ඇත. හේවාවිතාරණ ග්‍රන්ථ මාලාවේ අටුවා පොත් ගණනාවක් ම උන්වහන්සේ විසින් ශුද්ධ කරන ලදී. විදුරුපොළ මා හිමියන්ගේ ත්‍රිපිටක ග්‍රන්ථශුද්ධි ධර්මවිනයධර මහ වියතුන්ගේ පවා මහත් ප්‍රසාදයට පාත්‍ර විය.

> "පියතිස්ස මා හිමියන් ජීවිතයේ අන්තිම මොහොතේ කළ අන්තිම ශාසනික ක්‍රියාව ද හේවාවිතාරණ ත්‍රිපිටකග්‍රන්ථ අතර ජාතකපාළි පෙළ පොතේ ප්‍රස්තාවනාවට අත්සන් තැබීම ය."

පර්යාප්තිය පිරිසිදුව තබා ගැනීම සාසන සේවයේ මූලික පියවර ලෙස සැලකූ මහානායක පණ්ඩිත විදුරුපොළ **පියතිස්ස** ස්වාමීන් වහන්සේ **යම් යම්** වියතුන් අතිධාවනයෙන් කළ ත්‍රිපිටක විවේචනවලට තරයේ ම එරෙහි වූහ. එපමණක් නොව එබඳු උගතුන්හට පිළිතුරු දෙමින් පෞරාණික පිළිවෙත රැකගන්නට මහත් ධෛර්යයක් ගත්හ. මේ නිසා පුවත්පත් ආදිය මගින් කැරුණු වාදවිවාද ද කීපයකි.

---

* **භික්ෂුජන්දය ගැණයි; උඩරට අමරපුර නිකායේ මහානායක ධූරන්ධර රාජකීය පණ්ඩිත විදුරුපොළ පියතිස්සාභිධාන මහාස්ථවිරයෝ.**

**මුද්‍රණය; ඇඩ්වින් ඇල්බට් සහ සමාගම, නුවරඑළිය. 1930 ජූලි 22**

ධර්මශාස්ත්‍රීය අභිවෘද්ධිය භාෂා සාහිත්‍යසේවාව ආදිය පදනම් කොට ගෙන එද මේ රටේ ඇරඹුණු නොයෙකුත් සමිති සමාගම්වල උන්වහන්සේ වගකිය යුතු නිලයකට පත්වීම අනිවාර්ය කරුණක් මෙන් දිස්විණ.

භික්ෂූන් අතර සමගිය හා එක්සත්කමත් අන්‍යොන්‍ය සුහදතාවත් වඩා වර්ධනය කරලීමේ පරමාධිෂ්ඨානයෙන් ක්‍රි.ව. 1909 දී **සාමශ්‍රී සාධක සංඝ සභා** නමින් භික්ෂු සංවිධානයක් ඇතිකර ගන්නා ලදී. එහි ප්‍රථම සභාපති වරයා වූවෝ හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මා හිමියෝ ය. පස් නමක ගෙන් යුත් ලේකම් මණ්ඩලයෙහි ප්‍රධානත්වයට පත්වූවෝ විදුරුපොළ පියතිස්ස හිමිපාණෝ ය. සෙසු ලේකම්වරුන් නම්, යගිරල පඤ්ඤානන්ද පන්නිල පියරතන, සූරියගොඩ සුමංගල, පලිපාන සිරිනිවාස යන හිමි වරුන් ය.

වර්ෂ 1910 දී ප්‍රාචීන පණ්ඩිත විභාගයෙන් සමත් වූ විදුරුපොළ හිමි පාණන් හට **ප්‍රාචීන භාෂොපකාර සමිතියේ** සාමාජිකත්වය ස්වාභාවික ලෙස ම හිමි විය. ජාතික වශයෙන් ද ජාත්‍යන්තර වශයෙන් ද කීර්තිධර, ආසියාවේ ප්‍රබලතම ශාස්ත්‍රීය සංවිධානය වූ **රාජකීය ආසියාතික සමිතියේ** සාමාජිකත්ව යට පණ්ඩිත විදුරුපොළ පියතිස්ස නා හිමියන් තෝරාගන්නා ලද්දේ 1911 දී ය. ආගමික සාමාජික කටයුතු රාශියක් ඉෂ්ට සිද්ධ කරමින් ඉතා දීර්ඝ කාලයක් පවත්වාගෙන ආ බඹරකැලේ ශ්‍රී මහා විහාරයේ පිහිටුවා තිබුණු **ශ්‍රී සද්ධර්මාධර** නම් වූ සමිතියේ දීර්ඝ කාලීන සේවාවට විදුරුපොළ මා හිමියන්ගෙන් කැරුණු මග පෙන්වීම ප්‍රධාන ම ප්‍රතිෂ්ඨාව විය.

ඌවේ සමස්ත භික්ෂුසංඝයා වහන්සේගේ ධර්මශාස්ත්‍ර සමුන්නතිය හා එක්සත්කමත්, අන්‍යොන්‍ය සම්බන්ධතාවත් පදනම් කරගෙන පවත්වා ගෙන ගිය **ඌව භික්ෂු සම්මේලනය** ප්‍රබල සංස්ථාවක් බවට පත්ව තිබිණ. එහි ප්‍රථම සංවත්සර සම්මේලනය ක්‍රි.ව. 1941 මාර්තු 23 දින බණ්ඩාරවෙල දී පවත්වන්නට යෙදිණ. විදුරුපොළ මා හිමියන් වහන්සේ විසින් එහි දී පාළි භාෂාවෙන් පවත්වන්නට යෙදුණු ව්‍යක්ත දේශනය ඌවේ ඉතිහාසය, කාලීන ප්‍රශ්න හා භික්ෂු එක්සත්කම ආදිය පිළිබඳ ව සාරගර්භ ශාස්ත්‍රීය පරීක්ෂණාත්මක නිබන්ධයක් විය. එහි සංක්ෂිප්ත අනුවාදයක් මුද්‍රණයෙන් ප්‍රසිද්ධ කරන ලදී.*

සාසනයේ පැවැත්මට ධර්මවිනයධර ශිෂ්‍ය පිරිසක් ඇතිකරලීමේ අවශ්‍යතාව මහානායක හිමියන් වටහාගෙන ක්‍රියා කෙළේ උන්වහන්සේගේ තරුණ අවධියේ සිට ම ය. උන්වහන්සේගේ ප්‍රථම ශිෂ්‍යයා හැටියට නුවරඑළියේ **විමලබුද්ධි** හිමියන් සසුන්ගත කෙළේ 1904 දී ය.

---

* ඌව භික්ෂු සම්මේලනයේ දී විදුරුපොළ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් පාළි භාෂාවෙන් කරන ලද කථාවෙහි සංක්ෂිප්ත සිංහල අනුවාදය.

ක්‍රි. ව. 1941 මාර්තු.

අලවතුගොඩ දේවරක්ඛිත, විදුරුපොළ බුද්ධදත්ත, බඹරපනේ සීලවංස, විදුරුපොළ ධම්මානන්ද, දික්කාපිටියේ නන්ද යන හිමිවරුන් ඇතුළු සාසනික පිරිමැස්මක් ඇති විශාල ශිෂ්‍යානුශිෂ්‍ය පිරිසක් උන්වහන්සේ විසින් ඇති කරන ලදී. සාසනයේ පැවැත්මටත්, පැතිරීමටත් හේතු වන දේශීය වූත්, දේශාන්තරික වූත් හැම කාර්යයක් කෙරෙහි ම විදුරුපොළ මා හිමියන් වහන්සේගේ අවධානය ඉතා ගැඹුරු ලෙසින් හැම මොහොත ක ම යොමුව තිබිණ. එබඳු එළදයී කටයුතු පිළිබඳ ව තමන් හට දිය හැකි හැම සහයෝගයක් ම දීමට ද විදුරුපොළ මා හිමියෝ හැම මොහො තක ම ඇප කැප වී ක්‍රියා කළහ. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ ආගමික හා සාමාජික වූත්, දේශීය හා දේශාන්තරික වූත්, පොදු සේවාවල දී මෙන් ම එතුමාගේ ධර්මශාස්ත්‍රීය කටයුතුවලදීත් විදුරුපොළ මා හිමියන් වහන්සේගේ සදුපදේශයන් එතුමා බෙහෙවින් අගේ කොට ඇති බව මහා නායක ස්වාමීන්ද්‍රයන් හා කළ සාකච්ඡාවලින් මෙන් ම නොයෙක් වර එවා ඇති නොයෙකුත් ලිපි ලේඛනවලින් ද ස්ථිර වෙයි.

සමකාලීන වැ පැන නැගුණු විවාදපන්න කරුණුවල දී උන්වහන්සේ ධර්මවිනයානුකූල යථා තත්ත්වය ඍජුව මැ ප්‍රකාශ කරන්නට පසුබට නොවූහ. පාංශුකූලය පිළිබඳ වැ ඇති වූ විවාදයේ දී විදුරුපොළ මා හිමියන් කරුණු ගෙනහැර පෑයේ ඉතා ව්‍යක්ත ලෙස ධර්ම කරුණු හා විනය ප්‍රඥප්ති පාදක කර ගනිමිනි. ඒ පිළිබඳ වැ උන්වහන්සේ ඉදිරිපත් කළ තර්ක ධර්මශාස්ත්‍රානුකූල වූවා මෙන් ම කීර්තිධර මහා පඩිවරුන්ගේ සාතිශය සම්භාවනයට ද පාත්‍ර විය. එම කරුණු සියල්ල පිඩුකොට ධර්මවිනයධර වාදී–ප්‍රතිවාදී උභය පක්ෂයේ ම ප්‍රයෝජනය සඳහා උන්වහන්සේ විසින් ඉදිරිපත් කළ සාරගර්භ නිබන්ධය* නවීන මතධාරීන්ට යවුල් පහරක් වැනි වූයේ ය. අදාළ විෂය පිළිබඳ මූලික ප්‍රඥප්තීන්ගේ විවරණයක් වූ එය අභෙද්‍ය සාධකවලින් සපුරා පරිපෝෂණය කොට ඇත.

වර්ෂ එක්දහස් නවසිය තිස් ගණන්වල දී සිළුමිණ පුවත්පත මඟින් පවත්වාගෙන ගිය අටුවාවලට දෙස් දැක්වීම පිළිබඳ විවාදයේ දී උන්වහන්සේ ධර්මවිනය පිළිබඳ තම වෛශාරද්‍යය මොනවට විදහා දක්වා ඇත්තේ ප්‍රතිවාදීන් පවා විස්මිත කරන විලාසයෙනි. මේ සියල්ලෙන් ම උන් වහන්සේගේ අපේක්ෂාව වූයේ නවීන මතවාදවලින් ත්‍රිපිටකධර්මයට හානියක් නොවන අයුරින් එය සුරක්ෂිත කර ගැනීම යි.

පෞරාණික ධර්මශාස්ත්‍ර විෂයයෙහි අතිධාවන මතිමතාන්තර උන් වහන්සේ කොහොමටවත් ඉවසුවේ නැත. නවීන දේට නිග්‍රහ නො කළ අතර පැරණි දේට ගරු කිරීම උන්වහන්සේගේ ජීවිතයෙහි තහවුරු පිළි ගැනීම විය.

---

* පාංශුකූල විනිශ්චය; භදන්ත පණ්ඩිත විදුරුපොළ පියතිස්ස මහානායක හිමිපාණෝ ශ්‍රී පියතිස්ස සාහිත්‍ය අංකය, පිටු: 65–72

ලංකාවේ රජය මඟින් පැවැත් වූ ප්‍රධාන පෙළේ ප්‍රසිද්ධ විභාගවල උපදේශකයකු හා පරීක්ෂකවරයකු වශයෙන් ද, කටයුතු කළ **විදුරුපොළ** මා හිමියන් එද **විද්‍යාලංකාර පිරුවන** මඟින් පවත්වන ලද ඉහළ පෙළේ විභාගවල නිත්‍ය පරීක්ෂකයකු ලෙස කටයුතු කොට ඇත. ජීවිතයේ අන්තිම කාල පරිච්ඡෙදයේ මා හිමියෝ පිරුවන් අධ්‍යාපනයට තවද මුහුණුවරකින් සේවාවක් කළහ. ඒ ක්‍රි.ව. 1953 දී **ඇටම්පිටියේ** න්‍යග්‍රෝධාරාමයෙහි **ශ්‍රී විද්‍යාභූෂණ** නමින් පිරුවනක් අරඹා එහි ආධිපත්‍යයට හා අධ්‍යක්ෂ පදවියට පත්වීමෙනි.

අතිපූජ්‍ය මා හිමියන්ගේ ශ්‍රී නාමයට උපහාරයක් වශයෙන් ක්‍රි. ව. 1958 දී **විදුරුපොළ** ඇරඹි **ශ්‍රී පියතිස්ස පිරුවන් ආයතනය** ක්‍රමයෙන් දියුණුවට පත්ව අදත් ඉමහත් ධර්මශාස්ත්‍රීය සේවාවක් ඉටු කරන්නකි.

# 8 පරිච්ඡේදය

## මහාකාව්‍ය – චම්පූකාව්‍ය හා කෝෂකෘති

පාළියේ නිර්මාණාත්මක සාහිත්‍යය පිළිබඳ ව සලකන විට ගත වූ මෑත සියවස් කීපය ම ගෙවී ඇත්තේ අඳුරින් බරව ය. ප්‍රධාන පෙළේ අධ්‍යාපන ආයතන වන පිරුවන්වලින් පවා නිකුත් වූයේ සන්න, ව්‍යාඛ්‍යාන, ගැටපද, පරිකථා වැනි පරිවාර ග්‍රන්ථ විනා නිර්මාණාත්මක කෘති නො වේ. ඒ අතර විදුරුපොළ පියතිස්ස මහනාහිමියන් මහාකාව්‍ය, චම්පූකාව්‍ය, භක්ති කාව්‍ය ආදී සාහිත්‍යික අංශ ගැන නව කෘති කීපයක් ම නිර්මාණය කොට පාළි සාහිත්‍යයට කර ඇති සේවාව වෙනත් කිසිම වියතකුගෙන් සිදු වී නැති බව නූතන පාළි සාහිත්‍ය ඉතිහාසය විමසන්නකුට ඔප්පු වන්නකි. උන්වහන්සේ නිර්මාණය කළ මහාකාව්‍යය මහාකස්සපචරිතය[1] යි. එය මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ චරිතාපදානය වස්තු කොට ගත්තකි. මහාකාව්‍යලක්ෂණ ගණනාවකින් සම්පූර්ණ එය පූර්ව චරිත උත්තර චරිත වශයෙන් කොටස් දෙකකට වර්ග කොට ඇත. පූර්ව චරිතයට සර්ග දසයක් ද, උත්තර චරිතයට සර්ග දසයක් දැයි සර්ග විස්සකින් පිරි සිටි ප්‍රාර්ථනා ගාථා තුනක් ඇතුළු ගාථා 1532 කින් යුක්ත වූ මහා ග්‍රන්ථයකි. සිද්ධියට හෝ චරිතයට උචිත තෝරාගත් විවිධ වෘත්තවලින් රචිත එය හැම සර්ගාවසානයක් ම භින්න වෘත්තවලින් සංග්‍රහ කොට ඇත.

මෙම මහා කාව්‍යය සඳහා උන්වහන්සේ සපයා ඇති හැඳින්වීම ලියා ඇත්තේ ඉංග්‍රීසියෙන් පමණි. තමා මේ මහාකාව්‍යය රචනා කිරීමට පෙළඹුණු අයුරුත්, අවධියෙන් අවධිය මෙම කාව්‍යය සංවර්ධනය කරමින් අවුරුදු ගණනාවක් ඇවෑමෙන් නිමාවට පත් කළ අයුරුත් එයින් පැහැදිලි කොට ඇත. දේශීය හා දේශාන්තරික වශයෙන් ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා සම්බුද්ධ ශාසනයට කරන මහඟු සේවයට උපහාරයක් වශයෙන් එතුමාට මෙම කාව්‍යය පිරිනමා ඇත.

---

1 ප්‍රකාශනය; විදුරුපොළ සිරි සුගතසාසනෝදය සමිතිය
මුද්‍රණය; ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලය, කොළඹ.
ප්‍රමාණය; ඩිමයි පිටු: 136
ප්‍රකාශිත වර්ෂය; ක්‍රි; ව; 1924

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා 1923 දෙසැම්බර් 5 වැනි දින විදුරුපොළ මා හිමියන්හට ලිපියක් එවමින් මේ පොත ගැන මෙසේ කියයි :

> "මහා කස්සප චරිතය නමැති පාලි ග්‍රන්ථය දේවනාගර අකුරෙන් මුද්‍රණය කර දඹදිව සංස්කෘත දත් පණ්ඩිත ලෝකයාට බෙදා දෙන්ට මට සිතක් උපන...... මා ගණනේ එය මුද්‍රණය කරනු ලැබේ.
>
> මහා කාශ්‍යප හාමුදුරුවන්ගේ චරිතය මම ඉතා බාලකාලයේ දී මගේ මෑණියන්ගෙන් අසා දැනගතිමි. රිසි සිංග තාපසයාගේ කථාව සහ කාශ්‍යප චරිතය මගේ බ්‍රහ්මචර්‍ය්‍ය ජීවිතයට ආධාර විය."

ධර්මපාලතුමා මේ කාව්‍යය ගැන කොතරම් පැහැදීමක් ඇති කරගෙන සිටියා ද යනු එම ලිපියෙන් පැහැදිලි වෙයි. එසේ ම මෙම කාව්‍යය බොම්බායේ විශ්වවිද්‍යා පීඨයෙහි ඇම්.ඒ. විභාගයට ද නියමිත ග්‍රන්ථයක් විය.

බොහෝ විද්වත් පඬිවරුන්ගේ ප්‍රසාදයට පාත්‍ර වූ මහාකස්සපචරිත මහා කාව්‍යය ගැන **ලංකා පාලි සාහිත්‍යය**[1] නමින් මහාචාර්ය **ජී. පී. මලලසේකර** මහතා කළ ග්‍රන්ථයේ විශිෂ්ට අගැයීමක් කර තිබේ.

පාළි සාහිත්‍යය[2] ගැන ග්‍රන්ථයක් සැපයූ පොල්වත්තේ බුද්ධදත්ත නා හිමියන් ද සිය කෘතියෙන් මේ කාව්‍යය හඳුන්වා දී තිබේ. මේ ග්‍රන්ථය ගැන එකල ලංකාවේ පුවත්පත්වල පළ වූ විවේචන ද ගණනාවකි. මේ ඒවායින් එකකි :

## මහා කස්සප චරිතය

> "මෙම මාගධී භාෂාමය පද්‍ය රචනාව ලදින් මහත් සන්තෝෂයෙන් යුක්තව කියවා බැලීමි. මේ වනාහි රාජකීය පණ්ඩිත විදුරුපොළ ප්‍රියතිෂ්‍ය'භිධාන උඩරට අමරපුර නිකායේ මහා නායක ස්ථවිරයන්ගේ රචනාවකි. මෙය බැලීමෙන් මාහට ඇති වූ සන්තෝෂය ඉතා මහත් බැව් නොමසුරුව ප්‍රකාශ කරමි. ඌව දිශාව වනාහි එකකලක මහා පණ්ඩිතවරයන්ගේ ද ප්‍රසිද්ධ ග්‍රන්ථ කර්තෘවරයන්ගේ ද ජන්මභූමියක්ව පැවති බව රාජසිංහ රජතුමාගේ පණ්ඩිත සභාවේ හා කවිකාර මඩුවේද තතුදන්නා සුධීහු දනිති. එහෙත් කාලවිපරිනාමයාගේ ප්‍රබලතාව නිසාම මෙකල ශාස්ත්‍රය අතින් ඉතා දුප්පත් පළාතව තිබීමේ අගෞරවය හැමවිටම අපට ලජ්ජාකාරීය. දැන් වනාහි යලිත් ඌව පළාතට ඒ

---

1 ලංකා පාලි සාහිත්‍යය; (ගුණපාල මලලසේකර) සිංහල පරිවර්තනය, පිට; 238
ඇම්. ඩී. ගුණසේන සහ සමාගම කොළඹ, 1965

2 පාළි සාහිත්‍යය; දෙවෙනි කොටස (පොල්වත්තේ බුද්ධදත්ත) පිටු: 410- 411
ආනන්ද පොත් සමාගම, අම්බලන්ගොඩ. 1956

පළමු පැවති ගෞරවය අයත්වේගන යනු දකීම සැබවින්ම අතිශය ප්‍රීතියකි.

මේ අභිනව ග්‍රන්ථය ප්‍රශස්ත මහා කාව්‍යයකි. සර්ගබන්ධන ආදි මහා කාව්‍ය ලක්ෂණ කොයිවාත් මෙහි අනූනව තිබේ. භාෂාවිලාසය ද සන්දර්භ මාධුය්‍යීය ද සුධීන්ගේ චිත්තාරාධනය කරයි. ගැඹුරු නොවූ කයොරත් නොවූ වචනයන්ගෙන්ම පද්‍ය සියල්ල යුක්ත කොට තිබේ. ප්‍රසාද මාධුය්‍යී සෞකුමාරතාදී කාව්‍ය ප්‍රාණයෝ ප්‍රාණවත්වම දක්නා ලැබෙත්. ඉංග්‍රීසි කවීන් ෂේක්ෂ්පියර් ද සංස්කෘත කවීන් කාලිදස ද සිංහල කවීන් ශ්‍රී රාහුල මා හිමි ද ගරු තන්හි තබා තදීය ග්‍රන්ථයන්ගෙන් උපදෙස් ලැබ කාව්‍ය රචනාවන් කරණ බැව් සත්‍යයි. විශේෂයෙන් ලක්දිව විසූ ගිහි පැවිදි පඬිවරු භාරතදේශීය කවීන්ගේ ග්‍රන්ථයන් අනුවම ස්වකීය ග්‍රන්ථයන් නිෂ්පාදනය කළහ. ශ්‍රී රාහුල මාහිමියන්ගේ පඤ්චිකාප්‍රදීපය හා කාව්‍යශෙඛරය ද සංසරක්ෂිත මාහිමියන්ගේ වුත්තොදය හා සුබොධාලංකාරය ද වෙනත් බොහෝ පොත්පත් ද අපේ මේ කීමට සාක්ෂ්‍ය වෙති.

මේ චිරන්තන ධර්මතාව විදුරුපොළ නායක ස්ථවිරතුමන් විසින්ද පිළිගන්නා ලද බව පෙණේ. මේ අභිනව පුස්තකයෙහි බොහෝ රචනාවන් කාලිදස පඬිවරයාගේ ශ්ලෝකයන් අනුව රචනා කොට තිබීමෙන් ඒ බැව් හැඟේ. සැම පෘථජ්ජනයෙක්ම වරදින සුළුය. කාලිදසගේ රචනාවල පවා දෙස් දක්වූත් සමකාලීන පඬිවරයෙකු සිටි බැව් පෙණේ. එහෙයින් මේ පොතේත් යම් දෙසාංසුවක් තිබේ නම් එය ග්‍රන්ථගෞරව යවත් කර්තෘ ගෞරවයවත් අඩුවීමට හේතුවක් නොවෙනවා ඇත. කලක් උඩරට දීප්තිමත්ව පැවති ශාස්ත්‍රාලෝකය දැන් පහතරට පවත්නා අතර උඩරට ධන්‍ය පුණ්‍යසම්පන්නයන් විසින් යලිත් ස්වකීය රට ශාස්ත්‍රාලෝකයෙන් ඒකාලෝක කිරීමට සිත්වලට ගත යුතුය. රත් මලානේ පරමධර්ම චෛත්‍ය පරිවෙණාධිපතිව වැඩවිසූ ශ්‍රී ධර්මානන්ද නායක ස්ථවිරයන් වහන්සේ වෙතින් ශාස්ත්‍රාලෝකය ලබාගත් මේ උගත් නායක ස්ථවිරතුමා ඌව දිශාවට පමණක් නොව මුළු උඩරටටම ගෞරවයකි. දියුණුවනු කැමතියන්හට මනා ආදර්ශයකි. ආශංශ පුද්ගලයන්හට ප්‍රමොද වස්තුවකි. චපල ගති වාචාල ගති ආදි දුර්ගුණ වලින් සම්පූර්ණයෙන් තොරවූ ද ආත්මගෞරවය රැකගෙණ කටයුතු කරන්නාවූ ද ශාස්ත්‍රාගම විෂයෙහි බැසගත් ඥනගතීන් යුක්තවූ ද මේ නායක ස්ථවිරයන්ගෙන් ලංකා බුද්ධශාසනයටත් විශේෂ වශයෙන් ඌව පළාතේ කීර්තිශේෂගතවූ ගෞරවයාගේ පුනර්ජීවනයටත් බොහෝ වැඩ සිදුවනු නොඅනුමානය.

තවමත් මධ්‍යම වයස්කවූ මේ සුවිනීත නායක ස්ථවිරතුමන්ගේ චිරජීවනය අකුටිලාධ්‍යාශයෙන් යුක්තව ප්‍රාර්ථනා කරමි. මහෝත්තම වූ මහා කාශ්‍යපයන්වහන්සේගේ චරිතයෙන් සම්බුද්ධ ශාසනය ශෝභා

මත් කළේය. ප්‍රාඥ වූ විදුරුපොළ නායක ස්ථවිරයන්ගේ මේ රචනාවෙන් මහා කාශ්‍යපයන්වහන්සේගේ චරිතය ශෝභාමත් කළේය. එහෙයින් විදුරුපොළ නායක ස්ථවිරයන්ගෙන් සම්බුද්ධ ශාසනයත් විශේෂයෙන් ශෝභාමත් බවට පැමිණෙනු නිසැකය. අපගේ අවවාදය නම් බාල පරම්පරාවේ සිටින හැම පැවිදිතැන් විසින්ම මේ විදුරුපොළ නායක ස්ථවිරයන් මෙන්ම සම්බුද්ධ ධර්මය සහිත වූ සව්‍යාකරණ පාළි භාෂාව ප්‍රධාන කොට තදන්‍ය වූ භාෂා ශාස්ත්‍රයන් හැදෑරීමෙහිත් ලෝකාර්ථ චය්‍යාීවෙහිත් නියුක්ත විය යුතු බවය.

අප වෙත පොතක් එවීම ගැනද මේ ප්‍රශස්ත කෘතිය ගැනද අධික ප්‍රශාදයට පැමිණි අපි ග්‍රන්ථ කර්තෘවර නායක ස්ථවිරතුමන්ට යළිත් පසසම්හ.

මීට–දඹවින්නෝ විහාරාධිපති
වාගීශ්වර ශ්‍රී සංඝපාල මංගල සරණංකරාභිධාන උඩුව වෙල්ලස්ස දෙදිශාවේ ප්‍රධාන නායක ස්ථවිර වෙමි.''
''සිංහල ජාතිය''
1924 සැප්තැම්බර් 9 වැනි දින

## මහානෙක්ඛම්මචම්පූ[1]

සංස්කෘත සාහිත්‍යයෙහි සුලභ වැ ලැබෙතත් පාළියෙහි ඉතා දුලබ සාහිත්‍ය අංගයකි චම්පූ කාව්‍ය. පාළියෙහි ලැබෙන එකම චම්පූ කාව්‍යය හත්ථවනගල්ල විහාරවංසය යි. කුණාල ජාතකය ද චම්පූ ලක්ෂණවලින් යුක්ත වූවත් එය චම්පූ කාව්‍යයක් සේ ප්‍රකට නැත. පාළි සාහිත්‍යයෙහි ප්‍රකට වැ පැනෙන මේ අඩුව පිරීම සඳහා ද, ප්‍රමාණයෙන් හත්ථවනගල්ල විහාර වංසයට වැඩි තරම් වන කාව්‍යයක් කිරීම සඳහා ද, හිත ගියෙන් මේ කාව්‍යය රචනා කළ බව කතුවර මහ නා හිමියෝ කියති.

මෙහි වස්තුව මහා ජනක ජාතකය යි. එය විකාශනය කිරීම සඳහා නගර, රාජ, කුමාරෝදය, යුද්ධ, චන්ද්‍රසූර්ය, උදය, අස්ත, සමුද්‍ර, සෘතු, රාත්‍රී ආදි වශයෙන් වර්ණනාස්ථල රාශියක් මෙහි කථා වස්තුවට ඇතුළත් කොට ඇත. මෙම කාව්‍යය කාණ්ඩ වශයෙන් දහයකට වර්ග කොට රචිත ය. ඒවා නම් : 1. නිදාන කණ්ඩය, 2. මිථිලා කණ්ඩය, 3. යුද්ධ කණ්ඩය, 4. කාළචම්පා කණ්ඩය, 5. සමුද්ද කණ්ඩය, 6. විභූති කණ්ඩය, 7. සංකප්ප කණ්ඩය, 8. නෙක්ඛම්ම කණ්ඩය, 9. ඔවාද කණ්ඩය, 10. සමොධාන කණ්ඩය යන විසිනි. මේ කාව්‍යය චම්පූ කාව්‍යයකට අවශ්‍ය සියලුම අංග වලින් සම්පූර්ණ බව කතුවර මා හිමියෝ ම කියති.

---

1 ප්‍රකාශක; ඩී. ඒ. අභංගම මහතා
මුද්‍රණය; නුවරඑළිය යන්ත්‍රාලය
ප්‍රමාණය; ඩිමයි පිටු 100
ප්‍රකාශිත වර්ෂය; ක්‍රි; ව; 1935

ගද්‍ය පද්‍ය සම්මිශ්‍රිත මෙහි, කතුවරයන් වහන්සේ රචිත ගාථා 337 කි. සෙස්ස දේශනා ගාථා යි. අග එන කර්තෘ සන්දර්ශනය සහිත නිගමනයෙහි ද ගාථා 40 ක් ඇතුළත් වේ. කාව්‍යය හා තත් විෂය හඳුන්වමින් කතුවරයන් වහන්සේ ම ලියූ ඉංග්‍රීසි සිංහල හැඳින්වීම් දෙකෙකි. මෙය පළ කළ මුල් අවධියේ ලංකාවේ පිරුවන්වල 5 වැනි වර්ගයෙහි පාඨ ග්‍රන්ථයක් වශයෙන් රජය විසින් නියම කරන ලදී. මෙම කාව්‍යය විමසිල්ලට ලක් කරමින් "නූතන පාලි චම්පූ මහා කාව්‍ය" නමින් ලිපියක් දමුණුමැයේ ඤාණරතන[1] හිමියන් විසින් සපයා ඇත. ලංකාවේ විද්වත් පඬිවරුන් රාශියක් ම මේ කාව්‍යය ගැන පසසා කතුවර මා හිමියන් වහන්සේ වෙත එවූ ලිපි ද රාශියකි. පුවත්පත්වල පළ වූ විවේචන අතරින් මේ එකකි :

## අභිනව චම්පූ කාව්‍යයක්

**පැලැණේ ශ්‍රී වජ්‍රඥාන නායක ස්ථවිර පාදයන් වහන්සේ විසිනි.**

"පණ්ඩිත විදුරුපොල පියතිස්ස මහා නායක ස්ථවිරයන් වහන්සේ විසින් විරචිත වූ මේ පාලි චම්පූ කාව්‍යය ලදින් සාදරයෙන් කියවා බැලුයෙමු. මෙය වූකලී පාලි සාහිත්‍යයට වුවමනා වැ තුබූ පාඩුවක් පිරිමසා ලීමෙකි. පාලිභාෂායෙන් වදාළ ත්‍රිපිටකය ද එයට ලියූ අටුවා ටීකාවෝ ද සංග්‍රහ ප්‍රකරණාන්තරයෝ ද ගද්‍ය පද්‍ය තදුභයමිශ්‍රස්වරූප වුවත් කාව්‍යත්වයෙන් නොගිණිය යුතු වෙති. ඒ සියල්ලෙහි ධර්ම ශාස්ත්‍රයන් මුත් කවීන්හට අභිමත වූ රස භාවාදියක් ඇතුළත් නො වන හෙයිනි. මෙසේ බැවින් පාලිභාෂාව සාමාන්‍යයෙන් කාව්‍යපක්ෂයෙන් නො පොහොසත් ය යි කිය යුතු ය. එහිදු, ජිනාලංකාර—ජිනචරිත—දාඨාවංස—සමන්තකූට වණ්ණනාදි වශයෙන් පැරැණි වූද සාසනවංස දීපාදි වශයෙන් නවීන වූ ද පද්‍යමය කාව්‍ය සංඛ්‍යාවක්, ඇතත් සම්භාව්‍ය ගද්‍ය කාව්‍යයක් සැටියට මහාබෝධිවංසයත් චම්පූකාව්‍යයක් සැටියට ප්‍රමාණයෙන් කුඩා වූ හත්ථවනගල්ල විහාරවංසයත් පමණක් ඇතැයි කිය යුතු ය. මෙය (—අත්වනගලුවස) කුඩා බැවින් පමණක් නො වැ බොහෝ තන්හි සංස්කෘතකවීන්ගේ සන්දර්භයන් පාලියට පෙරළූ එක් වැනි වැ වැටැහෙන බැවින් ද පාලිසාහිත්‍යය චම්පූකාව්‍ය පක්ෂයෙන් වැඩියක් ම දුර්වල ය යි සැලැකිය යුතු ය. මෙහෙයින් කාව්‍යාංග සම්පූර්ණ වූද නාතිසංක්ෂිප්ත නාතිවිස්තර වූ ද සමප්‍රමාණ වූ පාලිචම්පූ කාව්‍යයක් දැන් වුවමනාම ය. එය මේ කෘතියෙන් පිරිමැසිණි.

මෙය කාව්‍යලක්ෂණයන්ගෙන් අනූන ය. රසභාවයන්ගෙන් නිරන්තර ය. ධර්මකථෝද්භූත වූ මහාවීර චරිතශ්‍රීයක් ශරීර කොට ඇති බැවින් සද්‍ගුය වශයෙනුදු පරම කෝටිප්‍රාප්ත ය. කාව්‍යත්වයෙන්

---

1 ශ්‍රී විමලබුද්ධි ප්‍රශස්ති; (විදුරුපොළ ධම්මපාල) මුද්‍රණය; 'දීපානි' ගංගොඩවිල, ක්‍රි; ව; 1973

මෙන් ම ජිනවචනානුරූප වූ පාලිභාෂා විලාසයෙදුනු ප්‍රශංසාර්හ ය. එබැවින් පාලිසාහිත්‍යවිෂයක පටුත්වය පසස්නා ශිෂ්‍යයනට ඉතා ප්‍රයෝජනවත් ය. ප්‍රාචීන භාෂොපකාර සමිතිය මගින් හා උසස් පිරිවෙන් මඟිනුත් වර්ෂයක් පාසා කැරෙන පාලිසාහිත්‍යය පිළිබඳ පාඨ පරීක්ෂණයන්හි ගද්‍යාංශ පද්‍යාංශ ද්වයටම සරිලන අගනා ග්‍රන්ථයෙකි. නොයෙක් අර්ථයන්හි යෙදෙන නොයෙක් දහස්ගණන් විසිතුරු නාමයන් හා අනෙකශත ධාතුන්ගෙන් නොයෙක් ලෙසින් නිපන් ක්‍රියාපද රාශියක් ද ඇතුළත් වන පරිදි මෙය ගැළැපීම පාලිභාෂාඥන පරිචය පසස්නවුන්ගේ භාග්‍යයෙකි. සාමාන්‍යයෙන් කථාශරීරය ධර්ම ශාස්ත්‍රාත්මක වුව ද මෙහි තැනින් තැන ප්‍රාසංගික වශයෙන් යෙදුණු ශාස්ත්‍රාන්තර සමයාන්තර ප්‍රතිබද්ධ වූ ද තත්කාලීන ලෝකචාර්තාදි ප්‍රතිබද්ධ වූද වචනජාතයෙන් කර්තෲන් වහන්සේගේ අනෙකවිෂය ප්‍රවෘත්ත වූ ගම්භීර ධීරබුද්ධිය හා ස්මෘති ප්‍රතිභා මහිමය ද පහළ වේ.

මෙයට සිංහලභාෂායෙන් විප්පනියකුදු මේ නායක ස්ථවිරයන් වහන්සේ අතින් ම ලියැවුණි නම් මැනැවි. මේ පොත හඳුන්වා ලියූ සංඥපනය ද වුවමනා කරුණු හැම සැකෙවින් ඇතුළත් වන පරිදි ස්වභාෂායෙන් ම ගැළැපූ සැටි කාලානුකූල ය. සංඥපනය නම් ග්‍රන්ථ තත්ත්වය නොදන්නවුන්හට එය හඟවා ලන වැකියෙකි. එය සාමාන්‍ය ජනයාට නො හැඟෙන පරිදි ජනසමාජයෙහි අව්‍යවහාර වූ භාෂායෙකින් දුෂ්කර බන්ධනාත්මක වූ පද්‍යයෙන් හෝ සමාස භූයිෂ්ඨ වූ අනුප්‍රාස බහුල වූ දුරවබෝධපදධික වූ අනවශ්‍ය වර්ණනයන්ගෙන් පල්ලවිත වූ ගද්‍යයෙන් හෝ ගැළැපීම ග්‍රන්ථයාගේ කෙසේ වෙතත් සම්පාදකයාගේ තත්ත්වය හඟවා ලන්නට නම් පමණ වේ. මේ නිෂ්ඵල ප්‍රයාසය බටහිරිදික්රටවල ද සියම් බුරුම චීන ජපන් ටිබැට් ආදි පෙරදික්රටවල ද අසම්භාවිත ය. මේ පොතෙහි මුද්‍රණය ද මැනැවැ යි කිය යුතු ය. පිටුව කට ත් අඩු තරම් වූ ශුද්ධිපත්‍රයක් යෙදීම ද අනුද්වේගකර ය. එපමණෙකු දු නො වී නම් වඩා ත් ප්‍රසාද කර ය. මේ ප්‍රශස්ත ග්‍රන්ථයාගේ නිෂ්පාදක වූ නායක ස්ථවිරයන් වහන්සේට අපගේ සාදර ස්තුතිය පිරිනමම්හ.'

"සිළුමිණ",
1935 මාර්තු 17 වැනි ඉරිද

## ව්‍යාකරණසද්දසින්ධු[1]

ප්‍රථම භාගය

පාළි භාෂාවට සිංහලයෙන් ලියැවුණු කිසි ම ශබ්දකෝෂයක් නොතිබුණු අවධියකි, ඒ. එහෙත්, ඒ අඩුව මුළුමනින් පිරිමැසීමට නොව පාළියෙහි ව්‍යාකරණ, ඡන්දස්, අලංකාර, න්‍යාය, නිරුක්ති යන ශාස්ත්‍රාන්තරයන්

1 ප්‍රකාශනය; වෛද්‍ය, ඩී. ජේ. ගුණසේකර මහතා
මුද්‍රණය; මහාබෝධි යන්ත්‍රාලය
ප්‍රමාණය; ඩිමයි පිටු 156
ප්‍රකාශිත වර්ෂය; ක්‍රි; ව; 1929

සම්බන්ධ පාරිභාෂික ශබ්දවලට ඇවුරුණු ශබ්දකෝෂයක් සැපයීමේ අර මුණින් පිළියෙළ කරන ලද්දකි ව්‍යාකරණසද්දසින්ධුව. වෙනත් ශබ්ද කෝෂ හා සසඳන විට මෙහි සන්දර්භය විශේෂ අමුත්තක් දරන්නකි. ප්‍රස්තුත ශබ්ද හැකිතාක් විග්‍රහ කිරීමත්, ඒ ඒ ශබ්දවල ව්‍යුත්පත්ති ලක්ෂණ දක්වීමත්, අවශ්‍ය ශබ්ද සඳහා දීර්ඝ ලෙස පරිකථා දක්වීමත් මෙහි විශේෂ ලක්ෂණ අතර කීපයකි. ඇතැම් අවස්ථාවල මතවාද විවේචනයත්, ඒවාහි සාවද්‍ය නිරවද්‍යභාවයත්, නිරාකරණයත් මෙම ශබ්දකෝෂයෙහි අන්තර් ගතය පිළිබඳ ස්වභාවය යි. මේ හේතු නිසා බොහෝ ශබ්දකෝෂවල භාවිත මග මේ ශබ්දකෝෂයෙන් පරිබාහිර යි. මෙය තරමකට හෝ පැහෙන්නේ සංස්කෘතයෙහි ප්‍රකට ශබ්දකල්පද්‍රැම වැනි මහා ශබ්ද කෝෂවල භාවිත සම්ප්‍රදයයට ය.

පාළි භාෂාව ගැන විමංසන දැනුමක් අපේක්ෂා කළ බොහෝ දෙනාටත්, අන්තර්ගත ශාස්ත්‍රාන්තරයන්හි පුළුල් දැනුමක් ලබනු කැමති පාඨකයන්ටත් මෙම කෘතිය ලොකුම අත් උදව්ව විය. මේ නිසා මේ ග්‍රන්ථය ප්‍රගල්භ බුද්ධි මතුන්ගේ මෙන් ම සාමාන්‍ය පාඨක ජනතාවගේ ද ඉමහත් සැලකිල්ලට ලක්වූවක් විය. මෙම ප්‍රථම භාගයට අයත් ශබ්ද සංඛ්‍යාව 535 ක් පමණ වූ අතර 'අ' පටන් 'ඔ' දක්වා ඒවා පරිකථා කොට ස්වරාදි කාණ්ඩය හැටියට ප්‍රථම භාගය නිකුත් කරන ලදී.

මේ ග්‍රන්ථය ලියන අවධියේ ම ඒ ගැන අසා ප්‍රසාදයට පත් ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා මුද්‍රණ බරපැන වශයෙන් රුපියල් දහසින් බැඳි පියල්ලක් පිදීමට සතුට පළ කළ බව එහි සංඥපනයෙහි කතුවරයන් වහන්සේ ම සඳහන් කරති. මේ පරිත්‍යාගය පුවත්පත්වලින් පවා අගය කරමින් වාර්තා කළ පුවත් කීපයක් ම වෙයි. පොත ගැන මෙන් ම එම පරිත්‍යාගය ගැන ද අගය කරමින් පළ වූ වාර්තා දෙකෙකි මේ :

## පාළි ව්‍යාකරණ ශබ්දකෝෂයක්

පූජ්‍ය පණ්ඩිත විදුරුපොල පියතිස්ස මා හිමියන්
වහන්සේගේ ප්‍රශස්ත ව්‍යාපාරයක්

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ අගනා පරිත්‍යාගයක්

"පූජ්‍ය පණ්ඩිත විදුරුපොල පියතිස්ස මහානායක මාහිමියන් වහන්සේ විසින් පාළි භාෂාවේ ව්‍යාකරණ න්‍යාය නිරුක්ති ඡන්දෝ ලංකාර ග්‍රන්ථයන්හි පැණෙන ඉතා වැදගත් වචන දෙදහසක් පමණ සිංහල භාෂාවෙන් විස්තර කරමින් ලියන ලද "ව්‍යාකරණ සද්දසින්ධු" නම් වූ පාළි අකාරාදි කෝෂග්‍රන්ථය මුද්‍රණය කරවා ගැනීම පිණිස ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා විසින් රු. 1000 ක් පරිත්‍යාග කරන්නට

සතුටු බව ප්‍රකාශ කොට පළමුවරට ඒ මුදලෙන් කොටසක් ග්‍රන්ථ කර්තෘ වූ පණ්ඩිත මාහිමියන් වහන්සේ වෙත එවා තිබේ. ප්‍රශස්ත පාළි ග්‍රන්ථ කර්තෘවරයෙක් වූ විදුරුපොළ මාහිමියන් වහන්සේට ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා විසින් කරන්ට යෙදුනු මේ පැසසිය යුතු පරිත්‍යාගය පාළිභාෂාභිවෘද්ධිය සඳහා උන්වහන්සේ අදහස් කර තිබෙන ශාස්ත්‍රීය කටයුතු රාශියක්ම සඵල වීමට හේතු වෙනවා ඇත. පණ්ඩිත විදුරුපොල මාහිමියන්ගේ මේ අභිනව ව්‍යාකරණ කෝෂග්‍රන්ථය මීට පෙර ලංකාවේ නිෂ්පාදනය නොකරණ ලද අභිනව ක්‍රමයේ අකාරාදි ග්‍රන්ථයක් බැවින් මෙය පාළි භාෂාව උගන්නා ආධුනිකයන්ට පමණක් නොව උසස් පංක්තියේ උගතුන්ටද ප්‍රයෝජනවත් කෘතියක් විය හැකි බව දැන ගන්ට තිබේ. මේ උසස් ග්‍රන්ථය මුද්‍රණය කරවීම ලඟදීම ආරම්භ කරණු ලැබේ.''

''සිංහල බෞද්ධයා''
1929 නොවැම්බර් 19 වැනි සෙනසුරාද

''පාළි භාෂාවට අයත් ව්‍යාකරණ ඡන්දස් අලංකාර න්‍යාය නිරුක්ති යන මේ ශාස්ත්‍රයන් පිළිබඳ පාරිභාෂික ශබ්ද එක්කොට ඒ සම්බන්ධව ස්වභාෂාවෙන් ලියන ලද පරිකථාවන්ගෙන් යුත් මේ කෝෂ ග්‍රන්ථය උඩරට අමරපුර නිකායේ මහා නායක ධුරන්ධර පණ්ඩිත විදුරුපොළ පියතිස්සා'භිධාන මහා ස්ථවිර පාදයන් වහන්සේ විසින් සංග්‍රහ කරන ලද්දකි. මේ ග්‍රන්ථයට අයත් ස්වරාදි කාණ්ඩය (ප්‍රථම භාගය) අනගාරික ධර්මපාලතුමාගේ ධනව්‍යයෙන් මුද්‍රණය කොට දැන් ප්‍රකාශයට පමුණුවා තිබේ. ග්‍රන්ථ කර්තෘන් වහන්සේගේ හා අනගාරික ධර්මපාලතුමාගේත් ඡායාරූප ඇතුළත් කොට පැහැදිලි අකුරින් ඔප කඩදාසියේ කරන ලද මුද්‍රණය ද වර්ණනා කටයුතුය. පාරිභාෂික ශබ්ද එහි අක්ෂර පිළිවෙළින් යොද ඒ පිළිබඳ පරිකථාවන්ද ඇතුළත් කොට විස්තර කර තිබෙන අයුරු සාතිශය ප්‍රශංසනීයයි. පාළි භාෂාව ඉගෙන ගන්නා පාරිවේණික ශිෂ්‍යයන්ට මේ ග්‍රන්ථය බෙහෙවින් ප්‍රයෝජනවත් බැව් කිය යුතු නොවේ. මේ මාහැඟි ග්‍රන්ථයෙන් පිටපතක් අප වෙත එවීම ගැන ග්‍රන්ථ කර්තෘන් වහන්සේට අපේ නොමසුරු ස්තුතිය හිමි විය යුතුයි.''

''සිරිකත''
1929 ඔක්තෝබර 12 වැනි සෙනසුරාද

ව්‍යාකරණ සද්දසින්ධුවෙහි අගයත්, එයින් ඉටුවන ශාස්ත්‍රීය මෙහෙවරත් පිළිබඳ ව පොත නිකුත්වනවාත් සමග ම ගලා ආ තුති පැසසුම් රාශියක් ම විය. පුවත්පත්වලින් ද මෙහි ඇති වටිනාකම පැහැදිලි කරන ලද අවස්ථා කීපයකි. විවේචන වශයෙන් ද පළ වූ ලිපි කීපයකි. මේ ඒවා අතර තවද එක විවේචනයකි :

## ව්‍යාකරණ සද්දසින්ධු

''පරිශ්‍රම සාඵල්‍යය නම් මෙසේ යයි ක්ෂණයකින් ප්‍රත්‍යක්ෂ කරවන ඉතාම අළුත් ක්‍රමයේ ග්‍රන්ථයක් අපවෙත ලැබී තිබේ. මෙය නම් පූජ්‍ය පණ්ඩිත විදුරුපොල පියතිස්සාභිධාන උඩරට අමරපුර නිකායේ මහානායක මාහිමියන් වහන්සේ විසින් අපවෙත සතුටු පඬුරු කර එවන ලද උන්වහන්සේගේ ව්‍යාකරණ සද්දසින්ධු නමැති අභිනව ග්‍රන්ථයේ ප්‍රථම භාගයයි. ව්‍යාකරණ සද්දසින්ධු යන නම ඇසීමෙන් සමහරවිට මෙය නානාවිධ ව්‍යාකරණ රීති විස්තරයකින්ම වෙලීගත් වියලි ග්‍රන්ථයකැයි සිතෙනු නිසැකය. නුමුත් මෙය ව්‍යාකරණ ග්‍රන්ථයක් නොවේ. පාරිභාෂික ශබ්ද කෝෂය යනු මේ ග්‍රන්ථයේ මුඛ්‍ය නාමයයි. එයින් මෙය අකාරාදියකැයි වැටහෙනු විය හැක. එහෙත් මෙය භාෂාවක් පිළිබඳ අකාරාදි කෝෂ ග්‍රන්ථයකුත් නොවේ. එසේ නම් මෙය කුමක්ද? ග්‍රන්ථකර්තෘ මාහිමියන් වහන්සේගේ වචනවලින් එය වඩා හොඳින් පැහැදිලි වන්නේය. ''මේ පාරිභාෂික ශබ්ද කෝෂ ග්‍රන්ථය ව්‍යාකරණ සද්දසින්ධු යන නාමයෙන් හඳුන්වනු ලැබේ. මෙය පාලිභාෂාව සම්බන්ධ අකාරාදි කෝෂ ග්‍රන්ථයෙක් නොවේ. මේ වනාහි පාලි භාෂාවට අයත් ව්‍යාකරණ, ඡන්දස්, අලංකාර න්‍යාය, නිරුක්ති යන ශාස්ත්‍රාන්තරයන්හි ව්‍යවහාරප්‍රාප්තව තිබෙන පාරිභාෂික ශබ්දයන් පමණක් හැකිතාක් එකතැන් කොට ඒ ශබ්දයන් සම්බන්ධව ස්වභාෂාවෙන් ලියනලද පරිකථාවන්ගෙන් යුත් අකාරාදි කෝෂග්‍රන්ථයෙකි. කච්චායන මොග්ගල්ලායනාදි පාලි ව්‍යාකරණ ග්‍රන්ථයන්හි පැණෙන පාරිභාෂික ශබ්දයන් හා ධාතුන්ද මෙහි වැඩි වශයෙන් ඇතුළත්ව තිබෙන බැවින් ඒ ව්‍යාකරණ ශබ්ද භයසන්වය මෙනෙහි කොට මෙයට ව්‍යාකරණසද්දසින්ධු යන නම තබන ලදි.'' පාරිභාෂික ශබ්දකෝෂය කුමක්ද යනු මෙයින් පැහැදිලි විය යුත්තේය. එහෙයින් මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් ලිවීම අනවශ්‍යය. එසේදවුව රටවැන්නක් කියනු කැමැත්තෙමු. පාරිභාෂික ශබ්දකෝෂය වැනි ග්‍රන්ථයක් කිසිකලෙකත් වූ බවක් නොඅසනු ලැබේ. ශබ්දකෝෂ කීපයක් අපට ඇත්තාහ. ළඟ අනාගතයේදී මහා ශබ්දකෝෂයක් ද ලැබෙන්නේය. එසේදවුව මේ ග්‍රන්ථයට ලැබිය යුත්තේ කිසිවකටත් දෙවෙනි නොවන ශ්‍රෙෂ්ඨ ස්ථානයකි. මෙය මෙතෙක්කල් නොපැවති අමුතුම නිපදවීමක් හෙයිනි. ව්‍යාකරණ, අලංකාර හා ඡන්දස් පොත් ටික ලංකර ගැනීමෙන් පාරිභාෂික ශබ්ද ටික රැස්කර ගැනීම නම් එතරම් දුෂ්කර නොවේ. එසේම ඔවුනොවුන් දක්වා තිබෙන පරිදි විස්තරය සඳහන් කිරීමද අරුමයක් නොවේ. එහෙත් එය නියම පාණ්ඩිත්‍යයයි කිව නොහැක. නියම පාණ්ඩිත්‍යය නම් පාරිභාෂික ශබ්දයන් පිළිබඳ ඔවුනොවුන් දක්වා තිබෙන මතවලම එල්බ නොගෙන නිදහස් කල්පනාවෙන් වඩා හරි ක්‍රමය තීරණය කර දැක්වීමය.

විදුරුපොල මාහිමියන් වහන්සේගේ ග්‍රන්ථය මීට නිදසුනකි. අධි කිස්සර වචන, අද්ධයොග, ආරප්පයොග ආදී ඇතැම් වචනවලට ලියා තිබෙන පරිකථාවලින් මෙය වඩාත් පැහැදිලි වන්නේය. කොටින්ම කියතොත් මෙය පාළි භාෂාවේ ව්‍යාකරණ, න්‍යාය, නිරුක්ති, ඡන්දෙ ලංකාර ආදිය හදරන්නන්ට අතිශයින් ප්‍රයෝජනවත් ග්‍රන්ථයෙකි. පිටු 138 කින් පමණ යුක්තවූ මේ ප්‍රථම කාණ්ඩය ස්වර අවසානය දක්වා ඇති පාරිභාෂික වචනයන්ගෙන් යුක්තය. සම්පූර්ණ ග්‍රන්ථය මෙවැනි කාණ්ඩ තුනකින් යුක්තවේ යයි සලකනු ලැබේ. අනගාරික ධර්මපාල මහතාගේ වියදමෙන් මෙය කඩිමට මුද්‍රණය කරවා තිබේ. වටිනාකම රු. 1.50 කි. නායක මාහිමියන්වහන්සේගේ පරිශ්‍රමය ශාස්ත්‍රරසිකයන්ගේ කෘතඥතාවට හිමිවනු නිසැකය. අප වෙත පිට පතක් තෑගි කිරීම ගැන අපේ ස්තුතිය ද මෙයින් ම පිරිනමමු.''

''ස්වදේශමිත්‍රයා''

1929 දෙසැම්බර 8 වැනි ඉරිද

## ව්‍යාකරණ සද්දසින්ධු[1]

ද්විතීය භාගය

ව්‍යාකරණ සද්ද සින්ධුවෙහි ප්‍රථම භාගය නිකුත් වූ දෙ වසරකට පසු එහි ද්විතීය භාගය මුද්‍රණයෙන් එළිදක්වීමට කතුවරයන් වහන්සේට ශක්තිය ලැබිණ. එම ශක්තිය ලැබීමේ හේතුව පැහැදිලි කරමින් මහ නා හිමියෝ මෙසේ කියති :

> ''ප්‍රථම භාගය නිකුත් කළ නොබෝ දවසකින් ම මේ කෘතිය බොහෝ උගතුන් විසිනුත් ආධුනිකයන් විසිනුත්, එක සේම ආදර සැලකිලි සහිතව පිළිගැනීමෙන් මෙය ප්‍රයෝජනවත් බව ප්‍රත්‍යක්ෂ වීම මගේ සිත උනන්දු වීමට කරුණක් වූයෙන්......''

ලාංකික ප්‍රවීණ අප්‍රවීණ උගතුන් විසින් සම්භාවනා පෙරටුව පිළිගත් මේ කෘතියේ ද්විතීය භාගය සඳහා ධනය වැය කොට ඇත්තේ මුදලිඳු ඩී. වනසුන්දර මැතිතුමා විසිනි.

මෙහි පරිකථා සැපයුණු ශබ්ද සංඛ්‍යාව 1303 කි. ඒ සියල්ල 'ක' වර්ගයේ පටන් 'ත' වර්ගය දක්වා ප්‍රස්තුත විෂයයනට අයත් පාරිභාෂික ශබ්දයෝ ය. ප්‍රථම භාගයෙහි භාවිත සම්ප්‍රදයයට වඩා මෙහි ඇති වෙනසක් නම් අවශ්‍ය ඇතැම් පාරිභාෂිකයන් සඳහා දීර්ඝ පරිකථා සපයා තිබීම යි.

---

1 ප්‍රකාශනය; ආයුර්වේද වෛද්‍ය ඩී. ජේ. ගුණසේකර මහතා
මුද්‍රණය; මහාබෝධි යන්ත්‍රාලය
ප්‍රමාණය; ඩිමයි පිටු 246
ප්‍රකාශිත වර්ෂය; ක්‍රි; ව; 1931

'කත්තු' යන්නට ලියූ පරිකථාව එබන්දකි. (පිටු. 05 — 09) පළමු භාගය සේම මෙම ද්විතීය භාගයත් වියත් ගෞරවය දිනා ගත්තකි. ඒ පිළිබඳ ලද අගැයීම් හා විවේචන රාශියක් පුවත්පත් සහරාදියෙහි පළ විය. පණ්ඩිත ඉඳුරුවේ උත්තරානන්ද නා හිමි කළ ප්‍රශස්ත අගැයීමකි මේ :

## ආනන්ද ගීති*

ජානතා ධිතිමන්තානං ධිතිසාරං යථාවතො,
සධම්මවිනයෙ බුද්ධි සිද්ධිසම්භූතතාඵලං.

සාමින්දේන ගුණට්ඨෙන පෙසිතො ධීමතා මුදා,
ගන්ථො විසිට්ඨෙ ව්‍යාකරණ සද්දසින්ධුත්ති විස්සුතො.

යතො'ත්‍ර පීති පාමොජ්ජ රසං රසවතො තතො,
ඔනොජෙසි'ධුනා භන්තෙ මම මුද්ධනිනෙකධා.

ආනන්දගීති නාමෙසා රචිතා තෙ පදම්බුජං,
නිධාය සිරසීදනි ගුණීසු ගුණජානතා.

මහාසාමිධූරීණස්ස සදන්වය විභාවතො,
විද්ධස්ත පරවම්භස්ස අග්ගිමස්ස කවිත්තනෙ.

විකත්ථනපලොකස්ස දයාපාරස්ස ධීමතො,
සත්ථන්තරෙසු පටුනො සාසනොදයකාරිනො.

ගන්ථොයමනධීතානමධීතානම්පි සබ්බථා,
අද්ධා පයෝජනඤ්චාපි භවතෙ සහිතොදයං.

සද්ද සත්ථ විදූ සන්ති බහවො'ත්‍ර තහිං තහිං,
සද්ද මත්තං විජානන්ති නපි තෙ'ත්ථාවබොධකා.

යග්ඝෙතෙ ධනිමත්තං ච පවිදන්තෙ කථඤ්චන,
සද්දත්ථං න විජානන්ති හීළෙන්ති කවිකප්පිතං.

අනත්තාධීනකා සබ්බෙ පරාධීනත්තනංගතා,
යෙසං කෙසඤ්චි විඤ්ඤූනං පිහෙන්ති හිතභාසනං.

පරත්ථාය කතො ගන්ථො සදත්ථාය විභූසතු,
සම්මොහතං සමාපන්න ජනමභ්‍යනුසාසතු.

සිවනාග සමුද්දක්ඛිභායනෙ සොගතෙ දලෙ,
ජුණ්හෙ මාගසිරෙ බාණ තිථීයා තිථීමොදනා.

උත්තරානන්ද නාමෙන යතිනා තෙ සගාරවා,
පණාමපුබ්බකානන්ද ගීතිකාපාංකිතා මයා.

ඉඳුරුවෙ උත්තරානන්ද

* ශ්‍රී පියතිස්ස සාහිත්‍ය අංකය, පිට; 107

## ව්‍යාකරණ සද්දසින්ධු [1]

### තෘතීය භාගය

පණ්ඩිත විදුරුපොළ පියතිස්ස මහා නායක ස්වාමීන්ද්‍රයන් සැපයූ ශබ්ද කෝෂයේ අවසාන භාගය මෙය යි. ද්විතීය භාගය පළ වී අවුරුදු අටකට පසුව මෙය පළ විය. පළ කිරීමට එතරම් කලක් ගත වී ඇත්තේ මුද්‍රණ වියදමේ දුෂ්කරතාව නිසා බව පැවසේ. 'ප' වර්ගයේ පටන් ඉතිරි අක්ෂර වලට අයත් ශබ්ද මෙහි සංගෘහිත ය. මේ ශබ්දකෝෂය නිමාවට පත් වූයේ කතුවරයන් වහන්සේගේ හැට වන ජන්ම සංවත්සරයත් සමඟ ය. මේ කාණ්ඩ තුන පිළියෙළ කිරීමේ දී කතුවරයන් වහන්සේ ග්‍රන්ථ 116 ක් අධ්‍යයනය කළ බව විඥපනයෙහි පවසති. එය ම මෙහි අගය වටහා ගැනීමට ප්‍රමාණවත් ය. එම ග්‍රන්ථමාලාවේ නාම ලේඛනය ද මෙයට ඇතුළත් වැ ඇත. පාළි භාෂාව සඳහා එතෙක් තිබුණු අඩුවක් සාර්ථක වැ සපුරාලීමෙන් මහ නා හිමිපාණන් කළ සේවාව මහනීය බව වියත් පඬි වරුන්ගේ අවංක නිගමනය විය. කතුවරයන් වහන්සේ මේ නිමාව තුළින් අසීමිත වින්දනයක් ලද බව ද පැවසේ. මෙහි පරිකථා සැපයූ පාරිභාෂික පදමාලාව එක්දහස් එකසිය හැත්තෑ ගණනකි. ලාංකික විසාරද පඬිවරුන් මේ ග්‍රන්ථය ගැන කළ අගැයීම් සාරගර්භය. තුති පැසසුම් කතුවරයන් වහන්සේ තව තවත් දිරිගන්වන සුලු විය. පුවත්පත් සඟරා විවේචන ද රාශියකි. මේ ග්‍රන්ථය පිළිබඳව වැල්ලවත්තේ සද්ධර්මෝදය පිරුවන්පති සද්ධම්මවංස හිමියන් කළ අගැයීමක් මෙසේ ය :

"වියරණ සද සිඳු" පිළිබැඳි

**මා හැඟුම්**

බුදු සසුන මා විල් මැද නැඟි ඇත් කමල් ලෙව්
ගන නැණ ගුණ පබන්දෙන් මුළු ලක් තලය හෙබවූ

කිවිමන් දනන් එඩි මැඩ නිතැතින් මැ මෙ දිවෙ
අග පඬි පදවි දරනා ගුණ දම් නො හැර සෙරෙනා

උඩරට අමරපුර මහ සඟ මුළට මාහිමි
විදුරුපොළ සමිඳුන්ගේ නමදිමි සිරි සරණ යුග

හෙළු මගද සකු බස ඈ නෙක වදන් මගෙහී
නොපැකිල පැවැති මාහිමි නැණ පබඳින් අතුල්වූ

පෙර වියරණැජරන් නො දුටු තැනුදු පැකිලි තැන්
දැක නො පැකිල පහද සදරුත් මහඟු රුවනින්

1 ප්‍රකාශනය; ආයුර්වෙද වෛද්‍යාචාර්ය ඩී. ජේ. ගුණසේකර මහතා
මුද්‍රණය; මහාබෝධි යන්ත්‍රාලය
ප්‍රමාණය; ඩිමයි පිටු; 300
ප්‍රකාශිත වර්ෂය; ක්‍රි; ව; 1939

සපුරා පිඩුකළ වියරණ සඳනිඳු නම්
මහගත නො වේ සඳසිඳු සුවන් නැවෙකැයි යෙම් මම්

සඳරුත් පියුම් සැදි අමා විලෙක මේ ගත්
නැතහොත් සඳත් පහයට නැගෙන රන්හිණි මේ වේ

රිසි රිසි'රුත් වෙසෙස් මහරු රුවන් වගුරුවන
සිතුමිණි මේ බදුරු කළ මෙයි කප්තුරුදු මේ මැයි

පෙර කල සිට පැවැති පෙළ බස අනෙක උනු තැන්
සපුරා ලූ මහිමිසඳ පුදත් දෙසැ දෙසැ පඩුවෝ

ගුණමකු බව යන මරු ඇවුළුමක් මෙ දිවේ
නැතොත් වියරණ දිය දද හිමි සුරතට මැ පැලඹේ

අප වැනියන් කෙරේ පොවා පැවැති සුමිහිරි
මහිමි කුළුණු අමාවට නමකර හැර කුම් කෙරෙමි?

දිව රෑ දෙකැ නිතොර අනත'පිරිසේ දුරු වැර
ලො සසුන් වැඩෙහි රඳනා හිමිසඳ රකිත් දෙවියෝ

නොම ලැබ සිහිනෙනුදු කිසි කාසිත් පෙළ බිඳක්
සැරදේවා! මහිමි සඳ හිතයට ලොවට සසුනට

සිරි දහමුදය නම් පිරිවෙන රඳන රසදත්
හිමි නැණ ගුණ අමාවේ සදම්වස් යති මේ කියා.

5.12.39 වැල්ලවත්ත

## පාළි ව්‍යාකරණ කෝෂය

### ව්‍යාකරණ සද්දසින්ධු

කර්තෘ : පණ්ඩිත විදුරුපොල පියතිස්ස මහානායක ස්ථවිරයන් වහන්සේ. පිටු 615 යි. (කාංඩ තුන) මිල රු. 6.00 යි.

''මේ වනාහි පාලිභාෂෝන්නතියට ඉවහල් වන සේ සැපයුණු මා හැඟි ග්‍රන්ථයකි. මෙහි පාලි භාෂාවට අයත් ව්‍යාකරණාදි කොටස් පසක පාරිභාෂික ශබ්ද 3014 කට පරිකථා ලියැවී තිබේ.

ශාස්ත්‍රාන්තරයන්හි ව්‍යවහාරප්‍රාප්ත පාරිභාෂික ශබ්ද සංකලනය කොට ඒවා අකාරාදි පිළිවෙළින් යොදා විග්‍රහ කළහැකි හැම ශබ්දයක්ම විග්‍රහ කිරීමෙන් ද ධාතු ප්‍රත්‍යයාදිය දැක්වීමෙන් ද පොත යහපත්සේ සම්පාදනය කර තිබෙන බව පෙනේ. පාලි භාෂාව පිළිබඳව ස්වභාෂාවෙන් ලියැවුණු පරිකථා ග්‍රන්ථයක් මේ හැර වෙන ඇතැයි නොසිතමු. එහෙයින් මේ ග්‍රන්ථය පාලි භාෂාව සම්බන්ධයෙන් මැතදී කෙරුණු ඉතා උසස් කෘතියක් මෙන් සැලකිය හැකිය.

විග්‍රහ අර්ථ විවරණ සහිත විස්තර පරිකථා ලිවීමට උපයෝගී වූ මෙහි ඇතුළුව තිබෙන වචන 3014 උපුටාගෙන තිබෙන්නේ ග්‍රන්ථ 116 කිනි. භාෂාත්‍රයට අයත් ව්‍යාකරණ ග්‍රන්ථ පෙළ හා අටුවා සන්න ගැටපද පොත් රාශියක් නිතර බලමින් ස්වෝත්සාහයෙන්ම මේ ග්‍රන්ථය නායක මාහිමියන් කර තිබෙන්නේ ශාස්ත්‍රාන්තරානුග්‍රහ බුද්ධියෙන් ම යයි කිව යුතුය.

පාලි භාෂාවට අයත් ව්‍යාකරණ, ඡන්දස්, අලංකාර, න්‍යාය හා නිරුක්ති පිළිබඳ බොහෝ පාරිභාෂික ශබ්දයන්ගේ පරිකථා එක් පොතකින් බලාගත හැකි වන සේ සංග්‍රහ කොට තිබේ. මේ ප්‍රයෝජනය කොතරම්දැයි කිව නොහේ. නිර්වචන දැක්වීමෙන් හා පදර්ථ විවේචනාත්මක අර්ථකථනයෙනුත් නායක මාහිමියන් නිර්දිෂ්ට හැම ශබ්දයක්ම ඉතා හොඳ අර්ථවිනිශ්චයකට ලක් කර තිබීම ශාස්ත්‍රවිවේකීන්ට ලොකු පහසුවක් වනු නිසැකය. ග්‍රන්ථාන්තරයන් බැලීමෙන් වන කාලක්ෂේපය හා වෙහෙස ද බැහැර යාමට මෙවැනි පරිකථා ග්‍රන්ථ උපකාර වන බව කිවයුතු නොවේ. උගතුන්වුන්ට හා උගත්තවුන්ටත් එකසේ ප්‍රයෝජනවත් වූ මේ පොතේ තෘතීය භාගය නොබෝ ද මුද්‍රණයට පැමිණවීමෙන් පොත සම්පූර්ණවී තිබේ.

"දිනමිණ"
1940 ජනවාරි 29 වැනි ද

රාජකීය පණ්ඩිත විදුරුපොළ පියතිස්සා'භිධාන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මෙම සාරගර්භ වැයම නිසා පාළි භාෂාවෙහි ව්‍යාකරණ, ඡන්දස්, අලංකාර, න්‍යාය, නිරුක්ති ආදී විෂය කීපයකට ඇතුළත් වචන සමුදය එක් ග්‍රන්ථයක් තුළ එකට එක්තැන් විණ. ඒ නිසා පාළිය පිළිබඳ ව සිංහලෙන් ශබ්දකෝෂයක් නැතිකමේ පාඩුව එම විෂයයන් පිළිබඳ මේ කෘතියෙන් නිමාවට පත්විය. මෙහි සවිස්තර පරිකථා නිසා ප්‍රවීණ අප්‍රවීණ පාඨකයන්ට සැලසුණේ මහදර්ථයකි.

## ENGLISH – PALI DICTIONARY

## ආඞ්ගලීපාළිසද්දකොසො[1]

රාජකීය පණ්ඩිත විදුරුපොළ පියතිස්ස මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පෙර'පර දෙදිග ම භාෂාඥනයට සාධක වන්නකි, උන් වහන්සේ අතින් සැපයුණු ඉංග්‍රීසි පාළි මහාශබ්දකෝෂය. පෙරදිග හා අපරදිග වියතුන්ගේ අවධානය පාළි ඉංග්‍රීසි ශබ්දකෝෂ සම්පාදනයෙහි ලා

---

1 English Pali Dictionary
ආඞ්ගලීපාළිසද්දකොසො
ප්‍රකාශනය හා මුද්‍රණය: සීමාසහිත අපොතිකරිස් සමාගම, කොළඹ.
ප්‍රමාණය; ඩිමයි පිටු: 763
ප්‍රකාශිත වර්ෂය; ක්‍රි; ව; 1949

යොමු වුවත් ඉංග්‍රීසි පාළි ශබ්දකෝෂයක් ගැන කිසිවකුගේ ද අවධානය යොමු නො වී ය. ඒ නිසා මේ වැයම අති සම්භාවනීය එකක් ලෙස බොහෝ විචාරකයෝ සලකත්. මේ පිළිබඳ වැ ආචාර්ය **පී. බ්. සන්නස්ගල**[1] මහතා කරන අගැයීම මෙසේ ය :

"පෙර අපර දෙදිග පඬිවරුන් පාළි ඉංග්‍රීසි අකාරාදි එකක් දෙකක් පළකළ නමුත්, ඉංග්‍රීසි පාළි අකාරාදියක් සපයා තැබීමෙහි ඔවුහු පවා අසමර්ථ වූහ. ඒ අඩුව පුරවමින් නා හිමියන් ලියූ ඉංග්‍රීසි පාළි අකාරාදිය, නූතන යුගයේ පෙරදිග පහළ වූ මහා පාළි පඬිවරයා විදුරුපොළ නා හිමියන් බව ලොවට පෙන්වා දෙයි."

මේ ශබ්දකෝෂය වචන 1,10,000 කින් පරිමිත ය. ඒ ඉංග්‍රීසි වචන 27,000 ක් ද, පාළි වචන 83,000 ක් ද වශයෙනි. මෙම ශබ්දකෝෂය ලියා ගෙන යන ආරංචිය උඩ පාඨකයන් නොඉවසිලිමත් ව ඒ ගැන නිතර නිතර ප්‍රශ්න කරන්නට වූයෙන් කතුවර මහනාහිමියන් පුවත්පත් මගින් ඒ ගැන සැපයූ එක පිළිතුරක් මෙසේ ය :

## ඉංග්ලිෂ්-පාලි ශබ්දකෝෂය දැන් කොහොම ද?

**පූජ්‍ය පණ්ඩිත විදුරුපොළ පියතිස්ස මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.**

"ඉංග්ලිෂ්-පාලි ශබ්දකෝෂය දැන් කොහොමද ?" යනු දැන් නිතොර වාගේ අපේ ගිහි පැවිදි බොහෝ පින්වතුන් මගෙන් අසන ප්‍රශ්නයකි. මේ ශබ්දකෝෂ ග්‍රන්ථය ආරම්භ කළ දවස්වල මා විසින් ඒ ගැණ පුවත්පත් මගින් සෑහෙන ප්‍රකාශයක් කරණ ලදී. දැන් බොහෝ හවතුන්ට මගෙන් මේ ප්‍රශ්නය අසන්නට සිතෙන්නේ එහෙයින් විය හැකිය. එහෙයින්ම ඒ ගැන යම්තමකින්වත් සතුටු විය හැකි උත්තරයක් දීම සුදුසුයයි සිතමි. මට දැනට දිය හැකිව තිබෙන ඉතා ලුහුඬු උත්තරය මෙසේය:

මේ ශබ්දකෝෂ ග්‍රන්ථය ලියන්නට ඇරඹුණේ 1941 ජූනි මස මැද භාගයෙහි ය. අදට මෙහි ඉංග්ලිෂ් වචන තුදුස්දහස් පන්සියකට (14500) පාලියෙන් අර්ථ ලියවී තිබේ. මෙය පොතේ දෙකෙන් කොටසකට වැඩිය. එක ඉංග්ලිෂ් වචනයට සමහරවිට පාළි වචන විසි තිස් ගණන කිනුදු අර්ථ ලියූ තැන් තිබෙන බැවින් දැනට මෙහි පාළි වචන සංඛ්‍යාව නම් ලක්ෂයකටත් වැඩිවිය හැකිය. ධාත්වර්ථය කියයුතු තැන ඊට සුදුසු තාක් ක්‍රියාපද වරනගමින්, ශ්‍රීමුඛ පාළියට අනුවම අර්ථ කියන තැන පාළියත් ලුහුඬු කොට දක්වමින්, තවත් මෙවැනි ප්‍රයෝජනවත් අංගයන්ගෙන් සමන්විත කොට මෙය සම්පාදනය කරණු ලැබේ. මේ

1. ශ්‍රී පියතිස්ස සාහිත්‍ය අංකය; පිට; 25

සියල්ලම කැරෙන්නේ ස්වොත්සාහයෙන්මය. සියතින්මය. එහෙයින් **ඉංග්ලිෂ්-පාලි ශබ්දකෝෂය දූන් මෙහෙමය.**

එහෙත් ගඟක දිය සිඳෙන්නාක් සේ මොහොතක් පාසා ගෙවීයන ආයුෂය විසින් ශරීර දෞර්බල්‍යය ශීඝ්‍රලෙස දියුණු කරණු ලැබේ. රුධිර වේග නමැති සතුරා නිතොරම මගේ සිදුරු සොයමින් සිටියි. මා පිට පැවරී තිබෙන වගකීම් රාශිය මට කිසිවිටෙකත් කිසිලෙසකිනුත් නිදහසක් නොදෙයි.

මෙවැනි සතුරන් තුන්දෙනෙකුට මැදිවී සිටින දුර්වලයෙක් වූ මා විසින් දූන් කටයුත්තේ අප්‍රමාදයමය. ඉතා සුළුවශයෙන් වුවද ලැබෙන විවේක පහසුව මේ සඳහාම යෙදීමය. මෙවැනි වැඩක යෙදීමට තරම් හොඳම විවේක පහසුවක් ඇතිව නම් මෙවකට මේ ග්‍රන්ථය අවසන් කළ හැකිව තුබුණේය. එවැනි භාග්‍යයක් මට නැති හෙයින් **ඉංග්ලිෂ්-පාලි ශබ්දකොෂය දූන් මෙහෙමයි.**

ඉංග්ලිෂ් භාෂා ශාස්ත්‍රාන්තරයන් හොඳින් දූන උගත් බොහෝ පින්වතුන් පාළි භාෂාව ඉගෙණීමෙහි මහත් අභිලාෂයක් දක්වන මේ කාලයෙහි මගේ සුළු දැනීමෙන් දුකසේවත් ඔවුනට ලෙහෙසියක් කර දීම මගේ මෙහි පරමාධ්‍යාසයයි. ඒ විනා මෙය "ඉංගිරිසි පණ්ඩිත යෙක්" වීමට වැයම් කිරීමක් නොවේ.

අද අපේ බොහෝ විද්වතුන් විසිනුත් විද්‍යාර්ථීන් විසිනුත් නිතොරම සතුට ප්‍රකාශ කිරීමෙන් හා ඉහතකී ප්‍රශ්නය මගෙන් ඇසීමෙන්ද මේ ගැණ දක්වනු ලබන සැලකිල්ල මට මහත් උපෂ්ටම්භයෙකි. මට එයින් හැගෙන්නේ ඒ පින්වතුන් මා කෙරෙහි බලවත්වූම විශ්වාසයක් තබමින් අනුබල දෙන බවයි. මම එය අනුබලයක් වශයෙන් පමණක් නොව ශුභ ප්‍රාර්ථනයක් වශයෙන් ද පිළිගණිමි. ඉංග්ලිෂ්-පාලි ශබ්ද කෝෂයේ ඉතිරි කොටසත් මෙසේම නිමවූ බව නොබෝ කලකින් පළකිරීමට මේ උපෂ්ටම්භය මෙසේම ලැබේවායි ප්‍රාර්ථනය කෙරෙමි.

ඉංග්ලිෂ්-පාලි ශබ්දකෝෂයක් ගැණ කථා කරන මේ අවස්ථාවෙහි ලංකා විශ්ව විද්‍යාපීඨයේ පාළිය ගැණත් ස්වල්ප වශයෙන් වුවද මෙහි සටහන් කිරීම අනවසර ප්‍රාප්තයකැයි නොසිතමි. ලංකා විශ්වවිද්‍යාලය යෙන් අපගේ ප්‍රෙමාස්පදවූ මාතෘ භාෂාවටත් අපට අති විශිෂ්ටවූ දයාද යක්ව තිබෙන පාළියටත් ඉතාම උසස් ගෞරවය ලැබෙනු දැකීම මගේ බලවත් ආශාවයි. විශ්වවිද්‍යාලය පාලක සභාවේ අනපණත් සියල්ල ගැණ මට සෑහෙන තරම් අවබෝධයක් නැති බව සැබෑය. ඒ සභාවෙන් දූනට කෙරී තිබෙන වැඩ කොපමණද යන්න ගැණත් මට වැඩි තේරුමක් නැතුවා වෙන්ට පිළිවන. එසේම පාළි භාෂාව ගැණ මට තරම් ඉක් මනක් විශ්වවිද්‍යාලය පාලක සභාවට තවම නැතුවා වෙන්ටත් පිළිවන.

ඒ එසේම වුවත් ලංකා විශ්වවිද්‍යාලයයේ උන්නතිය එකසිතින්ම බලාපොරොත්තු වන්නාවූද මාතෘ භාෂාව උතුම්කොට සලකන්නාවූද පාළියෙහි රසවිඳීමේ හොඳ පළපුරුද්දක් ලබා සිටින්නාවූද වැඩිසිටියකු වශයෙන් මා විසින් කියයුතුව තිබෙන්නේ ලංකා විශ්වවිද්‍යාලයය ලෝකයෙහි අන් කිසිම විශ්වවිද්‍යාලයයකට වඩා මාහැඟි වෛශිෂ්ට්‍ය යක් ඇති සරස්වතියක් බව ලොවට පෙන්වා දෙන්නට විශ්වවිද්‍යාලය පාලක සභාව සතුටු නම් ලක්දිව පමණක් පවත්නා චිර කාලාගත ඉතිහාසයක් ඇති සිංහල භාෂා සාහිත්‍යයටත් එසේම වූ පාලි භාෂාව සහිත බෞද්ධ දර්ශනයටත් මෙම විශ්ව විද්‍යාලයයෙහි අත්‍යුත්තම ස්ථානයන් දියයුතු බවය.

එසේම අදට වඩා සිය දහස් ගුණයකින් බිහිසුණුව පැවැති කාල පරිච්ඡෙදයන්හි පවා සිංහලයත් පාළියත් බෞද්ධ දර්ශනයත් නැසී වැනසී යානොදී මහත් භක්ත්‍යාදරයකින් පාලන පරිපෝෂණය කර ගෙණ ආ ලාංකේය භික්ෂූන්වහන්සේ අද ලංකා විශ්වවිද්‍යාලයයෙහි ශිෂ්‍යයන් සේ පමුණුවා ගැණීමට වඩා ගරු සම්මාන සහිතව ආචාර්ය වරයන් බවට පත්කොට ගැණීම ඉතාම සුදුසුය යනු විශ්වවිද්‍යාලය පාලක සභාව විසින් කෘතඥභාවයෙන් යෙදී නොමසුරු සිතින් පිළිගත යුතු බවද අවසාන වශයෙන් කියනු කැමැත්තෙමි.

> " සබ්බෙ භද්‍රානි පස්සන්තු
> මාක ඤ්චි පාපමාගමා. "

"සිංහල බෞද්ධයා"
1943 මැයි 15

ඉංග්‍රීසි පාළි ශබ්දකෝෂය ගැන නොඉවසිලිමත් මෙරට පාඨක ජනතාව නැගූ ප්‍රශ්නවලට කීපවිටක්ම පුවත්පත් මගින් පිළිතුරු සැපයූ මහනාහිමියන් ඔවුන් සැම දෙනාම සනසමින් තම කෘතිය නිමහම් කොට "සිළුමිණ" පත්‍රයෙහි පළ කළ නිවේදනය මෙසේ ය :

## ඉංග්ලිෂ්-පාළි ශබ්දකොෂයක්

**විදුරුපොළ මහානායක ස්ථවිරයන් වහන්සේ විසිනි.**

මා විසින් 1941 ජූනි මස මැද භාගයේ දී උගත් විද්‍යාලයාධිපති තුමකුගේ ආරාධනයෙන් ඉංග්ලිෂ් වචන විසිපන්දහසකට පාලි භාෂා වෙන් අර්ථ ප්‍රකාශවන ශබ්දකොෂ ග්‍රන්ථයක් ලියන්නට ආරම්භ කළ බව ඒ ළඟදීම "සිළුමිණ"ට ලියා එවන ලදි.

"සිළුමිණ" කර්තෘ මහතා එම ලිපිය පාඨක ලෝකයා ඉදිරියෙහි ගරු ලෙස තැබීමෙන් කෙළේ මහත් අනුබල දීමක් බැවින් පළමු කොටම ඒ මහතාට මාගේ කෘතඥතා පූර්වක ස්තුතිය හිමිවිය යුතුය.

මගේ ලිපිය කියවූ බොහෝ ගිහි පැවිදි භවතුන් එම කෘත්‍යය මා අතට ගැණීම ගැණ ඉතා සතුටුවූ බව මට වැඩිකල් නොයවාම වැට හුණේය. ඉංග්ලිෂ් හොඳටම දන්නා ඇතම් උගත් මහත්වරු මට ශුභ ප්‍රාර්ථනාත්මක ලියුම් ද එවූහ. "ඉංග්ලිෂ්-පාලි ශබ්දකොෂය දූන් කොහොමද ?" යන ප්‍රශ්නය බොහෝ භිපාවතුන් විසින් මගෙන් අසන ලදී.

ඒ සියල්ලම දුර්වලවූ මට ප්‍රාරබ්ධ කෘත්‍යයෙහි උනන්දුවීමට උපෂ්ටම්භකවූ බැවින් පාලි භාෂාභිවෘද්ධිකාමීවූ ඒ හැම භවතුන් වෙතම සාදර ස්තුතිය පිරිනැමීමට මම කෘතඥ වෙමි.

මාගේ ශාස්තෘවූ තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේට පන්සාළිස් වසක් මුළුල්ලෙහි අසූසාරදහසක් ධර්මස්කන්ධයන් දේශනා කිරීමෙන් කරුණා කෘත්‍යය සිදුකිරීමෙහි අත්‍යන්තෝපකාරිණීවූද නිඛිල දෙශ භාෂාවන්ගේ මූල භාෂාව යයි අර්ථකථාචාර්‍ය්‍යයන් වහන්සේලා විසින් පසස්නා ලද්දවූද අලෞකික චමත්කාරජනකවූ පාලි භාෂාවට හැකි තරම්වූ මෙහෙයක් කිරීම මෙම භාෂාව ඉගෙණීමෙහි ව්‍යාපෘතවූ කුඩා කල සිටම මගේ අදහස විය. එබැවින් මගේ ජීවිත කාලයෙන් හැකි පමණ කොටසක් මම ඒ අදහස ක්‍රියාවෙහි යෙදවීම සඳහා ගත කෙළෙමි.

ප්‍රතිඥතවූ පරිදි ඉංග්ලිෂ්-පාලි ශබ්දකොෂයක් සම්පාදනය කරන්නට ආරම්භ කොට දැවුරුදු දසමසක් ගත විය. මේ වර්ෂයෙහි අප්‍රියෙල් මස 16 වන දිනයෙහි මාගේ ප්‍රථම ප්‍රතිඥවටත් වැඩි තරම්වූ වචන සංඛ්‍යාවකින් එම ඉංග්ලිෂ්-පාලි ශබ්දකොෂ ග්‍රන්ථය නිර්විඝ්න පරිසමාප්තියට පැමිණියේ ය.

පාලි භාෂාභිවෘද්ධිය ප්‍රාර්ථනා කරන සිළුමිණ කර්තෘ මහතා ඇතුළුවූ සියලුම විද්වතුන්ටද විද්‍යාර්ථීන්ටද මෙපුවත ඇසීම අමන්දානන්දයකට හේතුවෙනවා ඇතැයි විශ්වාස කෙරෙමි.

"සිළුමිණ"
1944 අප්‍රෙල් 30 වැනි ද

මෙම කෘතිය සැපයීම පිළිබඳ කතුවරයන් වහන්සේ දැරූ පරිශ්‍රමයත්, මුණ පෑ විවිධ දුෂ්කරතාත් උන්වහන්සේගේ හැඳින්වීමෙන්* ප්‍රකට වෙයි. එසේ ම පොතේ තත්ත්වය ගැන ද උන්වහන්සේ මෙහි කරුණු පැහැදිලි කොට ඇත.

ඉංග්‍රීසියෙන් සැපයුණු එහි උපුටාගත් කොටස් කීපයක සිංහල පරිවර්තනය යි මේ :

---

* Preface, The English Pali Dictionary

"මෙම ඉංග්‍රීසි–පාළි ශබ්දකෝෂය වෙහෙස නොතකා වැඩ කිරීමේ ප්‍රතිඵලයක් විනා මගේ ව්‍යක්තභාවයේ ප්‍රතිඵලයක් නොවේ. මා මෙවැනි සුවිශාල කාර්යයක් භාර ගැනීමට තරම් සුදුසුම පුද්ගලයකු වශයෙන් මම නො සලකමි.

1941 වර්ෂයේ දී එවකට නුවරඑළියේ ගාමිණී විද්‍යාලයේ ප්‍රධානාචාර්යවරයා වූ **ඩී. ජී. ඇස්. වනිගරත්න** මහතාගේ ආරාධනය උඩ, එම පාඨශාලාවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පඞ්ක්තියට මම පාළි භාෂාව ඉගැන්වීමි. එම කාර්යයෙහි නියැළී සිටි කාලය තුළ බොහෝ අවස්ථාවල දී පාළි වචන ඉංගිරිසියටත්, ඉංග්‍රීසි වචන පාළියටත් පරිවර්තනය කිරීමට මට සිදු විය. පාළි අර්ථය සහිත ඉංග්‍රීසි වචන දෙතුන් දහසක ශබ්දසංග්‍රහයක් සපයා දෙන ලෙස වනිගරත්න මහතා මගෙන් ඉල්ලීමක් කර සිටියේ මේ අවදියේ දී ය. මගේ ඉංග්‍රීසි දැනුම දුර්වල වූ නිසා එවැනි කර්තව්‍යයකට ඉදිරිපත් වීමෙන් මම වැළකුනෙමි. මගේ ප්‍රතික්ෂේප කිරීම භාර නො ගත් වනිගරත්න මහතා, එවැනි ශබ්දසංග්‍රහයක් පාළි භාෂාව හදාරණ ශිෂ්‍යයන්ට පමණක් නොව මා වැනි ඉංග්‍රීසිය හදාරණ ශිෂ්‍යයින්ටත් ඉමහත් ප්‍රයෝජනයක් වනු ඇතැයි මට ඒත්තු ගන්වන තෙක් ම ඔහුගේ ඉල්ලීම යළියළිත් අවධාරණය කෙළේය.

ඉනික්බිති මගේ මුළු ශක්තියම යොදා ඉංග්‍රීසි වදන් 25,000කට නොඅඩු ශබ්ද කෝෂයක් ලිවීමට මා තීරණය කළ බව වනිගරත්න මහතාට දැනුම් දුන්නෙමි. 1941 ජූනි මස 16 වැනි දිනට යෙදුණු මගේ 61 වැනි ජන්ම දින, මෙම අතිවිශාල කාර්යය ආරම්භ කොට 1944 අප්‍රේල් 16 වැනි දිනට ඉංග්‍රීසි වදන් 26,500ක් සහ පාළි වදන් 82,000ක් අඩංගු ශබ්දකෝෂයක් මම සම්පූර්ණ කෙළෙමි. 1947 දී එම කෘතිය මුද්‍රණකරුවන්ට භාර දෙන ලදින් ශෝධ්‍යපත්‍ර බලන අවස්ථාවේ තව තවත් බොහෝ වචන ඇතුළත් කරනු ලැබ, අද සමීප වශයෙන් ඉංග්‍රීසි වදන් 27,000ක් ද, පාළි වචනා 83,000ක් ද මෙම ශබ්ද කෝෂයෙහි අඩංගු වේ.

ශබ්ද කෝෂයට වචන තෝරා ගැනීමේ දී සහ ග්‍රන්ථය සම්පාදනය කළ කාලය මුළුල්ලේ දී ම "කොන්සයිස් ඔක්ස්ෆෝඩ් ඩික්ෂනරි", "චේම්බර්ස් ට්වෙන්ටියත් සෙන්චරි ඩික්ෂනරි", "නිව් ඉලස්ට්‍රේටඩ් ඩික්ෂනරි"' හැන්ඩ් ඉංග්‍රීසි-සංස්කෘත ශබ්දකෝෂය, ගරු කාටර් පියතුමන්ගේ ඉංග්‍රීසි–සිංහල ශබ්දකෝෂය ආදිය මට අතිමහත් උපකාරයක් විය. යථෝක්ත ශබ්දකෝෂ ග්‍රන්ථවල කතුවරයින්ට මගේ ණයගැති භාවය ප්‍රකාශ කරමි. මුළු කාලය තුළම අන් කිසිම ශබ්දකෝෂයකට වඩා හැන්ඩ් ඉංග්‍රීසි-සංස්කෘත ශබ්දකෝෂය .......... මම අනුගමනය කෙළෙමි. එහෙත්, මා පාළි අර්ථ වෙනුවට සංස්කෘත අර්ථයන් යෙදුවේ යයි නොගනු මැනවි. මගේ අදහස වූයේත්, මෙම පොතේ පරමාර්ථය වන්නේත්, ඉංග්‍රීසි වචනවල අර්ථය සරල පාළි භාෂාවෙන් දීම විනා කිසිම සංස්කෘත කෘතියක් පාළියට නැඟීම නොවේ. සෑම කල්හි ම

මෙකී පරමාර්ථය පෙරදැරි කරගෙන, නිත්‍ය ව්‍යවහාරයෙහි පවතින පාළි වචනවලින් ඉංග්‍රිසි වචනවල අර්ථ පහදා දීමට මම උත්සාහ කර ඇත්තෙමි. භාෂා දෙක අතර ඇති විශාල පරතරය නො සලකා සංස්කෘතය පාළියටත්, පාළිය සංස්කෘතයටත් පෙරළිමට කවර හෝ වෑයමක යෙදුනාහොත් කතුවරයාට බොහෝ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවේ. මෙම කෘත්‍යයේ දී සංස්කෘත වචන ස්වල්පයක් හා මා විසින් ම ගොඩ නගන ලද පාළි වචන කිහිපයක් ද භාවිත කර ඇති නමුත් එම වචන භාවිතයේ දී මම අතිශයින් ම ප්‍රවේශම් වී ඇත්තෙමි. ඇතැම් පාළි වචන සමඟ එහි සිංහල තේරුම ද තවත් තැනෙක මූලික ග්‍රන්ථවලින් සහ අට්ඨකථාවලින් උදාහරණ ඡේදයන් ද දී ඇති අතර, කලාතුරෙකින් සංස්කෘත උදාහරණ ඉදිරිපත් කර ඇත. වචනවල තේරුම් දීමේ දී මම සෑම අවස්ථාවේ දී ම උචිත ලිංගය යොදා ඇත්තෙමි. පුරුෂ ලිංගයෙහි, ස්ත්‍රී ලිංගයෙහි, නපුංසක ලිංගයෙහි යොදන පාළි වචන එකී ලිංගයෙන් පමණක් පෙන්වා ඇති අතර, කිසියම් වචනයක් ලිඟු දෙකක හෝ තුනක යෙදෙන අවස්ථාවල දී එය පුරුෂලිංගයෙන් හෝ නපුංසක ලිංගයෙන් හෝ පෙන්වා ඇත. සාමාන්‍යයෙන් එසේ යෙදීම පාළි ව්‍යාකරණය හා එකඟ ය. ඇතැම් ඉංග්‍රීසි වචනවල ලිංගය යෙදීම පාළි භාවිතයෙන් වෙනස් වන්නට ඉඩ ඇත. සියලු ක්‍රියා පද ප්‍රථම පුරුෂ ඒක වචනයෙන් පෙන්වා ඇත. පාළියේ ප්‍රථම පුරුෂ යනු ඉංග්‍රීසියේ තෙවන පුරුෂයි. ඉංග්‍රීසි ක්‍රියා පදයට 's' හෝ "es" එකතු කිරීම ගැන පැහැදිලි කිරීමක් අනවශ්‍ය ය. ක්‍රියා පද "v" සංකේතයෙන් පෙන්නුම් කර ඇති අතර, සකර්මක හා අකර්මක ක්‍රියාපද "Vt" සහ "vi" යනුවෙන් වෙන් කර පෙන්වීමට වෑයම් කර නැත.

මෙම ශබ්දකෝෂයට වචන තෝරා ගැනීම, ඒවායේ අර්ථ පාළියෙන් ලිවීම, අත් පිටපත් මුද්‍රණයට පිළියෙළ කිරීම සහ ශෝධ්‍ය පත්‍ර බැලීම යන සියල්ල කිසිවෙකුගේ ආධාරයක් හෝ උපදෙසක් නැතිව මා විසින් ම කරන ලදී. කොටින්ම, පිටස්තර කිසිවකුගේ වචන මාත්‍රයක් පවා මෙම මුළු පොතෙන් ම සොයාගත නොහැකි ය. මෙය ඉංග්‍රීසි බස පිළිබඳ ගැඹුරු දැනුමක් නැති කෙනෙකුගේ කෘත්‍යයක් වුවත් මේ අන්දමේ ඉංග්‍රීසි–පාළි ශබ්දකෝෂයක් බිහි කිරීමට දරන ලද එකම උත්සාහය ලෙස එම බසෙහි උසස් නිපුණත්වයක් ඇති වියතුන්ගේ ආශීර්වාදය ලැබීමට තරම් සුදුසුවේ යයි මම බලාපොරොත්තු වෙමි.

දිවංගත ශ්‍රීමත් බාරොන් ජයතිලක මහතාණන්ගේ ජීවිත කාලය ඇතුළත, එතුමන්ට මෙම ශබ්දකෝෂයේ ආදර්ශ පිටුවක් යවමින් එම කෘත්‍යය එතුමන්ගේ හැඳින්වීමක් ලැබීමට තරම් සුදුසු යයි සලකන්නේ නම්, පොත පළකරන විට යොදාගැනීම සඳහා පූර්විකාවක් ලියා එවන ලෙස ඉල්ලීමක් කෙළෙමි. ඊට පිළිතුරු වශයෙන් එතුමන්ගෙන් මට ලැබුණු 1942 නොවැම්බර 22 වැනි දින ලිපියෙන් කොටසක් මෙසේ ය :

'ඔබ වහන්සේගේ පොත ප්‍රසිද්ධ කිරීමට ඉදිරිපත් කිරීම මගෙන් ඉටු විය යුතු යුතුකමක් ලෙස මම සලකන්නෙමි. පොතේ ප්‍රථම කොටස මුද්‍රණය වූ පසු, ඔබ වහන්සේගේ ප්‍රස්තාවනාව ලිවීමට ප්‍රථම, එය කියවා බැලීමට මම ඉතාමත්ම කැමතිය. ඊට පසු පූර්විකාවක් ලිවීමට මට හැකිවනු ඇත. එය මට ඉහළ ම ප්‍රීතිය ගෙන දෙන්නක් වේ.'

පොත මුද්‍රණකරුවන් අතට යාමට පෙර ශ්‍රීමත් බාරොන්ගේ අභාවය සිදුවීම නිසා දුක්වීමේ අභාග්‍යයට අපට මුහුණ දීමට සිදු වුවත්, මගේ කෘතිය නිම කිරීමෙන් පසු, මහාචාර්ය ජී. පී. මලලසේකර මහතා සුළු වේලාවකට මා මුණ ගැසීමට පැමිණි විට, මගේ අත් පිටපත එතුමන්ට පෙන්වීමට මටහැකි විය. එම කෘතිය ගැන මහත් සේ සතුටු වූ එතුමා 1946 ජුනි 12 වන දින මට ලියූ ලිපියක මෙසේ කියයි :

'ඔබ විසින් එතරම් වෙහෙසක් දරා ඉමහත් සැලකිල්ලෙන් සම්පාදනය කර ඇති, එමෙන්ම (ශිෂ්‍යයන්ට) මහත් අනුග්‍රහයක් විය හැකි මෙම ශබ්දකෝෂය අප්‍රමාදව ප්‍රසිද්ධ කිරීමට මට හැකි සියල්ලක් ම මම කරන්නෙමි.''

මෙකී ලිපියට අමතරව මගේ සුප්‍රකට වියත් මිතුරා මගේ ශබ්ද කෝෂයට ප්‍රස්තාවනාවක් ලිවීමෙන් මට මහත් අනුග්‍රහයක් කෙළේය. එනයින් මට කරන ලද සේවය කෘත ගුණ සම්ප්‍රයුක්ත ගැඹුරු හැඟීම කින් මම භාර ගනිමි.''

ඉංග්‍රීසි පාළි ශබ්දකෝෂය සඳහා සාරගර්භ පූර්විකාවක්* සපයා ඇත්තේ මහාචාර්ය ජී. පී. මලලසේකර මහතා විසිනි. මෙහි අගය මතුකර දක්වමින් ඒ මහතා පවසන අදහස් මෙසේ ය. ඉංග්‍රීසියෙන් සැපයූ එම පූර්විකාවෙහි සිංහල පරිවර්තනයයි මේ :

''මෙම පූර්විකාව ලියන ලෙස ආරාධනය කරනු ලැබීමෙන් මා ලද ගෞරවය මා සිතට ගැඹුරු ලෙස කාවැදී ඇත. ගෞරවාර්හ පණ්ඩිත විදුරුපොළ පියතිස්ස මහානායක ස්වාමීන්වහන්සේ දනට පරම්පරා වකට අධික කාලයක සිට ලංකාවේ ප්‍රථම ස්ථානයෙහි ලා ගිනිය හැකි අපේ ප්‍රාචීන පඬිවරයන් අතර කෙනෙකු ලෙස සලකනු ලැබේ. උන් වහන්සේ විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ග්‍රන්ථ සංඛ්‍යාව බොහෝ ය. ඒවා අතුරින් 'නෙත්තිප්‍රකරණ අටුවාව', 'සංයුත්ත නිකායට්ඨකථා' සහ 'ජාතකට්ඨකථා' වැනි ඇතැම් ග්‍රන්ථ මහත් වෙහෙසකින් හා චතුර බුද්ධියකින් කරන ලද, පාළි මූල ග්‍රන්ථ පිළිබඳ විචාරණ කෘති වේ. 'මහාකස්සපචරිත' සහ 'මහානෙක්ඛම්ම චම්පූ'

* Foreword, The English Pali Dictionary.

වැනි අවශේෂ ග්‍රන්ථ, සිය කවිත්වයේ පරිණතභාවය, ගැඹුරු භාෂාව බෝධය සහ උසස් දැහැමිකම විදහාපාන උන්වහන්සේගේ ම කෘතීන් ය. 'ව්‍යාකරණ සද්දසින්ධු' නමැති කෘතිය උන්වහන්සේගේ ප්‍රශස්ත නිර්මාණයකි ; එය පාළි ව්‍යාකරණයෙහි එන ව්‍යාකුල පදව්‍යවහාරය පිළිබඳ ප්‍රයෝජනවත් සූචියක් වනාවා පමණක් නොව, කතුවරයාගේ ගාම්භීර පාණ්ඩිත්‍යය සහ එකිනෙකට සම්බන්ධතාව ඇති භාෂා සාහිත්‍යය බොහෝ ගණනක් ඇසුරින් ලද පෘථුල දැනුම හෙළිදරව් කරන මූල ග්‍රන්ථයකි. ගෞරවාර්හ මහානායක හිමියන්ගේ අලුත් ම ප්‍රකාශනය වන 'ඉංග්‍රීසි-පාළි ශබ්දකෝෂය' නිසා උන්වහන්සේට අපගේ ණයගැතිකම බොහෝ සෙයින් වැඩි වී ඇත.

පාළි සහ ඉංග්‍රීසි වැනි දුරස්ථ භාෂාවන්ගේ වචනවල අර්ථයට සමාන අර්ථ ගෙන දෙන වචන සොයා ගැනීම කෙතරම් දුෂ්කරදැයි අවබෝධයක් ඇතිකර ගත හැක්කේ භාෂා හදාරණ ශිෂ්‍යයින්ට පමණකි. පාළි භාෂාව ශතවර්ෂ බොහෝ ගණනක සිට නිසංසලව තුබූ භාෂාවක් වන අතර ඉංග්‍රීසිභාෂාව අති ශීඝ්‍ර ලෙස වර්ධනය වී ඇති භාෂාවකි. සඳ පුළුල් වන ගංගාවක් පිරි ඉතිරී යන්නාක් මෙන් පාළි කවීකයින් සිහිනෙන් පවා නුදුටු නව සංකල්ප භාෂාටට ඇතුළු වී ඇත. කනට පුරුදු මාගධිභාෂාවේ මෘදු මොළොක් වහරට ගැළපෙන පරිදි, අලුත් අර්ථවලට කර්කශ නොවන පාළි වචන ගෙනීම ලෙහෙසි පහසු කාර්යක් නොවේ. එවැනි අපහසු කාර්යයක් කිරීමට ඉදිරිපත්වීම සඳහා අසාමාන්‍ය ධෛර්යයක් තිබිය යුතු ය. සිය ජීවිත කාලය මුළුල්ලේ ම සාහිත්‍ය ආශ්‍රයෙන් ලැබූ ආත්මවිශ්වාසයකින් යුතුව ගරුතර නායක ස්වාමීන් වහන්සේ මෙම කාර්යයට උර දී ඇත. මෙම ග්‍රන්ථයෙහි පිටු පෙරළා බැලූ පමණින් පෙනියන පරිදි, එමකාර්යය, අතිමහත් පරිණතභාවයකින් හා පහසු නිරවද්‍යතාවකින් යුතුව ඉටුකර ඇත. ඉංග්‍රීසි බස පිළිබඳ විශාරද දැනුමක් නැතැයි තමන්ම කියා ගන්නා කෙනෙකුන් විසින් ස්ඵුට කරන ලද, විශිෂ්ට ජයග්‍රහණයකි මෙය. අපහසු වචන අත්හැර දැමීමේ චෝදනාව තමන් වෙත එල්ල නො වන සේ, ඌන අවබෝධයක් ඇති අයෙකු නම් පහසුවෙන් අත්හරින වදන් පවා උන්වහන්සේ මෙහි ඇතුළත් කර ඇත. බොහෝ තැන්වල අර්ථය පැහැදිලි කිරීම් වස් සිංහල තේරුම් දී තිබේ. මේ නයින් හා නා නා ප්‍රකාර වෙනත් අයුරින් ශිෂ්‍යයාගේ පහසුව කෙතරම් ගැඹුරු ලෙස උන්වහන්සේ සලකා ඇද්දැයි පෙන්නුම් කර ඇත. මෙය මවිත යට හේතුවක් නො වේ. ශාස්ත්‍ර හැදෑරීමේ මඟ කෙතරම් කටුකදැයි ද, එම මඟ යන අයට කරනු ලබන කවර උපකාරයක් වුව ද කෙතරම් ඕනෑකමින් පිළිගන්නේ දැයි ද උන්වහන්සේ දනිති.

මෙම ශබ්දකෝෂය කතුවරයාගේ හැට නව වැනි ජන්ම දිනයට යෙදෙන සේ නිකුත්කරනු ලැබීම ඇත්ත වශයෙන්ම ප්‍රීතිමත් සිද්ධියකි. මාස ගණනාවක් ම උන්වහන්සේ බලවත් සේ රෝගාතුරව සිටියදීත් වෛද්‍ය අණ නොතකා ක්‍රියා කිරීමේ ප්‍රතිඵලය වී ඇත්තේ පාළි භාෂාව හදරනශිෂ්‍යයින්ට රන් ආකරයක් බඳු මෙම ග්‍රන්ථය බිහිවීම යි.

ජීවිතයේ මේ අවදියේ දී උන්වහන්සේගේ නොපසුබට වීර්යය හා යුතුකම් ඉටු කිරීමට ඇති ඇපකැපවීම මම පුද්ගලික වශයෙන් ඉමහත් භක්ති ප්‍රණාමයෙන් සලකමි. තරුණයන්ට අනුගමනය කිරීමට වටිනා ආදර්ශයක් උන්වහන්සේ පෙන්වා දී ඇත. 'අජරාමරවත් ප්‍රාඥෝ විද්‍යාමර්ථඤ්ච චින්තයෙත්' යයි පැරැන්නෝ කීහ. ''චිරං ජීව — සබ්බ ලෝකස්ස අත්ථාය භවස්සු අජරාමරෝ' යන එකම ප්‍රාර්ථනයෙන් ගරුතර කතුවරයාණන් වහන්සේට සිය කෘත ගුණය ප්‍රකාශ කිරීමට කෙනෙකුට පුළුවන. මම මුළු හෘදයෙන් ම එසේ කරමි. ගරුතර නායක ස්වාමීන්වහන්සේගේ පරිපූර්ණ ඥාන ශක්තියේ සහ අපරිමිත පාණ්ඩිත්‍යයේ විපුල ඵල අඛණ්ඩ ව දීර්ඝ කාලයක් තිස්සේ අපට ලබා දීමට උන්වහන්සේට ශක්තිය ලැබේවා!''

ලංකා විශ්වවිද්‍යාලය, ජී. පී. මලලසේකර
1949 මැයි 26 වැනි දින.

ඉංග්‍රීසි භාෂාවට ඉංග්‍රීසි–පාළි ශබ්දකෝෂයක් නැතිකමේ පාඩුව මේ ආකාරයෙන් සම්පූර්ණ වූයේ ය. ඉංග්‍රීසි හා පාළි පිළිබඳ ව විමසිලිමත් වියතුන්ගේ මනදෙළ පිරිගිය මේ මහඟු ග්‍රන්ථය පිළිබඳ ව උසස් පෙළේ බුද්ධිමතුන් විදුරුපොළ මා හිමියන් වහන්සේට ප්‍රශංසා වශයෙන් එවූ ලිපි රාශියක් ම වේ. ඒ හැරෙන විට ලංකාවේ ජනමාධ්‍ය තුළින් ද දැක්විය යුතු නියම ගෞරවය දක්වන ලදි. ඒ අතරින් 1949 අගෝස්තු මස 28 වන දින ''සිළුමිණ'' පත්‍රයෙහි පළ වූ විවේචනය යි මේ :

## ආංගලීපාළිසද්දකොසො

''පූජ්‍ය පණ්ඩිත විදුරුපොළ පියතිස්සා'භිධාන මහා නායක ස්ථවිර පාදයන් වහන්සේ විසින් කාගෙන්වත් උදව්වක් නැතිවැ, නොයෙක් ශබ්දකෝෂයන්ගෙන් පමණක් ලැබුණු උපකාරමාත්‍රයෙන්, ඉංගිලිසි ශබ්ද 27,000 කින් පමණ පාළි ශබ්ද 83,000 කින් පමණ විවරණ කිරීමෙන සකස් කළ, පිටු 747 කින් යුත්, මුද්‍රණයෙන් හා බැම්මෙන් ද, ප්‍රිය දර්ශනීය වූ — මේ ඉංගිලිසි පාළි ශබ්දකෝෂය දුටු පමණින් ම මහත් සතුටට පැමුණුණෙමු.

ශ්‍රී මුඛ පාලිය හෙවත් බුද්ධ වචනය ප්‍රභව කොට ඇති පාළි භාෂාව පිළිබඳ ''ව්‍යාකරණ, ඡන්දස්, අලංකාර, නිරුක්ති, නිඝණ්ටු'' සංඛ්‍යාත සකල ශබ්ද ශාස්ත්‍රයන් ම සිංහල ද්වීපයෙහි ම, මහාවිහාර පරම්පරාගත බුද්ධපුත්‍රයන්වහන්සේ අතින්ම, සැකැසුණාක් මෙන්, මෙය ද එසේ ම වූ උතුමකුගෙන් සැකැසීම සිංහල බෞද්ධ ගිහි පැවිදි පිරිසට මහත් ප්‍රීතියෙකි. රූඪියට අනු වැ පාළිශබ්දයන්ගේ අර්ථවිශේෂයන් දැක්වීම ධර්මවිනයධර ගුරු සම්ප්‍රදායයක් නැතියවුන් විසින් නොකැට හැකි වන බැවින්, මෙය මෙසේ සැලසීම සාමාන්‍යයෙන් පෙළ බස පුහුණු කරන සකලඡාත්‍රයනටම ප්‍රීතිජනක වූ භාග්‍යයක් වියැ යුතුය.

පාලි භාෂාව පිළිබඳ පළමු වන ශබ්දකෝෂය ලෙස සැලැකිය යුතු වන්නේ දොළොස්වන සියවස්හි පොළොන්නරුවේ මහා ජේතවන විහාරයෙහි වැඩ වුසූ 'මුගලන්' නම් සිංහල මහතෙරුන් කළ 'පාලි නිඝණ්ඩුව'යි — හෙවත් 'අභිධානප්පදීපිකාව' යි. එය අකාරාදි ක්‍රම යෙන් ඇවුණු පෙළසදනට සිය බසින් හෝ වෙන බසෙකින් අරුත් විවරණ කිරීමෙන් ගැළැපූවක් නො වැ, සවිඥනක වූත් අවිඥනක වූත් දේවල් කියන පාලි නාමයන් එක්කොට හුදු පෙළ බසින්ම ගාථා බන්ධ වශයෙන් සැකැසුණු ග්‍රන්ථයෙකි. එහි නාමයන් හා ඇතැම් අව්‍යයයන් මිස ක්‍රියාපදයෝ ඇතුළත් නො වෙති. එහෙත් ඒ ග්‍රන්ථයාගේ අවසාන යෙහි කර්තෘහු විසින් ම :

'' තිදිවෙ මහියං භුජගා'වසථෙ
සකලත්ථසමව්හයදීපනියං
ඉහ යො කුසලො මතිමා ස නරො
පටු හොති මහා මුනිනො වචනෙ ''

යන මේ ගාථායෙන් එය දෙව්ලොව මිනිස්ලොව සහ එය පත්ලෙහි වූ පාතාලලෝකයැ යන තුන් ලොවැම ඇතිතාක් දේවල නාමයන් දක් වන්කැයි ප්‍රතිඥත ය. මුළු පොත ම ගාථා 1,203 කින් පරිමිත වන බැවින් ප්‍රමාණ වශයෙන් මේ අභිනවකෝෂයට වඩා බොහෝ කුඩාය. එහෙත්, එහි එවකට ලොවැ පැවති කවර දෙයක් වුවත් සාමාන්‍යයෙන් කියා ලන්නට පොහොනා තරම් නාමයෝ ඇතුළත් වූහ.

මේ අභිනවකෝෂය වූ කලී අදත් දියුණු තියුණු වෙමින් වැඩෙන සාර්වභෞම වූ වේගවත් — සජීව භාෂාවකැයි — කියැ හැකි වූ — ඉංගිලිසි භාෂායෙහි අනතිප්‍රයුක්ත වූ අප්‍රසිද්ධ ශබ්දයන් හැර, පැරැණි වූත් අලුත් වූත් සාමාන්‍ය ව්‍යවහාරයෙහි උපයෝගී වන ශබ්දයන් එක්කොට අකාරාදි ක්‍රමයෙන් අටුණා, ඒ ඒ එකී එකී ශබ්දයක් පාසා ගෙන මෙයින් සියවස් විසි ගණනකටත් පෙර සාමාන්‍ය ව්‍යවහාරයෙන් ඉවත් වැ පත්පොත්හිම රැඳි ගිය පෙළ බසින් වියත් ලෙස විවරණ කරණ වශයෙන් සැකැසුණෙකි.

පාලි නිඝණ්ඩු තැනුණු කාලයෙහි යටැ කී තුන් ලොවැ ම නොතිබුණ හයි කියැයුතු වූ ශිල්ප'විද්‍යාදිය හා තද්විෂයක වූ පාරිභාෂික ශබ්දයෝ ද — එයින් පහළ වූ නානාවිධ වස්තූහු ද — ඔවුන් දක්වන නාමයෝ ද ඇ ඉංගිලිසි භාෂායෙහි ප්‍රචලිතයහ. ඒ ඉංගිලිසි ශබ්දයන් — දැන් සාමාන්‍ය ව්‍යවහාරයෙන් ඉවත් වැ පත්පොත්හි ම රැඳි සිටින පාලියෙන් තබා, තථා ව්‍යවහාරයෙහි පවත් වැ සිටින සිංහලයෙන් වත් නිසි සේ පරිවර්තනය කිරීම කොතරම් උගහට දැයි උගත්තු කවුරුත් දනිති. එබැවින් පාලි නිඝණ්ඩුවෙහි ඇතුළත් වූ පෙළබසින් පමණක් නම් ඒ ශබ්දයෝ විවරණ කට හැකි නොවෙති. ඉංගිලිසියෙහි ආ ක්‍රියාපදයෝ නම් කෙසේවත් ඒ නිඝණ්ඩු පාලියෙන් විවරණ කටැ හැකි නොවෙති. මෙසේ හෙයින් නිඝණ්ඩු වෙහි නො ආවත්, පෙළ අටුවාවන්හි

ප්‍රචලිත වූ පාළියට අනු වැ එබඳු තැන් නිසි සේ විවරණය කරන්නට මේ සංස්කාරකයන් වහන්සේ බොහෝ වෙහෙසුණු බව පෙනේ. ඒ ප්‍රයාසය හැමතන්හි එකසේ සඵල නොවූවත් පැසැස්සැයුතු වේ. අප කථා කරන සිංහලයෙහි පවා 'කඩා බිඳැ දමා ගෙන ගියේ යැ' යන ආදී පාඨාන්තරයන් ස්වරූපයෙන් පාළියට නගාලියැ නො හැකි නම්, ඉංගිලිසියෙහි ආ ශබ්දවිශේෂ විෂයෙහි කවර කථා යැ?

සිය බසින්ම වුවත් ශබ්ද කෝෂයක් සැකැසීම උගත් පණ්ඩිත මණ්ඩලයෙකින් දිගු කලක් සෙමෙන් විමස විමසා නොයෙක් වර සකස් කිරීමෙන් වියැ යුතු වුවත්, මෙය මඳ කලෙකින් ස්වෝත්සාහ මාත්‍රයෙන් නිපැදුණු බැවින් — ඇතැම් තැනැ අර්ථ පරිහානිත් ඇතැම් තැනැ අක්ෂර පරිහානිත් දක්නට ලැබීම ස්වාභාවික වේ. ඒ හැම නැවැතැ නැවැතැ මුද්‍රණය කැරෙන වාරයන්හි සපුරාලිය හැකි වේ. මේ ප්‍රථම වාරයෙහි ම මෙතරම් ප්‍රයෝජනවත් වන ලෙස මෙය තනියෙම සැකැසීම ගැන සංස්කාරකයන් වහන්සේට ප්‍රශංසා කටැ යුතු වේ.

විශ්වවිද්‍යාලයයන්හි උසස් පාඨ පරීක්ෂණයන්හි දී එක් විෂයයක් හැටියට පාළිත් ගෙනැ එයින් යහතින් උත්තීර්ණ වන්නට බලා පොරොත්තු වන ඡාත්‍රයනට ඉංගිලිසි වැකි පාළියටත්, පාළි වැකි ඉංගිලිසියටත් නගාලීමට මෙය ඉතා උපකාර වියහැකි බව සඳහන් කළ යුතුයැ. වයෝවෘද්ධ වත් ගිලන් වත් වැඩැ වෙසෙන මේ නායක ස්ථවිරපාදයන් වහන්සේගේ මේ කෘතිය ඉතා උසස් කොට සැලැකිය යුතු වේ."

පැලැණේ වජිරඤාණ
නායක ස්ථවිර.

"සිළුමිණ"
1949 අගෝස්තු 28

# 9 පරිච්ඡේදය

# ධර්මශාස්ත්‍රීය විවිධ කෘති

## I

විදුරුපොළ පියතිස්ස යතිවරයන් වහන්සේ ගැදි පැදි රචනය ආරම්භ කෙළේ තමාට අවුරුදු පසළොස පිරෙන්නට ද පෙර සිට ම ය. උන් වහන්සේගේ පළමුවැනි කෘතිය පිට වන විට වයස අවුරුදු 17 ක් විය. එතැන් සිට ලියා ඇති පොත් විවිධ විෂයයන් ආවරණය කැරෙයි. මීට ප්‍රථම පරිච්ඡේදයෙන් හැඳින්වුණු ඒවාට වඩා මේ කෘති සියල්ල ප්‍රමාණයෙන් කුඩා ග්‍රන්ථයේ පටන් විශාල සංස්කරණ තෙක් පැතිරී ඇත. ඒ එකිනෙකක් පාසා මෙහි ලා අනුපිළිවෙළින් හැඳින්වේ.

### දෘෂ්ටාන්තශතකය*

මහාකවි කුසුමදේවයන් විසින් රචිත දෘෂ්ටාන්තශතකය ජීවිත දර්ශනයට අවශ්‍ය උපදේශයන්ගෙන් යුක්ත වූ ද, ඒවා බාහිර දෘෂ්ටාන්ත දක්වා ඔප්පු කරන්නා වූ ද කෘතියකි. මේ හේතු නිසා මෙය ජනප්‍රියත්වය ලබා ගත් විසිතුරු කාව්‍යයකි. එම යුගය වන විටත් මෙම කව ලංකාවේ එතරම් ප්‍රචාරයට පත් වූවක් නො වේ. සංස්කෘත කාව්‍යයක් වන මෙයට සිංහල ව්‍යාඛ්‍යානයක් නොතිබුණු අඩුව පිරිමසමින් රත්මලානේ පරමධම්මචේතිය පිරුවන්හි ඉගෙනගන්නා අවධියේ ඒ සඳහා සිංහල සන්නයක් සපයන ලද්දේ විදුරුපොළ පියතිස්ස හෙරණපාණන් විසිනි. එවිට උන්වහන්සේගේ වයස අවුරුදු 17 ක් විය. හා පුරා කියා උන්වහන්සේ ලියූ පොත ද මෙය යි.

මෙය ලියා පිරුවන්හි දයක පිරිස හා ශිෂ්‍ය පිරිස ඉදිරියෙහි කියවා. පිරුවන්පති ධම්මානන්ද හිමිපාණන්ට ගුරු පඬුරු කොට පිරිනමන ලදි.

---

* ප්‍රකාශනය; කේ. ඇම්. මුදියන්සේ
මුද්‍රණය; හුණුපිටියේ ජිනාලංකාර යන්ත්‍රාලය, කොළඹ.
ප්‍රමාණය; ඩිමයි පිටු: 30
ප්‍රකාශිත වර්ෂය; ක්‍රි; ව; 1901

එහි ප්‍රස්තාවනාව සපයා ඇත්තේ ‘සංස්කෘත’ ශ්ලෝකවලිනි. පද්‍ය හතක් එයට අයත් ය. වර්ෂ දෙකකට ද වැඩි නො වූ සුළු කාලයක් තුළ ඒ සා කුඩා අවධියේ ම උන්වහන්සේ ලබා තිබූ සංස්කෘත භාෂා නෛපුණ්‍යයට එම ශ්ලෝක පන්තිය වුව නිදසුන් වේ. මේ එම රචනය යි :

1. ශ්‍රියමඛිලවිදුර්භවාර්ණවෛක-
තරණිනිභස්සුගතස්සුරෙන්ද්‍රවන්ද්‍යඃ ;
ප්‍රථිතගුණගණස්සදසදදයා-
දමෘතනිධිර්භවතාං විහිතසත්‍යඃ.

2. ශ්‍රීමච්ඡායනදෛත්‍යවිද්විෂපදෙ භක්තාග්‍රතාරාවෘතෙ
කාරුණ්‍යප්‍රකටීකෘතෙන්ද්‍රමලක්ෂිරාභකීර්තිප්‍රභඃ ;
රත්නද්‍යොතියතීශ්වරඃ ස්ථිරධෘතිර්ධමාර්ථවිත් සත්කෘතිර්
ජීයාද්වර්ෂශතං සුවිශ්‍රුතමතිර් විංශොත්තරං මද්ගුරුඃ.

3. අමිතවිඥවිවර්ණිතසද්‍යශො
සමුදයො‘මිතසාරගුණාකරඃ ;
අමිතසාර සමාඛ්‍යමහායතිර්
ජයති මද්ගුරුරග්‍රදයානිධිඃ.

4. භාස්වද්වංශාමෘතනිධිවිධොර් විශ්වලෝකාධිපස්‍ය
සර්වඥස්‍යා‘ඛිලගුණනිධෙඃ ශාසනෙ ශක්තචිත්තඃ ;
විද්වද්වෘන්දෛර්විමලමතිභිර්වර්ණනීයස්වරූපො
ධර්මානන්දාහ්වයයතිපතිර් භාතු භාස්වද්සුගාත්‍රඃ.

5. ශ්‍රීමත්කුසුමදෙවෙන විදුෂා විදුෂාං ප්‍රියම් ;
දෘෂ්ටාන්තශතකං නාම යත් ප්‍රණීතං සතාං මුදෙ.

6. තස්‍යා‘යං යතිපුත්‍රෙණ ස්වයා සිංහලභාෂයා ;
ක්‍රියතෙ ප්‍රියතිෂ්‍යෙණ ව්‍යාඛ්‍යා තත්ත්වාර්ථබොධිනී.

7. යදත්‍ර දෘශ්‍යතෙ දොෂො මත්ප්‍රමාදභ්‍රමොද්භවඃ ;
ස නිරාක්‍රියතාං ධීරෛර් ලොකාර්ථහිතසංසිභිඃ

ප්‍රස්තාවනා
දෘෂ්ටාන්තශතකය

මෙයින් කියැවෙන්නේ ආචාර්ය ප්‍රාචාර්ය ධර්මාචාර්ය හිමිවරුනට ආසිරි පැතීම හා කාව්‍ය නතු ඉදිරිපත් කිරීම යි. මේ කෘතිය එද සභරා පුවත් පත් මාධ්‍යයන්ගෙන් ඉහළින් අගය කරන ලදී. **‘‘සරසවි සඳරැස’’** පත්‍රයේ පළ වූ විවේචනාත්මක අගැයීම මෙසේ ය :

## දෘෂ්ටාන්ත ශතකය

“ඌව දිශාවේ විදුරුපොල සුමංගලාරාමවාසී පියතිස්ස සාමින් වහන්සේ විසින් සන්නකොට මුද්‍රණය කරවන ලද මෙනම් පුස්තකය අප වෙත එවන ලදින් ස්තුතියෙන් පිළිගෙණ කියවා බැලීමු. මෙය වනාහි ආචාර්ය ශ්‍රී කුසුමදේව නම් කවීන් විසින් නීති ශාස්ත්‍රෝපදේශයන්ගෙන් යුක්ත කොට ශ්ලෝක බන්ධනයෙන් රචනා කරණ ලද ප්‍රකරණයකි. මෙය දෘෂ්ටාන්තවලින් යුත් පද්‍ය සියයකින් සමන්විත වූයෙන් දෘෂ්ටාන්ත ශතක නම් වී. මධුර කොමලගුණයෙන්ද අනූනයි. මෙහි ඇතැම් තැනක අර්ථාන්තර න්‍යාසාදියක්ද දක්නා ලැබේ. මෙහි ක්‍රමය නම් ශ්ලෝකයෙහි මුල දෙපදයෙන් උපදේශයක් දක්වා ඊට යෝග්‍ය වූ උදාහරණයක් අග දෙපදයෙන් දැක්වීමයි. ග්‍රන්ථ කර්තෘවරයා කවරකලක විසූ කෙනෙක් දැයි දනගත නොහැකියි. නුමුත් නීති ශාස්ත්‍ර විජානනයෙහි පටුතර බුද්ධිමත් කෙනෙක් බවත් පද්‍ය රචනායෙහිද දක්ෂයෙක් බවත් ඒ තද් ග්‍රන්ථයෙන් පෙණේ.

උගත් නුගත් දෙපක්ෂය විසින් පිළිපැදිය යුතු උපදේශ රාශියක් මෙහි ඇතුළත් කර තිබේ. සුභාෂිත පථ්‍ය වාක්‍ය ව්‍යාසකාරාදි පොත් වල නැති උපදේශද මෙහි දක්නා ලැබේ. ජීවානන්ද විද්‍යාසාගර භට්ටාචාර්යයන් විසින් මීට ටීකාවක්ද කර තිබේ. විදුරුපොල පියතිස්ස සාමින්වහන්සේ විසින් මේ ටීකාව ඇසුරු කොට සන්නයක් ලියා මෙය මුද්‍රණය කර වන ලදින් ආධුනිකජනයාට දැන් ප්‍රයෝජන ගැණීම පහසු වී තිබේ. මෙහි ස්වභාව වැඩිදුර හඳුන්වනු පිණිස සන්න සහිත පද්‍ය කිපයක් මෙහි බහාලීමු.

නින්දාං යඃ කුරුතෙ සාධොස්තථා ස්වං දූෂයත්‍යසෞ
ඛෙ ධූලිං යස්ත්‍යජෙදූච්චෛර්මූර්ධ්නි තස්‍යෛව සා පතෙත්.

යඃ යමෙක් තෙම; සාධොඃ සත්පුරුෂයා හට ; නින්දාං කුරුතෙ, ගර්හාවක් කෙරේද ; අසෞ, ඒ මේ පුරුෂ තෙම ; තථා, එසේම ; ස්ව, තමන් ; දූෂයති, කිළුටු කරගණියි ; (සත්පුරුෂයා හට නින්ද කළාවූ පුරුෂ තෙමේ සියළු දෙනාගෙන් නින්ද ලබයි යනු භාවයි) යඃ, යමෙක් ඛෙ, අහසෙහි ; ධූලිං, දූවිලි ; ත්‍යජෙත්, දමාද ; සා, ඒ දූවිල්ල ; තස්‍ය එවං ඔහුගේම ; මූර්ධනි, හිසෙහි ; උච්චෛඃ, අතිශයින් ; පතෙත්• වැටෙන්නීය.

සම්පත්තෞ කර්කශං චිත්තං ඛලස්‍යාපදි කොමලම් ;
ශීතලං කඨිනං ප්‍රායස්තප්තං මෘදුහවත්‍යයඃ.

ඛලස්‍ය, දුර්ජනයාගේ ; චිත්තං, සිත ; සම්පත්තෞ, සම්පත්කාලයෙහි ; කර්කශං, දරුණුයි; ආපදි, විපත් කාලයෙහි ; කොමලං, (භවති), (අපොහොසත් බැවින්) මොලොක් වේ ; අයඃ, යකඩය තෙම ; ප්‍රායඃ,

බොහෝ සෙයින් ; ශීතලං, සිහිල්වූයේ (නිවුනේ) ; කඨිනං, තද වේ ; තප්තං, (ගින්නෙන්) තවන ලද්දේ ; මෘදු භවති, (උණුවන හෙයින්) මොළොක් වේ.

භොගඃ පරොපතාපෙන පුංසාං දුඃඛාය න ස්ථිරඃ
පානමප්‍යසෘජඃ ක්ෂිප්‍රං ස්වපීඩායෛ ජලෞකසාම්.

පරෝපතාපෙන, අනුන් පෙළීමෙන් ; පුංසාං, පුරුෂයන්ගේ ; භොගඃ, විෂය සැප අනුභව කිරීම ; දුඃඛාය, දුක් පිණිස වෙයි ; එහෙයින් ; නස්ථිර'. වැඩිදියුණු නොවෙයි ; ජලෞකසාං, දිය පූඩාවන්ගේ ; අසෘජඃ, (අනුන්ගේ) ලෙය තම ; පානං අපි, බීමත් ; ක්ෂිප්‍රං, වහා ; ස්වපීඩායෛ, තමන්ට පීඩා පිණිස පවතියි.

පියතිස්ස සාමීන්වහන්සේ පරිශ්‍රම දරා කර තිබෙන අර්ථ ව්‍යාඛ්‍යානය යහපති, ඇතැම් තන්හි භාවාර්ථානුගතවද ලියා තිබේ. රත්මලානේ පරමධම්මචේතිය පරිවෙණාධිපති ධර්මානන්ද ස්ථවිරයන් වහන්සේ විසින් මෙය සමාදරයෙන් පිළිගත් බැව් මෙහි කියා තිබේ. මේ පොත කාටත් ප්‍රයෝජනවත් එකකි. විශෙෂයෙන්ම පාඨශාලාවල ශිෂ්‍යයන් විසින් මෙය පරිශීලනය කටයුතු බැව් කියමු. අර්ථව්‍යාඛ්‍යානයේ යම් කිසි දෝෂාංශුවක් දක්නා ලැබෙතත් මෙයින් ගත යුතු ප්‍රයෝජනයට ඒ කිසිසේත් බාධක නොවේ.

මෙහි 2 වෙනි පිටේ 'පවත්නෙමු' යනු පවත්වන්නෙමු විය යුතුයි. 10 වෙනි පිටේ මේ ප්‍රසිද්ධිය යන්න වෙනුවට මේ නියමය යන්න යොදන ලද්දේ නම් වඩා මැනවි. එය තර්කශාස්ත්‍රීය ව්‍යාඛ්‍යාර්ථ යෝජනා ගානවේ, 12ස් වෙනි පිටේ භොති යනු 'අභොසි' විය යුතුයි. ලෝකාර්ථ සිද්ධිය සඳහා යථොක්ත අර්ථ ව්‍යාඛ්‍යානය සම්පාදනය කොට ප්‍රසිද්ධ කරවූ විදුරුපොල පියතිස්ස සාමීන්වහන්සේගේ අකුටිලාධ්‍යාසයෙන් පසසම්හ.

පියතිස්ස සාමීන්වහන්සේ රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙණෙහි ශාස්ත්‍රෝද්ග්‍රහණය කළ ශික්ෂාකාමී කෙනෙකි. මුන් වහන්සේ මින් නොනැවතී මතුද ස්වකීය ශාස්ත්‍රඥානය තව දියුණු වන සේ ක්‍රියාකරණු දකිනු කැමැත්තෙමු. තමන් ඉගෙණගත් ශාස්ත්‍රය අභාවිතත්වයට පැමිණිය නොදී එය දියුණු කරගැණීමට උත්සාහ ගත යුතුයි, බොහෝ දෙන යමක් යමක් ඉගෙණගත් පසු එය දියුණු කර නොගෙණ උද්ධච්චසහගතව සිටින බැව් නොයෙක් විට අසන්ට දකින්ට ලැබේ, මෙබන්දන්ගේ ශාස්ත්‍රඥානය ක්‍රමයෙන් පිරිහීමට පැමිණේ. සමහරු පොතක් ශුද්ධකර ප්‍රසිද්ධ කළ පමණින් පණ්ඩිතමානීව ශාස්ත්‍රඥානය දියුණු කරගැණීමට උත්සාහ නොගණිති, ස්වකීය ශාස්ත්‍රඥානය

පිරිහිය නොදී විපුලත්වයට පැමිණෙන සේ ක්‍රියා කිරීම ගිහි පැවිදි තැනැත්තන්ගේ යුතුකමකි.

ධර්මානන්ද ස්ථවිරයන් වහන්සේගේ ප්‍රධානත්වය පිට පවත්වන මේ පිරිවෙණේ ශාස්ත්‍රෝද්ග්‍රහණය කළ ශිෂ්‍යයන්ගෙන් විටින් විට කෙරෙණ ලෝකාර්ථදයක වැඩ ගැණ කල්පනා කර බලන කල මේ පිරිවෙණ කෙරෙහි කවුරු විසිනුත් සමාදර කටයුතු බැව් පෙණේ. පරම ධම්මචේතිය පිරිවෙණ චිරස්ථායිව පවත්වා ගැණීමට උත්සාහිව ක්‍රියා කිරීම විශේෂයෙන්ම එහි දයක පිරිසගේ බලවත් යුතුකමකි, යථොක්ත පිරිවෙණ යම්තාක් කල් නිරුපද්‍රව පවතීද ඒතාක් කල් ලෙව් සසුන් දෙකටම අනල්ප ශුභසිද්ධිදයක වේමය. රත්මලානේද, ඒ අවට ද බෞද්ධ ජනයා පරාංමුඛ නො වී පිරිවෙණේ චිරස්ථිතිය සඳහා යථා ශක්තීන් ආධාරෝපකාර කටයුතු බැව් කියම්හ.''

'සරසවි සඳරැස'
1901 දෙසැම්බර 10

මේ ආකාරයෙන් විදුරුපොළ පියතිස්ස දහර සාමණේරයන් වහන්සේ ස්වීය ප්‍රථම කෘතියෙන්ම වියත් ලෝකයා අතර පුහුණු ගත්කරුවකු ලබන කීර්තියේ හිමිකරුවාණ කෙනෙක් වූහ.

## සුගතාලංකාරෝ*

විදුරුපොළ පියතිස්ස සාමණේරයන් වහන්සේ තම පළමු වැනි කෘතිය සපයා වසරකට පසු මේ දෙවැනි කෘතිය රචනා කළහ. බුදුරජාණන් වහන්සේගේ ගුණ අතර සුගත ගුණය වස්තු කොට ගත් මේ කාව්‍යය මූලික ගාථා 144 කින් ද, ග්‍රන්ථ කර්තෘ සන්දර්ශන ඇතුළත් තවත් ගාථා 11 කින් ද යුක්ත ය. කතුවරයාගේ භාෂා නිපුණත්වය තහවුරු කිරීමට මෙන් දුෂ්කර යමක බන්ධන ගාථා කීපයක් ද යොද තිබේ. වෘත්ත විසින් විවිධ වෘත්තවලින් සමුල්ලසිත ය.

මෙහි විඥාපනය කතුවරයන් වහන්සේ පාළියෙන් ම ලියා ඇති අතර එයින් මෙබන්දක් රචනා කිරීමට හේතු වූ තම පසුබිම ද දක්වා තිබේ. මෙයට සැපයූ ඉංග්‍රීසි ප්‍රස්තාවනාවක් ද වෙයි. එය සපයා ඇත්තේ වලපනේ රටේ මහත්මයා වූ **පී. බී. අලවතුගොඩ** මහතා විසිනි. විදුරුපොළ පියතිස්ස හිමියන්ගේ ගිහි පැවිදි පරම්පරා තොරතුරු කෙටියෙන් දක්වා ඇති එහි උන්වහන්සේගේ අධ්‍යාපනික සුදුසුකම් ද සංක්ෂිප්ත ලෙස හඳුන්වා තිබේ. අටළොස් වැනි වියේ මෙය රචනා කළත් මුද්‍රණය කොට ඇත්තේ ඊට අවුරුදු පසළොසකට පමණ පසුව බව පෙනේ.

---

* **ප්‍රකාශනය; ජේ. ඩී. ප්‍රනාන්දු**
**මුද්‍රණය; ග්‍රන්ථප්‍රකාශ මුද්‍රණාලය, කොළඹ.**
**ප්‍රමාණය; ඩිමයි පිටු: 28**
**ප්‍රකාශිත වර්ෂය; ක්‍රි: ව: 1912**

අපරිමිත භක්තියෙන් බුදුගුණ ගාථා දහස් ගණනක් රචනා කළ විදුරුපොළ **පියතිස්ස** යතිවරයන් වහන්සේගේ ආදිම බුදුගුණ කාව්‍යය හැටියට මෙම සුගතාලංකාරය හැඳින්විය හැකි ය. බුදුගුණ ප්‍රකාශිත භක්තිකාව්‍යයක් හැටියට පසු කාලයේ අතිමහත් ප්‍රසිද්ධියක් උසුලමින් විශේෂ වාර්තාවක් පිහිටුවා ඇති ''කමලඤ්ජලී'' වැනි මහඟු කවක් කිරීමට උන්වහන්සේ පෙරහුරුවක් ලද්දේ මෙම කාවෙනැයි සැලකිය හැකි ය.

මෙරට පාළිසාහිත්‍යය පිළිබඳ වංශකථාව ලියූ ලාංකික විද්වත් වියතුන් කිප දෙනාට ම මේ පොත මුණ නොගැසීම මහත් පාඩුවකි. අනාගත සංස්කරණවල දී හෝ මෙය එක් කළ යුතු බව අවධාරණය කළයුතු ව ඇත.

## අභිනව සාසනවංසො*

සාසනඉතිහාසය කියැවෙන වංසකථාව සාසනවංසය හැටියට හැඳින් වෙන අතර මීට පෙර ද එබඳු වංසකථාවක් ලියැවී තිබුණු නිසා මේ කාව්‍යය අභිනව සාසනවංසය නමින් නම් කැරිණ. මෙය ද විදුරුපොළ **පියතිස්ස** යතිවරයන් වහන්සේ සාමණේර අවධියේ ම රචනා කරන ලද්දකි.

1899 අගෝස්තු 18 දින උන්වහන්සේ ලද උපසම්පද ශීලය නිමිති කරගෙන ගරු සංඝසභාව වෙත මේ පාළිකාව්‍යය ඉදිරිපත් කරන ලදී. සතුටට පත් සංඝසභාව ''සිරි පවර වජිරඤාණාලංකාර'' යන ගෞරව නාමය උන්වහන්සේ වෙත පිරිනමන්නට යෙදිණ. මුද්‍රිත ග්‍රන්ථය පිරිනමා ඇත්තේ එකල පාළිය පිළිබඳ ව විශාරද පඬිවරයකු වශයෙන් කීර්තිමත් ව සිටි වස්කඩුවේ **සුභූති** නාහිමිපාණන්හට යි.

මෙහි ගාථා සියල්ල 160 කි. ඒවා පරිච්ඡේද හතරකට ද, ග්‍රන්ථ සමාප්ති හා ආචාර්යප්‍රශංසා යැයි තව කොටස් දෙකකට ද වර්ග කොට ඇත. පළමුවැනි පරිච්ඡේදයට උපන්‍යාසයක් සහිත මුල පටන් සාසනය පිළිබඳ සංක්ෂිප්ත ඉතිහාසය ඇතුළත් වෙයි. එය ගාථා 37 කින් නිමාව දකී. දෙවැනි පරිච්ඡේදයේ අන්තර්ගතයට අමරපුර නිකායේ ආරම්භය හා උඩරට අමරපුර නිකායේ ආරම්භය ඇතුළත් වෙයි. තුන්වැනි පරිච්ඡේදයේ අන්තර් ගත වන්නේ සබරගමුව, ඌව දිසාවල උඩරට අමරපුර නිකාය ව්‍යාප්ත වී යාම ය. හතරවැනි පරිච්ඡේදය විදුරුපොළ රතනජෝති මහානායක හිමියන් දක්වා නිකායික පුවත් ආවරණය කැරෙයි.

ග්‍රන්ථ සමාප්තියේ දී තමා පිළිබඳ තොරතුරු ද ආචරියප්පසංසාවේ දී ආචාර්ය, ප්‍රාචාර්ය, ධර්මාචාර්ය හිමිවරුන්ට ප්‍රශංසාත්මක වැනුම් ද ඇතුළත් කොට ඇත. වෘත විසින් විවිධ, රසවත් ලෙස ගැයිය හැකි, වෘත ම කතුවරයා තෝරා ගෙන ඇති අතර හැම පරිච්ඡෙදවසානයක් ම භින්න වෘත්තයෙන් නිම කොට ඇත.

---
* මුද්‍රණය: ජිනාලංකාර යන්ත්‍රාලය, කොළඹ.
ප්‍රමාණය; ඩිමයි පිටු: 20
ප්‍රකාශිත වර්ෂය; 2443/1900

සාසනවංසකථාව ගාථාවලට නැඟීම වැනි මහා භාරදූර කටයුත්තක් ළාබාල සාමණේර හිමි නමක් අතින් මෙතරම් සාරවත් ව නිමවීම පිළිබඳ වියතුන්ගේ ප්‍රශංසා විදුරුපොළ පියතිස්ස යතිවරයන් වහන්සේ කරා ගලා එන්නට විය. පුවත්පත් සඟරා වැනි ජනමාධ්‍ය තුළින් ද උන්වහන්සේගේ එම් සාසනික වැයම අගය කරන ලදී.

පාළිසාහිත්‍යය ගැන පොත් ලියූ වියතුන් අතින් මේ පොත ද ගිළිහී ගිය ග්‍රන්ථයකි.

## ම්‍රම්මවංශ කතිකාවත*

උඩරට අමරපුරනිකාය සඳහා මුද්‍රණයෙන් පිටකළ කතිකාවත මෙය දෝ යි සිතේ. මීට පෙර ද නිකායික ප්‍රතිපත්ති හා පරිපාලන කටයුතු සඳහා යම් යම් පොදු සම්මත ව්‍යවස්ථා තිබුණ නමුත් ඒවා මුද්‍රණයෙන් පිටකර බෙදා හැරීමට තරම් අවශ්‍යතා තිබී නැත.

මෙහි නිර්මාතෘවරයා ඒ වන විට දෙවිසි විය ද නො ඉක්මවා සිටි පියතිස්ස හිමිපාණෝ ය. උන්වහන්සේ විසින් ස්වමතානුකූල වැ මේ ව්‍යවස්ථා මාලාව සකස් කොට යෝග්‍ය නම් පිළිගන්නැයි සංඝසභාවට ඉදිරිපත් කොට ඇත. සංඝසභාව එය පිළිගෙන දුන් සහතික පත්‍රය ද මේ ග්‍රන්ථයේ මුලට යොදා තිබේ. එය මෙසේ ය :

### ම්‍රම්මවංශ කතිකාවත

''ඌවේ විදුරුපොළ සුමංගලාරාමවාසි සිරි පවර වජිරඤාණාලංකාර පියතිස්ස තැන විසින් ඌව දිශාවේ අප අමරපුර නිකායයේ චිරස්ථිතිය සඳහා සම්පාදනය කරන ලද ''ම්‍රම්මවංශ කතිකාවත'' නම් වූ මෙම ප්‍රකරණයෙහි සඳහන් සියළු සිරිත් අප නිකායේ සියළු භික්ෂූන් විසින් නොපිරිහෙලා පැවැත්විය යුතු බවට සහතික කොට මහාසංඝයා වහන්සේ වෙනුවෙන් අත්සන් කළේ.

1. විදුරුපොල් සුමංගලාරාමවාසි, රතනජොතාභිධාන නායක ස්ථවිර.
2. බෙරලියපොල සුදස්සනාරාමාධිවාසී ධම්මානන්ද, ස්ථවිර.
3. මිරහවත්තේ පුප්පාරාමාධිවාසී, ධම්මරතන තෙරුන්නාන්සේ.
4. මැදවෙල ජිනජොතිකාරාමවාසී, ගුණරතන තෙරුන්නාන්සේ.
5. තුප්පිටියේ තපොධනාරාමවාසී, වැ. ධම්මරතන තෙරුන්නාන්සේ

ශ්‍රී බුද්ධවර්ෂ 2446 වැන්නෙහි
වප්මස පුර 15 වක ලත් ගුරු දින.''

* ---

මුද්‍රණය: ජිනාලංකාර යන්ත්‍රාලය, කොළඹ.
ප්‍රමාණය; සිමයි පිටු: 12
ප්‍රකාශිත වර්ෂය; 2446/1902

අද සිරිත මෙබන්දකට සංඝසභාවේ නිලධාරී හිමිවරුන් අත්සන් තැබීම විනා වෙනත් අය අත්සන් තැබීම නො වේ. එහෙත්, මෙයට මහානායක හිමියන් ද එද ප්‍රසිද්ධ වැ සිටි මහතෙරවරුන් වහන්සේ හතර නමක් ද අත්සන් තබා ඇත. ඒත් නිල මට්ටමින් නො වේ. මෙසේ කරන්නට හේතුව නිකායික භික්ෂූන් අතර එය වඩාත් තහවුරු ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් විය හැකි ය.

මෙම කතිකාවත ආරම්භ කරන්නේ සංස්කෘත ශ්ලෝකයකිනි. ශාසනික කතිකාවතක දී එහි ආරම්භය පාළි ගාථාවකට හෝ කීපයකට හිමි නො කොට සංස්කෘත ශ්ලෝකයකට හිමි කිරීම විශේෂත්වයකි.

**මාතෘකා පාඨ** දහයක් යටතේ පොත විස්තර කොට ඇත. **ඒවා** මෙසේ යි :

1. නිකාය ප්‍රවෘත්ති
2. පැවිදි උපසම්පද කිරීම
3. ළදරු භික්ෂූන්ගේ පැවතීම
4. පොහොය පවාරණ කිරීම
5. අබ්භාණ කිරීම
6. අධිකරණ විනිශ්චය
7. සංඝික ස්ථානාදි පරිහරණය
8. සඟසතු පිරිකර බෙදීම.
9. පිරිත් දෙසීම
10. උගත් භික්ෂූන් හා සාසනික කටයුතු.

පරිපාලනමය කාර්යවලට වඩා ප්‍රතිපත්තිමය කටයුතුවලට මුල් තැනක් දී ඇති බව මේ මාතෘකා පාඨ දෙස විමසිලිමත් වැ බැලීමේ දී පැහැදිලි වෙයි. භික්ෂු පිරිසගේ විනයානුකූල ප්‍රතිපත්තියට හා ආචාර සම්පත්තියට මූල් තැනක් දී මේ නීති මාලාව සකස් කොට ඇති බවත් පැනේ. එය එකල ප්‍රබල අවශ්‍යතාවක් වූවාට නිසැක වේ. මෙය ප්‍රසිද්ධියට පත් තැන් පටන් නිකායික භික්ෂූන් වහන්සේ ඒ අනුව හැම දෙනාම එකම ආකාරයකට සාසනික කටයුතුවල නිරත වන්නට ඇතැයි සිතීම අසාධාරණ නො වේ.

## දිට්ඨන්තරතනාවලී*

මෙම කෘතිය පාළි භාෂාවෙහි නව ආරක කාව්‍යයකි. ජීවිතයට ප්‍රයෝජනවත් වන නා නා උපදෙස් දීම මෙම කාව්‍යයෙන් කැරෙන නිසා මෙය පාළියෙහි පැනෙන දුලබ විෂයකට අයත් වන කාව්‍යග්‍රන්ථයකි.

---

* **ප්‍රකාශනය;** යූ. පී. ඒකනායක සහ සමාගම
**මුද්‍රණය;** ශ්‍රී භාරතී යන්ත්‍රාලය, කොළඹ.
**ප්‍රමාණය;** ඩිමයි පිටු: 61
**ප්‍රකාශිත වර්ෂය;** ක්‍රි: ව: 1926

මෙහි ස්වරූපය ගාථාවෙහි මුල් අර්ධයෙන් උපදේශයත්, ඊළඟ අර්ධයෙන් සුදුසු නිදර්ශනයකුත් දක්වීමේ සම්ප්‍රදායාත්මක පිළිවෙළයි. එබඳු කියුම් ආලංකාරිකයෝ දෘෂ්ටාන්තාලංකාර යැයි ගත්හ.

දෘෂ්ටාන්තශතකයෙන් මේ කාව්‍යය වෙන් වන්නේ භාෂාවෙන් පමණකැයි කතුවරයන් වහන්සේ ම තම සංඥාපනයෙන් කියති. ගාථා සංඛ්‍යාව ද මෙහි වැඩි ව සිටී. කතුවරයන් වහන්සේ ම ප්‍රසිද්ධියට පත් කළ සන්න සහිත දෘෂ්ටාන්තශතකය මෙබන්දක් පාළියෙන් ලියන්නට උපකාර වූවාට සැක නැත. මෙය පියවර කීපයක දී රචනා කළ එකක් බව සඳහන් වන නිසා ක්‍රමයෙන් සංවර්ධනය වූ කාව්‍යයක් වශයෙන් හැඳින්විය හැකි ය.

මේ ග්‍රන්ථයෙහි කොටසක් ප්‍රථමවරට ප්‍රසිද්ධියට පත්වූයේ උසස් ශාස්ත්‍රීය සඟරාවක් වූ **සිරිසර සඟරාව**[1] තුළිනි.

මෙහි සිංහල භාවය සහිත ගාථා දෙසිය පනසෙකි. ග්‍රන්ථ කර්තෘ සන්දර්ශන වශයෙන් ලියැවුණ තවද ගාථා විස්සෙකි. පාළි භාෂාවේ හා සම්බුද්ධ ශාසනයේ පැවැත්මත්, ස්ථිරත්වයත් සඳහා කරන ශාසනික මෙහෙවරට උපහාර වශයෙන් මේ ග්‍රන්ථය පිළිගන්වා ඇත්තේ වෛද්‍යාචාර්ය **සී. ඒ. හේවාවිතාරණ** මැතිතුමාට ය. සාතිශය ප්‍රීතියෙන් හා ගෞරවයෙන් එතුමා මෙය පිළිගත් බව සඳහන් වෙයි.

ජීවිතයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය සදුපදේශයන්ගෙන් මේ ග්‍රන්ථය පිරී ඇත. හැඩ ගැසෙන ජීවිතවලට මෙබඳු පොතපත මඟින් ලබාගත හැකි ආදර්ශ අප්‍රමාණ ය. එහෙත්, මේ පොත පිරුවින්වල ශ්‍රේණියක පාඨ ග්‍රන්ථයක් වශයෙන්වත් නියම නො කිරීමෙන් පෙනෙන්නේ අප රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙන අවාසනාවන්ත තත්ත්වය යි. විභාග සඳහා නියම කිරීමක් ගැන කවර කථා ද ?

## භාව සන්න සහිත කමලඤ්ජලි*

පාළි භාෂාවෙන් මේ සියවසේ ලියැවුණු ශ්‍රේෂ්ඨ බුද්ධ භක්තිකාව්‍යය හැටියට කීර්තියක් ලබාගත් කමලඤ්ජලිය රසික සිත් සතන් ප්‍රබෝධවත් කළ බහු ජනාදරයට පත් කමනීය නිබන්ධයකි. විදුරුපොළ **පියතිස්ස මා හිමියන්ගේ** කාව්‍ය අතර රසනිෂ්පත්තිය අතින් පිරි කවක් **හැටියට** ද, ස්වයං ප්‍රතිභානයට නිදසුන් කළ හැකි ස්වාධීන නිර්මාණාත්මක කාව්‍යයක්

1 සිරිසර සඟරා; පිටු: 619. 856, 889
මුද්‍රිත වර්ෂය; ක්‍රි; ව; 1920

* ප්‍රථම මුද්‍රණය: මහාබෝධි යන්ත්‍රාලය, කොළඹ.
මුද්‍රිත වර්ෂය; ක්‍රි: ව; 1940
ද්විතීය මුද්‍රණය; සේපාලි මුද්‍රණාලය, රුවන්එළිය.
ප්‍රකාශනය; ශ්‍රී පියතිස්ස පරිවෙණාධාර සභාව
ප්‍රමාණය; ක්‍රවුන් පිටු: 44

හැටියට ද, උන්වහන්සේගේ කාව්‍ය අතර මුල් පෙළට ගැනෙන්නකි. මෙහි එන ගාථාවලින් කියැවෙන අදහස් පරිපෝෂණයට හේතු වී ඇත්තේ භාවිත වෘත්තය තාලය හා අපූර්වතම පද සංඝටනාව යි. මුළු කාව්‍යය පුරාම භක්තිය, නිවිර කිරීමට එම බාහිර අංග සපුරා වහල් වැ සිටී.

මෙම කව ගාථා 60 කින් පිරී ඇති අතර කර්තෘ සන්දර්ශනාත්මක අතිරේක ගාථා තුනකින් ද යුක්ත ය. ජනප්‍රිය කමලා වෘත්තයෙන් මෙහි ගාථා සියල්ල රචිත අතර මුළු කාව්‍යය ම කොටස් හතරකට වර්ග කොට ඇත. එයින් **පණාමඤ්ජලිපූජනා** නම් පළමු කොටසට ගාථා තුදුසක් අයත් වේ. **පරමභත්තිප්පවේදනා** නම් දෙවැනි කොටසට ගාථා හතක් අයත් ය. **සතිවිප්පවාසඛමනාව** නම් තෙවැනි කොටසට අටළොසකි. **සරණායාචනා** නම් සිවුවැනි කොටසට ගාථා එක් විස්සක් අයත් වේ.

රාජකීය පණ්ඩිත විදුරුපොළ **පියතිස්ස** මා හිමියන් වහන්සේ ගේ හැට වැනි ජන්ම සංවත්සරය සමරා මේ කාව්‍යය ගාථා හැටකින් සම්පූර්ණ කළ බව කතුවරයන් වහන්සේ සිය සංඥාපනයෙන් පවසති. ලංකාවේ පාළි ග්‍රන්ථ සියල්ල හැඳින්වී ඇති ''පාළිසාහිත්‍යය'' නම් කාණ්ඩ දෙකකින් පරිමිත ග්‍රන්ථයට ඊට අවුරුදු 14 ට කලින් මුද්‍රණයවූ ද, පුවත්පත් සඟරා ආදි ජනමාධ්‍ය තුළින් විශාල කීර්තියක් ලැබුවා වූ ද, මේ කාව්‍යය ඇතුළත් නො වීම සංවේගයට කරුණකි.

මේ රසබර සුමිහිරි කාව්‍යයට ද අප රටේ ප්‍රාචීන අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් මෙන් ම පාරිවේණික අධ්‍යාපනයෙන් ද නිසි සැලකිලි තවම ලැබී නැත. එහෙත්, මෙය දෙවරක් ම මුද්‍රණය+ වීමෙන් බහු ජනාදරයට පත් වූවක් බවත්, එසේ ම ඉංග්‍රීසි භාෂාවටද සපුරා පරිවර්තනය වූවක් බවත්, කියයුතු වේ. මෙයින් එය භාෂාන්තර හා දේශාන්තර ප්‍රසිද්ධියට ද පත් විය.

## KAMALAÑJALI*
## ඉංග්‍රීසි පරිවර්තනය

කමලඤ්ජලී කාව්‍යය ප්‍රසිද්ධියට පත් වැ අවුරුදු දෙළොසකට පසු එහි සම්පූර්ණ ඉංග්‍රීසි පරිවර්තනයක් ද නිකුත් වීමෙන් මෙතෙක් පාළි භාෂාව දත් පාඨකයන් හට ම ඇවිරී තිබුණු මේ කාව්‍යය ඉංග්‍රීසි පාඨකයන් අතර ද

+ මුද්‍රණය: ඡේපාලි මුද්‍රණාලය, රුවන්එළිය.
මුද්‍රිත වර්ෂය; 1962

* *Translated by*
BHIKKHU BUDDHARAKKHITA
*Published by*
Mrs. N. Moonesinghe,
Maha-Bodhi Press, Colombo.
*Pages* 48
*C. E.* 1952

ප්‍රචලිත වීමෙන් දේශීය වශයෙන් මෙන් ම දේශාන්තරික වශයෙන් ද මහත් කීර්තියක් ලබන මහඟු කාව්‍යයක් බවට පත්විණ. මෙහි පරිවර්තක කර්තෘ වූයේ විදුරුපොළ මා හිමියන් වහන්සේගේ ම ශිෂ්‍යයෙකු වූ භාරතයේ **බුද්ධරක්ඛිත** ස්ථවිරයන් වහන්සේ ය.

පොතේ සැලැස්ම හැම ගාථාවක් ම පළමු කොට ඉංග්‍රීසි අකුරින් දක්වා අනතුරුව ඉංග්‍රීසියෙන් තේරුම ඉදිරිපත් කිරීම යි. ගාථාවක් පාසාම එන ගැටලු වදන්වලට පරිකථා විස්තර ඉංග්‍රීසියෙන් ම දක්වා ඇත. පරිවර්තක ස්ථවිරයන් වහන්සේ මේ සඳහා ලියා ඇති ප්‍රස්තාවනාව මෙම කාව්‍යය ගැන පමණක් නොව භක්තිකාව්‍ය විෂයයම අළලා ලියා ඇත්තකි. එම හැඳින්වීම මහත්ව පූර්ණ ය. පිටු නවයකින් පරිමිත ය.

මහාචාර්ය **ජී. පී. මලලසේකර** මහතා ලියූ සාරගර්භ ප්‍රස්තාවනාවකින් ද උපලක්ෂිත ය. **බුද්ධරක්ඛිත** ස්ථවිරයන් වහන්සේගේ හැඳින්වීමෙන්* උපුටාගත් කොටස් කීපයක සිංහල පරිවර්තනය මෙසේ ය :

> ''මෙම කෘතිය ගෞරවාර්හ විදුරුපොළ පියතිස්ස මහා නායක ස්වාමිපාදයන් වහන්සේ විසින් පාළි භාෂාවෙන් රචනා කරන ලද බෞද්ධ භක්තිය පිළිබඳ **කමලඤ්ජලී** නම් වූ අගනා කාව්‍ය සංග්‍රහයේ පද්‍ය පරිවර්තනයකි.
>
> 'භක්තිය' යන්නෙහි බෞද්ධ අර්ථ නිරූපණය (පිළිබඳ ව) බොහෝ විට විකෘත ලෙස, වැරදි ලෙස හා අරුම පුදුම ලෙස භාවිත කරන හෙයින් ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ. අවාසනාවකට මෙන් බුදු දහම ආශ්‍රිත කරුණු පිළිබඳ ව ලියන වියතුන් මෙතෙක් මේ වැදගත් අංගය ගැන අවධානය යොමු කර නැත.
>
> මෙම ග්‍රන්ථය වියත් කෘතියක් ලෙස හෝ එම විෂය ගැන ගැඹුරු ලෙස විමර්ශනය කරන්නක් ලෙස ඉඟි කිරීමක් හෝ නො කෙරේ. මෙය විවිධ විෂයයන්ගේ සත්‍ය සෙවීමට උත්සාහ කරන ශිෂ්‍යයකුගේ නිහතමානී වෑයමක් පමණි. එම නිසා අනිවාර්යයෙන් ම මෙවැනි කෘතියක අඩුපාඩු තිබිය හැක. එහෙත් මෙකී විෂයය සම්බන්ධයෙන් ගැඹුරු ලෙස අධ්‍යයනය කිරීමට සමත් වියතුන්ගේ උනන්දුව ඇවිස්සීමට එම අඩුපාඩු හේතු වේවයි ඉත සිතින් ප්‍රාර්ථනය කෙරේ.
>
> බෞද්ධධර්මයට අනුකූල ව භක්තිය යන්නෙහි නිවැරදි අර්ථය විදහා දැක්වීමට මෙම කෘතිය වෙර දරන අතර ම, අදාළ විෂයය ගැන ප්‍රචලිත සාවද්‍ය හා විකෘත අර්ථ නිරූපණ ආදිය නිවරද කිරීමට හා බැහැර කිරීමට මෙයින් අදහස් කෙරේ. පුළුල් වශයෙන් බලන කල

---

* Introduction, Kamalañjali

විකෘත කිරීම් පැන නගින්නේ දෙයාකාරයකිනි. එක් අතකින් හින්දු භක්තිකයෝ බුදුරජාණන් වහන්සේ අවතාරයක් හෝ විෂ්ණු දෙවියන්ගේ ප්‍රතිමූර්තියක් ලෙස සලකති. වීරයින් වන්දනා කිරීම උගන්වන අවතාරවාදය නම් වූ රළු (අසංස්කෘතික) දේව කථා ශාස්ත්‍රයෙන් මතුවන මෙය පුහු නන්දෙඩවිල්ලකි.

ප්‍රශස්ත වශයෙන් ගත් කල, බලවත් හැඟීම් දනවන, සැප ජීවිතයෙහි ඇල්ම ඇති කරවන, නිතරම ඉන්ද්‍රියයන් පිනවීමට මගක් පමණක් වන්නා වූ භක්තිය, න්‍යායට අනුව කාමුක ය. මේ සියල්ල බෞද්ධ චින්තනයට නුහුරු ය ; අත්‍යන්තයෙන් පටහැනි ය ; පිළිකුල් සහගත ය. හැරත්, යම් හෙයකින් එතුමා දෙවියකු හෝ දෙවියකුගේ ප්‍රතිමූර්තියක් ලෙස සැලකුව ද, මුළුමනින් ම සාංසාරික වෙළුමින් මිදුණු, පුනරුප්පත්තියක් ලැබීමට ඇති හැකියාවන් ඉක්ම වූ, උදාර වූත්, ලෝකෝත්තර වූත්, බෞද්ධත්වය පහත් කොට සැලකීම හෝ පෘථග්ජනයකු හා සම කිරීම වැනි නීච වැයමක් තවත් නැත. එම නිසා එවැනි න්‍යායක් බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වල හරයට පටහැනි ව ඉස්මතු වනවා පමණක් නොව, පොදු මහජනතාවගෙන් සත්‍යය වසන් කිරීම සඳහා ආත්මාර්ථ කාමී පුද්ගලයන් විසින් හිතා මතා කරන ලද උපාය මාර්ගයක් ද වන්නේ ය. අනෙක් කොටස සමන්විත වන්නේ තමන් විද්‍යාත්මක හෝ යථාර්ථවාදී බුද්ධාගම අදහන බව ප්‍රකාශ කරන කොටසෙනි. 'භක්තිය' යනුවෙන් දෙයක් නැතැයි පවසන මෙම ව්‍යාජ බෞද්ධයෝ, කෙනෙකුට පාලනය කළ නොහැකි උද්වේගය යනුවෙන් මානසික ස්වභාවයක් ඇතැයි යන සත්‍යය බැහැර කරමින්, බුද්ධාගම මුළුමනින් ම යථාර්ථවාදී ආගමක් ලෙස හඳුන්වති. මේ තත්ත්වය අනෙක් අන්තවාදය වේ.

මේ විෂය පිළිබඳ ව පාළි භාෂාවෙන් ලියැවුණු ග්‍රන්ථ කීපයක් හැරුනු විට, මෙතරම් විචිත්‍ර ව හා සරල ව ලියැවුණ වෙනත් කිසි පොත පතක් පරිවර්තකට දක්න ගන්නට නොලැබිණ. සමහර විට මෙම ග්‍රන්ථය රචනා කිරීමට හේතු වන්නට ඇත්තේ මේ හේතුව විය හැකි ය. භක්තිය යනු මානසික හෝ ආධ්‍යාත්මික ස්වභාවයක් නිසා, එය විචිත්‍ර ව ඉදිරිපත් කිරීමට නම් යොදා ගනු ලබන වචනවලින් බලය ලබා ගත යුතු නිසා එම කටයුත්ත උසස් මට්ටමකින් ඉටු කළයුතු ය. සංස්කාරකයාණන් වහන්සේ මෙම ග්‍රන්ථය සම්පාදනය කර ඇත්තේ කලින් සිතා මතා හෝ සැලසුම් කරගෙන සිට හෝ නො වේ. උන්වහන්සේගේ සැට වන ජන්ම දිනය ද යෙදුන කාලයෙහි භක්තිය මෙනෙහි කරමින් සිටි විට නිරායාසයෙන් ගලා ආවෙකි මේ. මෙලෙස භක්තියේ ප්‍රතිඵලයක් ලෙස බිහිවුණු මෙම පොත පරිවර්තනය කිරීමට ද එයම හේතු වූයේ ය.

සතර පාද පාළිගාථා හැටකින් සමන්විත මේ පොත සිවු පරිච්ඡේදයකට බෙදේ. පාළියෙන් ලියැවුණු ගාථාවෙහි අර්ථය පැහැදිලි

කරනු පිණිස ගාථාවට අනතුරුව සිංහල තේරුම ද යොද තිබේ. මෙම පරිවර්තනයෙහි ද, එම ක්‍රමය අනුගමනය කර ඇත.

'කමලඤ්ජලී' යන නම දෙමගකින් විස්තර කළ හැකි ය. කමල (නෙළුම් මල) අතෙහි රඳවා ගෙන කරන ප්‍රණාමය (අඤ්ජලී) එක් අරුතකි. අනෙක කමලා නම් වෘත්තයෙන් කෙරෙන ප්‍රණාමය (අඤ්ජලි) යනුයි.

පළමුවන පරිච්ඡේදයේ මුල් ගාථා තුන 'බුදුරජාණන් වහන්සේගේ නිකෙලෙස් වූ පාදපද්ම වන්දනා කරමි' යනුවෙන් ආරම්භ වන්නේ වන්දනාමාන කිරීමේ ගෞරවාන්විත ම ආකාරය පෙන්වමිනි. මේ කොටස කියවන විට බුදුරජාණන් වහන්සේගේ ජීවිතයෙහි, සම්බෝධි යට පත්වීම වැනි අවස්ථා ද මහා පුරුෂලක්ෂණ වැනි උන්වහන්සේට ම ආවේණික වූ දේහ ලක්ෂණ ද, උන්වහන්සේගේ ගුණ සමුදය ද භක්ති වන්තයන්ගේ සිතට නිරායාසයෙන් ම නැඟෙනු ඇත. බුදුරජාණන් වහන්සේගේ ත්‍රෛලෝකාග්‍ර සම්මාසම්බෝධියට පැමිණීමේ උත්තරීතර අවස්ථාව, බෞද්ධ භක්තිමත් බවේ විශේෂ සිද්ධියක් බවට පත්වන්නේ, එමඟින් බොදු බැතිමතුන්ට නිත්‍ය බලාපොරොත්තුවත්, අචල විශ්වාස යක් හා සැම බැතිමතකුට ම පැමිණිය හැකි උත්තරීතර තත්ත්වයත් පිළිබඳ ව උරුමයක් ද ලැබෙන සතුටත් හා සුරක්ෂිත භාවයත් ලැබෙන හෙයිනි. ඍජු සාක්ෂ්‍යයක් වන මෙයින් ගැඹුරු සත්‍ය පිළිබඳ ව දළ හැඟීමක් බැතිමතුන් තුළ ඇති වේ. 'ලක්ෂණ' යනු නායකත්වයේ ලක්ෂණ වේ. ගුණ සමුදයෙන් පැහැදිලි වන්නේ උන්වහන්සේ තුළ සත්‍යය හා යථාර්ථය තේරුම් ගෙන එම මාර්ගයට මෙහෙයවීමට ඇති හැකියාව යි. ලක්ෂණ මඟින් බුදුරජාණන් වහන්සේගේ නිශ්චල හා සාන්තභාවය පිරිසිදු ඓතිහාසික ස්වභාවයත් මඟින් විදහා දැක්වීමට අවකාශ ලැබේ. සංකේත මඟින් ඉදිරිපත් කෙරෙන තේරුම් නිවැරදි ලෙස උකහා ගැනීමටත්, දේහ ලක්ෂණවලින් පිළිබිඹු වන ස්වභාවයන් පිළිබඳ දැනුම පටු ආකාරයට සිතන පුද්ගලයනට ලබාදෙන නිසා මෙය ඉවත දැමිය නොහැකි ය. එබඳු මානසික ප්‍රතිරූප, ශාන්තභාවය පළ කෙරෙන සංකේත, ඥානය හා පාරිශුද්ධත්වය මඟින් සාමය උපශාන්ත භාවය ඉදිරිපත් කෙරේ.

දෙවන පරිච්ඡේදයෙන් ශ්‍රේෂ්ඨයාණන් වහන්සේ වෙත ඉතා දීර්ඝ හා පුළුල් ලෙස සතුට හා ආදරය, භක්තිය තවත් වර්ධනය කරන ආකාරයෙන් පෘථුල ස්වරූපයකින් ඉදිරිපත් කෙරේ. මෙම ආමන්ත්‍රණ ස්වරූපය බැතිමතුන්ගේ මනසෙහි ඇති වේ. (එහෙත් සම්බන්ධතාවක් ධ්වනිත නො වේ.) මෙහි ප්‍රධාන තේමාව වන්නේ පාරමිතාවය. ඉත දුෂ්කර හා දෘඪ කාර්යයන්ට ප්‍රබල සාධකයන් වන පාරමිතා තමන්ා විශ්වාස කරන කාර්යයක් හා අරමුණක් ඉටුකර ගැනීමට ආධාර වන

ස්වභාවයක් ඇත්තේ ය. මෙම උදර ප්‍රතිපත්ති සමඟ එක් කළ විට භක්තිය උතුම් අරමුණක් ඉටු කර ගැනීම සඳහා වෙහෙස වන, උදර, ආත්ම පරිත්‍යාගශීලී මාර්ගයන් බවට පත් වේ.

ඊ ළඟ පරිච්ඡේද දෙකෙහි භක්තිය යන්නෙහි ස්වරූපය වෙනස් වෙයි. සාංසාරික පැවැත්ම පිළිබඳ ස්වභාවය ගැන හැඟීමක් භක්තිවන්තයින් තුළ ඇති කෙරෙමින් භක්තිමය ක්‍රියා නව අදියරකට පත් වේ. තාත්විකත්වය අනුව වටහා ගතහොත් එමගින් සත්‍යය පිළිබඳ සම්පූර්ණයෙන් ම නව දර්ශනයක් ඇති වී තමන්ගේ අරමුණ අවබෝධ වන්නේ ය. සංසාරය පිළිබඳ ව යම් කෙනෙකුට කිසි බියක් ඇති නොවන තාක් කල් එහි පිහිට පැතීමට අවශ්‍ය නොවන්නේ ය. එම නිසා පිහිටක් ගැන අවශ්‍යතාව සිතෙහි ඇතිවීමට නම් යමෙකුට මායාවක් බඳු සොම්නස හා සන්තුෂ්ටිය විනිවිද යාම අවශ්‍ය වේ. සාංසාරික පැවතීමට හේතු වන තමන් පිළිබඳ හැඟීම නැති කිරීමට නම් අනිත්‍ය දුක්ඛ හා අනාත්ම යන සත්‍යය අනාවරණය කර ගත යුතු ය.''

මෙහි මුල් පාළි ග්‍රන්ථයේ මෙන් ම එහි ඉංග්‍රීසි පරිවර්තනයේ ද අගය ගැඹුරින් විමසමින් මහාචාර්ය ජී. පී. මලලසේකර මහතා ලියූ ප්‍රස්තාවනාවෙන්* උපුටාගත් කොටස් කීපයක සිංහල අනුවාදය යි මෙහි දැක්වෙන්නේ:

''බුදු දහමෙහි ඇදහීම හා වන්දනාව පිළිබඳ විද්වත් නිබන්ධන බොහෝ ලියැවී ඇති අතර මෙවැනි කෘතීන් බිහිවීම අනාගතයේ දීත් නිසැක ව ම සිදුවනු ඇත. ආගමික භක්තිය දනවන වස්තූන් සෙවීමට මිනිස් වර්ගයා ස්වභාවයෙන් නැඹුරු වන අතර, පුරාතන සමාජය ඒ සඳහා සුදුසු යම් වස්තුවක් පහළ වූ විට එම නැඹුරුව වඩාත් පැහැදිලි ලෙස විද්‍යමාන වේ. බෞද්ධයන් පිළිබඳ ව ද මෙම න්‍යාය සත්‍යයකි. බුදුරජාණන් වහන්සේගේ ජීවිත කාලය තුළ ම උන්වහන්සේගේ ශ්‍රාවකයන් වූ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ම උන්වහන්සේට ගරු බුහුමන් දක්වූයේ උන්වහන්සේගේ ළෙන්ගතු ගති ලක්ෂණවලට මෙන් ම ඔවුන්ගේ මාර්ගෝපදේශකයා, දර්ශනිකයා හා කල්‍යාණ මිත්‍රයා වූ බැවිනි. තම ගුරුවරයාට වැඳුම් පිදුම් කිරීම පෙරදිග ජනයාගේ කැපී පෙනෙන ලක්ෂණයකි. බුදුරජාණන් වහන්සේ ගුරුවරයකු ලෙස ගතකළ කාලය වසර පනහක් තරම් දිවයයි. මෙය වෙනත් ආගම් කර්තෘවරුන් ගත කළ කාලයට වඩා වැඩි ය. පිරිනිවන්පාන අවස්ථාව වන විට උන් වහන්සේ මනා ලෙස සංවිධානය කළ සහ පරපුරක අධිපති ව සිටි අතර උන්වහන්සේගේ අනුගාමිකයන් ගිණිය හැකි වූයේ දහස් ගණනින් නොව දශලක්ෂ ගණනිනි.

* Foreword, Kamalañjali

පුද පූජා සහ උත්සව පැවැත්වීමත්, පුද්ගල වන්දනාවත් බුදුරජාණන් වහන්සේ විසින් අනුදැන නො වදළ බව සත්‍යයකි. එහෙත්, මිනිස් හදවතෙහි ඇතිවන ප්‍රාර්ථනා අනුදැන නො වදළීමෙන් හෝ අනුමත නො කිරීමෙන් යටපත් කළ නො හැකි ය. කෙතරම් පුළුල් හදවතක් ඇත්තෙකුගේ වුව ද මහා කාරුණිකයාණන් වහන්සේ පිළිබඳ ව ඇති වන භක්ත්‍යාදරය හා ගෞරවය නිරායාසයෙන් ම හදවතින් උතුරා යන්නේ ය. අසීමිත භක්ත්‍යාදරය කිසියම් ක්‍රමයකින් යටපත් කළ හැක්කේ නො වේ. ලෞකික නො වන දේ පිළිබඳ ව ඇතිවන ඇල්ම භක්තිය ලෙස සැලකේ. මෙහි උච්චතම අවස්ථාව වන්දනාවෙන් පිළිබිඹු වේ. එහෙයින් ඈත අතීතයේ සිට ම මේ දක්වා බොහෝ ස්ත්‍රී පුරුෂයන් ඔවුන්ගේ ශ්‍රේෂ්ඨ ආචාර්යයන් වහන්සේ වන බුදුරජාණන් වහන්සේ හද පත්ලෙන් නැගුණු ගෞරවය, ගීත නිබන්ධනයෙන් හා ගායනයෙන් පුද කිරීම පුදුමයට කරුණක් නො වේ.

මෙම කාව්‍යසංග්‍රහය නිබන්ධනය කිරීමෙන් සිය හැකියාව එම කර්තව්‍යය සඳහා එක් කළ ගෞරවාර්හ විදුරුපොළ පියතිස්ස මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, ඈත අතීතයේ සිට පැවත එන එම සම්ප්‍රදායෙහි ශ්‍රේෂ්ඨ අනුප්‍රාප්තිකයන් වහන්සේ බවට පත්වන්නෝ ය. එහෙයින් භක්ත්‍යාදරයෙන් අනූන වීමෙන් සුගම ශෛලියකින් ලිවීමෙන් අතිශය ජනප්‍රියතාවට පත් වූ විදුරුපොළ නා හිමියන්ගේ මෙම කෘතිය ඉංග්‍රීසියට පරිවර්තනය වීම මගේ ඉමහත් සතුටට හේතු වේ. මෙම පරිවර්තනයට අගනා පෙරවදනක් එක් කිරීමෙන් නා හිමියන්ගේ ශිෂ්‍ය **බුද්ධරක්ඛිත** හිමි ශ්‍රේෂ්ඨ සේවාවක් ඉටුකර ඇත්තේ ය.''

විදුරුපොළ මාහිමියන් තම ජීවිතයේ හැම අතින්ම පැසුණු අවධියේ රචනා කළ, මේ කාව්‍යය සුමධුර සුකෝමල සුලලිත බසින් සුබ නම්‍ය ය. උන්වහන්සේගේ තරුණ කාලයේ කාව්‍ය හා මෙම කාව්‍යය සසඳන විට අදහස් හා හැඟීම් අතින් මෙන්ම භාෂා ව්‍යවහාරය අතින් ද ඇති වෙනස්කම් මනාසේ දත හැකි වේ. රසික ජනතාවගේ අවශ්‍යතාවකට මෙන් උන්වහන්සේ මෙමම කාව්‍යයට පද්‍ය පාළි පද්‍ය රචනා විෂයයෙහි ව්‍යාපෘත නො වූහ. එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉංග්‍රීසි පාළි ශබ්දකෝෂය නිම කිරීමටත්, හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ කඩිනම් සංස්කරණ කීපයක කටයුතුවල නිරතවීමටත් කාලය යොදවන්නට වීමයි.

## II

## නෙත්තිප්පකරණට්ඨකථා[1]

බෞද්ධ ධර්මයෙහි ආදිම ප්‍රකරණ ග්‍රන්ථයක් වන නෙත්තිප්පකරණයෙහි අටුවාව යි මෙය. මෙහි කතුවරයා **ධම්මපාල** ආචාර්යවරයා ය.

බුද්ධධර්මය න්‍යායානුකූල වැ විග්‍රහ කිරීමට තැනූ **නෙත්තිප්පකරණය ථෙරවාද** සම්ප්‍රදයයෙහි ඇති ප්‍රධාන ම න්‍යාය ක්‍රමය යි. එබන්දකට විස්තර විවරණයක් සැපයීම සුකර කරුණක් නො වේ. ධර්මපාල ආචාර්යතුමා ඒ බැරෑරුම් කාර්යය සපුරා එම න්‍යාය ක්‍රමය හදාරන්නවුනට පිටුවහලක් සපයා ඇත.

මෙම අටුවාව ලංකාවේ පළමු වරට සම්පූර්ණ ලෙස මුද්‍රණය වූයේ **හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථ** මාලාවේ නවවැන්න ලෙසට යි. එම ත්‍රිපිටක මුද්‍රණ සභාවේ අධ්‍යක්ෂ තැන්පත් දෙස්තර **සී. ඒ. හේවාවිතාරණ** මහතාගේ විශේෂ ආරාධනය මත රාජකීය පණ්ඩිත විදුරුපොළ **පියතිස්ස** මා හිමියන් විසින් මෙය සංස්කරණ කරන ලද්දේ මහත් පරිශ්‍රමයක් දරා බලවත් පරීක්ෂණ බුද්ධියකිනි. එතෙක් මෙම ග්‍රන්ථය මේ රටේ උගතුන් අතර පවා විමසිල්ලකට ලක් නොවී තිබීමත්, සිංහල අකුරින් මුද්‍රණය නොවී තිබීමත්, එම අපහසුකම් තව තවත් දියුණු කිරීමේ හේතු විය. ඒ වන විට බුරුම රටේ මුද්‍රණය වී තිබුණු පොත හා ලංකාවේ පුස්කොළ පොත් කීපයක් ආශ්‍රය කොට මහ නා හිමියන් මෙය සාරගර්භ සංස්කරණයක් බවට පත්කොට තිබේ. බෙහෙවින් අපපාඨ හා දෝෂ දූෂිතස්ථාන තියුණු විමසීමෙන් ශුද්ධ වී ඇත.

උන්වහන්සේ තම සංස්කරණය හැඳින්වීම සඳහා සපයා ඇති **මුඛබන්ධය** නව ශෛලියකින් නිමවන ලද්දකි. ගාථා තුනකින් ප්‍රශ්න නවයක් මතුකොට ඒවාට පිළිතුරු සපයන විලාසයෙන් මෙම ග්‍රන්ථය ගැන කිය යුතු සියලු විස්තර එහි දක්වා ඇත. එය පිටු හතකින් පිරී සිටියි.

නෙත්තිප්පකරණ අටුවාවේ අන්තර්ගතය විස්තර කැරෙන්නේ මේ ලෙසිනි :

(i) සංගහ වාර
(ii) උද්දෙස වාර
(iii) නිද්දෙස වාර

---

1 ප්‍රකාශනය: දෙස්තර, සී. ඒ. හේවාවිතාරණ
ඇස්. කේ. මුණසිංහ
මුද්‍රණය: ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ,
ප්‍රමාණය; රෝයල් පිටු: 284
ප්‍රකාශිත වර්ෂය; ක්‍රි. ව. 1921

එහි ද (i) හාරවිභංග
(ii) හාරසම්පාත වාර
(iii) නයසමුට්ඨාන වාර
(iv) සාසනපට්ඨාන වාර

වශයෙන් ග්‍රන්ථය මෙම විෂය මාතෘකා යටතේ විස්තර වෙයි. මෙහි පැනෙන විශේෂයක් නම් ග්‍රන්ථය පරිශීලනය කරන්නන්ගේ විශේෂ පහසුව සඳහා යොදා ඇති දීර්ඝ අනුක්‍රමණිකාව යි. විදුරුපොළ මා හිමියන් **හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථමාලාවේ** ග්‍රන්ථ වැඩි ගණනක් සංස්කරණය කළ අතර එම සංස්කරණවල පළමුවැන්න මෙය යි. මෙහි මුලට අධ්‍යක්ෂතුමා ගේ කෙටි හැඳින්වීමක් ද ඇත.

## සංයුත්තනිකායට්ඨකථා*

පඨමො භාගො

සංයුත්ත නිකායයේ පෙළ අටුවා දෙක ම විධිමත් සංස්කරණවලින් පිටවීමට බොහෝ කාලයක් ගත විය. ඒවා සම්පූර්ණ පොත් වශයෙන් මුද්‍රණය වූයේ ද දීර්ඝ කාලයකට පසුව යි. **හේවාවිතාරණ ත්‍රිපිටක** අටුවා ග්‍රන්ථමාලාවේ **සාරත්ථප්පකාසිනී** නම් සංයුත්තනිකායට්ඨකථාව කාණ්ඩ තුනකින් පරිමිතව මුද්‍රණයෙන් ප්‍රකාශ වීමෙන් එම ග්‍රන්ථය සිංහල අකුරින් විධිමත් සංස්කරණයකින් සම්පූර්ණ ලෙස පළවිය. එය සකස් කිරීම බැරෑරුම් දුෂ්කර කාර්යයක් වූයේ පෙළ පවා හරියට සකස් වී නො තිබුණු හෙයිනි. **විදුරුපොළ** මහානායක ස්වාමීන්ද්‍රයෝ එම දුෂ්කර කාර්යය **සපුරා ජයගත්හ.** ඒ පිළිබඳවත් පොත සංස්කරණයට තමා සම්බන්ධ වූ ආකාරයත් උන්වහන්සේගේ ම වචනවලින් :

> ''ප්‍රථම වාරයෙහි ම සාරත්ථප්පකාසිනී නම් වූ සංයුත්සඟි අටුවා පොත් වහන්සේ ශුද්ධ කරන්නට බාරගත් අතිගරු බැදිගම ශ්‍රී රතනපාල නායක මහා ස්ථවිරයන්වහන්සේ ස්වර්ගස්ථ වී වදාළ හෙයින් ද පසුව එය බාරගත් නායක ස්ථවිර දෙනමත් ස්වර්ගස්ථවීම හා ඊට පසුව බාර ගත් නායක මහා ස්ථවිරයන්වහන්සේ අපහසු බව දන්වා එවීම ද හේතුකොට ගෙන ෆෝර්ම 16 ක් පමණක් මුද්‍රිතව අඩාල වූ එම අටුවා පොත් වහන්සේගේ ශුද්ධිය ද මට ම බාර කරන්නට අධ්‍යක්ෂතුමා ඉටා ගත්තේ ය. එතුමා ඒ සම්බන්ධයෙන් මා සමඟ ලියුම් ගනුදෙනු

---

* ප්‍රකාශනය සී. ඒ. හේවාවිතාරණ
ඇස්. කේ. මුණසිංහ
මුද්‍රණය. ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ
ප්‍රමාණය රෝයල් පිටු 285
ප්‍රකාශිත වර්ෂය: 1924

කරන්නට පටන් ගත් විට මම දෙවරක්ම එතුමාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කෙළෙමි. තුන්වෙනුවත් එතුමා මටම ලියුමක් ලියමින් 'ජාතක අටුවා පොත් වහන්සේ තවම මුද්‍රණයට පටන් නොගත් නිසා එය පමා කළත් වරදක් නැත. දනට පටන්ගැනී අඩාලව තිබෙන මේ සංයුත්සඟී අටුවා පොත් වහන්සේගේ වැඩේ කරදෙන්ට ඔබ වහන්සේ සතුටු වෙතොත් එය අපට කරණ මහත් අනුග්‍රහයකි' යනු ලියා එවූවේ ය. මෙයින් මට ඇතිවන වෙහෙස කෙතරම් ද යන්න මා හොඳටම දන්නා නුමුත් මගේ ප්‍රිය හිතෛෂී වූ දෙස්තර මැතිතුමාගේ මේ දයාබර ඉල්ලීම තුන්වන වරටත් ප්‍රතික්ෂේප කරන්නට අපොහොසත් වූ මම නොමැළිව නොපසුබටව සතුටින්ම එය ද පිළිගත්තෙමි. ජාතක අටුවාව ශුද්ධ කිරීම ද අත නොහැර සංයුත්සඟී අටුවාවේ ශුද්ධිය නොකඩවා කරගෙණ යැමෙන් එම කෘත්‍යය හත් අවුරුද්දකින් අවසන් කෙළෙමි. භදන්ත බුද්ධඝොෂ මහාථෙර සාමිදරුවන්ගේ ම කෘතියක් වූ එම සාරත්ථප්පකාසිනී සංයුත්තනිකායට්ඨකථා පොත් වහන්සේ කාණ්ඩ තුනකින් මුද්‍රිතව අවසන් වූයේ 1930 දී ය.''

මෙහි **මුඛබන්ධය** (හැටියට) ගාථා පස්විස්සකින් යුක්ත නිබන්ධයකි· ඉහත සඳහන් විස්තර ද එයට අයත් වේ.

මෙම ප්‍රථම භාගයේ අන්තර්ගතය සංයුත්ත වණ්ණනා එකොළොසකින් පිරි සිටියි. ඒවා නම් දේවතා සංයුත්ත, දෙවපුත්ත සංයුත්ත, කොසල සංයුත්ත, මාර සංයුත්ත, භික්ඛුණී සංයුත්ත, බ්‍රහ්ම සංයුත්ත, බ්‍රාහ්මණ සංයුත්ත, වංගීස සංයුත්ත, වන සංයුත්ත, යක්ඛ සංයුත්ත, සක්ක සංයුත්ත, වශයෙනි. මෙයින් දේවතා සංයුත්තයට වර්ග අටක් ද, දේවපුත්ත සංයුත්ත යට වර්ග තුනක් ද, කොසල මාර සංයුත්ත දෙකට වර්ග තුන බැගින් ද, ඇතුළත් වැ ඇති අතර භික්ඛුණී සංයුත්තයට වර්ග එකකි. බ්‍රහ්ම, බ්‍රාහ්මණ සංයුත්ත වර්ග දෙක බැගිනි. වංගීස, වන, යක්ඛ සංයුත්තවලට එක වර්ගය බැගින් ඇතුළති. සක්කසංයුත්තයට වර්ග දෙකකි.

මෙම සංස්කරණය සඳහා මහ නා හිමියන් **ඉංග්‍රීසි** හා **බුරුම** සංස්කරණ ද, ලංකාවෙන් සොයාගත් විශේෂ පුස්කොළ පොත් ගණනාවක් ද ආශ්‍රය කොටගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ **ඇස්. කේ. මුණසිංහ** මහතා විසින් ලියන ලද ඉංග්‍රීසි ආරම්භක සටහනක් ද වෙයි. එම කාර්යය බාර ගැනීමත්, එය මහත් ඉවසිල්ලකින් හා මහන්සියකින් සපුරා දීමත්, ගැන මහනාහිමියනට මුව නොසැහෙන ස්තුතියක් ද කර ඇත.

## සංයුත්තනිකායට්ඨකථා*

දුතියො භාගො

**සාරත්ථප්පකාසිනී** සංයුත්ත නිකාය අටුවාවේ පඨමභාගය නිකුත් වී අවුරුදු තුනකට පසු එහි දුතියභාගය නිකුත් විය. ඒ **හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථමාලාවේ** 22 වැනි ග්‍රන්ථය වශයෙනි. **විදුරුපොළ** මා හිමියන්ගේ උච්ඡානසීලි පරිශ්‍රමයේ තවද ඉදිරියට ගිය පියවරක ප්‍රතිඵලයකි එය.

සංස්කාරකයාණන් වහන්සේ මේ සඳහා අවශ්‍ය තොරතුරු ගැබ්කොට ලියා ඇති **මුඛබන්ධය** ගාථා 26 කින් යුක්ත කාව්‍ය රචනයකි. එහෙත්, එහි අලුත් ගාථා ඇත්තේ එකක් පමණි. ඒ මෙහි අන්තර්ගතය ගැන කියැවෙන කොටස් ඇතුළත් කොට බඳනා ලද්ද යි. පඨමභාගයෙහි 22 වැනි ගාථාව මෙහි 24 වැන්නයි. මෙහි 23 වැනි ගාථාවට ඇතුළත් වැ ඇත්තේ මේ භාගයෙහි ඇතුළත් විෂය ක්ෂේත්‍රය යි. **නිදානවග්ග** වණ්ණනාවේ ඉතුරු කොටසත්, **ඛන්ධකවග්ග** වණ්ණනාවත් මේ භාගයට ඇතුළත් වැ ඇත.

මෙම ද්විතීය භාගයෙහි වර්ග දහයකින් යුක්ත අභිසමයසංයුත්තයත්, වර්ග හතරකින් යුක්ත ධාතුසංයුත්තයත්, වර්ග දෙකකින් යුක්ත අනමතග්ග සංයුත්තයත්, වර්ග එකක් වන කස්සප සංයුත්තයත්, වර්ග හතරක් වන ලාභසක්කාර සංයුත්තයත්, වර්ග දෙකක් වන රාහුල සංයුත්තයත්, වර්ග දෙකකින් යුක්ත ලක්ඛණ සංයුත්තයත්, එක එක වර්ග ඇති ඔපම්ම හා භික්ඛු සංයුත්තත් පිළිබඳ අර්ථ වර්ණනා ඇතුළත් වේ. එයින් නිදානවග්ග වණ්ණනාව නිම වී ඇත. ඛන්ධකවග්ග වණ්ණනාවෙහි මූලපණ්ණාසකයේ වර්ග පහක් ද, මජ්ඣිමපණ්ණාසකයේ වර්ග පහක් ද, මූලපණ්ණාසකයේ වර්ග පහක් ද, සංග්‍රහ වන අතර රාධ සංයුත්තයේ වර්ග දෙක පිළිබඳවත්, දිට්ඨි,ඔක්කන්ති, උප්පාද, කිලෙස, සාරිපුත්ත, නාග, සුපණ්ණ, ගන්ධබ්බ, වලාහක, වච්ඡගොත්ත, ඣාන, යන ඛන්ධවර්ගයට ඇතුළත් විස්තර වර්ණනා වලින් මෙම දුතිය භාගය නිමාවට පත්වෙයි. මේ සඳහා ආරම්භක කෙටි හැඳින්වීමක් හැටියට දෙස්තර **සී. ඒ. හේවාවිතාරණ** මහත්මා ලියා ඇති කෙටි ප්‍රස්තාවනාවක් ඇත.

---

* ප්‍රකශනය; සී. ඒ. හේවාවිතාරණ
ඇඒ. කේ. මුණසිංහ
මුද්‍රණය: ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ.
ප්‍රමාණය: රෝයල් පිටු:268
ප්‍රකාශිත වර්ෂය: 1927

## සංයුත්තනිකායට්ඨකථා

තතියො භාගො

සංයුත්තනිකායට්ඨකථාවේ දුතිය භාගය පළ වී වසර තුනකට පසු තෙවන භාගය වන මෙම කොටස මුද්‍රණයෙන් එළි දැකීමෙන් පාළිභාෂා වේදීන්හට හා ධර්මධර්යන්හට එතෙක් තිබුණු ප්‍රබල අපහසුකම් කීපයක් ම මඟහැරිණ. පළමුවැන්න මෙම අටුවාව ක්‍රමවත් ශුද්ධියකින් එතෙක් ප්‍රකාශනයට පත් නොවීම යි. අටුවා ග්‍රන්ථ අතර එතෙක් ම ඉතාමත් අවුල් සහිත වැ තිබුණු සංයුත්තනිකායට්ඨකථාව වරකින් සර්වප්‍රකාරයෙන් ම පිරිසුදු තත්ත්වයට පත් කිරීම සුකර කරුණක් නොවන බව විඥයෝ පිළිගනිති. මෙය ද සර්වශුද්ධ සංස්කරණයක් හැටියට සංස්කාරක මා හිමියන්වහන්සේත් නොපිළිගන්නා බව මෙහි එන **මුඛබන්ධයෙහි** සඳහන් කොට ඇත.

මෙම තෙවැනි කොටසට ඇතුළත් වන්නේ සළායතනවග්ග වණ්ණනාව හා මහාවග්ග වණ්ණනාවත් ය. එහිලා සළායතනවග්ග වණ්ණනාවට පඨම–දුතිය–තතිය–චතුත්ථ පණ්ණාසකයනුත් ; සහගාථාවග්ග හා රගොගත වග්ගත් ඇතුළත්, වේදනා සංයුත්තයේ පටන් අව්‍යාකත සංයුත්තය දක්වාත්, සූත්‍ර වර්ණනා අන්තර්ගත ය. මහාවග්ග වණ්ණනාවට මග්ග–බොජ්ඣංග–සතිපට්ඨාන– ඉන්ද්‍රිය– සම්මප්පධාන– බල– ඉද්ධිපාද– අනුරුද්ධ– ඣාන–ආනාපාන– සොතාපත්ති– සච්ච යන සංයුත්ත වර්ණනාත් ඇතුළත් වැ ඇත. මේ සංස්කරණය සඳහා උපයෝගි කොටගෙන ඇති ආශ්‍රෙය ග්‍රන්ථ නම් **සියම්** අකුරින් මුද්‍රිත සියම් පිටපත හා ලංකාවේ සුප්‍රකට පුස්තකාල කීපයක පුස්කොළ පිටපත් කීපයකුත් ය.

එවක **ත්‍රිපිටක මුද්‍රණ සභාවෙහි** අධ්‍යක්ෂ ධුර දැරූ **අනගාරික ධර්මපාල තුමා** හා **ඇස්. කේ. මුණසිංහ** යන දෙපොළ විසින් ලියන ලද පොත එළි දැක්වීම පිළිබඳ ආරම්භක සටහනක් ද වෙයි. විදුරුපොළ මා හිමියන් මෙම ආයාසකර සංස්කරණය සඳහා දරා ඇති පරිශ්‍රමය ගැන එම පින්වතුන් බලවත් සේ ගෞරවපුරස්සර ස්තුතිය පළකොට තිබේ. ත්‍රිපිටක මුද්‍රණ ග්‍රන්ථාවලියෙහි 31 වැන්න ලෙස මෙය පළ කොට ඇත.

---

* ප්‍රකාශනය: ඇස්. කේ. මුණසිංහ
මුද්‍රණය; ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ.
ප්‍රමාණය; රෝයල් පිටු: 245
ප්‍රකාශිත වර්ෂය: 1930

## ජාතකට්ඨකථා[1]

**පඨමො භාගො**

පාළි බණ කථා සාහිත්‍යායෙහි ශ්‍රේෂ්ඨතම ග්‍රන්ථය හැටියට කීර්තිමත් ජාතකට්ඨකථාව පාළි සාහිත්‍යකාමීන්ගේත්, ධර්මදේශකයන්ගේත්, පරමාදරයට පාත්‍ර වූවකි. මෙම ග්‍රන්ථය සිංහල අකුරෙන් සම්පූර්ණ වශයෙන් මුද්‍රණය නොවූවකි. මුද්‍රණය වී තිබුණේ පිටු 321 කින් යුක්ත තික නිපාතය තෙක් කොටස යි. එහෙත්, එය ඉංග්‍රීසි අකුරින් හා සියම් අකුරින් මුද්‍රණය කොට තිබුණේ ය.

**හේවාවිතාරණ** ත්‍රිපිටක මුද්‍රණ සභාවේ ඇරයුම පරිදි රාජකීය භදන්ත පණ්ඩිත විදුරුපොළ **පියතිස්ස** මහානායක හිමිපාණන් මෙම ග්‍රන්ථය ක්‍රමවත් පරීක්ෂණාත්මක සංස්කරණයකින් ශාස්ත්‍රීය කෘතියක් වශයෙන් සකසා කාණ්ඩ හතකින් සම්පූර්ණ කළහ. අති බැරෑරුම් **එම** කාර්යය සපුරාලීමට උන්වහන්සේට අවුරුදු දහ හතක් ම මහත් වෑයමක යෙදෙන්නට සිදු විය. මේ සංස්කරණය සඳහා උන්වහන්සේගේ සන්සන්දනාත්මක ආශ්‍රෙයස්ථාන වූයේ ඒ වන විට සිංහල අකුරෙන් මුද්‍රණය කර තිබුණු කොටසත්, ඉංග්‍රීසි මුද්‍රණය සහ සියම් අකුරෙන් මුද්‍රිත පොතත් ය වෙනේ. මේ සඳහා පුස්කොළ පොත් ද ඇසුරු කළාට නිසැකය. හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථාවලියේ විසිවෙනි ග්‍රන්ථය වශයෙන් නිකුත් වූ මෙම ප්‍රථම භාගය වෙනුවෙන් උන්වහන්සේ සපයා ඇති ප්‍රස්තාවනාව ‘මුඛබන්ධ’ නමින් පාළි ගාථාවලින් නිබන්ධිත ය. ගාථා 37 කින් පිරිපුන් එහි ජාතකට්ඨකථාව ගැනත්, හේවාවිතාරණ ත්‍රිපිටක මුද්‍රණය ගැනත්, තමන් බැස සිටුනා බරෑරුම් වගකීම ගැන මෙන් ම ඉංග්‍රීසි සියම් මුද්‍රණ ගැනත් සඳහන් කොට ඇත. මෙම ප්‍රථම භාගයෙහි අන්තර්ගතය **උපරිපණ්ණාසක** නම් ඒකක නිපාතය යි. එය සුමේධ තාපස කථාව හා **නිදාන** කථාව ඇතුළත් ජාතකකථා පනසකින් පරිපූර්ණ ය. ඒ අපණ්ණක ජාතකයෙන් ඇරඹී සංජීව ජාතකයෙන් අවසන් වන කොටස යි. වර්ගීකරණය ජාතක කථා දහය බැගින් ඇතුළත් වන සේ පසළොසකට වෙන් වේ.

මේ සඳහා ප්‍රකාශකයන් වෙනුවෙන් දොස්තර **සී. ඒ. හේවාවිතාරණ** මහතා විසින් ඉංග්‍රීසියෙන් සැපයුණු ආරම්භක සටහනක් ද වෙයි. මෙම ග්‍රන්ථය සකස් කිරීමෙහි ලා විදුරුපොළ මා හිමියන් දරණ මහඟු වෑයම ඉමහත් ප්‍රශංසාවට එහි ලක්කොට ඇත.

---

1 ප්‍රකාශනය: දොස්තර, සී. ඒ. හේවාවිතාරණ
ඇස්. කේ. මුණසිංහ
මුද්‍රණය: ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ.
ප්‍රමාණය: රෝයල් පිටු: 444
ප්‍රකාශිත වර්ෂය: 2470/1926

## ජාතකට්ඨකථා[1]

දුතියො භාගො

ජාතකට්ඨකථා පඨමභාගය නිකුත් වී දෙවසරකට පසුව මෙම දුතිය භාගය නිකුත් විය. මෙම සංස්කරණය ද පළමු කොටසේ සංස්කරණය මෙන් ම මහත් පරිශ්‍රමයකින් හා ලොකු වගකීමකින් සපුරා තිබේ. භාෂා තුනකින් රටවල් තුනක මුද්‍රිත පිටපත් සංස්කාරකයන් වහන්සේ ආශ්‍රය කොට ඇත. ඒ **සිංහල, ඉංග්‍රීසි** හා **සියම්** යන භාෂාවලින් මුද්‍රිත පිටපත් ය. විශේෂයෙන් පාළි භාෂාව පිළිබඳ මහා විශාරදයකු වූ විදුරුපොළ මහනාහිමියනට පාඨාන්තර සංසන්දනයේ දී ඉතාම උචිත පාඨය තෝරා බේරා ගැනීමට දුෂ්කර වී නැත්තේ උන්වහන්සේ තුළ පිහිටි ඒ සුගැඹුරු ප්‍රවීණත්වය නිසා ය. **සියම්, ඉංග්‍රීසි** පිටපත්වල පවා පැනෙන සදොෂ ස්ථාන මෙම සංස්කරණයෙන් ශුද්ධ වී ඇති බවක් එම සංස්කරණ හා මෙම සංස්කරණය තුලනය කොට පිරික්සන්නකුට වැටහී යනවා ඇත.

ජාතකට්ඨකථාවේ මෙම දුතියභාගයේ දුක හා තිකනිපාත වණ්ණනා ආවරණය කැරෙයි. එයින් දුක නිපාතයට අයත්වන්නේ දළ්හ-සන්ථව-කල්‍යාණධම්ම-අසදිස-රූහක-නතංදළ්හ-බීරණත්ථම්භ- කාසාව-උපාහන-සිගාල යන වර්ගදශය යි. එය ජාතක කථා සියයක එකතුවකි. තිකනිපාත යට අයත්වන්නේ සංකප්ප- කොසිය- අරඤ්ඤ- අබ්භන්තර- කුම්භ යන වර්ග පස යි. එයට ජාතක කථා පනසක් ඇතුළත් වේ.

මෙම භාගය සඳහා **මුඛබන්ධයක්** හෝ **විඥාපනයක්** සංස්කාරක මාහිමියෝ නො සපයති. එසේ කොට ඇත්තේ පඨමභාගයෙහි මුඛබන්ධය මෙයට ද අදාළ හෙයිනියි සිතිය හැකි ය. පේළි හයකට නොවැඩි විශේෂ විඤ්ඤාපනයක් වෙයි. එය ද කරුණු දෙකක් පිළිබඳව යි. **ත්‍රිපිටක මුද්‍රණ සභාවෙහි** අධ්‍යක්ෂ දෙස්තර **සී. ඒ. හේවාවිතාරණ** මැතිතුමා සැපයූ ආරම්භක සටහනක් ඇත. මෙය නිකුත් කොට ඇත්තේ ත්‍රිපිටක මුද්‍රණයෙහි සූවිසි වැනි ග්‍රන්ථය හැටියට යි.

## ජාතකට්ඨකථා[2]

තතියො භාගො

ජාතකට්ඨකථාවේ ද්විතීය භාගය පළ වී වැඩි කලක් යන්නට මත්තෙන් එහි තෙවැනි භාගය ද සාරගර්භ සංස්කරණයෙන් **විදුරුපොළ** මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් නිකුත් කරවන ලදී. ඒ ත්‍රිපිටක ග්‍රන්ථ

---

1 ප්‍රකාශනය: දොස්තර සී. ඒ. හේවාවිතාරණ
මුද්‍රණය: ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ.
ප්‍රමාණය: රෝයල් පිටු: 328
ප්‍රකාශිත වර්ෂය: 1928

2 ප්‍රකාශනය: ඇස්. කේ. මුණසිංහ
මුද්‍රණය; ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ.
ප්‍රමාණය: රෝයල් පිටු: 353
ප්‍රකාශිත වර්ෂය: 2474/1931

මාලාවේ තිස් දෙවැනි ග්‍රන්ථය යි. එයට චතුක්ක නිපාතයේ පටන් අට්ඨක නිපාතයෙන් නිමවන නිපාත පහක් ඇතුළත් වේ. එය වර්ග තෙළෙසකින් ද, ජාතක 126 කින් ද නිමා වී ඇත. ඒ **චුල්ලකාලිංග** ජාතකයෙන් ඇරඹ **දීපි** ජාතකයෙන් අවසාන වන ලෙසිනි. මෙම සංස්කරණයෙහි ලා ද මුද්‍රිත සිංහල කොටසත්, **ඉංග්‍රීසි** අකුරෙන් හා **සියම්** අකුරෙන් මුද්‍රිත පිටපතුත්, පුස්කොළ පිටපතුත් සංස්කාරක මා හිමියනට පිටුවහල් විය. සිරිත් පරිදි මෙහි මුඛබන්ධය සංස්කාරක මා හිමියන් පාළි භාෂාවේ සුපුරුදු ශෛලියෙන් නිබන්ධනය කොට ඇත.

ත්‍රිපිටක මුද්‍රණසභාවේ අධ්‍යක්ෂවරුන් හැටියට ශ්‍රීමත් **අනගාරික ධර්මපාල, ඇස්. කේ. මුණසිංහ** යන මහතුන් විසින් ඉංග්‍රීසියෙන් සැපයුණු ආරම්භක සටහනක් ද වෙයි. එහි දී ද සංස්කාරක මා හිමියන්ගේ සේවය ඉහළින් අගය කොට ඇත.

## ජාතකට්ඨකථා[1]

**චතුත්ථො භාගො**

ජාතකට්ඨකථාවේ තෘතීය භාගය නිකුත් වී අවුරුදු තුනකට පසු මෙම සිවුවෙනි භාගය නිකුත් කැරිණ. මෙම කොටස නවක නිපාතයෙන් ඇරඹ තේරසක නිපාතයෙන් අවසන් වෙයි. නිපාත වශයෙන් නිපාත පහකින් ද, ගිජ්ඣ ජාතකයෙන් පටන්ගෙන සරභමිග ජාතකයෙන් නිමකොට ඇත. ඒ අනුව සිව්වැනි භාගය තුළ ජාතක 57 ක් ඇතුළත් වේ. අප රටේ බොහෝ වියතුන්ගේ සැලකිල්ලට ලක් වූ චුල්ලබෝධි ජාතකය, මහා ධර්මපාල ජාතකය පසු කාලයක සිංහල කාව්‍යයට නැඟුණු කාලිංග බෝධි ජාතකය වැනි ජනප්‍රිය ජාතක කථා මේ කොටසට ඇතුළත් වී ඇත.

විශේෂ ප්‍රස්තාවනාවක් මේ කාණ්ඩය සඳහා සංස්කාරක මා හිමියන් සපයා නැති අතර ත්‍රිපිටක මුද්‍රණ සභාවේ අධ්‍යක්ෂක හැටියට **ඇස්. කේ. මුණසිංහ** මහතා ලියූ ආරම්භක සටහනක් වේ. මෙය නිකුත් කොට ඇත්තේ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ 36 වැන්න හැටියට යි.

## ජාතකට්ඨකථා[2]

**පඤ්චමො භාගො**

ජාතකට්ඨකථාවේ සිව්වැනි භාගය නිකුත් වී වර්ෂයක් පිරෙත් ම මෙම පඤ්චම භාගය ද ප්‍රකාශනයට පත්විය. ත්‍රිපිටක මුද්‍රණ ග්‍රන්ථ මාලාවේ නොකඩවා රැකගෙන ආ කලාත්මක වූත්, ශාස්ත්‍රීය වූත්, සම්ප්‍රදයයන්

---

1 ප්‍රකාශනය: ඇස්. කේ. මුණසිංහ
මුද්‍රණය: ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ.
ප්‍රමාණය: රෝයල් පිටු: 256
ප්‍රකාශිත වර්ෂය: 2478/1934

2 ප්‍රකාශනය: ඇස්. කේ. මුණසිංහ.
මුද්‍රණය. ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ.
ප්‍රමාණය: රෝයල් පිටු: 260
ප්‍රකාශිත වර්ෂය: 2479/1935

මෙහි දී ද රැකී ඇත. මෙම කොටසට පකිණ්ණක නිපාතය, වීසති නිපාතය, තිංසති නිපාතයැයි නිපාත තුනක් අන්තර්ගත වේ. ඒ තුළ ජාතක කථා 37 ක් ආවරණය කැරේ. ඒ සාලිකේදර ජාතකයෙන් ඇරඹ ගන්ධතින්දුක ජාතකයෙන් අවසාන වන ලෙසිනි. පැරණි සිංහල සාහිත්‍යකරුවන්ගේ විශේෂ සැලකිල්ලට ලක් වූ චන්දකින්නර ජාතකය, සිවි ජාතකය, මහා කපි ජාතකය, සම්බුලා ජාතකය වැනි ජාතක කථා මේ කොටසට ඇතුළත් වී තිබේ.

සංස්කාරක මා හිමියන් වහන්සේ සිරිත් පරිදි සිංහලයෙන් ලියැවුණු පුස්කොළ පිටපත් සේම ඉංග්‍රීසි බසින් හා සියම් බසින් මුද්‍රණය වුණු පිටපත් ද පෙර පරිදි මේ සංස්කරණයේදීත් වහල් කොටගෙන තිබේ. විශේෂ ප්‍රස්තාවනාවක් මේ සඳහා සපයා නැති අතර ප්‍රකාශක මණ්ඩලය වෙනුවෙන් එහි අධ්‍යක්ෂක එස්. කේ. මුණසිංහ මහතා ඉංග්‍රීසි බසින් ලියූ ආරම්භක සටහනක් වේ. සංස්කාරක මා හිමියන් මෙම සංස්කරණය සඳහා දරණ වෑයම එහි දී ගෞරවනීය ලෙස අගය කොට තිබේ. මෙම ජාතකට්ඨකථා පඤ්චම භාගය නිකුත් වූයේ හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ 37 වැන්න හැටියට යි.

## ජාතකට්ඨකථා[1]

ඡට්ඨමො භාගො

ජාතකට්ඨකථාවේ පඤ්චම භාගය නිකුත් වී දෙවසරක් ගත වෙන්නට ද මත්තෙන් මෙම ඡට්ඨම භාගය ද නිකුත් විය. ඒ හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ 39 වැන්න හැටියට යි. මෙහි අන්තර්ගතය චත්තාළීස නිපාතය, පඤ්ඤාස නිපාතය, සට්ඨී නිපාතය, සත්තති නිපාතය, අසීති නිපාතය යැයි නිපාත විසින් පහකින් යුක්ත ය. එයට තෙසකුණ ජාතකයෙන් පටන්ගෙන මහා සුතසෝම ජාතකය දක්වා වූ ජාතක කථා 17 ක් ඇතුළත් වී තිබේ. මෙම ජාතක කථා බොහෝ කොටසක් ප්‍රමාණයෙන් විශාල වූ ඒවා වෙයි. සාහිත්‍ය රසිකයන්ගේ ආදරයට පාත්‍ර වූ මහා සුතසෝම ජාතකය, කුස ජාතකය, උන්මදන්ති ජාතකය වැනි ජාතක මෙහි සංග්‍රහ වී ඇත. මෙම ජාතක කථා තුළ ප්‍රමාණයෙන් විශාල ඒවා කීපයක් ද වෙයි. මේ වෙනුවෙන් ද විශේෂ ප්‍රස්තාවනාවක් සපයා නැති අතර ඒ වෙනුවට ත්‍රිපිටක මුද්‍රණ සභාව වෙනුවෙන් සිරිත් පරිදි ඉංග්‍රීසි බසින් ලියැවෙන ආරම්භක සටහනක් වෙයි. මෙම ප්‍රකාශනය ගැන කියයුතු තොරතුරු එහි ඇතුළත් කොට ඇත.

---

1 ප්‍රකාශනය: ඇස්. කේ. මුණසිංහ
මුද්‍රණය: ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ
ප්‍රමාණය: රෝයල් පිටු: 336
ප්‍රකාශිත වර්ෂය: 2481/1937

## ජාතකට්ඨකථා[1]

**සත්තමො භාගො**

ජාතකට්ඨකථා මහා සංස්කරණයේ අවසාන භාගය වන **හත්වැනි** කොටස මෙය යි. හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ අභිමානවත් නිමාවක් සේ මෙය හැඳින්විය හැකි ය. මෙයට ඇතුළත්ව ඇත්තේ මහා නිපාත වර්ණනාව යි. එය මූගපක්ඛ, මහාජනක, සාම, නිමි, ඛණ්ඩහාල, භූරිදත්ත, මහා නාරද කස්සප, විධුර, මහා උම්මග්ග, මහා වෙස්සන්තර, යන ජාතක දහය ආවරණය කෙරෙයි. මේ ජාතක කථා සියල්ලම වාගේ අප රටේ සාහිත්‍යකරුවන්ගේත්, ප්‍රවීණ අප්‍රවීණ පාඨකයන්ගේත් බොහෝ සේ සිත් ඇදගත් ඒවා ය. ප්‍රමාණයෙන් එක ජාතකයක් එක ග්‍රන්ථයක් තරමින් ම විශාල ද වේ. සංස්කාරක මාහිමියන් භූරිදත්ත, විධුර, මහා උම්මග්ග හා මහා වෙස්සන්තර යන ජාතකයන් සංස්කරණය කිරීමේ දී වර්ණිත විෂයබද්ධ මාතෘකා පාඨ යොදා මහත් පරිශ්‍රමයකින් හා වගකීමකින් එම ජාතක සංස්කරණය කොට ඇත.

ජාතක කථා 547 කින් පමණ පරිමිත වන ජාතකට්ඨකථාවේ සම්පූර්ණ සංස්කරණය නිමහම් වීම නිසා අප රටේ පාළි භාෂා ප්‍රෙමීන්ගේ මෙන් ම ධර්මශාස්ත්‍ර රසිකයන්ගේත් මනදෙළ සපිරුණේ විය. විදුරුපොළ පියතිස්ස මහානායක හිමිපාණන් වහන්සේගේ හැටවෙනි ජන්ම සංවත්සරය පිරිමත් මෙම ජාතකට්ඨකථා සංස්කරණයේ නිමාවත් එක ම වර්ෂයක සිදුවීම අනපේක්ෂිත වූවක් වුවත් දෛවමය සිද්ධියක් සේ සැලකිය හැකි යි. මේ සඳහා උන්වහන්සේ ගෙවූ කාලය අවුරුදු 17 ක් පමණ වන්නේ ය. ඒ සා දීර්ඝ කාලයක් තුළ ඉමහත් වගකීමකින් මෙන් ම දැඩි සැලකිල්ලකින් ද උන්වහන්සේ මෙම ධර්මශාස්ත්‍ර කටයුත්තෙහි නිරතවූහ. මේ කාර්යය සපුරා නිම වීමෙන් උන්වහන්සේට සාතිශය ප්‍රීතියක් ඇති වූවා පමණක් නොව විශාල පිනක් අත්පත් කර ගත්තක් බවත් නොයෙක් වර සඳහන් කර ඇත. අතිපූජ්‍ය මා හිමියන් වහන්සේ මේ සාරගර්භ උදාර සංස්කරණයේ නිමාව දකිමින් මෙම අවසාන භාගය සඳහා ලියූ හැඳින්වීම "විඤ්ඤාපන" නමින් දීර්ඝ ලෙස සපයා ඇත. එහි දී මෙම කාණ්ඩ හතේ ග්‍රන්ථ මාලාවේ සම්පූර්ණ සංස්කරණය සඳහා භාවිත ක්‍රම හා අනුගමනය කළ පිළිවෙත් විස්තර කොට තිබේ.

මෙම කාණ්ඩය සඳහා ත්‍රිපිටක මුද්‍රණ සභාවේ අධිකාරීන් විසින් ඉංග්‍රීසි යෙන් ලියා ඇති ආරම්භක සටහනෙහි ත්‍රිපිටක මුද්‍රණ සභාව පිහිට වූ 1916 වසරේ සිට එහි ආරම්භක සංස්කාරකවරයෙකු හැටියට අතිගරු මහනා හිමියන්ගෙන් කැරුණු සේවය ඉමහත් හරසරින් අගය කොට ඇත. **විදුරු පොළ** මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථ

---

[1] ප්‍රකාශනය: ඩබ්ලිව්. ඩී. හේවාවිතාරණ
මුද්‍රණය: ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ.
ප්‍රමාණය: රෝයල් පිටු: 544
ප්‍රකාශිත වර්ෂය: 2483/1939

මාලාවේ ඒ වන විට සංස්කරණය කර තිබුණු එකොළොස් වැනි ග්‍රන්ථය මෙය වන අතර ත්‍රිපිටක පොත් පෙළේ සතළිස් එක් වැනි ප්‍රකාශනය වූයේ මේ ජාතකට්ඨකථා හය්වැනි භාගය යි.

## ජාතකපාළි*

**පඨමො භාගො**

ජාතකපාළිය **ජාතකට්ඨකථාවේ** පෙළ පොත යි. කාණ්ඩ හතකින් පරිමිත ජාතක අටුවාව ක්‍රමවත් සංස්කරණයකින් බෞද්ධ ලෝකයා අතට පත් කළ **වීදුරුපොළ** මහානායක හිමිපාණන් හට ජාතක පාළිය සකස් කිරීමට තිබුණේ බුහුටි අත්දැකීම් සමුදයකි. තම භාෂා වෛශාරද්‍යය මෙන් ම පරීක්ෂණ බුද්ධිය ද උන්වහන්සේට මෙම කාර්යය අර්ථවත් සේ නිම කිරීමට පිටුවහල් මාර්ග වූයේ ය. අටුවාවත් පෙළත් උන්වහන්සේගේ අතින් නිමවීම ත්‍රිපිටක ධර්මයෙහි සමුන්නතිය පතන කාගේත් ප්‍රීති ප්‍රමෝද්‍යයට හේතු විය. එහෙත්, එය උන්වහන්සේ නිමාවම පත් කෙළේ නීරෝගී සම්පත්තියෙන් හා කායික මානසික ඉස්පාසුවකින් හෝ එබඳු සංයමයකින් නම් නො වේ. වයසින් සිවු හැත්තෑ වසක් පිරුණු මහලු වියේ දී පමණක් නොව වැඩි කලක් ලෙඩ ඇඳේ කල් ගෙවමිනි.

එහෙත්, එම හේතු නිසා මේ සංස්කරණ විෂයයෙහි සාරත්වය හා ශාස්ත්‍රීයත්වය ස්වල්ප මාත්‍රයකින් හෝ අඩුවීමට මහා නායක හිමියන් ඉඩ නො තැබුයේ පර්යාප්තිධර්මය පිළිබඳ මෙබඳු සේවාවකට තිබුණු දැඩි ලැදියාව හා නොපිරිහුණු ආත්මශක්තිය නිසා ය. මීට පෙර සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ එකොළොසින් මෙන් ම මෙම සංස්කරණයෙන් ද මහා නායක හිමියන්ගේ බුද්ධිපාටවය හා තීක්ෂ්ණඥානය කැටපතක මෙන් ප්‍රතිබිම්බිත වැ ඇත.

**ජාතකපාළියේ** පඨම භාගයට නිපාත තුදුසක් ඇතුළත් වෙයි. ඒ එකක දුක ආදි වශයෙන් ගෙන අවසානය පකිණ්ණකනිපාතය වශයෙනි. මුල් නිපාත බෙදා තිබෙන්නේ වර්ග වශයෙන් වුවත්, නවක නිපාතයෙන් පසු එබඳු වර්ග බෙදීමක් නො දක්වෙයි. ඒ ඒ නිපාතවලට අයත් ජාතක වලත් සීමාවක් නැත. එකක නිපාතයට ජාතක 150 ක් අයත් වුවත්, අවසාන නිපාතවල පැනෙන්නේ ජාතක 9 ක් හෝ 10 ක් පමණි. මෙම ප්‍රථමභාගයෙහි සංස්කරණය වූ ගාථා සංඛ්‍යාව 2,327 කි.

---

* ප්‍රකාශනය: ඇස්. කේ. මුණසිංහ
ඩබ්ලියු. ඩී. හේවාවිතාරණ
මුද්‍රණය: ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ.
ප්‍රමාණය: රෝයල් පිටු. 244
ප්‍රකාශිත වර්ෂය: 2497/1954

මෙම සංස්කරණය සඳහා සංස්කාරකයාණන් වහන්සේ බුරුම හා සියම් අකුරුවලින් මුද්‍රිත පොතුත්, ලංකාවේ මුද්‍රිත කොටස මෙන් ම පුස්කොළ පොත් ගණනාවකුත්, තමා ම සකස් කළ ජාතක අටුවාවක් ආශ්‍රය කොට ගෙන ඇත.

සංස්කාරකයාණන් වහන්සේ මේ සඳහා ලියා ඇති විඥාපනයෙහි පැවසෙන්නේ තමා බලවත් රෝගාතුර ව සිට නමුත් මෙම කෘතිය අතිමහත් පරිශ්‍රමයෙන් සැකසූ බවයි. එහි සත්‍යතාව පොත කියවන පාඨකයන් හට යථාර්ථයෙන් වැටහෙනු ඇත. සිරිත් පරිදි ඉංග්‍රීසියෙන් සැපයෙන ත්‍රිපිටක ප්‍රකාශන මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ ආරම්භක සටහනින් කියැවෙන්නේ දුර්වල සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිමින් වුවත් ගරු මහානායක හිමිපාණන් වහන්සේ මේ කාර්යය ඉමහත් සැලකිල්ලෙන් හා බලවත් පරිශ්‍රමයෙන් සපුරාලූ බව ය.

හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථමාලාවේ පෙළ පොත් පෙළේ සිවු වැන්න වශයෙන් මෙම ග්‍රන්ථය ප්‍රකාශනයට පත්කොට ඇත.

## ජාතකපාළි*

දුතියො භාගො

ජාතකපාළි සංස්කරණයේ දෙවැනි භාගය වූ මෙය භදන්ත පණ්ඩිත විදුරුපොළ **පියතිස්ස** මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අවසාන ම ග්‍රන්ථ සංස්කරණය යි. ජාතකපාළි දුතිය භාගයත් සමඟ උන්වහන්සේ **හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථමාලාවේ** සකස් කළ ග්‍රන්ථ සංඛ්‍යාව තෙළෙසකි. ත්‍රිපිටක මුද්‍රණයේ ආරම්භය වූ 1916 සිට ඒ වනතෙක් වැඩිම පොත් සංඛ්‍යාවක් සංස්කරණය කළ පඬිවරයා වූයේ ද **විදුරුපොළ** මා හිමියෝ ය.

ප්‍රථම භාගය මෙන් ම මේ ද්විතීය භාගය ද විදුරුපොළ මා හිමියන් සංස්කරණය කෙළේ දැඩි ගිලන් බවින් පෙළෙමින් ම ය. මෙය සපුරා සංස්කරණය කොට විඥාපනයට උන්වහන්සේ අත්සන් තැබුවේ 1954 දෙසැම්බර 9 දින රාත්‍රී 7 ට යි. 10 වැනි දිනට එළිවෙන යාමයේ නොහොත් එදින ම රාත්‍රී ඊට පැය කීපයකට පසු උන්වහන්සේ අපවත් වූහ. මේ පිළිබඳ ව ත්‍රිපිටක ග්‍රන්ථ සභාවේ අධ්‍යක්ෂවරුන් ලියා ඇති හැඳින්වීමෙන් එය සංවේගාත්මක වැ විස්තර කොට ඇත.

---

* ප්‍රකාශනය; ඇස්. කේ. මුණසිංහ
ඩබ්ලියු. ඩී. හේවාවිතාරණ
මුද්‍රණය; ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ.
ප්‍රමාණය: රෝයල් පිටු: 200
ප්‍රකාශිත වර්ෂය; 2498/1955

බලවත් සේ රෝගී වැ සිට නමුත්, තමා මේ සංස්කරණයත් මහත් ඉවසීමකින් හා පරිශ්‍රමයකින් සකසා නිම කළ බව සංස්කාරක මා හිමියෝ තම විඥාපනයෙන් ප්‍රකාශ කරති. මෙහි අන්තර්ගතය නිපාත 7 කි. ඒ වීසති, තිංසති, චත්තාළීසති, පඤ්ඤාස, සට්ඨි, සත්තති, අසීති වශයෙනි. ඒ තුළ ඇතුළත් වුණු ජාතක සංඛ්‍යාව 39 ක් පමණි. සංස්කරණය කැරුණු ගාථා ගණන 1,970 කි. ප්‍රථම භාගයේ දී අනුගමනය කළ ප්‍රතිපත්ති සියල්ල ම මෙහි දී ද උන්වහන්සේ අනුගමනය කොට ඇත.

අප රටේ ධර්මධර වියතුන්ගේ අවාසනාවට මෙන් අතිපූජ්‍ය මහානායක හිමිපාණන්ට ජාතකපාළි අවසාන කොටස වූ තෙවැනි භාගයේ සංස්කරණය නිම කිරීමට අවස්ථාව නො ලැබිණ. උන්වහන්සේ දී තිබුණු උපදෙස් හා මග පෙන්වීම යටතේ එම කාණ්ඩය ඒ දිනවල ම සංස්කරණය කෙළේ පණ්ඩිත නුවරඑළියේ සේනානන්ද හිමියන් විසිනි.* එයින් ජාතකපාළි සංස්කරණය සම්පූර්ණ විය. මෙම ද්‍විතිය භාගය හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ පෙළ පොත් පෙළේ පස් වැන්න හැටියට මුද්‍රණයෙන් ප්‍රකට විය.

## මෙතෙක් නොපළ වූ පොත්

විදුරුපොළ මා හිමියන් වහන්සේ ස්වීය ආයුෂ්කාලය තුළ නිර්මාණය කළ ග්‍රන්ථ සමුදය විභාග පාඨමාලා සඳහා සමහරුන් ලියන සන්න-ගැටපද-විස්තර- පරිකථා මෙන් සුළු කාලයක් ජීවත්ව අභෝසි වන ඒවා නොව භාෂාව හා සාහිත්‍යය ජීවත් වන තාක් කල් ජීවත් වන ඒවා ය. ඒවායින් දෙක තුනක් හැර සෙසු සියල්ල ම උන්වහන්සේ ජීවත් වූ කාලය තුළ දී ප්‍රකාශයට පත් කිරීමට මහනාහිමියෝ භාග්‍ය සම්පන්න වූහ. එහෙත්, ඉතා වැදගත් කෘති දෙකක් පළ කරවිය නො හැකි විය. මහත් අවාසනාවකට ඒ නො පළ පොත් තවමත් එසේ ම ය. ඒවායින් එකක් **භක්තිපඤ්චාශිකාව**.

ත්‍රිවිධරත්නය විෂයෙහි සිය භක්තිප්‍රණාමය ගලා ගිය කාව්‍යයක් වූ **කමලඤ්ජලිය** රචනා කොට සුළු කලකට පසු එබඳු ම භක්තිකාව්‍යයක් වූ **භක්තිපඤ්චාශිකාව** රචනා කළහ. නමින් ම එහි විෂයක්ෂේත්‍රය පැහැදිලිය. සංස්කෘතය භාෂා මාධ්‍යය යි. රසික හදවත් භක්තියෙන් නැවී පිබිදී යන අයුරින් සුසිලිටු බසින් ඉදිරිපත් කොට ඇති එහි අදහස් සර්වප්‍රකාරයෙන් ම සාරගර්භ විය. විෂයයට උචිත වෘත්තයකින් රචිත ය. එය ගීතවත් ලෙස ගායනය කළ හැක්කකි. ප්‍රමාණයෙන් කුඩා කාව්‍යයක් වුවත් අගයෙන්

---

* ප්‍රකාශනය: ඇස්. කේ මුණසිංහ
ඩබ්ලියු. ඩී. හේවාවිතාරණ
මුද්‍රණය: ත්‍රිපිටක මුද්‍රාණාලය, කොළඹ.
ප්‍රමාණය: රෝයල් පිටු. 200
ප්‍රකාශිත වර්ෂය: 2498/1955

හා වටිනාකමින් වැඩිතැන් පත් සුමිහිරි නිර්මාණයකි.[1] මහානායක හිමි පාණන් වහන්සේට 60 වසරක් පිරෙත් ම එය ද අරමුණු කොටගෙන රචනා කළ මෙම කාව්‍යය 1940 සැප්තැම්බර් මස 04 වැනි දින නිමකොට ඇත.

1919 විදුරුපොළ මා හිමියන් වැඩම කළ ඉන්දියා ගමන ගැන උන් වහන්සේ පිළියෙළ කළ සංචාරක ග්‍රන්ථයක් විය. එය මුද්‍රණය කරවිය නො හැකි වීම ගැන පැවැසෙන අදහසකි, මේ .[2]

> "(මෙය) පොතක් වශයෙන් එක විට ම තමුන්නාන්සේලා අතට දෙන්නට අදහස් කර මේ තාක් පමා වූයෙමි. නමුත් එසේ කර ගත හැකි කාලය නොවන බැවින්.... කොටස් වශයෙන්...... පළ කරන්නෙමි."

මෙම සංචාරක ග්‍රන්ථයට උන්වහන්සේ වැඩම කළ ගමන් මාර්ගය පිළිබඳ පූර්ණ තොරතුරු ඇතුළත් වෙයි. නැරඹුවා වූ ද, වැඳුම් පිදුම් කළා වූ ද, විවිධ ස්ථාන ගැන ඓතිහාසික විස්තර ද උන්වහන්සේ විවරණය කරන අතර තමා මුණ පෑ විවිධ අවස්ථාවන් ගැන ලියා ඇත්තේ සිත් කාවදින බසිනි. උන්වහන්සේට හමු වූවන්ගේ ගති පැවතුම් හා චාරිත්‍ර විධි, චරිත විනිවිද දුටුවකු මෙන් කරන විස්තර පහන් සංවේගය දනවන අයුරින් විවරණය කොට ඇත. ඇතැම් තැනක භෞගෝලික පරිස්ථිතිය, දේශගුණික තත්ත්වය, ඒ ඒ පෙදෙස් වැස්සන්ගේ ආචාර විධි පමණක් නොව එම පෙදෙස් හා ලංකාවත් අතර ඇති සමවිසමතාවන් ගැන ද මේ ග්‍රන්ථය තුළ විස්තර කොට ඇත්තේ චමත්කාරජනක ලෙස යි.

මෙම සංචාරක ග්‍රන්ථය මුද්‍රණය කරගත නොහැකි වූ පාඩුව යම්තමින් හෝ මැඩපවත්වා ගන්නට මෙන් **"මගේ පළමුවන ඉන්දියා ගමන"** යන මාතෘකාවෙන් ලිපි පෙළක් හැටියට 1920 — 1921 වර්ෂවල **සිරිසර සඟරාව**[3] මඟින් පළ කරවන ලදී.

ක්‍රි.ව. 1924 ජුනි 13 වැනි දින ඇරඹූ වන්දනා සංචාරයක් ගැන ලිපි කීපයක් ජූලි 05 පටන් **සිංහල බෞද්ධයා**[4] පත්‍රයේ පළ වී තිබේ. මහානායක හාමුදුරුවන්ගේ ප්‍රධානත්වයෙන් ගිය මෙම ගමනට සහභාගි වූ පිරිස 18 දෙනෙකි. ජූනි 20 වැනිදයින් අවසන් වී ඇති මේ සංචාරය සඳහා දින 8 ක් ගත වී ඇත. **දළද මාලිගය, අලුවිහාරය, සීගිරිය, දඹුල්ල, පොළොන්නරුව, අනුරාධපුරය, අව්කන, විජිතපුරය** ආදි පූජ්‍යස්ථාන රාශියක් මේ සඳහා යොද ගෙන ඇත. ඒ ඒ පූජ්‍යස්ථානවල සාමාන්‍ය හැඳින්වීමක් මෙන් ම ගමනේ

---

1. මෙයින් උපුටාගත් ශ්ලෝක කීපයක් මෙහි උපග්‍රන්ථයෙහි පළවේ.
2. සිරිසර සඟරාව, පිට; 904
3. සිරිසර සඟරාව, (1920-21) පිටු:903, 926, 949, 960, 978, 1001, 1018, 1039, 1082 සිට ඉදිරියට
4. සිංහල බෞද්ධයා, 1924 ජූලි 05 හා 12 සිට ඉදිරියට.

සිදුවීම ඇතුළු තොරතුරු මේ ලිපිවලට ඇතුළත් ව තිබේ. ආගමික සංචාරක වාර්තාවක් හැටියට රසවත් අයුරින් රචනා කොට ඇත්තෙන් වෙහෙසක් නො දනෙන ලෙස පාඨකයාට කියවාගෙන යා හැකි ය. මෙය ද මුද්‍රණය නො වූවකි. එම ලිපි පෙළෙහි මාතෘකාව **'මගේ ප්‍රීතිමත් වන්දනා ගමන'** යනු යි.

# 10 පරිච්ඡේදය

# ජාත්‍යන්තර කීර්තිය

## I

සපුරා මීට හැටඅට වසරකට පෙර එනම් ක්‍රි.ව. 1919 නොවැම්බර් 6, 7, 8 වැනි දිනවල භාරතයෙහි **පූනා** පුරවරයෙහි පැවැත්වූ **ආසියානු මහා පණ්ඩිත සම්මේලනය** සමස්ත ආසියාකරයේ ම මහා විද්වතුන්ගේ එබඳු සම්මේලනයක් පැවැත්වූ ආදිම අවස්ථාව යි. නොවැම්බර හයවන දින සවස් භාගයෙහි එම සම්මේලනයේ දී සුගැඹුරු විෂයක් ගැන වේගවත් කථාවක් පවත්වන ලාංකික මහා පඬිවරයෙක් විය. මෙම පඬිවරයා වේදිකා ගතවුණු වහා ම සභාවේ අමුතුම නිසලතාවක් ඇති විය. කථා කරන ස්වර යෙහි, මාතෘකාවෙහි පමණක් නොව ආරෝහ පරිණාහ සම්පන්න දේහයෙහි පවා ඇති ඒ සුගැඹුරුබව සභාසද පඬිවරුන්ගේ විශේෂ අවධානයටත්, ගෞරවාන්විත පිළිගැනීමටත් හේතු විය. පැහැදිලි වියත් බසින් කථාව පැවැත්වේ. සභාව නිහඬ යි. මීයට පිම්බාක් මෙන් ඇති වූ ඒ නිහඬතාව කථාව නිමවන තෙක් ම නොනිමියේ ය.

මේ ශ්‍රේෂ්ඨ කථිකයා උඩරට අමරපුර නිකායේ මහානායක පූජ්‍ය පණ්ඩිත **විදුරුපොළ පියතිස්සා**'භිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. දඹදිව **පූනා** නගරයේ පැවැත්වූ මෙම සම්මේලනය ආසියාවේ මහා පඬිවරුන් එක් රැස්ව ඉතිහාසයේ පළමුවරට භාෂා ශාස්ත්‍ර දර්ශන දර්ශනාන්තර පිළිබඳ ව කැරුණු මහා සම්මේලනය යි. මෙයට එක්රැස් වූ පණ්ඩිත පිරිස පන්සියයකි· ලිපි ඉදිරිපත් කරමින් කථා පැවැත්වූවෝ එකසිය දහහත් දෙනෙකි. සම්මේලනය පැවැත්වූ දින ගණන තුනකි. බාහිර නිරීක්ෂකයන් හැටියට සහභාගි වූ පඬිවරු එක්දහස් පන්සියයක් පමණ වූහ.

**රාජකීය ආසියාතික සමිතිය** වෙනුවෙන් මේ සම්මේලනයට සහභාගි වන ලෙස ආරාධනා පත් ලැබූ ලාංකික වියතුන් අතර ශ්‍රීමත් **පොන්නම්බලම් අරුණාචලම්** මහතා හා ආචාර්ය **පෝල් ඊ. පීරිස්** මහතා ද වෙති. එම සම්මේලනයේ කෘත්‍යවිධායක **මණ්ඩලයේ** විශේෂ ආරාධනාවක් ලබා එයට සහභාගි වූ ලාංකික පඬිවරයා **විදුරුපොළ පියතිස්ස** මහානායක

හිමිපාණන් වහන්සේ ය. මෙම ආසියාතු වියතුන්ගේ මහා සභා සම්මේලන යට සහභාගි වීමෙන් විදුරුපොළ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ලබා ගත්තේ අතිවිශිෂ්ට ගෞරවයකි. විශේෂයෙන් ආසියාවේ කීර්තිධර ලේඛකයෙකු හා ශ්‍රේෂ්ඨතම පඬිවරයෙකු හැටියට උන්වහන්සේගේ ශ්‍රී නාමය ඉතිහාසයට එක්වීමට මෙම කාරණය ද ප්‍රධාන හේතුවක් වේ.

විශේෂයෙන් ආසියාවේත්, සාමාන්‍යයෙන් ලෝකයේත්, නව භාෂා-ශාස්ත්‍ර-ශිල්ප-කලා සමුන්නතිය පිළිබඳ ව මෙබඳු සම්මේලනයක ඇති වැදගත්කමත්, එයින් ලංකාවට ලැබිය හැකි ප්‍රයෝජනයත් ගැන කරුණු පැහැදිලි කරමින් සාහිත්‍යකීර්ති ඩබ්ලියු. ඒ. සිල්වා මහතා තම කර්තෘත්ව යෙන් පළ කළ ''සිරිසර'' සඟරාවේ කතුවැකි තුනක්ම ලියා ඇත. විදුරු පොළ මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ මේ සම්මේලනයට සහභාගී ව අතිව්‍යක්ත දේශනයක් පැවැත්වීමෙන් ලංකාද්වීපයට ලබා දුන් කීර්තිය ගැන ඒ මහතා ඉතා උසස් අන්දමෙන් වර්ණනා කොට ඇත.

මේ මහා පණ්ඩිත සම්මේලනයට සහභාගි වීම සඳහා විදුරුපොළ මහානායක මාහිමියෝ 1919 ඔක්තෝබර් 24 වැනි දින නුවරඑළියේ ශ්‍රී මහා විහාරයෙන් පිටත් ව ටහනුවරට පැමිණ දළදා වහන්සේ වැඳ පුදාගෙන 30 වැනි දින මහනුවර මල්වත්තෙන් සිය ගමන ආරම්භ කළහ.* නොවැම්බර් 04 වැනි දින පූනා නගරයට පැමිණියහ. මහානායක හිමියන්ගේ කථාවට වෙන් වී තිබුණේ නොවැම්බර් හය වැනි දින පස්වරු සමය යි. ''බෞද්ධ න්‍යාය ශාස්ත්‍රය'' යන හිසින් උන්වහන්සේගේ කථාව පිටු 15 ක් වන නිබන්ධ යකි. ථෙරවාද බුද්ධධර්මයෙහි පැනෙන ඉතා උසස් ම න්‍යාය ක්‍රමය වන මෙය ධර්මය විස්තර කිරීම සඳහා උපයෝගී කරගත් අතිවිශිෂ්ට සම්ප්‍රදය යකි.

මේ සම්මේලනය පවත්වන ලද්දේ සර් රාමක්‍රිෂ්ණ ගොපාල් භණ්ඩර්කාර් මහා පණ්ඩිතොත්තමයාගේ සභාපතිත්වයෙනි. මෙහි මාතෘකාන්විත කථා පන්ති කෙළෙසකින් සමන්විත වූ අතර සාකච්ඡාවට විෂයයන් බෙද තිබුණි. එහි පාළි හා බුද්ධධර්මය සඳහා නිබන්ධන සම්මේලන වාර පහක් යොදා තිබිණ. එයින් බෞද්ධ න්‍යාය ශාස්ත්‍රය පිළිබඳ ව ඉංග්‍රීසියෙන් ඉදිරිපත් කළ ශාස්ත්‍රීය නිබන්ධයෙහි සම්පාදකවරයා වූයේ බුරුම මහා පඬිවරයෙකු වූ මෞන්ස්වී ෂාන්ඕං තුමා ය. බෞද්ධ විනය පාළිය පිළිබඳ ශාස්ත්‍රීය නිබන්ධය ඇන්. කේ. භගවත් (ඇම්.ඒ.) මහතා විසින් ඉදිරිපත් කරන ලදී. මිථිලාපුරය දැවීම පිළිබඳ ව ඉංග්‍රීසියෙන් ඉදිරිපත් කළ ශාස්ත්‍රීය නිබන්ධයෙහි සම්පාදකවරයා සී. වී. රාජ්වාදෙ (ඇම්.ඒ.) මහත්මා ය.

* උන් වහන්සේගේ කැපකරු හැටියට මේ ගමනට සහභාගී වූයේ මාතර බී. ඒ. ඒ. ජී. ජයවර්ධන නම් තරුණ මහතෙකි. ඔහු සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුන ගැනම අක්ෂණකූ ටම සඳහන් වේ.

මේ ගමන ගැන සම්පූර්ණ විස්තරයක් මහානායක හිමිපාණන් විසින් ම ක්‍රි. ව. 1920-1921 වර්ෂවල පළ වූ සිරිසර සඟරාවට සපයා ඇත. එහි මාතෘකාව ''මගේ පළමු වන ඉන්දියා ගමන'' යනු යි.

බෞද්ධ න්‍යායශාස්ත්‍රය පිළිබඳ ව පාළි භාෂාත්මක ශාස්ත්‍රීය නිබන්ධය පූජ්‍ය පණ්ඩිත **විදුරුපොළ පියතිස්ස** මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ඉදිරිපත් කැරිණ. **නාගාර්ජුන** ආචාර්යවරයා පිළිබඳ ව ඉංග්‍රීසියෙන් සැපයූ ශාස්ත්‍රීය ලේඛනයෙහි කතුවරයා වූවෝ මහා මහෝපාධ්‍යාය ශාස්ත්‍රාචාර්ය **සතිශ්චන්ද්‍ර විද්‍යාභූෂණ** පඬිවරයාණෝ ය. විදුරුපොළ මා හිමිපාණන්ගේ එම ශාස්ත්‍රීය දේශනය උන්වහන්සේ විසින් ම සිය අත් අකුරෙන් ලියා තැන්පත් කොට තබා ඇත. මෙහි පළ වන්නේ එම නිබන්ධයේ පිටපත යි :

## සොගතඤායසත්ථං

"ඉදං පන සත්ථං ආයස්මතා මහා කච්චායනත්ථෙරෙන මහාභිඤ්ඤාසවෙන පභින්නපටිසම්භිදෙන අසීතියා මහා සාවකෙසු අන්තොගධෙන භගවතා එතදග්ගෙ ඨපිතෙන පණීතං නවඞ්ගසත්ථු සාසනසංවණ්ණනාය.

තත්ථ නවඞ්ගසත්ථුසාසනං නාම, සුත්තං – ගෙය්‍යං - වෙය්‍යාකරණං ගාථා– උදානං – ඉතිවුත්තකං - ජාතකං – අබ්භුතධම්මං – වෙදල්ලන්ති.

භගවතා දෙසිතො හි පරියත්තිධම්මො ඉමෙහි නවහි අඞ්ගහි විනිම්මුත්තො නාම නත්ථි.

තදෙතං නවඞ්ගසත්ථුසාසනසංඛාතං පරියත්තිධම්මං සංවණ්ණෙතුකාමෙන තාව — ඤායසත්ථඤ්ඤුනා භවිතබ්බං.

තම්පනෙතං සත්ථං රචයන්තෙන ආයස්මතා මහාකච්චායනත්ථෙරෙන ද්වේ පකරණානි පණීතානි පෙටකොපදෙසො නෙත්තිප්පකරණඤ්චා'ති.

තෙසු ච නෙත්තිප්පකරණං භගවතා අනුමෝදිතං මූලසඞ්ගීතියං සඞ්ගීතං බදරතිත්ථවිහාරවාසිනා භදන්ත ධම්මපාලමහාථෙරෙන දුතියට්ඨකථාචරියෙන විරචිතාය අට්ඨකථාය පතිමණ්ඩිතං, ස්‍යාමමරම්මවිසයෙසු ලඞ්කාදීපෙ ච සොගතාගමධරෙහි ථෙරානුථෙරෙහි සම්භාවියමානං වත්තතෙ.

තස්සෙවං සම්භාවිතත්තෙ සතිපි යස්මා නේතමෙතරහි ලඞ්කිකාසු ආචරියපරම්පරාසු අන්තෙවාසිකෙ වාචෙන්ති, තස්මාස්ස සබ්බත්ථ පචලිත භාවො න දිස්සතෙ.

තං සාධුවතස්ස සචෙ ලඞ්කාදීපිකා සොගතාගමධරා ආචරියපුඞ්ගවා පසත්ථං ඤායසත්ථමිදමන්තෙවාසිකෙ වාචෙය්‍යුං එතදන්තොගධත්තා සකල නවඞ්ගසත්ථුසාසනසංවණ්ණනාය අවිඤ්ඤාතඤායසත්ථානං වාධුනිකානං පාලියත්ථසංවණ්ණනාය ඤායවිරොධාපජ්ජනසම්භවතො.

තස්මා මයමෙවමාදිකං පයොජනන්තර'මභිසන්ධාය නෙත්තිප්පකරණං තදට්ඨකථඤ්ච නිස්සාය තත්ථාගතනයෙනෙව සොගතං ඤායසත්ථ'මිධ සංඛෙපතො දස්සයිස්සාම.

සකල'මෙව හි නෙත්තිප්පකරණං ආයස්මතා මහා කච්චායනෙන ද්විධා විභත්තං සඞ්ගහවාරො විභාගවාරොති. තත්‍රායං සඞ්ගහවාරස්ස සංඛෙපො. නෙත්තිසංඛාතෙන ඤායසත්ථෙන සංවණ්ණෙතබ්බපදත්ථ භාවෙ ඨිතං සුත්තගෙය්‍යාදිනවඞ්ගසඞ්ගහිතං පරියත්තිසාසනං බ්‍යඤ්ජනත්ථ ප්පභෙදතො ද්වාසපද'මිහ සුත්තං නාම.යෙනා'හ "ද්වාදසපදනිසුත්තං තං සබ්බං බ්‍යඤ්ජනඤ්ච අත්ථො චා" ති.

තස්ස ච සුත්තස්ස අත්ථසංවණ්ණනාභූතා සොළසහාරා පඤ්චනය අට්ඨාරසමූලපදානි ච නෙත්ති (අථවා සොගතඤායසත්ථං) නාම. තත්ථ දෙසනාදයො සොළසපිහාරාමූලපදනිද්ධාරණ'මන්තරෙන බ්‍යඤ්ජනමුඛෙනෙව සුත්තස්ස සංවණ්ණනා හොන්ති. පඤ්චසු නයෙසු තයො අත්ථ නයා නන්දියාවට්ටාදයෝ අත්ථමුඛෙනේව සුත්තත්ථං සංවණ්ණෙන්ති. උභයම්පෙ'තං සුත්තස්ස අත්ථනිද්ධාරණවසෙන සබ්බථා සුත්තෙ පයොජිතං සුත්තං සංවණ්ණනාති නාම.

අථවා, අත්ථෙසු කතපරිච්ඡෙදෙ බ්‍යඤ්ජනප්පබන්ධො දෙසනා, යො පායො'ති වුච්චති. තදත්ථො දෙසිතං. තාය දෙසනාය පබොධිතත්තා. තදුභයම්පි එකන්තෙනෙ'ව විඤ්ඤෙය්‍යං අනුපාදපරිනිබ්බාණපරියොසානානං සම්පත්තීනං හෙතුභාවතො තදුභයවිනිම්මුත්තස්ස ච ඤෙය්‍යස්ස අභාවතෝති.

යථා වුත්තෙ ච විජානෙන සාධෙතබ්බෙ අයං වක්ඛමානො හාරනයානුපුබ්බිසංඛාතො අනුක්කමො නවඞ්ගසාසනසංඛාතස්ස සුත්තස්ස අත්ථ විචාරණ'ති වෙදිතබ්බොති. එව'මතිසංඛිත්තං සංගහවාරං විභජිත්වා දස්සෙතුං තදනන්තරං විභාගවාරො දෙසිතො.සො ච තිවිධා උද්දෙස නිද්දෙස පටිනිද්දෙසවසෙන.

(!) තත්ථ උද්දෙසවාරෙ තාව සොළසහාරා භවන්ති.

1. දෙසනාහාරො
2. විචයහාරො
3. යුත්තිහාරො
4. පදට්ඨානහාරො
5. ලක්ඛණහාරො
6. චතුබ්‍යූහහාරො
7. ආවට්ටහාරො
8. විභත්තිහාරො

9. පරිවත්තනහාරො
10. වෙවචනහාරො
11. පඤ්ඤත්තිහාරො
12. ඔතරණහාරො
13. සොධනහාරො
14. අධිට්ඨානහාරො
15. පරික්ඛාරහාරො
16. සමාරොපනහාරො'ති.

තත්ථ කෙනට්ඨෙන හාරා ? හරියන්ති එතෙහි එත්ථ වා සුත්තගෙය්‍යාදි විසයා අඤ්ඤාණසංසයවිපල්ලාසා'ති හාරා. හරන්ති වා සයං තානි හරණමත්ත'මෙව වා' ති හාරා එලුපචාරෙන. අථවා හරියන්ති වොහරීයන්ති ධම්මසංවණ්ණකධම්මපටිග්ගාහකෙහි ධම්මස්ස දනගහණවසෙනා' ති හාරා. අථවා හාරා විය'ාතිහාරා. යථා හි අනෙකරතනාවලිසමූහො හාරසංඛාතො අත්තනො අවයවභූතරතනසම්ඵස්සේහි සමුප්පජ්ජමානහිලාදසුඛො හුත්වා තදුපභොගිජනසරීරසන්තාපං නිදසපරිළාහූපජනිතං වූපසමෙති, එව'මෙතෙ' පි නානාවිධපරමත්ථරතනප්පබන්ධා සංවණ්ණනා විසේසා අත්තනො අවයවභූතපරමත්ථරතනාධිගමෙන සමුප්පාදියමානනිබ්බුතිසුඛා ධම්මපටිග්ගාහකජනහදයපරිතාපං කාමරාගාදිකිලෙසහෙතුකං වූපසමෙන්තී'ති. අථවා, හාර යන්ති අඤ්ඤාණදීනං හාරං අපගමං කරොන්ති ආවික්ඛන්තී'තිවා හාරා, අථවා සොතුජනචිත්තස්ස හරණතො රමණතො ච හාරා නිරුත්තිනයෙන. යථා භවෙසු වන්තගමණො භගවා'ති. අයං තාව හාරානං සාධාරණතො අත්ථො. අසාධාරණතො පන—

1. දෙසීයති සංවණ්ණීයති එතාය සුත්තත්ථො'ති දෙසනා. දෙසනාසභවරණතො වා දෙසනා.

2. විචීයන්ති එතෙන එත්ථ වා පදපඤ්හාදයො, විචිති එව වා තෙසන්ති විචයො. පාළියං පන විචිණතී'ති විචයොති අය'මත්ථො දස්සිතො.

3. යුත්තී'ති උපපත්ති සාධනයුත්ති. ඉධ පන යුත්තිවිචාරණා යුත්ති, උත්තරපදලොපෙන රූපභවො රූපන්ති ආදිසු විය. යුත්තිසභවරණතො වා යුත්ති.

4. පදට්ඨානන්ති ආසන්නකාරණං, ඉධා'පි පදට්ඨානවිචාරණා'ති ආදිවුත්තනයමෙව.

5. ලක්ඛීයන්ති එතෙන එත්ථ වා එකලක්ඛණා ධම්මා අවුත්තා'පි එකවචනෙනා'ති ලක්ඛණං.

6. වියූහියන්ති විභාගෙන පිණ්ඩීයන්ති එතෙන එත්ථවා'ති බ්‍යූහො නිබ්බචනාදීනං සුත්තෙ දස්සියමානානං චතුන්නං බ්‍යූහො'ති චතුබ්‍යූහො. චතුන්නං වා බ්‍යූහො එත්ථා'තිචතුබ්‍යූහො.

7. ආවට්ටීයන්ති එතෙන එත්ථ වා සභාගා විසභාගා ච ධම්මා, තෙසං වා අවට්ටනන්ති ආවට්ටො.

8. විභජීයන්ති එතෙන එත්ථ වා සාධාරණාසාධාරණානං සංකිලෙස වොදනධම්මානං භූමියො'ති විභත්ති. විභජනං වා එතාසං භූමීනන්ති විභත්ති.

9. පටිපක්ඛවසෙන පරිවත්තීයන්ති ඉමිනා, එත්ථ වා සුත්තෙ වුත්ත ධම්මා, පරිවත්තනං වා තෙසන්ති පරිවත්තනො.

10. විවිධං වචනං එකස්සෙවත්ථස්ස වාචකමෙත්ථා'ති විවචනං. විවචනමෙව වෙවචනං. විවිධං වුච්චති එතෙන අත්ථොති වා විවචනං. සෙසං වුත්තනයමෙව.

11. පකාරෙහි පභෙදතො වා ඤාපියන්ති ඉමිනා එත්ථ වා අත්ථාති' පඤ්ඤත්ති.

12. ඔතාරියන්ති අනුප්පවෙසියන්ති එතෙන, එත්ථ වා සුත්තාගතා ධම්මා පටිච්චසමුප්පාදදීසූ'ති ඔතරණෙ.

13. සොධියන්ති සමාධියන්ති එතෙන එත්ථ වා සුත්තෙ පදපදත්ථ පඤ්හාරම්භා'ති සොධනො.

14. අධිට්ඨීයන්ති අනුපවත්තීයන්ති එතෙන එත්ථ වා සාමඤ්ඤ විසෙසභූතා ධම්මා විනා විකප්පෙනා'ති අධිට්ඨානො.

15. පරිකරොති අභිසංඛරොති ඵලන්ති පරික්ඛාරො. හෙතු පච්චයො ච. පරික්ඛාරං ආචික්ඛතී'ති පරික්ඛාරො. හාරො. පාරික්ඛාරවිසයත්තා පරික්ඛාරසභවරණතො වා පරික්ඛාරො.

16. සමාරොපියනති එතෙන එත්ථ වා පදට්ඨානාදීමුඛෙන ධම්මා'ති සමාරොපනො. සබ්බත්ථ ච භාවසාධනවසෙනා'පි අත්ථො ලබ්භතී'ති පස්සා'පි වසෙන යොජෙතබ්බං.

(ii) පඤ්චනයා භවන්ති යථා–

1. නන්දියාවට්ටො.
2. සීහවික්කීළිතො.
3. තිපුක්ඛලො.
4. දිසාලොචනො.
5. අඞ්කුසො'ති.

තත්ථ නයන්ති සංකිලෙසෙ වොදනාහි ච විභාගතො ඤාපෙන්තී'ති නයා. නියන්ති වා තානි එතෙහි එත්ථ වා'ති නයා. නයනමත්ත මෙවවා'ති නයා. නීයන්ති වා සයං ධම්මකථිකෙහි උපනීයන්ති සුත්තස්ස අත්ථ

පච්චයත්ථන්ති නයා. අථවා නයා පියා'ති නයා. යථා හි එකත්තාදයො නයා සම්මා පටිවිජ්ඣියමානා පච්චයපච්චයුප්පන්නධම්මානං යථාක්කමං සම්බන්ධවිභාගබ්‍යාපාරවිරහානුරූපඵලභාවදස්සනේන අසඞ්කරතො සම්මති සච්චපරමත්ථසච්චානං සභාවං පවෙදයන්තා පරමත්ථසච්චපටිවේධාය සංවත්තන්ති, එව'මෙතෙ'පි කණ්හසුක්කසප්පටිභාගධම්ම විභාගදස්සනෙන අවිපරීතසුත්තත්ථාවබොධාය අභිසම්භූනන්තා වෙනෙය්‍යානං සච්චපටිවෙධාය සංවත්තන්ති. අථවා පරියත්ති අත්ථස්ස නයනතො සංකිලෙසතො යමනතො ච නයා නිරුත්තිනයෙන.

1. නන්දියාවට්ටෝ'ති ආදීසු නන්දියාවට්ටස්ස විය ආවට්ටො එතස්සා'ති නන්දියාවට්ටො. යථා හි නන්දියාවට්ටො අන්තොයීතෙන පධානාව යවෙන බහිද්ධා ආවට්ටති, එව'මයම්පි නයොති අත්ථො. අථවා නන්දියා තණ්හාය පමොදස්ස වා ආවට්ටො'ති නන්දියාවට්ටො.

2. තීහි අවයවෙහි ලොභාදීහි සංකිලෙසපක්ඛේ, අලොභාදීහි වොදනපක්ඛෙ පුක්ඛලො සොභනො'ති තිපුක්ඛලො.

3. අසන්තසනජවපරක්කමාදිවිසෙසයොගෙන සීහො භගවා. තස්ස වික්කීළිතං දෙසනාවචීකම්මභූතො විහාරොති කත්වා විපල්ලාසතප්පටිපක්ඛපරිදීපනතො සීහස්ස වික්කීළිතං එත්ථා'ති සීහවික්කීළිතො. නයො. බලවිසෙසයොගදීපනතො වා සීහවික්කීළිතසදිසත්තා නයො සීහවික්කීළිතො. බලවිසෙසො චෙත්ථ සද්ධාදිබලං, දසබලානි එව වා.

4. අත්ථනයත්තයදිසාභාවෙන කුසලාදිධම්මානං ආලොචනං දිසාලොචනං.

5. තථා ආලොචිතානං තෙසං ධම්මානං අත්ථනයත්තයයොජනෙ සමානයනතො අඞ්කුසො විය අඞ්කුසො'ති.

(iii) අට්ඨාරසමූලපදනි භවන්ති යෙසං නව කුසලානි නව අකුසලානි. තත්ථ—

1. තණ්හා
2. අවිජ්ජා
3. ලොභො
4. දොසො
5. මොහො
6. සුභසඤ්ඤා
7. සුඛසඤ්ඤා
8. නිච්චසඤ්ඤා
9. අත්තසඤ්ඤා'ති, නව පදනි අකුසලානි. සබ්බො'පි අකුසලපක්ඛො එත්ථෙ'ව සංගහං සමොසරණංගච්ඡති.

1. සමථො
2. විපස්සනා
3. අලොභො
4. අදොසො
5. අමොහො
6. අසුභසඤ්ඤා
7. දුක්ඛසඤ්ඤා
8. අනිච්චසඤ්ඤා
9. අනත්තසඤ්ඤා'ති ඉමානි නව පදනි කුසලානි. සබ්බො කුසලපක්ඛො එත්ථෙ'ව සඞ්ගහංසමොසරණං ගච්ඡතී'ති.

තත්ථ මූලපදනී'ති, මූලානි ච තානි නයානං පට්ඨාන භාගානඤ්ච පතිට්ඨා භාවතො පදනි ච අධිගමූපායභාවතො කොට්ඨාසභාවතො වා'ති මූලපදනි. කොසල්ලසම්භූතට්ඨෙන කුච්ඡිතානං වා පාපධම්මානං සලනතො විද්ධංසනතො කුසානං වා රාගාදීනං ලවනතො කුසාවිය වා ලවනතො කුසෙන වා ඤාණෙන ලාතබ්බතො පවත්තෙතබ්බතො කුසලානි. තප්පටිපක්ඛතො අකුසලානී'ති. අයං උද්දේසවාරස්ස සංඛෙපො.

(II) ඉදනි නිද්දේසවාරං සංඛෙපතො දස්සෙම. සොප ඤ්චධා දට්ඨබ්බො.

1. පදත්ථතො
2. ලක්ඛණතො
3. කමතො
4. එතාවපරමතො
5. හෙත්වාදිතො'ති.

1. තත්ථ සාමඤ්ඤෙන හාරනයසද්දනං විසෙසෙන දෙසනාසද්දදීනඤ්ච පදත්ථො අට්ඨකථාගතනයෙන උද්දෙසවාරෙදස්සිතොයෙව.

2. ලක්ඛණෙ පන සාමඤ්ඤතො තාව සබ්බෙ'පි හාරා නයා ච යථාක්කමං බ්‍යඤ්ජනත්ථමුඛෙන නවඞ්ගස්ස සාසනස්ස අත්ථ සංවණ්ණන ලක්ඛණා. විසෙසතො දෙසනාදීනං ලක්ඛණ මෙවං දට්ඨබ්බං—

අස්සාද ආදීනව නිස්සරණ ඵල උපාය ආණත්තීනං විභජනලක්ඛණො දෙසනාහාරො (1)

පදපුච්ඡාවිස්සජ්ජනපුබ්බාපරානුගීතීනං අස්සාදදීනඤ්ච විසෙස නිද්ධාරණවසෙනෙව විචයලක්ඛණො විචයහාරො. (2)

සුත්තෙ බ්‍යඤ්ජනත්ථානං යුත්තායුත්තභාවවිභාවනලක්ඛණො යුත්ති හාරො (3)

සුත්තෙ ආගතධම්මානං පදට්ඨානභූතා ධම්මා තෙසඤ්ච පදට්ඨාන භූතා'ති සම්භවතො පදට්ඨානභූතධම්මනිද්ධාරණලක්ඛණො පදට්ඨාන හාරො (4)

සුත්තෙ අනාගතෙ'පි ධම්මෙ වුත්තප්පකාරෙන ආගතෙවිය නිද්ධාරෙත්වා සංවණ්ණනලක්ඛණො ලක්ඛණහාරො. (5)

නිබ්බචන අධිප්පාය දෙසනානිදන පුබ්බාපරානුසන්ධීනං චතුන්නං විභාවනලක්ඛණො චතුබ්‍යුහ හාරො. (6)

දෙසනාය ගහිතසභාගවිසභාගධම්මවසෙන ආවට්ටනලක්ඛණො ආවට්ට හාරො. (7)

සංකිලෙසධම්මෙ වොදනධම්මෙ ච සාධාරණාසාධාරණතො පදට්ඨා නතො භූමිතො ච විභජනලක්ඛණො විභත්තිහාරො. (8)

නිද්දිට්ඨානං ධම්මානං පටිපක්ඛතො පරිවත්තනලක්ඛණො පරිවත්තන හාරො. (9)

එකස්මිං අත්ථෙ අනෙකපරියායසද්දයොජනාලක්ඛණො වෙවචන හාරො. (10)

එකෙකස්ස ධම්මස්ස අනෙකාහි පඤ්ඤත්තීහි පඤ්ඤාපෙතබ්බා කාරවිභාවනලක්ඛණො පඤ්ඤත්තිහාරො. (11)

පටිච්චසමුප්පාද ඉන්ද්‍රිය ඛන්ධ ධාතු ආයතනමුඛෙහි සුත්තත්ථස්ස ඔතරණලක්ඛණො ඔතරණහාරො. (12)

සුත්තෙ පදපදත්ථපඤ්හාරම්භානං සොධනලක්ඛණො සොධනහාරො. (13)

සුත්තාගතානං ධම්මානං අවිකප්පනවසෙන සාමඤ්ඤවිසෙසනිද්ධාරණ ලක්ඛණො අධිට්ඨානහාරො. (14)

සුත්තෙ ආගතධම්මානං පරික්ඛාරසංඛාතෙ හෙතුපච්චයෙ නිද්ධාරෙත්වා සංවණ්ණනලක්ඛණො පරික්ඛාරහාරො. (15)

සුත්තෙ ආගතධම්මානං පදට්ඨානවෙවචන භාවනා පහානසමාරොපන විචාරණලක්ඛණො සමාරොපනහාරො. (16)

නයෙසු ච තණ්හා අවිජ්ජාහි සංකිලෙස පක්ඛස්ස සුත්තත්ථස්ස සමථවිපස්සනාහි වොදනපක්ඛස්ස ච චතුසච්චයොජනාමුඛෙන නයන ලක්ඛණො නන්දියාවට්ටනයො. (1)

අකුසලමූලෙහි සංකිලෙසපක්ඛස්ස කුසලමූලෙහි වොදනපක්ඛස්ස ච සුත්තත්ථස්ස චතුසච්චයොජනාමුඛෙන නයනලක්ඛණො තිපුක්ඛලනයො. (2)

සුභසඤ්ඤාදීහි විපල්ලාසෙහි සකලස්ස සංකිලෙසපක්ඛස්ස සද්ධින්ද්‍රි යාදීහි වොදනපක්ඛස්ස ච චතුසච්චයොජනාවසෙන නයනලක්ඛණො සීහ වික්කීළිතනයො. (3)

තෙසුතෙසු සුත්තත්ථවිස්සජ්ජනෙසු තස්ස තස්ස නයස්ස දිසාභූතානං වොදනියානං සංකිලෙසිකාන ඤ්ච ධම්මානං මනසා ඔලොකන ලක්ඛණො දිසාලොචන නයො. (4)

දිසාලොචනෙන ඔලොකිතානං ධම්මානං උද්ධරිත්වා තස්ස තස්ස නයස්ස යෝජනාවසෙන සමානයනලක්ඛණො අඞ්කුසනයො'ති. (5) ඉමෙ පනද්වේ'පි න අත්ථනයා අථඛො වොහාරනයා කම්මනයා'ති ච වුච්චන්ති.

තත්ථ බ්‍යඤ්ජනපරියෙට්ඨීභාවතො හාරානං පඨමං සොළසහාරෙ යොජෙත්වා තදනන්තරං තිණ්ණං අත්ථනයානං දිසාභූතධම්මෙ දිසාලොචන නයෙන ඔලොකෙත්වා පුන තෙ නිද්ධාරෙත්වා අඞ්කුසනයෙන තීසු'පි අත්ථනයෙසු නන්දියාවට්ට තිපුක්ඛල සීහවික්කීළිතෙසු යොජෙන්තේන සුත්තත්ථවණ්ණනා කාතබ්බා.

ඉධ ඨත්වා ඡ බ්‍යඤ්ජනපදනි ඡ අත්ථපදනී'ති සුත්තස්ස ද්වාදස පදනි දස්සෙතබ්බානි. තත්ථ ඡ බ්‍යඤ්ජනපදනි නාම.—

1. අක්ඛරං
2. පදං
3. බ්‍යඤ්ජනං
4. නිරුත්ති
5. නිද්දෙසො
6. ආකාරො'ති

1. තත්ථ, අපරියොසිතෙ පදෙ වණ්ණො අක්ඛරං පරියායවසෙන අක්ඛරණතො අසඞ්වරණතො ච.

2. පජ්ජති අත්ථො එතෙනා'ති පදං. නාම ආඛ්‍යාත උපසග්ග නිපාත වසෙන චතුබ්බිධං.

3. සංඛෙපතො වුත්තං පදභිහිතං අත්ථං බ්‍යඤ්ජයතී'ති බ්‍යඤ්ජනං වාක්‍යං. පදසමුදයොති අත්ථො.

4. ආකාරාභිහිතං නිබ්බචනං නිරුත්ති.

5. නිරවසෙසදෙසනත්තා නිබ්බචනවිත්ථාරො නිද්දේසො.

6. පදෙහි වාක්‍යස්ස විභාගො ආකාරො, අථපදතො ආකාරස්ස තො විසෙසො'ති? අපරියොසිතෙ වාක්‍යෙ අවිභජ්ජමානෙ වා තදවයවො පදං. උච්චාරණවසෙන පරියොසිතෙ වාක්‍යෙ විභජ්ජමානෙ වා තදවයවො ආකාරොති.

ඡ අත්ථපදනි නාම—

1. සංකාසනා
2. පකාසනා
3. විවරණා

4. විභජනා
5. උත්තානීකම්මං
6. පඤ්ඤත්තී'ති.

1. තත්ථ අක්ඛරෙහි දීපනං සංකාසනා
2. පදෙහි දීපනං පකාසනා
3. විත්ථාරකථනං විවරණා
4. විභාගකථනං විභජනා
5. පාකටකරණං උත්තානීකම්මං
6. පකාරෙහිඤාපනං පඤ්ඤත්තී'ති.

එත්ථ ච තයො අත්ථනයා ඡ අත්ථපදනී'ති නවහි පදෙහි සකලස්ස පි බුද්ධවචනස්ස අත්ථො යුජ්ජතෙ. සොළසහාරා ඡ බ්‍යඤ්ජනපදනි ද්වෙ කම්මනයා'ති චතුබ්බීසපදනි යථා වුත්තෙහි නවහි පදෙහි සද්ධිං තෙත්තිංස හොන්ති. ඉතො විනිම්මුත්තො නෙත්තිපදත්ථො නාම නත්ථි.

3. ඉදනි කමතො'ති වුත්තත්තා හාරනයානං අනුක්කමො දස්සී යතෙ.

තත්ථ ධම්මදෙසනාය නිස්සයඵලතදුපායසරිරභූතානං අස්සාදදීනං විභාවනසභාවත්තා පකතියා සබ්බසුත්තානුරූපා'ති සුවිඤ්ඤෙය්‍යභාවතො පරෙසඤ්ච සංවණ්ණනාවිසෙසානං විචයහාරාදීනං පතිට්ඨාභාවතො පඨමං දෙසනාහාරො (1) දස්සිතො.

පදපුච්ඡාවිස්සජ්ජනපුබ්බාපරානුගීතීහි සද්ධිං දෙසනාහාරපදත්ථානං පවිචයසභාවතාය තස්සා'නන්තරං විචයහාරො (2)

විචයහාරෙන විචිතානං අත්ථානං යුත්තායුත්ති විචාරණා යුත්තා'ති යුත්තිවිචාරණභාවතො විචයානන්තරං යුත්තිහාරො. (3)

යුත්තියුත්තානමෙව අත්ථානං උප්පත්තිඅනුරූපං කාරණපරම්පරාය නිද්ධාරණලක්ඛණං පදට්ඨානචින්තනං කාතබ්බන්ති යුත්තිහාරානන්තරං පදට්ඨානහාරො. (4)

යුත්තියුත්තානං කාරණපරම්පරාය පරිග්ගහිතසභාවානංයෙව ච ධම්මානං අවුත්තානම්පි ච එකලක්ඛණතාය ගහණං කාතබ්බන්ති පදට්ඨානානන්තරං ලක්ඛණහාරො. (5)

අත්ථතො නිද්ධාරිතානම්පි ධම්මානං නිබ්බචනාදීනි වත්තබ්බානි, න සුත්තෙ සරූපතො ආගතාන'මෙවා'ති ලක්ඛණානන්තරං චතුබ්‍යූහො. (6)

නිබ්බචනාධිප්පාය නිදානවචනෙහි සද්ධිං සුත්තෙ පදත්ථානං සුත්තන්තර සංසන්දනසංඛාතෙ පුබ්බාපරවිචාරෙ දස්සිතෙ තෙසං සභාගවිසභාගධම්මන්තරාවට්ටනං සුඛෙන සක්කා දස්සෙතුන්ති චතුබ්‍යූහානන්තරං ආවට්ටහාරො. (7)

සභාගවිසභාගධම්මාවට්ටනෙ නියොජිතෙ සාධාරණා'සාධාරණවසෙන සංකිලෙසවොදනධම්මානං පදට්ඨානතො භූමිතො ච විභාගො සක්කා සුඛෙන යොජිතුන්ති ආවට්ටානන්තරං විභත්තිහාරො. (8)

සාවජ්ජානවජ්ජධම්මානං සප්පටිභාගාභාවතො තෙසං විභාගෙ කතෙ සුත්තාගතෙ ධම්මෙ අකසිරෙන පටිපක්ඛතො පරිවත්තෙතුං සක්කා'ති විභත්ති අනන්තරං පරිවත්තනහාරො. (9)

පටිපක්ඛතො පරිවත්තිතා'පි ධම්මා පරියායවචනෙහි යොජෙතබ්බා න සුත්තෙ ආගතායෙවා'ති දස්සනත්ථං පරිවත්තනානන්තරං වෙවචනහාරො. (10)

එවං තෙ ධම්මා පරියායසද්දතො'පි විභාවිතාහොන්තී'ති පරියායතො පකාසිතානං ධම්මානං පභෙදතො පඤ්ඤත්තිවසෙන විභජනං සුඛෙන සක්කා විඤ්ඤාතුන්ති වෙවචනානන්තරං පඤ්ඤත්තිහාරො. (11)

පභවපරිඤ්ඤාදිපඤ්ඤත්තිවිභාගමුඛෙන පටිච්චසමුප්පාදසච්චාදිධම්ම විභාගෙ කතෙ සුත්තෙ ආගතධම්මානං පටිච්චසමුප්පාදදිමුඛෙන අවතරණං සක්කා දස්සෙතුන්ති පඤ්ඤත්ති අනන්තරං ඔතරණහාරො. (12)

ධාතායතනාදීසු ඔතාරිතානං සුත්තෙ පදත්ථානං පුච්ඡාරම්භවිසොධනං සක්කා සුඛෙන සම්පාදෙතුන්ති ඔතරණානන්තරං සොධනහාරො. (13)

විසොධිතෙසු සුත්තෙ පදපදත්ථෙසු තත්ථ ලබ්භමාන සාමඤ්ඤවිසෙස භාවො සුකරො හොතී'ති දස්සෙතුං සොධනානන්තරං අධිට්ඨානහාරො. (14)

සාමඤ්ඤවිසෙසභූතෙසු සාධාරණාසාධාරණෙසු ධම්මෙසු පවෙදිතෙසු පරික්ඛාරසංඛාතස්ස සාධාරණාසාධාරණරූපස්ස පච්චයහෙතුරාසිස්ස පභෙදෙ සුවිඤ්ඤෙය්‍යො'ති අධිට්ඨානානන්තරං පරික්ඛාරහාරො. (15)

අසාධාරණෙ සාධාරණෙ ච කාරණෙ දස්සිතෙ තස්ස අත්තනො ඵලෙසු කාරණකාරො තෙසං හෙතුඵලානං දෙසනාකාරො භාවෙතබ්බපහාතබ්බ ධම්මානං භාවනාපහානානි ච නිද්ධාරෙත්වා වුච්චමානානි සම්මා සුත්තස්ස අත්ථාවබොධාය සංවත්තන්තී'ති පරික්ඛාරානන්තරං සමාරොපනහාරො. (16) දසසිතො'ති අයං හාරාන'මනුක්කමො.

නයානං පන වෙනෙය්‍යත්තයප්පයොජිතත්තා අත්ථනයත්තයුපදෙසස්ස තදනුක්කමෙනෙ'ව නන්දියාවට්ටාදීනං තිණ්ණං අත්ථනයානං කමො වෙදිතබ්බො. තථාහි උග්ඝටිතඤ්ඤූ නන්දියාවට්ටං, විපඤ්චිතඤ්ඤූ තිපුක්ඛලං, නෙය්‍යො ච සීහවික්කීළිතං පයොජෙන්ති. තෙ පන තයො'පි නයා උද්දෙසනිද්දෙසපටිනිද්දෙසා විය තෙසං උග්ඝටිතඤ්ඤූ ආදීනං උපකාරාය සංවත්තන්ති.

ඉතරස්ස පන නයද්වයස්ස අත්ථනයත්තයස්ස භූමියා ආලොචනං තස්ස තත්ථ සමානයනඤ්චා'ති ඉමිනා කාරණෙන උද්දේසක්කමො වෙදිතබ්බො'ති, අයං නයානං අනුක්කමො.

4. එතාවපරමතො'ති එත්ථ එතපරමතා ච හාරානං එත්තකෙහි පකාර විසෙසෙහි අත්ථනයත්තයසහිතෙහි සුත්තස්ස අත්ථො නිද්ධාරියමානො වෙනෙය්‍යානං අලමනුත්තරාය පඨමාය භූමියා සමධිගමායා'ති වෙදිතබ්බා. අථවා එතදන්තොගධත්තා සබ්බෙසං සුත්තස්ස සංවණ්ණනාවිසෙසානං එතාවපරමතා හාරානං දට්ඨබ්බා. බහවො හි එත්ථන්තොගධා සුත්තන්ත සංවණ්ණනා විසෙසා. සෙය්‍යථීදං ?

සුත්තස්ස සමුට්ඨානං වත්තබ්බං. අධිප්පායො විභාවෙතබ්බෝ. අනෙකධා පදත්ථො සංවණ්ණෙතබ්බො. විධි අනුවාදෙ ච වෙදිතබ්බො. විරොධො සමාධාතබ්බෝ. අනුසන්ධිස්ස අනුරූපං නිගමෙතබ්බං.

තථා සුත්තස්ස අත්ථං වදන්තෙන පයොජනං, පිණ්ඩත්ථො, පදත්ථො, අනුසන්ධි, චොදනා, පරිහාරෝති ඉමෙ වත්තබ්බා. තථා උපොග්ඝාටො, පදවිග්ගහො, පදත්ථචාලනා, පච්චුපට්ඨානඤ්ච වත්තබ්බානි. තථා තිස්සො කථා එකනාළිකා, චතුරස්සා, නිසින්නවත්තිකා'ති.

1. තත්ථ පාළිං වත්වා එකෙකපදස්ස අත්ථකථනං එකනාළිකා නාම.

2. පටිපක්ඛං දස්සෙත්වා, පටිපක්ඛස්ස උපමං දස්සෙත්වා, සපක්ඛං දස්සෙත්වා, සපක්ඛස්ස උපමං දස්සෙත්වා කථනං චතුරස්සා නාම.

3. විසභාගධම්මවසෙනෙ'ව පරියොසානං ගන්ත්වා පුන සභාගධම්මව සෙනෙ'ව පරියොසානගමණං නිසින්නවත්තිකා නාම. තථා භෙදකථාය තත්වකථාය පරියායවචනෙහි ච සුත්තං සංවණ්ණෙතබ්බන්ති අයං හාරානං එතපරමතා.

නයානං පන යස්මා උග්ඝටිතඤ්ඤූ ආදයො තයො එව වෙනෙය්‍යා සච්චාභිසමයභාගිනො තදත්ථාය ච අත්ථනයදෙසනා තස්මා සතිපි සංකිලෙස වොදනධම්මානං යථාවුත්තමූලපදභෙදතො වඩ්ඪෙත්වා විභජිතබ්බප්පකාරෙ තථා මූලපදනි අවඩ්ඪෙත්වා වෙනෙය්‍යත්තයවසෙනෝ'ව එතපරමතා වුත්තා.

නවසු නවසු හි මූලපදෙසු සබ්බෙසං සංකිලෙසවොදනධම්මානං අන්තො ගධභාවතො න තානි වඩ්ඪෙතබ්බානි, වෙනෙය්‍යත්තයාධිකාරතො න භාපෙ තබ්බානී'ති නයානං එතපරමතා දට්ඨබ්බා. කම්මනයානං පන ආලොචන සමානයනතො අඤ්ඤස්ස පකාරන්තරස්ස අසම්භවතො එතපරමතා'ති.

5. හෙත්වාදිතෝති එත්ථ ආදිසද්දෙන ඵල භූමි උපනිසා සභාගවිසභාග ලක්ඛණනයාදයො පරිග්ගහිතා. තෙසු හේතු'තිකාරණං, යො ධම්මෝති'පි

වුච්චති. සො පන පච්චයසභාවෙන එකවිධො, කාරකො, සම්පාපකෝ’ති දුවිධො. කාරකො, ඤාපකො, සම්පාපකෝ’ති තිවිධො. හේතුහේතු, පච්චය හේතු, උත්තමහේතු, සාධාරණහේතු’ති චතුබ්බිධෝ. පච්චයධම්මො කුසලො, අකුසලො, සද්ද, අරියමග්ගෝති පඤ්චවිධො. සභාගහෙත්වා දිවසෙන අනෙකවිධො.

ඵලම්පි පච්චයුප්පන්නභාවෙන එකවිධං. අධිගන්තබ්බතො’පි සම් පාපකහේතුවසෙන ඵලපරියායො ලබ්භතී’ති, නිබ්බත්තෙතබ්බ අධිගන් තබ්බභාවතො දුවිධං. ඤාපෙතබ්බනිබ්බත්තේතබ්බ පත්තබ්බතො තිවිධං. පච්චයුප්පන්නවිපාකක්‍රියාවචනත්ථනිබ්බාණවසෙන පඤ්චවිධං. සභාගහේතු නිබ්බත්තාදිවසෙන අනෙකවිධං. තථා ලොකියං ලොකුත්තරන්ති. තත්ථ ලොකුත්තරං චත්තාරි සාමඤ්ඤඵලානි. ලොකියඵලං දුවිධං කායිකං මාන සඤ්ච. තත්ථ කායිකං පඤ්චද්වාරිකං අවසිට්ඨං මානසං. යඤ්ච තාය තාය සුත්තදෙසනාය සාධෙතබ්බං තද පි ඵලන්ති.

භූමී’පි බහුවිධා සාසවා භූමි, අනාසවා භූමීත්‍යාදිවසෙන. යෙ ච ධම්මා තෙසං තෙසං, හාරනයානං පතිට්ඨානභාවෙන සුත්තෙසු නිද්ධාරියන්ති තෙපි භූමියෝති දට්ඨබ්බා.

උපනිසාති බලවකාරණං, යො උපනිස්සයපච්චයෝ’ති වුච්චති. අපි ච උපනිසා’ති තස්මිං තස්මිං සමයෙ සිද්ධන්තෙ හදයභූතං අබ්භන්තරං වුච්චති ඉධා’පි ච නෙත්තිහදයං. තං හි සම්මා පරිග්ගණ්හන්තා ධම්මකථිකා තස්මිං තස්මිං සුත්තෙ ආගතධම්මමුඛෙන සබ්බහාරනයයොජනාය සමත්ථා හොන්ති.

සභාගවිසභාගධම්මා ච තෙසං තෙසං ධම්මානං අනුකූලපටිකූලධම්මා යථාක්කමං වෙදිතබ්බා. යථා සම්මාදිට්ඨියා සම්මාසඞ්කප්පො සභාගො මිච්ඡාසඞ්කප්පො විසභාගා’ති. ලක්ඛණන්ති සභාවො. සො හාරනයානං නිද්දේසෙ දස්සිතො යෙව.

යම්පනෙ’තං හේතු ආදි විසෙසවිනිම්මුත්තං හාරනයානං යොජනා නිබන්ධනං සො නයො. එකත්තාදයො’පි නයා ඉධ ගහෙතබ්බා’ති. අයං නිද්දේසවාරස්ස සංඛෙපො.

(III) ඉදනි පටිනිද්දෙසවාරො සංඛෙපෙන දස්සීයතෙ. සො චතුධා විභත්තො—

1. හාරවිභඞ්ගවාරො
2. හාරසම්පාතවාරො
3. නයසමුට්ඨානවාරො
4. සාසනපට්ඨානවාරො’ති.

1. තෙසු යත්ථ අනෙකෙහි'පි උදාහරණසුත්තෙහි එකො හාරො නිද්දිසීයති අයං හාරවිභඞ්ගවාරො.

2. යත්ථ පන එකස්මිං සුත්තෙ අනෙකෙ හාරා සම්පතන්ති අයං හාරසම්පාතවාරො.

3. නයසමුට්ඨානන්ති එත්ථ සමුට්ඨහන්ති එතෙනා'ති සමුට්ඨානං. කෙ සමුට්ඨහන්ති ? නයා. නයානං සමුට්ඨානං නයසමුට්ඨානං. කිං පන තං ?

තං තම්මූලපදෙහි චතුසච්චයොජනා. සා හි නන්දියාවට්ටාදීනං උප්පත්තිට්ඨානතාය සමුට්ඨානං භූමී'ති ච වුච්චති. යස්මාපනෙත්ථනයානං නයෙහි සම්භවො දිස්සති. නන්දියාවට්ටතොහි පුග්ගලාධිට්ඨාන වසෙන සීහවික්කීළිතස්ස සීහවික්කීළිතතො ච තිපුක්ඛලස්ස සම්භවො දිස්සති, තස්මා උද්දෙසානුක්කමෙන නිද්දේසෝ නකතො'ති දට්ඨබ්බො.

4. සාසනපට්ඨානන්ති එත්ථ සාසනස්ස පට්ඨානං සාසනපට්ඨානං. සාසනං දෙසනා. තස්සා වෙනෙය්‍යජ්ඣාසයානුරූපං තෙසං හිතසුඛනිප්ඵාදනත්ථං පකාරෙහි ඨානං පවත්ති සාසනපට්ඨානං. අපරෙහි පි නයෙහි ඉදං අට්ඨකථායවණ්ණිත'මෙව.

තදෙතං පාළියං ද්විධාවිභත්තං සොළසවිධෙන අට්ඨවීසතිවිධෙන ච. තත්ථ සොළසවිධතා එවං වෙදිතබ්බා. සොළසසුත්තානි. (1) සංකිලෙස භාගියං (2) වාසනාභාගියං (3) නිබ්බෙධභාගියං (4) අසෙක්ඛභාගියං (5) සංකිලෙසවාසනාභාගියං (6) සංකිලෙසනිබ්බෙධභාගියං (7) සංකිලෙස අසෙක්ඛභාගියං (8) වාසනානිබ්බෙධභාගියං (9) වාසනාඅසෙක්ඛනිබ්බෙධ භාගියං (10) අසෙක්ඛසංකිලෙසවාසනාභාගියං (11) නිබ්බෙධසංකිලෙස වාසනාභාගියං (12) අසෙක්ඛසංකිලෙසනිබ්බෙධභාගියං (13) අසෙක්ඛ වාසනානිබ්බෙධභාගියං (14) අසෙක්ඛසංකිලෙසවාසනා භාගියං (15) නිබ්බෙධ අසෙක්ඛනෙවසංකිලෙසභාගියං (16) නවාසනානනිබ්බෙධන අසෙක්ඛ භාගියන්ති.

තත්ථ, සංකිලිස්සති එතෙනා'ති සංකිලෙසො, සංකිලෙසභාගෙ සංකිලෙස කොට්ඨාසෙ පවත්තං. සංකිලෙසභාගියං. වාසනාපුඤ්ඤභාවනා. වාසනා භාගෙ පවත්තං, වාසනං භජාපෙතී'ති වා වාසනාභාගියං, නිබ්බිජ්ඣනං, ලොභක්ඛන්ධාදීනං පදාළනං නිබ්බෙධො. නිබ්බෙධභාගෙ පවත්තං, නිබ්බෙධං භජාපෙතී'තිවා නිබ්බෙධභාගියං. පරිනිට්ඨිත සික්ඛා ධම්මා අසෙක්ඛා. අසෙක්ඛ භාගෙ පවත්තං. අසෙක්ඛෙ භජාපෙතී'ති වා අසෙක්ඛභාගියං.

තෙසු යත්ථ තණ්හාදිසංකිලෙසො විභත්තො ඉදං සංකිලෙසභාගියං. යත්ථ දානාදිපුඤ්ඤකිරියවත්ථු විභත්තං ඉදං වාසනාභාගියං. යත්ථ සෙක්ඛ. සීලක්ඛන්ධාදයො විභත්තා ඉදං නිබ්බෙධභාගියං. යත්ථ පන අසෙක්ඛා සීලක්ඛන්ධාදයෝ විභත්තා ඉදං අසෙක්ඛභාගියං. ඉතරානි තෙසං වොමිස්සකනයවසෙන වුත්තානි.

ඉමෙහි සංකිලෙසභාගියාදීහි සොළසහි සුත්තෙහි පට්ඨානනයෙන විහත්තෙහි නවවිධපරියත්ති සාසනසංඛාතං සුත්තං සොළසධා විහත්තං හොති. ඉමිනා සොළසවිධෙන පට්ඨානෙන අසඞ්ගහිතො පරියත්තිසාසනප්පදෙසො නාම නත්ථි.

අට්ඨවීසතිවිධෙන පට්ඨානං එවං වෙදිතබ්බං.

1. ලොකියං, ලොකුත්තරං. ලොකිය ඤ්ච ලොකුත්තර ඤ්ච.
2. සත්තාධිට්ඨානං, ධම්මාධිට්ඨානං, සත්තාධිට්ඨාන ඤ්ච ධම්මාධිට්ඨාන ඤ්ච.
3. ඤාණං, ඤෙයයං, ඤාණ ඤ්චඤෙයය ඤ්ච.
4. දස්සනං, භාවනා, දස්සන ඤ්චභාවනාච.
5. සකවචනං, පරවචනං, සකවචන ඤ්ච පරවචන ඤ්ච.
6. විස්සජ්ජනීයං, අවිස්සජ්ජනීයං, විස්සජ්ජනීය ඤ්චඅවිස්සජ්ජනීය ඤ්ච.
7. කම්මං, විපාකො, කම්ම ඤ්ච විපාකො ච.
8 කුසලං, අකුසලං, කුසල ඤ්ච අකුසල ඤ්ච.
9. අනුඤ්ඤාතං, පටික්ඛිත්තං, අනුඤ්ඤාත ඤ්චපටික්ඛිත්ත ඤ්ච. එවෙවා'ති.

තත්ථ ලොකියන්ති ලොකෙ නියුත්තො ලොකෙ වා විදිතො ලොකියො. ඉධ පන ලොකියො අත්ථො යස්මිං සුත්තේ වුත්තෝ තං සුත්තං ලොකියං. තථා ලොකුත්තරං. යස්මිං පන සුත්තේ පදෙසෙන ලොකියො පදෙසෙන ලොකුත්තරො වුත්තො තං ලොකිය ඤ්චලොකුත්තර ඤ්ච. ය ඤ්ච සුත්තේ අධිට්ඨාය සත්තප ඤ්ඤත්තිමුඛෙන දෙසිතං තං සත්තාධිට්ඨානං. ධම්මවසෙනේව දෙසිතං ධම්මාධිට්ඨානං. උභයවසෙන දෙසිතං සත්තාදිට්ඨාන ඤ්චධම්මාදිට්ඨානඤ්ච. ඉමිනා නයෙන සබ්බපදෙසු අත්ථො වෙදිතබ්බො. බුද්ධාදීනං පන ගුණාභිත්ථවනවසෙන පවත්තං සුත්තං ථවො නාමා'ති. එත්ථ ච නවන්නංතිකානංථවස්ස ච වසෙන අට්ඨවීසති විධතා වෙදිතබ්බා. එවං අට්ඨවීසති විධෙන උද්දිට්ඨං සාසනපට්ඨානං පුන සංකිලෙසභාගියාදීහි සංසන්දිත්වා දස්සිතන්ති.''

## II

## බෞද්ධ න්‍යාය ශාස්ත්‍රය

**පූනා** නුවර සමස්ත ඉන්දියා ප්‍රාචීන මහා පණ්ඩිත සංගමය ඉදිරියෙහි පූජ්‍ය පණ්ඩිත **විදුරුපොළ පියතිස්සා**'භිධාන මහානායක මාහිමියන්වහන්සේ විසින් කියවන ලද පාළිභාෂාමය නිබන්ධනයාගේ සිංහල භාව සන්නයයි.

මේ **බෞද්ධ න්‍යායශාස්ත්‍රය** වනාහි මහාක්ෂීණාශ්‍රව වූ ප්‍රභෙදගත ප්‍රතිසංවිදඥන ඇති අසූ මහසව්වන් කෙරෙහි ඇතුළත් වූ භාග්‍යවතුන් වහන්සේ විසින් එතදග්‍රස්ථානාන්තරයෙහි තබන ලද්ද වූ **ආයුෂ්මත් මහා කාත්‍යායන**

ස්ථවිරයන් වහන්සේ විසින් නවාංග ශාස්තෘශාසන සංවර්ණනාව පිණිස රචනා කරණ ලද්දේය.

එහි නවාංගශාස්තෘ ශාසනය නම්, සූත්‍රය, ගෙය්‍යය, වෙය්‍යාකරණය ගාථාය, උදනය, ඉතිවුත්තකය, ජාතකය, අබ්භූත ධම්මය. වෙදල්ලය යන අංග නවයයි. භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කර වදළ පර්යාප්ති ධර්මයෙක් මේ අංග නවයෙන් තොරව නම් නැත්තේමය. ඒ මේ නවාංග ශාස්තෘ ශාසන සංඛ්‍යාතවූ පර්යාප්තිධර්මය මනා සේ වර්ණනා කරනු කැමැත් තහු විසින් පළමුකොට න්‍යාය ශාස්ත්‍රඥයෙක් විය යුතුයි.

මේ න්‍යායශාස්ත්‍රය රචනා කරන්නා වූ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ විසින් **පෙටකොපදෙශය. නෙත්තිප්‍රකරණය** යන ප්‍රකරණ දෙකක් රචනා කරණ ලදහ.

එයිනුදු **නෙත්තිප්‍රකරණය** භාග්‍යවතුන් වහන්සේ විසින් අනුමත කරණ ලදුව ප්‍රථම මහාධර්මසංගායනාවෙහි දී සංගායනාකරණලදුව බදරතිර්ථ විහාරාධිවාසී ව වැඩ විසූ ද්විතීයාර්ථකථාචාර්‍ය්‍ය භදන්ත ධර්මපාල මහා ස්ථවිරයන් වහන්සේ විසින් රචනා කරණ ලද අර්ථකථාවෙන් ප්‍රතිමණ්ඩිත ව සියම් බුරුම දෙරට හා ලක්දිව්හිද සෞගතාගමධර මහාස්ථවිරෝපස්ථවිරයන් වහන්සේලා විසින් සම්භාවනා කරණු ලබමින් පවතියි.

ඒ නෙත්ති ග්‍රන්ථයාගේ මෙ සේ සම්භාවිතත්වයක් ඇති කල්හිදු' යම්හෙයකින් එය මෙකල ලක්දිව්වැසි ආචාර්‍ය්‍ය පරම්පරාවන්හි අතවැසියනට නොකියවත් ද එහෙයින් ඒ ග්‍රන්ථයාගේ සැමතැන පතළ බවක් නොදක්නා ලැබේ.

සකල නවාංග ශාස්තෘ ශාසනයාගේ අර්ථවර්ණනාව මෙහිම ඇතුළත් වන බැවිනුත් අවිදිත න්‍යාය ශාස්ත්‍රය ඇති ආධුනිකයන්ගේ පාලාර්ථ කථනය න්‍යායවිරෝධ දෝෂයට පැමිණිය හැකි බැවිනුත් ලංකාද්වීප වාස්තව්‍ය වූ බෞද්ධාගමධර වූ ආචාර්‍ය්‍යවරයෝ මේ ප්‍රශස්ත වූ න්‍යායශාස්ත්‍රය අතවැස්සන් හට කියවන්නාහු නම් ඒ ඉතා මැනවි.

එහෙයින් අපි මේ ආදි වූ ප්‍රයෝජන විශේෂය සිත්හි තබාගෙණ නෙත්ති ප්‍රකරණය හා තදර්ථකථාව ද ඇසුරුකොට ඒ පෙළ අටුවා දෙකක් ආනයින් ම **බෞද්ධ න්‍යායශාස්ත්‍රය** මෙහි සැකෙවින් දක්වන්නෙමු.

ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ විසින් මේ නෙත්ති ප්‍රකරණයම **සංග්‍රහවාරය. විභාගවාරයයි**, කොටස් දෙකකට බෙදන ලද්දේය. එහි මේ සංග්‍රහවාරයාගේ සංක්ෂේපයයි.

නෙත්තිසංඛ්‍යාත වූ න්‍යායශාස්ත්‍රයෙන් වර්ණනා කළ යුතු පදර්ථභාව යෙහි සිටියා වූ සුත්තගෙය්‍යාදි අංග නවයකින් සංගෘහිත වූ ව්‍යඤ්ජනපද අර්ථපද ගණනින් දෙළොස් වැදෑරුම් වූ පර්යාප්ති ශාසනය මේ ශාස්ත්‍රයෙහි දී ''සූත්‍ර'' යයි ව්‍යවහාර කරණු ලැබේ.

ඒ සූත්‍රයාගේ අර්ථවර්ණනා වූ හාර සොළසය, නයපසය, මූලපද අටළොසය, යන මෙතෙක් ම නෙත්ති (හෙවත් බෞද්ධ න්‍යායශාස්ත්‍රය) නම් වේ.

එහි දේශනාහාරය ආදිකොට ඇති හාර සොළස ම මූලපදයන් උපුටා ගැන්මක් නැතිව ව්‍යඤ්ජනද්වාරයෙන් ම සූත්‍රයාගේ වර්ණනාවෝ වෙති.

නයපස අතුරෙන් නන්ද්‍යාවර්තය, ත්‍රිපුෂ්කලය, සිංහවික්‍රීඩිතය, යන අර්ථ නය තුන අර්ථද්වාරයෙන් සූත්‍රාර්ථය වර්ණනා කෙරෙති. මෙසේ මේ හාරනයදෙක ම සූත්‍රයාගේ අර්ථනිර්ධාරණ වශයෙන් හැම ලෙසින්ම සූත්‍රයෙහි යොදන ලද්දේ සූත්‍රය වර්ණනා කෙරේයයි කියනු ලැබේ.

නොහොත් අර්ථයන් විෂයෙහි කරණ ලද පිරිසිඳීම ඇති ව්‍යඤ්ජන ප්‍රබන්ධය (අකුරුරැස) දේශනා නම් වේ. හෙම පාඨයයිද කියනු ලැබේ. ඒ දේශනාවගේ අර්ථය දේශිත නම් වේ. දේශනාව විසින් ප්‍රබෝධ කරණ ලද බැවිනි. යථෝක්තාකාර වූ දේශනා දේශිත යන දෙකම ඒකාන්තයෙන්ම දතයුතුය. කුමක් හෙයින් යත්? අනුපාද පරිනිර්වාණය කෙළවරකොට ඇති සම්පත්තීන්ට හේතුවන හෙයින් හා දේශනා දේශිතයෙන් විනිර්මුක්ත වූ ඥෙයධර්මයක්හු ද තමා නැති හෙයිනි.

කියන ලද අයුරු ඇති විජානනය (දැනගැණීම) සාධ්‍යකල්හි මේ මතු කියනු ලබන්නා වූ හාරනයන්ගේ අනුපූර්විසංඛ්‍යාත වූ අනුක්‍රමය (පිළිවෙළ) නවාංගශාසන නම් වූ සූත්‍රයාගේ අර්ථ විචාරණයයි දත යුත්තේ යි.

## මේ සංග්‍රහවාරය යි

මෙසේ අතිසංක්ෂිප්ත වූ සංග්‍රහවාරය විභජනය කොට (බෙද) දක්වන පිණිස ඊට අනතුරුව **විභාගවාරය** දේශනා කරණ ලද්දේය. ඒ විභාග වාරය ද **උද්දෙසවාරය**, **නිද්දෙසවාරය**, **පටිනිද්දෙසවාරය** වශයෙන් තුන් වැදෑරුම් වේ.

(1) එයින් උද්දෙසවාරයෙහි පළමුකොට නම් වශයෙන් හාර සොළසකි. ඒ මෙසේයි:

1. දෙසනාහාරය.
2. විචය හාරය
3 යුත්ති හාරය.
4. පදට්ඨාන හාරය.
5. ලක්ඛණ හාරය.
6. චතුබ්‍යූහ හාරය.
7. ආවට්ට හාරය.
8 විභත්ති හාරය.
9. පරිවත්තන හාරය.

10. වෙවචන හාරය.
11. පඤ්ඤත්ති හාරය.
12. ඔතරණ හාරය.
13. සොධන හාරය.
14. අධිට්ඨාන හාරය.
15. පරික්ඛාර හාරය.
16. සමාරොපන හාරය යන මොහු යි.

එහි සාධාරණ වශයෙන් දේශනාදි සොළොස් පදයෝ ම කවර අර්ථයකින් හාරනම් වෙත් ද යත්?

මේ දේශනා විචයාදී සොළස විසින් නොහොත් මේ සොළොසහි දී සූත්‍රගෙයාදි නවාංගයන් විෂයකොට ඇති අඥාන (නොදැනීම) ශංසය (සැකය) විපර්යාස (නොපිට තේරුම් ගැණීම) යන මොව්හු බැහැර කරණු ලැබෙත්නුයි හාර නම් වෙති.

නොහොත් එලොපචාර වශයෙන් තුමූ ඒ අඥානාදීන් බැහැර (ඉවත) ලති. බැහැර කිරීම පමණක්ම මොනුස හාරනම් වෙති.

නොහොත් ධර්මසංවර්ණයිතෘ ධර්මප්‍රතිගෘහිතෘ යන දේශනය විසින් ධර්මය දීම් ගැණීම් වශයෙන් ව්‍යවහරණය කරණු ලැබෙත්නුයි හාර නම් වෙති. ඒ එසේමය යම් සේ හාරසංඛ්‍යාත වූ නොයෙක් රත්නාවලි සමූහය තමා අවයව වූ ගැවන් පහසින් උපදවනු ලබන ප්‍රීති සැප ඇතිව තදුපභෝගී (එය පාවිච්චි කරණ) ජනයාගේ නිදය පරිදහයෙන් උපන් ශරීරසන්තාපය සංසිඳුවයි ද එමෙන් මේ නානාවිධ පරමාර්ථරත්න ප්‍රබන්ධවත් වූ දේශන විචයාදී සංවර්ණනා විශේෂයෝ ද තමන් අවයව වූ පරමාර්ථ රත්නාධිගමා යෙන් උපදවනු ලබන නිවන්සැප ඇත්තාහු ධර්මප්‍රතිග්‍රාහක ජනයන්ගේ කාමරාගාදි ක්ලේශ හේතුක වූ හෘදය පරිතාපය සංසිඳුවතියි දතයුතු.

නොහොත් අඥනාදීන්ගේ අපගමය (ඉවත ලෑම) කෙරෙති. ඒ කියා දෙත් හෝ නුයි හාර නම් වෙති.

නොහොත් 'නවේසු වන්ත ගමණො භගවා'* යන තන්හි මෙන් නිරුක්ති ක්‍රමයෙන් ශ්‍රොතෘජනයන්ගේ සිතහරණය (පැහැර ගැණීම) කරණ හෙයින්අරමණය (ඇලීම) කරණ හෙයිනුදු හාර නම් වෙත් ම ය.

මේ ෂොඩශහාරයන්ගේම සාධාරණ (සාමාන්‍ය) වූ අර්ථයයි.

අසාධාරණ (විශේෂ) වශයෙන් අර්ථය මෙසේ දතයුතුයි.

---

* නෛරුක්තිකයෝ භව, වන්ත, ගමන ශබ්දත්‍රයෙන් භ. ව. ග කාරයන්ගෙන ග කාර ව කාර විපර්‍ය්‍යාශයෙන් භගවායි පදනිෂ්පත්තිය කෙරෙති. එමෙන් මෙහිදු හරණ රමණ ශබ්දද්වයෙන් හ. ර. කාරයන් ගෙණ හාරයයි පදය නිපදවා කියති. නිරුක්ති නය නම මෙයයි දන්නේය.

1. මේ කරණකොටගෙන සූත්‍රාර්ථය දේශනා කරණු ලැබේනුයි, මනාසේ වර්ණනා කරණු ලැබේනුයි, දේශනා නම් වේ. නොහොත් සහචාරිත්වයෙන් දේශනා නම් වේ.

2. මෙයින් නොහොත් මෙහි පද ප්‍රශ්නාදීහු සොයනු ලැබෙත්, ඔවුන්ගේ සෙවීමම හෝනුයි විචය නම් වේ. පාළියෙහි (විචිනතීති විචයො) සොයානුයි විචය නම් වේයයි කර්තෘකාරකාර්ථය දක්වන ලද්දේය.

3. යුක්ති නම් උප්පත්ති සංඛ්‍යාත වූ සාධනයුක්තියයි. මෙහි වනාහි යුක්තිය සොයා බැලීම 'යුක්ති' නම් වේ. ''රූපභවො රූපං'' යන ආදියෙහි මෙන් ''යුත්තිවිචාරණයුත්ති''යි. උත්තර පදලෝපයි. යුක්ති සහචරණ යෙන් හෝ යුක්ති නම්.

4. පදස්ථාන නම් ආසන්න කාරණයි. මෙහිදු පදස්ථාන සොයාබැලීම පදස්ථාන නම්. සෙස්ස යුක්තිහාරය මෙනි.

5. මෙයින් නොහොත් මෙහි නොකියන ලද්දවූ ද සමාන ලක්ෂණ ඇති ධර්මයෝ එකවචනයෙන් දක්වනු ලැබෙත්නුයි ලක්ෂණ නම් වේ.

6. මෙයින් නොහොත් මෙහි විභාගයෙන් පිඩු කරණු ලැබෙත්නුයි ව්‍යූහ නම් වේ. සූත්‍රයෙහි දක්විනු ලබන නිර්වචනාදි සතරදෙනාගේ ව්‍යූහය චතුර්ව්‍යූහ නම් වේ. සතරදෙනෙකුගේ ව්‍යූහය (පිණ්ඩනය) මෙහි ඇත්තේ හෝනුයි, චතුර්ව්‍යූහ නම් වේ.

7. මෙයින් හෝ මෙහි සභාග විසභාග ධර්මයෝ ආවර්තනය කරණු ලැබෙත්නුයි, ඔවුන්ගේ ආවර්තනය හෝනුයි ආවර්තන නම් වේ.

8. මෙයින් හෝ මෙහි සාධාරණාසාධාරණ (සාමාන්‍ය විශේෂ) වූ සංක්ලේශ ව්‍යවදාන ධර්මයන්ගේ භූමීහු විභාග කරණු ලැබෙත්නුයි විභක්ති නම් වේ. ඒ භූමීන්ගේ විභජනය හෝ විභක්ති නම්.

9. මෙයින් හෝ මෙහි සූත්‍රෝක්ත ධර්මයෝ ප්‍රතිපක්ෂ වශයෙන් පරිවර්තනය (පරළීම) කරණු ලැබෙත්. ඔවුන්ගේ පරිවර්තනය හෝනුයි පරිවර්තන නම් වේ.

10. මෙහි එකම අර්ථයාගේ වාචක වූ විවිධ වූ වචනය ඇත්තේනුයි විවචන නම්. විවචනයම වෙවචන නම් වේ. මෙයින් අර්ථය විවිධ කොට කියනු ලැබේනුයි හෝ විවචන නම් වේ. හෙම වෙවචනයි.

11. මෙයින් හෝ මෙහි අර්ථයෝ ප්‍රකාරයෙන් නොහොත් ප්‍රභෙද වශයෙන් හඟවනු ලැබෙත්නුයි ප්‍රඥප්ති නම් වේ.

12. මෙයින් හෝ මෙහි සූත්‍රාගත ධර්මයෝ ප්‍රතීත්‍යසමුත්පාදදියෙහි අවතරණය (අනුප්‍රවේශය) කරණු ලැබෙත්නුයි අවතරණ නම් වේ.

13. මෙයින් හෝ මෙහි සූත්‍රස්ථවූ පදය පදර්ථය ප්‍රශ්නය ආරම්භය යන මොහු ශෝධනය (සාමාධානය) කරණු ලැබෙත්නුයි ශොධන නම් වේ

14. මෙයින් හෝ මෙහි සාමාන්‍ය විශේෂ වූ ධර්මයෝ විකල්ප රහිතව අධිෂ්ඨානය (අනුප්‍රවර්තනය) කරණු ලැබෙත්නුයි අධිෂ්ඨාන නම් වේ.

15. ඵලය අභිසංස්කරණ කෙරේනුයි පරිෂ්කාර නම් වේ. හේතුව හා ප්‍රත්‍යයයි. පරිෂ්කාරය කියන්නේ නුයි පරිෂ්කාර නම් වේ. හාරය යි. නොහොත් පරිෂ්කාරය විෂයකොට ඇති හෙයින්ද පරිෂ්කාර සහ වරණයෙනු පරික්ෂ්කාර නම් වේ මය.

16. මෙයින් හෝ මෙහි පදස්ථානාදි මුඛයෙන් ධර්මයෝ සමාරොපනය කරණු ලැබෙත්නුයි. සමාරොපන නම් වේ. මේ සැමතන්හිම භාවසාධන වශයෙනුදු අර්ථය ලැබෙන හෙයින් එසේ ද යෙදිය යුතුයි.

මේ දක්වන ලද්දේ දේශනාහාරාදි සොළොස්පදයන්ගේ සාමාන්‍ය විශේෂ වශයෙන් විවිධ වූ අර්ථය යි.

මීට අනතුරුව මේ උද්දේශවාරයෙහි නය පසකි. ඒ මෙසේය:

1. නන්දියාවට්ටනය,
2. තිපුක්ඛලනය,
3. සීහ වික්කීළිතනය,
4. දිසාලොචනනය,
5. අඞ්කුසනය, යන මොහුයි.

ඒ නන්ද්‍යාවර්තාදි පසටම සාධාරණ වූ නය ශබ්දයාගේ අර්ථය මෙසේය. සංක්ලේශ (කෙලෙසීම) ව්‍යවදන (පිරිසුදුවීම) යන දෙක විභාග වශයෙන් හඟවා දෙත්නුයි නය නම් වෙත්. ඒ සංක්ලේශ ව්‍යවදනයෝ මෙයින් හෝ මෙහි හඟවා දෙනු ලැබෙත්නුයි හෝ නය නම් වෙත්. නයන මාත්‍රය ම (හඟවාදීම පමණක්ම) හෝ නය නම් වෙත්. තුමූ ධර්මකථිකයන් විසින් සූත්‍රයාගේ අර්ථය සෙවීම පිණිස එලවා තබනු ලැබෙත්නුයි හෝ නය නම් වෙත්.

අපිච, නය (ක්‍රම) යන් වැනි වෙත්නුයි නය නම් වෙත්. ඒ එසේමැයි. යම්සේ ඒකත්වාදි නය (ක්‍රම)යෝ මනාසේ පිළිවිදිනු ලබන්නාහු ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න (හෙතුඵල) ධර්මයන්ගේ යථාක්‍රමයෙන් සම්බන්ධය විභාගය ව්‍යාපාර විරහය යන මොවුනට සුදුසු ඵලය ඇති බව දක්වීමෙන් සංවෘති පරමාර්ථ සත්‍යයන් ගේ ස්වභාවය අසංමිශ්‍රකොට ප්‍රකාශ කරන්නාහු පරමාර්ථසත්‍යයාගේ ප්‍රතිවේධය පිණිස පවතිත් ද, එසේම මේ නන්ද්‍යාවර්තා දීහු ද කෘෂ්ණ ශ්වේත සප්‍රතිභාග (එකිනෙකට විරුද්ධ වූ අකුශල කුශල)

ධර්මයන් ගේ දර්ශනයෙන් අවිපරීතවූ (වෙනස් නොවනසුලු) සූත්‍රාවබෝධයට සමර්ථවන්නාහු වෛනෙයයන්ගේ සත්‍ය ප්‍රතිවේධය පිණිස පවත්නාහුයි.

නොහොත් පර්‍යාප්ති අර්ථය නයනය (ගෙණ යෑම) කරණ හෙයින් ද, සංක්ලේශයන් කෙරෙන් යමනය (රැකගැණීම) කරණ හෙයිනුදු නිරුක්ති නයින් නයන යමන ශබ්ද දෙකින් න කාර ය කාරද්වය ගෙණ නය යි කියනු ලැබෙත්. මේ සාමාන්‍යාර්ථයයි.

විශේෂාර්ථය මෙසේ දතයුතු :

1. නන්දියාවට්ට යන ආදියෙහි නන්ද්‍යාවර්තයාගේ වැනි ආවර්තය (කරකැවීම) මොහුගේ ඇත්තේ නුයි නන්ද්‍යාවර්ත නම් වේ. යම්සේ නන්ද්‍යාවර්තය තෙම ඇතුළත පිහිටි ප්‍රධානාවයවයෙන් පිටත්හි ආවර්තනය කරයි ද මේ නය ද එසේමය යනු අර්ථයි. නොහොත් නන්දි සංඛ්‍යාත වූ තෘෂ්ණාවගේ හෝ ප්‍රමෝදයාගේ ආවර්තය නන්ද්‍යාවර්ත නම් වේ.

2. සංක්ලේශ පක්ෂයෙහි ලොභාදී වූ ද ව්‍යවදන පක්ෂයෙහි ආලොභාදී වූ ද ත්‍රිවිධ අවයවයන් හේතුකොටගෙණ පුෂ්කල (ශොභන) වේනුයි ත්‍රිපුෂ්කල නම් වේ.

3. අසන්ත්‍රාස (තැති නොගැණීම) ජව පරාක්‍රමාදී විශේෂයෝගයෙන් සිංහ නම් භාග්‍යවතුන් වහන්සේය. උන්වහන්සේගේ වික්‍රීතඩිය දේශනා වාක්කර්ම වූ විහරණයයි කොටගෙණ විපර්‍යාසය හා තත්ප්‍රතිපක්ෂය දැක්වීමෙන් සිංහයාගේ වික්‍රීඩිතය මෙහිනුයි සිංහවික්‍රීඩිත නම් වේ. නයයි ශ්‍රද්ධාදී වූ හෝ ස්ථානාස්ථාන ඥනාදි බලවිශේෂයෝගය දක්වන හෙයින් සිංහවික්‍රීඩිතය සදෘශ බැවිනුදු මේ නය සිංහවික්‍රීඩිත නම් වේ.

4. නන්ද්‍යාවර්තාදි අර්ථනය තුනට දිශාභාවයෙන් කුශලාදි ධර්මයන්ගේ ආලෝචනය (සිතා බැලීම) දිශාලොචන නම් වේ.

5. එසේ ආලොචනය කරණ ලද ඒ කුශලාදී ධර්මයන් අර්ථ නයත්‍රය යෙහි යෙදීමෙහි එකතැන් කරණ හෙයින් අකුස්සක් (කෙක්කක්) වැනිනුයි අඞ්කුශ නම් වේ. මේ විශේෂාර්ථයයි.

තදනන්තරව අටළොස් වැදෑරුම් වූ මූලපදයෝ දතයුතු වෙත්. ඔවුන්ගේ ප්‍රභෙදය කුශල අකුශල වශයෙන් දෙවැදෑරුම් වේ.

ඔවුනතුරෙන් (1) තෘෂ්ණාය, (2) අවිද්‍යාය, (3) ලොභය, (4) ද්වේෂය, (5) මෝහය, (6) ශුභසංඥය, (7) සුඛසංඥය, (8) නිත්‍ය සංඥය, (9) ආත්ම සංඥය, යන මේ පද නවය අකුශල නම් වෙත්. සියලුම අකුශල පක්ෂය මේ පද නවයෙහිම සංගෘහිත වේ.

එසේම (1) සමථය, (2) විදර්ශනාය, (3) අලොභය, (4) අද්වේෂය,

(5) අමෝහය, (6) අශුභ සංඥය, (7) දුඃඛ සංඥය, (8) අනිත්‍ය සංඥය, (9) අනාත්ම සංඥය, යන මේ පද නවය කුශල නම් වෙත්. සියලුම කුශල පක්ෂය මේ පද නවයෙහිම සංගෘහිත වේ.

එහි මූලපදය කුසලය අකුසලය යන මොවුන්ගේ අර්ථය මෙසේය. පඤ්චවිධ නය හා පදට්ඨාන භාගය යන දෙකොටසටම පිහිට බැවින් මුල් වූවාහුද ඔව්හුමය. අධිගමොපාය හෙයිනුත් කොට්ඨාස භාවයෙනුත් පද වූවාහු ද ඔව්හුමනුයි මූලපද නම් වෙත්. කෞශල්‍යසම්භූත (නුවණින් හටගත් යන) අර්ථයෙන්ද කුසිත වූ පාපධර්මයන් ශලනය (විධ්වංසනය) කරණ හෙයින්ද කුශලසංඛ්‍යාත රාගාදීන් ලවනය (ඡෙදනය) කරණ හෙයින්ද කුශලසංඛ්‍යාත ඥනයෙන් ලාතව්‍ය (ගතයුතු පැවත්වියයුතු) හෙයින්ද කුශල නම් වෙත්. තද්විරුද්ධ වශයෙන් අකුශල නම් වෙතියි දතයුතු.

මේ සංක්ෂේපයෙන් **උද්දෙශවාර** යයි.

(2) දැන් **නිර්දෙශවාරය** සැකෙවින් දක්වමු. එය පස් ප්‍රකාරයකින් දැක්ක යුතු වේ. කෙසේද යත් ?

1. පදර්ථ වශයෙන් ද,
2. ලක්ෂණ වශයෙන් ද,
3. ක්‍රම වශයෙන් ද,
4. එතාවත් පරම වශයෙන් ද,
5. හෙත්වාදි වශයෙන් ද, යන පඤ්ච ප්‍රකාරයෙනි.

එහි සාමාන්‍ය වශයෙන් හාරනය ශබ්දයන්ගේ ද විශේෂ වශයෙන් දෙසනා ශබ්දදීන්ගේ ද පදර්ථය අටුවාවෙහි ආ නයින් උද්දෙශවාරයෙහි දක්වන ලද්දේ ම ය.

ලක්ෂණයෙහි වනාහි සාමාන්‍ය වශයෙන් හාර සොළස ඛ්‍යඤ්ජන මුඛයෙන් ද, නය පස අර්ථ මුඛයෙන් ද නවාංග ශාස්තෘශාසනයාගේ අර්ථය වර්ණනා කිරීම ලක්ෂණ කොට ඇත්තාහ. විශේෂ වශයෙන් දේශනා හාරාදීන්ගේ ලක්ෂණය මෙසේ දැක්ක යුතු.

ආස්වාද (සැප සොම්නස් ආදි)ය, ආදීනව (දෙෂ)ය, නිඃශරණ (නිර්වාණ)ය, ඵල (දේශනා ප්‍රයෝජන)ය, උපාය (පූර්වභාග ප්‍රතිපත්ති)ය, ආඥප්ති (භාග්‍යවතුන් වහන්සේගේ විධාන)ය, යන මොවුන් විභාග කොට දැක්වීම ලක්ෂණකොට ඇත්තේ දේශනා හාරයයි.

පදය, පෘච්ඡාය, විසර්ජනය, පූර්වාපරය, අනුගීතිය යන මොවුන්ගේ හා ආස්වාදදීන්ගේ විශේෂ නිර්ධාරණ (වෙසෙසින් තෝරා ගැනීම්) වශයෙන් ම සෙවීම ලක්ෂණකොට ඇත්තේ විචයහාරය යි.

සූත්‍රයෙහි ව්‍යඤ්ජනාර්ථයන්ගේ යුක්තායුක්තභාව විභාවනය (යුතු අයුතු බැව් විස්තර කිරීම) ලක්ෂණ කොට ඇත්තේ යුක්තිහාරය යි.

සූත්‍රාගත ධර්මයන්හට පදස්ථාන (ආසන්න කාරණ) වූ ධර්මයෝ ද ඔවුනටත් පදස්ථාන වූ ධර්මයෝ ද යි සම්භව වශයෙන් (ලැබෙන පරිද්දෙන්) පදස්ථාන වූ ධර්මයන් තෝරා වෙන් කිරීම ලක්ෂණ කොට ඇත්තේ පදස්ථාන හාරය යි.

සූත්‍රයෙහි නොආවා වූ ධර්මයනුදු උක්තප්‍රකාරයෙන් ආවවුන්මෙන් තෝරා වෙන්කොට ගෙන වර්ණනා කිරීම ලක්ෂණ කොට ඇත්තේ ලක්ෂණ හාරය යි.

නිර්වචන, අභිප්‍රාය, දේශනා නිදන, පූර්වාපරානුසන්ධි යන මේ සතර විස්තර කිරීම ලක්ෂණ කොට ඇත්තේ චතුර්ව්‍යූහහාරය යි.

දේශනාරූඪ වූ ධර්මයන් සභාග විසභාග ධර්ම වශයෙන් ආවර්තනය (පෙරළාකීම) ලක්ෂණ කොට ඇත්තේ ආවර්තහාරය යි.

සංක්ලේශ ධර්මයන් ද, ව්‍යවදන ධර්මයන් ද, සාධාරණ අසාධාරණ වශයෙන් පදස්ථාන වශයෙන් භූමි වශයෙන් බෙදීම ලක්ෂණ කොට ඇත්තේ විභක්ති හාරය යි.

නිර්දිෂ්ට (විස්තර කොට දක්වන ලද) ධර්මයන් ප්‍රතිපක්ෂ (විරුද්ධ) යන්ගේ වශයෙන් පෙරළීම ලක්ෂණ කොට ඇත්තේ පරිවර්තනහාරය යි.

එක අර්ථයෙක නොඑක්පර්යාය (සමානාර්ථ) ශබ්දයන් යෙදීම ලක්ෂණ කොට ඇත්තේ වෙවචනහාරය යි.

එක එක ධර්මය තමා නොඑක් ප්‍රඥප්තීන් පැණ විය හැකි අයුරු විස්තර කිරීම ලක්ෂණ කොට ඇත්තේ ප්‍රඥප්තිහාරය යි.

ප්‍රතීත්‍යසමුත්පාද, ඉන්ද්‍රිය, ස්කන්ධ, ධාතු, ආයතන මුඛයන්ගෙන් සූත්‍රාර්ථයාගේ අවතරණය (බැස ගැණීම) ලක්ෂණ කොට ඇත්තේ අවතරණ හාරය යි.

සූත්‍රයෙහි පදපදර්ථ ප්‍රශ්නාරම්භ යන මොවුන් ශුද්ධ කිරීම ලක්ෂණ කොට ඇත්තේ ශෝධනහාරය යි.

සූත්‍රාගත ධර්මයන්ගේ අවිකල්පන වශයෙන් (සාමාන්‍ය විශේෂයන් ගැණ කල්පනා කිරීමක් නැතිව) සාමාන්‍ය විශේෂ නිද්ධාරණය ලක්ෂණ කොට ඇත්තේ අධිෂ්ඨානහාරය යි.

සූත්‍රාගත ධර්මයන්ගේ පරිෂ්කාර සංඛ්‍යාත හේතු ප්‍රත්‍යයන් තෝරා වෙන් කොට වර්ණනා කිරීම ලක්ෂණ කොට ඇත්තේ පරිෂ්කාර හාරය යි.

සූත්‍රාගත ධර්මයන්ගේ පදස්ථාන වෙවචන භාවනා ප්‍රහාණ සමාරොපන යන් විවාරණය කිරීම ලක්ෂණ කොට ඇත්තේ සමාරෝපනහාරය යි.

මේ ෂොඩශහාරයන්ගේ විශේෂ ලක්ෂණයි.

නයපස අතුරෙනුදු තෘෂ්ණා අවිද්‍යා දෙකින් සංක්ලේශ පක්ෂ වූ ද සමථ විදර්ශනා දෙකින් ව්‍යවදන පක්ෂ ද සූත්‍රාර්ථය තමා චතුඃසත්‍ය යොජනා මුඛයෙන් නයනය (ගෙණයෑම හෝ පැමිණවීම) ලක්ෂණ කොට ඇත්තේ නන්ද්‍යාවර්තනය යි.

ලෝභාදී වූ ත්‍රිවිධ අකුශල මූලයන්ගෙන් සංක්ලේශ පක්ෂ වූ ද, අලොභාදී වූ ත්‍රිවිධ කුශල මූලයන්ගෙන් ව්‍යවදන පක්ෂ වූ ද සූත්‍රාර්ථය තමා චතුඃසත්‍ය යොජනාමුඛයෙන් නයනය කිරීම ලක්ෂණ කොට ඇත්තේ ත්‍රිපුෂ්කලනය යි.

ශුභසංඥාදි විපර්‍යාසයෙන් සියලු සංක්ලේශ පක්ෂය ද ශ්‍රද්ධෙන්ද්‍රියාදීන් ව්‍යවදන පක්ෂය ද චතුඃසත්‍යය යෝජනා වශයෙන් නයනය කිරීම ලක්ෂණ කොට ඇත්තේ සිංහ වික්‍රීඩිතනය යි.

ඒ ඒ සූත්‍රාර්ථ විසර්ජනයන්හි ඒ ඒ නයට දිසාභූත (කාරණා) වූ ව්‍යවදන පාක්ෂික වූ ද සංක්ලේශ පාක්ෂික වූ ද ධර්මයන් සිතින් සලකා බැලීම ලක්ෂණ කොට ඇත්තේ දිසාලෝචනය යි.

දිසාලෝචනයෙන් සිතා බැලූ ධර්මයන් උපුටා ඒ ඒ නය යෙදීම් වශයෙන් එක්තැන් කිරීම ලක්ෂණ කොට ඇත්තේ අඩකුශනය යි.

මේ පඤ්චනයයන්ගේ විශේෂ ලක්ෂණ යි.

මෙහි දිසාලොචන අඩකුශනය දෙක අර්ථනය නම් නො වෙති. ව්‍යවහාරනය නමැයි ද කර්මනය නමැයි ද කියනු ලැබෙති.

යථොක්ත හාරාදීන් අතුරෙන් සොළොස්හාරයන් ව්‍යඤ්ජන පර්යේෂණ මාත්‍රයක් කරණ බැවින් පළමුකොට සොළොස්හාරයන් යොද ඊට අනතුරුව නන්ද්‍යාවර්තාදි වූ අර්ථනය තුනට දිශාභූත වූ ධර්මයන් දිශාලොචන නයින් බලා යළිත් ඒ ධර්මයන් උපුටාගෙන අඩකුශ නයින් අර්ථනය තුනෙහි යොදන්නහු විසින් සූත්‍රාර්ථවර්ණනා කටයුතු.

මෙතැන සිට ව්‍යඤ්ජන පද සය ද අර්ථ පද සයදැ යි සූත්‍රයාගේ දොළොස් පදයෝ දක්විය යුතු වෙත්. එහි බ්‍යඤ්ජන පද සය නම් :

(1) අක්ෂරය, (2) පදය, (3) ඛ්‍යඤ්ජනය, (4) නිරුක්තිය, (5) නිර් දේශය (6) ආකාරය, යන සය යි.

(1) එහි නොනිමියා වූ පදයෙහි වර්ණයතෙම පර්‍ය්‍යාය වශයෙන් නොනැසෙන හෙයිනුදු සඤ්චරණය (මාරුවීම) නොකරණ හෙයිනුදු අක්ෂර නම් වේ.

(2) මේ කරණ කොටගෙන අර්ථය තෙම ගමන් කෙරේනුයි පද නම් වේ. හේ නාම, ආඛ්‍යාත, උපසර්ග, නිපාත වශයෙන් චතුර්විධ වේ.

(3) පදයෙන් කියන ලද අර්ථය ප්‍රකාශ කෙරේනුයි ව්‍යඤ්ජන නම් වේ. වාක්‍යයයි. පද සමුදය යන අර්ථයි.

(4) ආකාරයෙන් කියන ලද නිර්වචනය නිරුක්ති නම් වේ.

(5) නිරවශේෂ දේශනා (ඉතිරි නොකොට දෙසීම) හෙයින් නිර්වචන යාගේ විස්තරය නිර්දේශ නම් වේ.

(6) පද විසින් වාක්‍යයාගේ විභාගය ආකාර නම් වේ. ඉදින් පදයා කෙරෙන් ආකාරයාගේ වෙනස කවරේ ද යත් ? වාක්‍යය නොනිමි කල්හි නොහොත් විභාග නොකරණු ලබන කල්හි ඒ වාක්‍යයාගේ අවයවය තෙමේ පදනම් වේ. උච්චාරණ වශයෙන් වාක්‍යය නිමි කල්හි නොහොත් විභාග කරණු ලබන කල්හි ඒ ව්‍යාක්‍යයාගේ අවයව තෙමේ ආකාර නම් වේ.

අර්ථපද සය නම් : (1) සංකාශනාය, (2) ප්‍රකාශනාය, (5) විවරණාය, (4) විභජනාය, (5) උත්තානීකර්මය, (6) ප්‍රඥප්තිය, යන මොහුයි.

1. එහිදු අකුරුවලින් දක්වීම සංකාශනා නම් වේ.
2. පදවලින් දක්වීම ප්‍රකාශනා නම් වේ.
3. විස්තර කීම විවරණා නම් වේ.
4. විභාගකොට කීම විභජනා නම් වේ.
5. ප්‍රකට කිරීම උත්තානීකර්ම නම් වේ.
6. ප්‍රකාරයන්ගෙන් හැඟවීම ප්‍රඥප්ති නම් වේ.

පූර්වෝක්ත වූ නන්ද්‍යාවර්තාදී අර්ථනය තුන ද මේ අර්ථපද සය ද යන නවවිධ පදයන් විසින් නොහොත් නවවිධ පදයන් හා සියලුම බුද්ධ වචනයාගේ අර්ථය යොදනු ලැබේ.

හාර සොළසය, ඛ්‍යඤ්ජන පදසය, කර්මනය (දිශාලොචන අඩකුශා ඥකය යන සූවිසි පදයෝ යථෝක්ත නව පදයන් හා සමඟ තෙතිසක් වෙති. මේ තෙතිස් පදයෙන් තොර වූ නෙත්ති පදර්ථයෙක් නම් නැත්තේයි.

(c) තුන්වනුව ''ක්‍රම වශයෙන්'' යි කී බැවින් හාරනයයන්ගේ අනු ක්‍රමය (පිළිවෙළ) දක්වනු ලැබේ :

එහි ධර්මදේශනාවගේ නිඃශ්‍රය, ඵල, උපාය, ශරීර වූ ආස්වාදදීන් විස්තර කිරීම ස්වභාව කොට ඇති බැවින් පියොවින් සියලුම සූත්‍රාන්තයනට අනුරූප යයි සුවසේ දතහැකි බැවිනුදු, විචයහාරාදී සෙසුත් සංවර්ණනා විශේෂයනට ප්‍රතිෂ්ඨා වන හෙයිනුදු පළමු කොට දේශනාහාරය දක්වන ලද්දේ ය.

පද පෘච්ඡා විසර්ජන පූර්වාපරානුගීතීන් හා සමග දේශනාහාර පදර්ථයන් සෙවීම ස්වභාව කොට ඇති හෙයින් ඊට අනතුරුව විචයහාරය ද,

විචයහාරයෙන් සොයන ලද අර්ථයන්ගේ යුක්ති අයුක්ති සොයා බැලීම සුදුසුනුයි යුක්තිවිචාරණභාවයෙන් විචයහාරයට අනතුරුව යුක්තිහාරය ද,

යුක්ති යුක්ත වූ ම අර්ථයන්ගේ සාධන යුක්තියට අනුරූපව කාරණ පරම්පරාවගේ නිර්ධාරණය ලක්ෂණ කොට ඇති ආසන්න කාරණ චින්තනය කළ යුතු හෙයින් යුක්තිහාරයට අනතුරුව පදස්ථානහාරය ද,

යුක්ති යුක්ත වූ (එහෙයින්ම) කාරණ පරම්පරාව විසින් අයත් කොට ගන්නා ලද ස්වභාවය ඇති නොකියන ලද ධර්මයනුදු සමාන ලක්ෂණත්ව යෙන් ගැනීම් කළ යුතු හෙයින් පදස්ථානයට අනතුරුව ලක්ෂණහාරය ද,

සූත්‍රයෙහි ස්වරූපයෙන් ආවා වූ ධර්මයන්ගේ පමණක් නොව අර්ථ වශයෙන් නිර්ධාරණය කරන ලද ධර්මයන්ගේ ද නිර්වචනාදීහු කියයුතු වෙත්නුයි ලක්ෂණයට අනතුරුව චතුර්ව්‍යූහ හාරය ද,

නිර්වචන අභිප්‍රාය නිදානයන් කීමුත් සමග සූත්‍රයෙහි පදර්ථයන්ගේ සූත්‍රාන්තර සංසන්දන (වෙන සුතුරු හා සසඳා බැලීම්) සංඛ්‍යාත වූ පූර්වාපර විචාරය දක්වූ කල ඒ පදර්ථයන්ගේ සභාග විසභාග (සදෘශ විසදෘශ) ධර්ම විශේෂයන්හි ආවර්තනය සැපසේ දක්වන්නට පිළිවන් හෙයින් චතුර්ව්‍යූහයට අනතුරුව ආවර්තනහාරය ද,

සභාග විසභාගධර්මයන්ගේ ආවර්තනය යෙදූ කල සාධාරණ අසාධාරණ වශයෙන් සංක්ලේශ ව්‍යවදාන ධර්මයන්ගේ විභාගය පදස්ථාන වශයෙනුත් භූමි වශයෙනුත් සුවසේ යොදන්නට හැකියයි ආවර්තනයට අනතුරුව විභක්තිහාරය ද,

සාවද්‍ය නිරවද්‍ය ධර්මයන්ගේ සප්‍රතිභාග (අන්‍යොන්‍ය විරුද්ධ) භාවය හේතුකොටගෙන ඔවුන්ගේ විභාගය කළ කල්හි සූත්‍රාගත ධර්මයන් සැපසේ ප්‍රතිපක්ෂ වශයෙන් පෙරළන්නට හැකි යයි විභක්තියට අනතුරුව පරිවර්තන හාරය ද,

සූත්‍රාගත ධර්මයන් පමණක් නොව ප්‍රතිපක්ෂ වශයෙන් පෙරළන ලද ධර්මයෝ ද පර්‍ය්‍යාය වචනයෙන් යෙදිය යුත්තාහයි දක්වනු පිණිස පරිවර්තන යට අනතුරුව වේවචනහාරය ද,

මෙසේ ඒ ධර්මයෝ පර්‍ය්‍යායශබ්ද වශයෙනුත් විභාවනය කරන ලදහයි පර්‍ය්‍යාය වශයෙන් ප්‍රකාශිත වූ ධර්මයන්ගේ ප්‍රභෙදයෙන් ප්‍රඥප්ති වශයෙන් විභාග කිරීම සුවසේ දතහැකි යයි වේවචනයට අනතුරුව ප්‍රඥප්තිහාරය ද,

ප්‍රභවය පරිඥය ආදී වූ ප්‍රඥප්ති විභාග මුඛයෙන් ප්‍රතීත්‍යසමුත්පාද සත්‍යාදී ධර්ම විභාගය කළ කල්හි සූත්‍රාගත ධර්මයන්ගේ ප්‍රතීත්‍යසමුත්පාදදී මුඛයෙන් අවතරණය දැක්විය හැකි යයි ප්‍රඥප්තියට අනතුරුව අවතරණ හාරය ද,

ධාතු ආයතනාදියෙහි අවතරණය කරවන ලද සූත්‍රස්ථ පදර්ථයන්ගේ පෘච්ඡාරම්භ විශෝධනය සුවසේ සපයන්නට පිළිවනැයි අවතරණයට අනතුරුව ශෝධනහාරය ද,

සූත්‍රයෙහි පද පදර්ථයන් විශෝධිත වූ කල්හි එහි ලැබෙන සාමාන්‍ය විශේෂ භාවය සුකරවේයයි දක්වන්නට ශෝධනයට අනතුරුව අධිෂ්ඨාන හාරය ද,

සාමාන්‍ය විශේෂ වූ සාධාරණ අසාධාරණ ධර්මයන් ප්‍රකාශ කළ කල්හි පරිෂ්කාර සංඛ්‍යාත වූ සාධාරණ අසාධාරණ රූප වූ ප්‍රත්‍යය හේතුරාශිහුගේ ප්‍රභෙදය සුවසේ දත හැකියයි අධිෂ්ඨානයට අනතුරුව පරිෂ්කාර හාරය ද,

අසාධාරණ වූ ද, සාධාරණ වූ ද, කාරණය දැක්වූ කල්හි ඒ කාරණයාගේ ස්වකීය ඵලයන් විෂයෙහි කාරණාකාරය ද ඒ හේතුඵලයන්ගේ දෙශනා කාරය ද, භාවයිතව්‍ය ප්‍රහාතව්‍ය (වැඩිය යුතු පහකළ යුතු) ධර්මයන්ගේ භාවනා ප්‍රහානයෝ ද, නිද්ධාරණය කොට කියනු ලබන්නාහු මැනවින් සූත්‍රයාගේ අර්ථාවබෝධය පිණිස පවත්නාහයි පරිෂ්කාරයට අනතුරුව සමාරොපනහාරය ද දක්වන ලද්දේ ය.

මේ හාරයන්ගේ අනුක්‍රමය යි.

නයපස අතුරෙන් අර්ථනය තුන දැක්වීම වෛනෙය පුද්ගලයන් තුන් දෙනා විසින් යොදන ලද බැවින් ඒ ක්‍රමයෙන්ම නන්ද්‍යාවර්තාදී නයතුන් දෙනාගේ පිළිවෙළ දත යුතුයි. ඒ එසේම ය. උද්ඝටිතඥ පුද්ගල තෙමේ නන්ද්‍යාවර්තනය ද, විපඤ්චිතඥ පුද්ගල තෙමේ ත්‍රිපුෂ්කලනය ද, නෙය පුද්ගල තෙමේ සිංහ වික්‍රීඩිතනය ද යොදයි. ඒ නය තුනම උද්දේශ, නිර්දේශ, ප්‍රතිනිර්දේශයන් මෙන් ඒ උද්ඝටිතඥ ආදීන් හට උපකාර පිණිස පවත්නා හුයි.

ඉතිරි නය දෙක තමා අර්ථනය තුනට භූමි වූ ධර්මයන් සිතා බැලීම ද ඒ එහි එකතැන් කිරීම ද යන මේ කරුණෙන් උද්දේශ ක්‍රමය දතයුතු. මේ නයයන්ගේ අනුක්‍රමය යි.

(D) එතාවත් පරම වශයෙන් යන මෙහි තේරුම නම් හාර සොළසෙක නය පසෙකැයි අඩුවක් වැඩියක් නො කොට මෙපමණක් ම පරමකොට දක්වීම් වශයෙන් යනුයි.

මෙහි හාරයන්ගේ එතාවත් පරමතාව නම්, අර්ථනය තුන සහිත වූ මෙපමණක් (සොළසක්) ප්‍රකාර විශේෂයන් කරණ කොටගෙන සූත්‍රයාගේ අර්ථ තෙම නිද්ධාරණය කරනු ලබන්නේ වෛනෙය පුද්ගලයන්ගේ නිරුත්තර වූ ප්‍රථමභූමියට (සෝවාන් ඵලයට) පැමිණීමට ප්‍රමාණ වන්නේය යනුයි.

නොහොත් සූත්‍ර සම්බන්ධ වූ සියලුම සංවර්ණනා විශේෂයන් මේ ෂොඩශහාරයෙහි ඇතුළත් වන බැවින් හාරයන්ගේ එතාවත් පරමතාව දත යුතුයි. ඒ එසේමැයි. මෙහි ඇතුළත් වූ සූත්‍රාන්ත සංවර්ණනාවෝ බොහෝ වෙති. ඔවුහු නම්:

සූත්‍රයාගේ සමුත්ථානය කියයුතු ය. අභිප්‍රාය විස්තර කටයුතු ය. අනෙකප්‍රකාරයෙන් පදර්ථය වර්ණනා කළයුතු ය. විධිය ද අනුවාදය ද දත යුත්තේ ය. නිරෝධය සමාදන කටයුත්තේ ය. අනුසන්ධියට අනුරූප ලෙස නිගමනය කටයුත්තේ යි.

එ සේ ම සූත්‍රයාගේ අර්ථය කියන්නහු විසින් ප්‍රයෝජනය, පිණ්ඩාර්ථය, පදර්ථය, අනුසන්ධිය, චොදනාවය, පරිහාරය, යන මොවුහු කියයුතු වෙත්. එසේම උපොද්ඝාත (නිදර්ශන) ය, පදවිග්‍රහය, පදර්ථචාලනාවය, ප්‍රත්‍යුපස්ථාන (වැටහීම) ය, යන මොව්හු කියයුත්තාහ.

එසේම, (a) ඒකනාලිකාය, (b) චතුරස්‍රාය, (c) නිසණ්ණවර්තිකාය, යන කථා තුන කියයුතුයි.

(a) එහි ශ්‍රී මුඛපාළිය කියා එක එක පදයාගේ අර්ථය කීම ඒකනාලිකා නම.

(b) විරුද්ධ පක්ෂය දක්වා ඊට උපමා දක්වා සපක්ෂය දක්වා ඊට උපමා දක්වා කීම චතුරස්‍රා නම.

(c) විසභාගධර්ම වශයෙන්ම අවසානයට පැමිණ නැවත සභාග ධර්ම වශයෙන්ම අවසානයට යෑම නිෂණ්ණවර්තිකා නමු.

එ සේ ම හෙද කථාවෙන් ද, තත්ත්ව කථාවෙන් ද, පර්‍යාය වචනයෙනුදු සූත්‍රය වර්ණනා කටයුත්තේ යි.

මේ හාරයන්ගේ එතාවත් පරමතාව යි.

නය යන්ගේ එතාවත් පරමතා නම්: යම් හෙයකින් උද්ඝටිතඥ ආදි වූ වෛනෙය පුද්ගලයෝ තුන්දෙන ම සත්‍යාවබෝධයට හිමිවෙත් ද, අර්ථනය තුන දේශනා කිරීමත් ඔවුන් පිණිස ම වෙයි ද, එහෙයින් සංක්ලේශව්‍යවදන ධර්මයන්ගේ උක්තප්‍රකාර වූ (තෘෂ්ණා ආවිද්‍යාදි වූ ද සමථ විදර්ශනා ආදී වූ ද) මූලපද භෙදයෙන් වැඩිකොට බෙදිය යුතු ප්‍රකාරයක් ඇතත් එසේ මූලපදයන් වැඩි නොකොට වෛනෙය පුද්ගලයන්ගේ වශයෙන් ම එතාවත් පරමතාව (නය තුනක් ම බව) වදරන ලදී.

ඒ එසේම ය, මූලපද නවයෙක නවයෙක සියලුම සංක්ලේශය ව්‍යවදන ධර්මයන් ඇතුළත් වූ බැවින් ඔව්හු (මූලපදයෝ) නො වැඩිය යුත්තාහ. වෛනෙයයන් තුන්දෙනා පිළිබඳ වැ පවත්නෙන් අඩු ද නො කළයුත්තාහ යි නයයන්ගේ එතාවත් පරමත්වය දැක්කයුතු. කර්මනයයන්ගේ වනාහි අලොචන සමානයන (සිතා බැලීමත්, එක්තැන් කිරීමත්,) යන දෙක හැර සෙසු ප්‍රකාරයක් නො ලැබෙන බැවින් එතාවත් පරමතාව (දෙකක් මබව) දැක්කයුතු යි.

මේ නයයන්ගේ එතාවත් පරමතාවයි.

E. හෙත්වාදි වශයෙන් යන මෙහි ආදි ශබ්දයෙන් ඵලය, භූමිය, උපනිසාය, සභාග විසභාගය, ලක්ෂණය, නයය යන ආදීහු ගන්නා ලදහ.

ඔවුනතුරෙන් හේතු නම් කාරණයයි. හේ ධර්ම යයිදු කියනු ලැබේ. ඒ වනාහි ප්‍රත්‍යය ස්වභාවයෙන් එක් වැදෑරුම් වේ. කාරක හේතුය, සම්ප්‍රාපක හේතුයයි දෙවැදෑරුම් වේ. කාරකය, ඥාපකය, සම්ප්‍රාපකය යි ත්‍රිවිධ වේ. හේතු හේතු, ප්‍රත්‍යයහේතු, උත්තමහේතු, සාධාරණහේතු යයි චතුර්විධ වේ. ප්‍රත්‍යයධර්මය, කුශලය, අකුශලය, ශබ්දය, ආයර්‍යමාර්ග යයි පංචප්‍රකාර වේ. සභාගහෙත්වාදි වශයෙන් අනෙකවිධ වේ ම ය.

ඵලය ද ප්‍රත්‍යයොත්පන්නභාවයෙන් එක් වැදෑරුම් වේ. අධිගන්තව්‍ය (පැමිණිය යුතු හෝ ලැබිය යුතු) හෙයිනුදු සම්ප්‍රාපක හේතු වශයෙන් ඵල පර්‍යාය ලැබෙයි නොයි ඉපදවියයුතු ලැබියයුතු බැව් විසින් දෙවැදෑරුම් වේ. ඥාප්‍ය (හැඟවියයුතු) නිර්වර්ත්‍ය (ඉපද වියයුතු) ප්‍රාප්‍ය (පැමිණිය යුතු) වශයෙන් තුන් වැදෑරුම් වේ. ප්‍රත්‍යයොත්පන්න විපාක ක්‍රියා වචනාර්ථ නිර්වාණ වශයෙන් පඤ්චවිධ වේ. සභාගහේතු නිර්වෘත්තාදි වශයෙන් අනේකප්‍රභාර යි. එ සේම ලෞකිකය ලෝකෝත්තරයයි ද්විප්‍රකාර වේ. එහි ලෝකෝත්තර නම් චතුර්විධ වූ ශ්‍රාමණ්‍යඵලය යි. ලෞකික ඵලය කායිකය මානසික යයි දෙවදෑරුම්. එහිදු කායික නම් පඤ්චද්වාරික විපාකය යි. සෙස්ස මානසික යි. ඒ ඒ සූත්‍ර දේශනාවෙන් සිදුකළයුතු ප්‍රයෝජනය ද ඵල නම් වේමැයි.

භූමිය ද, සාශ්‍රව භූමි, අනාශ්‍රව භූම්‍යාදී වශයෙන් බහුවිධ වේ. යම් ධර්ම කෙනෙක් ඒ ඒ හාරයන්හට ප්‍රතිෂ්ඨාත්වයෙන් සූත්‍රයන්හි නිර්ධාරණය කරනු ලැබෙත් ද, ඔව්හු ද භූමි නම් වෙතියි දන්නේ ය.

උපනිසා නම් බලවත් කාරණයයි. ඒ ම උපනිඃශ්‍රය ප්‍රත්‍යයනමැයිදු කියනු ලැබේ. යළිදු ඒ ඒ සමයෙහි සිද්ධාන්තයෙහි හෘදය වූ අභ්‍යන්තරය උපනිසා යයි කියනු ලැබේ. මෙහිදු උපනිසා නම් නෙත්ති හෘදය යි හෙවත් නෙත්ති ප්‍රකරණයාගේ සාර වූ තත්ත්වාර්ථය යි. එය මනා සේ පිරික්සා උගන්නා වූ ධර්මකථිකයෝ ඒ ඒ සූත්‍රයෙහි ආගත ධර්ම මුඛයෙන් සියලු හාරනයයන් යෙදීමට සමර්ථ වෙති.

සභාග විසභාග ධර්ම නම් ඒ ඒ ධර්මයනට අනුකූල ප්‍රතිකූල ධර්මයෝ ය. ඒ මෙසේ යි. සම්‍යක්දෘෂ්ටියට සම්‍යක් සංකල්පය සභාගයි. මිථ්‍යා සංකල්පය විසභාගයි. සෙස්ස ද මෙසේමැ යි.

ලක්ෂණ නම් ස්වභාවය යි. ඒ හාරනයයන්ගේ නිර්දේශයෙහි දක්වන ලදුයේම ය.

හාරනයයන් සම්බන්ධ වූ හෙත්වාදි විශේෂයෙන් විනිර්මුක්ත වූ යම් මේ යෝජනා නිබන්ධයෙක් වේ ද, ඒ නය නම් වේ. එකත්වනය, නනාත්ව නය, අව්‍යාපාරනය, එවං ධර්මතානය, යන මොව්හු ද මෙහි නයයහයි ගත යුතු වෙත්.

මේ නිර්දේශවාරයාගේ සංක්ෂේපය යි.

(3) දුන් ප්‍රතිනිර්දේශවාරය සැකෙවින් දක්වනු ලැබේ. ඒ චතුෂ් ප්‍රකාරයකින් බෙදන ලද්දේ ය. එනම් :

1. හාර විභංග වාරය.
2. හාර සම්පාත වාරය.
3. නය සමුට්ඨාන වාරය.
4. සාසන පට්ඨාන වාරය, යන සතර යි.

1. ඔවුනතුරෙන් යම් වාරයෙක්හි නොඑක් උදහරණයෙන් එකම හාරය තෙමේ විස්තර කොට දක්වනු ලැබේ ද, ඒ හාරවිභංගවාර නම් වේ. නෙත්තිප්‍රකරණයෙහි මේ නයින් සොළොස් හාරයම අනෙකොදහරණයෙන් විස්තර කිරීම් වශයෙන් හාර විභංගවාරය ඉතා විස්තරයෙන් දේශනා කරන ලද්දේ ය.

2. යම් වාරයෙක්හි එකම සූත්‍රයෙහි සොළොස් හාරයෝ ම පතනය වෙත් ද (වැටෙත් ද) ඒ හාරසම්පාතවාර නම් වේ.

3. නය සමුට්ඨානය යන මෙහි මේ කරණකොටගෙන සමුත්ථානය (නැගී සිටීම) කෙරෙත්නුයි සමුට්ඨාන නම් වේ. කවරහු නැගී සිටිත් ද යත් ? නයයෝ යි. නයයන්ගේ සමුත්ථානය නයසමුත්ථාන නම් වේ. ඒ කුමක් ද යත් ? ඒ ඒ මූලපදයන් හා චතුස්සත්‍යය යෙදීම යි. එසේම ය. ඒ චතුස් සත්‍ය යෝජනා තොමෝ තන්ද්‍යාවර්තාදීන් හට උත්පත්ති ස්ථාන

බැවින් සමුත්ථානයයිදු භූමියයිදු කියනු ලැබේ. යම් හෙයකින් මෙහි නයයන්ගෙන් නයයන්ගේ සම්භවය (ඉපදීම) දක්නා ලැබේ ද, හෙවත් නන්ද්‍යාවර්තයෙන් පුද්ගලාධිෂ්ඨාන වශයෙන් සිංහ වික්‍රීඩිතයාගේ ද සිංහ වික්‍රීඩිතයෙන් ත්‍රිපුෂ්කලයාගේ ද සම්භවය දක්නා ලැබේ ද, එහෙයින් උද්දේශ පිළිවෙළින් නිර්දේශය නොකරණ ලද්දේ ය. (නෙත්තිපාළියෙහි නයසමුට්ඨානවාරය පිළිවෙළින් දක්වන ලද්දේය) යි දතයුතු.

4. සාසනපට්ඨානය යන මෙහි ශාසනයාගේ ප්‍රස්ථානය ශාසන ප්‍රස්ථාන නම් වේ. ශාසන නම් දේශනා යැ. ඒ දේශනා සංඛ්‍යාත ශාසනය වෛනෙය යන්ගේ අධ්‍යාශයට අනුරූපව ඔවුනට හිතසුඛනිෂ්පත්තිය පිණිස ප්‍රකාරයෙන් සිටීම හෝ පැවතීම ශාසනප්‍රස්ථාන නම් වේ. මෙය සෙසු ක්‍රමවලිනුදු අටුවාවෙහි වර්ණනා කරන ලද්දේම ය. මේ ඉතා සැකෙවිනි. හේ මේ ශාසනප්‍රස්ථානය නෙත්තිපාළියෙහි ෂොඩශප්‍රකාරයෙන් ද අෂ්ටාවිංශති ප්‍රකාරයෙන්දයි ද්විප්‍රකාරයකින් බෙදන ලද්දේ ය. ඉන් සොළොස් වැදෑරුම් බව මෙසේ දත යුතුයි. සූත්‍ර සොළසක් වෙති. ඔව්හු නම්:

1. සංකිලෙසභාගිය සූත්‍රය
2. වාසනාභාගිය සූත්‍රය
3. නිබ්බේධභාගිය සූත්‍රය
4. අසෙක්ඛභාගිය සූත්‍රය
5. සංකිලෙස වාසනාභාගිය සූත්‍රය
6. සංකිලෙස නිබ්බේධභාගිය සූත්‍රය
7. සංකිලෙස අසෙක්ඛභාගිය සූත්‍රය
8. වාසනා නිබ්බේධභාගිය සූත්‍රය
9. වාසනා අසෙක්ඛ නිබ්බෙධභාගිය සූත්‍රය
10. අසෙක්ඛ සංකිලෙස වාසනාභාගිය සූත්‍රය
11. නිබ්බෙධ සංකිලෙස වාසනාභාගිය සූත්‍රය
12. අසෙක්ඛ සංකිලෙස නිබ්බේධභාගිය සූත්‍රය
13. අසෙක්ඛ වාසනා නිබ්බේධභාගිය සූත්‍රය
14. අසෙක්ඛ සංකිලෙස වාසනාභාගිය සූත්‍රය
15. නිබ්බේධ අසෙක්ඛ නේවසංකිලෙස භාගිය සූත්‍රය
16. න වාසනා න නිබ්බේධ න අසෙක්ඛ භාගිය සූත්‍රය

යන මොව්හුයි.

එහි මේ කරණකොටගෙන කෙලෙසේනුයි සංක්ලේශ නම්. සංක්ලේශ භාගයෙහි—සංක්ලේශ කොට්ඨාශයෙහි පැවතියේ සංක්ලේශභාගිය නම් වේ. වාසනා නම් පුණ්‍යභාවනා යැ. වාසනාභාගයෙහි පැවැත්තේ නොහොත් වාසනාව භජනය කරවන්නේනුයි, වාසනාභාගිය නම් වේ. නිර්වෙධනය හෙවත් ලොභස්කන්ධාදීන් ප්‍රදලනය කිරීම නිර්වෙධ නම් වේ. නිර්වේධ භාගයෙහි පැවැත්තේ නොහොත් නිර්වේධය භජනය කරවන්නේ

නුයි නිර්වේධභාගිය නම් වේ. පරිනිෂ්ඨිත (හාත් පසින් නිමියා වූ) ශික්ෂා ඇති ධර්මයෝ අශෛක්ෂ්‍යයෝ නම් වෙත්. අශෛක්ෂ්‍යභාගයෙහි පැවැත්තේ නොහොත් අශෛක්ෂ්‍ය ධර්මයන් භජනය කරවන්නේනුයි අශෛක්ෂ්‍යභාගිය නම් වේ.

ඔවුනතුරෙන් යම් සූත්‍රයෙක තෘෂ්ණාදී වූ සංක්ලේශය තෙමේ විභාග කරන ලද්දේ ද මේ සංක්ලේශභාගිය සූත්‍ර නම් වේ. යම් සූත්‍රයෙක දනාදී පුණ්‍යක්‍රියා වස්තුව විභාග කරන ලදදේ ද මේ වාසනාභාගිය සූත්‍ර නම් වේ. යම් සූත්‍රයෙක ශෛක්ෂ්‍ය වූ ශීලස්කන්ධාදීහු විභාග කරනලදහු ද, මේ නිර්වේධභාගිය සූත්‍ර නම් වේ. යම් සූත්‍රයෙක වනාහි අශෛක්ෂ්‍ය වූ ශීලස්-කන්ධාදීහු විභාග කරන ලද්දහු ද, මේ අශෛක්ෂ්‍යභාගීය සූත්‍ර නම් වෙයි. සෙසු දෙළොස් වැදෑරුම් සූත්‍රයෝම මේ සතර සූත්‍රයන්ගේ ව්‍යාමිශ්‍රනය වශයෙන් වදරණලදහුයි.

ප්‍රස්ථාන නයින් විභාග කරන ලද මේ සංක්ලේශ භාගියාදී වූ ෂොඩශවිධ සූත්‍රයන් කරණකොටගෙන නවවිධ පර්‍යාප්තිශාසන සංඛ්‍යාත වූ සූත්‍රය ෂොඩෂ ප්‍රකාරයෙන් විභක්ත වෙයි. එහෙයින් මේ ෂොඩශවිධ ප්‍රස්ථාන යෙන් අසංගෘහිත වූ පර්‍යාප්ති ශාසන ප්‍රදේශයෙක් නම් නැත්තේයි.

මීට' අනතුරුව අෂ්ටාවිංශති (අටවිසි) ප්‍රකාරයෙන් ශාසන ප්‍රස්ථානය මෙසේ දතයුතුයි. එහි සූත්‍ර අට විස්සකි. එනම්:

1. ලොකියය
2. ලෝකුත්තරය
3. ලෝකිය ලෝකුත්තරය
4. සත්තාධිට්ඨානය
5. ධම්මාධිට්ඨානය
6. සත්තාධිට්ඨාන ධම්මාධිට්ඨානය
7. ඤානය
8. ඤෙයයය
9. ඤාන ඤෙයයය
10. දස්සනය
11. භාවනාය
12. දස්සන භාවනාය
13. සකවචනය
14. පරවචනය
15. සකවචන පරවචනය
16. විස්සජ්ජනීයය
17. අවිස්සජ්ජනීයය
18. විස්සජ්ජනීයාවිස්සජ්ජනීයය
19. කම්මය
20. විපාකය

21. කම්මවිපාකය
22. කුසලය
23. අකුසලය
24. කුසලාකුසලය
25. අනුඤ්ඤාතය
26. පටික්ඛිත්තය
27. අනුඤාතපටික්ඛිත්තය
28. ථවය

යන මොහු ය.

එහි ලෝකිය යනු ලෝකයෙහි නියුක්ත වූයේ නොහොත් ලෝකයෙහි දන්නා ලද්දේ ලෝකය (ලෞකික) නම් වේ. මෙහි වනාහි ලෞකික වූ අර්ථය යම් සූත්‍රයෙක වදරණ ලද්දේ දහේ ලෞකික සූත්‍ර නම් වේ. ලෝකෝත්තර යනු ද එසේම ය. යම් සූත්‍රයෙක ප්‍රදේශයකින් ලෞකිකාර්ථයත් ප්‍රදේශයකින් ලෝකෝත්තරාර්ථයත් වදරන ලද්දේ නම් හේ ලෞකික ලෝකෝත්තර සූත්‍ර නම් වේ. යම් සූත්‍රයෙක් සත්වයන් අධිෂ්ඨාන කොට සත්ත්ව ප්‍රඥපත්තිය ප්‍රධාන කොට ගෙන දේශනා කරන ලද්දේ ද හේ සත්ත්වාධිෂ්ඨාන සූත්‍ර නම් වේ. ධර්ම වශයෙන් ම දේශිත වූයේ ධර්මාධිෂ්ඨාන සූත්‍ර නම් වේ. තදුභය වශයෙන් දේශනා කරන ලදුයේ සත්ත්වාධිෂ්ඨාන ධර්මාධිෂ්ඨාන නම් වේ. මේ නයින් හැම පදයන්හි අර්ථය දත යුත්තේ ය.

බුද්ධාදීන්ගේ ගුණ කීර්තනමුඛයෙන් පැවැත්තේ ස්තවසූත්‍රය නමැයි දතයුතු. මෙහිදු (ලොකියං, ලොකුත්තරං, ලෞකියඤ්ච, ලොකුත්තරඤ්ච යන ආදි වූ) නවවිධත්‍රිකයන්ගේ ද ථව (ස්තවසූත්‍ර) යාගේ ද වශයෙන් අටවිසි වැදැරුම් බව දත යුතුයි.

නෙත්තිපාලියෙහි මෙසේ අටවිසි ප්‍රකාරයකින්දෙසන ලද සාසන පට්ඨානය නැවතත් සංකිලේසභාගියාදීන් හා සංසන්දනය කොට විස්තර මුඛයෙන් දක්වන ලදී. මේ ඉතා සැකෙවින් ප්‍රතිනිර්දේශවාරය යි. නෙත්ති ප්‍රකරණයෙහි ද අටුවාවෙහි ද ආවා වූ බෞද්ධ න්‍යාය ශාස්ත්‍රය මේ නිබන්ධන යෙහි සංක්ෂේප මුඛයෙන් සංගෘහතියයි දතයුතු.

විදුරුපොළ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මෙම දේශනය හැම වියතකුගේම සම්මානයට හා සම්භාවනයට පාත්‍ර විය. උන් වහන්සේගේ මාතෘකාවම අප්‍රකට ගැඹුරු විෂයක් පිළිබඳ වීම විශේෂ කාරණ යකි. එබඳු ගැඹුරු මාතෘකාවක් ව්‍යක්ත ලෙස විග්‍රහ කිරීමට විදුරුපොළ මා හිමිපාණන් වහන්සේට තිබුණු ශක්තිය අප්‍රකට විෂයක් පරීක්ෂණයට ලක් කිරීමෙන් කාලයක් තුළම ක්‍රමවත් අධ්‍යනයකින් ඔපමට්ටම් වූවකි. ලංකාවේ පඬිවරුන්ගේ ඒ වන විටත් අවධානයට ලක් නොවීමෙන් අශුද්ධව තිබුණු නෙත්තිප්පකරණ අටුවාව ක්‍රි.ව. 1916 හේවාවිතාරණ අටුවා ග්‍රන්ථ

මාලාවේ ශුද්ධියක් හැටියට උන්වහන්සේ විසින් ව්‍යක්ත සංස්කරණයකින් ශුද්ධ කොට තිබිණ. මෙහිලා ලබාගෙන තිබුණු ධර්මශාස්ත්‍රීය අවබෝධය පූර්වෝක්ත දේශනය පැවැත්වීම සඳහා මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට පිටුවහල් වූවාට නිසැක ය. ලංකාවේ පමණක් නොව බුරුමය සියමය වැනි වෙනත් ථෙරවාද රටවල පවා මේ බෞද්ධ න්‍යාය ක්‍රමය ගැන ඒ වන විටත් තිබුණු දැනුම ඉතා ස්වල්ප බව කියනු ලැබේ.

විදුරුපොළ පියතිස්ස මහානායක හිමිපාණන් වහන්සේ මෙම දේශනය පවත්වා නිමවත්ම මූලාසනයේ සිටි කල්කටා රාජකීය සංස්කෘත විද්‍යාලයාධිපති මහා මහෝපාධ්‍යාය සතිශ්චන්ද්‍ර විද්‍යාභූෂණ පඬිතුමා නැගී සිට පාළි භාෂාවෙන්ම කථා කරමින් දේශකයන් වහන්සේට උණුසුම් පැතුම්වලින් යුක්තව ගරු ගම්භීර වචනවලින් මුව නොසෑහෙන තරම් ස්තුතියක් කළේ ය. සකල සභාසදයන්ගේ නොහිඟ පැසසුමට හා සාතිශය ප්‍රීතිප්‍රමෝදයට එම දේශනය ලක්විය. එසේ ප්‍රීතියට පත් මහා වියතුන් අතරින් බැරෝඩා, ෆර්ගිසන්, සැන්ට් ක්ෂැවියර්ස් යන මහා විද්‍යාලය තුනෙහි පාළි භාෂාව පිළිබඳ ආචාර්යධුරන්ධර සී. වී. රාජ්වඩෙ (ඇම්.ඒ.), ඇන්. කේ. භගවත් (ඇම්.ඒ.), පී. වී. බාපට් (ඇම්.ඒ.) යන මහා පඬිවරයන් තුන්පළ විසින් ශුද්ධකොට දේවනාගරාක්ෂරයෙන් මුද්‍රණය කළ මජ්ඣිමනිකාය මූලපණ්ණාසකය ඒ තුන්පළ විසින් ම ගෞරවාදර ස්තුති ප්‍රශංසා සහිතව සිහිවටනයක් වශයෙන් පුද කිරීමෙන් ද, මුන් වහන්සේට ගෞරව කරන ලදී.

එම දේශනයට පසු උන්වහන්සේ පිළිබඳ ව භාරතීය පඬිවරුන් අතරත්, සඟරා ප්‍රවෘත්ති පත්‍ර ආදී ජනමාධ්‍ය තුළිනුත්, විශේෂ ප්‍රශංසාත්මක ප්‍රචාරයන් පළ වන්නට විය. ඊට පසු දින උන්වහන්සේ නැවතුම් ගෙන සිටි වෛදිකාශ්‍රම බ්‍රාහ්මණ විද්‍යාලයේ පිහිටුවා තිබුණ සංස්කෘත වාග්විහාරිණී නමින් ප්‍රකට සභාව මඟින් කෙරුණු පිළිගැනීමේ උත්සවයක් ද විය. බමුණු පඬිවරුන් හතළිස්දෙනෙකුන් සමඟ එම පිළිගැනීමට සහභාගි වූහ. එය ද අතිශය උණුසුම් පිළිගැනීමක් වූයේ ය. එහි දී කථා කළ හැම කථිකයෙක්ම අතිපූජ්‍ය මා හිමියන් වහන්සේගේ ධර්මශාස්ත්‍ර විශාරදභාවය හා ව්‍යක්ත භාවය සාතිශය ප්‍රීතියෙන් හා ඉමහත් ඕනෑකමින් වර්ණනා කෙළේ ය.

මහානායක හිමියන් ලද ජාත්‍යන්තර කීර්තිය ගැන එකල ජනමාධ්‍ය තුළින් විශාල කීර්තියක් ලබා දුන් අතර ප්‍රසිද්ධ නවකතා කතුවර ඩබ්ලිව්. ඒ. සිල්වා මහතා සිරසර සඟරාවට කතුවැකි තුනක්ම ලියුයේ ය. එහි තුන් වැන්න මෙ සේ යි :

## පූනා නුවර පැවැත්වූ ප්‍රාචීන මහා පණ්ඩිත සංගමය

"මේ ශාස්ත්‍රීය මහා පණ්ඩිත සමාජයෙහි නොයෙක් රටවලින් පෙනී සිටිය කීර්තිමත් පඬිවරුන් විසින් කියවන ලද පෙරදිග නොයෙක් කරුණු

සම්බන්ධ නිබන්ධනයන්ගේ සාරාංශයන් එකතුකොට ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රණය කරන ලද පොත ලැබී කියවා බැලීමු.

මෙහි ඇතුළත් වූ සියලුම නිබන්ධනයෝ වෛදික අවෙස්ථා ආදී වූ පඞ්ක්තීන් තෙළෙසකින් සංග්‍රහ කරන ලදහ. එයින් පාලි සහ බුද්ධාගම යනු තෘතීය පඞ්ක්තිය වේ. මේ පඞ්ක්තියෙහි ඇතුළත් නිබන්ධන පසකි. එනම් (a) බෞද්ධන්‍යාය ශාස්ත්‍රය සම්බන්ධව **මෞංස්වී ෂාන්ඕං** බුරුම පඬිතුමාගේ ඉංග්‍රීසි ලිපිය ද, (b) බෞද්ධයන්ගේ විනය පාලිය සම්බන්ධව ශාස්ත්‍රාචාර්ය **ඇන්. කේ. භගවත්** (ඇම්.ඒ.) මහතාගේ ඉංග්‍රීසි ලිපිය ද, (c) මිථිලාපුරය දැවීම සම්බන්ධව ශාස්ත්‍රාචාර්ය සී. වී. රාජ්වදෙ (ඇම්.ඒ.) මහතාගේ ඉංග්‍රීසි ලිපිය ද, (d) බෞද්ධන්‍යාය ශාස්ත්‍රය සම්බන්ධව පූජ්‍ය පණ්ඩිත **විදුරුපොල පියතිස්ස** මහා නායක මා හිමියන් වහන්සේගේ පාලි භාෂාමය ලිපිය ද, (e) නාගාර්ජුන සම්බන්ධව මහා මාහෝපාධ්‍යාය ශාස්ත්‍රාචාර්ය **සතිශ්චන්ද්‍ර විද්‍යාභූෂණ** පඬිතුමාගේ ඉංග්‍රීසි ලිපිය ද යන පසයි.

''බුද්ධාගම ප්‍රකෘතිමත් වීම'' සම්බන්ධව ද **සතිශ්චන්ද්‍ර විද්‍යාභූෂණ** පඬිතුමා විසින්ම ඉංග්‍රීසි භාෂාවෙන් විසිතුරු කථාවක් කරන ලද නමුත් එය මේ පොතෙහි ඇතුළත් වී නොමැතියි.

මුල කී ලියවිලි අතුරෙන් බෞද්ධන්‍යාය ශාස්ත්‍රය සම්බන්ධ ලියවිලි දෙකකි. එයිනුත් බුරුම පඬිතුමාගේ ලිපියෙහි සාරාංශය අතිසංක්ෂිප්ත බැවින් අපට ඒ ගැන කිසිත් කිය නොහේ. පණ්ඩිත විදුරුපොල මා හිමියන්ගේ පාලි නිබන්ධනයේ සාරාංශය පිටු තුනක සංග්‍රහ කොට තිබේ. මේ ලිපියෙහි දක්වා තිබෙන්නේ මහාක්ෂීණාශ්‍රව භදන්ත මහාකාත්‍යායන ස්ථවිර ප්‍රණීත නෙත්තිප්‍රකරණ පාලියෙහි ආවා වූ න්‍යාය ශාස්ත්‍රයයි. මේ න්‍යාය ශාස්ත්‍රය නොදන ශ්‍රී මුඛ දේශනාවට අර්ථ වර්ණනා කිරීම නිවැරදි ලෙස නොකට හැකි ය. මෙකල ලක්දිව මේ න්‍යාය ශාස්ත්‍රය අභාවිතත්වයට පැමිණ තිබේ. නෙත්තිප්‍රකරණය දුටුවේවත් නැති අපේ ඇතැම් උගතුන් ශ්‍රී මුඛ දේශනාවට හිතුමතින් අර්ථ කියවන බව රහසෙක් නො වේ. එය පර්‍යාප්ති ධර්මයාගේ පරිහානියට කරුණකි. මෑතකදී ප්‍රාචීන භාෂොපකාර සමිතියේ පණ්ඩිත විභාගයට නෙත්තිප්‍රකරණය නියම කර තිබෙනු දැක්ම සතුටකි. බොහෝ සේම අපේ ලක්දිව පඬිවරු තවමත් දඹදිව පඬිවරුන් පමණ අභාවප්‍රාප්තවූ දෙය සෙවීමෙහි ව්‍යාපෘත නොවන්නාක් මෙන්ම එහි දක්ෂ නොවන බවද හැඟේ. එය අපට මහත් පාඩුවකි.

පණ්ඩිත විදුරුපොල මා හිමියන් වහන්සේ ලක්දිව දැනට ලුප්ත ප්‍රායව තිබෙන බෞද්ධන්‍යාය ශාස්ත්‍රයම ඉදිරියට ගෙන දඹදිවෙහිත් පාලි ඉගෙනීම ගැන පඬිවරුන් අතර මහත් උනන්දුවක් පවත්නා මේ කාලයෙහි ශ්‍රී මුඛ දේශනා පාලියට මුඛාරූඪ අර්ථ කීම වැරදි බැවි උගන්වන මේ උතුම් ශාස්ත්‍රය සම්බන්ධව මුළු දඹදිව පිළිබඳ මහා පණ්ඩිත සමාජය ඉදිරියෙහි කරුණු ගෙනහැර දක්වන්නට අදහස් කළ බව ඉතා පැසසිය යුත්තකි.

ගතවූ නොවැම්බර් මස 6 වන දින පස්වරු කාලයෙහි යථෝක්ත සංගමයේ තුන්වන කොටස වූ පාලි සහ බුද්ධාගම සම්බන්ධ සභාවෙහි මේ පූජ්‍ය පණ්ඩිතයන් වහන්සේ ස්වකීය පාලි නිබන්ධය කියවා අවසන් කළ විට ඒ සභාවේ මූලාසනාරූඪව හුන් කල්කටාවේ රාජකීය සංස්කෘත විද්‍යාල යාධිපති මහා මහෝපාධ්‍යාය සතිශ්චන්ද්‍ර විද්‍යාභූෂණ පඬිතුමා නැගී සිට පාලි භාෂාවෙන් කථා කෙරෙමින් මහා පණ්ඩිත සංගමයේ උපසභාපති තැන හැටියටත්, මේ සභාවේ ප්‍රධාන සභාපතිතැන හැටියටත්, ඉතා ගරු වචන වලින් ස්තුති කිරීමෙන් ද, සකල සභිකයන් අත්පොලසන් දීම ආදියෙන් එය අනුමත කිරීමෙන් ද, බැරෝඩා, !පර්ගිසන්, සැන්ට් ක්ෂැවියර්ස් යන මහා විද්‍යාලය තුණෙහි පාලිභාෂා ශාස්ත්‍රාචාය්‍ය ධූරීනවූ සී. වී. රාජ්වදෙ (ඇම්.ඒ.) ඇන්. කේ. භගවත් (ඇම්.ඒ.), පී. වී. බාපට් (ඇම්.ඒ.) යන පඬි තුමන් තුන්පල විසින් ශුද්ධකොට දේවනාගරාක්ෂරයෙන් මුද්‍රණය කළ මජ්ඣිමනිකාය මූලපණ්ණාසකය ඒ තුන්පල විසින් ම ගෞරවාදර ස්තුති සහිතව සිහිවීමක් වශයෙන් පුද කිරීමෙන් ද මුන්වහන්සේට ගෞරව කරන ලද බැව් දැනගන්නට ලදින් සතුටුවමු. එය සාමාන්‍යයෙන් මුළු ලක්දිවටත්, විශේෂයෙන් ලංකික ප්‍රව්‍රජිත පණ්ඩිත සමූහයටත් ලැබුණු ගෞරවයෙකි. අපට මුන්වහන්සේ දැක හැඳිනීමක් නැතත් අපේ දිවයිනටත්, ජාතියටත්, ආගමටත් ගෞරව පිණිස මුන්වහන්සේ වැඩිය ගමන ගැන උප විසින් ඒකාන්ත හිතාධ්‍යාශයෙන් කරන ලද ශුභ ප්‍රාර්ථනාව එසේම සමෘද්ධ වූවා දැක්ම අපගේ අතිශය ප්‍රීතියට කාරණයකි.

මුන්වහන්සේගේ පාලිනිබන්ධනයෙහි සාරාංශය කියවා බැලීමෙන් නෙත්තිප්‍රකරණගත බෞද්ධන්‍යාය ශාස්ත්‍රය මුළුල්ලම නාතිසංක්ෂේප නාති විස්තර ක්‍රමයෙන් එහි ඇතුළත් කර තිබෙන බැව් හැඟේ.

නෙත්ති ප්‍රකරණය වනාහි සංග්‍රහවාරය විභාගවාරයයි කොටස් දෙකකට බෙදන ලද්දේ ය. ඒ දෙකින් විභාගවාරය උද්දේස, නිද්දේස, පටිනිද්දේස වාර වශයෙන් ත්‍රිවිධ වේ. එයිනිදු පටින්ද්දේස වාරය හා විභංග හාර සම්පාත නයසමුට්ඨාන සාසනපට්ඨානවාර වශයෙන් චතුර්විධ වේ. ඒ කරුණු සියල්ලම පණ්ඩිත විදුරුපොල මාහිමියන්ගේ පාලි ලිපියෙහි සංගෘහිත බව සාරාංශයෙහි දක්වා තිබේ. එයින් වැඩිදුරටත් හැඟීයන්නේ මෙම පාලි නිබන්ධනය නව වැදෑරුම් වූ අර්ථපදය ද සූවිසිවැදෑරුම් ව්‍යඤ්ජන පදය ද යන තෙතිස්වැදෑරුම් නෙත්තිපදය ම හකුළුවා ලියන ලද්දක් බවයි.

**සිරිසර සහරා*** පිටුව: 571.

---

* **පළමුවැනි කතුවැකිය: 1919. 10. 16 සිරිසර සහරා**
**දෙවෙනි කතුවැකිය; 1919. 11. 01 ,,**
**තුන්වැනි කතුවැකිය; 1920. 01. 16 ,,**

අතිගරු විදුරුපොළ මාහිමියන් වහන්සේගේ කීර්තිය රට රටවල ප්‍රචලිතවත් ම **සියම් රජපවුල** විසින් සිය වියදමින් මුද්‍රණය කැර වූ අටුවා පොත්පෙළ ඇතුළු **සම්පූර්ණ සියම් ත්‍රිපිටකය** ම ධර්ම පූජාවක් හැටියට එම රජපවුලේ උතුමන් විසින් පිරිනමා තිබේ. **1954 බුරුම** රටේ ඇරඹුණු **හවැනි ත්‍රිපිටක ධර්ම සංගායනාවට** ලංකාවෙන් තෝරාගත් උත්තරීතර මණ්ඩලයේ සභාපති පදවියට පත්කර ගත්තෝ ද අතිපූජ්‍ය පණ්ඩිත විදුර පොළ මා හිමියන් වහන්සේ ය. උන්වහන්සේ එම සංගායනාව සඳහා යවන ලද ලේඛනයත් මෙසේ ය :

## නමත්‍ථු මහෙසිනො

සන්දේසොයං මයා විදුරුපොල පියතිස්සාභිධානෙන උද්ධරට්ඨීය අමරපුර නිකායිකමහානායකත්ථෙරෙන පාචීන භාසා සත්ථකොවිදතාය සිරිලංකාදීප මණ්ඩලිස්ස සන්තිකා පඨමතරං ලද්ධ පණ්ඩිතාධිකාරෙන මරම්මරට්ඨෙ අධුනා ආරභියමානාය ඡට්ඨ මහාධම්මසංගායනාය ගරු ලෙඛකධුරන්ධරස්ස අයාස්මතො විසුද්ධාභිවංසත්ථෙරස්ස ආයාචනං තථා අසම්ං ලංකාදීපෙ අච්චුස්සන්නාව විසිට්ඨ සාසනකිච්චස්ස සුඛනිත්ථාරණත්ථං පතිට්ඨාපිතාය උත්තරීතර විධායක මහා සංඝසභාය ගරු ලෙඛකාධිකාරිනො අයස්මතො ධම්මවංසත්ථෙරස්ස අනුමතිඤ්ච පටිච්ච සාදර බහුමාන පුබ්බංගමං ලිඛිත්වා පෙසීයතෙ.

තත්‍ර ආදෙයෙව තාව යථාවුත්තාය උත්තරීතරවිධායකමහාසංඝසභාය සබ්බජෙට්ඨකොහං ජාතියා පඤ්චසත්තතිවස්සිකො එතරහි මරම්ම විසයෙ ආරබ්භමානාය ඡට්ඨ මහාසංගායනාය නියුත්තා යෙ මය්හං පියසබ්‍රහ්මචාරිනො මහාථෙරානුත්ථෙරා ආගතාගමා ධම්මධරා විනයධරා පරියත්ති පටිපත්ති බහුස්සුතා ච සබ්බෙපි තෙ ආයස්මන්තො යථා ච තෙ තථෙව පච්චය දයකා සබ්බෙ ගහට්ඨාපි රතනත්තයානුභාවේන සුඛිතා හොන්තු, අරොගා නිද්දුක්ඛා නිහතසබ්බන්තරාය සබ්බොපද්දවා චිරං දීඝමායුං පරිපාල යන්තු. ඉමස්ස සබ්බසම්පත්තිමූලකස්ස සබ්බලොකහිතසුඛවිධායකස්ස අපරිමිත ඵලානිසංස දයකස්ස මහා සාසන කිච්චස්ස අනන්තරාය පරියොසාන දස්සනත්ථං සමග්ගා සම්මෝදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤ මඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා ච විහරන්තු ධම්මගරුකාති හිතමාසිංස යාමි.

න කෙවලං මමෙවායං හිතාසිංසනා අථඛො මමාධීනස්ස සකලස්සාපි භික්ඛුසංඝස්ස අයමේව හිතාසිංසනාති න මෙ එත්ථ කොචි සංසයො අත්ථි.

සරන්තු ආයස්මන්තො ඉමා තිස්සා ගාථායොපි අට්ඨකථාසු දිස්ස මානා :—

"යාව තිට්ඨන්ති සුත්තන්තා විනයො තාව දිප්පති
තාව දක්ඛින්ති ආලොකං සූරියෙ අබ්භුට්ඨිතෙ යථා.
සුත්තන්තේසු අසන්තේසු පම්මුට්ඨෙ විනයම්හි ච
තමො භවිස්සති ලොකෙ සූරියෙ අත්ථංගතෙ යථා.
සුත්තන්තෙ රක්ඛිතෙ සන්තෙ පටිපත්ති හොති රක්ඛිතා
පටිපත්තියං ඨිතො ධීරො යොගක්ඛෙමා න ධංසතීති."

පහිතමිදං සන්දේසපණ්ණං සිරිලංකාදීපෙ රොහණ ජනපදෙ නගරංගණ පුරොපන්තිකෙ හමරාරඤ්ඤෙ පතිට්ඨිතස්මා සිරිමහාවිහාරතො සම්මාසම් බුද්ධස්ස භගවතො පරිනිබ්බාණතො චතුස්සතසත්තනවුතාධිකානං ද්වින්නං වස්සසහස්සානමුපරි අට්ඨනවුතිමෙ සංවච්ඡරෙ වෙසාඛපුණ්ණමියං සසිවාරෙ මරම්මරට්ඨෙ ආරබ්භමානාය ඡට්ඨමහාධම්මසංගීතියා පුරෙතරං වචනත්ථා යාති.

විදුරුපොල පියතිස්ස මහා නායකත්ථෙරො

10.5.54

බුරුම සංගායනාවේ දී ත්‍රිපිටකය පිළිබඳ පැනනැගුණු ගැටලු තැන් නිරාකරණය කර ගැනීම් ආදියේ දී විදුරුපොළ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් ලද සහයෝගයත්, සදුපදේශත්, බෙහෙවින් ම පිටුවහල් වූ බව පැවසේ. ඒ වන විට වෘද්ධ අවස්ථාවෙහි ජීවිතයෙහි හායනපක්ෂය ගෙවමින් සිටි මහානායක හිමිපාණන් තම අපහසුකම් කිසිවක් නො බලා ත්‍රිපිටක ධර්මයෙහි චිරස්ථිතියම පතා ක්‍රියා කිරීම උන්වහන්සේ තුළ තිබුණ සාසනික ඇල්මට තවද සාධක වේ.

ඉන්දියාවේ නොයෙක් පෙදෙස්වල ලාංකික ධර්මධරයන් හා විශාරද උගතුන් ගැන කියැවෙන හැම අවස්ථාවක ම **විදුරුපොළ පියතිස්ස** යන නම මුල් පෙළටම ගැනුණේ නිරායාසයෙන්ම ය.

සුපේසල ශික්ෂාකාමී අතිපූජ්‍ය විදුරුපොළ **පියතිස්ස** මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ජාත්‍යන්තර වශයෙන් කොතෙක් ප්‍රසිද්ධියට පත්වූවා ද යතහොත් උන්වහන්සේ වෙත සසුන්ගත වීම සඳහා භාෂාශාස්ත්‍ර ප්‍රවීණ ශාසනමාමක වියතුන් පිටරටවලින් මෙරටට පැමිණීමට තරම් එම ප්‍රසිද්ධිය පුළුල් විය. එසේ සසුන්ගත වූ ශිෂ්‍යයෙකි, ඉන්දියා **නාලන්ද මහා විද්‍යාපීඨයෙහි** පාළි හා සංස්කෘත පිළිබඳ මහාචාර්ය ගරු **බුද්ධරක්ඛිත** ස්ථවිරයන් වහන්සේ. උන්වහන්සේ විදුරුපොළ මා හිමියන් වහන්සේගේ ශිෂ්‍යයෙකු හැටියට බුද්ධධර්මය ඇතුළු පාළි සංස්කෘත භාෂා පිළිබඳ ව මහත් සේවාවක් කරමින් විශාරද පඬිවරයෙකු හැටියටත් භාරතයෙහි **කීර්තියක් උසුලති.**

# 11 පරිච්ඡෙදය


## ශ්‍රෙෂ්ඨතම සංඝපිතෘත්වය

### I

ශ්‍රී ලංකාද්වීපයෙහි අනුරාධපුරයෙන් පටන් ගෙන පැවත ආ වියත් පඬිවර මාහිමි පරපුර මේ සියවසේ සෝභාමත් කළ අසහාය පඬිවරයාණ කෙනෙකු හැටියට කීර්තියට පත් මහොත්තමයෙකි, රාජකීය පණ්ඩිත විදුරුපොළ පියතිස්සාභිධාන මාහිමිපාණෝ. උන්වහන්සේ වචනයේ පිරිපුන් අරුතින් ම සුපේශල ශික්ෂාකාමී වූහ. සංඝසෝභන ගුණවලින් උසස් අයුරින් ම පිරී සිටියහ. සංඝපිතෘත්වයට අවශ්‍ය පාණ්ඩිත්‍යය, ආදර්ශය, පාලන ශූරත්වය, මධ්‍යස්ථ බව, දයාව හා කරුණාව යන මේ ආදී ගුණවලින් උන්වහන්සේගේ ජීවිතයට ලැබුණේ විශාලතම ආලෝකයකි.

අතිපූජ්‍ය විදුරුපොළ මාහිමියන් වහන්සේ ළදරු සාමණේර වියේ පටන් අනාගත සංඝනායකත්වයට පෙර ලකුණු පහළ කළ කෙනෙකි. උන්වහන්සේ කවර තරම් බැරෑරුම් කරුණක දී වත් කලබල නො වූහ. සොයා විමසා බලා ක්‍රියා කිරීම තම ජීවිතයට පුරුද්දක් කරගෙන තිබුණේ ය. ශාසනික වශයෙන් හෝ සාමාජික වශයෙන් හෝ මතුවන ලොකු කුඩා කවර තරමේ ගැටලුවක් වුවත් තියුණු ඇසින් හා විමසුම් නුවණින් නිරාකරණය කිරීම උන්වහන්සේගේ ජීවිතයේ පරිණත පුරුද්දක් වූයේ ය. විදුරුපොළ මාහිමියන් වහන්සේගේ අනාගත සංඝපිතෘත්වය ගැන දේහ ලක්ෂණ විද්‍යාඥයෙකුගේ කියමනක් මෙම ග්‍රන්ථයෙහි මුල ද සඳහන් වී ඇත. ඒ අනාගත වාක්‍යයට අනුගුණ වන අයුරින් ම උන්වහන්සේ තම ජීවිතය සකස් කරගෙන ආහ. 1911 උඩරට අමරපුර නිකායේ සංඝපිතෘත්වය තෙක් පියතිස්ස හිමිපාණන් වහන්සේගේ ජීවිතය එම උදාර පදවියට උචිත ආකාරයෙන් ම සංවිධාන වූයේ ය. කලක් ම සංඝපති බවට නියම සුදුස්සකු නැතිකමේ අඩුපාඩුව උන්වහන්සේ ස්වනිකායේ මහා නායක පදවියට පත්වීමෙන් සම්පූර්ණ වූයේය. එතැන් පටන් තමා වෙත පැවරුණු ඒ බැරෑරුම් වගකීම ධර්මවිනයානුකූලවත්, විශේෂයෙන් සංඝ සමාජයේ සුභ සිද්ධියට පිරිමහින අයුරිනුත්, කොටින් ම ලෝක සාසන දෙකට වැඩ

## විදුරුපොල මහ නාහිමියන්ගේ ශිෂ්‍ය ජීවිතය



පළමුවැනි පෙළේ වමේ සිට: කරන්නාගොඩ ගුණරතන, මාබොටුවන සිද්ධාර්ථ, හික්කඩුවේ ශ්‍රී සුමංගල [නායක], වලානේ ශ්‍රී සිද්ධාර්ථ [නායක], සූරියගොඩ සුමංගල, මුල්ලේරියාවේ සුමතිපාල යන ස්වාමීන්ද්‍රයන් වහන්සේලා. දෙවැනි පෙළේ වමේ සිට: කුරුණෑගල සුමන, පළීවානේ ශ්‍රී නිවාස, යගිරල පඤ්ඤානන්ද [නායක], කළුගෙඩිහේනේ ගුණානන්ද, විදුරුපොල පියතිස්ස [මහා නායක], මොරටුවේ මේධානන්ද [නායක], දියපත්තුගම වාචිස්සර, බඳුල්ලේ ධම්මපාල යන ස්වාමීන්ද්‍රයන් වහන්සේලා. අන්තිම පෙළේ වමේ සිට: ඇචරියවත්තේ ශ්‍රී ජිනරතන [නායක], බැන්ඩියමුල්ලේ ධම්මරතන, ගල්කිස්සේ ධම්මිස්සර, කුරුණෑගල පේමරතන, වලානේ සද්ධිස්සර යන ස්වාමීන්ද්‍රයන් වහන්සේලා.

වැඩෙන අයුරින් ම පවත්වාගෙන යාමෙහි ලා ක්‍රියා කළේ අප්‍රතිහත ධෛර්ය යෙන් හා සුප්‍රතිෂ්ඨිත අධිෂ්ඨාන ශක්තියකින් යුක්තව ය. හැම පියවරක් පාසා ම ක්‍රියා කොට ඇත්තේ ඒ උත්කෘෂ්ට පදවියේ ගරුත්වය සුරක්ෂිත වන අයුරින් පමණක් නොව එම තනතුරට අලංකාරයක් ද වන ආකාරයෙනි. ඉතා බැරෑරුම් ගැටලු, ප්‍රශ්න, අධිකරණ විමර්ශන ආදී වශයෙන් මුණ පෑ නොයෙක් අර්බුද අවස්ථාවල ඒවා තෝරා බේරා ගැනීමට උන්වහන්සේට ප්‍රධාන වශයෙන් පිටුවහල් වූයේ ධර්මවිනය විෂයෙහි තමන් ලබාගෙන තිබුණු සුවිශද දැනුම් සම්භාරය යි. බුද්ධි කෞශල්‍යයත්, විචාරශීලීභාවයත්, මේ සියල්ල තුළ ම විනිවිද ගිය අපක්ෂපාතීභාවයත් උන්වහන්සේගේ තීරකාරණයන් නිරවද්‍ය වීමට නියත හේතු විය.

ශිෂ්‍යයෙකු වශයෙන්, ආචාර්යවරයෙකු වශයෙන්, නායකවරයෙකු වශයෙන් **විදුරුපොළ** මාහිමියන් වහන්සේ කොතැනට පැමිණියත් ඒ සෑම තැනකම මූලිකත්වයක් හිමිවීම ස්වභාවසිද්ධ සිද්ධියක් බවට පත් විය. මෙරට ප්‍රධාන පෙළේ පඬිවරුන්ගෙන් සැදුම් ලත් 1916 ඇරඹි **හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථ සංස්කරණ මණ්ඩලයෙහි** උන්වහන්සේ ප්‍රධානස්ථානයකට පැමිණියේ තමන්ටත් වඩා ප්‍රසිද්ධියෙන් හා තපසින් වැඩිහිටි ප්‍රවීණ මහ තෙරවරුන් පසුබාමිනි. එහි පෙළ අටුවා පොත් වැඩිම ගණනක් සංස් කරණය කිරීමේ ගෞරවය ද හිමි ව ඇත්තේ විදුරුපොළ මහානායක හිමි පාණන් වහන්සේට ය. උන්වහන්සේ සැපත්වුණු කවර තරමේ වියත්, නැණවත් ප්‍රභූමණ්ඩලයක වුවත් මුලසුනට හිමිකමක් විදුරුපොළ මාහිමි යනට ලැබී තිබුණේ ඒ මහා පාණ්ඩිත්‍යය නිසා පමණක් නොව චිරාත් කාලයක් පුරුදු කොට තිබුණු ජීවිත පරිඥානය හා තදනුබද්ධ පරිණත භාවයත් නිසා ය. සුදුස්සාට සුදුසු තැන දෙන හැම සමිති සම්මේලනයක ම හැම සභා සංස්ථා වක ම **විදුරුපොළ** මහානායක හිමිපාණන්ගේ නම එසේ මුල්තැනට පැමිණියේ කිසිදු පෙළඹීමක් නැතිවයි. ප්‍රදේශ භේද, නිකාය භේද, ගෝත්‍ර භේද ආදී වශයෙන් භේද මතුවීම හෝ මතු කිරීම උන්වහන්සේගේ ජීවිතය තුළ නො සිදු වූවකි. එබඳු භේදයන්ට රුකුලක් හෝ අනුබලයක් වන ලෙසින් ක්‍රියා කිරීම නායක හිමිපාණන්ගේ ජීවිතයෙන් පලා ගිය පිළිවෙතයි. අන්‍ය නිකායික පිරුවනක් වුවත් තමා ඉගෙන ගත් තැනම ආධිපත්‍යයට පත් කිරීමේ පුවත මෙහි ලා ඉතා වැදගත් වන්නකි. ක්‍රි.ව. 1953 **විද්‍යාලංකාර ත්‍රිපිටක ධර්ම සංගායනාවේ** මූලිකත්වය හෙබවීමත්, 1954 **බුරුම ධර්ම සංගායනාවේ** උත්තරීතර සංඝ සභාවෙහි මූලාසනයට තෝරා ගැනීමත් උන්වහන්සේගේ ජීවිතයේ සහභාගි වූ උසස් ආගමික කර්තව්‍ය දෙකකි. ලංකාවේ පමණක් නොව **සියම** වැනි ඈත නැගෙනහිර රටවල පවා මාහිමියන්ගේ කීර්තිනාමය සංඝපිතෘවරයෙකු හැටියට ප්‍රසිද්ධියට පත්ව තිබිණි. **සියම් රජපවුලකින්** උන්වහන්සේ වෙත පරිත්‍යාග කරන ලද ඒ අගනා ත්‍රිපිටක පූජාව පවා කැරුණේ ශ්‍රේෂ්ඨතම සංඝපිතෘවරයෙකු හැටියට ලබා තිබුණු ඒ කීර්තිනාමය නිසා ය.

විදුරුපොළ මාහිමියන් අර්ථවත් කළ පාණ්ඩිත්‍යයටත්, ශාසනික මෙහෙවරක් හැටියට පලගැන්වූ මහානායක පදවියටත්, පස්විසි වසරක් පිරුණේ විය. එම අනුස්මරණීය අවස්ථාව මහා උත්සවයකින් සැමරීම සඳහා 1936 පෙබරවාරි 26 වන දින නුවරඑළියේ බඹරකැලේ ශ්‍රී මහා විහාරයේ දී පවත්වන ලද ගිහි පැවිදි ඒ මහා සමුළුව **පඤ්චවිංශතිපූර්ති**[1] නමින් හඳුන්වනු ලැබිණි. එය ලංකාවේ උගත් නූගත් කොයිකාගේත් සැලකිල්ල හිමි වූ, විශේෂයෙන් උඩරට හැම පෙදෙසකම ප්‍රසිද්ධියක් ඇති කළ මහොත්සවයක් විය. එබඳු උත්කර්ෂවත් අවස්ථාවක පවා උන් වහන්සේ කල්පනා කෙළේ තමා ගෙවූ ජීවිතය දෙස ආපස්සට හැරී බැලීමටයි එය වඩාත් සත්‍ය වන්නේ ඒ මහා උත්සව සභාව අමතා උන්වහන්සේ පැවැත්වූ දේශනාව යථාර්ථයෙන් විග්‍රහ කරන විට ය. එම දේශනාව තම ජීවනචරිතය අත්‍යර්ථයෙන් තමා විසින් ම කියා පෑමකි. එය පියවර තුනකින් සම්පූර්ණ වී තිබේ. පළමු පියවර උපතේ සිට පණ්ඩිතෝපාධිය ලැබූ තැන් දක්වා තිස් අවුරුද්දටත්, දෙවෙනි පියවර පණ්ඩිත පදප්‍රාප්තියේ සිට විසිපස් අවුරුද්දකටත්, තුන්වෙනි පියවර හැටියට උඩරට අමරපුර නිකායේ මහානායක ලෙසට උන්වහන්සේගේ ක්‍රියා කලාපයටත් යටත් කොට ඇත. මෙහිලා තම සංඝපතිත්වය ස්වනිකාය තුළ ක්‍රියාත්මක කළ විදිය ඉතා වැදගත් කොට සැලකිය හැකි ය. උන්වහන්සේ නිකාය තුළ ඇති වූ ගැටලු හා අධිකරණ ප්‍රශ්න විසඳූ ආකාරය මෙන් ම නිකායික අභිවෘද්ධිය සඳහා ක්‍රියා කළ විධියත් මෙම කොටසින් විවරණය කර තිබේ. ඒ සියල්ලෙන් ම පැහැදිලි වන්නේ නිකායක් පාලනය කළ මහානායක වරයකු හැටියට එම පදවියට හැම අතින්ම උචිත අයුරින් ක්‍රියා කොට ඇති බවයි. ස්වනිකායික මහා ස්ථවිරයන් වහන්සේලා අමතමින් ද, ඊට අමතරව අන්තේවාසික සද්ධිවිහාරිකයන් වහන්සේලා අමතමින් ද, ප්‍රකාශ කළ අදහස්වලින් ස්වනිකායික මහානායක හිමිපාණන් වහන්සේ කවර තරම් ළෙන්ගතු කමකින් හා අභිවෘද්ධිදායක ප්‍රාර්ථනාවකින් ක්‍රියා කරනවා දැ යන්න පැහැදිලි ව දක්ක හැකි ය. එසේ ම එය නිකායේ අභිවෘද්ධියට ද ප්‍රතිෂ්ඨාධාර වියත් අනුශාසනාවක් හැටියට සර්වප්‍රකාරයෙන් ම පෝෂණය වී ඇත.

මෙම මහොත්සවය සඳහා පැමිණීමෙන් ද, ආශීර්වාද කරමින් ද, ලිපි ලේඛන විදුලි පුවත් ආදිය සපයමින් ද, සහභාගි වූ ගිහි පැවිදි වියත් පිරිස ඉතා විශාල ය. ලංකාවේ එද වැඩසිටි හැම නිකායක හැම මහානායක වරයෙකුගෙන් ම උන්වහන්සේට ආශීර්වාද හා සුභ ප්‍රාර්ථනා ලැබිණ. මේ උත්සවයේ දී කථා කළ ශ්‍රීමත් ඩී. බී. ජයතිලක ඇමතිතුමා අතිගරු මහානායක හිමිපාණන් වහන්සේගෙන් ආගම ධර්මයට හා භාෂාශාස්ත්‍රාදිය වත් කෙරුණු සේවය අතිසම්භාවනීය බව හා සදනුස්මරණීය බව ප්‍රකට කෙළේ ය. පුවත්පත් වැනි ජනමාධ්‍ය තුළින් ද මේ අවස්ථාවේ දී මහ

1 මෙම උත්සවයේ දී කළ දේශනය විශාල පිටු 15 කින් යුක්තව මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලදී.

නායක හිමිපාණන් වහන්සේ ආගමික සාමාජික හා ශාස්ත්‍රීය වශයෙන් කර ඇති සේවය අත්‍යන්තයෙන් ම උත්කෘෂ්ට බව ප්‍රකාශ කෙරිණ.[1]

ධර්මවිනය ඇතුළු ශාසනය පිළිබඳ ව හෝ රටේ පොදු සමාජය පිළිබඳ ව හෝ යම් යම් මත භෙද, ප්‍රශ්න හා වාදවිවාද ඇති වූ හැම අවස්ථාවක ම මෙන් **විදුරුපොළ** මාහිමියන් ශ්‍රේෂ්ඨතම සංඝපිතෘවරයකු හැටියට ඉදිරිපත් වැ ලියා කියා දක්වීමෙන්, අදහස් ප්‍රකාශ කිරීමෙන් පමණක් නොව සමහර විට වාදවිවාද පවා කිරීමෙන් තම වගකීම උපරිම මට්ටමින් ඉටු කළහ. එබඳු මතභෙද හා අර්බුදකාරී ප්‍රශ්නවල දී උන්වහන්සේ තම අදහස් පළ කෙළේ ජයග්‍රහණය තකා නොව සත්‍යය, යුක්තිය හා සාධාරණත්වය තෝරා බේරා නිරාකරණය කර ගැනීම සඳහා ය. උන්වහන්සේ තම ලිපි ලේඛන මගින් බලාපොරොත්තු වූ තවද දෙයක් නම් අනුන්ගේ අදහස් පවා දියුණු තියුණු කිරීම හා හැඩගැස්වීම යි

සමකාලීන වැ පැනනැගුණු **භික්ෂු ඡන්දය, විහාර දේවාලයගම් ආදයම් ප්‍රශ්නය, ප්‍රතිසංස්කරණ යෝජනා, භික්ෂු දේශපාලනය** ආදී මේ රටේ ආන්දෝලනයක් ඇති කළ හැම ප්‍රශ්නයක දී ම විදුරුපොළ මා හිමියන් අදහස් දක්වූයේ කිසිම බලවේගයකට හෝ හිතමිත්‍ර සම්බන්ධයකට හෝ පක්ෂපාතිත්වය දක්වමින් නොව තම අදීන අදහස් පාඨක ලෝකයා අතර ප්‍රචලිත කොට ඒ මගින් සත්‍යය නිරාවරණය කර යථාර්ථය කුළුගන්වන පරමාධිෂ්ඨානයෙනි. උන්වහන්සේගේ අදහස් හා මතවාද නො ඉවසූ ඇතැම්හු විවාද පථයට ද බටහ. එබන්දවුන් විදුරුපොළ මා හිමියන් මෙල්ල කෙළේ ධර්මය, යුක්තිය හා සත්‍යය ආයුධ කොට ගනිමින් විනා තර්ක බුද්ධිය වහල්කොට ගනිමින් නො වේ. එද ඇවිලෙමින් තිබුණු ජාතික ප්‍රශ්න, ආගමික ප්‍රශ්න හා දේශපාලනික ප්‍රශ්න වැනි ප්‍රශ්නවල දී උන්වහන්සේ පළකළ අදහස් මධ්‍යස්ථ මතධාරී විද්වත් විචාරක ලෝකයාගේ සාතිශය සම්භාවනයට හා ගෞරවාන්විත පිළිගැනීමට ලක් වූ බව අවධාරණයෙන් පළ කළයුතු වේ.

## II

## විශෙෂ ගති ලක්ෂණ:

විදුරුපොළ මාහිමියන් වහන්සේ උගතුන් අතර විශේෂ උගතෙකි. බුද්ධිමතුන් අතර විශේෂ බුද්ධිමතෙකි. ලේඛකයන් අතර විශේෂ ලේඛක යෙකි. අන් කවර කෙබඳු අංශයකින් ගත්තත් උන්වහන්සේගේ ජීවිතය තුළ ම තිබුණේ පැහැදිලි අනන්‍යතාවකි. එම තත්ත්වය දීර්ඝ ලෙස විස්තර කරතොත් ඒ සඳහා වෙනම ම ග්‍රන්ථයක් නිර්මාණය කළ යුතු වේ. කෙටි සිද්ධි ඔස්සේ විශේෂ ගති ලක්ෂණ කීපයක් මෙසේ දක්වේ :

---

1 මේ පිළිබඳව ලංකාවේ කීර්තිමත් පුවත්පත් කතුවරයකු විසින් පළ කරන ලද ලිපියක් මෙහි අග යොදා ඇත. උපග්‍රන්ථය කියවන්න.

රතනජෝති මහ නා හිමියන්ගේ ඉල්ලීම පරිදි "ලියනඅප්පු" නමැත්තෙක් පුස්කොළ පොතක් ලියා එය උන්වහන්සේට බාරදීම සඳහා විහාරස්ථානයට ගෙනාවේ ය. එය අතට ගත් **පියතිස්ස** සාමණේර නම එහි අගට වැකියක් යෙදීමට යෝජනා කෙළේ ය. මහනාහිමියන් අත පොත තබමින් ලියනඅප්පු ඒ කථාව ද මහනාහිමීට කී කල ඒ වැකිය කුමක් දැයි උන්වහන්සේ විචාළහ. වැකිය මෙය යැයි කියමින් :—

> "සම්මාසම්බුද්ධස්ස භගවතො පරිනිබ්බානා ඡත්තිංසාධික ද්විසහස්සචතුස්සත සංවච්ඡරෙ චිත්තමාසෙ පුණ්ණ පක්ඛ මියං රවිවාරෙ පුබ්බණ්හසමයෙ ලිඛිත්වා නිට්ඨිතා ඉමා. . . ."

මේ පාඨය කී විට මහනාහිමියෝ මහත් ප්‍රීතියට පැමිණ ඒ වේලාවේ ම **පාළි මහා බෝධිවංසය** තම ශිෂ්‍යවරයාට පරිත්‍යාග කළහ. ක්‍රි.ව. 1893 මේ පුවත සිදුවන විට පියතිස්ස සාමණේර නමගේ වයස අවුරුදු 13 යි.

කොළඹ පැමිණි දිනවල විවේක පහසුකම් ලද විට **හික්කඩුවේ සුමංගල** නා හිමියන් බැහැ දැකීමට යාම වීදුරුපොළ පියතිස්ස හිමියන්ගේ පුරුද්දයි. එහි නැවතී සිටි දිනක හැන්දෑවේ හික්කඩුවේ නාහිමියෝ සිය ගුරු මණ්ඩලයේ හෙයියන්තුඩුවේ, මහගොඩ නාහිමිවරුන් ඇතුළු ශිෂ්‍ය පිරිස හා **පියතිස්ස** හිමියනුත් සමඟ තෙරුවන් වැඳ, මල් පහන් පුද එන ගමන් බෝධිවන්දනා ගාථාවේ "නාමවාම දේවරුක්ඛ" යන තැන "වාම" කීයේ මොන තේරුම කට දැයි පිරිසගෙන් විචාළහ. හැමදෙන ම නිහඬ වූහ. තරුණ පියතිස්ස හිමි එහි තේරුමත් කියා **නිඝණ්ඩුවේ** එන එය ඇතුළත් ගාථාව ද කීයෙන් "නිඝණ්ඩුව හරියට පාඩම් තිබෙන්නේත් පියතිස්ස තැනට පමණකැ" යි කියමින් මහත්සේ ප්‍රශංසා කළහ.

**නුවරඑළියේ** අධික ශීතල දිනවල පවා පියතිස්ස නාහිමියෝ කිසිම බාහිර පොරෝණයකින් හිස කය වසා ගැනීමක් නො කළහ. ශීත අධික ලෙස දැනෙන විට උන්වහන්සේ කෙළේ බෙල්ලේ පසුපස රැඳි සිවුරු කොනින් හිස් මුදුන වසා ගැනීම පමණි. දේශගුණයට ඔරොත්තු දෙන පරිදි ශරීරය හැඩ ගස්සා ගැනීමට උන්වහන්සේ සමත් වූහ.

හැම මසකට ම වරක් තම පුස්තකාලය, නිදන කාමරය, ශාලාව ආදියේ මකුළුදැල් කඩා මුහුණ සේදීමට ගන්නා පැන් සෙම්බුව ඇතුළු හැම පාරිභෝගික උපකරණයක්ම මැද පිරිසිදු කොට, කාමරවල සුවඳකුරු දල්වා සුවඳ කැවීම ද උන්වහන්සේගේ සිරිතයි. මේ කටයුතු සියතින්ම කිරීම සිරිත වුවත් අතවැසි පිරිස ද සහභාගී වී ඒ සියලු කටයුතු නිම කරති.

පැරණි වන්නම් තාල ගැන ද උන්වහන්සේට අවබෝධයක් තිබුණු අතර ඒවා ඇසීමට ද ඉතාම ප්‍රිය ය. වන්නම් කීම ගැන මහත් ප්‍රසිද්ධියක් දැරූ රඹුක්වැල්ලේ සිද්ධාර්ථ හිමියන් තමන් බැහැ දැකීමට පැමිණි හැම

අවස්ථාවක ම රාත්‍රි මධ්‍යමයාමය වනතුරු ඒ හිමියන් කියන වත්නම්වලට ඇහුම්කන් දී ප්‍රීතිවීම ප්‍රකට චාරිත්‍රයකි.

කිසිදක උල්පත් පෑනක් පාවිච්චි නො කළ විදුරුපොළ නාහිමියන් ලියූයේ ම කටු පෑනකිනි. දිග්සහළා පුටුවෙහි බද්ධපර්යංක ව වාඩි වී පැය තුන හතර එක දිගට ලියාගෙන යාම උන්වහන්සේට කිසිදක ආයාසකර දෙයක් නො වූ අතර ලියන මේසයක් ළඟ පුටුවක වාඩි වී පහසු ලෙස ලිවීමක් අවශ්‍ය නො වූ නාහිමියන් ලියූ පොත්පත් හා ලිපි ලේඛන සම්භාරය සඳහා ම භාවිත පිළිවෙත මෙය යි.

කවදත් නොඅඩු ගුරු භක්තියකින් පිරි නාහිමියන් දිනපතා තෙරුවන් නැමද සිය ඇදුරුවරයාණන්ගේ පින්තූරය ළඟ මල් වට්ටියක් තබා සුවඳ දුම් දී වැඳ **කමා** කරවා ගැනීම දෛනික චාරිත්‍රය යි.

දිනක් පොත් වෙළෙන්දෙක් උන්වහන්සේ පළ කර වූ පොත් ලබා ගැනීම සඳහා පැමිණියෙන් නා හිමි ඔහුට තමා ළඟ ඇති පොත් බලන්නට සැලැස්සූවේ ය. පොත් ගොඩක් තිබෙනු දුටු වෙළෙන්ද අවශ්‍ය පොත් තෝරාගෙන ඒවා මිලෙන් අඩක් වන ලෙස ඉල්ලූයේ ය. ''එහෙම කුණු කොල්ලෙට දෙන පොත් මා ළඟ නැතැ'' යි අල්මාරිය වසාදමමින් තරමක් සැර වදනින් කී කල අන්දුන් කුන්දුන් වූ වෙළෙන්ද නාහිමියන්ගෙන් සමු ගෙන අඩියට දෙකට පියවර තබා යන්නට ම ගියේ ය.

**හේවාවිතාරණ ත්‍රිපිටකග්‍රන්ථමාලාව** සඳහා සුද්ධ කරන පොත්වල අවසාන පිටපත එක්තරා පිරුවනක නාහිමි කෙනකු ලවා අනුමත කරවා ගතයුතු යැයි නීතියක් සම්මත කොටගෙන තිබිණ. ඒ අනුව **විදුරුපොළ** මාහිමි පළමුවෙන් ම කළ සංස්කරණය ඒ නාහිමිහට පෙන්වා සුද්ධිය අනුමත වියයුතු යයි කීයෙන් තමා කරන සුද්ධිවලට තමාගේ අනුමතය ඇනා අනුන්ගේ අනුමතයක් අවශ්‍ය නැතැයි කෙළින් ම ප්‍රකාශ කළහ. එයින් පසු උන් වහන්සේගේ සංස්කරණ වෙනත් කෙනෙකුට පෙන්වා සම්මතය ලබා ගත යුතු යැයි යන නීතිය බල නො පෑවේ ය.

**මුනිදස කුමාරණතුංග** මහතා විදුරුපොළ මා හිමියන්ගේ ශිෂ්‍යවරයෙකි. එතුමා හෝඩිය සකස් කිරීමට සංස්කරණ යෝජනා කීපයක් මාහිමියන්ගේ අනුමතිය සඳහා එවූ විට ''මහත්තයා, ඔය හෝඩිය ඔබත් මමත් දෙදෙනාම ඉගෙන ගත් එකයි. ඒ නිසා එය තිබෙන හැටියට තිබුණාවේ'' යි ප්‍රකාශ කළහ. කවදත් උන්වහන්සේ පුරාතන දෙයට ගරු කළහ. එපමණට ම නවීන දෙයට ද ගරු කළහ.

විදුරුපොළ මාහිමියන්ගේ නඩු තීන්දුවකට එරෙහි ව උසාවියක නඩු පවරන ලදී. එම නඩුවේ අද්වකාත්වරයෙක් මහනාහිමියන් හමුවට අවුත් මහා රහසක් කියන්නා සේ කනට කොඳුරමින් මෙන් කථා කරන්නට

පටන් ගත්තේ ය. ''මහත්තයා ටිකක් ඇත්වෙලා කථා කරනවා, ඔක්කෝටම ඉස්සෙල්ලා ඉගෙන ගන්නවා වැදගතකු සමඟ කථා කරන විධිය'' යි කීහ. අද්වකාත්ට තමා ආ කාර්ය ද අමතක විය. මොහොතක් නිහඬව සිටි ඔහු සමුගෙන යන්ට ගියේ ඉන් එහාට කර කියා ගත හැකි දෙයක් නැතුවයි.

කුලයෙන් තරමක් පහත් යැයි සම්මත ධනවත් නිවසක දානමය පින් කමක් සඳහා මහා සඟ පිරිසක් ද කැටුව උන්වහන්සේ වැඩම කළහ. දානය වළඳා සුළු විවේකයක් ගනිමින් කථා කර කර සිටින විට ගෙදර පසුපස මහා ඝෝරනාදුවක් ඇසිණ. පින්කමට ආ හේවිසිකරුවන් ගෙදර අයගෙන් කෑම කන්නට බැරිය කියා බෙදූ ආහාර ප්‍රතික්ෂේප කොට කරන අරගලයයි මේ. හිමින් සීරුවේ ඒ ස්ථානයට වැඩම කළ මහනාහිමියෝ හේවිසි කරුවන් අමතා, ''ඇ බොලව් ! මට මේ මිනිසුන්ගෙන් වළඳන්ට හොඳ නම්, තොපට කැවාම වන අවනම්බුව මොකක්ද'' යි ඇසූහ. අරගලය එයින් ම නිම විය.

හේවාවිතාරණ ග්‍රන්ථමාලාවේ ජාතක අට්ඨකථා සංස්කරණය පැව රුණේ විදුරුපොළ මාහිමියන්හට යි. මේ ගැන සාකච්ඡා කළ දවසේ ලංකාවේ සුප්‍රකට පඬි හිමිනමක් ජාතක අටුවාව ශුද්ධ කරන විට මහා භාරතය ද ආශ්‍රය කරමින් ශුද්ධ කළයුතු බවත්, දෙකේ සමාන තැන් සසඳා බැලියයුතු බවත් පළ කළහ. එයට පිළිතුරු දුන් මහනාහිමියන් ''ජාතක අටුවාව ශුද්ධ කිරීම මට බාරයි. ඒක මම කරන්නම්. මහා භාරතය ශුද්ධ කිරීම මට අයත් නො වේ. ඒක ඔබ වහන්සේ කරන්නැ'' යි කීහ. පඬි හිමියෝ නිරුත්තර වූහ.

විදුරුපොළ මහනාහිමියන් ලියූ ලිපි ලේඛනවල වෙනම පිටපත් ලිවීමක් නැත. පුවත්පත් ආදිය සඳහා ද උන්වහන්සේ ලියූ ලිපියක පිට පතක් වෙනම කෙනෙකු ලවා ලියවීමක් ද නැත. එසේ ම ඒවායේ කටුගෑම් අමුතු එක්කිරීම් ආදිය ද නො වේ. ලංකාවේ ප්‍රධාන පුවත්පත් කතුවරයකු වූ **පී. නිශ්ශංක** මහතා මෙසේ කියයි :

> ''....සිහින් අකුරෙන් කටුගාන්නේවත්, කපන්නේවත් නැතුව ලියා.... කාරණයට ගැලපෙන දෑ පමණක් ඇතුළත් කොට එවූ ලිපි වගේ අගය කළ යුතු ලිපි පුවත් පතකට ලැබෙන්නේ කලාතුරකිනි.''

මහනාහිමි ලක්ෂණ අකුරු ලිවීමට පුදුම ආශාවක් දැක් වූ අතර එයින් විශාල වින්දනයක්ද ලැබුවේ ය. වයෝවෘද්ධ අවසාන කාලයේ **ජාතකපාළිය** මුද්‍රණය වෙමින් තිබිය දී ශුද්ධිපත්‍ර කියවා සකස් කර දීමට සද්ධිවිහාරික පඬි හිමිනමක් ඉදිරිපත් වූ විට උන්වහන්සේ කීයේ, ''කොතරම් අමාරු වුවත් අකුරක් ලියන එක තරම් වෙනත් ප්‍රීතියක් මට නෑ. ඒ නිසා මම ම ශුද්ධි පත්‍රය සකස් කරන්නම්'' යනුවෙනි.

1919 නාහිමියෝ **පූනා ශාස්ත්‍රසම්මේලනයට** වැඩම කළ අවස්ථාවේ ඉන්දියාවේ සුප්‍රකට මහා පඬිවරයකු වූ **ගණපති ශාස්ත්‍රී**තුමා සමඟ සංස්කෘත භාෂාවෙන් කථා කරමින් සිටියෝය. මහනාහිමියන්ගේ සංස්කෘත භාෂා ඥානය ගැන පුදුමයට පත් ඒ මහා පඬිවරයා "ඔතරම් දක්ෂ සංස්කෘත උගතුන් ලංකාවේ සිටින බවක් මම දැන නො සිටියෙමි" යි කීයේ ය. ගත් කටට ම එයට පිළිතුරු දුන් නාහිමියෝ, "මට වඩා උසස් පඬිවරුන් ලංකාවේ තව බොහොම සිටිනවා" යැයි කීහ. "ඔබ වහන්සේ තමාට ලැබුණු ගෞරවය තම මාතෘභූමියට පිරිනැමීම උතුම් ගුණයකැ" යි කී **ගණපති ශාස්ත්‍රී** මහ පඬිවරයා මුව නොසෑහෙන පමණට මහනාහිමියනට ස්තුති කෙළේ ය.

පැරණි අටුවාවලට දෙස් කීම ගැන ඇති වූ විවාදයේ දී ප්‍රතිවාදීන් ඉදිරිපත් කළ දැ හරයක් නැති කෙසෙල් ගසක් මෙනැ යි නාහිමියෝ කියා පෑහ. මේ උපමාවට විරුද්ධ වූ ප්‍රතිවාදියෙක් කෙසෙල් ගසේ හරය කෙසෙල් කැන යයි කියමින් විරෝධය පළ කළේ ය. "කෙසෙල් ගසේ උපමාව තමාගේ නො වන බවත්, එය බුදුන්වහන්සේ **සච්චකයා**ගේ වාදවල නිස්සාරත්වය පෙන්වීමට යොදු ගත්තක් බවත්, දහසක් වාද උගත් සච්චකයා ඒ උපමා පිළිගත් නමුත් නවීන සච්චකයන්ට එය නො පෙනෙනවා නම් කරන්ට දෙයක් නැතැ" යි නාහිමියෝ පිළිතුරු දුන්හ.

**පූනා** මහා ශාස්ත්‍රසම්මේලනයට වැඩම කරන මහනාහිමියෝ දුම්රියෙන් යමින් දකුණු භාරතයේ **කෘෂ්ණා** නදියෙන් එතර ව **කෘෂ්ණා** දුම්රිය පොළට සැපත් වූහ. **දක්ෂිණ භාරතීය ශිලාලේඛන** ගැන ශාස්ත්‍රීය දේශනයක් කිරීම සඳහා එම සම්මේලනයටම යන **එච්. කෘෂ්ණා ශාස්ත්‍රී**තුමා ද එම දුම්රිය මැදිරියට ම නැග පිළිසඳර කථා කොට ශිලාලේඛන ගැන කථාව ආරම්භ කෙළේ ය. සම්පූර්ණ සාකච්ඡාව සංස්කෘත භාෂාවෙනි. ටික වේලාවකට පසු මහනාහිමියෝ :

> "මහතාණනි, කෘෂ්ණා නදියෙන් එතර ව කෘෂ්ණා දුම්රිය පොළට පැමිණි මට කෘෂ්ණා ශාස්ත්‍රී කෙනකු හමුවීම පුදුමයක් නො වේදැ" යි ඇසූහ. "හා ඒ මොන පුදුමයක් ද ? ඔබ වහන්සේ ශිලාලේඛන ගැන කථා කරමින් සිට ඔය සියුම් යෝගය ගැන සිතූ එක තමයි පුදුමය. ඔබ වහන්සේගේ බුද්ධිය නිතර ම විවේක සහිත යි යනු මගේ කල්පනාව" යි **කෘෂ්ණා ශාස්ත්‍රී**තුමා මහනාහිමියන්ගේ බුද්ධිපාටවය වර්ණනා කෙළේ ය.

**නුවරඑළියේ** ප්‍රසිද්ධ පාසැලක ලොකු උත්සවයක් සංවිධානය කෙරිණ. එම උත්සවයට ආගම් කීපයක ම පූජ්‍ය පක්ෂයට ආරාධනා කරන ලදී. විදුරුපොළ මහනාහිමියනට ද ආරාධනාවට ගිය සංවිධායකයකු කියා සිටියේ උත්සව අවස්ථාවේ පන්සිල් ගැනීම ආදියක් නො කෙරෙන බවයි. එවිට උන්වහන්සේ :

"මේ බෞද්ධ රටේ, බෞද්ධ පළාතේ උත්සවයකට ගොස් භික්ෂු නමකට පන්සිල් දීමටවත් අවස්ථාවක් නැත්නම්, ඒ උත්සවයට යන එකේ තේරුම මොකක් ද ? ඒක නිසා මට ඔය ආරාධනාව පිළිගන්න බෑ" යි කීහ.

මඳක් කල්පනා කළ සංවිධායකයා වැඳ සමුගෙන ආපසු ගියේ මහා නාහිමියන්ගේ ඍජු ප්‍රකාශය ගැන ගැඹුරින් කල්පනා කරමිනි.

1919 ජූලි 28 දින පූනා මහා ශාස්ත්‍රසම්මේලනයට ගිය ගමන ගැන ලියන ලද සංචාරක ලිපි පෙළ අරඹමින් :

"මෙවකට මා උපන් සමසාළිස්වන වර්ෂය පිරී තිබේ. පසුගිය සතළිස් අවුරුද්ද තුළ මා ඉගෙණගත් සියල්ල ප්‍රමාණකර බලතොත් අබළුවකින් මැන්න හැකි තරම් ය. නුමුත් මට ඉගෙණ ගන්නට ඉතිරිව තිබෙන කොටස මැනීමට මහාසමුද්‍ර කුහරය හැර සෑහෙන භාජනයක් නැත."

"මා නොඋගත් දෙයක් නැතැයි මම කිසිවිටකත් නො සිතමි. එහෙයින් මා නොදත් ඉතා සුළු දෙයක් වුවත් නොදන්නා බව කියන්නට සිදුවීම ද මට ලජ්ජාවට කරුණක් නොවේ."

විදුරුපොළ මාහිමියන්ගේ නිහතමානී මහඟු ගුණයට මේ අයෝමය සාධකයෙකි.

මහානායක මාහිමියන් දිනපතා අලුයම අවදි වී සයනගතව ම සිටිමින් බුදුගුණ ගාථා කීපයක් සජ්ඣායනා කොට මෝර පරිත්ත ආදී ආරක්ෂක පිරිත් සූත්‍රයක් හඬ නගා කියනු ලැබේ. රාත්‍රියේ සැතපීමට අසුන්ගත වූ විට ද සතිපට්ඨාන සූත්‍රය සජ්ඣායනය කොට මෙත්තා භාවනාදී භාවනා පාඨයක් කියා තුනුරුවන් සිහිකොට සතිසම්පජඤ්ඤයෙන් යුක්තව සැතපීම උන්වහන්සේගේ දෛනික පිළිවෙතයි.

සිංහල අලුත් අවුරුදු දිනය මහානායක හිමිපාණන් නියත වැඩ පිළිවෙළක් ගෙනයන දිනයකි. එදින විශේෂ කිරි ආහාරයක් පිළියෙළ කොට පළමු කොට එයින් බුද්ධපූජාව පවත්වා සදේවක ලෝකයාට පින් පමුණුවා විහාරස්ථානයේ නේවාසික සියලූ දෙනාට ද සියතින් ම එම කිරිබතින් සංග්‍රහ කරනු ලැබේ. අනතුරුව ඒ හැමදෙනාට ම තෑගි බෝග දී සතුටු කරවීම උන්වහන්සේගේ අවුරුදු චාරිත්‍රවිධියෙහි එක අංගයකි.

ලංකාවේ ප්‍රසිද්ධ පුවත් පතකින් විවාදයක් කරගෙන ගිය අවස්ථාවකි ඒ. එම අවස්ථාවේ ප්‍රතිවාදීපක්ෂයේ ලේඛකයෙක් නායක හාමුදුරුවන්හට "නායක හාමුදුරුවන්ගේ වෘද්ධබව සලකා අප නිසොල්මන් වෙනවා" යි සානුකම්පික උපහාසයක් එල්ල කෙළේ ය. නාහිමියෝ එයට පිළිතුරු

දෙමින් ''මගේ වෘද්ධබව සලකා නිසොල්මන් වනුවාට වඩා ඔබ වහන්සේගේ බාල බව සලකා නිසොල්මන් වීම හොඳ නොවේද'' යි එබඳුම ව්‍යංගාර්ථවත් උපහාසයක් එල්ල කළෝ ය.

අප රටේ මහත් ආන්දෝලනයක් ඇති කළ තාපස ව්‍යාපාරය නොයෙක් පළාත්වල පැතිරෙමින් පැවති අවධියෙහි එම ව්‍යාපාරයට පටහැනිව මහා නාහිමියන්ගේ සද්ධිවිහාරික හිමිනමක් ප්‍රසිද්ධ පුවත් පතකට ලිපියක් සැපයූයේ ය. ඒ ගැන එම ලේඛක හිමියන් අමතා ''මේ ස්ථාවර සම්බුද්ධ ශාසනයට විරුද්ධ ව නැගී එන ඔය කෙහෙල්මල් ව්‍යාපාරවලට වැඩි ආයුෂ නැත. ඒ නිසා ඕවාට කලබල වී ලියුම් ලියන්නට වුවමනා නැතැ'' යි මහනාහිමියෝ ප්‍රකාශ කළහ. උන්වහන්සේ කී පරිද්දෙන් ම වැඩි කලක් යන්නට මත්තෙන් සම්බුද්ධශාසනවිරෝධී එම ව්‍යාපාරය රට තුළින් අතුගෑවී ගියේ ය. උන්වහන්සේ එද ප්‍රකාශ කළ දෙය පසුව සත්‍යයක් ම විය.

සුගැඹුරු කාව්‍ය නිර්මාණ ඇතුළු විශිෂ්ට පන්තියේ ග්‍රන්ථ සත්විස්සක් නිර්මාණය කළ නාහිමියන්ගේ ජනප්‍රිය විෂය වූයේ ද පොතපත ලිවීමයි. තම ප්‍රබල දායක මහතකුගේ නිවසක සඟසතු මහදනක් යෙදී තිබිණ. ඒ සඳහා විශාල භික්ෂු පිරිසක් ද විහාරස්ථානයට රැස් වී සිටියහ. ගෙඩිය ගසන හඬත් සමඟ හැමදෙනා වහන්සේ ම දනයට වැඩමවීමට ලෑස්ති වූහ. මහනාහිමියන් සූදනම් නො වන බව දුටු තෙරනමක් :

> ''ඇයි මහානායක හාමුදුරුවන් දනෙට වඩින්නේ නැද්ද ?''
> යි විචාළහ.

> ''දනෙට වඩින එක හැම කෙනකුට ම පුළුවන් එකක්. පොත් ලිවීම හැමෝට ම බැනෙ. මම මේ ලියාගෙන යන පොත ලියන්නම්. තමුසෙලා දනෙට වැඩමවන්ට ඕනැ'' යි පැවසූහ.

එක්තරා මහා පිරුවනක ගුරුවර පඬිහිමිනමක් පන්තියේ දී ගාථා පොතක් උගන්වමින් සිට :

> ''වීදුරුපොළ නායක හාමුදුරුවෝ පොත් නම් ලියනවා. ඔක්කොම යල්පැන ගිය ඒවා. අද ඉන්න ශිෂ්‍යයන්ට ඒවායින් ඇති ප්‍රයෝජනයක් නැ'' යි කීහ.

පන්තියේ සිටි බුද්ධිමත් ශිෂ්‍යයෙක් :

> ''පණ්ඩිත හාමුදුරුවන්ගෙ කථාව ඇත්ත. වීදුරුපොළ නායක හාමුදුරුවන්ගෙ පොත්වගෙ පොත් ලියන්ට හොඳ නුවණක්, විචාර බුද්ධියක් තියෙන්ට ඕනැ. එහෙම නැති අපේ පිරිවෙනේ ඉන්න ගුරුවරුන් ලියන්නෙම සන්න, ගැටපද, විස්තර, විවරණ විතරයිනෙ''

යි කීයේ ය. ගුරුහිමියන් හට උත්තර නැති විය.

මහනාහිමියන් සුපුරුදු පරිදි බද්ධපර්යංකව සිය දීග්සභලා පුටුවෙ වැඩ සිටින වෙලාවක කුඩා ළමයෙක් එතැනට පැමිණ උන්වහන්සේට මෙසේ කීයේ ය :

"තමුසෙ කම්මැලිකමට ඔහොම ඉඳගෙන ඉන්නේ නැතුව එනව යන්න බෝලගහන්න"

එවිට කවර දිනකවත් නැති තරම් ලොකුම හිනාවක් පළකළ මාහිමියෝ කුඩා දරුවා ළඟට ගෙන තවතවත් සුරතල් කරන්නට වූහ.

නුවරඑළියට අධික ලෙස සීත වකවනුවක දිනක් හුහක් වයසක මහල්ලෙක් උන්වහන්සේ ළඟට පැමිණියේ ය. මහානාහිමි ඔහුගෙන් තොරතුරු විමසන්නට විය :

"ලොකු උන්නැහේ කොහේ ඉඳලා ද ආවෙ ?"

"මම ආවේ බොහෝම දුර ගමක ඉඳලයි. අදට මෙහෙ නවතින්න නවාතැනක් ඉල්ලා ගන්නයි ආවේ."

"මෙහෙ බොහොම සීතලයි. ඔය වගෙ වයසක උදවියට මෙහෙ සීතල උහුලන්න බැහැ. ඒ නිසා ගමට ම යන්න."

මෙයින් කිපුණු මහල්ලා උන්වහන්සේට දැඩි ලෙස බැණ දෙඩන්නට විය. මහනාහිමියෝ ඔහු දෙස බලාගෙන සිනාසෙන්නට පටන් ගත්තා විනා කිසිවක් නො කීහ.

# 12 පරිච්ඡේදය

## සමකාලීන වියතුන්

ගත වූ සියවසේ අග කාර්තුවේත්, මේ සියවසේ මුල් භාගයේත්, ලක්දිව විසූ කීර්තිමත් වියතුන් රැසක් විදුරුපොළ මාහිමියන් හා ධර්මශාස්ත්‍රීය වූ ද අධ්‍යාපනික වූ ද සබඳතාවලින් බැඳී කල් ගතකොට ඇත. **හික්කඩුවේ ශ්‍රී සුමංගල** නාහිමියන් වහන්සේ ඔවුනතර ප්‍රධානත්වයෙන් ගිනිය යුත්තෝ ය. විදුරුපොළ මාහිමියන් කඩින් කඩ රත්මලානේ **පරමධම්මචේතිය** පිරුවන්හි හා **හුණුපිටියේ ගංගාරාමයේ** වාසය කළ අවස්ථාවල හික්කඩුවේ නාහිමියන් හමුවට **විද්‍යෝදය** පිරුවනට පැමිණියේ ධර්මශාස්ත්‍ර විෂයෙහි විවිධ ගැටලු නිරාකරණය කර ගැනීමට මෙන් ම වැදගත් අවවාදනුශාසනා ලැබ ගැනීම ද අරමුණු කරගෙනයි. උන්වහන්සේ හමු වී වැදගත් උපදෙස් ලබා ගනිමින් වැඳපුද ගැනීමට ලැබීම පවා විදුරුපොළ මාහිමියන් සලකන්නේ මහත් භාග්‍යයක් කොටයි.

ක්‍රි.ව. 1905 අගෝස්තු 29 වැනි දින දතමින් හික්කඩුවේ නාහිමියන් එවූ ලිපියකින් පෙනෙන්නේ **විදුරුපොළ** හිමියන්ගේ බුද්ධි කෞශල්‍යය කෙරෙහි එම නාහිමියන් තබා තිබූ විශ්වාසය යි. නිතර ඇසුරු කිරීමෙන් වැඩි දියුණු කරගත් ළෙන්ගතු බව හා අනාගත අභිවෘද්ධිකාමිත්වය ද නොඑක්වර සැපයූ ලියුම් කියුම්වලින් හා හමුවූ අවස්ථාවල දුන් අවවාද අනුශාසනා ආදියෙන් ද පැහැදිලි වේ. වස්කඩුවේ රාජගුරු ශ්‍රී **සුභූති** නාහිමියන් ද විදුරුපොළ මාහිමියන්ගේ පාණ්ඩිත්‍යය හා ශික්ෂාකාමීත්වය කෙරෙහි පැහැදී සිටි මහතෙරනමකි. විශේෂයෙන් පාළි විෂයෙහි විශාරද වියතකු වූ වස්කඩුවේ නාහිමියන් සමඟ කළ නොඑක් ධර්මවිනය හා භාෂාශාස්ත්‍රීය සාකච්ඡා නිසා මහදර්ථයක් සැලසිණ. විදුරුපොළ හිමියන් සිය **අභිනව සාසනවංසයෙහි** මුද්‍රිත පිටපත පිළිගන්වා ඇත්තේ ද ශ්‍රී **සුභූති** නාහිමියනටයි. ඒ උන්වහන්සේ සමඟ ඇතිකර ගත් සමාශ්‍රයට හා ළෙන්ගතු බවටත්, විශාරද වියත් බවටත්, උපහාරයක් වශයෙනි.

අතිපූජ්‍ය අඹන්වැල්ලේ ශ්‍රී **සුමංගල** මල්වතු පාර්ශ්වයේ මහානායක ස්වාමීන්ද්‍රයන් ද විදුරුපොළ මාහිමියන් ගෞරව සම්ප්‍රයුක්ත වැ ඇසුරු කළ වියත් මහතෙර නමකි. **පූනා ශාස්ත්‍රසම්මේලනයට** වැඩම කරන අවස්ථාවේ

ඉතා හරසරින් පිළිගෙන සිය අරමෙහි නවත්වා ගෙන, දළද වහන්සේගේ ද ආශීර්වාද දෙවා ඉන්දියාව බලා යාමට සැලැස්සුවේ සාතිශය හෘදයග්‍රාහීත් වයකිනි. තමා රචනා කළ හැම ග්‍රන්ථයක් ම අඹන්වැල්ලේ මාහිමියනට පිරිනමා ඇත්තේ උන්වහන්සේ කෙරෙහි ඇති භක්තියත්, කෘතඥතාවත් ප්‍රකට කිරීම සඳහා ය.

විදුරුපොළ හිමිපාණන් කොළඹ කල් ගෙවූ අවස්ථාවල උන්වහන්සේගේ සියලු සැපපහසුකම් සලසා දීමෙන් ද විභාග සඳහා හැදෑරීමට අවශ්‍ය විවේක පහසුකම් සලසා දීමෙන් ද අනුග්‍රහ දක් වූ හුණුපිටියේ ගංගාරාමාධිපති දෙවුන්දර ජිනරතන නාහිමියන්ගේ ඇසුර හැම අතින් ම වැඩදයී විය. විදුරු පොළ හිමියන් එය හැමවිටක ම සිහිපත් කෙළේ දඩි කෘතඥතා පූර්වක සගෞරවාදර සිතිනි. ඒ හිමිපාණන්ගේ විවිධ ධර්මශාස්ත්‍රීය ව්‍යාපාරයන් සඳහා ද මුන්වහන්සේගෙන් ලද අනුග්‍රහය විශාල ය. විදේශවලින් පවා පොත් ලබා දීමෙන් පෙනෙන්නේ ජිනරතන නාහිමියන් උන්වහන්සේ කෙරෙහි දක්වා තිබුණු පිළිගැනීම හා ළෙන්ගතු බවයි.

විදුරුපොළ මාහිමියන්ගේ සමකාලීන ආශ්‍රිතයාණ කෙනෙකුන් හැටියට සම්භක්ත මිත්‍ර මහතෙරපාණ කෙනෙකි, පැළෑණේ ශ්‍රී වජ්‍රඥාන මහානායක හිමියෝ. විදුරුපොළ මාහිමියන්ගේ පොතපත ගැන දඩි සැලකිල්ලක් හා පිළිගැනීමක් තිබුණු මහා වියතෙකි, උන්වහන්සේ. ව්‍යාකරණසද්දසින්ධු කෝෂ ග්‍රන්ථය නිර්මාණය කෙළේත් පැළෑණේ මාහිමියන්ගේ අයැදුම පරිදියි. එවකට හමු වූ හැම විටක ම සුගැඹුරු ධර්මශාස්ත්‍රීය කරුණු ගැන සාකච්ඡා කිරීම දෙදෙනා වහන්සේගේ පුරුද්දයි. තමාගෙන් සිදු වූ සුළු අත්වැරැද්දක් ගැන පැළෑණේ මාහිමියන් සමාව අයැදිමින් ලියා ඇති දීර්ඝ ලිපියකින් (1936.03.12) පෙනෙන්නේ විදුරුපොළ මාහිමියන් කෙරෙහි තිබුණු දෘඪතම ගෞරව සම්ප්‍රයුක්ත බවයි.

කොළඹ විශ්වවිද්‍යාලය කොලීජියේ එද ආචාර්යවරයකු ව සිටි රඹුක් වැල්ලේ ශ්‍රී සිද්ධාර්ථ හිමියන් සිය ආචාර්යවරයකු සේ අතිමහත් ගෞරව යෙන් ආශ්‍රය කළ කෙනෙකි, විදුරුපොළ මාහිමියන් වහන්සේ. නිතර නිතර නුවරඑළියට පැමිණ විවේක ගනිමින් ද, ශාස්ත්‍රීය ලේඛනාදියෙහි යෙදෙමින් ද, භාෂා ශාස්ත්‍රාදිය ගැන සාකච්ඡා පවත්වමින් හා ඒවා ගැන උපදෙස් ගනිමින් ද ක්‍රියා කළ සිද්ධාර්ථ හිමියන් තමන්හට මතුවන කවර ගැටලුවක් වුවත් විසඳා ගැනීමට විදුරුපොළ මාහිමියන් කරා පැමිණීම සිරිතක් විය.

තමාට පාරම්පරික හිමිකම් ඇති භාණ්ඩයක් ලබාදීමට ක්‍රියා කිරීම ගැන මුව නොසැහෙන සේ ස්තුති කරමින් ඒ හිමියන් සැපයූ ලිපියක් (1941.02.01) ද වෙයි. විදුරුපොළ මාහිමියන් සිංහල වන්නම් හා තාල ශාස්ත්‍රය ගැන දක් වූ සැලකිල්ලත් රඹුක්වැල්ලේ හිමියන්ගේ ආශ්‍රය වැඩී දියුණු වීමට අතිරේක හේතුවක් විය.

සමකාලීන වියතකු හා පඬිවරයකු වශයෙන් නිතර විදුරුපොළ මාහිමියන් හමු වූ පණ්ඩිත කොත්මලේ **ධම්මානන්ද** හිමියන් උන්වහන්සේ කෙරෙහි දැඩිතර භක්තියකින් ආශ්‍රය කළ මහා තෙරනමකි. අම්බලංගොඩ **දේවානන්ද**, පාණදුරේ **ඤාණවිමලතිස්ස** යන වියත් මහා තෙරුන් වහන්සේලා ද විදුරුපොළ මාහිමියන් ආශ්‍රය කළ උගත්තු අතර වෙති.

නූතන ආගමික ප්‍රබෝධයේ හා ජාතික ප්‍රබෝධයේ මහා බලවේගය සේ සැලකිය හැකි ශ්‍රීමත් **අනගාරික ධර්මපාලතුමා** නොයෙක් නොයෙක් අංශ මගින් විදුරුපොළ මාහිමියන් හා සම්බන්ධ වැ සිටියේ ය. ගත වූ සියවසේ අග භාගයේ 1892 දී එතුමා වැලිමඩට සැපත් අවස්ථාවෙ පිළිගැනීම සඳහා රචිත පාළි සිංහල පද්‍යාවලිය රචනා කෙළේ එවක වන විට 12 වියේ සිටි **විදුරුපොළ** කුඩා සාමණේරයන් වහන්සේ ය. පළමු වරට එතුමාගේ පැහැදීම ඇති වූයේ ඒ පුවත ඇසීමෙනි. එතැන් පටන් උන්වහන්සේ ලියූ පොතපත ලිපි ලේඛන හා ලැබූ උසස් අධ්‍යාපනය යන මේ සියල්ල ගැන **අනගාරික ධර්මපාලතුමා**ගේ ප්‍රසාදය දිනෙන් දින වැඩි දියුණු විය. ලියන පොත්පත් සඳහා නොයෙක් වර මිල මුදල් පරිත්‍යාගයන් ද කෙළේ ය. **ව්‍යාකරණසද්දසින්ධු** ප්‍රථම භාගය මුද්‍රණයෙන් එළි දක්වීමට හැකි වූයේ ද එබඳු මුදල් ප්‍රදානයක් නිසා ය. **මහාකස්සපචරිතය** පිළිගත් එතුමා එය නාගර අකුරින් තම වියදමින් මුද්‍රණය කොට ඉන්දියාවේ ප්‍රසිද්ධ කර හැරීමට ද සූදානම් විය.

ඉන්දියාවේ බුදුසසුන දියුණු කිරීම සඳහා නොයෙක් වර **විදුරුපොළ** මහා නාහිමියන්ගෙන් උපදෙස් පැතී ය. ලංකාවේ ජාතික ව්‍යාපාරයේ දී උන්වහන්සේ සමඟ සාකච්ඡා කොට යොදගත් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කොට ඇත. තමාට ඉඩ ලැබුණු හැම අවස්ථාවක ම **බඹරකැලේ** විහාරස්ථානයට ගොස් මහනාහිමියන් බැහැ දැකීම ද එතුමාගේ සිරිත විය. උන් වහන්සේ වැඩ සිටි ශාලාවෙන් වම් පැත්තේ ඇති කුඩා මල් උයන ද **ධර්මපාලතුමා**ගේ යෝජනාවක් අනුව ඇති කරවන ලද්දකි.

1919 නොවැම්බර 14 දින මහා නාහිමියන්ට එවූ ලිපියකින් **පූනා ශාස්ත්‍ර සම්මේලනයට** සැපත් අවස්ථාවේ **කල්කටාවේ** ම වැඩ සිටීමට ආරාධනා කර ඇත. එහි වැඩිදුරටත් පැවසෙන්නේ ඉන්දියාවේ බුදුසමය පැතිරවීමේ කටයුතු ගැන ඒ ගමනේ දී සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බවයි. ඉන්දියාවේ බෞද්ධ කටයුතු දියුණු කර ගැනීම සඳහා අවුම වශයෙන් හය මසක් වත් නැවතී සිටින ලෙසට එතුමා නිතර කළ ආරාධනයකි. එහෙත්, උන්වහන්සේට පැවරී තිබුණු කාර්යභාරය එබන්දකට විවේකයක් ලබා දුන් බවක් පෙනෙන්නට නැත. **හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථමාලාවේ** ග්‍රන්ථ ඉතා වැඩි ගණනක් සකස් කිරීමටත්, එම කටයුතු විෂයයෙහි වැඩි වශයෙන් ව්‍යාපෘත වීමටත්, හේතු වූයේ ද **ධර්මපාලතුමා**ගේ හා මහනාහිමියන්ගේ තිබුණු ඒ දැඩි සම්බන්ධකම යි.

මහානායක හිමියන් ඇසුරු කළ සැදැහැවත් බැතිමත් වියතුන් අතර **පී. බී. අලවතුගොඩ වලපනේ රටේ මහත්මයා** බෙහෙවින් ආධාරෝපකාරී ව සිටි කෙනෙකි. එතුමා උන්වහන්සේට අධාරෝපකාරී වූවන් අතර පළමු වැන්නා හැටියට හඳුන්වා තිබේ. නාහිමියන්ගේ **සුගතාලංකාර** නම් පාළි කාව්‍යයට **හැඳින්වීම** ලියා ඇත්තේ ද එම රටේ මහතා විසිනි. පිළිවෙළින් නාහිමියන්ගේ ශාස්ත්‍රීය සේවය විස්තර කොට ඇති එහි උන්වහන්සේ ලබා ඇති උසස්ම අධ්‍යාපන තත්ත්වය ගැන වර්ණනාමුඛයෙන් හඳුන්වා තිබේ. ශ්‍රේෂ්ඨතම පඬිවරයකු හැටියට උන්වහන්සේගේ අගය වඩාමත් එහි වර්ණනා කොට ඇත. මෙතුමාගේ නිතර ආශ්‍රය නිසා ශාසනික දියුණුවට පිටුවහල් වූ කාරණා රාශියක් ම සාර්ථක විය.

මහානාහිමියන් කෙරෙහි අධික භක්තියකින් යුක්ත වැ සිටි රටේ මහත් මයා නිතර නිතර උන්වහන්සේ හමු වී ධර්මානුශාසනා ලබා ගැනීම පුරුද්දක් කොටගෙන තිබිණ.

**මොරපේ** දේවාලයේ බස්නායක නිලමේ තැන්පත් **පී. බී. රත්නායක මහතා** ද මහ නාහිමියන් ළඟින් ආශ්‍රය කළ සැදැහැබර ගුණවතෙකි. තමාට ආධාරකාරි වූ දෙවැන්නා හැටියට නාහිමියන් හඳුන්වා ඇත්තේ ඒ මහතා යි. **නුවරඑළිය** ප්‍රදේශයේ ආගමික හා සාමාජික මෙහෙවර රාශියක් සපුරා ලූ ඒ මහතා **ශ්‍රී සද්ධර්මාධාර** සමාගමේ සභාපති හැටියට ද විශාල සේවාවක් කොට තිබේ. එබඳු ආගමික හා සාමාජික කාර්යභාරයක් සම්පූර්ණ කරන්නට ඒ මහතාට ඉඩකඩ ලැබුණේ මහානායක හිමියන්ගේ ආසන්න ආශ්‍රය නිසා ය. තම තමන්ගේ ආගමික දිවිපෙවෙත වඩාත් පලදායී වීමට මහානායක හාමුදුරුවන් වැනි නැණ නුවණින් හා ගුණයෙන් පිරි උතුමකු ආශ්‍රයට ලැබීම ම ඒ මහත්වරුන් සැලකුවේ අතිමහත් වාසනාවක් ලෙසට යි.

සීලයෙන් ගුණයෙන් හා පාණ්ඩිත්‍යයෙන් කීර්තිධර වැ සිටි නාහිමියන් කෙරෙහි දෘඪ භක්තිමතකු ලෙස ක්‍රියා කළ **සර් ඩී. බී. ජයතිලක** මැතිතුමා උන්වහන්සේගේ ධර්මශාස්ත්‍රීය සේවය උපරිම මට්ටමකින් අගය කළ කෙනෙකි. **සිංහල ශබ්දකෝෂයේ** කටයුතුවල දී ඇතිවුණු ගැටලු නිරාකරණය කර ගැනීමෙහි ලා නාහිමියන්ගේ සහාය එතුමාට පිටුවහල් විය. **ඉංග්‍රීසි පාළි ශබ්දකෝෂය** ගැන ද විශාල පැහැදීමක් හා බලාපොරොත්තුවක් ඇතිව සිටි කෙනෙකි. ඒ ශබ්දකෝෂය සඳහා අවශ්‍ය වටිනා කෝෂග්‍රන්ථ පවා ඉන්දියාවෙන් ලබා දීමටත් පමණක් නොව එයට සාරගර්භ ප්‍රස්තාවනාවක් පවා ලියන්නටත් සූදානම් ව සිටියේ ය. එතුමාගේ අනපේක්ෂිත අභාවයෙන් ඒ සියල්ල ඇණ සිටියේ ය. 1936 **පංචවිංශතිපූර්ති** උත්සවයේ **දී ශ්‍රීමත් ජයතිලක** මහතා **මහා** නාහිමියන් ගැන ප්‍රකාශ කළ අදහස් අදත් වෘද්ධතම බොහෝ දෙනාගේ මතකයේ රැඳී ඇත.

හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථ ප්‍රකාශනමණ්ඩලයේ එවක අධ්‍යක්ෂ වශයෙන් ක්‍රියා කළ **වෛද්‍යාචාර්ය සී.ඒ. හේවාවිතාරණ** මැතිතුමා ද නැණවත්

වත් බෞද්ධයකු හැටියට මහනාහිමියන් හා ආසන්න සබඳතාවක් දක් වූ මහත්මයෙකි. උන්වහන්සේ කෙරෙහි විශාල පිළිගැනීමක් තිබුණු ඒ මහතා **හේවාවිතාරණ** ත්‍රිපිටක පොත් වැඩි ගණනක් උන්වහන්සේ ලවා සංස්කරණය කරවා ගන්නට ලොකු ඕනෑකමක් දක්වී ය. **සාරත්ථප්පකාසිනිය** උන් වහන්සේ ලවා ම සංස්කරණය කරවා ගන්නට නිතර නිතර ලියුම් කියුම් ලියා කළ ඇවටිල්ලෙන් ම එය ඔප්පු වේ. එපමණක් නොව **ත්‍රිපිටක මණ්ඩලයේ** කටයුතු සඳහා උන්වහන්සේගේ උපදෙස් එතුමා නිතර නිතර බලාපොරොත්තු විය.

එතුමාත් මහනාහිමියනුත් අතර තිබුණු සම්බන්ධතාව තේරුම් ගැනීමට හොඳම සාධකයකි, මහානායක හිමියන් විසින් රචනා කරන ලදුව 1926 අප්‍රේල් 27 වැනි දින **සිංහල බෞද්ධයා** පත්‍රයේ පළ වූ **''වෛද්‍යාචාර්ය ශ්‍රී හේවාවිතාරණ ගුණානුස්මරණ''** නම් ශ්ලෝක පන්තිය. එයට ශ්ලෝක 12 ක් ඇතුළත්. ඒවායින් කීපයකි මේ :

'' විබුධගණ රචිත නිජ රුචිර ගුණ ගා යන
නිඛිල ජන විහිත ශුචි සුචරිතොපා යන
කුමති කෘත ජනතාප දුර්නීති වා රණ
විජය සුර සදසි හො හේවාවිතා රණ

ස්වජනීධෘත මනුජහිත භූලොක ම ණ්ඩන
සුගතවර වචන කෘත නිජ පාපඛ ණ්ඩන
සුමති මහණීය සුචරිත ගුණපූ රණ
විජය සුරසදසි හො හේවාවිතා රණ

සුහෘදමති විමලමතී හේවාවිතාරණං
ප්‍රතිහෘදය ගතසදය තත්ත්ව විස්තාරණම්,
සරස මෘදු මධුරපද වින්‍යාස නිර්මිතං
විධුර කවිරචිතමිදමත්‍යුක්ති වර්ජිතම්.

සුකෘත නරලොකහිතසාත්කෘත්‍ය ජාතං
නිඛිල කවිභාරතී රචිත ගුණගීතම්,
ජගති හේවාවිතාරණ නාමධෙයං
ජයති සිංහලබෞද්ධ ජනභාගධෙයම්.''

තමන්වහන්සේ ආශ්‍රය කළ බැතිමත් හොඳ බෞද්ධයෙකු වූ එතුමාගේ අභාවය නිසා මහනාහිමියෝ හදපත්ලෙන් ම සංවේගයට පත්වූහ. එම සංවේගය පිටාර ගලායාමක් බඳුයි ඉහත සඳහන් ශ්ලෝක පන්තිය.

පිරිපුන් උගතකු වශයෙන්, අධීන විචාරකයකු වශයෙන් හා භාෂා තත්වඥයකු වශයෙන් සිටි **ජුලියස් ද ලැනරෝල්** මහතා ද මහනාහිමියන් ළඟින් ඇසුරු කළ වියතාණ කෙනෙකි. එතුමාගේ ආශ්‍රය ප්‍රධාන වශයෙන්

පැවැත්තේ ශාස්ත්‍රීය මට්ටමෙනි. **සිංහල ශබ්දකෝෂයේ** කර්තෘ වශයෙන් එතුමා එහි කටයුතු සඳහා නිතර නිතර මහනාහිමියන්ගේ උපදෙස් පැතී ය. එම කාර්යයෙහි දී මතුවන ගැටලු නිරාකරණය කර ගැනීමට උන්වහන්සේගේ සහාය නිතර ලබා ගත්තේ ය. 1936 **පංචවිංශති පූර්ති** මහොත්සවය නිමිත්තෙන් එතුමා සපයා ඇති ලිපියෙන් පමණක් වුවත් උන්වහන්සේගේ සීලය, ගුණය, පාණ්ඩිත්‍යයත් මැන ගෙන සිටි ආකාරය තේරුම් ගත හැකි ය.

මහාචාර්ය **ජී. පී. මලලසේකර** මහතා මහනාහිමියන් ඇසුරු කෙළේ, ගෝලයකු, ගුරුවරයකු ආශ්‍රය කරන විලාසයෙන් විනා උගතකු, උගතකු ඇසුරු කරන මට්ටමෙන් නො වේ. මහනාහිමියනට එතුමා ලියන ලිපි පවා අවසන් කොට ඇත්තේ මේ වගට, කීකරු මලලසේකර යන ලෙසිනි. උන්වහන්සේගේ විශාරද පාණ්ඩිත්‍යය කෙරෙහි එතුමා තුළ විශාල පිළිගැනීමක් තිබිණ. **කමලාඤ්ජලි** ඉංග්‍රීසි පරිවර්තනයටත්, **ඉංග්‍රීසි පාළි ශබ්දකෝෂයටත්** ලියා ඇති ප්‍රස්තාවනාවලින්[1] වුවද මහනාහිමියන් කෙරෙහි එතුමා තුළ තිබුණු භක්තියේ ස්වරූපය වටහා ගත හැකි ය.

මේ සියවසේ ලංකාවේ විසූ විශාරද පඬිවරුන් අතර මුල් පෙළ ගොබ වන්නෙකි, **මුනිදාස කුමාරණතුංග** මහත්මා. එතුමාගේ ජීවිතය කැපවූයේ සිංහල භාෂාවත්, සාහිත්‍යයත් වෙනුවෙනි. එසේ ම සිංහල ජාතියේ අනන්‍යතාව ගොඩ නැගීම සඳහා ද එතුමා ලියූ කියූ දෑ මහා සම්භාරයකි. එතුමාගේ උගත්කම ගැන කථා කරන විට ආචාර්යවරයා ලෙස පිළිගෙන සිටියා වූ ද, විශේෂයෙන් පාළි සංස්කෘත භාෂා ඉගෙනීමට උපකාරවත් වූ ද විදුරුපොළ මාහිමියන්ගේ ශ්‍රී නාමය මුලට මැ වැටෙයි.

**මුනිදාස කුමාරණතුංගයන්** මහනාහිමියන් වෙතින් පසු කාලයේ දැනුම ලබාගත්තේ තැපැල් මගින් ගැටලු විසඳා ගැනීමෙනි. එතුමා මහනාහිමියන්ට ලියා ඇති ලියුම් රාශියෙන් පෙනෙන වැදගත් ම දෙයක් නම් තිබුණු ගුරු භක්තියයි. ඒ ලිපි රාශිය අතරින් එක ලිපියක එන අදහසකි මේ :

> ''ශිෂ්‍යයකුගේ මෙබඳු කාර්යයෙක දී ආචාර්‍ය්‍යවරයනට කරදර පැමිණෙනුයේ බැරි මැ තැනක් වූ විට ය. එහෙයින් මගේ මේ ආයාචනය ඔබ වහන්සේගේ කරුණාමහිමයෙන් අමොඝවන්නේ මැ ය යනු මගේ විශ්වාසය යි.
>
> නිතර නිතර ලියුම් ගනුදෙනුවක් නැත ද **මහාකස්සපචරිතාදිය** බැලීමෙන් ''මේ මාගේ ආචාර්‍ය්‍යයන් වහන්සේගේ චාතුර්යයට සුදුසු වූ ම කෘතියෙකැ'' යි යම් බඳු ප්‍රීතියක් ලැබිය හැකි ද එය සම්පූර්ණයෙන් විඳියෙමි.''

---

1. **විස්තර සඳහා මෙහි viii වැනි පරිච්ඡේදය කියවන්න.**

**කුමාරණතුංගයන්** ලියූ ග්‍රන්ථ රාශියෙන් හැම විටම පළමු ම පිටපත ගුරු පඬුරු වශයෙන් මහනාහිමියනට පූජා කිරීම නියත චාරිත්‍රයක් බවට පත් වී තිබිණ.[1]

හිතෛෂී සැදැහැවත් උගත් දායකයකු හැටියට මහනාහිමියන්ට ආධාර කාරී වැ සිටි **රත්නපුර කච්චේරියේ** මුදලි තැන්පත් **ඩී. වනසුන්දර** මහත්මා නාහිමියන්ගේ ශ්‍රේෂ්ඨත්වය වටහාගෙන සිටි කෙනෙකි. මහනාහිමියන්ගේ විවිධ ධර්මශාස්ත්‍රීය කෘති පිළිබඳවත්, ඒ මඟින් මේ රටට කෙරෙන උදාර සේවාව ගැනත්, අවබෝධයක් ඇතුව සිටි **වනසුන්දර** මහත්මා මහනාහිමි යන්ගේ ශාසනික හා ධර්මශාස්ත්‍රීය සේවාවනට හැකි හැම අවස්ථාවක ම නොයෙක් අයුරින් පිටුවහල් විය.

ව්‍යාකරණසද්දසින්ධු ද්විතීය කාණ්ඩය මුද්‍රණයෙන් එළි දැක්කේ ද එතුමා මුදලින් කළ බරපැන් පූජාව නිසා ය.

ජාත්‍යන්තරික වශයෙන් කීර්තිධර සමකාලීන වියතුන් කීප දෙනෙක් ම මහනාහිමියන්ගේ හිතකාමීන් අතර වූහ. ආචාර්ය **ගණපති ශාස්ත්‍රී** නම් මහා පඬිවරයා හා මහාචාර්ය **ඇන්. කේ. භගවත්** යන මහා වියතුන් දෙපොළ විශේෂයෙන් සඳහන් කළ යුත්තෝ ය. ආචාර්ය ගණපති ශාස්ත්‍රීතුමා මහ නාහිමියන් හා මිත්‍රත්වයට පත්වූයේ **පූනා ශාස්ත්‍රසම්මේලනයට** එකට සහභාගි වීමට ලැබීමේ හේතුවෙනි. මහානායකහිමියන්ගේ ශාස්ත්‍රීය පොතපත කෙරෙහිත්, ආගමික සේවාවන් කෙරෙහිත් විශේෂ පැහැදීමක් ඇතුව සිටි **භගවත්** පඬිතුමා ලිපි ගනුදෙනු මඟින් ද බොහෝ කාලයක් සබඳකම පවත්වාගෙන ගිය කෙනෙකි.[2]

මේ මහා පඬිවරයාගේ මඟ පෙන්වීම යටතේ මහනාහිමියන්ගේ මහා **කස්සපචරිත** නම් මහාකාව්‍යය **බොම්බායේ විශ්වවිද්‍යාපීඨයෙහි** ශාස්ත්‍රා චාර්ය (ඇම්.ඒ.) උපාධිය සඳහා පාඨග්‍රන්ථයක් වශයෙන් නියම කරන්නට යෙදිණ.. මේ මහාපඬිවරුන් දෙපොළගේ මිත්‍ර සන්ථවය භගවත් පඬි වරයාගේ අවසාන කාලය තෙක් ම පවත්වා ගෙන ගිය බව පෙනේ.

ලෝකප්‍රකට විශාරද වියතකු වූ මහාචාර්ය **විල්හෙල්ම් ගයිගර්** තුමා මහනාහිමියන් මෙන් පාළි භාෂාවට විශේෂ සේවාවක් කොට ඇති කෙනෙකි. එපමණක් නොව මහාවංශයේ දෙවැනි කොටස ආශ්‍රය කොට ගෙන එතුමා ලියූ, CULTURE OF CEYLON IN MEDIAEVAL TIMES* නම්

1 මෙතුමා ගැන තවත් කරුණු මීළඟ පරිච්ඡේදයට ඇතුළත් වැ ඇත.

2 මෙහි උපග්‍රන්ථයට එතුමා ගේ එක ලිපියක් යා කොට ඇත.

* Messrs. otto Harrassowitz, Wiesbaden verlag. Taunusstrasse, Germany.
සිංහල පරිවර්තනය;
ආචාර්ය ඇම්. බී. ආරියපාල
සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

ග්‍රන්ථය මේ රටේ සංස්කෘතිය ගැන විශාල වටිනාකමක් ගැබ් වූවකි. මහනාහිමියන්ගේ පොතපත කෙරෙහිත්, පාණ්ඩිත්‍යය කෙරෙහිත් විශාල පිළිගැනීමක් ඇතුව සිටි එතුමා උන්වහන්සේ බැහැ දැකීමට බඹරකැලේ ශ්‍රී මහා විහාරයට පැමිණ විශේෂයෙන් පෙරදිග භාෂා පිළිබඳ ව සාකච්ඡා කොට උන්වහන්සේගේ පාණ්ඩිත්‍යය පිළිබඳ වැ පුවත්පත් මඟින් පළකළ අදහස් ලාංකික පඬි පරපුරට ම ආඩම්බරයකි. මහනාහිමියන්ගේ සමකාලීන වියත් විදේශ මිත්‍රයකු හැටියට එතුමා විශේෂයෙන් සඳහන් කළ යුත්තෙකි.

**සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ** මහතාගේ ධනව්‍යයෙන් ඇරඹූ **හේවාවිතාරණ ත්‍රිපිටක මුද්‍රණය** පවත්වාගෙන යාමේ දී මූලික ප්‍රතිෂ්ඨාධාර ව ක්‍රියා කළ එතුමා ගේ භාර්යාව වූ **සෝමාවතී හේවාවිතාරණ** මැතිනිය විදුරු පොළ මා හිමියන්ගේ කැපකරු දායිකාවක සේ උන්වහන්සේට භක්තිමත් ව සිටි මහෝපාසිකාවකි. වසරකට කීප විටක් උන්වහන්සේ තම නිවසට වැඩ මවාගෙන දන්පැන් පූජා කිරීම චාරිත්‍රයක් කොට ගෙන සිටි ඇය නුවර එළියේ **ශ්‍රී මහා විහාරය** කරා හැකි හැම අවස්ථාවක ම ගොස් සැපදුක් සොයා බැලීමත්, උන්වහන්සේගෙන් අවවාද අනුසාසනා ලබාගැනීමත් නොකඩවා පවත්වාගෙන ගිය චාරිත්‍රයක් විය. මහානායක හාමුදුරුවන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ භක්තිකාව්‍යය වන කමලඤ්ජලිය මුද්‍රණයෙන් එළි දක්කේ ද එතුමිය ගේ ධනව්‍යයෙනි.

එකල ලංකාවේ කීර්තිමත් වැ සිටි ගිහි පැවිදි නායකවරුන්, සාහිත්‍ය කරුවන්, සමාජසේවීන්, ශාසන අනුග්‍රාහකයන්, පුවත්පත් කලාවේදීන් ආදී විවිධ ජන කොටස් සමඟ මහනාහිමියන්ගේ සමාශ්‍රය ඒ ඒ විෂයයන්ගේ අභිවර්ධනයට අනුබල වන අයුරින් ව්‍යාප්ත වැ තිබිණ.

# 13 පරිච්ඡේදය

## සිසු පිරිස

### I

මහානායක හාමුදුරුවන් වහන්සේ සංඝ සමාජය තුළ පරම සම්භාව්‍ය තත්ත්වයට පත්වීම නිසා ශාසනය සඳහා උන්වහන්සේගෙන් ඉටුවිය යුතු සේවාව උපරිම තත්ත්වයෙන් ඉටු විය. භාෂාවට සාහිත්‍යයට ඉටුවිය යුතු මෙහෙය ද එලෙස ම ඉටු විය. අනාගත සාසන සුභසිද්ධිය සඳහා ශිෂ්‍ය පිරිසක් ඇති කළ යුතු ය, යන නිගමනය මත උපරිම වෑයමක් දරා ඇත. එහි ප්‍රතිඵල වශයෙන් උසස් සිසු පිරිසක් සාසනික දයාද හැටියට ලැබී තිබේ. ඔවුන් වහන්සේලා අතර ප්‍රථම ශිෂ්‍ය රත්නය නුවරඑළියේ **විමලබුද්ධි** මහනාහිමියෝ ය.* දෙවෙනි ශිෂ්‍යවරයා නුවරඑළියේ බඹරකැලේ ශ්‍රී මහා විහාරාධිපති ව වැඩ විසූ අලවතුගොඩ **දෙවරක්ඛිත** හිමියෝ ය. මහෝපාධ්‍යාය ධුරයක් ද දරූ, නිකායික කටයුතුවලට විශාල පිරිමැස්මක් ඇතුව සිටි උන්වහන්සේ 1973 නොවැම්බර් 02 දින අපවත් වූහ. තුන්වැනි ශිෂ්‍ය වරයා විදුරුපොළ **බුද්ධදත්ත** හිමියෝ ය. උන්වහන්සේ නිකායික කාරක සභාවේ සාමාජික පදවියක් දරන අතර අධිකරණ නායක පදවියක් ද හොබවති. මහානෙක්ඛම්මචම්පූ ව්‍යාඛ්‍යාව හා රතනජෝති මාහිමි චරිතය ද උන්වහන්සේගේ කෘතීන් ය. මේ හිමියෝ නිකායයේ අනුනායක පදවියක් ද දරති. බඹරපනේ **සීලවංස** ස්ථවිරයන් වහන්සේ සිවුවැනි ශිෂ්‍ය නමයි. **විද්‍යාලංකාර** විශ්වවිද්‍යාලයේ **ශාස්ත්‍රවේදී** උපාධිය ලබා ඇති ඒ හිමියන් නිකායික කාරක සභාවේ ද සාමාජිකත්වය දරන,මෙම අපදන ග්‍රන්ථයේ සහායකයාණ කෙනෙකු ද වන නිකායේ සහකාර ලේකම් පදවියද හොබවන සාසනයට පිරිමහින මහ තෙරනමකි. විදුරුපොළ **ධම්මානන්ද** ස්ථවිරයන් වහන්සේ ඊළඟ ශිෂ්‍යවරයා ය. පිරුවන් **ගුරු විද්‍යාලය** පුහුණුවත්, විද්‍යාලංකාර **සාහිත්‍යාචාර්ය** උපාධියත්, ප්‍රාචීන අවසාන විභාගයේ කොටස් කීපයකුත් සමත් වැ සිටි උන්වහන්සේ විශ්ව විද්‍යාලය **ශාස්ත්‍රවේදී** උපාධිය ද ලබාගෙන සිටි ධර්මවිනයධර යතිවරයෙකි.

---

* විස්තර සඳහා පළමුවැනි පරිච්ඡේදයේ II කොටස කියවන්න.

**සිරි පියතිස්ස** පිරුවන්හි ආධිපත්‍යයට ද පත්වූහ. නිකායේ **මහලේකම්** හැටියටත්, **අනුනායක** හැටියටත්, **මහොපාධ්‍යාය** හැටියටත් තනතුරු රාශියක් හෙබ වූ උන්වහන්සේ නිකායික කටයුතුවල දී පුරෝගාමී ව ක්‍රියා කළහ. 1987 අප්‍රේල් 09 වැනි දින අපවත් වූහ. ඊළඟ ශිෂ්‍යවර දික්කා පිටියේ **නන්ද** ස්ථවිරයන් වහන්සේ **සිරි පියතිස්ස** පිරුවන්හි වත්මන් අධිපති වරයා ය. නිකායයේ මහ ලේකම් පදවිය ද අනුනායක පදවියක් ද හොබ වති. විශ්වවිද්‍යාලය ශාස්ත්‍රවේදී උපාධිය ද විද්‍යාලංකාර සාහිත්‍යාචාර්ය උපාධිය ද, ලබා ඇති උන්වහන්සේ **ප්‍රාචීන අවසාන** විභාගයේ කොටස් කීපයක් ද සමත් වැ සිටිති. නිකායික සියලු කටයුතුවල දී ප්‍රමුඛ වැ මහ මෙහෙයක් කරන්නාහ.

ශාණ්ඩිල්‍ය ගෝත්‍රික **බුද්ධරක්ඛිත** යතිවරයන් වහන්සේ **පියතිස්ස — විමලබුද්ධි** මහ නාහිමිවරුන් දෙනමගේ විදේශීය ශිෂ්‍යයා යි. කමලඤ්ජලිය ඉංග්‍රීසියට පරිවර්තනය කළ මොවුන් වහන්සේ මහාචාර්යවරයෙකි. බැංග ලෝරයේ **මහාබෝධි** සමාගමේ සභාපති පදවිය ද දරූ උඩරට අමරපුර නිකායයේ **භාරතයේ** ප්‍රධාන **සංඝනායක** හිමියෝ ය.

මහානායක හිමියන් තමාගේ ම ශිෂ්‍යයන් හැටියටත්, විමලබුද්ධි හිමියන් හා හවුලේත් මහණ උපසම්පද ලබා දී ඇති කරගත් සිසු පිරිසයි ඒ. ඊළඟට උන්වහන්සේගෙන් භාෂාශාස්ත්‍ර හදළ ධර්මාන්තේවාසික සිසු පිරිසක් ද ඇත. මුල් කාලයේ පටන් කායික ශක්තිය පිරිහීයන තෙක් ම උන්වහන්සේ තම ශිෂ්‍යවරයන් හටත් ධර්මාන්තේවාසිකයන් හටත් ධර්ම විනය ඇතුළු භාෂාශාස්ත්‍ර ප්‍රගුණ කරවූහ.

මහානායක හිමියන්ගෙන් **භාෂාශාස්ත්‍ර** හදළ ගිහි ශිෂ්‍ය පිරිස තුන්වැනි කොටස යි. ඔවුන'තර විශාරද උගතකු හැටියට කැපී පෙනෙන ශිෂ්‍යයා **මුනිදස කුමාරණතුංග** මහතා ය. පාළි හා සංස්කෘත භාෂා විෂයයෙහි ඒ මහතාගේ ආචාර්යවරයා වූයේ මහනාහිමියන් වූ අතර එතුමාගේ ව්‍යක්ත භාවයට හා බහුශ්‍රැතභාවයටත් මාර්ගෝපදේශකත්වය උන්වහන්සේගෙන් ලැබිණ. නිවාඩු කාලවල **නුවරඑළියට** පැමිණි එතුමා මහානායක හාමුදුරු වන් ළඟ ඉගෙනීම කළ බව සපයා ඇති ලියුම්කියුම්වලින් ද පැනේ. එසේ කිරීමේ දී ඇතිවන දුෂ්කරතා හා අපහසුකම් එතුමා ගණන් ගෙන නැත. සෙසු කාලවල තැපැල් මඟින් ගැටලු විසඳා ගැනීමෙන් තම ඉගෙනීම දියුණු කරගෙන ඇත. **කුමාරණතුංගයන්** කළ සංස්කරණ විවරණ ආදී ග්‍රන්ථ සමුදයයට මහනාහිමියන්ගෙන් ලද අනුග්‍රහය ද බෙහෙවින් ඔහු අගේ කොට තිබේ.

මහනාහිමියන්ගේ ගිහි ශිෂ්‍යයන් අතර තවද තිදෙනකු ම වෛද්‍ය ශාස්ත්‍රය හදළ අය යි. **අඹලියද්දේ ''සිරි වෙදමැඳුරෙ''**හි **ඩී. එච්. ගුණසේකර** වෙද ආරච්චි රාලහාමිගේ දෙටුපුත් **ඩී. ජේ. ගුණසේකර** මහතා වෛද්‍ය වරයෙකු වශයෙන් ද සමාජ සේවකයෙකු වශයෙන් ද වැඩදයී **ජීවිතයක්**

ගෙන ගිය කෙනෙකි. **ඇල්.ඇම්.පී.එච්.** නමින් හැඳින්වෙන උසස් ඉන්දීය වෛද්‍යරාජ උපාධියත් ලබාගෙන සිටි ගුණසේකර මහතා **ලංකා ජාතික සංගමයේ නුවරඑළිය** දිස්ත්‍රික්කයේ පුරෝගාමියකු ලෙස එම සංගමයට බැඳී ජාතික සටනේ ද කොටස්කරුවෙක් විය. **උඩපුස්සැල්ලාවේ** "ශ්‍රී ජීවක අමෘතෞෂධාලය" නමින් වෛද්‍ය මධ්‍යස්ථානයක් අරඹා දහස් ගණන් සිංහල දෙමළ රෝගීන් සුවපත් කිරීමේ නිරත වූ අතර **උඩ පළාත** ගම්කාර්ය සභාවේ සභාපති ලෙස ද පත් වී එම ප්‍රදේශයේ දියුණුවට මහඟු මෙහෙයක් ඉටු කරන ලදී. මහනාහිමියන්ගේ කෘතියක් වූ **ව්‍යාකරණසද්දසින්ධු** නම් කෝෂග්‍රන්ථයේ ප්‍රකාශක වූයේ ද ගුණසේකර මහතා යි. මහනාහිමියනට අසීමිත ගුරු භක්තියක් දැක් වූ ඒ මහතා 1948 මැයි 01 වැනි දින් සතුරකු අතින් ජීවිතක්ෂයට පත්විය.

උන්වහන්සේ වෙතින් **භාෂාශාස්ත්‍ර** හදළ තවද එක් වෛද්‍ය ශිෂ්‍ය වරයෙකි උඩුවර **ඒකනායක** වෙදමහතා. වෙද මුහන්දිරම් පදවියක් ලබා සිටි, ප්‍රදේශය තුළ බහු ජනාදරයට පාත්‍ර වූ මොහු ජනතා නියෝජනයක් ද ලැබූ බවක් අසන්ට ලැබේ.

බඹරපනේ **යූ. බී. ඒකනායක** වෙද මහත්මා මහානායක හිමිපාණන් වහන්සේගේ අනෙක් වෛද්‍ය ශිෂ්‍යයා ය. මෙම වෛද්‍යවරුන් වෙදකම පමණක් නොව ඒ එක්කම මහජන සේවයන් ද කළ අය වන අතර ජනතා සුභසිද්ධිය තකාගෙන පරිත්‍යාගශීලී ව තම මෙහෙවර තම තමන් විසූ ප්‍රදේශවලට ලබා දී ඇත.

## II

### නිධන ප්‍රාප්තිය

විදුරුපොළ මාහිමියන් වහන්සේ පාරිවෙණික අධ්‍යාපනය ලබන අවධියේ කලක් ම රෝගාබාධයකින් පෙළුණු අතර **කොළඹ** දී සිදු වූ වැටීම කින් පාදයක ඇති වූ අවහන්දිවීමක් නිසා සැහෙන කාලයක් පීඩා විඳ ඇත. එම් අවස්ථාවේ ලංකාවේ සියලු ම ප්‍රසිද්ධ පුවත්පත් එයට දුක් වී ඉක්මන් සුවය තකා තම තම පුවත්පත් මඟින් සුවපත් වේවා යි පතා ඇත. ඒ හැරෙන විට උන්වහන්සේ ජීවත් වූ සම්පූර්ණ කාලය නීරෝග සම්පන්න විය. සෞඛ්‍යය රැකීම ගැන විශේෂ වැයමක් නො දැරුවත් සෞඛ්‍ය නසන නොයෙකුත් චරියාවලින් වැළකී කල් ගෙවූහ. කය සිත වෙහෙසා නිතර ධර්මශාස්ත්‍රීය වශයෙන් කළ සේවාවන් නිසා නීරෝගීතාව රැකුණා යයි සිතිය හැක. උන්වහන්සේගේ ජීවිතය බෙහෙවින් ම කතකිච්ච බවට පත්වූවකි.

කළයුතු ධර්මශාස්ත්‍රීය, ආගමික හා සාමාජික සේවා සියල්ල ඉටුවීම නිසා ඒවා ගැන සිතා උන්වහන්සේට තම ජීවිතයේ සඵල බව මෙනෙහි කොට විශාල වින්දනයක් ලැබීමට හිමිකම නියත වශයෙන් ම තිබුණේ ය. සැමදම උන්වහන්සේගේ ජීවිත කටයුතු දෛනික වැඩ පිළිවෙළකට යටත් විය. එය නො වෙනස්ව පවත්වා ගෙන යාමට ද මහනාහිමියෝ අකුරට ම ධෛර්යය ගත්හ. කවර හේතුවක් නිසාවත් මාහිමියන් තම වැඩ පිළිවෙළ වෙනස් කරන්නට කැමති වූයේ නැත. මේ සියලු කටයුතු අනුව සලකන විට උන්වහන්සේ ගෙවා ඇත්තේ අතිශයින් ම තෘප්තිමත් අල්පෙච්ච ජීවිතයක් බව කිව යුතුයි.

නායකමාහිමියන් කවර තරම් කායික දුබලතාවකින් පෙළුණත් තම වගකීම් තව කෙනෙකුට පවරා නිදහස ලබාගන්නා ස්වරූපයේ කෙනෙකුන් නො වන බව උන්වහන්සේගේ ජීවිතය පුරා බැඳී ගිය ලක්ෂණයකි. උන් වහන්සේ දූරු මහානායක පදවියට අයත් ශාසනික කාර්යභාරය විශාල වූයේ ද එහි කටයුතුවලට සහාය කරගත හැකි කීප නමක් ම වූහ. එහෙත්, මහනාහිමියන්ට මැ සීමාවුණු ධර්මශාස්ත්‍රීය කටයුතුවලට වෙනත් කෙනෙකු ගේ සහාය ලබා ගන්න කල්පනා නො කෙළේ උන්වහන්සේ බලාපොරොත්තු වන මට්ටමින් ඒ කටයුතු වෙනත් කෙනකුට කිරීම පහසු නො වන නිසා විය හැකියි.

කෙසේ නමුත් 1954 වර්ෂයේ අවසාන කාර්තුව ගෙවී ගියේ උන් වහන්සේගේ වයෝවෘද්ධභාවයත්, ශාස්ත්‍රීය කටයුතුත් තරහකාරී ස්වරූපය කින් එකට පැහීමෙන් මෙනි. ඒ එක්කම නිකායයේ ආයතනාභිවෘද්ධියට අදාළ කරුණු ගැන සුදුස්සන් සමඟ සාකච්ඡා කිරීම, උපදෙස් දීම වැනි කරුණු පිළිබඳව ද උන්වහන්සේගේ අවධානය ගැඹුරින් යොමු වී තිබුණට නිසැක ය. මෙම වකවානුව තුළ කඩිනමින් නිමවෙමින් තිබුණු ජාතකපාළියේ අවසාන සංස්කරණ කටයුතු ගැන අනභිත යෙදවීම ප්‍රධාන ම ධර්මශාස්ත්‍රීය සේවාව විය. නායක මාහිමියන්ගේ අරමුණත්, අධිෂ්ඨානයත් වූයේ තමාගේ ජීවිතයේ අවසානයට පෙර ජාතක අටුවාවේ සංස්කරණ කටයුතු නිම කළා සේ ජාතකපාළියේ සම්පූර්ණ සංස්කරණ කටයුතුත් නිම කිරීමට යි. මේ වනවිට මෙහි ප්‍රථම භාගය මුද්‍රණයෙන් ප්‍රකට වී තිබුණ ද, ද්විතීය භාගයේ මුද්‍රණ කටයුතු කරගෙන යමින් තිබුණු නියා එහි ශුද්ධි පත්‍ර කියවීම් ආදිය දිගට ම කරගෙන යන්නට සිදු විය. 1954 අවසාන මාසය උදා වී දින අටක් ගෙවී නව වැනි දිනය පැමිණියේ පුන් පසළොස්වකත් සමඟ යි. සුපුන් සඳ අහස පුරා නව ආලෝකයක් උදා කෙළේ මහනාහිමියන්ගේ ජීවිතයේ අවසන් මොහොතට ආශීර්වාද කරන්නට මෙනි.

එදින නුවරඑළියේ බඹරකැලේ ශ්‍රී මහා විහාරයෙහි පසළොස්වක පොහොය නිමිත්තෙන් ආගමික කටයුතු කීපයක් ම සැලසුම් කොට තිබිණ. වාර්ෂික ''සංඝමිත්තා පෙරහැර'' ප්‍රධාන කටයුත්ත විය. ඒ සියලු කටයුතු

කෙරෙහි ඉතා ප්‍රීතිමත් ලෙසින් සිය අවධානය යොමු කළ මහනාහිමියෝ ස්වකීය දයකකාරකාදීන්ට කළයුතු අවවාදනුශාසනාදිය අමුතු උද්යෝගය කින් මෙන් ම මහත් සතුටකින් ඉටු කළහ. ස්වකීය ප්‍රධාන ශිෂ්‍යවර විමලබුද්ධි නාහිමියන් ඇතුළු ශිෂ්‍යයනට දිය යුතු උපදෙස් හා අනුශාසනා පැවැත්වීමෙන් පසු නොයෙක් කරුණු ගැන කථා කෙළේ කථාවෙන් ඇතිවන පීඩාව අහිතකර බව කියමින් රැස්ව සිටි අය වළකද්දී ම ය.

එදින රාත්‍රි 7 ට පමණ මහනාහිමියන්ගේ අවසාන ශාස්ත්‍රීය කාර්යය වූ **ජාතකපාළි** ද්විතීය භාගයේ සංශෝධනයට සිය අත්සන යොදා එය නිම කළහ. ඊට පසු සිය ජීවිතය ගැන ආපසු බලන්නාක් මෙන් එහි සන්ධිස්ථාන හා වැදගත් සිද්ධි ගණනාවක් ම රැස් ව හුන් පිරිසට මතක් කර දුන්හ. තම ජීවිතයෙන් ගතයුතු ආදර්ශයන් පිළිබඳ ශිෂ්‍ය පිරිසට කරුණු පැහැදිලි කෙළේ පියෙකු අවසන් මොහොතේ දරුවන් හට අවවාද දෙන්නාක් මෙනි. නායකමාහිමියන් වහන්සේගේ කයෙහි හා සිතෙහි තිබුණු එඩිතර බව ඒ මොහොතේ වුව නො ගෙවී තිබුණාක් සේ දක්නට ලැබිණ.

මේ වනවිට මාහිමියන් සිවු සැත්තෑ විය සපුරා පන් සැත්තෑ වියට පා තබා සමසක් පමණ ගෙවා තිබිණ. ක්‍රි.ව. 1954 දෙසැම්බර් මස 9 වැනි දින නොහොත් ඒ පසළොස්වක පුන් පොහොය දින රාත්‍රි අලුයම් සමය ගෙවීයත්ම රාජකීය පණ්ඩිත විදුරුපොළ පියතිස්සාභිධාන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ස්වර්ගප්‍රාප්ත වූහ.

අනුරපුර–පොළොන්නරු–දඹදෙණි–කෝට්ටේ මාහිමි පරපුර වර්තමාන යෙන් ප්‍රතිබිම්බිත කළ, ලාංකික පණ්ඩිත මුක්තාවලියෙහි අග තරළම්ණ බඳු, ආගම ධර්මය, භාෂාව සාහිත්‍යය, ජාතිය දේශය ප්‍රගතියට නතු කිරීමෙහි ලා ඇපකැපවුණු, දේශිය හා විදේශීය භාෂාවලින් සාරගර්භ ග්‍රන්ථ සත් විස්සත් තැනූ, ජාතික හා ජාත්‍යන්තරික කීර්තියට පාත්‍ර වූ ඒ මහා පඬිවර විදුරුපොළ මාහිමියන් නිධන ප්‍රාප්ත වූයේ මුළු රට ම අඳුරේ ගිල්වමිනි.

''රූපං ජීරති මච්චානං
නාම ගොත්තං න ජීරති''

## විදුරුපොළ නාහිමියනි

සම්බුදු මුවින් ගිලිහුණු පා වචන පෙ ළ
අටුවා සමඟ ටීකාවෙන් පගුණ ක ළ
මෙත් සිල් අමිත ගුණ ගණ හදවතට හ ළ
අපවත්වූහ නායක හිමි විදුරුපො ළ

හෙළ සකු මගද සඳ වියරණ රැඳී කටේ
නායක හිමිතුමෙක් නම ගිය අපේ රටේ
අපවත්වූ බැවින් කඳුලැලි හෙලා වටේ
සුරගුරු සරසවිය සමගින් අඬා වැටේ

පණ්ඩිත පදවියක් සැමටම මුලින් ලැ බූ
රන්කොත විලස ගිය තැන සහ සබය හෙ බූ
මහනායක සමිඳ සමිඳුන් අතර ප බූ
කොතරම් සරු ද ? වතුර ද? කට ඔබට ති බූ

චුතවී ලොවින් සුරපුර එන ගමන ගැන
තුටුවන දෙව් පිරිස විත් පා වඳින දින
මහබඹු වෙතින් සුබ නැකතක ලකුණු දූන
සුර කොල්ලන්ට ඔබ අත්පොත් තබනු මැන

ශූ. ඒ. ඇස්. පෙරේරා
"සිංහල බෞද්ධයා"
1954 දෙසැම්බර් 18 දින

# 14 පරිච්ඡේදය

# විශේෂ ලිපි

## හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිගෙන්

1905 අගෝස්තු 29

දයානුස්මෘති පෙරදැරිකොට දැනුම් දෙමි.

තමුසේ එවූ කේන්ද්‍ර පත්‍රය බලා ඉතාම ප්‍රසන්නවීමි. එහි විස්තර තමුසේ ඉදිරිපිට කියන්නට සිතමි. මේ වතාවේ ප්‍රාචීන විභාගයෙන් තමුසේට සර්වප්‍රකාරයෙන් සමෘද්ධත්වය ආ බව ගැසට් පතින් දකින්නට ඇති. 1903 අවුරුද්දේ දී විභාගාරම්භයට තුන් මාසයක් පමණ තිබියදීයි රත්මලාණට මගේ ගමන සිදුවුනේ. එතකල් මගේ කල්පනාව තුබුණේ ශ්‍රමණ ශිෂ්‍ය කවුරුවත් විභාගයට නොයවන්නටයි.

එකල ධම්මානන්දදීන් සමඟ කථා කළ විට යවන්නට ඕනෑකම වැඩි දෙනෙක් කී හෙයින් යවමුයයි ධම්මානන්ද සමඟ කථා කළේ. ඒ එවිට ධම්මානන්ද සැක නැතුව පාස් කරන්නට පුළුවන් අයෙකු මම දෙන්නෙමි කියා තමුසෙගෙ නම කීවේ. මා විසිනුත් විභාගයක් කර තිබුන හෙයින් මමත් එසේම විශ්වාස කෙළෙමි.

....තමුසේ එළු පාලි දෙකට යනු කැමැත්ත කීවිට එහෙම නම් ඔය විභාගයේදී තමුසේම පාලියෙන් පළමු වෙනියා වෙයි කීමි. එය ඒ කීවා වගේ මේ ගමනේ කල් ඇතුව තමුසේ භාෂාත්‍රයට යනු දැනගත් හෙයිනුත්, ශක්තිය සැලකීමෙනුත් කොයි ශාඛාවලිනුත් තමුසේ හොඳ වෙන බව ඤාණිස්සර සමඟ කීමි. සමරසේකර දුර්භාග්‍යතාවෙන් මෙන් මේ අන්තිම විභාග කාලේ බලවත් රෝගාතුර වූනා. ඒ ඒ කරුණු කෙසේ නමුත් මේ වතාවේ ප්‍රශ්න සෑදීමේදී මට පත්වුනේ ප්‍රධාන සංස්කෘත පත්‍ර කිරීමයි. තමුසෙලාට යම් යම් ගුරුකම් දුන් නමුත් ඒ මේ කොයිම ශිෂ්‍යයෙකු උදෙසා වත් ඒ කිසිවෙකුට හිත වශයෙන් එකම පදයක් නොයෙදීමි. ගණන් සෑදීමේදී පත්‍ර හැඳිනලාවත් එක බාගයකින්වත් කාටවත් උපකාරවත් අපකාරවත් නොකෙළෙමි. ඒ මගේ ධර්මතාවයි.

එය මගෙන්ම උගත් ජිනරතන සංස්කෘතෙන් කෘතාර්ත්ථ නොවූ බැවිනුත් සැගේ. එමෙන් කවුරුත් තත්වූ පරිද්දෙන් ලකුණු දූන් සේ සිතමි. ඉතින් තමුසේගෙන් ධම්මානන්දට නම්බු ලැබුන එකම මටත් නම්බු ලැබුනාමයි. මේ වතාවේ ප්‍රාරම්භ විභාගයට මෙහෙන් යැවූ ඇත්තන් ටිකක් කල් ඇතුව සකස්කරලාමයි යැවුවේ. නුමුත් යාමට සුදුසුම දෙනමක් ඇරුණා. ඒත් අමනාප වූ බැවිනි. ඒ කෙසේ වුනත් ප්‍රාරම්භ විභාගයෙන් සාර්ථක වූ ප්‍රධාන සතර දෙනාම අපෙයි.

සීලාලංකාර නම පාලියෙන් වඩා හොඳ වූ නමුත් මුළු ගණනින් දෙවන පඞ්ක්තියෙයි වැටුනේ. තමුසේ සර්වප්‍රකාරයෙන් මධ්‍යම විභාගයෙන් හොඳ වූ හෙයින් රත්නත්‍රයානුභාවයෙන් අන්ත්‍ය විභාගයේ දී නීරෝගීව සිටියොත් පළමුවෙනිව පාස් කරන්නේ යයි මගේ බලාපොරොත්තුවයි. මේ වතාවේ තෑගි දීමේ කාලය ඔක්තෝබර මාසයේ වෙයි. තවම ප්‍රධාන තැන නියම කළේ නෑ. මට මේ කාලෙ බොහොම සනීප මඳකමුත් විපත්තිත් තිබේ. තමුසෙලාගේ අභිවෘද්ධිය බලාපොරොත්තු වෙමි. එයින් මට ද සුව ලැබෙනු හැකිවේ.

මේ බවට,
හිතෛෂී,
හික්කඩුවේ සුමංගල

## මුල්ලේගම ශ්‍රී ගුණරතන මහානායක හිමියන්ගෙන්

අස්ගිරි විහාරය,
මහනුවර.
13 මාර්තු 1935

පණ්ඩිත විදුරුපොල පියතිස්සාභිධාන මහා නායක ස්ථවිරයන් වෙත හිතාද්ධ්‍යාශයෙන් ලියා සැළකරමි.

අපේ මිත්‍ර මහානායක ස්ථවිරයන් විසින් සම්පාදිත ''මහා නෙක්ඛම්ම චම්පූ'' නමැති පොත ලැබී සතුටින් පිළිගතිමු.

ලක්දිව පණ්ඩිත මුක්තාවලියෙහි ශ්‍රෙෂ්ඨ මුතු ඇටයක් වූ මහානායක ස්ථවිරයන් විසින් සම්පාදිත ශාස්ත්‍රීය ග්‍රන්ථයක් ගැණ අමුතු වර්ණනාවක් නූවමනාය. කාටත් ප්‍රයෝජනවත් අයුරින් සම්පාදිත මේ පොත මධ්‍යස්ථ සිතැති සියල්ලන් විසින් ම ආදරයෙන් පරිශීලනය කරණු ලැබේ යයි අපේ විශ්වාසයයි.

අප වෙතද පිටපතක් එවීම ගැණ අපේ ස්තුතිය මෙයින් පිරිනමමු.

ඒවගත් මෙසේම,
විශ්වාස වූ,

අස්ගිරි විහාරාධිපති මහා නායක
ස්ථවිරයන් වහන්සේ වම්හ.

අත්සන.

## ලුණුපොකුණේ ධම්මානන්ද නාහිමියන්ගෙන්

පැලියගොඩ,
කැලණිය.
24.02.1936

සාදර ස්තුති පුරස්සරව ලියා දන්වමි.

මෙහි එවූ ප්‍රීතිජනක ලිපි ලැබුණා. 26 වෙනි දින අපේ පැමිණීම ඉතා සුදුසු නමුත් අනවකාශකම් නිසා මෙසේ ලියමි. ''පූජා ච පූජනීයානං එතම්මංගල මුත්තමං'' යනු වදාළ බැවින් ගුණ නුවණින් යෙදී ලෝකශාසනාභි වෘද්ධියෙහි නිරතව වැඩ වසන අපේ විදුරුපොළ පියතිස්ස සංඝ නායක ස්ථවිරයාණන් උදෙසා සුදුසු කාලවලැ පවත්වන ගරු පුද පෙරහර ඉතා මැනවැයි ද එසේ කරන ගිහි පැවිදි පිනැතියන්ට ද උභය ලෝකාර්ථසාධනය වේ යයි ද අනුමත කරමින් ගුණ නුවණින් ගිහි පැවිදි සමූහයා හොබවන අපේ විදුරුපොළ පියතිස්ස නායක ස්ථවිරයාණෝ රත්නත්‍රයානුභාවයෙන් ද ලෝක ශාසන සංරක්ෂක දේවානුභාවයෙන් ද නිරුපද්‍රැතව චිරජීවනය කෙරෙත්වායි අප විද්‍යාලංකාර පිරිවෙනේ ආශංසනය සාදර පුරස්සරව මෙයින් නිවේදනය කරිම්හ.

මේ බවට,
හිතවත්,

පැලියගොඩ විද්‍යාලංකාර,
පරිවෙණාධිපති.

අත්සන.

## මාතලේ ධම්මසිද්ධි මහානායක හිමියන්ගෙන්

2479 පෙබරවාරි 25 දින,
වේයන්ගොඩ, නිට්ටඹුවේ
විද්‍යානන්ද පිරිවෙන දී ය.

මෙත් සිතින් දැනුම් දෙමි.
භවත් ස්ථවිරතුමනි,

අප මිත්‍ර විදුරුපොල ශ්‍රී පියතිෂ්‍ය නායක ස්ථවිරතුමන් පිළිබඳ සැලකිය යුතු වැදගත් සිදුවීම් දෙකක් නිමිති කොට ගෙණ පවත්වන පඤ්චවිංශති පූර්ති මහොත්සවයෙහි මාද පැමින සතුටුවිය යුත්තෙක්මය. එහෙත් මේ දිනවල මම දැඩි ගිලන්කමකින් නැගී සිටින ලහම කාලය නිසා නුවරඑලිය වැනි සැප පලාතක් උවත් අපහසුය.

මා නොපැමිනියත් උඩරට අමරපුර නිකායේ මහා නායක පදවි පැමිනි අප මිත්‍රොත්තමතුමන් වහන්සේ හැම ලෙසකින්ම පිදියයුත්තෙක් බැවින් එබඳු අදහසකින් පැළඹුනු සියලු දෙනාහට ස්තුති කරමින් නායක ස්ථවිර තුමන්ගේ චිරන්තන යසෝබිම්බය අනාගතයේදී ත්‍රිගුණවේවා' යයි ආශංසනය කරමි.

සැප වේවා.
මේ,හිතවන්ත,

මාතලේ සිරිධම්මසිද්ධි ස්ථවිර.

අත්සන.

## පැළෑණේ ශ්‍රී වජිරඤාණ මහනාහිමියන්ගෙන්

වජිරාරාමය,
බම්බලපිටිය.
1936.02.24

ශ්‍රීරස්තු

පූජ්‍ය පණ්ඩිත විදුරුපොල පියතිස්සාභිධාන මහානායක ස්ථවිරපාදයන් වහන්සේගේ පණ්ඩිතෝපාධි ප්‍රතිලාභයෙන් හා මහානායක පදප්‍රාප්තියෙන් පස්විසිවස් පිරීම නිමිති කොට ස්ව නිකායයෙහි සංඝයා වහන්සේගේත් දයක සමූහයාගේත් සමාන සම්මතියෙන් පවත්වන්නට නියම කරගත් පුණ්‍ය මහොත්සවයත් ගැන අසා අතිශය සන්තෝෂයට පැමිණියෙමු. මේ නිමිත්තයෙන් පැවැත්වෙන ගිහිපැවිදි මහා සභාවට එළැඹෙන්නට නිවේදන යක් ලදුවත්, අපගේ බලවත් අසනීපකම නිසා නොපැමිණිය හැකිවීම මහත් කනස්සල්ලෙකි. මෙවැනි පුණ්‍යමහොත්සවයක් පවත්වන්නට අදහස් කිරීම ගැන යථෝක්ත ගිහි පැවිදි දෙපසටම අපගේ ස්තුතිය වේවා!

මේ නායකස්ථවිරපාදයන් වහන්සේ අපගේ කල්‍යාණ මිත්‍රයාණ කෙනෙකි. ගම්භීර ධීර ස්ථිරසාර ගුණ ඇති සැබෑ පණ්ඩිතරත්නයෙකි. ඒ උගත්කමින් සිය ගෙණෙහි සහ පිරිසට ද සාමාන්‍යයෙන් ලංකාබුද්ධ ශාසනයට ද ධර්මශාස්ත්‍රෝද්දීප්තියට ද ලැබුණු පිහිට අපමණය. ධර්ම විනය හා ශබ්ද ශාස්ත්‍රාදිය පිළිබඳ බොහෝ පත්පොත් තැනීමෙනුත් සංස්කරණ ව්‍යාඛ්‍යාකරණදියෙනුත් ධර්මශාස්ත්‍රානුසාරි ලෝකයට කළ මෙහෙය අනර්ඝය. මේ කාලයේ සැටියට, පිරිය හැකි උසස් ප්‍රමාණයේ භික්ෂු ප්‍රතිපත්තියත් සපුරමින්, ස්වවශයෙහි පවත්නා පන්සියයක් පමණ මහා භික්ෂු සමූහයත් නිසි මඟ මෙහෙයමින්, මනා සේ පාලනය කෙරෙමින් දහස් ගණන් විශාල වූ දයක සමූහයකුත් නිසි සේ හසුරුවමින්, ලක්දිව නොයෙක් පළාත්වල අනන්ත අප්‍රමාණ ගිහි පැවිදි සමූහයාට නොයෙක් විට ධර්ම දෙශනායෙන් හා කාලානුරූප අවවාදනුශාසනාන්විත ලියුම් පළකර වීමෙන් ද ලෝ සසුන් දෙකට මේ පස්විසි වස ඇතුළත මොවුන් වහන්සේ විසින් සැලසූ සෙත අප්‍රමාණ වේ. එවැනි උත්තමයාණ කෙනකුනට මෙවැනි කෙළෙහිගුණ සැලැකීමක් කටයුතුමය. මෙවැනි ගිහි පැවිදි මහා සමූහය කගේ ශුභාශංසනය ආයුඃ ශ්‍රී වර්ධනයට හේතුවේමය......

මීට, නොවෙනස් හිතවත්,

පැළෑණේ වජිරඤාණ නායක
ස්ථවිරයෝ වම්හ.

## පණ්ඩිත මාදෝවිට ඤාණානන්ද ස්ථවිරයන්ගෙන්

22 පෙබරවාරි 36
විද්‍යාලංකාර පිරිවෙන.

ගෞරවාභිවාදන පෙරටුව ලියා සැලකරමි,
ගරුතර, මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්ස !

මහොත්සවය පිළිබඳ දැන්වීමක් අප වෙත ද එවා තිබේ. ඒ සඳහා පැමිණීමට ද මේතාක් බලාපොරොත්තු වූයෙමි. උත්තරයක් එවීමට ප්‍රමාද වූයේත් ඒ නිසාමය. මේ කාරණය නිමිති කොට මගේ ප්‍රීතිය සහ ගෞරවය සැලකරනු වස් මෙසේ ලියුමක් ලියන්නට අදහස් කරමි. "යො හොති ව්‍යත්තෝච" යනාදින් ධර්මයෙහි සඳහන් වන "සංඝ ශොභන යතිඥ නම් මෙකල මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වැනි උතුමෝය" යනු මගේ අවංක හැඟීමය, එබැවින් එබඳු උත්තමයන් ජීවත් වන මොහොතක් පාසා ලෝකශාසන ප්‍රතිජ්ඨාවෙක්මය. නායක හාමුදුරුවන් වහන්සේගේ ජීවිතය සර්වප්‍රකාරයෙන් සඵලය. උසස්ය. පිරිසිදුය. අන්‍යයන් විසින් ආදර්ශයට ගතයුතුය. දුරෙහි වුවත් ඒ සියල්ල අපි දනිමු. මෙබඳු උත්සව කළත් නොකළත් දෙව්මිනිස් දෙපක්ෂයෙහි ආශීර්වාදයටද ගෞරවයට ද පාත්‍ර විය යුතුය. එහෙයින් පරමායුඃ ශ්‍රී වින්දනය කොරෙමින් තව කරන ලෝකශාසන සංග්‍රහයනට ද සමර්ථ වේවා යනු මගේ ප්‍රාර්ථනාවයි. උත්සවය සර්ව ප්‍රකාරයෙන් සඵල වේවා.

මෙවගට,
කීකරු,

පණ්ඩිත මාදෝවිට ඤාණානන්ද ස්ථවිර

අත්සන.

## පොල්වත්තේ බුද්ධදත්ත ස්ථවිරයන් වහන්සේගෙන්

අම්බලම්ගොඩ,
පොල්වත්තේ,
අග්ගාරාමයේ දී ය.
23.2.1936

නුවරඑළියේ විමලබුද්ධි
ස්ථවිරතුමන් වෙතටයි.

විදුරුපොල පියතිස්සාභිධාන මහානායක ස්වාමිපාදයන් වහන්සේ පිළිබඳ "පඤ්චවිංශතිපූර්ති මහොත්සව"යට පැමිණෙනමෙන් අපවෙත එවූ ආහ්වාන පත්‍රිකාව ලදිමි....

....පණ්ඩිත ප්‍රතිරූපකයන් බොහෝ සේ විද්‍යමාන වූ මේ කාලයෙහි නියම පණ්ඩිතොත්තමයකු උදෙසා පවත්වන මේ මහොත්සවය සර්ව ප්‍රකාරයෙන් සඵලවේවා යි ද මේ මාහිමියන් වහන්සේ ශාසනාභිවෘද්ධියෙහි නිරතවෙමින් බොහෝ කලක් වැජඹෙන සේක්වා යි ද ආශංසනය කරමි.

මීට,
විශ්වාස වූ,

පොල්වත්තේ බුද්ධදත්ත ස්ථවිර.

## මහාචාර්ය ඇන්. කේ. භගවත් මහතාගෙන්

St. Xavier's College,
Bombay 1.
Dated 28th November 1924

N. K. Bhagwat, M.A.
Professor of Sanskrit,
Pali & Marathi.

My Dear Rev. Sir,

Please excuse me if I did not write to you for a long time. But as I was on tour in seeing Buddhist Caves of Western India during the Holidays, I could not go through your Pali Poem and hence, this delay. I returned to Bombay on the 10th of this month, and then read your book and have sent you this opinion, which I hope you like.

I am going to Patna in March next as the University of Patna (Pāli Pataliputra) has invited me to deliver a course of six Lectures on Buddhist Philosophy.

I wish you enjoy good health and give us some more lines in poetry of the Sakyaputta Samanas who are a glory and pride of Buddhism.

Hoping to hear from you occassionaly,

I remain,
Yours affectionately,
Sgd / N. K. Bhagwat

## මහාචාර්ය ඇන්. කේ. භගවත් මහතාගෙන්

St. Xavier's College,
BOMBAY 1.

Dated 28th November, 1924

N. K. Bhagwat, M.A.
Professor of Sanskrit,
Pāli & Marathi.

I have great pleasure in going through the Pāli poem " MAHĀ KASSAPA CHARITAM" composed by Rev. WIDURUPOLA PIYATISSA OF NUWARA ELIYA. The wonderful life of the great apostle of Gotama, who has thrown his mantle upon him, saying "DHĀRESSASI PANA ME TWAM KASSAPA-SĀNĀNI PANSAKŪLĀNI NIBBASANANI," has got a grandeur of its own. In fact the credit of preserving the THERA VĀDA Literature in its purity be given to Mahākassapa alone! Such a life, to be narrated in Pāli and in poetry, requires the devotion of a Māha Kassapa, and the genius of a poet like Kalidasa. My reading of the Pali poem (KAVYA) has convinced me of the wonderful powers of mind and head of Rev, Piyatissa. The verses has a grace and flow and music of modern Pāli and as such they could be recited with pleasure. The language is chaste and is typical of modern Pāli. The concepts are free from extravagance and quaintness. The descriptions are natural and well harmonise both the realistic and the idealistic aspects of poetry. The get up and printing are really creditable.

I believe the book is a valuable asset to the existing Pāli Literature and I wish my friend do well in giving us the metrical lines of all the important lives of the apostles both the male and female ones who have rendered signal service to the cause of Lord Buddha and his religion.

Sgd/N. K. Bhagwat

රුම ෂට්ඨ සංගායනාවේ ලේඛකාධිකාරීතුමාගෙන්,

## UNION BUDDHA SĀSANA COUNCIL

Rangoon, Dated 19.6.54

To

Ven. Widurupola Piyatissa Mahanayaka Thera,
Mahanayaka of Udarata Amarapura Nikaya,
Bambarakele, Nuwara Eliya, CEYLON.
Venerable Sir,

We are indeed grateful to you for your exceedingly kind message of greetings and goodwill to the Chattha Sangāyanā which with the greatest pleasure we had read out at the opening ceremonies.

Perhaps you will be glad to know that your message will appear in the book we are soon publishing as a special number.

Please allow us to thank you again for all your kind co-operation and good will on the occasion of this great historical and the momentous event of the modern times.

With Metta,
Sgd / Secretary to the Executive Committee of the Supreme Sangha Council of Chattha Sangāyāna.

## ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගෙන්

නමෝබුද්ධාය

2929 නොවැම්බර් 14,

ශාසන ගෞරවයෙන්
අපේ වීදුරුපොළ නායක හාමුදුරුවන්ට
ප්‍රේමයෙන් ලියමි.

ඔබ වහන්සේ විසින් මා නමට ලංකාවේ සිට එවූ ලියුම ලැබුනා. නමුත් ඊට උත්තර යැවීමෙන් ඵලක් නැති බව දුන් වූ බැවින් උත්තර ඇරියේ නැත.

ඔබ වහන්සේ කල්කටාවට වැඩි බව අපේ ලමයාගෙන් දැනගතිමි.

මහාබෝධි ශාලාවේ විවේක පහසුකම තිබෙන බැවින් කල්කටාවේ නැවති සිටින කාලය තුළ මෙහි නැවතීමට ආරාධනා කරමි.

දඹදිව ශ්‍රී සම්බුද්ධශාසනය මතු පිහිටුවීමට කෙසේ කටයුතු ආරම්භ කිරීම යුතු දැයි සාකච්ඡා කර ගැනීම ද යෝග්‍ය බැවින් මෙහි වැඩමවන්ට ඉල්ලමි.

හිතකාමී—කල්‍යාණමිත්‍ර
අනගාරික ධර්මපාල.

## සර් ඩී. බී. ජයතිලක මැතිතුමාගෙන්

New Delhi
3 January 1943

ගෞරවප්‍රණාම පුරස්සරව
ලියා සැලකිරිමයි.

ඔබ වහන්සේ විසින් එවන ලද දෙසැම්බර් මස 15 වෙනි දින දරන ලියුම ලැබී ඉතා සතුටින් කියවා බලා ලංකා නියෝජිතයා වසයෙන් අප පිට පැවරී තිබෙන අභිනව මෙහෙය පිළිබඳව එහි සඳහන් වූ කරුණා සහගත ශුභාශංසනය හෘදයංගම ස්තුති පෙරදැරිව පිළිගනිමු. අපේ කටයුතු සඵල වීමට ඒ ශුභප්‍රාර්ථනා හේතු වේයයි විශ්වාස කරමු. එසේම ඔබවහන්සේ ශාසනික ශාස්ත්‍රීය කෘත්‍යයන්හි යෙදෙමින් සුවසේ වැඩ වසන බැව් දැනගන්ට ලැබීමත් ප්‍රීතියකි.

ශබ්දකොෂය හුඟක් දුර සම්පාදනය වී තිබෙන බැව් සතුටින් ඇසීමු. ඉන්දියාවේ ශාස්ත්‍රීය සමිතියක් විසින් සම්පාදනය කරන ලද ඉංග්‍රීසි–ඉන්දීය ශබ්දකොෂයක් ළඟදී පළකරවනු ලැබේ. එය පිටු දසදහසක් පමණ වේ. ශබ්ද තුන්ලක්ෂයකි. මේ ශබ්දකොෂය පිටු 80 කින් යුක්ත කාණ්ඩ වශයෙන් මාස්පතා පළකරනු ලැබේ. පළමුවැනි කාණ්ඩය පිට වූ වහාම එයින් පිටපතක් ඔබ වහන්සේට එවන්නෙමි. එය ප්‍රයෝජනවත් වේ යයි සිතමි.

මෙය මෙහි ශීතකාලයයි. දිවාභාගයෙහි අව්ව පායයි. රාත්‍රිකාලයෙහි ශීතාධිකයි. වැස්ස අඩුයි. මේ දේශගුණයෙන් සණීපයට බාධාවක් නොමැතියි. අපි සුවසේ වෙසෙමු.

මේ බවට,
හිතවත්,

ඩී. බී. ජයතිලක.

## මුනිදාස කුමාරණතුංග මහතාගෙන්

2468 මාර්තු මස 16 වන දින
පානදුරේ පල්ලිමුල්ලේ දී ය.

පා වැඳ ලියමි,
ඇදුරුපාණන් වහන්ස,

මා විසින් සුද්ධ කරන ලද සසදයෙහි සම්පූර්ණ ශුද්ධියට නොපැමිණි තැන් කිහිපයක් තවම ඇති බැවින් එය ද සම්පූර්ණ කරගනු පිණිස ඔබ වහන්සේ ගෙන් අනුග්‍රහයක් ලබනු සඳහා මෙය ලියන්නට අදහස් කෙළෙමි. මා විසින් සපයා ගන්නා ලද්දේ පහත රට පිටපත් පමණෙකි. ඔබ වහන්සේගේ අනුග්‍රහයෙන් උඩරට පරණ පිටපත් කිහිපයක් ලැබුණ හොත් මගේ මනදෙළ පිරෙනු නිසැක ය. ශිෂ්‍යයකු ගේ මෙබඳු කාර්යයෙක දී ආචාය්‍ර්‍යවරයනට කරදර පැමිණෙනුයේ බැරි මැ තැනක් වූ විටය . එහෙයින් මගේ මේ ආයාචනය ඔබ වහන්සේ ගේ කරුණා මහිමයෙන් අමොඝ වන්නේ මැ ය යනු මගේ විශ්වාසය යි.

නිතර නිතර ලියුම් ගනුදෙනුවක් නැත ද මහාකස්සපචරිතාදිය බැලී මෙන් ''මේ මාගේ ආචාය්‍ර්‍යයන් වහන්සේගේ චාතුය්‍ර්‍යයට සුදුසු වූ ම කෘතියෙකැ''යි යම් බඳු ප්‍රීතියක් ලැබිය හැකි ද එය සම්පූර්ණයෙන් විඳියෙමි. ....ඔබ වහන්සේ නිදුක් වන සේක්වා.

මේ වගට,
කීකරු,

මුනිදස කුමාරණතුංග

## ජූලියස් ද ලැනරෝල් මහතාගෙන්

UNIVERSITY OF CEYLON
COLOMBO 3.
1953 ජූලි 9

අතිගරු, පූජ්‍ය පණ්ඩිත
විදුරුපොළ මහානායක හාමුදුරුවන්
වහන්සේ වෙත නමස්කාර පෙරටුව
ලියා මතක්කරන වග නම්:

අප වෙත එවා වදාළ මේ මස 7 දින දරන ලියුමත් ඒ සමගම හරවා එවන ලද ශබ්දකෝෂ කාණ්ඩයේ කෙටුම්පතත් ලැබී බලවත් කනගාටුවට පත්වීමු. අපේ මහානායක හාමුදුරුවන් වහන්සේ අසනීප ගණනේ වැඩ සිටින බව මුත් එතරම් ගිලන්ව දුර්වලව සිටින බවක් මේතාක් අපට දැන ගන්ට ලැබුණේ නැත. ලැබුණා නම් මෙසේ කරදර කරන්ට අදහස් නොකරන බව කරුණාවෙන් සලකනු මැනවි.

අපේ මේ කටයුත්තට ඔබ වහන්සේගේ ඉතා වටිනා සහයෝගය දැනට නොලැබුණත් ලෙඩදුක් මගහැරී ගිය පසු ඒකාන්තයෙන් ලැබෙන බව අපි දනිමු. එසේම තෙරුවන් පිහිටෙන් සම්පූර්ණ සුවය ඉක්මනින්ම ලැබේවායි ප්‍රාර්ථනා ද කරමු.

මේ බවට,
හිතවත්,

ජූලියස් ද ලැනරෝල්.
ප්‍ර. කර්තෘ.

## මහාචාර්ය ජී. පී. මලලසේකර මහතාගෙන්

1936 පෙබරවාරි මස 25 වන දින
ලංකා විශ්වවිද්‍යාලයේ දී ය.

ස්වාමිනි,

අද පවත්වනු ලබන උත්සවයට පැමිණෙන්නට බැරිවීම මට මහත් කණගාටුවකි.

ශ්‍රද්ධා ශීලාදිගුණයෙන් අනූන—සුපෙශල ශික්ෂාකාමී ශාසනභාරධාරී යතිතුමකු මෙන් ද, ධර්මධර—විනයධර බහුශ්‍රැත පඬිතුමකු වශයෙන් ද—උගතුන්ගෙන් පැසසුම් ලැබිය යුතු, එසේම විශිෂ්ට සේ පැසසුම් ලත් ග්‍රන්ථ කර්තෘවරයකු වශයෙන් ද, හැමවිට නිසිමගමගත්, අනුන් හික්මවීමෙහි පොහොනා, ආදර්ශවත් චරිතයෙන් සමුපෙත, අගති විරහිත අනුශාසකයකු වශයෙන් ද, විදුරුපොළ පියතිස්ස මාහිමිතුමන් විසින් පසුගිය අවුරුදු බොහෝ ගණනක් තුළ කරණ ලද ලෝක ශාසන සංග්‍රහය අනල්පය, මහාර්ඝය. එතුමන්ගේ චිර ජීවනය ද, ආයුරාරොග්‍යාදි සියලු සැපත ද, වීර්යය හා ප්‍රඥමහිමය ද, හැම ලෙසින්ම දියුණු වෙමින් අගතැන් පැමිණේවා යි මමද ඉතා ගෞරවයෙන් හා ආදරයෙන් ප්‍රාර්ථනා කරමි.

කීකරු,

ගුණපාල මලලසේකර

මුනිදාස කුමාරණතුංග මහතාගෙන්,

1912. 10. 6 දින,
කඩුගන්නාවේදි ය

ශිවමස්තු

වා සර  පවර මුවසර සිරි සර උර  ගේ
සේසර  කරන රිසි නිසි නඳන' දනැ ම  ගේ
නි සර  විදුරුපොළ පියතිස්ස සමිඳු  ගේ
පා සර  වදිමි සිහිකර ගුණගණ අන  ගේ

පරද  වන ගණිඳු අපමණ නැණ බෙලෙ  නී
නරද  රුදු මුවර දද මිණිකවස වැ  නී
වරද  නොව කිසිම පියතිස් සමිතුම  නී
සැරද  දද රදෙව් දිසි සඳුන'ඹර මු  නී

සිය බස්  සමහ දන නිසි ලෙස සකු මග  ද
ලිය දෙස්  ගෙලෙහි කළ යස මුනුහර නිබ  ද
පිය තිස්  නමැති වන හිමි සඳ සිතු පැහ  ද
සිය වස්  දිනේ තෙද අනුහසිනි මුනි ර  ද

රුදුරු  වන කුදිටු මතගජ හරි හර  ණ
දුදුරු  දප ඇදුරු කිවි විදුරු සෙ වර  ණ
ඇදුරු  අප සොඳුරු බබළන ගුණබර  ණ
විදුරු  පොළ සමිඳු දින හිමි හිම කිර  ණ

රන්  වනඹර පදසර ලොව මත කර  නා
බුන්  තම කඳ දදරද සසලප දර  නා
හන්  සුපුබුදු වන නිසයුරු කුමුදු ව  නා
මන්  ලෙස දිනු පියතිස් සමි සොමි සොබ  නා

මුනිදාස කුමරණතුංග

## ඇම්. ධර්මරත්න "ලක්මිණි" පහන් කතෘතුමාගෙන්,

62, Shwa Laung Street,
Kemmendine,
Rangoon.
9. 12. 35

ශ්‍රී චරණාභිවාදන පූර්වකව ඉතා යටහත් ලෙස ලියා සැලකර සිටිමි,

ගරුතර මාහිමියාණෙනි,

අප වෙත එවා වදළ "මහානෙඛම්මචම්පූ" නමැති මාගධී භාෂාමය කාව්‍ය ග්‍රන්ථය ලැබී කියවා බැලීමු. පුරාතන පඬිවරයන් ගේ රචනාවන්ට දෙවෙනි නොවන පරිදි මෙය රචනා කොට තිබෙනු දක්ම සතුටට කරුණකි.

මෙකල පිරිවෙන්ලැ බාහිරකයන් ගේ කාව්‍යග්‍රන්ථ අගය කොට සලකා ශිෂ්‍යයනට උගන්වන නමුත් එයින් ශාසන පරිහානියක් විනා නියම ශාසන දියුණුවක් ඇති වන බැව් නොපැනේ. මෙ ග්‍රන්ථය පිරිවෙන්වලැ උගන්වනු ලැබුවහොත් එයින් පාළි භාෂාව පිළිබඳ මනා පටුත්වයක් ඇති වෙනවා පමණක් නොව තරුණ භික්ෂූන්ගේ නෛෂ්ක්‍රම්‍ය සංකල්පනා සංවර්ධනයට රුකුලක් ද විය හැකි හෙයින් මීට පදගතාර්ථ සන්‍යායක් ලියා වදළහොත් මින් ලබත හැකි ප්‍රයෝජනය වඩාත් අධිකවේ යයි සිතමි. පොතක් අප වෙත පරිත්‍යාග කිරීම ගැණ ගෞරවාදර පූර්වාංගම ව කෘතඥ වෙමි.

මෙ වගට, (යටහත් කීකරු)

බුරුම ආණ්ඩුවේ ප්‍රාචීන විභාගයේ පරීක්ෂක වූද,
සුධම්මවතී ත්‍රිපිටක මුද්‍රණ සභාවේ ප්‍රධාන වූද,
ශ්‍රී ධර්මරත්න

# උපග්‍රන්ථය

## ජීවන චරිත සියතින් ලිවීමේ අගය

### පණ්ඩිත විදුරුපොළ පියතිස්ස නායක ස්ථවිරයන් වහන්සේ

උගත්තු දෙපක්ෂයෙකි. උගතුන්ගේ මෙන් පොදු ජනයාගේ ද ස්තුති ප්‍රශංසාව අගය කරන, එය ප්‍රාර්ථනා කරන උගත්තු එක් පක්ෂයකි. තමන්ගේ උගත්කම තේරුම් ගැනීමෙන් අගය කළ හැකි උගතුන් ටික දෙනාගේ ස්තුතිප්‍රශංසාව මිස අප්‍රබුද්ධයන්ගේ ස්තුතිප්‍රශංසාව ප්‍රාර්ථනා නොකරන උගත්තු අනික් පක්ෂයයි. දෙවැනි පක්ෂයේ ගැනෙන උගත්තු පොදු ජනයාගේ ස්තුතිප්‍රශංසා නොතකන බැවින්, ඔවුන් ද ඔවුන්ගේ මතය අනුමත කරන උගතුන්ද ප්‍රකෝප කරවන දේ වුවද තමන්ට හරියයි වැටහෙතොත් ලියන්ට කියන්ට ප්‍රමාද නොවෙති. එහෙයින්ම එබන්දෝ පොදු ජනයා අතර වඩා ප්‍රකට නොවෙති.

පණ්ඩිත විදුරුපොල පියතිස්ස නායක ස්ථවිරයන් වහන්සේ ද දෙවැනි කී ගණයේ ලා සැලකිය යුතු පඬිවරයෙකි. උන්වහන්සේගේ නායක පද ප්‍රාප්තියෙන් පස්විසි වසක් සම්පූර්ණවීම නිමිතිකොට ගෙන නොබෝද නුවරඑලියේ බඹරකැලේ විහාරස්ථානයෙහි පැවැත්වූ උත්සවයෙහිදී උන් වහන්සේම තමන්ගේ ජීවන චරිතය පිඩුකොට කීහ.

අප රට ජීවන චරිත ලිවීම ස්තුති පත්‍ර රචනයට නොදෙවැනි තැනකයි තවමත් තිබෙන්නේ. එහෙයින් තමන්ගේ ජීවන චරිතයෙහි ලෝකයාට හඳුන්වාදිය යුතු තැන් මේ මේ යයි තමන් විසින්ම තෝරාගෙන කීම කාලානුරූපය. අප රට පොත පත කරන අනික් උගතුන්ද පණ්ඩිත විදුරු පොල පියතිස්ස ස්ථවිරයන් වහන්සේ අනුගමනය කළ හොත් මැනවි.

පණ්ඩිත විදුරුපොල පියතිස්ස නායක හිමිහු තමන් ගැන මෙසේ කියත්.

> "විදුරුපොල පියතිස්ස නමින් තමුන්නාන්සේලාට හැඳිනෙන මම වනාහි...... කිතුවසින් එක් දහස් අටසිය අසූවැන්නෙහි ජූනි මස 16 වන බුධ දින...... විදුරුපොල දිවිගාල් පිටිය නම් වූ ස්ථානයෙහිදී....

මෙලොව පහන් එළිය දුටුවෙමි. දෛවඥයෝ මා සරස්වතී යෝග යෙන් උපන්නෙකැයි කියති. මගේ ගුණවත් මෑණියන් පසු කාලයක කළාවූ ප්‍රකාශයක අන්දමට මම එතුමිය විසින් තුන් අවුරුද්දක් මුළුල් ලෙහි සිව්වරම් දෙවියන් යැදීමෙන් ලත් පුත්‍රයෙක්මි.''

මෙසේ තම ජීවන චරිතය කියන්ට ආරම්භ කළ පියතිස්ස නායක ස්ථවිරයන් වහන්සේ කුඩා කාලයේ පටන් මේ තාක් තම ජීවනයෙහි සිහි කටයුතු වැදගත් දේ මෙන් රසවත් දේද සැකෙවින් විස්තර කරති.

පාළි නිසණ්ඩුව සහ බාලාවතාරය පාඩම් කරන්ට පටන්ගත් පියතිස්ස ස්ථවිරයෝ:

''මට දවසකට ගාථා හැටක් පාඩම් කළ හැකිය''යි උපාධ්‍යායයන් වහන්සේට කීහ.

''කාටවත් කියන්ට එපා ! දවසකට ගාථා අටක් හෝ දහයක් පාඩම් කළාම ඇති'' යි උපාධ්‍යායයන් වහන්සේ කීහ.

ඇස්වහ කාරයන්ගෙන් තම ශිෂ්‍යයා ආරක්ෂාකර ගැනීමට උපාධ්‍යාය යන් වහන්සේ මෙසේ අවවාද කෙළේ ශිෂ්‍යයාගේ අද්භූත ධාරණ ශක්තිය දුටු බැවිනැයි හැඟේ.

පියතිස්ස නායක ස්ථවිරයන් වහන්සේ තම උපාධ්‍යායයන් වහන්සේ ගෙන් ප්‍රශංසා මාත්‍රයක් ලැබුයේ දශ අවුරුද්දක් බණ කීවාට පසුවය.

මඟුල් බණ කියා වෙඩි පත්තු කරවා, ස්තුති පත්‍ර පිළිගන්වා ගන්නා තරුණ භික්ෂූන් බහුල වෙගන යන මේ කාලයේ ගිහි පැවිදි දෙපක්ෂය යට කී කරුණ ගැන කුමක් සිතත්දැයි කිව නොහැකිය.

වරක් ශාස්ත්‍රකාරයකු තමන් ගැන කී කීමක් පියතිස්ස නායක ස්ථවිරයෝ මෙසේ විස්තර කරත්.

''1893 දී උපාධ්‍යායයන් වහන්සේ පෙර වස් එළඹුණේ මේ විහාරස්ථානයෙහිමය. ඒ කාලයෙහි දේවබලයකින් ශාස්ත්‍ර කියන සිංහල පඬිවරයෙක් මෙහි ආවේය. ඔහු එක් දිනක් මගේ යටිපතුල්වල රේඛා බලා 'මේ පුංචි උන්නාන්සේ සංඝරාජ කමකට හොඳය' යි කීවේය.''

පියතිස්ස ස්ථවිරයන් වහන්සේ සංඝරාජ කමක් කිරීමට වුවමනා ස්ථිර ගුණයද, අනුශාසනයට මෙන් තමාගේ අනුශාසනය සැලකවීමේ

බලයද ඇත්තකු බව උන්වහන්සේගේ නෙත් යුවළත්, තරයේ එකටෙක වැද්දෙන තොල් සඟලත් බලන බුද්ධිමතකුට, සාමුද්‍රිකා ශාස්ත්‍රකාරයාගේ උපකාරය නැතිවම සිතා ගත හැකිය.

පුවත්පත් සඟරාවල ගුණදෙස් සෙවිය හැකි පණ්ඩිතයන් බහුල වුවද පෙනෙන දෝෂය නිර්භයව කීමට ධෛර්‍ය්‍ය ඇත්තෝ ඉතා දුර්ලභවෙත්. විදුරුපොල පියතිස්ස ස්ථවිරයෝ එසේ නොවෙත්. පුවත්පත්වල දෝෂ විචාරකයෙකි. එහෙයින් ''පුවත් පත් සඟරාවලට මගෙන් වැඩක් නැතත් රටට මහත් මෙහෙයක් කරන පුවත්පත් සඟරාවන් මවෙත එවීමෙන් ගෞරවාදරයක් දක්වන පුවත්පත් සඟරා අයත් මහතුන් හා කර්තෘ මහතුන්ටද මාගේ දයාබර ස්තුතිය වේවා'' යි පියතිස්ස නායක ස්ථවිරයන් වහන්සේ යට කී පදවලියෙහි තුඩ උපහාස රසයෙන් සරසාලීම පුදුමයක් නොවේ.

පියතිස්ස නායක ස්ථවිරයෝ, සාක්ෂ්‍ය දීම යනාදිය ලියන ප්‍රවෘත්ති පත්‍රවල භාෂාවටද, ඉංගිරිසියෙන් ලියූ සිංහල නම් ගම් පවා වරද්ද පරිවර්තනය කොට පළ කිරීමටද සරදම් කළහ.

පේළි දහයක වාසගමකින් කිය හැකි දේ කීමට තීරු හත අටේ ලියුම් පවා පත්‍රවල පළවන්ට වූ කාලයක පියතිස්ස නායක ස්ථවිරයන් වහන්සේ පත්‍රවලට සරදම් කෙළේ අස්ථානයේයයි කිව හැකි නොවේ. එහෙත් දිනපතා පත්‍රයක හෝ සතිපතා පත්‍රයක හෝ සංස්කාරකයන් මෙන් පෙනී සිටින අවාසනාවන්ත පුද්ගලයන්ගෙන් එකකුගේ ස්ථානය ගෙන සතියක් වැඩ කළහොත් උන්වහන්සේද 'පත්‍ර කර්තෘ' යයි කියන ඒ අවාසනාවන්ත පුද්ගලයාට පැහැදෙනු නිසැකය. තමන් එම ස්ථානය ගත්තත් පළපුරුදු කතු තැන කරනවාට වඩා හොඳින් භාෂා පක්ෂයෙන් වුවද එම කාරිය කළ නොහැකි බැව් වැටහෙතැයි සිතමි.

පැය කීපයක් ඇතුළත පිටු අටක දිනපතා පත්‍රයක් සම්පාදනය කොට රෑ 8 ට ලැබෙන ප්‍රවෘත්තිත් ඇතුළත් කොට රෑ දෙළහ පසුවන්ට පෙර තිස් හතළිස් දහසක් අච්චු ගස්වා අවසාන කිරීමට වුවමනා දය සපයන පත්‍රකාරයන් ගිනිනැවේ වැඩ කරන්නන් මෙන් වැඩ කළයුතු බව තමන්ටද එකැවර හැඟෙන බැවිනි.

පණ්ඩිත පියතිස්ස නායක ස්ථවිරයන් වහන්සේගේ ජීවන චරිතයෙන් උපුටා ගත් පහත දැක්වෙන කියුම මෙකල බොහෝ දෙනාට ප්‍රයෝජනවත් වෙතැයි සිතිමි.

> ''පණ්ඩිත පදප්‍රාප්තියෙන් මඳ කලකට පසු එක දවසක් මට මෙසේ සිතුණේය. ප්‍රාචීන භාෂොපකාර සමිතියෙන් මේ පණ්ඩිත නාමය ලැබුණේ මගේ ශාස්ත්‍රඥ භාවය නිසාය. පණ්ඩිත බව නම් ශාස්ත්‍ර ඥානය පමණක් නොවෙයි. පණ්ඩිත නාමය සඳහා දී තිබෙන සන්නස්

පත්‍රය ආණ්ඩුකාරතුමාටත් ප්‍රාචීන භාෂොපකාර සමිතියටත් ඕනෑ නම් අවලංගු කරන්ටත් බැරිකමක් නැත. ශාස්ත්‍ර ඥානය නම් කාටවත් අවලංගු කරන්ට බැරිය. එසේවුවත් මේ ශාස්ත්‍රඥ පණ්ඩිත නාමය ලත් පමණකින් තෘප්තියට පැමිණීම හොඳ නැත. මම දූන් මේ ශාස් ඥානය ආධාර කොටගෙන කවදවත් කාටවත් මාරුකළ නොහැකි සර්වාංග සම්පූර්ණ වූ පණ්ඩිතකමක් මා කෙරෙහි පිහිටුවා ගන්ට ඕනෑය. හොඳයි, ඒ සඳහා මා විසින් කෙසේ පිළිපැදිය යුතුද ? මේ ප්‍රශ්නය මම මගෙන්ම නොයෙක් වර අසන්නට පටන් ගතිමි. අන්තිමේදී මම මෙහෙම නිශ්චයකට පැමිණියෙමි.

''ඒ සඳහා මවිසින් ඉතාම දුෂ්කරවුවත් විෂමවූ ලෝවැස්සන් අතර සමවූ පැවැත්මක් ඇතිකර ගත යුතුය. මධ්‍යස්ථ විය යුතුය. අතීතය සිහිකළ යුතුය. අනාගතය බැලිය යුතුය. වර්තමානයෙහි තැන්පත් විය යුතුය. සතුරාටවත් දුකක් නොසිතිය යුතුය. සතුරා කෙරෙහිත් වෛර නොකට යුතුය. සතුරාගේ වත් ගුණය නොවැසිය යුතුය. තම වරද දක්ක යුතුය. අනුන්ට භය නූපදවන්නෙක් විය යුතුය. තෙමේත් භය නොවන්නෙක් විය යුතුය. අසත්පුරුෂයාට මගඇරිය යුතුය. සත්පුරුෂයා පිළිගත යුතුය. අදහසය, වචනය, ක්‍රියාවය යන තුණෙහිම ස්ථිරව පිහිටිය යුතුය. ඇද නැති නොගිස්වූ අදහස් වචන ක්‍රියා ඇත්තෙක් විය යුතුය. ධර්මය විනයය හෝ ශාස්ත්‍රය තමා දන්නා විෂයයෙහි විසාරද විය යුතුය. නොදන්නා විෂයයෙහි සමීක්ෂ්‍යකාරී විය යුතුය. හැම දෙයකම තමා නොදන්නා හරියකුත් තිබෙන බව සිතිය යුතුය. ඉක්මන් නොවිය යුතුය. උදහස් නොවිය යුතුය. සන්සුන් විය යුතුය. ලාභ කීර්ති ප්‍රශංසාදියක් සඳහා කිසිවකුට වහල් නොවිය යුතුය. පණ්ඩිත බැව්හි අනෙකකුගේ වහළක් නොසෙවිය යුතුය. තමා කෙරෙහි කිසිවකුට කිසිවිටක නොසෙල්විය හැකි ගෞරවයක් හා විශ්වාසයක් තබා ගත යුතුය.'' යන මේ කරුණු නැවත නැවතත් මෙනෙහි කෙළෙමි.

මම දූන් ප්‍රාචීන භාෂොපකාර සමාගමයේ පණ්ඩිත උපාධි ලද්දවුන් අතුරෙන් වෘද්ධතමවූ පණ්ඩිතවරයා පමණක් නොව පස්විසි වර්ෂයක් මුළුල්ලෙහි නොයෙක් වර ඉටාගත් යහපත් අදහස් රැසක් ඉතා ඕනෑකමින් රක්නාවූ පඬිවරයෙක්ද වෙමි. එහෙත් පුහුදුන් බැවින් පැණෙන අඩුපාඩු නම් නිමක් නැත. එය දක්නා බැවින් කිසිවිටෙක ගර්වයට ඉඩක් නොලැබේ.

මගේ රචනාවන් අතුරෙන් 'මහකස්සපචරිතය' බොම්බායේ විශ්ව විද්‍යාපීඨයෙහි ශාස්ත්‍රාචාර්‍ය (ඇම්. ඒ.) විභාගයට නියමිතවූ බව ප්‍රොපැසර් ඇන්. කේ: භගවත් (ඇම්.ඒ.) පඬිතුමා විසින් දන්වා එවන

ලදී. 'මහානෙක්ඛම්මචම්පූ' කාව්‍යය ලක්දිව ආණ්ඩුව පිරිවෙන්හි පැවිදි 5 වන වර්ගයට නියම කළ බව අධ්‍යාපනාධ්‍යක්ෂ තුමාගේ කාර්‍ය්‍යාලයෙන් දන්වා එවා තිබේ.

"මගේ මේ ග්‍රන්ථ රචනාවන්හිද සංශෝධනයන්හිද වැරදි නැතැයි මම කිසිවිටක නොසිතමි. පෘථග්ජන බව අපේ පණ්ඩිතකම්වලට වඩා බලවත් වන්නක් බැවින් එයින් සිදුවූ සුලු වරද තිබුණත් නොගෙන මා දූරූ පරිශ්‍රමය උතුම් කොට සලකා මගේ රචනාවන් හා සංශෝධන යන් ලාංකේයවූද විදේශීයවූද ගිහිපැවිදි පණ්ඩිතොත්තමයන් හැම විටකම සාදරයෙන් පිළිගත් බව කියන්ට ලැබීම මට මහත් ප්‍රීතියකි."

මයූරපාද
" සිළුමිණ "
1936 මාර්තු 15 ඉරිද

## භක්තිපඤ්චාශිකා

‘‘සමස්තලෝකසන්නිවාස ඒක ඒව යෝ’භවද්
ගුණෛරලෞකිකෛරනුත්තරෛස්තථෛකඑව යඃ,
යමාහුරද්විතීයමෙකපුද්ගලං මහර්ෂයස්
තමෝනුදං තමේකමුත්තමං නමාමි ගෞතමම්.

අනල්ප කල්පකෝටිසඤ්චිතප්‍රශස්ත පාරමී
ප්‍රභාව සිද්ධ නිර්මල ප්‍රබුද්ධබුද්ධි වෛභවම්,
භවාර්ණවප්‍රපන්නතාරණෛකබද්ධ මානසං
ජගද්ගුරුං නමාමි සත්පථාගතං තථාගතම්.

විධෞජසා වීයීයමාන ශංඛනාද පූජනං
සුයාමදේවරාජවීජ්‍යමාන චාරුචාමරම්,
විරිඤ්චිනා ස්වමස්තකෙ කෘතාතපත්‍ර ධාරණං
විශුද්ධි දෛවතං සදෛව තං නමාමි ගෞතමම්.

ම හා ද යං  මහෝදයං මහාමතිං මහාගතිං
මහද්ද්‍යුතිං  මහෝද්‍යමං මහායතිං මහාධෘතිම්,
මහද්ව්‍රතං  මහාබලං මහද්විලාසශෝභනං
ම හා මු නිං  මහේශ්වරාභිවන්දිතං නමාමි තම්.

නි රා ශ්‍ර යං  නිරාශ්‍රවං නිරුද්ධසර්වලාලසං
නිරර්ගලං  නිරාමිෂේක්ෂණං නිරීහමව්‍යූතම්,
නිරුත්තරං  නිරාගසං නිරස්තතීර්ථදේශනං
නි රා ප දං  සදා නමාමි තං නිරාත්මවාදිනම්.

වනේ ජනිර්වනෙ තපෝවනෙ මතිප්‍රබෝධනං
වනේ රතිර්වනෙ මතිර්වනෙ විවේක බෘහනම්,
වනේ ච නිර්වෘතිඃ පරං මනෝවනාද් විනිර්ගතං
නමෝ මහාමනස්විනේ මුනීශ්වරාය තෙ නමඃ.’’

රාජකීය පණ්ඩිත විදුරුපොළ පියතිස්ස මාහිමියන් නිර්මාණය කළ මෙතෙක් අමුද්‍රිත සංස්කෘත භක්තිකාව්‍යය වන **භක්තිපඤ්චාශිකාවෙන්** උපුටා ගත් පද්‍ය පන්තියකි මෙ.

## රත්මලානේ පරිවේණාධිපති වලානේ ශ්‍රී ධම්මානන්ද නායක හිමියන්ට

1. සිරිසරණ සියප  ත
වැද බැති පෙම් ඩඩා සි  ත
ඇදුරු හිමි සඳ වෙ  ත
ලියා සැලකර එවමි මෙම ප  ත

2. වැඩිය දින අපැදු  රු
පටන් අද මේ වන තු  රු
නොදන කිසි තොරතු  රු
වෙසෙමු දුක්මුසු සිතින් නිරතු  රු

3. උප ඇදුරු සිල්න  ද
හිමිසඳ මෙ අප අනුබ  ද
අස්වසමින් නො ම  ද
වෙහෙස විඳිනාසේක මෙම ස  ද

4. පසුගිය දවස්ව  ල
වැළඳුන මෙමා කය තු  ළ
රෝගය වැඩී බ  ල
පෙළෙමි එ දුකින් ඉතා තදබ  ල

5. දෙපය බිම  තැබුමත්
රිසි ලෙස අහර  ගැනුමත්
බැරිය ඇඟ  කැසුමත්
වැඩිය එලෙසින් ම  පැසවීමත්

6. පොතපත  බැලීමය
වත පිළිවෙත  කිරීමය
රුති ලෙස  විසීමය
මෙකී කුමකුත් කළ නො  හෙම්මය

7. පින්පල ගෙවුනු ක  ල
පව්පල දෙන්ට වන් ක  ල
වුවත් අපි කල බො  ල
තවත් හිරිහැර මිස නොවේ ප  ල

8. ගෙවී රුදු පව්  පල
සැපත් කල යලි පින්  පල
සිඳ බිඳ රුපුන්  බල
විජය සිරි සැප ලඟා වෙයි  දුල

9. මෙ කරුණ දහම් ලෙ ස
සිහිකොට සිතින් නොවල ස
පැමිණි දුක් පැණි ර ස
සිතා විඳිනෙමි දුන් මෙ දුක් රැ ස

10. ඇදුරු බප හිමි ස ද
දුක දුක ඉන්ට සිතූ ලෙ ද
දින තෙවරුව නිබ ද
ලැබේ නම් වෙන සැපක් කුමට ද?

11. මෙලෙසින් වඩා බැති
මෙහි ආ මට එයින් නැති
ලෙඩ දුක් අඩු නො වෙති
ඉතින් මේවා තමයි හොඳ නැති

12. දුන සැප නො සැප ලෙ ස
ඔය පෙදෙස සැප නම් මී ස
නැතහොත් මීන් වෙන ස
වඩිනු මැනවිය මෙහි නොවී ලස

13. විසූ මෙහි පෙම්බ ර
සුරතල් රැහුම් කර ක ර
රස බස දෙන නිතො ර
ගිරා පැටියත් ගියේ මරු පු ර

14. ගිලන්ව කය වෙසෙන නමුත්
බඳින්ට කවි සිත ලෙඩ නැත්
ලියන්ට නම් අත පණ නැත්
කමන්න මෙහි වරද ඇතොත්

15. හිමි සඳ වෙත පිය පෙමැ ති
අතැවැසි සත දූනුම් ඇ ති
උපත "විදුරුපොල" නමැ ති
මෙ වගට "පියතිස්ස" ය ති

1907.08.13

## පිඹුරේ වාචිස්සර නාහිමිට

1. සරතා පචුරං චිරාගතං — ගුණජාතං කරුණාපරෙනිදං,
පහිණියති සාසනං මයා — ඉති වාචිස්සර සංයමිම්පති.

2. ලද්ධා සාසනපණ්ණන්තෙ හීයො පියවචොයුතං
වාචෙත්වා පීතිපාමොජ්ජං පාපුණිං මනසො පරං.

3. සමස්සමං සමායාතො සමං විමලබුද්ධිනා,
සුමංගලාරාම නාම මහං'දනි වසාමිහ.

4. මහා උපාසිකා මය්හං ජනනී ධම්මචාරිණී,
ලද්ධස්සාසාසි සුඛිනී දිට්ඨයෙ මයි නිරාමයා.

5. ඉධාගතස්ස මෙ ඡට්ඨයෙ දිවසෙ ජෙට්ඨභාතිකො,
මහාවෙජ්ජො'පගන්ත්වා මෙ විදිත්වා ව්‍යාධිතත්තනං.

6. පචිත්වා තෙලමබ්භඤ්ජි කායෙ මෙ දිවසත්තයං,
භිජ්ජිංසු පිළකා තෙන සුස්සිංසු ච වණාබිලා.

7. ගෙලඤ්ඤතො තථාපාහං වුට්ඨිතො නෙව තාවපි,
පතිකාරං ලභන්තොව චීතිනාමෙමි දුබ්බලො.

8. පුරෙතරං ත්වයා වුත්තා පුත්ථකා පෙසිතා මයා,
ලද්ධාලද්ධත්තමෙතෙසං ඤාතුමිච්ඡාමිදනාහං.

9. විනා හුත්වාන තුම්හෙහි පට්ඨායාගත කාලතො,
අහො ! කථංකථම'පි වාසාරා'තික්කමන්ති මෙ.

10. දූරට්ඨාපි ච වො නිච්චං මනසාසම්මුඛී කතා,
සුඛං පදිස්සථා දස ගතාව පටිබිම්බිතා.

11. සිස්සතුජොපි බො මය්හං සුඛිතො හොතු රෙවතො,
තුම්හේපි සුඛිතා හොථ සබ්බෙව සුහිතාසයා.

12. රෙවතෙ ත්වයි චඤ්ඤෙසු සබ්බෙසුපි සමාසයො,
සමචිත්තො සද හොමි පත්ථෙමි ච සමං සුඛං.

13. පවත්තිනො කථෙතබ්බා රෙවතස්ස නිරාකුලා,
පරඤ්චෝවදිතබ්බො සො තයා හිතගවෙසිනා.

14. ඉතො බහුතරං නත්ථි වත්තබ්බං කිඤ්චි මෙ ඉධ,
වත්තුං බහු න සක්කොමි සන්තම්පි යදි දුබ්බලො .

15. ඉතීදං පියතිස්සේන යතිනා පියසීලිනා
මයා වජිරපාලවහ – ගාමජාතෙන පෙසිතන්ති.

1907.09.14

## රත්මලානේ පරමධම්මචේතිය පරිවෙණාධිපති වලානේ ධම්මානන්ද නාහිමිට

### ස්වස්ති

1. නමඃ ශ්‍රී ගුරුවෙ සර්වශර්ම සෞභාග්‍ය හෙතවෙ,
චින්තා ගණ්‍යගුණෞඝාය යොගීන්ද්‍රාය නමෝ නමඃ.

2. හෘදබ්ජෙ ගුරුපාදබ්ජං නිධාය විධිවන්මයා,
ශාසනං ප්‍රියතිෂ්‍යෙණ යතිනෛතත් සුලිඛ්‍යතෙ.

3. භ්‍යොමත්පාණිතලප්‍රාප්තමහවද්භ්‍රූර්ම සංහතෙඃ,
වාරණං පරමානන්ද කාරණං ගුරුශාසනම්.

4. ප්‍රභූත කරුණාශීතවචඃ ශීතාංශුධෘෂ්ණිභිඃ,
සමායොගාදිවෞදතං සර්වතශ්චිත්‍රවර්ණකම්.

5. තච්චවාච්‍යසමප්‍රාපං දුරාපං ප්‍රීතිමාදිතඃ,
මත්ප්‍රෙෂිත භිෂග්ග්‍රන්ථ සාරත්වමුරරීකෘතම්.

6. තතඃ සදුපදේශං මෙ ප්‍රත්‍යුක්තං චෛත්‍යචාරිකාම්,
ගුරොරධ්‍යාශයං චෛත්‍ය චාරිකා ගමණෙ කථා.

7. ද්වයමෙව පුනර්දුඃඛාවහං ජාතං තථා'පි මෙ,
ගුරොරකල්‍ය ශ්‍රවණං දුර්දශා රෙවතස්‍ය ච.

8. යදුක්තං තෘණපර්ණෙස්තු චණ්ඩමාරුත ඝට්ටනම්,
න ක්ලෙති විවාදදි හෙතොර්මද්ගුරුණා වචඃ.

9. තත්‍රානිලොපමස්තිෂ්‍යඃ පරවාදී තෘණොපමඃ,
ඝට්ටනං තස්‍ය තෙනෛහ මාභූදිති ගුරොර්මතම්.

10. සත්‍යං බහුමතං තත් ස්‍යාද් ගුරු වාක්‍යමුදහෘතම්,
රාෂ්ට්‍රෙස්මින් පණ්ඩිතංමන්‍යඃ ප්‍රමාණං මම කො භවෙත් ?

11. මන්‍යෙතදන්‍යථෛවාහං පරවාදස්තෘණොපමඃ,
නෛරායුෂ්‍යං ච දෞර්බල්‍යමස්ත්‍යාධර්මයොර්යතඃ.

12. සත්‍ය ධර්මප්‍රවාදස්තු නෛව චණ්ඩානිලොපමඃ,
හිමානිලොපමඃ කින්තු දුර්වාදතෘණනාශනාත්.

13. අධර්මවාද භයස්ත්වාත් ශාසනානුග්‍රහාන් මම,
න දෙෂාය භවෙද් යස්මාත් පරවාද නිරාකෘතිඃ.

14. තතඃ ස්වභාවතොයච්චාප්‍යනල්ප ක්ලේශකාරණම්,
තථාපි ධර්මවාදෙන කුර්වේ දුර්වාදමර්දනම්.

අපරඤ්ච

15. ගුරවෙ ප්‍රහිතං යත්තු මදන්තෙවාසිනා පුරා,
ලෙඛනං ප්‍රාභෘතං චෛව නාම්නා විමලබුද්ධිනා.

16. තයොරලාභ ශ්‍රවණාදභවන්මානසව්‍යථා,
තස්‍ය කො? හෙතුරප්‍රාප්තෙ ස්තයොරිති මමං පි ච.

17. වර්තතෙ සෝ්ධුනා ශික්ෂාපරොධ්‍යයන තත්පරඃ,
අඞ්ගොත්තරනිකායස්‍යාධීතවානෙකකාවයිම්.

18. තථා බාලාවතාරස්‍ය කෘදන්තාන්තමධීතවාන්,
චතුර්වර්ණාදිවර්ගාන්තාමභිධානප්‍රදීපිකාම්.

19. අථො මංගල ධර්මස්‍ය දෙශනාර්ථං සමුද්‍යතඃ,
සූත්‍රාන්තමප්‍යධියානො ධර්මචක්‍රප්‍රවර්තනම්.

20. ගුරු ප්‍රසාදත් සර්වාර්ථ සිද්ධිරිත්‍යෙව මෙ මතිඃ,
අස්‍යාපි දෝෂ ශාන්තිස්තත් ප්‍රභාවාද් භවතාදිති.

1908.03.23

# පොත්වැල

**මහානායක හිමියන්ගේ නිර්මාණ හා සංස්කරණ පොත්වැළ අනුපිළිවෙළිනි.**

| | පොතේ නම | | | | ප්‍රකාශිත වර්ෂය |
|---|---|---|---|---|---|
| 1. | අභිනවසාසනවංසො | ... | ... | ... | ක්‍රි.ව. 1900 |
| 2. | දෘෂ්ටාන්තශතක සන්නය | ... | ... | ... | ක්‍රි.ව. 1901 |
| 3. | මුම්මවංශ කතිකාවත | ... | ... | ... | ක්‍රි.ව. 1902 |
| 4. | සුගතාලංකාරො | ... | ... | ... | ක්‍රි.ව. 1912 |
| 5. | නෙත්තිප්පකරණට්ඨකථා | ... | ... | ... | ක්‍රි.ව. 1921 |
| 6. | මහාකස්සපචරිතය | ... | ... | ... | ක්‍රි.ව. 1924 |
| 7. | සංයුත්තනිකායට්ඨකථා (පඨමොභාගො) | | ... | ... | ක්‍රි.ව. 1924 |
| 8. | දිට්ඨන්තරතනාවලිය | ... | ... | ... | ක්‍රි.ව. 1926 |
| 9. | ජාතකට්ඨකථා (පඨමොභාගො) | | ... | ... | ක්‍රි.ව. 1926 |
| 10. | සංයුත්තනිකායට්ඨකථා (දුතියොභාගො) | | ... | ... | ක්‍රි.ව. 1927 |
| 11. | ජාතකට්ඨකථා (දුතියොභාගො) | | ... | ... | ක්‍රි.ව. 1928 |
| 12. | ව්‍යාකරණසද්දසින්ධු (ප්‍රථම භාගය) | | ... | ... | ක්‍රි.ව. 1929 |
| 13. | සංයුත්තනිකායට්ඨකථා (තතියොභාගො) | | ... | ... | ක්‍රි.ව. 1930 |
| 14. | ව්‍යාකරණසද්දසින්ධු (ද්විතීය භාගය) | | ... | ... | ක්‍රි.ව. 1931 |
| 15. | ජාතකට්ඨකථා (තතියොභාගො) | | ... | ... | ක්‍රි.ව. 1931 |
| 16. | ජාතකට්ඨකථා (චතුත්ථොභාගො) | | ... | ... | ක්‍රි.ව. 1934 |
| 17. | මහානෙක්ඛම්මචම්පූ | ... | ... | ... | ක්‍රි.ව. 1935 |
| 18. | ජාතකට්ඨකථා (පඤ්චමොභාගො) | | ... | ... | ක්‍රි.ව. 1935 |
| 19. | ජාතකට්ඨකථා (ඡට්ඨමොභාගො) | | ... | ... | ක්‍රි.ව. 1937 |
| 20. | ව්‍යාකරණසද්දසින්ධු (තෘතීයභාගය) | | ... | ... | ක්‍රි.ව. 1939 |
| 21. | ජාතකට්ඨකථා (සත්තමොභාගො) | | ... | ... | ක්‍රි.ව. 1939 |
| 22. | කමලඤ්ජලි | ... | ... | ... | ක්‍රි.ව. 1940 |
| 23. | English Pali Dictionary | ... | ... | ... | ක්‍රි.ව. 1949 |
| 24. | ජාතකපාළි (පඨමොභාගො) | ... | ... | ... | ක්‍රි.ව. 1954 |
| 25. | ජාතකපාළි (දුතියොභාගො) | ... | ... | ... | ක්‍රි.ව. 1955 |

# ලිපිවැල*

| මාතෘකාව | ජනමාධ්‍යය | වකවානුව |
|---|---|---|
| ඉංග්ලිෂ් පාළි ශබ්දකෝෂය දන් කොහොමද ? | සිංහල බෞද්ධයා | 1943 |
| ඉංග්ලිෂ් පාළි ශබ්ද කෝෂයක් | සිළුමිණ | 1944 |
| ඉතා හොඳ ආගම කුමක්ද ? | සිංහලේ | 1924 සැප්: 15 |
| ඌව හඩ කලාපය | ලංකා මිත්‍රයා | 1942 පෙබ: මාර්තු |
| ගත් පැසසුම් | වර්තමාන සිංහල කවීන්ද්‍රයෝ (I) | 1948 ජන: 15 |
| ගෘහස්ථයන්ගේ සම්පත් | පුරසඳ සහරා | 1921 |
| ඡන්දය පාවිච්චිය තහනම් | සිංහල බෞද්ධයා වෙසක් ක. | 1920 දෙසැ: 31 |
| ජගත් ගුරු කවරේද ? | එම | 1929 මැයි 18 |
| ජාතකපොත්වහන්සේ | වී. පියතිස්ස සාහිත්‍ය අංකය, (උධෘතයකි) | 1961 |
| පණාමඤ්ජලි පූජනා | සිංහල බෞද්ධයා | 1946 මැයි 11 |
| පැරණි සිංහලයන්ගේ ආචාර විධි | සිංහල මිත්‍රයා | 1929 මැයි 20 |
| පාළි භාෂාභිවෘද්ධිකාමී බෞද්ධ මහා ජනතාවට සුභාරංචියක් | සිංහල බෞද්ධයා | 1944 මැයි 6 |
| පාලි භාෂාභිවෘද්ධිකාමී බෞද්ධ මහා ජනතාවට සුභාරංචියක් | එම | 1944 |
| පෙළ අටුවා දෙකට දෙස් කියන්නෝ | සිළුමිණ | 1937 ජූලි 29 |
| එම | එම | 1937 අගෝ: 22 |
| එම | එම | 1937 සැප්: 19 |
| එම | එම | 1937 ඔක්: 03 |
| එම | එම | 1937 ඔක්: 10 |
| එම | එම | 1937 ඔක්: 24 |
| එම | එම | 1937 අගෝ: 08 |
| ප්‍රතිසංස්කරණයට පෙර කළ යුත්තක් | දිනමිණ | 1937 ජූලි 14 |
| එම | එම | 1937 ජූලි 31 |
| එම | එම | 1937 අගෝ: 07 |
| එම | එම | 1937 අගෝ: 14 |
| ප්‍රාචීන භාෂා දියුණුව (1941 ලියන ලද්දකි) | සිංහල බෞද්ධයා | බු.ව. 2505 දුරුතු |
| බුද්ධ කාරක ධර්ම | සිරිසර සහරා | 1920 මැයි 01 |
| බුද්ධස්තොත්‍ර | බුද්ධජයන්ති සංග්‍රහය (උධෘතයකි) | 1956 මැයි 01 |
| බෞද්ධ සිද්ධස්ථානවල ආදායම් | දිනමිණ | 1937 |
| එම | එම | 1937 ජූලි 31 |
| මගේ පළමුවන ඉන්දියා ගමන | සිරිසර සහරා | 1920 අගෝ: 01 |

* මහානායක හිමිපාණන්ගේ ධර්මශාස්ත්‍රීය ලිපි සිය ගණනක් නොව ඊටත් අධික විශාල සංඛ්‍යාවකි. මෙහි ඇතුළත් කර ඇත්තේ සොරකුරු සපයා ගත හැකි වූ කීපයක් පමණිම.

| | | |
|---|---|---|
| මගේ පළමුවන ඉන්දියා ගමන | සිරිසර සහරාව | 1920 අගෝ: 16 |
| එම | එම | 1920 සැප්: 16 |
| එම | එම | 1920 ඔක්: 01 |
| එම | එම | 1920 ඔක්: 16 |
| එම | එම | 1920 නොවැ: 01 |
| එම | එම | 1920 නොවැ: 16 |
| එම | එම | 1920 දෙසැ: 01 |
| එම | එම | 1921 පෙ: 16 |
| මගේ ගිලන්බව හා විවේක කාලය | සිංහල බෞද්ධයා වෙසක් ක. | බු.ව. 2483 වෙසක් |
| මගේ ප්‍රීතිමත් වන්දනා ගමන | සිංහල බෞද්ධයා | 1924 ජූලි: 05 |
| එම | එම | 1924 ජූලි: 12 |
| මා කැමති පොත, වදන්කවි පොත | වි: පියතිස්ස සාහිත්‍ය අංකය (උධෘතයකි) | 1961 |
| රහුපොළ ශ්‍රී සුජාත නාහිමිපාණන් වහන්සේගේ දීර්ඝ ලිපිය | බෞද්ධ බලය | 1938 |
| ලක් බුදුසසුන | ලක් බුදුසසුන | 1947 ජූනි: 02 |
| ලක්දිව අපරාධ වළක්වන්නේ කෙසේද ? | සිංහල මිත්‍රයා | 1932 නොවැ: 18 |
| ලංකාවේ සංඝරාජ පදවිය මට ලැබුනොත් | සිංහල බෞද්ධයා | 1938 මාර්තු 19 |
| වෛද්‍යාචාර්ය ශ්‍රී හේවාවිතාරණ ගුණානුස්මෘති | සිංහල බෞද්ධයා | 1929 අප්‍රේ: 27 |
| ශාසන ධර්ම විචාරකයන්ට වචනයක් | සිංහල බෞද්ධයා | 1927 |
| එම | එම | 1927 ජූලි 31 |
| සමතිස් පැරුම | සිරිසර සහරාව | 1919 මැයි 13 |
| සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය | සිරිසර සහරාව | 1919 මැයි 13 |
| සිංහල ජාතියේ දියුණුවට කුමක් කළයුතුද? | සිංහල බෞද්ධයා | 1929 |
| | සරසවි සඳරැස | 1905 අගෝ: 07 |
| සූත්‍ර පිටකය | සරසවි සඳරැස හා සිංහල මිත්‍රයා | 1929 මැයි 22 |
| සුරාබද්ද ව්‍යවස්ථාව | සිංහල බෞද්ධයා | 1912 ජූනි 29 |
| සංඝයාට වචනයක් | සිංහල බෞද්ධයා වෙසක් ක: | 1936 මැයි 05 |

# පදවැල

## අ


අග්ගාරාමය, පොල්වත්ත, 194
අටතිස්මහල, 39, 40,
අටුවා ග්‍රන්ථ මාලාව, හේවාවිතාරණ, 156,
අත්ථදස්සී, වරකාදෙණ්ඩෙ, 7,
අධ්‍යාපන අධ්‍යක්ෂ ත්‍යාගය, 48,
අධිකරණ විනිශ්චය, 100,
අනුරාධපුරය, 121,
අප්පුහාමි වෙදදුරු, 33,34,
අධිභාණ කිරීම, 100,
අභිනව සාසනවංසො, 45, 98, 173, 216,
අමරපුර නිකාය, 6, 7,
අමරපුර භික්ෂුවංශය, 21,
අමරපුර වංශය, 5,
අමිතසාර, පනාකන්නියේ, 14,34, 47, 61,
අලවතුගොඩ, පී. බී. 97, 176,
අලුවිහාරය, 121,
අවුකන, 121,
අස්ගිරි විහාරය, 5, 189,
අස්ගිරි (විහාර) පාර්ශ්වය, 8, 10,
ආඞ්ගලිපාළිසද්දකොසො 8, 90,
ආනන්ද ගීති, 78,
ආසියානු මහා සම්මේලනය, 123
ඇටෝර්නි ජනරාල්තුමා, 64,
ඇමෙරිකා එක්සත් ජනපදය, 22,
ඇළපාත, 5,


## ඉ


ඉතා හොඳ ආගම කුමක්ද? 217
ඉද්දමල්ගොඩ 5.
ඉන්දවිමලතිස්ස මහා ස්ථවිර, 3.
ඉන්දියාව, 22.
ඉන්දියාවේ ශාස්ත්‍රීය සමිතිය, 199.
ඉංග්‍රීසි – ඉන්දීය ශබ්දකෝෂය, 199.
ඉංග්‍රීසි පරිවර්තනය (කමලඤ්ජලි), 102, 106.
ඉංග්‍රීසි පාළි ශබ්දකෝෂය, 15, 81, 82, 86, 88, 90, 107, 176, 178, 217
ඉංග්‍රීසි පිටපත්, 114, 115,
ඉංග්‍රීසි භාෂාව, 35,
ඉංග්‍රීසි සංස්කරණ, 110.
ඉංග්‍රීසි සංස්කෘත ශබ්දකෝෂය, 86
ඉංග්‍රීසි සිංහල ශබ්දකෝෂය, 86.

## උ

උගත් භික්ෂූන් හා ශාසනික කටයුතු, 100
උඩරටඅමරපුර නිකාය, 1, 3, 6, — 10, 12, 22, 60, 61, 69, 75, 98, 99, 123, 162, 182, 191.
—සමගවය හා ව්‍යාප්තිය, 1,
උඩරට අමරපුර සාමග්‍රී සංඝසභාව, 21,
උඩරට නීති ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, 64
උඩරට ප්‍රදේශය, 5,
උඩුකිඳ අමරපුර නිකාය, 21.
උඩුකිඳ කොට්ඨාශය, 8.
උත්තරානන්ද, ඉඳුරුවේ, 78.
උද්දේසවාරය, 140.
උපාලි මහා ස්ථවිර, 2.
උභයශේඛර ස්වර්ණ මුද්‍රිකාව, 14.
ඌව දිශාව, 19, 98.
ඌව හඩ කලාපය, 217.
ඌවේ අමරපුර නිකාය, 9, 19, 20, 21.
ඌවේ භික්ෂු සම්මේලනය, 65.

## එ

එක්නැළිගොඩ, 5.
එක්නැළිගොඩ මහදිසාවේ, 62.
එල්ලාවල, 5.
ඒකනායක, උඩුවර, 183.
ඒකනායක ඩු. බී. 183.

## ක

ක්ෂැවියර්ස් මහා විද්‍යාලය, 157, 159, 195, 196.
කතිකාවත, 100.
කන්දේවිහාරය, බෝගහපිටිය, 5.
කඳුරුගමුවේ, රටේ මහතා කේ. බී. 62.
කමලඤ්ජලි, 15, 39, 98, 101, 105, 120, 178, 180, 182, 216.
කල්කටාව, 175, 198.
කාලිදාස (මහාකවි), 70.
කාව්‍ය නිර්මාණය, 35.
කැනඩාව, 22.
කැටගොඩ ගුරුන්නාන්සේ, 39.
කීර්ති ශ්‍රී රාජසිංහ, 2, 57.
කුමාරණතුංග, මුනිදාස, 167, 178, 179, 182, 200, 203.
කුසුමදේව, මහාකවි, 42, 43, 93.
කොන්සයිස් ඔක්ස්ෆෝඩ් ඩික්ෂනරි, 86.
කොට්ටඉඹුල්වල ගල්විහාරය, 9.
කෝෂ කෘති, 68.
කෘෂ්ණා ශාස්ත්‍රීතුමා, එච්. 169.

## ග

ගණපති පූජාව, 33.
ගණපති ශාස්ත්‍රී, 169, 179.
ගත් පැසසුම, 217.
ගම් කාර්ය සභාපති, උඩ පළාත, 183.
ගම්පහ කෝරළය, 8.
ගයිගර් විල්හෙල්ම්, 179.
ගාමිණී විද්‍යාලය, 86.
ගුණරතන, පානදුරේ, 62.
ගුණරතන, මුල්ලේගම, 189.
ගුණරතන, රඹුක්පල්ලාවේ, 45.
ගුණරතන, වැලිතර, 5.
ගුණවර්ධන, ඩබ්. ඇෆ්. 46.
ගුණසේකර, ඩී. එච්. 182.
ගුණසේකර ඩී. ජේ. 182.
ගෘහස්ථයන්ගේ සම්පත්, 217.
ගංගාරාමය, අංදෙනිය, 9.
ගංගාරාමය, හුණුපිටිය, 173, 174.

## ච

චන්ද්‍රවිමල, රේරුකානේ, 19.
චම්පූ කාව්‍ය, 68.
චෙම්බර්ස් ටුවෙන්ටියත් සෙන්චරි ඩික්ෂනරි, 86.
ඡන්දය පාවිච්චිය තහනම්, 217.

## ජ

ජගත්ගුරු කවරේ ද? 217.
ජනානන්ද විහාරය, 17.
ජපානය, 22.
ජයතිලක, සර් ඩී. බී. 87, 88, 164, 176, 199.
ජයතුජිනතිස්ස, බෝගහවත්තේ, 3, 4.
ජාතක අටුවාව, 119, 184.
ජාතකට්ඨකථා, 113, — 118, 168, 216.
ජාතකපාළි, 118, 168, 184, 185, 216.
ජාතක පොත් වහන්සේ, 217.
ජාත්‍යන්තර කීර්තිය, 123.
ජිනරතන, දෙවුන්දර, 174.
ජීවන චරිත සියතින් ලිවීමේ අගය, 205.

## ඤ

ඤාණවිමලතිස්ස, අඹගහපිටියේ, 2, 3.
ඤාණරතන, දමුණුමැයේ, 72.
ඤාණවිමලතිස්ස, පානදුරේ, 62, 175.
ඤාණානන්ද, මාදෝවිට, 193.
ඤාණාභිවංස, මහාධම්ම රාජාධි රාජගුරු, 2, 3.

ඩ

ඩොනමෝර් ආණ්ඩුක්‍රමය. 64.
කොමිෂන් සභාව, 64.

ත

තපොධනාරාමය, තුප්පිටිය 11, 15, 61.
තපොධනාරාමය, මූලමහාවිහාරය, සපුගොල්ල, 10, 11, 20.
තාපස ව්‍යාපාරය, 171.
ත්‍රිපිටක ධර්ම සංගායනාව, විද්‍යාලංකාර, 165.
ථෙරවාද සම්ප්‍රදය, 108.

ද

ක්ෂිණ භාරතීය ශිලාලේඛන, 169.
දඹුල්ල, 121.
දහම් පාසැල් අධ්‍යාපනය, 21.
දළදා මාලිගය, 121.
දිට්ඨන්තරතනාවලි, 100, 216.
දිනමිණ (පත්‍රය) 81.
දිවිගාල්පිටිය, 33, 39, 205,
දූම්බර භාරසියපත්තුව, 9.
දේවරක්ඛිත, අලවතුගොඩ, 18, 66, 181.
දේවරක්ඛිත පඬිතුමා, බටුවන්තුඩාවේ, 58, 59.
දේවානන්ද, අම්බලන්ගොඩ, 62, 175.
දෘෂ්ටාන්තශතකය, 42, 93 — 95, 101.
දෘෂ්ටාන්තශතක සන්නය, 43, 216,
දෘෂ්ටාන්තාලංකාරය, 101.
ද්‍රවිඩ භාෂාව, 19,

ධ

ධර්මපාල, අට්ඨකථාචාරිය, 108, 139.
ධර්මපාලතුමා, අනගාරික, 36, 66, 68, 69, 74, 77, 112, 115, 175, 198.
ධර්මරත්න ඇම්. (ලක්මිණි පහන් කතුතුමා) 204.
ධම්මක්ඛන්ධ, කපුගම, 3.
ධම්මජෝති, බෝගහපිටිය, 3—7, 9, 10.
ධම්මානන්ද, කොත්මලේ, 175.
ධම්මානන්ද, දම්නන, 12, 13.
ධම්මරතන, රඹුපොල, 45.
ධම්මසිද්ධි, මාතලේ, 191.
ධම්මානන්ද, ලුණුපොකුණේ, 190.
ධම්මානන්ද, වලානේ, 41, 43, 44, 47, 58, 59, 61, 70, 93, 97, 211, 214.
ධර්මවිජය ප්‍රතිපත්තිය, 1.
ධර්මශාස්ත්‍ර පරම්පරාව, 57, 59,
ධර්මශාස්ත්‍රීය විවිධ කෘති, 93.

ධර්මාමිෂ සම්භෝගය, 21.
ධර්මාරාම, කරතොට, 57--59.
ධර්මාලෝක, රත්මලානේ, 41, 58, 59.
ධර්මාශෝක අධිරාජයා, 1.

## න

නන්ද, දික්කාපිටියේ, 66, 182.
නන්ද, හුණුවල, 5, 11
 කාව්‍යය, 13.
නන්දරාම, පරණගම,. 18.
නම්බපාන තොට, 6.
නවාංග ශාස්තෘ ශාසනය, 139.
නාගාර්ජුන, 125, 158.
නායක්කර් වංශිකයන්, 2.
නාරද, කපල්ලේවෙල, 12, 20.
නාලන්ද මහා විද්‍යාපීඨය, 161.
නිකාය ප්‍රවෘත්ති, 100.
නිකාය වාර්තාව (1986) 21.
නිද්දේසවාරය, 140.
නිධන ප්‍රාප්තිය, 183.
නිර්මාණාත්මක කෘති, 68.
නිවේදන පත්‍රය, 63.
නිව් ඉලෙස්ට්‍රෙටඩ් ඩික්ෂනරි, 86.
නිශ්ශංක පී. (පුවත්පත් කතු) 168.
නූතන පාළි චම්පූමහාකාව්‍යය, 72.
නෙත්තිප්පකරණ අටුවාව, 64, 88, 108.
නෙත්තිප්පකරණට්ඨකථා, 108, 216.
නෙත්තිප්පකරණය, 139.
 නොපළ වූ පොත්, 120.
න්‍යග්‍රෝධාරාමය, කිනිගම, 18.

## ප

පඤ්ඤානන්ද, වැඹිකුඹුරේ, 14.
පඤ්ඤාසාර, ජිනවංශ, 12.
පටිනිද්දේසවාරය, 140.
පණාමඤ්ජලි පූජනා, 217.
පණ්ඩිත උපාධි, 19.
පරමධම්ම චේතිය (පරමධර්ම චෛත්‍යය) පිරුවන, 16, 41, 43, 44, 46, 58, 59, 60, 70, 93, 173.
පර්ගිසන් මහා විද්‍යාලය, 157, 159.
පර්යාප්ති ධර්මය, 139.
පහත රට අමරපුර නිකාය, 62.
පහත රට නායක පදවිය, 58.
පංචවිංශතිපූර්ති උත්සවය, 164, 176, 177, 191, 194.
පාරිභාෂික ශබ්දකෝෂය, 76, 81.

පාළි ත්‍යාගය, 48.
පාළි නිඝණ්ඩුව, 206.
පාළි ප්‍රබන්ධකරණය, 35.
පාළි භාෂාභිවෘද්ධිකාමී බෞද්ධ ජනතාවට සුභාරංචියක්, 217.
පාළි භාෂාව, 76, 79, 80, 83, 84, 86, 89, 100, 102, 157.
පාළි මහාබෝධිවංශය, 166.
පාළි ව්‍යාකරණ කෝෂය, 80.
පාළි සාහිත්‍යය, 69, 99, 102.
පංශුකූල විනිශ්චය, 66.
පැරණි සිංහල සාහිත්‍යය, 116.
පැරණි සිංහලයන්ගේ ආචාර විධි, 217.
පැල්මඩුල්ලේ විද්‍යාස්ථාන, 58.
පැවිදි උපසම්පද කිරීම, 100.
පියරතන, පන්නිල, 65.
පිරිත් දෙසීම, 100.
පිරිවෙන් (නිකායික) 21.
පීරිස් පෝල් ඊ. 123.
පුස්කොළ ලිවීම. 39, 40.
පූනා නගරය, 123, 124.
පූනා නුවර පැවැත් වූ ප්‍රාචීන මහා පණ්ඩිතසංගමය, 157, 169, 170, 173, 175, 179.
පෙටකොපදේශය, 139.
පෙරේරා යූ. ඒ. ඇස්. 186.
පෙළ අටුවා දෙකට දෙස් කියන්නෝ, 217.
පොන්නම්බලම් අරුණාචලම්, 123.
පොහොය පවාරණ කිරීම, 100.
පොළොන්නරුව, 121.
ප්‍රකාශ පත්‍රය, 62.
ප්‍රඥාසාර, කිරිඹරුවේ, 18.
ප්‍රතිසංස්කරණ යෝජනා, 185.
ප්‍රථම ධර්ම සංගායනාව, 139.
ප්‍රාචීන භාෂොපකාර සමාගම, 46, 65, 207, 208.
ප්‍රාචීන භාෂා දියුණුව, 217.
ප්‍රාචීන භාෂොපකාර සමිතිය, 14.
ප්‍රාචීන විභාග පරිපාටිය, 46.
ප්‍රාදේශීය සංඝ සභා, 22.
ප්‍රාරම්භ විභාගය, 46.
පෘතුගීසීන්ගේ ආගමනය, 2.
පෘතුගීසි ආගමික ප්‍රතිපත්තිය, 2.

බ

බණකතා සාහිත්‍යය, 113.
බණ්ඩාර, අත්තරගම රාජගුරු, 56—59.
බණ්ඩාර කේ. මුණසිංහ, 16.
බදුලු දිස්ත්‍රික්කය, 8.

බරොස් ඇස්. ඇම්. 46.
බාරස කාව්‍යය, 58.
බාපට පී. වී. 157, 159.
බාලාවතාරය, 206.
බැරෝඩා මහා විද්‍යාලය, 157, 159.
බුද්ධකාරක ධර්ම, 217.
බුද්ධදත්ත, පොල්වත්තේ, 194.
බුද්ධදත්ත, විදුරුපොළ, 66, 181.
බුද්ධරක්ෂිත, භාරතයේ ශාණ්ඩිල්‍යගෝත්‍රික, මහාචාර්ය, 103, 107, 161, 182
බුද්ධස්තොත්‍ර, 217.
බුරුමරට, 2, 139, 157.
බුරුම රට අමරපුරය, 3.
බුරුම ඡට්ඨසංගායනාවේ ලේඛකාධිකාරිතුමා, 197.
බුරුම ධර්ම සංගායනාව, 161, 163.
බුරුම සංස්කරණය, 110.
බෞද්ධ න්‍යාය ශාස්ත්‍රය, 15, 124, 125, 138. 139, 156, 158, 159.
බෞද්ධ බලය, (ප්‍රවෘත්ති පත්‍රය), 6.
බෞද්ධ විනය පාළිය, 124.
බෞද්ධ සිද්ධස්ථානවල ආදායම්, 217.
බ්ලේක්, සර් හෙන්රි ආතර්, 46.

### භ

භක්තිකාව්‍ය, 15, 68, 98, 102, 180, 210.
භක්තිපඤ්චාශිකා, 15, 120, 210.
භගවත් ඇන්. කේ. 124, 157—159, 179, 195, 196, 208.
භණ්ඩර්කාර් සර් රාමක්‍රිෂ්ණා ගෝපාල්, 124.
භාරත දේශය, 20.
භාරතයේ ප්‍රධාන සංඝනායක, 182.
භාෂාත්‍රය ත්‍යාගය, 48.
භාෂාව හා සාහිත්‍යය, 120.
භික්ෂු ඡන්දය ගැනයි, 64, 165.
භික්ෂු දේශපාලනය, 165.
භික්ෂු රෙජිස්ටරය, 63.

### ම

මගේ ගිලන්බව හා විවේකකාලය, 217.
මගේ පළමුවන ඉන්දියා ගමන, 121, 217.
මගේ ප්‍රීතිමත් වන්දනා ගමන, 122, 213.
මධ්‍යම දිශාව, 19.
මයූරපාද, 209.
මධ්‍යම විභාගය, 47, 48.
මහගොඩ නාහිමි, 166.
මහනුවර අවධිය, 2.
මහවලතැන්න, 5,
මහා කාශ්‍යප චරිතය, 68, 88, 175, 178, 179, 208, 216.
මහා කාශ්‍යප චරිත මහා කාව්‍යය, 69,

මහා කාව්‍ය ලක්ෂණ, 68,
මහා නෙක්ඛම්මචම්පු, 71, 88, 181, 189, 204, 209, 216,
මලලසේකර ජී. පී. මහාචාර්ය, 69, 88, 90, 103, 106, 178, 202.
මහා කාත්‍යායන ස්ථවිර, 138, 139,
මහා කාව්‍ය, 68.
මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ, 68.
මහා තපොධනාරාමය, හිඳගොඩ, 9—11.
මහානායක ධුරය (පදවිය) 10, 13, — 18, 60, 61.
මහා මංගල සීමාව, 3,
මල්වත්ත, මහනුවර, 124.
මල්වතු අස්ගිරි උභයවිහාරය, 5,
මල්වැස්සාගොඩ විහාරය, රත්ගම, 7.
මහාබෝධි සමාගම, 182.
මහා විහාරීය භික්ෂුවංශය, 1,
මහා විහාරීය, සංඝ පරම්පරාව, 2.
මාඹය උදකුක්ඛේප සීමාව, 7,
මා කැමති පොත, 217.
මාගධී භාෂාව, 89, 204.
මා හැඳුම, 79.
මාහිමි පරපුර, 185,
මිරිලාපුරය දවීම, 124,
මිහිඳු මහ රහතන් වහන්සේ, 1, 5
මිෂනාරීන්ගේ බලය, 2,
මිෂනාරි ක්‍රියාදමය, 12,
මීගමුව, 9,
මුඛ බන්ධය, 108—112,
මුණසිංහ ඇ. ස්. කේ. 110, 112, 115, 116,
මුතුරාවැල්ලේ උදකුක්ඛේප සීමාව, 9,
මේධංකර, ගාල්ලේ 59,
මොලමුරේ, 5,
මොරපේ දේවාලය, 176,
මොන්ඩස්වී ෂාත්ඕ, 124, 158,
මුරම්ම දේශය, 4,
මුරම්මවංශ කතිකාවත, 99, 216'

ය

යටන්වල මහා නා හිමි, 5,

ර

රතනජෝති පුස්තකාලය, විදුරුපොළ, 16,
රතනජෝති විදුරුපොළ, 11—15, 18,33—38, 42, 44, 45, 47, 59, 60, 98, 99
රතනපාල බැදිගම, 109,
රතනපාල මොළහැර, 13,
රඹුක්පොත , 5,
රත්නායක, පී. බී. , 176

රඹුපොළ ඌව පරණගම, 8
රඹුපොළ සුජාත ...ලිපිය, 217
රාජකීය ආසියාතික සමිතිය, 65, 123,
රාජකීය සංස්කෘත විද්‍යාලය, කල්කටා, 157
රාජසිංහ රජ, 69
රාජ්‍ය මන්ත්‍රණ සභාව, 64
රාජ්වදේ සී. වී. 124, 157 – 159,

ල

ලක්දිව අපරාධ වළක්වන්නේ කෙසේද? 217
ලක්දිව පළමුවන පඬිරුවන, 46,
ලන්දේසි, 2
ලක්බුදු සසුන, 217
ලක්දිව ජාතික සංගමය, 183
ලංකා පාළි සාහිත්‍යය 69
ලංකා විශ්ව විද්‍යාලය, 83,84, 90, 202,
ලංකාවේ සංඝරාජ පදවිය මට ලැබුණොත්, 217,
ලැනරෝල් ජූලියස් ද, 177, 201,
ලූසිහාමිනේ කේ. පී. 16,
ලෙව්කේ රාළහාමි, 57,
ලොකුබණ්ඩාර රත්නායක, 17,
ලෝරන්ස් අප්පුහාමි, 16,
ලෝරන්ස් විද්‍යාලය, 19,

ව

වජ්‍රඥාන (වජිරඤාණ) පැළැණේ, 72, 92, 174, 192,
වජිරාරාමය, බම්බලපිටිය. 192,
වනිගරත්න ඩී. ජී. ඇස්., 86,
වනසුන්දර ඩී. මුදලි. 77, 179,
වන්නකුරාළ, යාපාමුදියන්සේලාගේ, 18
වලපනේ රටේ මහත්මයා, 97, 176,
වලපනේ ශාස්ත්‍රීය සංගමය, 18,
වාචිස්සර, පිඹුරේ, 213,
වාරිගම නිළමේ, 5,
වාසවදත්තා. 18,
වැලිවිට තෙරණුවෝ 2,
- සරණංකර බ
විජයසිරිවර්ධනාරාමය, ගනේගොඩැල්ල. 12,
විජිතපුරය 121,
විදුරුපොළ නා හිමියනි. 186,
විද්‍යානන්ද පිරුවන, නිට්ටඹුව 191,
විද්‍යාරවින්ද පිරුවන, 18,
විද්‍යාවිලාස පිරුවන රුපහ, 17,
විද්‍යෝදය පිරුවන 17, 18, 41, 47, 85, 173,
විද්‍යාභූෂණ පිරුවන, ඇටම්පිටිය, 19, 67,

විද්‍යාලංකාර පිරුවන 41, 47, 58, 67, 190, 193,
විධායක සංඝසභාව, 62,
විනය පිටකය, 59,
විනයවාදිනි කාරක සංඝසභාව, 15, 17, 19, 22, 62,
විභාගවාරය, 140,
විඕලධම්ම, වලව්වත්තේ 18,
විමලබුද්ධි නුවරඑළියේ 16, 17, 65, 181, 182, 185, 194,
විශ්වවිද්‍යා පීඨය, බොම්බාය, 69, 179, 208,
විශ්වවිද්‍යාල කොලීජිය, 174
විශ්ව විද්‍යාල පාලක සභාව, 83, 84,
විශ්වවිද්‍යාලය, විද්‍යාලංකාර, 181,
විශේෂ ගති ලක්ෂණ, 165,
විශේෂ ලිපි, 187
විහාරදේවාලයගම් ආදායම් ප්‍රශ්නය, 165,
විහාර දේවාලයගම් පනත, 63,
වීරගුලේ ගුරුතුමා, 4,
වීරවන්නි පරපුර, 34,
වේද විනිශ්චය, 4,
වේරගම්පිට විහාරස්ථානය 58
ව්‍යවස්ථා මාලාව 22,
වෙහෙරවත්ත විදුරුපොළ, 11,
වෛදිකාශ්‍රම බ්‍රාහ්මණ විද්‍යාලය, 157,
වෛද්‍යාචර්ය ශ්‍රී හේවාවිතාරණ ගුණානුස්මරණ , 177, 217,
වියරණ සඳ සිඳු 79,
ව්‍යාකරණ සද්ද සින්ධු 73 - 77, 7[illegible], 80, 89, 174, 175, 179, 216

### ස

සහසතු පිරිකර බෙදීම, 100,
සතිස්චන්ද්‍ර විද්‍යාභූෂණ, 125, 157 - 159,
සතර කෝරළය, 20,
සත් කෝරළය, 20,
සදම්වස්, 80,
සද්ධර්මාකර පිරුවන, පින්වත්ත, 17, 18,
සද්ධම්මවංශ නිකාය, 3,
සද්ධානන්ද රුපහ 17, 18,
සන්නස්ගල පී. බී. 82,
සබරගමු ප්‍රදේශය 7,
සබරගමු දිශාව 19, 98,
සමකාලීන වියතුන් 173,
සමගි සම්මුතිය 21,
සමතිස් පැරුම් 217,
සමස්ත ඉන්දීය ප්‍රාචීන පණ්ඩිත සම්මේලනය, පූනා නගරය 14,
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය, 217,
සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ, 64,
සරණංකර දඹවින්නේ, 71,
සරණංකර වැලිවිට, 3, 46, 57, 59,
සරසවි සඳරැස, 94, 97,

ස්රස්වතී පූජාව, 33,
සාගත, හුණුවල, 10, 11, 13,
සාසන ඉතිහාසය, 98,
සාමග්‍රී සාධක සංඝ සභාව, 65,
සාසනවංස කථාව, 99
සිද්ධාර්ථ රඹුක්වැල්ලේ, 166, 174,
සිද්ධාර්ථ වලානේ, 58, 59,
සියම් නිකාය, 3, 6,
සියම් ත්‍රිපිටකය, 160,
සියම් පිටපත්, 114, 115,
සියම් රජ පවුල, 160, 163,
සියම්රට, 139, 157,
සියාතුරාළ හා එම කුමාරිහාමි, 11,
සියාම දේශය, 2,
සිරිකත (පත්‍රය), 75,
සිරි පිවර වජිරඤාණාලංකාර, 45, 98,
සිරි පියතිස්ස පිරුවන, විදුරුපොළ, 16, 67, 182,
සිරි විජයාරාමය බෝගහපිටියේ 7,
සිරිසර සහරා, 101, 120, 120, 124, 157, 159,
සිරි සුනන්ද, යටින්වල මහා නායක, 8,
සිල්වා ඩබ්ලියු. ඒ. 124, 157,
සිළුමිණ පුවත්පත, 66, 73, 84, 85, 90, 92, 209,
සිංගප්පූරුව, 22,
සිසු පිරිස, 181,
සිංහල අනුවාදය, 106,
සිංහල ජාතියේ දියුණුවට කුමක් කළ යුතුද? 217
සිංහල ත්‍යාගය, 48,
සිංහල බෞද්ධයා (පත්‍රය), 75, 84, 121, 177, 186,
සිංහල භාෂා සාහිත්‍යය, 84,
සිංහල භික්ෂුවංශය, 1, 2,
සිංහල විශ්ව කෝෂය, 10, 20,
සිංහල ශබ්ද කෝෂය 176, 178,
සීගිරිය 121,
සීමා සම්මුති 63,
සීමා සංකරය 6,
සීලවංස, බඹරපනේ 66, 181,
සීලානන්ද, පින්වත්තේ, 62,
සීලානන්ද රාස්සගල, 45,
සුගතාලංකාරෝ. 45, 97, 98, 176, 216,
සුජාත මහා නා හිමි, රඹුපොළ, 5, 10, 12,
සුජාතාරාමය, රඹුපොළ 9,
සුධර්මෝදය පිරුවන, කැබිල්ලේවෙල 19,
සුභූති, වස්කඩුවේ 61, 62, 98, 173,
සුමංගල, අඹන්වැල්ලේ 173,
සුමංගල, ඉදුරුවේ 58, 59,
සුමංගල, සූරියගොඩ 58,
සුමංගල, හික්කඩුවේ 41, 47, 58, 59, 65, 166, 173, 187, 188,

සුමංගලාරාමය, විදුරුපොළ, 11, 14, 16, 17, 18, 21, 33, 37, 45,
සුමන කඹුරුගමුවේ, 11, 34,
සුමනවංශ කන්දේගෙදර, 18, 19, 21,
සූත්‍ර පිටකය, 217,
සුරාබද්ද ව්‍යවස්ථාව, 217,
සූරියගොඩ සාමණේර, 57,
ෂේක්ෂ්පියර් (කවියා), 70,
සේනානන්ද, නුවරඑළියේ, 120,
සොගතසඤායසත්ථං, 125,
සෝභිත, ඉලුක්වෙල, 17,
සෝමා හේවාවිතාරණ, 180,
සෝවියට් දේශය, 22,
ස්‍යාමරාජ ත්‍යාගය, 17,
ස්වදේශ මිත්‍රයා (පත්‍රය), 77,
ස්වර්ණජෝති, මහ කදුරු පොකුණේ, 57,
ශාසනධර්ම විචාරකයන්ට වචනයක්, 217,
ශාසනික සේවය, 60,
ශ්‍රී ජීවක අමෘතඖෂධාලය, උඩපුස්සැල්ලාව, 183,
ශ්‍රී සද්ධර්මාධාර සමාගම, 65, 176,
ශ්‍රී පාදස්ථානයේ නායක පදවිය, 58,
ශ්‍රී මහා විහාරය, නුවරඑළිය, 12, 16, 34, 38, 124, 164, 180, 181, 184,
ශ්‍රී මුඛ දේශනාව, 158,
ශ්‍රී මුඛ පාළිය 82, 90,
ශ්‍රී සුධර්ම පාර්ශවය, 12,
ශ්‍රී සුධර්මාරාමය, වැලිකන්දේ, 3,
ශ්‍රී රතනජෝති පුස්තකාලය, විදුරුපොළ, 16,
ශ්‍රී රාහුල මා හිමි, 69,
ශ්‍රී රාහුල, වස්කඩුවේ, 5,
ශ්‍රී වර්ධන කුල කුමරු, 14, 33, 34,
ශ්‍රී විජයාරාමය, උඩුවහවර, 34,
ශිව මස්තු, 203,
ශ්‍රේෂ්ඨතම සංඝ පිතෘත්වය, 162,
සංග්‍රහවාරය, 140,
සංඝයාට වචනයක්, 217,
සංඝ සංස්ථාව, 1, 20,
සංඝ රක්ෂිත මා හිමි, 70,
සංඝරාජ පදවිය, 2, 206,
සංඝානන්ද, අංගොඩ, 9,
සංඝික ස්ථානාදි පරිහරණය, 100,
සංයුත්ත අටුවාව, 64,
සංයුත්ත නිකායට්ඨකථා (සාරත්තප්පකාසිනී, 88, 109, 112, 177, 216
සංස්කෘත ත්‍යාගය, 48,
සංස්කෘත භාෂාව, 41,
සංස්කෘත වාග් විහාරණී සභාව, 157,

හ

භයගිරි විහාරස්ථ උපෝසථාගාරය, 8,
භයවැනිත්‍රිපිටක ධර්ම සංගායනාව,බුරුමය, 160,
හීන්මැණිකේ, රත්නායක මුදියන්සේලාගේ, 18,
හෙයියන්තුඩුවේ නා හිමි, 166,
හෙරණසික හා හෙරණසික විනිස, 16,
හෙන්ද්‍රික් ද සෝසා එදිරිමුනි, 3,
හේවාවිතාරණ ග්‍රන්ථ ශුද්ධිය, 19,
හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථ, 64,
හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 107, 111, 116, 117, 119, 120, 163, 167, 168, 175.
හේවාවිතාරණ ත්‍රිපිටක මුද්‍රණ සභාව, 64, 113—115,
හේවාවිතාරණ සයිමන් ඇලෙක්සැන්ඩර්, 180,
හේවාවිතාරණ සී. ඒ. වෛද්‍යාචාර්ය, 101, 108, 110, 113, 114, 176.
හේවාහැට, 9,

ළ

ළදරු සිසුන්ගේ පැවතීම, 100.

書　　號:　SR047

詳細書名: 斯里蘭卡文

《大迦葉尊者的故事 及 開示》

PALI POEM (KAVYA):

" MAHA KASSAPA CHARITAM "

編 著 者: VEN. RAJAKIYA PANDITA

WIDURUPOLA PIYATISSA MAHA

NAYAKA THERO

(1880 ~ 1954)

宗　　派:　南傳

提供日期:　2008 年

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

## NAMO AMITABHA

## 南無阿彌陀佛

【斯里蘭卡文：大迦葉尊者的故事及開示】

**財團法人佛陀教育基金會　印贈**

台北市杭州南路一段五十五號十一樓

Printed for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55, Sec 1, Hang Chow South Road, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website:http://www.budaedu.org

Mobile Web: m.budaedu.org

**This book is strictly for free distribution, it is not to be sold.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

Printed in Taiwan

3,000 copies; September 2018

SR047-16190